ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

# ශ්‍රී ලංකාවේ නව ජනාවාස

ජ. ඕ. එල්මන්

ඩී. ද එස්. රත්නවීර

325.33
SL

අධ්‍යයන මාලා අංක 6

1975 ජනවාරි

2009/06

2010/04

# ශ්‍රී ලංකාවේ නව ජනාවාස

තෝරා ගත් තරුණ ජනාවාස, සමූපකාර ගම්මාන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු කෘෂිකාර්මික ව්‍යාපාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස විස්සක් පිළිබඳව කළ අධ්‍යයනයකි.

ඒ.සී.එල්මන්

ඩී. ද එස්. රත්නවීර

පර්යේෂණ අධ්‍යයන මාලාව – අංක 6
1975 ජනවාරි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත, (තැ.පෙ. 1522) කොළඹ 7.

2621 A

සංස්කරණය

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී

යූ.එල්.ජයන්ත පෙරේරා

ජේ.ට්‍යුඩර් සිල්වා

පී.ජේ.ගුණවර්ධන

එල්.පී.ගාපා

සහ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

ආරියපාල සිරිවර්ධන

ගෙන් සමන්විත සංස්කාරක මණ්ඩලයක්

විසින් සිංහල පිටපත සංස්කරණය කෙරිනි.

පෙරවදන

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් නිකුත් කරනු ලැබෙන 'ශ්‍රී ලංකාවේ නව ජනාවාස' යන මැයෙන් වූ වැදගත් පර්යේෂණ අධ්‍යයනයට මෙම පෙරවදන ලිවීමට අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙමි. දිවයිනෙහි කෘෂිකර්ම අංශයෙහි දූරදර්ශී පරිවර්තන සිදු වෙමින් පවතින අවදියක ආර්ථිකමය වශයෙන් වාසි ගෙන දෙන්නාවූද, සමාජයීය වශයෙන් අර්ථාන්විත වන්නාවූද, මාදිලියකින් භූමිය සහ ජනතාව ඒකාබද්ධ කිරීමේ ගැටළු විසඳීමෙහි ලා රජයේ විවිධ ආයතන කටයුතු කරමින් සිටින අවස්ථාවක මෙම අධ්‍යයනය සිදු කර ඇත. තරුණ ජනාවාස යෝජනා ක්‍රම, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයන්හි කෘෂිකර්ම යෝජනා ක්‍රම, සමූපකාර ගම්මාන සහ සමූපකාර ජනාවාස යන විවිධ ජනාවාස සිවු වර්ගයක් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබ ඇත්තේ දිවයිනෙහි ගොවිජන සේවා ක්ෂේත්‍රයේ පරිවර්තනයන් කිරීම සඳහා සිසියම් අයුරකින් දායක වෙමින් අනාගතයේ කෘෂිකර්ම ජනාවාස පිළිබඳව ජාතික ප්‍රතිපත්ති තහවුරු කිරීමෙහි ලා මෙම ජනාවාස ආධාරකාරී වන හෙයිනි. මෙතෙයින් බලන කළ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ආරම්භයේදීම එහි ක්‍රියාකාරී දර්ශනයට ඇතුළත් වූ සංකල්පයක් වන ආයතනයේ වැඩ කටයුතු නිරතුරුවම දිවයිනෙහි ප්‍රායෝගික ගැටළුවලට අදාළ විය යුතුය යන මූලික සංකල්පය ආයතනය විසින් ඉදිරියටත් අනුගමනය කරමින් සිටී. එසේම ආයතනයේ වැඩ කටයුතුවලට අදාළ වන තවත් වැදගත් සංකල්පයක් මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් හුවා දක්වනු ලැබ ඇත. එනම්, ආයතනයෙහි පර්යේෂණ අධ්‍යයන ප්‍රකාශන සාරානුකූල වූත්, සම්පූර්ණ වූත් ක්ෂේත්‍ර කටයුතු මත පදනම් විය යුතුවාක් මෙන්ම ආයතනය ඉදිරි කටයුතු කරගෙන යා යුත්තේ ප්‍රායෝගික ගැටළු වලින් අවතීර්ණ වැඩ සටහනකට අනුව බවයි.

'රජයේ' හෝ අත් පත් කර ගනු ලැබූ පෞද්ගලික ඉඩම් ප්‍රධාන වශයෙන් ඉඩම් නොමැති 'ගොවි' පන්තියට වෙන් කර දෙමින් 'ඉඩම් බෙදා දීමේ' වැඩ සටහනක් දශක ගණනාවක් තුළ ක්‍රියාත්මක කර ඇත්තෙවු. මෙම ඉඩම් බෙදා දීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී නිශ්චය මිම්ම වශයෙන් සලකන ලද්දේ ඉඩම් නැති බව හා පවුලේ ප්‍රමාණයයි. මෙම වැඩ පිළිවෙල අනුව ප්‍රධාන හා මධ්‍යම ප්‍රමාණයේ වූ වැදගත් වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ මහා පරිමාණ වශයෙන් ඉඩම් ජනාවාස කරවීමේ වැඩ සටහනක් ද ගොඩ ඉඩම් ජනපද කරවීමේ හා ගම් පුළුල් කිරීමේ වැඩ සටහනක්ද කරගෙන යන ලදී. ඉඩම් සංවර්ධනය, වාරිමාර්ග සහ යටිතල පහසුකම් සැපයීම, ඒ සමඟම කෙළින්ම ජනපදිකයින් හට ගෙවනු ලැබූ සහනාධාර ආදිය සඳහා රජයට මහත් ප්‍රාග්ධන ආයෝජනයක් කිරීමට සිදු විනි. මෙවැනි යෝජනා ක්‍රම වලින් නොයෙක් ආකාරයෙන් රටට සහායක් ලැබී ඇතත් මීට වඩා කෘෂික අයුරින් මෙන්ම බෙහෙවින් අඩු ප්‍රාග්ධන ආයෝජනයක් ඇතුව ඉඩම් ජනාවාස කිරීම සඳහා දැනට අවශ්‍යතාවක් තිබේ. වර්තමානයෙහි ඉඩම් සොයන නව පදිංචි කරුවන් වනුයේ, ප්‍රයෝජනවත් සේවා අවස්ථාවන් ඉක්මනින් අපේක්ෂා කරන උගත් තරුණ තරුණියෝය. දිවයිනෙහි කෘෂිකර්ම අංශයේ අතිශයින් වැදගත් කොටසක් බවට පත්ව සිටින මෙම නව ජනපදික පංතියට ආර්ථිකමය වශයෙන් හා සමාජීය වශයෙන් සෑහීමකට පත් විය හැකි ජීවන ක්‍රමයක් ලබා දීමෙහි ලා පුරෝගාමී ප්‍රයත්නයක

යෙදුනු ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳවය, මෙම අධ්‍යයනය සවිස්තර පරීක්ෂණයක යෙදෙනුයේ.

දීර්ඝ කාලයක සිට සංවර්ධිත දේශයන් විසින් මැනවින් වටහා ගනු ලැබ ක්‍රියාවට පරිවර්තනය කර ඇති 'ජනාවාස සැලසුම්' පිළිබඳ සංකල්පය ඇතැම්විට සාපේක්ෂ වශයෙන් සළකන කළ ශ්‍රී ලංකා වාසීන් හට නව සංකල්පයකි. ප්‍රවේශමෙන් තෝරා ගත යුතු කෘෂි–ශිල්පීය හා සමාජයීය–ආර්ථික දත්ත අනුසාරයෙන්, විශේෂත්ව ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන කණ්ඩායමක් විසින් මහත් ශ්‍රම වැයෙන් ඉටු කළ යුතු ප්‍රායෝගික ක්ෂේත්‍ර වැඩ ජනාවාස සැළසුම් සඳහා අවශ්‍ය වන්නේය. මෙය හුදෙක් න්‍යායයන් පිළිබඳ කෙරෙන ව්‍යායාමයක් නොවන අතර, පුළුල් වූ මානුෂික පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඇප කැප වී මහන්සියෙන් කළයුතු ක්ෂේත්‍ර කාර්යයකි. නව ජනාවාස සැලසුම්, භෞතිකමය හා ආර්ථික සංවර්ධනය පමණක් නොව සමාජයීය හා ජන සමූහ සංවර්ධනයද අරමුණු කළ යුතුය. ආරම්භයෙහි සිටම තමන්ට පමණක් වග කිවයුතු ආත්ම විශ්වාසයක් ඇති ජන සමූහයක් වශයෙන් දියුණු වීමට පමණක්නොව නව ජනාවාස පිහිටුවනු ලැබෙන ප්‍රදේශයන්හි ගැමි ජනතාව සමඟ සහයෝගයෙන් කටයුතු කරන ජන සමූහයක් බවට පත් කිරීමටද නව ගොවිපලවල් හා ජනාවාස දිරිමත් කළ යුතුය. මැනවින් සැලසුම් කර මනාව පිහිටුවනු ලැබූ යහපත් කෘෂිකර්ම ජනාවාසයක් ඇත්ත වශයෙන්ම ගැමි පෙදෙස්වල නව ජීවන ක්‍රමයක් සඳහා යථාර්ථ වූ මාවතක් වන්නේය. මෙම අධ්‍යයනයට යොමුවූද, දැනට පිහිටුවනු ලැබ ඇත්තාවූද නව ජනාවාස යෝජනා ක්‍රම අපගේ අනාගත කෘෂිකර්ම ජනාවාස සැලසුම් කිරීම සඳහා වැදගත් 'ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයක්' අපට සපයන්නේය.

මෙනයින් මෙම තුලනාත්මක අධ්‍යයනය සම්පූර්ණයක් සේ අදහස් නොකෙරෙන අතර එය වඩාත් ජාතික වැදගත්කමින් යුතු පුළුල් විෂයයක් සඳහා ආරම්භයක් හා හැඳින්වීමක් පමණක් වන්නේය.

එහෙයින් ස්වභාවයෙන්ම අඩුපාඩුකම් තිබිය හැකි මෙම අධ්‍යයනය, ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳවද වැදගත් ජනාවාස සැලසුම් ප්‍රතිපත්ති කෙරෙහිද සැළකිල්ලක් දක්වන සියළු දෙනා විසින් විවේචනාත්මකව පරීක්ෂා කර සාකච්ඡාවට භාජනය කරනු ලැබේවි යයි මම විශ්වාස කරමි. ජනාවාස සැලසුම් විෂය පිළිබඳව වඩ වඩාත් විශ්වාසවත් අධ්‍යයනයන් කිරීම සඳහා මෙම අධ්‍යයනය කෙරෙහි එල්ල වන විවේචන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින්ද මෙම අධ්‍යයනය හා සම්බන්ධ සියළු දෙනා විසින්ද උණුසුම්ව පිළි ගනු ලැබෙන බවට මට සැකයක් නොමැත.

මෙම සමීක්ෂණය හා අධ්‍යයනය සම්පූර්ණ කිරීම සඳහා කාරුණික සහාය දැක්වූ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ සියළුම නිලධාරීන් හටද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමටද, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවටද, ක්‍රම සම්පාදන අමාත්‍යාංශයටද, සියළුම දිස්ත්‍රික්කයන්හි දිසාපතිවරුන්ට හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ටද, මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් හටද ස්තුති කරනු කැමැත්තෙමි. තමන් හමුවට පැමිණි පර්යේෂකයින් මුණ ගැසී ඔවුන් හට සිය සම්පූර්ණ සහයෝගය දැක්වූ, මෙම අධ්‍යයනය සඳහා

තෝරා ගත් යෝජනා ක්‍රමවල නව පදිංචි කරුවන්ටත් ගොවීන් හටත් අවසාන වශයෙන් විශේෂයෙන් ස්තුති කරනු කැමැත්තෙමි.

මෙම රටෙහි කෘෂිකාර්මික හා සමාජයීය සංවර්ධනය උදෙසා භූමිය සහ ජනතාව අතර නිවැරදි සම්බන්ධතාවයක් ඇති කරවීමේ කාර්යය පිළිබඳව අර්ථාන්විත අදහස් හුවමාරුවකට සීමිත වශයෙන් හෝ මෙම ප්‍රකාශනය අවස්ථාව සලසාවි යයි මම විශ්වාස කරමි.

එච්. කොබ්බෑකඩුව
කෘෂිකර්ම හා ඉඩම් ඇමති

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය,
කොළඹ 2.

1974 සැප්තැම්බර් 25

## ස්තූතිය

මෙම අධ්‍යයනය කරගෙන යාමේදී අපට සහාය දැක්වූ බොහෝ දෙනෙකුට අපි ණය ගැති වෙමු. තරුණ ජනාවාස යෝජනා ක්‍රම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස පිළිබඳව වන දෙවන පරිච්ඡේදය හා පස්වන පරිච්ඡේදය සම්බන්ධයෙන් කටයුතු කල එල්මන් මහතාට ඔහුගේ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී පී.වික්‍රමසිංහ මහතා සහාය වූයේය. සමූපකාර ගොවිපලවල් සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම පිළිබඳව වන තෙවන හා සිව්වැනි පරිච්ඡේද සම්බන්ධයෙන් කටයුතු කල රත්නවීර මහතාට සහාය වන ලද්දේ ටී.අබේසිංහ මහතා විසිනි. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි කේ.ටී. සිල්වා මහතාද ක්ෂේත්‍ර සමීක්ෂණයේ පසු අදියරෙහිදී සමීක්ෂණ කටයුතුවලට සහාය වූයේය. අප ඉල්ලා සිටි තොරතුරු සැපයීමෙන් හා අපගේ ක්ෂේත්‍ර චාරිකා සඳහා අවශ්‍ය විධි විධාන සැලසීමෙන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ, ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූලස්ථානයේ සහ දිස්ත්‍රික් හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීහු බෙහෙවින් අපට සහාය වූහ. අපගේ අධ්‍යයනයට යොමු වූ ජනාවාස විසෙසෙහි සාමාජිකයෝ ඔවුන් සමඟ අප නතරව සිටි කාලය තුළ අපව හොඳින් රැක බලා ගනිමින් අප විසින් අසන ලද ප්‍රශ්නවලට ඉතාමත් සාවදානව කන් දී පිළිතුරු සැපයූහ. මෙම අධ්‍යයනය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සමාප්ත කිරීම ආදී විවිධ අදියරවලදී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, ප්‍රධාන උපදේශක සහ කාර්ය මණ්ඩලයේ අනිකුත් බොහෝ නිලධාරීන්ද අපට මහඟු උපදෙස් දුන්හ.

මෙම අධ්‍යයනයෙහි අප විසින් සඳහන් කරන ලද කිසිදු කරුණක් අදාල කවරෙකු විසින් හෝ පෞද්ගලිකව භාර ගනීවී යයි අපි බලාපොරොත්තු නොවෙමු. අධ්‍යයනය පුරාම අපගේ අරමුණ වූයේ විවේචනය කිරීම නොව නිර්මානය කිරීමයි. අපිදු, කවර හෝ මාර්ගයකින් එල්ල වන විවේචන සුහදව පිළි ගනිමු. මෙම අධ්‍යයනය හා ඒ අනුව උද්ගත වන වාද විවාද, සමාජයීය වශයෙන් හා ආර්ථික වශයෙන් සෑහීමකට පත් ග්‍රාමීය සංවර්ධනයක් සඳහා ඉදිරි බලන මාවතක් සෙවීම සඳහා දරණ ප්‍රයත්නයට දායක වෙතියි බලාපොරොත්තු වෙමු.

# පටුන

පෙරවදන .. .. ..

ස්තුතිය .. .. ..

සාරාංශය සහ නිගමන .. ..

1 වන පරිච්ඡේදය හැඳින්වීම

1.1 අධ්‍යයනයේ පරමාර්ථ .. .. 2
1.2 නියැදිය තෝරා ගත් අයුරු .. .. 2
1.3 ක්ෂේත්‍ර සමීක්ෂණය කළ ආකාරය .. 3
1.4 ජනාවාස අගය කළ ක්‍රමය .. .. 4
1.5 අධ්‍යයනයේ සීමා .. .. 6
1.6 නිර්වචන .. .. .. 7

2 වන පරිච්ඡේදය තරුණ ජනාවාස

2.1 තරුණ ජනාවාස වැඩ පිළිවෙල හඳුන්වා දීම 10
2.2 තරුණ යෝජනා ක්‍රමයන්හි සාර්ව තත්වය-1973 16
2.3 තරුණ ගොවි යෝජනා ක්‍රම පහ පිළිබඳ තොරතුරු 18
2.3.1 මන්ඩලපුර තරුණ ගොවි යෝජනා ක්‍රමය 18
2.3.2 මනම්පිටිය තරුණ යෝජනා ක්‍රමය 23
2.3.3 කුඩාඔය තරුණ යෝජනා ක්‍රමය 26
2.3.4 යට්ටපාත (සිරිමාවෝ උද්‍යානය) තරුණ යෝජනා ක්‍රමය .. 28
2.3.5 විස්වමඩුකුලම් තරුණ යෝජනා ක්‍රමය 34

2.4 තරුණ යෝජනා ක්‍රම අගැයීම .. 44
2.4.1 යෝජනා ක්‍රම සැළසුම .. 45
2.4.2 ජනාවාසිකයින් තෝරා ගැනීම .. 46
2.4.3 පදිංචි කරුවන් තෝරා ගන්නා මාර්ග 49
2.4.4 ඉඩම් භුක්තිය .. .. 54
2.4.5 නිෂ්පාදන ක්‍රම .. .. 64
2.4.6 මූල්‍ය ප්‍රතිපත්තිය .. .. 66
2.4.7 යෝජනා ක්‍රමයන්හි කළමනාකරණය 70
2.4.8 පුහුණුකිරීම් සහ සේවාවන් 76
2.4.9 යෝජනා ක්‍රමයන්හි ප්‍රමාණය සහ සැළැස්ම 77
2.4.10 ගම හා තරුණ යෝජනා ක්‍රම අතර සම්බන්ධතාවය .. .. 78
2.5 නිගමන හා නිර්දේශ .. .. 80

3 වන පරිච්ඡේදය සමුපකාර ගම්මාන

3.1 හැඳින්වීම සහ අරමුණු 84
3.2 සමුපකාර ගම්මාන පිළිබඳ සාර්ව තත්වය - 1973 87
3.3 සමුපකාර ගම්මාන පහ පිළිබඳ විස්තරය 87

3.3.1 ලක්සනගම සමුපකාර ගොවිපල 88
3.3.2 බද්දේගම සමුපකාර ගම්මානය 96
3.3.3 පීපිලිමාන සමුපකාර ගම්මානය 105
3.3.4 ගිලීමලේ සමුපකාර ගම්මානය 112
3.3.5 ප්‍රොවිඩන්ස් සමුපකාර ගම්මානය 120

3.4 සමුපකාර ගම්මාන අගැයුම .. .. 127
3.4.1 භෞතික සැළසුම් .. .. 127
3.4.2 දීර්ඝ කාලීන සහ කෙටි කාලීන සැළසුම් 127
3.4.3 පදිංචිකරුවන් තෝරා ගැනීම .. 134
3.4.4 පදිංචිකරුවන්ගේ ප්‍රභවස්ථාන සහ ගොවිපල තුළ ඔවුන්ගේ පදිංචිය .. 138
3.4.5 ඉඩම් භුක්ති ක්‍රමය .. .. 139
3.4.6 නිෂ්පාදන ක්‍රම .. .. 140
3.4.7 මූල්‍ය ප්‍රතිපත්ති .. .. 143
3.4.8 ව්‍යාපාරවල කළමනාකාරිත්වය .. 145
3.4.9 පුහුණුකිරීමේ කටයුතු හා සේවාවන් 145
3.4.10 ප්‍රමාණය සහ සැළැස්ම .. 145
3.4.11 අවට ගම් සමඟ තිබූ සම්බන්ධය .. 146

3.5 නිගමන හා නිර්දේශ .. .. .. 146

4 වන පරිච්ඡේදය ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල (කෘෂිකාර්මික ව්‍යාපාර)

4.1 හැඳින්වීම සහ අරමුණු .. .. 150
4.2 සාර්ව තත්වය - 1973 .. 151
4.3 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම පහ පිළිබඳ විස්තරය .. .. 152

4.3.1 පිද්දෙණිය ගොවිපල .. 152
4.3.2 තෝනිගල ගොවිපල .. 161
4.3.3 අරංගල ගොවිපල .. 167
4.3.4 උප්පුවේලි කුකුළු පාලන ව්‍යාපාරය 172
4.3.5 යටිනුවර - මැද පළාත කිරිපට්ටි ව්‍යාපාරය .. .. 177

4.4 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපල පිළිබඳ අගැයීමක් .. .. .. 185

4.4.1 ගොවිතමය සැලසුම .. 185
4.4.2 ජනපදිකයින් තෝරා ගැනීම .. 186
4.4.3 ජනපදිකයින්ගේ ප්‍රභව ස්ථාන .. 186
4.4.4 ඉඩම් භුක්ති ක්‍රමය .. 187
4.4.5 නිෂ්පාදන ක්‍රම .. .. 187
4.4.6 මූල්‍යමය කරුණු .. 187
4.4.7 යෝජනා ක්‍රමවල පරිපාලනය .. 188
4.4.8 පුහුණුව හා සේවාවන් .. 188
4.4.9 ප්‍රමාණය සහ සැලැස්ම .. 188
4.4.10 ගම් සමඟ ඇති සම්බන්ධකම් .. 188

4.5 නිගමන .. .. .. 189

5 වන පරිච්ඡේදය ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස

5.1 හැඳින්වීම .. .. .. 191
5.2 සමූපකාර ජනාවාස – සාර්ව තත්වය .. 199
5.3 ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස පහ පිළිබඳ විස්තර 204

5.3.1 සෙරපිස් සාමූහික ගොවිපල 204
5.3.2 දම්මුලහේන සාමූහික ගොවිපල .. 220
5.3.3 නෝමැන්ඩි සාමූහික ගොවිපල 228
5.3.4 යැරෝ සාමූහික ගොවිපල 236
5.3.5 පාත්හැම් සාමූහික ගොවිපල 246

5.4 ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර ජනාවාස පිළිබඳ අගැයීම 257

5.4.1 යෝජනා ක්‍රම සැලසුම් කිරීම .. 257
5.4.2 සමූපකාර සාමාජිකයින් තෝරා ගැනීම, තෝරා ගැනීමේ මාර්ග සහ ජනාවාසයෙහි පදිංචි කරවීම .. .. 265
5.4.3 ඉඩම් භුක්ති ක්‍රමය .. 268
5.4.4 නිෂ්පාදන ක්‍රම .. .. 270
5.4.5 මූල්‍ය ප්‍රතිපත්ති .. 273
5.4.6 කළමනාකරණ ප්‍රතිපත්ති .. 276
5.4.7 පුහුණුව හා සේවා .. 281
5.4.8 ප්‍රමාණය හා සැලැස්ම .. 281
5.4.9 ගම් හා සම්බන්ධතාවය .. 282

5.5 සාරාංශය හා නිගමනය .. .. 282

6 වන පරිච්ඡේදය ජනාවාස වර්ග සතර පිළිබඳව තුලනාත්මක අගැයීමක්


6.1 ව්‍යාපාර සැළසුම් කිරීම .. .. 286
6.2 සාමාජිකයින් තෝරා ගැනීම .. .. 287
6.3 ඉඩම් භුක්ති ක්‍රමය .. .. 287
6.4 මූල්‍ය ප්‍රතිපත්ති .. .. 288
6.5 ජනාවාස කළමනාකරණය .. .. 289
6.6 ශ්‍රම භාවිතය .. .. 290
6.7 ආර්ථික සඵලතා .. .. 290
6.8 සමාජයීය සඵලතා .. .. 292
6.9 අසල්වාසී ගම් සමග ඇති සම්බන්ධතාවය .. 293


7 වන පරිච්ඡේදය නිගමන සහ යෝජනා


7.1 අන්තර්-විෂය ප්‍රවේශයක් සඳහා ඇති අවශ්‍යතාවය 295
7.2 ජනාවාස හා සම්බන්ධ විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සඳහා ඇති අවශ්‍යතාවය .. 295
7.3 අනාගත ජනාවාස යෝජනා ක්‍රම පිහිටුවීම සඳහා යෝජනා .. .. .. 296
7.3.1 සමූපකාර ගම්මාන හෝ පුද්ගලික (පවුල්) ගොවිපලවල් .. .. 297
7.3.2 ඉඩම් අයිතියේ ස්වභාවය .. 299
7.3.3 ජනාවාස සැළසුම් කිරීම .. 300
7.3.4 පදිංචිකරුවන් තෝරා ගැනීම .. 302
7.3.5 මූල්‍ය ප්‍රතිපත්තිය .. .. 303
7.3.6 කළමනාකරණ ප්‍රතිපත්තිය .. 304
7.3.7 පුහුණුව සහ සේවා .. 306
7.3.8 අසල්වාසීන් සමග ඇති සම්බන්ධතාවය 307
7.4 නිගමනය .. .. .. 307


උපග්‍රන්ථයන්


1 සමීක්ෂණය සඳහා නියැදි තෝරා ගැනීම.
2 තරුණ ව්‍යාපාර පිළිබඳව අතිරේක තොරතුරු.
3 සමූපකාර ගොවිපළවල් පිළිබඳ අතිරේක තොරතුරු.
4 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර පිළිබඳ අතිරේක තොරතුරු.
5 ඉඩම් සංවර්ධන කොමිසමේ ජනාවාස පිළිබඳ අතිරේක තොරතුරු.
6 පුහුණුව හා කළමනාකරණ සංවිධානය පිළිබඳ අතිරේක තොරතුරු.


මෙම උප ග්‍රන්ථයන් වෙනම ඉංග්‍රීසියෙන් නිකුත් කර ඇති අතර ඒවා උදෙසා තැපැල් ගාස්තුව සමග කොළඹ, තැ.පෙ. 1522, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය යන ලිපිනයෙන් ඉල්ලුම් කිරීමෙන් පර්යේෂකයින් හට ලබා ගත හැකි වේ.

# ශ්‍රී ලංකාවේ නව ජනාවාස

## සාරාංශය සහ නිගමන

1. තරුණ යෝජනා ක්‍රම, සමූපකාර ගම්මාන, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයන්හි කෘෂිකාර්මික යෝජනා ක්‍රම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ සාමූහික ජනාවාස යන සිව් වර්ගයන්හි නව ජනාවාස විස්සක අත්දැකීම් මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කෙරේ.

2. කලින් ආරම්භ කරන ලද ජනපද ව්‍යාපාරවලදී මෙන් නොව වඩාත් පහත් පිරිවැය ආයෝජනයකින් යුතුව සේවා අවස්ථාවන් සැපයීම හා නිෂ්පාදනය වැඩි කිරීම, සාමාජිකයින් අතර ආර්ථිකමය හා සමාජයීය සමානාත්මතාවය පවත්වා ගැනීම, සමූපකාර සංවිධාන ක්‍රම දියුණු කිරීම, සාමාජිකයින් විසින් ආත්ම විශ්වාසය හා ස්වයං-පාලනය සාක්ෂාත් කර ගනු ලැබීම සහ නව ජනාවාස ඒ අවට ජන සමූහ සමඟ ඒකාග්‍රතාවයක් ඇති කිරීම යන ප්‍රධාන පරමාර්ථයන් අරමුණු කරගෙන මෙම යෝජනා ක්‍රම ආරම්භ කරන ලදී. (සවිස්තරාත්මක ප්‍රතිපත්තිමය පරමාර්ථයන් සඳහා සටහන 1-2 බලන්න).

3. පළමුව එක් එක් ජනාවාස වර්ගයක් සම්බන්ධයෙන් අදාළ කරගත හැකි දියුණු කිරීම් යෝජනා කිරීම සඳහා සහ අනාගතයෙහි නව ජනාවාස පිහිටුවීම උදෙසා පොදු උපදෙස් සකස් කිරීමේ පරමාර්ථ අරභයා ඉහත සඳහන් මිණුම් දඬු අනුව ජනාවාස විස්ස අගයනු ලැබේ.

4. ඉහත සඳහන් කර ඇති සියළුම පරමාර්ථයන් මුළුමනින්ම සාක්ෂාත් කර ගත් එකම ජනාවාස මාර්ගයක්වත් නොමැති බව අධ්‍යයනයෙන් පෙනී යයි. ඇතැම් යෝජනා ක්‍රම ආර්ථිකමය අංශයෙන් මනා ප්‍රගතියක් දක්වා ඇතත් සමාජයීය හා පරිපාලනමය අංශයෙන් බලන කල ඒවා අසතුටුදායක තත්වයක පවතී. පොදුවේ දක්වා ඇති කරුණු හැර වෙනත් කරුණු ඇතත් එක් එක් වර්ගයක ජනාවාස ළඟා කරගෙන ඇති ඵලදායීතාවයන් හා ඒවායේ ඌනතාවයන් පහත සඳහන් පරිදි සංක්ෂිප්ති යෙන් දැක්විය හැක.1/

---

1/ අනාවශ්‍යයෙන්ම ඉතාමත් සංකීර්ණ සංවිධානයක් පිළිබඳ විස්තර වචන කිහිපයකින් සංක්ෂිප්ත කොට දැක්වීමට උත්සාහ කිරීම අන්තරායකාරී වන්නේය. මෙසේ වූ විට සංක්ෂිප්තයෙන් දක්වා ඇති මෙම අදහස අධ්‍යයනයේ සම්පූර්ණ අදහසින් පරිබාහිරව උපුටා ගැනීමට ඉඩ කඩ ඇති අතර එනයින් වැරදි අර්ථ කථනයකට තුඩු දීමට පිළිවන. එහෙයින් මෙසේ දක්වා ඇති සංක්ෂිප්ත සටහන් සම්බන්ධයෙන් අවසාන නිගමනයකට එළඹීමට පෙර ඉහත කී වැරදි හැඟීම් මග හරවා ගැනීම සඳහා අවශ්‍යතන්හිදී ඒ ඒ අදාළ පරිච්ඡේදවලටත් (2, 3, 4 සහ 5) විශේෂයෙන් පරිච්ඡේදයක් අවසානයේ දී ඇති සංක්ෂිප්තයන් හා නිර්දේශවලටත් සැළකිල්ල යොමු කරවන ලෙස පාඨකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(අ) සේවා සමුපකාර සමිතියක් යටතේ පෞද්ගලික පවුල් ඉඩම් ක්‍රමය මත පදනම් වූ තරුණ යෝජනා ක්‍රම (2 වන පරිච්ඡේදය) ඇතැම් අවස්ථාවලදී ආර්ථිකමය අංශයෙන් බලන කල මනා ප්‍රතිඵල පෙන්වා ඇතත් සමානත්මතාවය, සමුපකාරය හා ස්වයං-පාලනය පිළිබඳ සමාජයීය පරමාර්ථයන් සපුරා ගැනීමට පොදුවේ අපොහොසත් වී ඇත. ඒවා, ඒ වටා ඇති ගම් වලින් වෙන් වූ හුදකලා ඒකක බවට පත් වීමේ නැඹුරුතාවයද දක්නට ලැබේ.

(ආ) සමුපකාර ගම්මාන බොහොමයක සාමූහික පදනම මත භූමිය අයිති කරගෙන ගොවිතැන් කරන විට, දැඩි විනය පාලනයක් ඇති අවස්ථාවලදී හැරෙන්නට අනෙක් අවස්ථාවලදී ආර්ථිකමය ප්‍රගතිය පිළිබඳ වේගය සාමාන්‍යයෙන් පහත් තත්වයක විනි. සාමාජිකයින් අතර සමානත්මතාවය පවත්වාගෙන ඇත. කෙසේ වෙතත් කළමනාකරණය පිළිබඳ වගකීම තවම සමුපකාර සාමාජිකයින්ට පවරනු ලැබ නැති අතර මෙම ගොවිපළ් බොහොමයක් භාරව රජයේ නිලධාරීහු කටයුතු කරති.

(ඇ) අධ්‍යයනයට යොමු වූ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල් පහෙන් හතරක භූමිය, තරුණ යෝජනා ක්‍රමවලදී මෙන් පෞද්ගලිකව ගොවීන් හට වෙන් කර දී ඇත.[1] මෙම ගොවිපලවල්හී ඇතැම් අවස්ථාවල ඵලදායීතාවය සෑහෙන පමණ ඉහළ මට්ටමක තිබූ අතර දුර බැහැර ප්‍රදේශ වලින් සාමාජිකයින් ගෙන ඒමක් සිදු නොවන හෙයින් පිරිවැය ආයෝජන සාපේක්ෂ වශයෙන් අඩු විනි. සමුපකාර සමිති පරිපාලනය තවම සාමාජිකයින්ට පවරා නැති අතර සමුපකාර ගම්මානවල මෙන් එම වගකීම් භාරය, පත් කරන ලද නිලධාරීන් අත පවතී. මෙම ජනාවාස අසල්වැසි ගම් වලින්ම ව්‍යාප්ත වූ කොටසක් ලෙස සංවිධානය වීමේ නැඹුරුතාවයට එළඹ ඇත. අනිකුත් ජනාවාස වර්ගයන් මෙන් නොව මේවා එනයින් හුදකලා ඒකක බවට පත්ව නොමැත.

(ඈ) සවිස්තරාත්මක අගැයීමක් කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ සාමූහික ජනාවාස ආරම්භ කර තවම වැඩි කල් ගොස් නැතත් ඒවායේ මූලික ප්‍රගතිය පිළිබඳව සමාලෝචනයක යෙදෙන විට පෙනී යන්නේ එම ජනාවාස මනාව සැලසුම් කර ඇති බවත්, අත් පත් කර ගත් වතු යායවල සේවා අවස්ථාවන් හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා එම ජනාවාස ආරම්භක වශයෙන් සෑහෙන ප්‍රගතියක් දක්වා ඇති බවත්, සමුපකාර සංවිධානයක් වර්ධනය කරමින් ස්වයං-පාලනය දියුණු කිරීමට එම ජනාවාස තුඩු දී ඇති බවත්ය. මෙම ජනාවාස අසල්වැසි ගම් සමඟ ඒකාග්‍රතාවය ඇති කිරීම සඳහාද ප්‍රයත්නයක් දරා ඇත.

---

1/ මේ හේතුකොටගෙන අපගේ නියැදිය අසමාන ස්වරූපයක් ගන්නා බව අපි දනිමු. එහෙත් එනයින් එහි වටිනාකම අඩු වී නැත. නියැදිය තෝරා ගත් ආකාරය පිළිබඳ විස්තර සඳහා 1 වන උප ග්‍රන්ථය බලන්න.

5. යෝජනා ක්‍රම සිවු වර්ගය පිළිබඳව කෙරෙන තුලනාත්මක විශ්ලේෂණය මගින් පහත දහත් ප්‍රධාන නිගමනයකට එළඹේ. (6 වන පරිච්ඡේදය).

(අ) නව ජනාවාස පිළිබඳ අදහස නිරතුරුවම පෞද්ගලික පදනමක් මත හෝ සාමූහික පදනමක් මත ඉඩම් අයිතිය තිබිය යුතුද යන කරුණ වටා මධ්‍යගත වුවත් මෙම තත්වය නොමග යවන සුළු එමෙන්ම ප්‍රධාන සංකල්පයන් දුර්ව කොට තැකීමේ ස්වභාවයක් බව පෙනී යයි. ඉහත දක්වා ඇති කවර තත්වයක් යටතේ වුව ප්‍රතිපත්ති පරමාර්ථයන් සපුරා ගැනීම සඳහා ඉඩම් අයිතිය පිළිබඳ මෙම තර්ක දෙකෙන් එකක් හෝ අනෙකට වඩා පහත් සේ නොහැඟේ. ඇත්ත වශයෙන්ම පැහැදිලි වනුයේ ඉඩම් අයිතිය පිළිබඳ කාරණය නව ජනාවාසයන්හි සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට තුඩු දෙන විවිධ සාධක වලින් එකක් පමණක් බවයි. භුක්තිය පිළිබඳ සුරක්ෂිත භාවය, කළමනාකරණය, මුදල්, තෝරා ගැනීම, පුහුණුව, සේවා සැපයීම, ගොවිපලෙහි සැළැස්ම හා අනිකුත් කරුණුද සමාන්තරව වැදගත් වන්නේය. බොහොමයක් ගොවිපලවල් නව පරමාර්ථයන් සපුරා ගැනීමට අපොහොසත් වී ඇත්තේ ඒවායේ ඉඩම් අයිතිය පෞද්ගලික හෝ සාමූහික හෝ පදනමක් මත වූ නිසා නොව ඉහත සඳහන් කර ඇති එක් සාධකයක් හෝ අනෙක්වා සැලකිල්ලට ගෙන නොමැති බැවිනි.

(ආ) සාමූහික පදනමක් මත සහ පෞද්ගලික පදනමක් මත ඉඩම් අයිතිය ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකක් වශයෙන් අවධාරණය කිරීමේ හේතුවෙන්, ඉඩමෙහි කොටසක් සාමූහිකවත් තවත් කොටසක් පෞද්ගලිකවත් ගොවිතැන් කළ හැකි වන්නේය යන්න හෝ ඉඩම් අයිතිය පෞද්ගලිකව පැවතුනත් ශ්‍රම යෙදවුම් හා සේවා (ණය, අලෙවිය, යන්ත්‍රෝපකරණ යනාදිය) සාමූහික වශයෙන් සංවිධානය කළ හැකිය යන කරුණු පිළිබඳ අවධානය මග හැරී යන්නේය.

(ඇ) ඉහත 5 (අ) ඡේදයෙහි සඳහන් කර ඇති අතිරේක සාධක වලින් ඉතාමත් වැදගත් වනුයේ කළමනාකරණයයි. ජනාවාසිකයින් විසින්ම සිය කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ අවශ්‍යතාවය පොදුවේ පිළි ගනු ලැබුවත් මෙම වගකීම් භාරය නිලධාරීන්ගෙන් ඉවත් කර සාමාජිකයින්ට පැවරීමේදී තදබල අකමැත්තක් දක්වා ඇත. මෙම වගකීම් භාරය පවරා ඇති අවස්ථාවලදී ඒ කැටුව යා යුතු පුහුණුව හා සේවා සැපයීම නිතරම ප්‍රමාණවත් වී නැත. බැහැරින් යොදවන ලද කළමනාකරණ ක්‍රමයක් අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුකොටගෙන සාමාජිකයින් තුළ ඇති ධෛර්යය හා ආත්ම විශ්වාසය අතිශයින් හීන වීමට තුඩු දී ඇත.

(ඈ) සාමාජිකයින් තෝරා ගැනීම තීරණාත්මක සාධකයක් ලෙස නිතරම පිළි ගනු ලැබේ. එහෙත් අධ්‍යයනයෙන් පෙනී යනුයේ මෙතෙක් යොදාගෙන ඇති සාමාජිකයින් තෝරා ගැනීම පිළිබඳ එකම කාර්ය පටිපාටියක් මගින්වත් "නිවැරදි වර්ගයේ" සාමාජිකයින් තෝරා ගැනීම තහවුරු කළ නොහැකි බවයි. සාමාජිකයින් බහුල සංඛ්‍යාවක් ජනාවාස අත්හැර යාම වැළැක්විය නොහැක්කකි. පිටස්තර පුද්ගලයින් විසින් කරනු ලබන ආරම්භක තෝරා

ගැනීමෙන් පසුව "සාමාජිකයින් මගින් කරනු ලබන තෝරා ගැනීමක්" වුවමනින්ම අවැඩදායක නොවන්නට පිළිවන.

(ඉ) සියළුම වර්ගයේ යෝජනා ක්‍රමවලදී මතු වූ තවත් වැදගත් සාධකයක් වූයේ ඒවායේ අනාගත පුරක්ෂිත භාවය පිළිබඳව දක්වන සැළකිල්ලයි. සමුපකාර ගම්මානවල වැඩි හරියක් සාමාජිකයින් ඒවායින් ඉවත්ව යන්නේ සාමූහික සංකල්පය ප්‍රතික්ෂේප කිරීමක් වශයෙන් නොව එම යෝජනා ක්‍රමයන්හි අනාගතය සම්බන්ධයෙන් දක්නට ලැබෙන අවිනිශ්චිත බව නිසාය.

(ඊ) ජනාවාස හා සම්බන්ධ ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම, ඒ එක් එක් ආයතනය විසින් ජනාවාස සම්බන්ධයෙන් අනුගමනය කෙරෙනු ලැබෙන මූලය, සමාජයීය හා පරිපාලන ප්‍රතිපත්ති එකිනෙකට වෙනස් වීම හේතුකොටගෙනද ගැටළු බොහෝ සංඛ්‍යාවක් උද්ගත වී ඇත. එක් එක් ආයතනය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සම්බන්ධ ඒකීයත්වයක් හා ප්‍රත්‍යක්ෂ බවක් මෙන්ම ඒවා අතර වඩාත් සම්බන්ධීකරණයක් බෙහෙවින් අවශ්‍ය බව අධ්‍යයනයෙන් යෝජනා කෙරේ.

6. එක් එක් ජනාවාස වර්ගය සාමූහිකත්වය පිළිබඳ සංකල්පයද සමානත්මතා වයද උපරිම වශයෙන් සාක්ෂාත් කර ගන්නේ යයිද, දෙවෙනි ඡේදයෙහි විස්තර කර ඇති අභිකූත් පරමාර්ථයන් ළඟා කර ගන්නේ යයිද යන පිළිගැනුම මත, විවිධ සමාජ–ආර්ථික හා කෘෂි – දේශගුණික තත්වයන් යටතේ සාමූහික ගොවිපලවල්වලටත්, පෞද්ගලික අයිතිය මත පදනම් වූ ගොවිපලවල්වලටත්, මේ දෙ ආකාරයම ඒකාබද්ධ කර ක්‍රියාත්මක කරනු ලැබෙන ගොවිපලවලටත් වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට ඇති බව මෙම අධ්‍යයනය අවසාන වශයෙන් දක්වයි. (7 වන පරිච්ඡේදය).

(අ) පිරිමැසුම් පරිමාණයන් සඳහා සහ කළමණාකරනයේ පහසුව තකා මහා පරිමාණයේ ආර්ථික මෙහෙයුම් අදාළ වන්නාවූද, සමාජය ඒකීය ස්වභාවයක වන්නාවූද, තරමක් දුරට නව ක්‍රමය කෙරෙහි සාමාජිකයින්ගේ බැඳියාවක් ඇත්තාවූද අවස්ථාවලදී සමූපකාර ගම්මාන වඩාත් යෝග්‍ය බව යෝජනා කරනු ලැබේ. මෙවැනි තත්වයන් ඉඩම් ප්‍රතිසංස්කරණ වතු යායවල සහ අභිකූත් අත් කර ගත් වතු යායවල හෝ මෙම දර්ශනය ක්‍රියාත්මක කිරීමට පෙළඹීම නිසා ඇතැම් කණ්ඩායම් විසින් සංවර්ධනය කරන ලද ගොවි පලවල්වල දක්නට ලැබේ. මෙම ගොවිපලවල්වල ඉඩම කුඩා කැබලිවලට කට්ටි කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති නොවිය යුතු අතර සාමාජිකයින්ගේ සාමූහික ප්‍රයත්නය සවිමත් කිරීම සඳහා සියළුම පුහුණුකිරීම් සහ සේවා පහසුකම් සැපයිය යුතු වේ.

(ආ) අභිකූත් තත්වයන් යටතේ පෞද්ගලික පවුල් ගොවිපලවල් හෝ පෞද්ගලික පදනම මත ඇති ගොවිපලවල් සමූපකාර ගොවිපලවල්ද සමඟ ඒකාබද්ධ කිරීම හෝ යෝග්‍ය විය හැකිය. එහෙත් එවැනි තන්හිදී පහත සඳහන් කරුණු පිළිබඳව ප්‍රමුඛත්වයක් දැක්විය යුතුය: සාමාජිකයින් කණ්ඩායමක් වශයෙන් එකට බැඳ තබන පරිදි සවිමත් සේවා

සමූපකාර සමිතියක් පිහිටුවීම, ශ්‍රම හුවමාරුව සහ අනිකුත් ආකාරයේ සාමූහික ක්‍රියා මාර්ග දිරි ගැන්වීම, අසමානාත්මතාවය වැඩීම වැළැක්වෙන පරිදි හා වඩාත් උසස් ස්වරූපයක සාමූහිකත්වයකට ක්‍රමයෙන් පරිවර්තනය වන පරිදි සැළැස්ම සහ පවුල් බිම් කැබලි නියම කිරීම යනාදියයි.

7. සමූපකාර, පෞද්ගලික සහ මේ දෙකම ඒකාබද්ධ කරන ලද අනාගත යෝජනා ක්‍රම පිහිටුවීමේදී පිළිපැදිය යුතු යයි සැළකෙන මූලික උපදෙස් 7 වන පරිච්ඡේදයෙහි දැක්වේ. පහත සඳහන් කරනුයේ ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කර ඇති යෝජනාය.

(අ) අයිතියේ ස්වරූපය: ඉඩම සාමූහිකව හෝ පෞද්ගලිකව වගා කෙරෙනු ලැබෙන විට එහි අයිතිය දීර්ඝකාලීන බදු ක්‍රමයක් යටතේ විය යුතුය. එසේම ඉඩම් භාවිතය, පැවරීම සහ අවිනිශ්චිත බව පිළිබඳ හැකිම් ඉවත් කෙරෙන කොන්දේසි නියම කළ යුතුය.

(ආ) භෞතිකමය සැළසුම: ජනාවාසය සැළසුම් කර එහි ප්‍රමාණය සහ ස්වරූපය නියම කළයුත්තේ සාමූහික සංකල්පය, අභ්‍යන්තර සම්බන්ධතාවය සහ අසල්වාසීන් සමඟ ඒකාග්‍රතාවය වැඩි දියුණු වන පරිද්දෙනි.

(ඇ) ආර්ථික සැළසුම: සියළුම ව්‍යාපාරයන් පිළිබඳ පිරිවැය සහ ප්‍රතිලාභ අවුරුදු 3–5 ක කාල පරිච්ඡේදයක් සඳහා ඇස්තමේන්තු කළ යුතුය. හැකි සෑම අවස්ථාවකදීම යෝජනා ක්‍රමය සැළසුම් කිරීමෙහි ලා සාමාජික සහභාගිත්වය ලබා ගත යුතුය.

(ඈ) සාමාජිකයින් තෝරා ගැනීම: සාමාන්‍යයෙන් සාමාජිකයින් තෝරා ගනු ලැබිය යුත්තේ සිරිත් පරිදි වූ නිශ්චය පිළිමට අනුව අසල්වැසි ගම් වලිනි. ජනාවාසයේ පරමාර්ථයන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් සහ සාමාජිකයින් යෝජනා ක්‍රමයට සම්බන්ධ වූ සැනින් ඔවුනට පුහුණුවීමේ පහසුකම් ලබා දිය යුතු අතර ඔවුන් බඳවා ගත යුත්තේ මාස 6 ක පමණ පරිවාස සේවා කාලයකට යටත්වය.

(ඉ) මුදල්: ජනවාසිකයින් නොවන ගොවීන්ට ලබා ගත හැකි සහනාධාර ක්‍රම පිළිබඳ අවස්ථාවලදී හැරෙන්නට අනෙක් අවස්ථාවලදී සියළුම සංවර්ධන වියදම් පිරිනැමිය යුත්තේ ණය වශයෙනි.

(ඊ) කළමනාකරණය: සූක්ෂම මාර්ගෝපදේශකත්වයක් සහ පුහුණු කරන ලද රජයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව පූර්ණ වගකීම සමූපකාර සමිතිය මගින් සාමාජිකයින්ට පැවරිය යුතුය. කළමනාකරණ තනතුරුවලට නිලධාරීන් පත් කරනු ලැබෙන විට සීමිත කාලසීමාවකින් පසු ඔවුන් එම තනතුරු වලින් ඉවත් කිරීම තහවුරු විය යුතුය.

(උ) පුහුණුව: සංකල්පය, සංවිධානය හා ශිල්පීය ක්ෂේත්‍රයන්හි වැඩ කටයුතු සම්බන්ධයෙන් සාමාජිකයින්ට මෙන්ම නිලධාරීන්ටත් අඛණ්ඩ පුහුණුවක් කාර්යයෙහි නිරත වන ගමන්ම දිය යුතුය.

(ඌ) අසල්වැසි ගම් සමඟ ඒකාග්‍රතාවය: මෙය වැඩි දියුණු කළ යුත්තේ අසල්වැසි ගම් වලින් සාමාජිකයින් තෝරා ගැනීම, සේවාවන් හුවමාරු කර ගැනීම, ග්‍රාමීය ආයතනවල කටයුතුවලට ඒකාබද්ධව සහභාගී වීම, ඒකාබද්ධ අභ්‍යාස පාඨමාලා හා සංස්කෘතික කටයුතු ආදිය මගිනි.

8. මෙම අධ්‍යයනය තුළින් පුළුල් ප්‍රශ්න ගණනාවක් උද්ගත වේ. එහෙත් අධ්‍යයනය වෙනුවෙන් නියම කරන ලද සීමිත පරමාර්යන් හා අධ්‍යයනය කරගෙන යනු ලැබූ කාල පරිච්ඡේදයේ සීමාවන් අනුව මෙම ප්‍රශ්නවලට සම්පූර්ණ පිළිතුරු සපයා නොමැත.

(අ) එක් ප්‍රශ්නයක් නම්, සම්පූර්ණ කෘෂිකාර්මික සංවර්ධන උපාය මාර්ගයෙහිදී ඉඩම් ප්‍රතිසංස්කරණයට ඉටු කළහැකි වැඩ කොටස සහ විවිධ මාදිලියේ ඉඩම් බෙදා දීම හා කළමනාකරණය තුළින් (කුඩා ඉඩම් හිමියන්, සමූපකාර ජනාවාස, රාජ්‍ය සංස්ථා ආදී වශයෙනි) ඵලදායිතාවය, සේවා අවස්ථා සැපයීම සහ ආදායම් ව්‍යාප්තිය කෙරෙහි ඇති වන බලපෑමයි.

(ආ) තවත් ප්‍රශ්නයක් වනුයේ ජන සමූහය අළුත් පෙදෙස්වලට සංක්‍රමණය කිරීම සම්බන්ධ වන නව ජනාවාස ක්‍රමය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයට කවර ආකාරයකින් දායක වන්නේද යන්නයි. විශාල වශයෙන් ජන සමූහ තවත් තැනකට ගෙන යාමේදී සමාජයීය වශයෙන් හා ආර්ථික වශයෙන් නොයෙකුත් වියදම් අදාළ වන හෙයින් එවැනි තත්වයන් වළකාලමින් නව ජනාවාසයන්හි ඉඩම් හැකි සෑම අවස්ථාවකදීම එම ප්‍රදේශවලම ජනතාවට දිය යුතු බව අධ්‍යයනයෙන් යෝජනා කෙරේ.

(ඇ) නව ජනාවාසවල සහ දැනටමත් සංස්ථාපිත යෝජනා ක්‍රමයන්හි ජන සමූහය, ආදර්ශනයක් වශයෙන් අවට පෙදෙස් කෙරෙහි බලපෑම් පවත්වමින් හා ද්විතියක ප්‍රතිලාභයන් ගෙන දෙමින්, සංවර්ධන ඒකකයන් ලෙස ඒකාබද්ධ කළ යුත්තේ කවර ආකාරයකින්ද යන බව තෙවන ප්‍රශ්නයයි.

ආයතනය විසින් අනාගතයේදී අපේක්ෂා කරනු ලබන පර්යේෂණ අධ්‍යයනවලට මෙම ප්‍රශ්න තුන පදනම් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

### අධ්‍යයනය පිළිබඳ මූලික කරුණු

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වගා නොකළ ඉඩම්වල ගොවීන් පදිංචි කරවීම කලක සිටම ක්‍රියාත්මක වූ අතර ඒ පිළිබඳව නොයෙකුත් වාර්තා ඉදිරිපත් කර ඇත. එම වාර්තා අනුව ජනාවාස ඇති කිරීමේ මුල් අවස්ථාවලදී ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය ඉතා අධික බව පෙනේ. විශේෂයෙන්ම වාරිමාර්ග පහසුකම් ඇති කිරීම සඳහා වැය කළ මුදල් පියවීමට එයින් ලැබුණු ආදායම් ප්‍රමාණවත් නොවීය. එපමණක් නොව විස්තර ගොවීන් පදිංචි කරවීමේදී ජන හෝ සමාජ සංවර්ධනය පිළිබඳව යෙදවූ අවධානය අල්ප වීම නොයෙකුත් සමාජ ප්‍රශ්නවලට හේතු වී ඇත.1/

දැඩි ආත්ම විශ්වාසයකින් හෙබි දියුණු ජන සමාජ ගොඩ නැංවෙන පරිදි නව ජනාවාස ඇති කිරීම මෑත කාලයක සිට රජයේ ප්‍රතිපත්තිය විය. මෙම අළුත් වැඩ පිළිවෙල යටතේ 1966 දී මුලින්ම තරුණයන් පදිංචි කරවීමේ ව්‍යාපාර ආරම්භ විනි. උගත් තරුණයන් කෘෂිකර්මයෙහි යෙදවීම මෙහි මූලික අදහස විය. ඉන්පසුව 1970/71 දී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ සමූපකාර ගොවිපලවල්ද, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රමද පිහිටුවන ලදී. ස්වයං-පාලනය හා සමූහ නිෂ්පාදනය පිළිබඳව අභ්‍යාසයක යෙදීම මෙම සමූහ ගොවිපලවල් හා සමූපකාර ගම්මාන පිහිටුවීමේ එක් පරමාර්ථයක් විය. සමූපකාර පාලන ක්‍රමයක් යටතේ තරුණයන්ට වැඩි වැඩියෙන් රැකියා සැපයීම දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම පිහිටුවීමේ එක් අරමුණක් විනි. 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සම්මත වීමෙන් පසු තෙත් කලාපයේ හා අතරමැදි කලාපයේ, සංවර්ධිත හා සංවර්ධිත නොවූ ඉඩම් විශාල ප්‍රමාණයක් ජනාවාස පිහිටුවීම සඳහා ලබා ගත හැකි විය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මෙසේ පවරා ගත් ඉඩම්, ජනාවාස ඇති කිරීම සඳහාත් පුද්ගලයින් සඳහාත් එමෙන්ම රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා හෝ සමූපකාර පිහිටුවීම සඳහාත් යොදා ගැනීමට කටයුතු සැළැස්වීය.

මෙම විවිධාකාර වූ ව්‍යාපාරවල පරමාර්ථයන් බොහෝදුරට එක සමාන වන අතර ඒ හැම එකක්ම එකිනෙක තුලින් ලද අත්දැකීම් හා පැරණි ජනපද ව්‍යාපාර ආදර්ශයට ගෙන ඇති බවට සැකයක් නැත. මෙසේ, මෙම සිවු ආකාරයේ වූ යෝජනා ක්‍රම පිළිබඳ

---

1/ මෙම වාර්තා වලින් එය මනාව පැහැදිලි වේ.
ලංකාවේ පුරෝගාමී ගොවි ජනපද - බී.එච්. ෆාමර්.
ගල්ඔය ජනපදය අගය කිරීමේ කොමිටි වාර්තාව ( කාලීන පත්‍ර අංක 1 - 1970)
ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාර තක්සේරු කිරීම (ආ.කෘ.සං. 1968)
ජේ.සී.සී.හාට්ඩින්ජ්.

සංසන්දනාත්මක අධ්‍යයනයක් කර නොමැති නිසා මේවා සැලසුම් කරන හා ක්‍රියාත්මක කරන අයට එකිනෙකෙහි ඇති දුෂ්කරතාවයන් හා සඵලත්වයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අපහසු වී ඇත. මෙම අධ්‍යයනය එම අඩුපාඩුව බොහෝදුරට මඟ හරවන්නක් බව අපේ විශ්වාසයයි.

## 1.1 අධ්‍යයනයේ පරමාර්ථ

(අ) තරුණ ගොවි යෝජනා ක්‍රම, සමූපකාර ගොවිපලවල්, දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපාර හා ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස වලින් තෝරා ගත් නියැදියක ශිල්පීය, ආර්ථික, සමාජ හා පරිපාලන අංශයන්හි ක්‍රියාකාරීත්වයන් අගය කිරීම.

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස මෑතදී පිහිටුවනු ලැබූ ඒවා වන හෙයින් ඒවාහී සැලසුම් විශ්ලේෂනය කිරීම් හා ඒවායින් මතු විය හැකි ප්‍රශ්න හඳුනා ගැනීම.

(ඇ) ඉහත සඳහන් ව්‍යාපාරයන් සහ අලුතින් පිහිටුවනු ලැබූ ව්‍යාපාරවල සැලසුම් වැඩි දියුණු කළ හැකි මාර්ග පෙන්වා දීම.

(ඈ) එක් එක් ආකාරයේ ජනාවාස වලින් උගත් පාඩම් මතු කොට දැක්වීම හා ඒවා අනිකුත් යෝජනා ක්‍රම හා සම්බන්ධ වන අයුරු පහදා දීම.

(ඉ) අනාගතයේදී පිහිටුවන නව ජනාවාස සඳහා මග පෙන්වීම් පිළියෙල කිරීම.

## 1.2 නියැදිය තෝරා ගත් අයුරු

මෙම අධ්‍යයනය ආරම්භ කරන අවස්ථාවේදී තරුණ යෝජනා ක්‍රම 43 ක් ද, සමූපකාර ගොවිපලවල් 27 ක් ද, දිස්ත්‍රික් සංවර්ධන යෝජනා ක්‍රම 350 ක් ද, ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස 16 ක් ද ක්‍රියාත්මක වෙමින් පැවතුනි. වගා කරන භෝග, ආයෝජන ප්‍රමාණය, පරිපාලන ක්‍රම, සාමාජිකයින්ගේ ස්වභාවය යනාදී අංශ ගැන සලකා බැලීමේදී මෙම ව්‍යාපාර අතරෙහි සැළකිය යුතු වෙනසක් තිබුණද, විශාල සංඛ්‍යාවක් අධ්‍යයනය කරනවාට වඩා තෝරා ගත් නියැදියක ගැඹුරු අධ්‍යයනයක් කිරීම සුදුසු බව තීරණය කරන ලදී. විවිධ ආකාරයේ ව්‍යාපාර හොඳින් සංසන්දනය කළහැකි පරිදි එක් එක් ආකාරයේ වූ විචලයයන් හොඳින් නියෝජනය වන අයුරින් ජනාවාස පහ බැගින් තෝරා ගන්නා ලදී. මෙසේ තෝරා ගත් ජනාවාස 20 පහත සඳහන් 1-1 සටහනෙහි දැක්වේ. නියැදිය තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා මාර්ගය පළමුවන පුවියෙහි දැක්වේ. නියැදියෙන් හරිහැටි ආයෝජනය නොවුන දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපාරයන්ට විශේෂ තැනක් දෙමින් සවිස්තරාත්මක අධ්‍යයනයේ පිළිබිඹු වූ කරුණු තහවුරු කර ගැනීම සඳහා තෝරා ගත් 20 ට අමතරව වූ අනිකුත් ව්‍යාපාර පිළිබඳවද දළ අධ්‍යයනයක් කරනු ලැබීය.

සටහන 1–1 තෝරා ගත් ජනාවාස (1 වන සිතියම බලන්න)

| තරුණ යෝජනා ක්‍රම | සමුපකාර ගොවිපලවල් | දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපාර | ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස |
|---|---|---|---|
| 1. විස්වමඩුකුලම යාපනය | 1. උස්සනගම කෑගල්ල | 1. පිද්දෙනිය හම්බන්තොට | 1. පෙරපිස් කුරුණෑගල |
| 2. මහපිපිටිය පොළොන්නරුව | 2. ප්‍රොවිඩන්ස් ගාල්ල | 2. තෝනිගල අනුරාධපුරය | 2. දම්බුලගේන කොළඹ |
| 3. යට්ටපාත – පිහියවෙල කළුතර | 3. ගිලීමලේ රත්නපුරය | 3. අරන්ගල මාතලේ | 3. කෝමැන්ඩි කුරුණෑගල |
| 4. මන්ඩලපුර ගාල්ල | 4. පීපිලිමාන නුවරඑළිය | 4. උප්පුවේලි ත්‍රිකුණාමලය | 4. යැරෝ මහනුවර |
| 5. කුඩාඔය නුවරඑළිය | 5. බද්දේගම ගාල්ල | 5. මැද පළාත මහනුවර | 5. පාන්හැම් කොළඹ |

1.3 ක්ෂේත්‍ර පරීක්ෂණය කළ ආකාරය

පරීක්ෂණය පියවර හතරකින් යුක්ත විනි.

1.3.1 විවිධ වර්ගයේ සෑම ජනාවාසයක් පිළිබඳවම වූ මූලික තොරතුරු ඊට අදාළ දෙපාර්තමේන්තුව හෝ ආයතනය මඟින් ලබා ගන්නා ලදී. (මෙම තොරතුරුම සවිස්තරාත්මක අධ්‍යයනයක් සඳහා නියැදියක් තෝරා ගැනීමේදීද භාවිතා කරන ලදී.)

1.3.2 නියැදියට හසු වූ එක් එක් ජනාවාසය පිළිබඳව වග කිව යුතු දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර ඊට අදාළ ලියවිලිද පරීක්ෂා කරන ලදී.

1.3.3 පර්යේෂණ නිලධාරියෙකු හා පරීක්ෂකයෙකු දින 2 – 3 ක් පමණ එක් එක් ව්‍යාපාරයේ ගත කළ අතර එහිදී අනුගමනය කළ ක්‍රියා මාර්ග පහත දැක්වේ:

(අ) පර්යේෂණ නිලධාරියා ගොවි මහතුන් හා ජනාවාසය භාර නිලධාරියා සමඟ සාකච්ඡා පැවැත්වූවා පමණක්නොව ලිපි ගොනු හා වාර්තා පරීක්ෂා කරමින් සමුපකාර කමිටුව (පිහිටුවා තිබුණේ නම්) සමඟ හෝ මුළු සාමාජික සංඛ්‍යාවම නියෝජනය වන පරිදි තෝරා ගත් ගොවීන් සමූහයක් සමඟද සමූහ සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡාවලදී ලබා ගත් තොරතුරු ඒ සඳහා පිළියෙල කරන ලද ප්‍රශ්න මාලාවක් ඇසුරින් වාර්තාගත කරනු ලැබීනි.

(ආ) ජනාවාසයෙහි සෑම තරාතිරමක්ම නියෝජනය වන පරිදි තෝරා ගත් සාමාජිකයින් 5 – 10 ක සංඛ්‍යාවක් සමඟ සමීක්ෂක විසින් සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබීය. (කමිටුවෙහි සාමාජිකයින් හා සාමාන්‍ය සාමාජිකයින්, ගැහැනු හා පිරිමි, දියුණු හා නොදියුණු ගොවීන් ආදී සියළු ගොවීන් හසු වන සේ) මේ ආකාරයට පෞද්ගලික සම්මුඛ සාකච්ඡා වලින් ලබා ගත් ප්‍රමාණාත්මක තොරතුරු වලින් වැඩි හරියක් විශේෂයෙන්ම, ඒ සඳහා පිළියෙල කරන ලද ප්‍රශ්න මාලාවක සටහන් කර ගැනීමෙන් පසු වගු ගත කොට සම්මුඛ පරීක්ෂණ මග පෙන්වීමක් ආධාරයෙන් සමූහ සාකච්ඡා වලින් ලබා ගත් තොරතුරු තහවුරු කර ගන්නා ලදී. හැකි සෑම අවස්ථාවකදීම මෙසේ නියමාකාරයට කළ සම්මුඛ සාකච්ඡාවලට අමතරව පර්යේෂණ නිලධාරියා හා සමීක්ෂක ජනාවාසයේ නැවති නිලධාරීන් හා සාමාජික මහතුන් සමඟ දැඩි මිත්‍ර සම්බන්ධතාවයක් ඇති කර ගනිමින් අනියම් ආකාරයට තොරතුරු සොයා බලමින් තමන් රැස් කර ගත් තොරතුරුවල නිවැරදි බව අවබෝධ කර ගන්නා ලදී. විවිධ මූලාශ්‍ර වලින් තොරතුරු ලබා ගැනීමද (කච්චේරි, කමිටුවේ සාමාජිකයන්, ගොවීන්ගෙන් හා අසල්වැසි ගොවීන්ගෙන්) සමූහ සාකච්ඡා වලින් ලබා ගත් තොරතුරු පෞද්ගලික සාකච්ඡා මගින් තවත් පැහැදිලි කර ගැනීමද නිසා මෙම තොරතුරුවල නිරවද්‍යතාවය තවත් තහවුරු කර ගනු ලැබිණ.

## 1.4 ජනාවාස අගය කළ ක්‍රමය

1–2 සටහනෙහි දක්වා ඇති සාධක භාවිතා කිරීමෙන් අධ්‍යයනය කළ ජනාවාස විස්ස අගය කරන ලදී. සිව් ආකාර ව්‍යාපාරවලට අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රතිපත්ති පත්‍රිකා වලින් ඉහත කී මිනුම් දඬු උපුටා ගනු ලැබීය. (ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සංවර්ධන අංශය, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම) මෙම වාර්තාවේ අදාළ පරිච්ඡේදයන්හි, එක් එක් වර්ගයේ ජනාවාසවල පරමාර්ථයන් පිළිබඳව විස්තර කර ඇති අතර සාමාන්‍ය පරමාර්ථයන් හැම වර්ගයකටම පොදුය.

**සටහන 1–2 නව ජනාවාස ප්‍රතිපත්තියෙහි පරමාර්ථ**

| අංගය | | අවශ්‍යතාවය |
|---|---|---|
| 1. පිහිටුවීමේ වියදම | : | හැකිතරම් අඩු විය යුතුය. සහනාධාර අවම විය යුතුය; ජනාවාසිකයින්ගේ ධෛර්‍යය මත උපරිම රඳා පැවැත්ම. |
| 2. නඩත්තු වියදම් | : | කෙටිකාලීන බැංකු ණය වලින්; වාර්ෂික වියදම් පියවීමට සමත් ආදායමක් තිබිය යුතුය. |

| අංගය | | අවශ්‍යතාවය |
|---|---|---|
| 3. සංවර්ධන වේගය | : | හැකිය හැකි ඉක්මනින් නිෂ්පාදිත තත්වයට ගෙන ආ යුතුය; ඉක්මනින් ලාභ ගෙන දෙන කෙටි කාලීන භෝග වගා කළ යුතුය. |
| 4. ගොවියාගේ ආදායම | : | ජනාවාසිකයින් හට විවෘතව තිබෙන අනිකුත් රැකියා වලින් අපේක්ෂා කළ හැකි ආදායම සමඟ සංසන්දනය කළ හැකි විය යුතුය; (ශුද්ධ ආදායම රු. 250/- සිට 300/- ක් මසකට) |
| 5. ආදායම් හා ධන ව්‍යාප්තිය | : | ජනාවාසිකයින් අතර අධික ආර්ථික අසමානතාවයක් ඇති වීම වැළැක්විය යුතුය. |
| 6. ශ්‍රම භාවිතය හා පංති සංවර්ධනය | : | ජනාවාසිකයන් විශේෂයෙන්ම සිය ශ්‍රමය මතම යැපිය යුතුය; සාමාජික විෂමතාවයන් ඇති වීමට තුඩු දෙන කුලී ශ්‍රමය පුණි වශයෙන් උපයෝගී කර ගැනීම වැළැක්විය යුතුය. |
| 7. පාලනය | : | ජනාවාසිකයන් මූලික වශයෙන් ස්වයං-පාලනයට පුරුදු විය යුතුය; රජයේ නිලධාරින්ගේ සහාය අධික ලෙස බලාපොරොත්තු නොවිය යුතුය. |
| 8. සහභාගිත්වය | : | සෑම කාර්යයකදීම හොඳ සහයෝගයකින් යුතුව (ණය ලබා ගැනීම, අලෙවිය, සැපයුම, ශ්‍රම භාවිතය, පාලනය හා නිෂ්පාදන ක්‍රම හිමිකාරත්වයේදී පවා) කටයුතු කිරීම දිරි ගැන්විය යුතුය. |
| 9. ආදර්ශ දීමේ හැකියාව | : | අසල්වාසී ජනතාවට අනුගමනය කළ හැකි වන පරිදි ජනාවාසය හොඳ ආදර්ශයක් විය යුතු අතර එය අසල්වැසියන්ගෙන් වෙන් වූ ස්ථානයක් නොවිය යුතුය. |

මූලාශ්‍ර: (අ) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - තරුණ ජනාවාස පිළිබඳ අත් පොත, 1966-11-01 සහ පසුව නිකුත් කළ චක්‍රලේඛ.

(ආ) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය - සමූපකාර ගොවිපළ මගින් කෘෂිකර්ම සංවර්ධනය, 1971-09-22

(ඇ) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය - දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල මගින් කෘෂිකර්ම සංවර්ධනය, 1971-08-19

(ඈ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අංක 1 - 1972 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ චක්‍රලේඛ.

අගය කිරීම කොටස් දෙකකින් යුක්තය:

(අ) කාණ්ඩය තුළ අගය කිරීම: 1–2 සටහනෙහි දක්වා ඇති සාධක මත සිව් ආකාර ව්‍යාපාරයන්ගෙන් එක් එක් ආකාරයට අයිති ජනාවාස පෞද්ගලිකව අගය කරන ලදී. මෙහිදී කුමන ව්‍යාපාරයන් මගින් කුමන සාධකයන් සපුරාලන්නේදැයි හෝ කුමන තත්වයන් යටතේ එක් එක් ආකාරයේ ව්‍යාපාරයන් ඉතා හොඳින් ක්‍රියා කරන්නේදැයිද සොයා බලන ලදී.

(ආ) කාණ්ඩ අතර අගය කිරීම: සිව් ආකාර ව්‍යාපාර සාමූහිකව ගෙන ඉහත සඳහන් පදනම මතම පරීක්ෂා කරන ලදී. මෙහිදී කුමන පරමාර්ථයන් කුමන ආකාරයේ ව්‍යාපාර වලින් සපුරාලන්නේද යන බව හෝ එක් එක් ආකාරයේ ව්‍යාපාරයන්ගෙන් බලාපොරොත්තු වූ පරමාර්ථයන් ආසන්න වශයෙන් හෝ සපුරාලන්නේ කුමන තත්වයන් යටතේදැයි සොයා බලන ලදී.

## 1.5 අධ්‍යයනයේ සීමා

අගය කිරීමට හා අවසාන නිරණයන්ට එළඹීමට තුඩු දුන් සමහර ප්‍රමාණාත්මක දත්තයන්ගේ සාවද්‍යතාවයද, නියැදියේ ප්‍රමාණයද, සමහර දත්ත ප්‍රමාණාත්මක කිරීමේ අපහසුවද යන මේවා මෙම අධ්‍යයනය විවේචනයට හසු වන ප්‍රධාන කරුණු තුන වේ.

1.5.1 නියැදියේ ප්‍රමාණය: එක් එක් වර්ගයෙන් ජනාවාස පහක් බැගින් තෝරා ගැනීම නිසා නියැදිය සෑහෙන දුරට කුඩා වූ අතර සංඛ්‍යාව විශාල වූ දිස්ත්‍රික්ක සංවර්ධන මණ්ඩල ගැන සළකා බැලීමේදී මෙය කොහෙත්ම ප්‍රමාණවත් නොවීය. කෙසේ වුවද ප්‍රධාන වෙනස්කම් හොඳින් නියෝජනය වන පරිදි නියැදිය ඉතා ප්‍රවේසමෙන් තෝරා ගත් අතර අධ්‍යයනය කරන කාලයේදී හා ඊට පෙර, සංසදනය කිරීම සඳහා තවත් අතිරේක ජනාවාස සංක්ෂිප්තව නරඹන ලදී. දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල හැරෙන්නට, අනිකුත් ව්‍යාපාර ආකාරයන්ගේ ප්‍රධාන ගුණාංග හා උගත හැකි පාඩම් එතු කර දැක්වීමට තෝරා ගත් නියැදිය හොඳාකාරව ප්‍රමාණවත් වේ.

1.5.2 ප්‍රමාණාත්මක දත්තයන්ගේ සාවද්‍යතාවය: ආයෝජන ප්‍රමාණය හා නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා හරියටම නිවැරදි ඒවා නොවීය. ආයෝජනය පිළිබඳ සංඛ්‍යා හරියාකාරව සෑමවිටම වාර්තා නොකරන බැවින් සුළු සුළු වැරදි තිබිය හැකිය. (තරුණ ව්‍යාපාරයන්හි ආයෝජනයන් දෙපාර්තමේන්තු කිහිපයක් අතර බෙදී යන හෙයින් හරි තොරතුරු හෙළිදරව් කර ගැනීම අපහසුය.) සාමාන්‍යයෙන් ගොවීන්ගේ සිරිත නිෂ්පාදනය හා ආදායම පිළිබඳ දත්ත අඩුවෙන් පෙන්වීමයි. මෙම කරුණු දෙකෙහෙදීම දත්ත වැඩියෙන් ප්‍රකාශ කිරීමට වඩා අඩුවෙන් කීම සාමාන්‍යයෙන් සිදු වන හෙයින් ඇති වන වැරදි දළ වශයෙන් ශුන්‍ය වී යයි.

1.5.3 අගය කිරීමේ අදහස: සමාජයීය සම්බන්ධතාවයන් හා ආකල්පයන් තේරුම් ගැනීම හා ආයෝජන හා නිෂ්පාදන ප්‍රමාණය වැනි ප්‍රමාණාත්මක දත්ත සම්බන්ධ වූ මෙවැනි අධ්‍යයනයක් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම අපහසුය. කෙසේ වුවද ජනාවාස හා සම්බන්ධ වී ඇති විවිධ තරාතිරම්වල පුද්ගලයන්ගෙන් තොරතුරු එකතු කිරීමෙන් හා අදහස් විමසීමෙන්ද ශිල්පීය, ආර්ථික, සමාජ හා පරිපාලනමය ආදී විවිධ විස්තරාත්මක අදහස් පිළිබඳ පුළුල් තොරතුරු ලබා ගැනීම නිසාද මෙම අධ්‍යයනය සෑහෙන දුරට සාර්ථක එකක් වන බව අපගේ විශ්වාසයයි.

## 1.6 නිර්වචන

මෙම අධ්‍යයනය හා සම්බන්ධ පාරිභාෂික වචන ශ්‍රී ලංකාවේ භාවිතා වන ක්‍රමය අනුව සමහරවිට ව්‍යාකූල බවක් පෙන්විය හැකිය. ඒ නිසා මෙම වාර්තාවෙහි ඇති සමහර පදවල අර්ථ පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) ජනාවාස: මෙයින් සාමාන්‍යයෙන් හඳුන්වන්නේ ජන ජීවන තත්වය උසස් කිරීමේ අදහසින් එක් ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයකට, සැලසුමකට අනුව මාරු කරන ලද ජනගහනයකි. නමුත් මීට වඩා පුළුල්ව, දැනටමත් ජනයා පදිංචි වී සිටින ප්‍රදේශවල රැකියා ලබා ගැනීමට ඇති අවස්ථා වැඩි කර (එසේ නැතහොත් ජනයා එම ප්‍රදේශ වලින් බැහැරව යන නිසා) නව ප්‍රජාවක් බිහි කිරීමේදීද භාවිතා වෙයි.


(ආ) පුද්ගලික බිම් කොටස්: පුද්ගලයෙකුට බෙදා වෙන් කර දෙන ලද, බිම් කැබැල්ලක් මෙයින් අදහස් කෙරේ. මෙම බිම් කැබැල්ල වගා කිරීම ඔහු හා ඔහු පවුලේ අය විසින් හෝ කුලී කරුවන් ලවා හෝ කළහැකි අතර එයින් ලැබෙන ලාභය ඔහුට හා ඔහු පවුලට අයත්ය.

(ඇ) සේවා සමූපකාර සමිති: පෞද්ගලික බිම් කැබලිවල වාසය කරන ගොවීන් සමූහයකට ණය, අලෙවිය හා අනිකුත් පහසුකම් ලබා දෙන සංගමයක් මෙයින් අදහස් කෙරේ.

(ඈ) සමූපකාර/සමූහ ගොවිපල: තනි ඒකකයක් වශයෙන් පාලනය වන එහෙත් සාමාජිකයින් බොහෝ දෙනෙකුට අයිති ගොවිපලකි. සාමාජිකයින් සිය ශ්‍රමය හා අනිකුත් සම්පත් මෙම ගොවිපල සඳහා යොදවා ඇති අතර එම යෙදවුම් ප්‍රමාණයන්ට සමානුපාතික වන පරිදි ලාභය බෙදීම සිදු වේ. ගොවිපලෙන් කොටසක් සාමාජිකයින්ට වෙන් කර දී ඇති එහෙත් විශාල

කොටසක් හවුලට පාලනය වන ගොවිපලවලටද මේ නම යෙදිය හැකිය. 'සමූපකාර' හා 'සමූහ' යන වචන දෙකම එකම අර්ථය දෙන අයුරු ශ්‍රී ලංකාවේ භාවිතා වන නමුත් වෙන් කර ගැනීමේ පහසුව තකා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මගින් පිහිටුවා ඇති ඒවා සමූපකාර ගොවිපලවල් වශයෙන්ද (3 වන පරිච්ඡේදය) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මගින් පිහිටුවා ඇති ඒවා සමූපකාර ජනාවාස හෝ (5 වන පරිච්ඡේදය) සමූහ ගොවිපල වශයෙන්ද හඳුන්වනු ලැබේ.

අධ්‍යයනය කළ ව්‍යාපාරවල පිහිටීම



# 2 වන පරිච්ඡේදය

## තරුණ ජනාවාස

### 2.1 තරුණ ජනාවාස වැඩ පිළිවෙල හඳුන්වා දීම

වසර නවසිය හැට ගණන්වල මැද භාගයේදී ඇස්තමේන්තු කරන ලද පරිදි රැකියා විරහිත තරුණයින්ගේ සංඛ්‍යාව දෙලක්ෂයක් වූ අතර මොවුන්ගේ වයස් පරාසය 19 – 25 අතර විය. මොවුන්ගෙන් 40% ක් පමණ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) දක්වා උගත් අය විහ. මෙම තරුණයන්ගෙන් බොහෝ දෙනෙකු නාගරික පරිසරය අනුව හැඩි වැඩී ඇතත් මොවුන්ගේ හැකියාවන් කෘෂිකර්මය කෙරෙහි යොමු කර එම ක්ෂේත්‍රය තුළින් ඔවුනට රැකියාවන් සපයාදීමේ අවශ්‍යතාවය හොඳින් අවබෝධ වෙමින් පැවතුනි.

ගොවිතැනෙහි පළපුරුදු එහෙත් ඉඩම් නැති, පවුල් බර අධික අයට ප්‍රමුඛස්ථානයක් දුන් නිසා ඒ අවධියේදී රැකියා විරහිත තරුණයන්ට ජනපදවල පදිංචි වීමට ඇති වූ අවකාශය ඉතා සුළු විය. නමුත් පසුව ජනපදිකයින් තෝරා ගැනීමේදී 10% ක් පමණ උගත් තරුණයින් තෝරා ගැනීමට ඉඩ කඩ සලසන ලද නමුත් එයින් ලද ප්‍රතිඵල එතරම්ම සතුටුදායක නොවූයේය. කෘෂිකර්ම අමාත්‍යාංශය සහ වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් හවුලේ 1966 දී ප්‍රථමවරට තරුණයන් සඳහා පමණක් ජනපද යෝජනා ක්‍රම ඇති කරන ලදී.1/

#### මූලික යෝජනා

රුපියල් දස ලක්ෂ 153 ක මුලු වියදමක් දරමින් 1965/66 සහ 1969/70 අතර කාලය තුළදී තරුණ ව්‍යාපාර 235 ක් ආරම්භ කිරීමට නියමිත විහ. (සටහන II–1) මෙම යෝජනා ක්‍රම සෑම එකකම සාමාජික සංඛ්‍යාව සියයක් පමණ වීමට අදහස් කෙරුණ අතර මොවුන් සාමූහිකව ඉඩම් එලි පෙහෙලි කිරීම හා සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරුණේය. පසුව පවුල් වශයෙන් කට්ටිවලට ඉඩම් බෙදා වෙන් කර ගැනීමේ හෝ නැතහොත් තනි ඒකකයක් වශයෙන් ඉඩම වගා කිරීමේ මනාපය පළ කිරීමට ඔවුනට හැකියාව තිබුණේය.

**සටහන II–1 තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ අදියරගත වැඩ පිළිවෙල 1966/70**

| වර්ෂය | සැලසුම් කරන ලද යෝජනා ක්‍රම සංඛ්‍යාව | පදිංචි කිරීමට නියමිත වූ තරුණයින්ගේ සංඛ්‍යාව | දරන ලද වියදම (ආසන්න වශයෙන්) රුපියල් දස ලක්ෂ |
|---|---|---|---|
| 1965 – 66 | 25 | 2500 | 16.3 |
| 1966 – 67 | 35 | 3500 | 22.8 |
| 1967 – 68 | 50 | 5000 | 32.6 |
| 1968 – 69 | 50 | 5000 | 32.6 |
| 1969 – 70 | 75 | 7500 | 48.9 |
| එකතුව | 235 | 23500 | 153,000,000/– |

මූලාශ්‍රය: කෘෂිකාර්මික තරුණ ජනාවාස පිළිබඳ අත්පොත.

---

1/ 1966–11–01 දින ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද කෘෂිකාර්මික තරුණ ජනාවාස පිළිබඳ අත් පොත බලන්න.

මෙම යෝජනා ක්‍රම ආරම්භ කිරීමට අදහස් කරන ලද්දේ පාංශු හා ජල තත්වය, ජනගහණය හා යටිතල පහසුකම් පිළිබඳව හොඳින් සමීක්ෂණය කිරීමෙන් පසුවය. ව්‍යාපාර බොහෝමයක්ම වාරිමාර්ග ක්‍රම යටතේ වැපුරු හෝ මිරිස් වැනි අතිරේක බෝග නිෂ්පාදනය මත පදනම් වූ අතර සමහරක් පොල් හා තේ යනාදිය මත පදනම් විය. නාගරික රැකියා සමග සැසඳිය හැකි සේ මසකට රු. 250 - 300 ක ආදායමක් උපැයීමට පිළිවන් වන පරිදි වගා පරිමානය සකස් කරන ලදී. විවිධ යෝජනා ක්‍රමයන්හි වගා පරිමානය හා තරුණයෙක් සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම පහත 11-2 සටහනෙහි දැක්වෙයි.

__සටහන 11-2__ __විවිධ යෝජනා ක්‍රමයන්හි තරුණයෙකු සඳහා අපේක්ෂිත වියදම__

| යෝජනා ක්‍රම වර්ගය | ඉඩම් ඒකකය ප්‍රධාන බෝගය සඳහා | ගෙවත්ත | තරුණයෙකු සඳහා සාමාන්‍ය වියදම රුපි. |
|---|---|---|---|
| කුරුන්ව වාරිමාර්ග (අතිරේක ආහාර බෝග) | අක්කර 2 (ජලය සැපයිය හැකි) | අක්කර 1 | 9,524.00 |
| උස්සාන වාරිමාර්ග (අතිරේක ආහාර බෝග) | අක්කර 2 (ජලය සැපයිය හැකි) | අක්කර 1 | 5,454.00 |
| පොල් | අක්කර 5 | - | 6,856.00 |
| වී.පී. තේ | අක්කර 2 | අක්කර 1/2 | 8,412.00 |
| කුරුඳු | අක්කර 2 | අක්කර 1/2 | 7,520.00 |
| එලවළු හා අර්තාපල් | අක්කර 1 - 1 1/2 | අක්කර 1/4 - 1/2 | 5,904.00 |
| පළතුරු | අක්කර 3 | අක්කර 1/2 | 10,025.00 |
| කරදමුංගු | අක්කර 2 1/2 | අක්කර 1/2 | 5,425.00 |
| කුකුල් පාලනය | තරුණයන් 30 කට කුකුලන් 5,000 | | 4,985.00 |

මූලාශ්‍රය: තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ වාර්තාව - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 1972 ජනවාරි.

මෙම තරුණ යෝජනා ක්‍රම දිස්ත්‍රික් මට්ටමින් පරිපාලනය කෙරෙනුයේ රජයේ දිසාපති හෝ දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන් මගිනි. එක් එක් ව්‍යාපාරය භාරව නිලධාරියෙකු පත් කළ යුතු වූ අතර ඔහුගෙන් අපේක්ෂා කරන ලද්දේ සිය බලතල යෙදවීම නොව තරුණයින් සමඟ ජීවත් වෙමින් එක්ව වැඩ කරමින් ඔවුන්ට මග පෙන්වීමයි. කෘෂිකාර්මික පසු බිමක් ඇති පවුල් වලින් තරුණයින් තෝරා ගනු ලැබුයෙන් ජන සමාජයක ජීවත් වීම සඳහා අනුවර්තනය විය හැකි ස්වභාවය ගැන

විශේෂ සැළකිල්ලක් දක්වන ලදී. යෝජනා ක්‍රමය හා සම්බන්ධ විවිධ කටයුතු පාලනය කිරීමෙහි ලා සහභාගිවන සමුපකාර සමිතිවල සාමාජිකත්වය ලැබීම තරුණයින්ගෙන් අපේක්ෂා කෙරිනි. තරුණයන් හා නිලධාරීන් යන දෙකොටසම මෙම අලුත් පාලන ක්‍රමයට හොඳින් පුහුණු කරනු ලැබීය.

තරුණ යෝජනා ක්‍රම ප්‍රධාන ජනපද ව්‍යාපාර වලින් වෙන් වන්නේ පහත සඳහන් අයුරිනි:

(අ) සංවර්ධන වැඩ සියල්ලක්ම තරුණයින් විසින්ම කළයුතු අතර ආහාර හා යැපීම් දීමනා පමණක් රජයෙන් ලබා දෙන ලදී. මෙයින් අදහස් කළේ වියදම අඩු කිරීමත් යෝජනා ක්‍රමය කෙරෙහි තරුණයන්ගේ බැඳියාව වැඩි කිරීමත්ය. නමුත් ජනපද ව්‍යාපාරවලදී බිම එළි පෙහෙළි කිරීම හා වාරිමාර්ග පහසුකම් සැලැස්වීම යන සියල්ලම රජය මගින් කරන ලදී.[1] තරුණ යෝජනා ක්‍රමවලට සහනාධාර සැපයෙන පිළිවෙල II-3 සටහනෙහි දැක්වේ.

(ආ) මුල් අවස්ථාවලදී තරුණයන් පොදු නිවහනක නවාතැන් ගත යුතු වූ අතර හවුලේ භූමිය සංවර්ධනය කළයුතු විය. අනාගත ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය පසුව නිගමනය කිරීමට නියමිත විනි. නමුත් ජනපද ව්‍යාපාරයන්හිදී පටන් ගැන්මේදීම ගොවීන්ට ඉඩම් කොටස් බෙදා වෙන් කර දෙන ලදී.

(ඇ) සමුපකාර සමිති මගින් තරුණයන් පාලන කටයුතුවල නිරත විය යුතු විනි. නමුත් ජනපදවලදී මෙම වගකීම ප්‍රධාන වශයෙන්ම ජනපදය භාර නිලධාරියා වෙත පැවරේ. ජනපදයකට වඩා තරුණ යෝජනා ක්‍රම ප්‍රමාණයෙන් කුඩා නිසා සමුපකාර කළමණාකරන ක්‍රමය වඩාත් පහසුය. (තරුණයන් 50 - 100 දක්වා)

(ඈ) ජනපදවල මෙන් වී ගොවිතැනට මුල් තැන දෙනවාට වඩා ඉලක්ක ආදායම වූ රු. 250/- සිට රු. 300/- ක් ලබා ගැනීම සඳහා වැඩි අගයකින් යුත් "මුදල් බෝග" සඳහා ප්‍රමුඛත්වයක් දෙන ලදී.

---

1/ පූර්ව ඉඩම් පවරා දීමේ ක්‍රමය යටතේ 1963 සිට ජනපදිකයින් හටද ඉඩම් එළි පෙහෙළි කිරීමට සිදු විය. මූලික වශයෙන් වාරිමාර්ග හා අනිකුත් පහසුකම් සැලසීමට ප්‍රමාද වීම නිසා පදිංචි කරුවන් එම ව්‍යාපාර අත්හැර දැමීමට පටන් ගත් හෙයින් 1969 දී මෙම ක්‍රමය අත්හැර දමන ලදී.

සටහන II-3 විවිධ යෝජනා ක්‍රමයන්හි එක් තරුණයෙකුට සහනාධාර ලබා දෙන පිළිවෙල

| කාර්යය | ගුරුත්ව වාරිමාර්ග | උස්සාන වාරිමාර්ග | වැලි දොඩම් ව්‍යාපාර | වී.පී. තේ ව්‍යාපාර |
|---|---|---|---|---|
| 1. ප්‍රවාහනය | 50.00 | 50.00 | 150.00 | 150.00 |
| 2. උපකරණ | 30.00 | 30.00 | 30.00 | 30.00 |
| 3. අඳුම් පැළඳුම් | 30.00 | 30.00 | 30.00 | 30.00 |
| 4. බීජ සඳහා | 60.00 | 60.00 | - | - |
| 5. පැළ සඳහා | - | 50.00 | 955.00 | 2000.00 |
| 6. පොහොර හා කඩත්තුව සඳහා | - | - | 1200.00 (වසර දෙකකට) | 1388.00 |
| 7. රෝග හා පළිබෝධ මර්ධනය | - | - | 125.00 | 125.00 |
| 8. සත්ව පාලනය | - | - | - | - |
| 9. යැපීම් දීමනා | 1094.00 | 1094.00 | 1440.00 | 1094.00 |
| (වසර 1 1/2 ක් දිනකට රුපි. 2/- ගණනේ) | | | | |
| 10. විනෝදාංශ උදෙසා | 15.00 | 15.00 | 15.00 | 15.00 |
| 11. තාවකාලික මඩු සඳහා | 80.00 | 80.00 | 80.00 | 80.00 |
| 12. අභ්‍යන්තර මාර්ග සඳහා | 225.00 | 225.00 | 825.00 | 825.00 |
| 13. පාංශු සංරක්ෂණය | 80.00 | 80.00 | 200.00 | 200.00 |
| 14. ගස් මුල් උදුරා දැමීම | 260.00 | 260.00 | - | - |
| 15. වැටවල් සඳහා | 75.00 | 75.00 | 100.00 | - |
| 16. ලිං හෝ ජලය සැපයීම සඳහා | 200.00 | 200.00 | 200.00 | 200.00 |
| 17. නිවාස හා වැසිකිළි සඳහා | 1075.00 | 1075.00 | 1075.00 | 1075.00 |
| 18. කුඩාරම් හා භෝජනාගාර | 600.00 | 600.00 | 600.00 | 600.00 |
| 19. සමූපකාර ගබඩා ආදිය සඳහා | 600.00 | 600.00 | 600.00 | 600.00 |
| 20. වාරිමාර්ග වියදම | 5000.00 | 630.00 | - | - |

| කාර්යය | ගුරුත්ව වාරිමාර්ග | උස්සාන වාරිමාර්ග | වැලි දොඩම් ව්‍යාපාර | වී.පී. තේ ව්‍යාපාර |
|---|---|---|---|---|
| 21. පොම්ප හා අනිකුත් උපකරණ | – | 300.00 | 2,400.00 (කුලු) | – |
| 22. තරුණයෙකු සඳහා මුළු සහනාධාර ප්‍රමාණය | 9524.00 | 5454.00 | 10,025.00 | 8412.00 |

මූලාශ්‍රය: තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ වාර්තාව.

## 1966 – 71 දක්වා කාලය තුළ තරුණ යෝජනා ක්‍රමවල දියුණුව

වැඩ පිළිවෙළ අනුව මුල් වසර පහ තුළදී තරුණ යෝජනා ක්‍රම 41 ක් පිහිටුවනු ලැබීය. මෙම ව්‍යාපාර හා සම්බන්ධ මූලික දත්ත II–4 සටහනෙහි දක්වා ඇත. තරුණ ගොවි ව්‍යාපාරවල දියුණුව හා ගැටළු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් 1971 දී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලදී. එම වාර්තාවෙන් ප්‍රයෝජනවත් විශ්ලේෂණයක් උපුටා දැක්විය හැක.

<u>සටහන II–4</u> 1966 – 71 කාලය තුළ පිහිටුවනු ලැබූ තරුණ යෝජනා ක්‍රම පිළිබඳ මූලික තොරතුරු

| ප්‍රධාන ව්‍යවසාය | යෝජනාක්‍රම සංඛ්‍යාව | ප්‍රමාණය (අක්කර) | තරුණයන්ගේ සංඛ්‍යාව 1971 | පිහිටුවනු ලැබූ වර්ෂය 1966–1967 | 1968–1969 | 1970–1971 |
|---|---|---|---|---|---|---|
| මිරිස් හා ළූනු (උස්සාන වාරිමාර්ග) | 18 | 4,838 | 1,044 | 15 | – | 3 |
| මිරිස් හා ළූනු (ගුරුත්ව වාරිමාර්ග) | 4 | 1,218 | 297 | 4 | – | – |
| එළවළු හා ශීඝ්‍ර ගොවිතැන | 6 | 485 | 146 | 4 | 2 | – |
| තේ සමඟ කුරුඳු | 5 | 1,295 | 401 | 5 | – | – |
| වැලි දොඩම් | 3 | 2,250 | 580 | 1 | – | 2 |
| තේ | 2 | 246 | 92 | 2 | – | – |
| පොල් | 1 | 2,100 | 110 | 1 | – | – |
| කරදමුංගු | 1 | 191 | 57 | 1 | – | – |
| සත්ව පාලනය | 1 | 8 | 12 | 1 | – | – |
| එකතුව | 41 | 12,631 | 2,739 | 34 | 2 | 5 |

මූලාශ්‍රය: ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ වාර්තාව 1972

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව තරුණ යෝජනා ක්‍රම පිළිබඳව පරමාර්ථ අතත් අනුසාරයෙන් සලකා බලනු ලැබේ:

(අ) රැකියා සැපයීම: මුල් වසර පහ තුළදී තරුණයින් 23,500 කට පමණ රැකියා සැපයීමට සැලසුම් කර තිබූ නමුත් ඇත්ත වශයෙන්ම බඳවා ගන්නා ලද්දේ තරුණයින් 2,739 කි. මෙයට ප්‍රධාන හේතුව වූයේ පිහිටුවීමට බලාපොරොත්තු වූ තරුණ ගොවි යෝජනා ක්‍රම 235 න් පිහිටුවීමට හැකි වූයේ 41 වීමයි. එපමණක්නොව සමහර යෝජනා ක්‍රමයන්හි සැලසුමෙහි වූ දුර්වලතා වයන් නිසා බලාපොරොත්තු වූ මුල් සංඛ්‍යාව බඳවා ගත නොහැකි වූ අතර තවත් සමහර යෝජනා ක්‍රමයන්හි පදිංචි කරුවන්ගෙන් සැහෙන ප්‍රමාණයක් ඒවා අතහැර ගියහ.

(ආ) රු. 250/- ක අවම මාසික ආදායමක් ලබා දීම: මෙම ඉලක්කය සපුරා ගන්නා ලද්දේ තරුණ ගොවි ව්‍යාපාර 41 න් 13 ක පමණි. එකී ව්‍යාපාර 13 හේ තරුණයින් බොහෝ දෙනෙක් මසකට රු. 500/- කට වඩා ආදායමක් ලබා ගත්තෝය. ප්‍රමාණවත් නොවූ සැලසුම්, දුර්වල තේරීම, කළමනාකරණය හා වෙනත් කරුණු හේතුකොටගෙන අනෙක් යෝජනා ක්‍රමවල ආදායම් තත්වය දුර්වල විය. මෙහි ප්‍රතිපලය වූයේ තරුණයින් සැහෙන ප්‍රමාණයක් යෝජනා ක්‍රම අතහැර යාමයි.

(ඇ) නව මාර්ග ඔස්සේ ඉඩම් සංවර්ධනය හා කෘෂි නිෂ්පාදනය: මුල් අවස්ථාවලදී ගොවිපල සාමූහිකව එලි පෙහෙලි කිරීම ඉතා සාර්ථක බව පෙනී ගිය නමුත් මූලික සංවර්ධන අවස්ථාවෙන් පසුව පදිංචි කරුවන් තම කොටස් වෙන් කර ගැනීමට කැමති වූ බව වාර්තාවෙන් පෙනී යයි. නාගරික පහල මධ්‍යම පන්තික සේවකයින්ගේ ආදායම හා සැසඳිය හැකි ආදායම් තත්වයක් ලැබෙන විට උගත් තරුණයින් කැමැත්තෙන්ම නව කෘෂිකාර්මික ක්‍රම ඔස්සේ අලුත් බෝග වගා කරමින් කෘෂිකර්මයට පිවිසෙන බව දෙපාර්තමේන්තුවේ අදහස විය.

පහත සඳහන් කරුණුවල වැදගත්කම ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාර්තාවෙන් පෙන්වා දෙයි:

I. මූලික සැලසුම් හා ස්ථානය තේරීම පිළිබඳව පරිස්සාකාරී වීම;
II. කෘෂිකර්මය කෙරෙහි උනන්දුවක් ඇති තරුණයින් තෝරා ගැනීම;
III. වේගයින් පලදාව ලබා දෙන මිළ අධික බෝග වගා කිරීම;
IV. නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා නව ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම;
V. ව්‍යාපාර මට්ටමෙහි අධීක්ෂණය සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීම;
VI. කච්චේරිය මගින් සිදුවන අධීක්ෂණය.

අදාළ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම උදෙසා පහත සඳහන් කරුණු තීරණාත්මක නොවන හෙයින් ඒවා ගැන එතරම්ම සැළකිල්ලක් නොදක්වන ලදී.

I. වියදම් අඩු ජනාවාස: ජනපද සඳහා වියදම් කල මුදල සමඟ සසඳන විට තරුණ ගොවි යෝජනා ක්‍රම සඳහා යෙදවූ මුදල අඩු නමුත්, තවමත් මෙම වියදම සෑහෙන තරම් වැඩි තත්වයක පවතින හෙයින් අනාගතයේදී පිහිටුවන මෙවැනි ව්‍යාපාර සංඛ්‍යාව කෙරෙහි එය බලපායි.

II. ආයෝජන ප්‍රතිලාභය: මූලික ආයෝජන ප්‍රමාණය දීමනාවක් හෙයින් ආර්ථිකව සාර්ථක වූ යෝජනා ක්‍රමවල පවා, ප්‍රාග්ධනය පියවීම අදාළ ආදායම් සඳහා සලකා බලනු නොලැබේ.1/

III. සමූපකාර කළමණාකරනය: එම වාර්තාවේ දක්නට ලැබෙන පරිදි මෙවැනි තරුණ යෝජනා ක්‍රමවල පිහිටුවා ඇති සමූපකාර සමිති වලින් සිදු වන සේවාව, ජනාවාසයේ සංවර්ධන අවශ්‍යතාවයන් සපුරාලීම නොව පරිභෝජන අවශ්‍යතාවයන් සපුරාලීමය.

අපගේ වර්තමාන පරමාර්ථයන්ට අනුව ඉහත සඳහන් කරුණු තුන ඉතා වැදගත් වන අතර, අධ්‍යයනය සඳහා තෝරා ගත් යෝජනා ක්‍රම අගය කිරීමේදී එම කරුණු තුන, අදාළ අනෙකුත් කරුණු සමඟ ප්‍රධාන තැනක් ගනී.

## 2.2 තරුණ යෝජනා ක්‍රමයන්හි සාර්ව තත්වය - 1973

1971 දී කරන ලද විමර්ශනයෙන් පසුව සාර්ථක බවෙහි ලකුණු නොපෙන්වූ යෝජනා ක්‍රම වසා දමනු ලැබූ අතර, අලුත් යෝජනා ක්‍රම කිසිවක් ආරම්භ නොකරන ලදී. මිරිස්, ළූණු, වැල් දොඩම් වැනි මිල අධික බෝග වගා කරන ආර්ථික වශයෙන් සාර්ථක වූ යෝජනා ක්‍රම කීපයක් පමණක් පුළුල් කිරීමට කටයුතු යොදන ලදී. සමීක්ෂණය කරන අවස්ථාව වන විට පැවතුන යෝජනා ක්‍රම පිළිබඳ මූලික තොරතුරු II-5 හා II-6 සටහන් වලින් දැක්වෙයි.

---

1/ දීමනාවක් වශයෙන් මුලදී ආයෝජනය කල මුදලද ඇතුළු වන සේ සකස් කරන ලද මිලකට තම ඉඩම් මිලදී ගැනීමට 1973 රාජ්‍ය ඉඩම් විකිණීමේ පනත යටතේ පදිංචි කරුවනට අවස්ථාවක් ලැබෙනු ඇත. කෙසේ වුවද මෙම පනත තවමත් ක්‍රියාත්මක නොවන හෙයින් වාර්තාවෙහි එන විශ්ලේෂණයට හා විස්තරයට එය අදාළ නොවේ.

### පටහන II–5 1973 දී පැවතුන තරුණ යෝජනා ක්‍රම පිළිබඳ මූලික තොරතුරු

| | |
|---|---|
| මුළු යෝජනා ක්‍රම සංඛ්‍යාව .. .. .. | 43 |
| සියළුම යෝජනා ක්‍රමයන්හි වගා කර ඇති මුළු සාමාන්‍ය අක්කර ගණන | 6,442 |
| සියළුම යෝජනා ක්‍රමයන්හි ගොවීන්ගේ මුළු සංඛ්‍යාව .. .. | 3,216 |
| මණ්ඩලීය නිලධාරීන්ගේ මුළු සංඛ්‍යාව (ඉ.කො.දෙ.) .. | 17 |
| ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මුළු සංඛ්‍යාව (ඉ.කො.දෙ.) .. .. | 90 |
| තරුණ යෝජනා ක්‍රම සඳහා වියදම් කළ මුළු ප්‍රමාණය 1972/73 (වෙන් කරන ලද ප්‍රමාණය) .. .. | රු. 3,424,500.00 |
| තරුණ යෝජනා ක්‍රම සඳහා දෙපාර්තමේන්තුව සත්‍ය වශයෙන් වියදම් කළ ප්‍රමාණය .. .. | රු. 1,760,362.00 |
| සියළුම යෝජනා ක්‍රම වලින් ලැබුණු දළ ආදායම 1972/73 (ආසන්න වශයෙන්) .. .. | රු. දස ලක්ෂ 50 |

මූලාශ්‍ර: (අ) තරුණ ගොවි ව්‍යාපාරවල දියුණුව පිළිබඳ වාර්තාව– 1972 සැප්තැම්බර්
(ආ) තරුණ ගොවි ව්‍යාපාර පිළිබඳ සහකාර ඉඩම් කොමසාරිස්ගේ වාර්තාව.

### පටහන II–6 තරුණ යෝජනා ක්‍රමයන්හි කෘෂිකාර්මික ක්‍රියාකාරිත්වය, 1973

| ප්‍රධාන බෝග | යෝජනා ක්‍රම සංඛ්‍යාව | තරුණයින්ගේ සංඛ්‍යාව | වගා කර ඇති අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| මිරිස් හා ළූනු | 22 | 1,767 | 1,754 |
| වී (පමණක්) | 1 | 11 | 33 |
| තේ (වැලි දොඩම්, කුරුඳු ආදිය සමග) | 6 | 440 | 245 |
| කුරුඳු | 2 | 103 | 75 |
| වැලි දොඩම් | 3 | 568 | 325 |
| එළවළු සහ මිශ්‍ර බෝග | 6 | 163 | 155 |
| සත්ව පාලනය | 1 | 11 | 6 |
| පොල් | 1 | 96 | 770 |
| කරදමුංගු | 1 | 57 | 49 |
| එකතුව | 43 | 3,216 | 3,412 |

මූලාශ්‍ර: (අ) තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ ප්‍රගති වාර්තාව–1972 සැප්තැම්බර්
(ආ) තරුණ යෝජනා ක්‍රම පිළිබඳ සහකාර ඉඩම් කොමසාරිස්ගෙන් ලබා ගත් තොරතුරු.

1971 දී සියළුම තරුණ ගොවි යෝජනා ක්‍රමයන්හි සාමාජික සංඛ්‍යාව 2,739 ක් වූ අතර, 1973 දී එය වැඩි වූයේ 3,216 දක්වා පමණකි.

1971 හා 1973 යන වර්ෂවල කෘෂිකාර්මික ක්‍රියාකාරිත්වය සංසන්දනය කළ නොහැකි වනුයේ සංඛ්‍යාලේඛනවලට (සටහන II-4) ඇතුළත් වී තිබෙන්නේ 1971 දී වගා කිරීමට ලබා ගත හැකිව තිබුණු අක්කර ප්‍රමාණය හා 1973 හි සත්‍ය වශයෙන්ම වගා කළ අක්කර ප්‍රමාණය වන හෙයිනි. 1971 දී සත්‍ය වශයෙන්ම වගා කළ අක්කර ප්‍රමාණය පිළිබඳ තොරතුරු නොමැත.

1971 සිට 1973 දක්වා කාලය තුළ ඉහත සඳහන් ලෙස සවල්ප වශයෙන් වැඩ පිළිවෙල ව්‍යාප්ත වූ නමුත් කෘෂිකාර්මික අංශයෙහි වූ නිෂ්පාදනය සැළකිය යුතු ලෙස වැඩි වූයේ නැත. නමුත් තරුණ යෝජනා ක්‍රම සාර්ථක ලෙස ක්‍රියාත්මක වූ ප්‍රදේශවල මිරිස් හා වැලි දොඩම් නිෂ්පාදනය සෑහෙන ප්‍රමාණයකින් වැඩි විය. ඊළඟ අංශවල එන අපගේ සවිස්තරාත්මක විශ්ලේෂනවලදී මේ බව පැහැදිලි වෙයි.

## 2.3 තරුණ ගොවි යෝජනා ක්‍රම පහ පිළිබඳ තොරතුරු

මන්ඩලපුර, මනම්පිටිය, කුඩාඔය, යට්ටපාත සහ විස්වමඩුකුලම් යන තරුණ ගොවි ව්‍යාපාර පහ සූක්ෂම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. මුල් යෝජනා ක්‍රම තුන ප්‍රමාණයෙන් කුඩා වන අතර, වගා කරන ප්‍රධාන බෝග පිළිවෙලින් තේ, මිරිස් හා එළවළු වෙයි. මේ වන තෙක් ඒවා ආරම්භක අවස්ථාවේ පැවැති තත්වයට වඩා පුළුල්ව ඇත්තේ සුළු වශයෙනි. යට්ටපාත හා විස්වමඩුකුලම් යන තරුණ යෝජනා ක්‍රමයන්හි ප්‍රධාන වශයෙන් වැලි දොඩම් හා මිරිස් වගා කර ඇති අතර, 1970 සිට එම ව්‍යාපාර අධික ලෙස පුළුල් කර ඇත. තරුණ ගොවි යෝජනා ක්‍රමයන්හි මුළු ජනගහණයෙන් භාගයක් පමණ මේ යෝජනා ක්‍රම දෙකෙහි පදිංචි වී ඇති අතර, රජයේ මුළු ආයෝජන ප්‍රමාණයෙන් 40% ක් පමණද මේ ව්‍යාපාර දෙකට යොදවා ඇත. ඉහත සඳහන් තරුණ ගොවි ව්‍යාපාර පහ ප්‍රධාන තරුණ ගොවි යෝජනා ක්‍රම වර්ගයන් නියෝජනය වන අයුරින් තෝරා ගැනීමට හේතු 1 වෙනි පුවියෙහි දැක්වේ.

තරුණ ගොවි යෝජනා ක්‍රම පහ පිළිබඳ විස්තරාත්මක තොරතුරු 2 වෙනි පුවියෙහි දැක්වෙයි. සටහන I-21.1/ එක් එක් ව්‍යාපාරය පිළිබඳ සුළු විස්තරයක් පහත දැක්වේ.

### 2.3.1 මන්ඩලපුර තරුණ ගොවි යෝජනා ක්‍රමය

ඉතිහාසය: ගාල්ල දිස්ත්‍රික්කයේ දුෂ්කර පලාතක පිහිටි අක්කර 300 ක් පමණ වූ සංවර්ධනය නොකරන ලද රජයේ ඉඩමක 1966 දී මෙම ව්‍යාපාරය ආරම්භ කරන ලදී. (සටහන අ.2.2). මෙහි මුලින්ම තේ වගා කර තිබූ අතර සාමාජිකයන් 60 දෙනා විසින්ම

1/ මෙම සටහන් ග්‍රන්ථයෙහි අ.2.1, අ.2.2 යනාදී වශයෙන් දක්වා ඇත.

ආරම්භයේදී මෙම ඉඩම සාමූහිකව සංවර්ධනය කළ යුතු විය. අයදුම් කරුවන් තෝරා ගන්නා අවස්ථාවේදී සඳහන් කළ පරිදිම මුල් අදහස වූයේ ඉඩම මූලිකව සංවර්ධනය කිරීමෙන් පසුව පවුලකට අක්කරය බැගින් බෙදා දීමය. නමුත් පරීක්ෂණාත්මක පදනමක් යටතේ මෙම ගොවිපල දිගටම සමූපකාර ගොවිපලක් වශයෙන් පවත්වාගෙන යාමට රජය පසුව තීරණය කළාය. මෙම තීරණයට එළඹීමට සාධාරණ හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ, තනි ඒකකයක් ලෙස තේ වගාව වඩාත් කාර්යක්ෂම අයුරින් පාලනය කිරීම පිළිබඳව වූ ආර්ථිකමය හේතුව සහ අනෙකුත් සාමාජික හා සංකල්ප පිළිබඳ සාධකය.

පරීක්ෂක කමිටුවක් විසින් ආදායම් පාලක කාර්යාලයේදී පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයකින් තරුණයින් 66 දෙනෙකු තෝරා ගන්නා ලදී. මොවුන්ගේ වයස් පරාසය 18 – 30 අතර විය. යෝජනා ක්‍රමයට බැඳෙන විට මොවුන් සියලු දෙනාම අවිවාහක වූ අතර 35% ක් පමණ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළද 50% ක් පමණ හයවැනි ශ්‍රේණියද සමත් වූ අය වූහ. මොවුන්ගෙන් වැඩි දෙනෙක් ගොවීන්ගේ පුතුන් වීහ. එක් අයෙක් ගොවි පාසැලක අධ්‍යාපනයද ලබා තිබුණි. මොවුන් සියලු දෙනාගේම පසුබිම බොහෝ දුරට එකාකාර වූ හෙයින් සෑහෙන දුරට සමාකාර වූ ජන සමූහයක් ගොඩ නැංවින. එපමණක් නොව මොවුන් වැඩි දෙනකු ව්‍යාපාරයට බැඳීමට පෙර ඔවුනොවුන් දැන සිටි අය වූහ. (සටහන අ.2.3 – 6)

එක් තරුණයෙකු සඳහා යෙදවූ ඝනකාධාරවල උපරිම ප්‍රමාණය රු. 8,412.00 විය. (සටහන II–3). සාමාජිකයන්ට නැවතීම සඳහා පොදු නිවහනක් ගොඩ නගන ලදී. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපාර කළමනාකරුවකු පත් කරන ලද අතර රජයේ උප දිසාපති තුමා විසින් ගොවිපල පිළිබඳව මනා උනන්දුවක් දක්වන ලදී. රජයේ නිලධාරීන්ගේ සුපරීක්ෂාව යටතේ ඉඩම් හෙළි පෙහෙළි කිරීමටත්, තේ වගාව පිහිටුවීමටත් 'මණ්ඩල' නැතහොත් කණ්ඩායම් ආරම්භ කරන ලද අතර මේ අනුව 'මණ්ඩලපුර' යන නම යෙදිණි. 1967 දී සමූපකාර සමිතියක් පිහිටුවනු ලැබූ නමුත් ගොවිපල පරිපාලනයෙහි ලා ඉන් ඉටු වූයේ ඉතා සුළු මෙහෙයකි.

<u>මූලික ප්‍රගතිය</u>: මෙම ක්‍රමය යටතේ ලැබූ ප්‍රගතිය ඉතා සුළු විය. 1971 දී දිස්ත්‍රික්කයේ තරුණ යෝජනා ක්‍රම ගැන දිසාපති විසින් සකස් කරන ලද වාර්තාවක සඳහන් කර ඇත්තේ, "දුර්වලම සාමාජිකයා විසින් පෙන්වූ ප්‍රගතියට සමාන ප්‍රගතියක් සමූපකාරය විසින් පෙන්වූ" බවයි.[1] වසර තුනක කාලය තුළදී තේ අක්කර 32 ක් පමණක් දියුණු කළහැකි වූ අතර පසුව එයින් අක්කර අටක් අත් හැර දමනු ලැබීණි. මෙම සංවර්ධනය උදෙසා රු. 2,23,000/– ක් පමණ යැපීම් දීමනා සඳහා සහ රෝපන ද්‍රව්‍ය, පොහොර, උපකරණ ආදිය මිළයට ගැනීම සඳහාද වියදම් විය. ජනාවාසිකයින්ගේ මාසික ආදායම් ඉලක්කය

1/ ගාල්ල දිස්ත්‍රික්කයේ තරුණ යෝජනා ක්‍රම – පී.ජී.ටී.ගුණසිංහ, 1971.

රු. 250 – 300 දක්වා වූ නමුත් ප්‍රථම වසර තුන තුළදී ඔවුන්ට ජීවත් වීමට සිදු වූයේ රු. 2/– දෛනික දීමනාවක් හා රට අමතරව පස සංරක්ෂණය, බිම හෙළි පෙහෙළි කිරීම ආදිය සඳහා ඔවුන් ලබා ගත් උපයා ගැනීම් මතය. (සටහන අ.2.9) මේ කාරණය නිසා මෙන්ම මුලින් පොරොන්දු වූ පරිදි බිම් කැබලි බෙදා නොදීම නිසා ආරම්භක සාමාජිකයන්ගෙන් විශාල ප්‍රමාණයක් යෝජනා ක්‍රමය අත හැර දැමූහ. මුලින්ම තෝරා ගත් සාමාජිකයන්ගෙන් දැන් ඉතිරිව ඇත්තේ 14 දෙනෙක් පමණි. 1966 සිට 1970 දක්වා කාළය තුළ පුරප්පාඩු පිරවීම සඳහා හය වරක් පමණ සාමාජිකයන් තෝරා ගැනීමට සිදු විය. (සටහන අ.2.7 – 8)

වැලි දොඩම් වැවීම සඳහා පදිංචි කරුවනට තවත් අක්කරය බැගින් ලබා දීමෙන් ආදායම් තත්වය නැංවීමට 1971 දී තීරණය කරන ලදී. තරුණයන්ගේ ඉල්ලීම පරිදි සහ තේ වගාවෙන් ලද අත්දැකීම අනුව මෙම ඉඩම පෞද්ගලිකව වෙන් කර දෙන ලදී.1/ වැලි දොඩම් වගාව සඳහා බෙදා දුන් ඉඩම් සංවර්ධනය වූ වේගය හා කලින් තේ වගාව සංවර්ධනය වූ වේගය අතර වෙනස් මනාව ප්‍රත්‍යක්ෂ විනි. මාස තුනක් ගත වීමටත් පෙර බිම එළි පෙහෙළි කොට වැලි දොඩම් වගාව පිහිටුවනු ලැබූයෙන් වසර අවසානයේදී ජනාවාසිකයින්ගේ ආදායම දෙගුණයකින් පමණ, එනම් සාමාන්‍ය මාසික ආදායම රු. 120/– සිට රු. 270/– දක්වා වැඩි විය. වැලි දොඩම් ව්‍යාපාරය මේ අයුරින් සාර්ථක වීම නිසා එය තවත් පුළුල් කිරීමට තීරණය කරන ලදුව 1972 දී මණ්ඩලපුර දෙවැනි අදියර ආරම්භ කරන ලදී. සාමාජිකයන් 90 දෙනෙකුට වැලි දොඩම් වගා කිරීම සඳහා අක්කර එක බැගින් බෙදා දෙන ලදී.

ප්‍රථම අදියරෙහි ඉතිරි වූ තරුණයන් තිස් දෙදෙනා කෙතෙක් දුරට වැලි දොඩම් ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කළේද කිවහොත් සමූහ තේ වගාව පිළිබඳව සැළකිල්ල අඩු වන්නට විය. එය සමූපකාර සංගමය මගින් යොදවනු ලැබූ කම්කරුවන් විසින් පාලනය කරන ලදී. එක් තරුණයෙකුට අක්කර 3/4 ක් ලැබෙන සේ ප්‍රථම අදියරෙහි සාමාජිකයන් අතර තේ වගාව බෙදා දීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව තීරණය කළාය. එසේ වුවද සමූපකාර පාලන ක්‍රමය සුළු වශයෙන් වුවද තවදුරටත් පවත්වා ගෙන යනු ලැබිණි.

වර්තමාන තත්වය: ප්‍රථම අදියරෙහි, දැනට සිටින තරුණයින් තිස් දෙදෙනාගෙන් එක් අයෙකුට තේ අක්කර 3/4 ක් සහ වැලි දොඩම් අක්කර 1 ක් අයිතිව ඇත. දෙවැනි පියවරෙහි තරුණයන් 90 දෙනෙකු සිටින අතර එක් අයෙකුට වැලි දොඩම් අක්කරය බැගින් හිමිව ඇත. රජයේ නිලධාරීන් දෙදෙනෙකු ව්‍යාපාරය භාරව කටයුතු කරමින් සාමාජිකයින්

---

1/ "දෙවැනි අක්කරය බෙදා දීමේදී, ඉඩම් කැබලි වෙන් කරවා ගන්නා ලෙස දෙමාපියන් විසින් තරුණයන්ට බල කරන ලද බව දිසාපති තුමා සඳහන් කර ඇත. සමහර තරුණයන් විවාහ වීම නිසා 1969 න් පසු මෙම තත්වය විශේෂයෙන්ම මෙසේ විය." – ගුණසිංහ

දැඩි විනය පාලනයකට ලක් කරති.1/ ප්‍රථම අදියරෙහි ඇති සමූපකාරය, පොහොර හා අනෙකුත් යෙදවුම් පිළදී ගැනීම, ට්‍රැක්ටරයක් නඩත්තු කිරීම, බෝග අලෙවිය ආදී කරුණුවලදී විනා වෙනත් ආකාරයකින් කළමණාකාරීත්වය සමඟ සම්බන්ධ නොවන්නේය. සතුටුදායක ආදායම් තත්වය ක්‍රමයෙන් දියුණු වෙමින් පවතී. ඉඩම් පෞද්ගලිකව වෙන් කර දීමෙන් පසුව ප්‍රථම හා දෙවැනි අදියරවල තරුණයින් ව්‍යාපාරය අත හැර නොදැමූ අතර, එසේ කිරීමට මනාපයක්ද දක්වා නැත.

<u>විශ්ලේෂණය</u>: පෞද්ගලිකව බිම් කට්ටි ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සාමාජිකයෝ සිටියද එය ඒ අයුරින් සිදු නොවුන අවිනිශ්චිත කාල සීමාවක් අතරින් මන්ඩලපුර යෝජනා ක්‍රමය සාමූහික පදනමක සිට පෞද්ගලික පදනමක් තෙක් අඛණ්ඩ ක්‍රියාවලියට මුහුණ දී ඇත. මෙයින් සැළකිය යුතු පාඩම් කිහිපයක් උගත හැක.

ශිල්පීය වශයෙන් බලන කල මන්ඩලපුර මනාව සංවර්ධිත තත්වයක පැවතුණි. ජේ වගාව මැනවින් සැලසුම් කර පවත්වාගෙන තිබූ හෙයින් ආදායම උසස් තත්වයක විය. (සටහන අ.2.11) මෙය මධ්‍යගත කළමණාකරණයේ හා තනි ඒකකයක් වශයෙන් කරන ලද වගාවේ ප්‍රතිපලයකි. කුඩා බිම් කට්ටි වශයෙන් ඉඩම වෙන් කිරීමෙන් තවම අහිතකර බලපෑමක් සිදුව නැත්තේ සමීප අධීක්ෂණයක් දැනුදු පවත්වාගෙන යනු ලැබෙන හෙයිනි. හොඳම හා නරකම වගා ක්ෂේත්‍ර අතර සැහෙන වෙනස්කම් තිබුණද වැලි දොඩම් වගාව හොඳ ආදායමක් ගෙන දෙන තත්වයක පැවතුණි.

ආර්ථික වශයෙන් සලකන විට, නිෂ්පාදන වියදම් දැන් සාධාරණ ප්‍රමාණයක (වාර්ෂික පුනරාවර්තන වියදම් රු. 50,000/- කි) වන අතර ඒවා දළ ප්‍රතිලාභ වලින් පියැවේ. (වසරකට රු. 150,000/- සටහන අ.2.14 – 16) එහෙත් රුපියල් 458,916/- ක් පමණ වූ සංවර්ධන වියදම් අතිශයින් වැඩි වූයේ පහත් ශ්‍රම ඵලදායීතාවය නිසාය. මෙම පහත් ශ්‍රම ඵලදායීතාවය, සාමූහික හිමිකාරත්වයක් යටතේ ඇති අඩු සානුබල හේතුකොටගෙන ඇතිවන්නකැයි පහසුවෙන් කිව හැකි වුවද ( 20 පිටුව බලන්න) මෙය කරුණු බෙහෙවින් සුළු කොට දැක්වීමක් බව අපගේ සමීක්ෂණයෙන් හෙළි වේ. ප්‍රථමයෙන්ම, අනවශ්‍ය පරිදි දීර්ඝ කාලසීමාවක් සඳහා අඛණ්ඩව ගෙවන ලද ඉහළ පෙළේ සහනාධාර හේතුකොටගෙන වෙහෙස මහන්සි වී වැඩ නොකර සිටීමට තරුණයන්ට හැකි විය; ආත්ම විශ්වාසයට වඩා සහනාධාර මත රඳා පැවැත්ම ඔවුන් හට වාසිදායක වූයේය. දෙවනුව, පෞද්ගලික පදනමකින් සාමූහික පදනමකට හා නැවත පෞද්ගලික පදනමකට වශයෙන් ප්‍රතිපත්ති පිළිබඳ වෙනස නිසා තරුණයින් අධෛර්යයට පත් විනි. තෙවනුව, පෞද්ගලික බිම් කට්ටි වෙන් කරවා

---

1/ වැලි දොඩම් වගාවේ හෝ ජේ වගාවේ යම්කිසි කොටසක් යම් සාමාජිකයෙකු විසින් අතහැර දැමුවොත් කළමනාකරු විසින් ඔහුට ගෙවිය යුතු ගෙවීම් නවත්වන අතර එම අවශ්‍ය වැඩ කටයුතු වෙනත් කම්කරුවෙකු ලවා කරවනු ලබයි. තවදුරටත් ඔවුන් අතින් වැරදි සිදු වන්නේ නම් ඔවුනට තදින් අවවාද කිරීම හෝ සාමාජිකත්වයෙන් නෙරපා දැමීම හෝ සිදු කෙරේ. මේ අයුරින් 1971 දී සාමාජිකයන් දෙදෙනෙකු සේවයෙන් ඉවත් කරන ලදී.

ගැනීම සඳහා වූ බලපෑම තරුණයින්ගෙන් නොව ඔවුන්ගේ පවුල් වලින් 1/ උද්ගත වූ අතර පසුව යෝජනා ක්‍රමයේ ඇති වූ කළමණාකාරිත්වය තුළින් එය වඩාත් තහවුරු විනි.

මන්ඩලපුරයේ සංවර්ධනය කුමන දිශා ඔස්සේ යොමු විය යුතුද යන්න තීරණය කිරීමේදී කළමණාකරණ ක්‍රමය වැදගත් මෙහෙයක් ඉටු කර ඇත. ආයෝජනය, සැලසුම් කිරීම, ඉඩම් ප්‍රතිපත්ති ආදී වැදගත් තීරණ ගනු ලැබුයේ ගොවීන් විසින් නොව රජයේ නිලධාරීන් විසිනි. ගොවීන්ට පුද්ගලික බිම් කොටස් බෙදා වෙන් කර දීම ඔවුන්ගේ ඉල්ලීමක ප්‍රතිඵලයක් බව කළමණාකරු විසින් පෙන්වනු ලැබු නමුත් අපට පෙනෙන පරිදි නම් ඒ ඔහුගේ අදහසක් ක්‍රියාත්මක කිරීමකි. 2/ කළමණාකරුගේ වැඩ කටයුතු ගැන සොයා බලා ඒ ගැන පියවරක් ගැනීමට සාමාජිකයන්ට ලැබෙන අවස්ථා විරල නිසා එවැන්නක් කිරීමට ඔව්හු බිය වෙති. අනෙක් අතට සාමාජිකයන්ගේ සාමාන්‍ය අදහස නම්, "අපිට පාලන කටයුතු ගැන සොයා බලන්නට අවස්ථාවක් නැහැ. කොහොම වුනත් මැනේජර් මහත්තය අපිට සල්ලි හොයල දෙනවා. ඒක හන්ද ඇයි අපි කරදර වෙන්නේ" යනාදී වශයෙනි. කෙසේ වුවද සමුපකාර සමිති මාර්ගයෙන් සාමාජිකයන්ට පරිපාලන වගකීම බාර දුන් අවස්ථාවලදී (සීමිත ප්‍රදේශවල) එය ඉතා කාර්යක්ෂම ලෙස කර ඇත. (විශේෂයෙන්ම තේ හා වැලි දොඩම් එකතු කිරීම හා අලෙවිය)

මන්ඩලපුරයේ බිහි වන සමාජය අධික ලෙස පුද්ගල අභිමුඛ ස්වභාවයක් පෙන්වයි. තම පෞද්ගලික ගොවිපල කෙරෙහි අවධානය යොමු කරන හෙයින් සාමූහික හැඟීම් යටපත්ව ගොස් ඇත. කලින් මොවුන් සාමූහිකව ගොවිතැන් කල නිසා තවමත් සාමූහික වගකීම මොවුන් තුළ ඇතැයි කෙනෙකු බලාපොරොත්තු වුවත් එයට ඉඳුරා ප්‍රතිවිරුද්ධ තත්වයක් උද්ගතව ඇති බව පෙනේ. සමහරවිට මෙයට හේතුව පෞද්ගලිකව ඉඩම් බෙදා දීමෙන් පසු පාලන පක්ෂය විසින් සාමූහිකත්වය වැඩි දියුණු වන පරිදි කටයුතු නොකල නිසා විය හැක. පෞද්ගලික බිම් කොටස්වල නිවාස ඉදි වූ අතර පාලනය කෙරෙහි සාමාජිකයන්ගේ සහභාගිත්වය අවම විය; සාමූහිකත්වය පිළිබඳ ප්‍රශ්නුව නතර විනි. එපමණක් නොව වැලි දොඩම් හා තේ වගා වලින්

---

1/ "තරුණයින් කඳවුරෙහි එක්ව සිටින තාක් කල් ඔවුන්ගේ අචල භක්තිය හා උදෙයෝගය හේතුකොටගෙන බැඳියාව පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීමට හැකි වූයේය. ඔවුන් තම නිවෙස්වල වෙනම පදිංචි වූ පසු (ඔවුන්ගෙන් ඇතැමෙක් විවාහ වී එසේ නැතහොත් සාමාජිකයින්ගේ පවුලේ වෙනත් අයද සාමාජිකයින් සමග එක් වූ විට) පවුල්වල නිරතුරුවම හට ගන්නා අභ්‍යන්තර මත භේද ඇති වන්නට පටන් ගත්තේය." (ගුණසිංහ - 1971)

2/ "ලංකාවාසී අපි සාමූහික ගොවිකටයුතු සඳහා පුද්ගලවාදී වැඩියි" යනුවෙන් කළමණාකරු කිහිප විටක්ම පැවසීය. පිවිසි හැම ව්‍යාපාරයකම නිලධාරීන්ගේ පොදු අදහස වූයේ මෙයයි. මෙම තත්වයට හේතු වූ කරුණු සමහරක් කළමණාකරනය අගය කිරීම පිළිබඳ කොටසෙහි දක්වා ඇත.

ලද ආදායම රු. 75/- සිට රු. 385/[1] දක්වා පරාසයක වීමෙන් සාමාජිකයන් අතර අසමානතාවය ඇති වන්නට විය. ඉඩම් කට්ටි පිළිබඳ අසමානතාවයන් තවමත් ඇති වී නැතත් දැනට පවතින තත්වය අනුව වඩාත් සාර්ථක ගොවීන් විසින් වැඩිපුර ඉඩම් ඉල්ලීම හෝ අසාර්ථක අසල්වාසී ගොවීන්ගේ ඉඩම් කොටස් ලබා ගැනීම හෝ සිදු වන්නට පිළිවන. කුලී ශ්‍රමය යෙදවීම ක්‍රමයෙන් වර්ධනය වෙයි. මෙය තවදුරටත් වැඩි දියුණු වනු ඇත. සමානත්මතාවයේ සංවර්ධනය පිළිබඳ ආදර්ශකයක් වනවාට වඩා අසමානතාවයේ හා ධූරාකෘමේ ලක්ෂණ වලින් යුත් සමාජයක් මන්ඩලපුරයේ ඇති වන්නට ඉඩ තිබේ.

### 2.3.2 <u>මකම්පිටිය තරුණ යෝජනා ක්‍රමය</u>

<u>ඉතිහාසය:</u> 1967 ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය පිහිටා ඇත්තේ මහවැලි ගඟේ දකුණු ඉවුරෙහි පොළොන්නරුවට සැතපුම් 6 ක් නැගෙනහිරින්ය. ජනපද ව්‍යාපාරවලට ඇතුල් වීමට ඉඩ ප්‍රස්ථාවක් නොලත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඉඩම් නැති තරුණයන්ට රැකියා ලබා දීම මෙහි අදහස විය. උස්සාන වාරිමාර්ග යටතේ මිරිස් වගා කිරීම සඳහා අක්කර 100 ක් මෙහි වෙන් කර ඇත. ඉඩමේ මූලික සංවර්ධන කටයුතු තරුණයන් 50 දෙනෙකු විසින් පළමුව කළ යුතු විය. පසුව මෙම ඉඩම් පෞද්ගලිකව බෙදා දිය යුතුද යන්න විවෘත ප්‍රශ්නයක්ව පැවතුණි.

තෝරා ගත් තරුණයන් මන්ඩලපුරයේ සිටින අයට සමාන වුවත් ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම තරමක් පහත්ය. (සටහන අ.2.4 - 5) ඊට කලින් මොවුහු දිස්ත්‍රික්කයේ ජනපද ව්‍යාපාරයන්හි වාසය කල දෙමවුපියන් හා අනෙකුත් නෑදෑයින් සමඟ ගොවිතැන් කළ අය වූහ. තරුණයකු සඳහා සපයන ලද සහනාධාරවල උපරිම අගය රු. 5,454/- විනි. (සටහන II-3) ට්‍රැක්ටරයක් සහ උපකරණ සපයන ලද අතර පොදු නවාතැනක් ඉදි කරන ලදි. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් පත් කරන ලද නිලධාරියෙකුගේ මග පෙන්වීම යටතේ මොවුන් ඉඩම් හෙළි පෙහෙළි කිරීම ආරම්භ කළහ.

<u>මූලික ප්‍රගතිය:</u> ආරම්භයේ සිටම මකම්පිටිය යෝජනා ක්‍රමය නොයෙකුත් දුෂ්කරතාවලට මුහුණ දුන්නේය. මෙම ප්‍රදේශය ප්‍රත්‍යවර්තව ජල ගැලීම් හා නියඟයන්ට භාජනය වන්නේය. වාරිමාර්ග ක්‍රමයක් සකස් කරන ලද නමුත් මුළු ගොවිපලටම ජලය සැපයීමට පොම්ප ප්‍රමාණවත් නොවීය. මෙම තත්වය යටතේ සාමාජිකයන් කල කිරුණු අතර, බොහෝ දෙනෙක් යෝජනා ක්‍රමය හැර දමා ගියෝය. අඩුව පිරවීමට තෝරා ගත් සාමාජිකයන්ද එය හැර දමා යන්නට විය. සෑම වසරකම සාමාජිකයන් 30-40% ක් පමණ යෝජනා ක්‍රමයට බැඳෙන්ට හා හැර දමා යන්නට විය. 1970 දී ව්‍යාපාරයේ ඉතිරි වූයේ සාමාජිකයන් 10

---

[1] මෙම අසමානතාවයට හේතුවක් වී ඇත්තේ අවට ගම්වාසීන් විසින් තේ හා වැලි දොඩම් ව්‍යාපාරය තුළ සිටින යහළුවනට විකිණීමය. මොවුන් මෙම තේ හා වැලි දොඩම් තමාගේ නිෂ්පාදන මෙන් විකුණන අතර ඒවායින් කොමිස් මුදලක් තබා ගනිති.

දෙනෙකු වූ අතර, ඔවුන්ගේ මාසික ආදායම රු. 150/- ක් පමණ විය. යැපීම් දීමනා හා සලාකය ඒ වන විටත් ගෙවමින් පැවතිනි.

1968 දී අක්කර දෙක බැගින් බිම් කොටස් පෞද්ගලිකව බෙදා දෙන ලදී. කෙසේ වුවද 1972 දී වගා කර තිබුණේ අක්කර 22 ක් වූ නමුත් ඒ වනවිට සාමාජිකයන් 30 ක් යෝජනා ක්‍රමයට අයත් විනි. මේ වනවිට රු. 3,00,000/- කට වැඩි මුදලක් සංවර්ධන වැඩ වෙනුවෙන් වැය කර තිබුනි. පදිංචි කරුවන් නොයෙක් ආකාරයේ ආධාර දිගටම රජයෙන් ඉල්ලන්නට විය.

<u>වර්තමාන තත්වය</u>: ව්‍යාපාරය දියුණු කිරීමට 1973 දී නැවතත් නව පරිශ්‍රමයක් දරන ලදී. සංඛ්‍යාව 45 දක්වා වැඩි කිරීමට අළුත් සාමාජිකයින් 15 දෙනෙකු බඳවා ගැනීමෙන් අනතුරුව අළුත් පරිපාලන නිලධාරියකු පත් කරන ලදී. ලෝක ආහාර සංවිධානය මගින් ලබා දුන් සලාකය තවත් වසරකට දීර්ග කෙරිනි. ගොවීන්ට අක්කරය බැගින් වී සහ මිරිස් වගා කිරීමට ඉඩ දෙන ලදී. මුලදීම මෙම ඉල්ලීම කරන ලද නමුත් ව්‍යාපාරය සැළසුම් කරන ලද්දේ මිරිස් වගාවට තෙයින් ශ්‍රමය යෙදවීමේදී බාධා පැමිණෙතියි බලාපොරොත්තු වූ හෙයින් එයට ඉඩ දෙනු නොලැබිනි. 1968 දී සමූපකාර සමිතියක් ආරම්භ කළ නමුත් එය හොඳින් ක්‍රියාත්මක නොවුවද සාමාජිකයින්ට බෙදා දීම සඳහා එය රු. 20,000/- ක ණය මුදලක් ලබා ගති. සාමාජිකයින් ටික දෙනෙක් ඔවුන්ගේ ඉඩම් හොඳින් වගා කරමින් රු. 500/- ක පමණ මාසික ආදායමක් ලබා ගනී. වාරිමාර්ග ක්‍රමය යටතේ ජලය සැපයීම, ජල වහනය පිළිබඳ ගැටළු හා මුල සිටම ඉගෙන ගත් පරිදි රජයේ ආධාර මත තවමත් යැපීමට බලාපොරොත්තු වීම ආදිය දැනුදු පවතින ගැටළු වේ.

විශ්ලේෂනය: මින්ඩලපුරයේදී දක්නට ලැබුනේ සමූහ ගොවිතැන් ක්‍රමය නිසා මතු වූ ප්‍රශ්න වන අතර, රජයේ ආධාර ඇතිව පිහිටුවනු ලැබූ පෞද්ගලික ගොවිපල ක්‍රමයේ නොයෙකුත් ප්‍රශ්න මනම්පිටියෙන් පිළිබිඹු වේ.

ශිල්පීය අතින් බැලූ කල මෙම ඉඩම්වල වගාව ඉතා දුර්වල තත්වයක පවතියි. මිරිස් අක්කරයක අස්වැන්න රාත්තල් 250 ක් වන අතර, බොහෝ ඉඩම් අතහැර දැමීම නිසා කැලෑ බවට පත් වී ඇත. මෙසේ වීමට ප්‍රධාන හේතු වූයේ ප්‍රමාණවත් නොවූ ජල සැපයුම, ලබා ගැනීමට අපහසු වුවත් ට්‍රැක්ටර් යන්ත්‍ර වලින් වැඩ කිරීමට බලා සිටීම හා බොහෝ දෙනෙකු කුලී කරුවන් ලවා පවා ප්‍රමාණවත් ලෙස වල් පැල මර්දනයට අසමත් වීම යන කරුණුය. (සටහන අ.2.11) අමතර ට්‍රැක්ටර් හා වතුර පොම්ප සඳහා ඉල්ලීම් ඇති නමුත් දැනට ඇති පහසුකම් මැනවින් උපයෝගී කර ගන්නා තෙක් හා සමූපකාරය අක්‍රීය තත්වයකින් පසු වන තාක් කල් ඉල්ලීම් ඉටු වේ යැයි සිතිය නොහැක. යල් කන්නයේ මිරිස් වගාව සඳහා ඉඩම් පිළියෙල කිරීම ස්වල්ප වශයෙන් ප්‍රමාද වන නමුත් මහ කන්නයේ වී වගාව සඳහා එක් තරුණයෙකුට අක්කරයක් බැගින් දීමට තීරණය කිරීම නිසා ඉඩම් භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු වීමට ඉඩ ඇති අතර ආහාර හිඟකමද අඩු වීමට මෙම ක්‍රියා මාර්ගය තුඩු දෙනු ඇත.

ගොවිපලෙහි කරන ලද ආරම්භක ආයෝජනයෙන් විශාල ප්‍රමාණයක් පලදායී නොවිණි. හෙළි කරන ලද ඉඩම් බොහෝ ප්‍රමාණයක් කැලෑ බවට පත් වූ අතර, ආත්ම විශ්වාසය ඇති කර ගත් පදිංචි කරුවන්ගේ ප්‍රමාණය ඉතා අල්පය. පුනරාවර්තන වියදම් මට්ටම අඩුව පැවතුනද සමුපකාරයෙන් සාමාජිකයන් වෙත ලබා දුන් ණය මුදල් සම්පූර්ණ වශයෙන් ආපසු නොගෙවීම නිසා තවදුරටත් ණය ලබා ගැනීම අපහසු වී ඇත. ජල ගැලීම් නිසා ගොවිපලෙහි ස්ථිර නිවාස ඉදි නොකරනු ලැබුයෙන් අවිනිශ්චිත වාතාවරණය අනුව හොඳ ආදායම් ලැබූ ගොවීන් ටික දෙනා පවා ඒවා නැවත ගොවිපලෙහි ආයෝජනය කිරීමට කැමැත්තක් නොදක්වයි. (සටහන අ.2.12 - 13)

1973 දක්වා, කළමණාකරන කටයුතුවලට ගොවීන්ගේ මැදිහත් වීම ඉතා සුළු විය. සාමාජිකයන් නිතර නිතර යෝජනා ක්‍රමය හැර දමා යාම නිසා මෙය අපහසු කාර්යයක් වූ නමුත්, සාමාජිකයන් ව්‍යාපාරය කෙරෙහි වූ බැඳීම අඩු කරලීමට එය හේතුවක් විය. මූලික වශයෙන් මිරිස් වගාව සඳහා මහවිපිටිය සැලසුම් කර ඇති හෙයින් වී වගාව සඳහා ඉඩ නොදීම නිසා ඇති වූ තත්වය නිලධාරී පාලනයේ අවාසනාවන්ත ප්‍රතිඵලයක් පැහැදිලි කරයි.[1] වර්තමාන වී ගොවිතැන සෑහෙන දුරට අසාර්ථක නමුත්, නිලබල වාදයේ මග පෙන්වීමෙන් තොරව අත්දැකීම් තුලින් ලබා ගන්නා දැනුම වඩාත් අර්ථදායී වන්නේය. සාමාජිකයන් හා සම වයසේ සිටින එමෙන්ම ඔවුන්ගේ පසුබිමකට සමාන පසුබිමක් යටතේ හැදුනු වැඩුණු තරුණ කළමණාකරු මෙහි අගය තේරුම් ගෙන ඇති අතර සෑම කාර්යයකදීම ඔහු ජනාවාසිකයන්ගේ අදහස් විමසයි. නමුත් සමුපකාරය කාර්යක්ෂම කිරීමට හෝ සාමාජිකයන් නියම අයුරින් වැඩෙහි යෙදවීමට හෝ ඔහු තවමත් අපොහොසත් වී ඇත.

මන්ඩලපුරයෙහි මෙන්ම මහවිපිටියෙහිද ප්‍රජාව පුද්ගල අභිමුඛ ස්වභාවයකට නැඹුරුව ඇත. සම්මුඛ පරීක්ෂණය කරනු ලැබූ සියළු දෙනාම කියා සිටියේ සමූහ ගොවිපල ක්‍රමයට විරුද්ධ අදහස්ය. එක් අයෙකු "මිනිස්සු 10 දෙනෙක් හිටියොත් පහක්වත් වැඩට එන එකක් නෑ:" ආදී වශයෙන්ද තවෙකකු "සමූහ ගොවිපල ක්‍රමයෙන් මිනිසුන් කම්මැලි වෙනවා, ආණ්ඩුවෙන් ඇවිත් වැඩ කරලා දෙනකල් මිනිස්සු බලං ඉඳීවි:" යනුවෙන්ද ප්‍රකාශ කළහ. සමුපකාර සංගමය මගින් තවමත් ප්‍රජාව අතර සම්බන්ධය තහවුරු වනසේ කටයුතු කර නැත. රජයේ සහාය මත රඳා පැවැත්ම හා සහනාධාර නිසා ආත්ම විශ්වාසය මුදුන්පත් කර ගැනීම ප්‍රමාද වී ඇත. තරුණයින් විසින් කරනු ලැබිය හැකි කාර්යයනට පවා කුලී ශ්‍රමය යෙදවීමේ නැඹුරුතාවය වැඩි වෙමින් පවතී. මන්ඩලපුරයේ තරම් සමාජ අසමානත්මතාවය මෙහි අන්තයට ගොස් නැති නමුත් එය වැඩි වෙමින් පවතී. එක් විශිෂ්ඨ ගනයේ සාමාජිකයෙක් මිරිස්, එළු, කෙසෙල්, වී හා මාළු වෙළඳාමෙන් 1972 දී රු. 10,000/- කට වඩා ආදායම් උපයා ඇති නමුත් අනෙක් බොහෝ අය ව්‍යාපාරය ආරම්භ කළ අවස්ථාවේ සිටම රු. 3,000/- කට වැඩි ආදායමක් ලබා නැත. මේ අයුරින් මහවිපිටියද අසමානතාවය පිළිබඳ ලක්ෂණ පෙන්වන නිසා හා කුලී ශ්‍රමය මත යැපෙන නිසා දර්ශීය ජන සමාජයක් වශයෙන් සැළකිය නොහැක.

---

1/ මිරිස් හා එළුවලට නොව කෙසෙල්, පොල් හා වීවලට ජලය සපයන බව දැන ගත් වාරිමාර්ග ඉංජිනේරුවෙකු මාස දෙකක් ජලය සපා හැරීමට අණ කළ බව, 1971 දී වාර්තා කර ඇත.

### 2.3.3 කුඩා ඔය තරුණ යෝජනා ක්‍රමය

<u>ඉතිහාසය</u>: ගේ වතු වලින් වට වූ කඳු සහිත කැලෑ ප්‍රදේශයක 1968 අප්‍රියෙල් මස ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය නුවරඑළියේ සිට සැතපුම් හයක් ඈතින් පිහිටා ඇත. මුල් යෝජනාව වූයේ අක්කර 100 ක භූමියක් ලබාගෙන අර්තාපල්, එළවළු, පළතුරු හා ගවයන් සඳහා තණ වගා කිරීමයි. තරුණයන් 40 දෙනෙකු තෝරා ගත් අතර, මුලදී වසර දෙකක් පමණ මෙම ඉඩම පොදුවේ සංවර්ධනය කළයුතු බවත් පසුව එක් අයෙකුට අක්කර 2 1/2 බැගින් බෙදා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

වාරිමාර්ග පහසුකම්, වසර තුනක් යන තෙක් සලාකය සහ තවත් නොයෙකුත් සහනාධාර ලබා දෙන බවට තරුණයින් හට පොරොන්දු වෙන ලදී. නමුත් බෙදා දීම සඳහා ලබා ගත හැකි වූයේ අක්කර 40 ක් පමණි. මේ නිසා එක් අයෙකුට ලැබෙන ප්‍රමාණය අක්කරය දක්වා අඩු විය. වාරිමාර්ග පහසුකම් සහ තවත් නොයෙකුත් පොරොන්දු ඉටු නොකිරීම නිසා ව්‍යාපාරයේ තරුණයන්ට ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නට සිදු විය.

<u>මුලික ප්‍රගතිය</u>: පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අනුදැනුම ඇතිව, කෘෂිකාර්මික පසුබිමක් ඇති උගත් තරුණයින් 40 දෙනෙකු දිස්ත්‍රික්කයෙන් තෝරා ගන්නා ලදී. (සටහන අ.2.3-4) පොදු නිවහනක පදිංචි වූ තරුණයන් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් පත් කරන ලද කළමණාකරුවෙකුගේ අධීක්ෂණය යටතේ කඩිනමින් ඉඩම් හෙළි පෙහෙළි කිරීම ආරම්භ කළහ. ඔවුනට දෙන ලද පුහුණුව හා මාර්ගෝපදේශකත්වය ඉතා අල්ප වූ අතර, රු. 2/- ක දෛනික දීමනාවක් හා ලෝක ආහාර සංවිධානයෙන් ලැබෙන සලාකය ඔවුනට සපයා දෙන ලදී. (ඔවුන් ප්‍රකාශ කරන පරිදි) ඔවුනට සළකන ලද්දේ වතු කම්කරුවන් විසිනි. මොවුනට සෑහෙන ප්‍රමාණයක මුදල් ආධාර ලබා දුන් නමුත් සෑහීමට පත් නොවූ බොහෝ දෙනෙකු ව්‍යාපාරය හැර දමා යන්නට විය. 1968 අග භාගයේදී ඉතිරි වූයේ සාමාජිකයින් 10 දෙනෙකු පමණි. 1969 දී හිඟය පිරවීම සඳහා තවත් අය තෝරා ගනු ලැබීය.

මුල් කාලයේදී ශ්‍රම පලදායිතාවය එතරම් උසස් තත්වයක නොපැවතියේය. මාස 20 ක් ඇතුලතදී හෙළි පෙහෙළි කරනු ලැබුයේ අක්කර 10 ක් පමණි. තවත් අක්කර 10 ක් පිටස්තර කොන්ත්‍රාත්කරුවකු විසින් හෙළි කරනු ලැබීය. ව්‍යාපාරය කෙරෙහි සාමාජිකයන්ගේ බැඳියාව එතරම් දැඩි නොවූ අතර එහි පරමාර්ථ පිළිබඳව ඔවුන්ගේ අවබෝධය අල්ප විය. කෙසේ වුවත් අර්තාපල් හා එළවළු වලින් 1969 - 70 කන්න තුනකදී ලබා ගත් රුපියල් 1,54,000/- ක ආදායම බැංකුවේ තැන්පත් කරන ලදී. 1971 දී නව රජය පිහිටුවීමෙන් පසු එවකට ව්‍යාපාරයේ සිටි සාමාජිකයන් අතරේ (සංඛ්‍යාව 34 ක් විය) ඉඩම් බෙදා දී සියළුම සහනාධාර නවත්වා බැංකුවේ මුදල් සමූපකාර ගිනුමට මාරු කරන ලදී.

<u>වර්තමාන තත්වය</u>: දැන් යෝජනා ක්‍රමයේ තරුණයන් 33 දෙනෙකු සිටින අතර එක් අයෙකුට අක්කර 1 - 1 1/4 ක ප්‍රමාණයක් අයිති වී ඇත. මෙම යෝජනා ක්‍රමය රජයේ නිලධාරීන් දෙදෙනෙකුගේ වගකීම යටතේ ඇති නමුත් ඔවුන්ට වෙනත් රාජකාරි ඇති නිසා ව්‍යාපාරයේ

දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. මුල් බෝග වලින් ලබා ගත් ආදායමින් සැලකිය යුතු ප්‍රමාණයක් සමූපකාර සමිතිය මගින් ණයට දී ඇති අතර ඒවා නැවත ලබාගෙන ඇත්තේ සුළු වශයෙනි. සමූපකාරය, ට්‍රැක්ටරයක් නඩත්තු කරන අතර කිරි එළදෙනුන් පස් දෙනෙක්ද ඇති කරයි. මේ දෙකෙන්ම වසරක් පාසා පාඩු සිදු වෙයි. සමූපකාරය කෙරෙහි සාමාජිකයින් වැඩි විශ්වාසයක් නොතබන අතර එක් එක් සාමාජිකයා සිය බිම් කට්ටිය පෞද්ගලිකව පාලනය කර සිය අස්වැන්න පෞද්ගලිකවම කොමිස් ඒජන්ත වරුන්ට අලෙවි කරයි. යෙදවුම් බොහොමයක්ද සාමාජිකයින් විසින්ම පෞද්ගලිකව මිලයට ගනු ලැබේ. අධික ලෙස කුලී ශ්‍රමය භාවිතා කරන සමහර සාමාජිකයින් වැඩි පලදාවක් හා ආදායමක් ලබා ගන්නා නමුත් ස්ථිර ජල සම්පාදනයක් නොමැතිකම, අවශ්‍ය සේවාවන් සැපයීමට සමූපකාරය අපොහොසත් වීම, රජයේ සහයෝගය හා අභ්‍යාස පහසුකම් ඌණ වීම යනාදිය ව්‍යාපාරයේ දියුණුවට එරෙහිව ඇති සීමාවන් බවට පත් වී තිබේ.

<u>විශ්ලේෂනය:</u> ස්වයං-පාලන ක්‍රමය හාආත්ම විශ්වාසය ඇති කිරීමේ අවශ්‍යතාවය සුළු කොට තකමින් පදිංචි කරුවන්ට අධික සහනාධාර හා අනවශ්‍ය පොරොන්දු දීමේ භයානක කම මනම්පිටියෙන් මෙන්ම තුඩා ඔයෙන්ද පැහැදිලිව දැක්වෙයි. නිෂ්පාදනය කල බෝගවල අධික අගය නිසා ඇතැම් ප්‍රශ්න මැඩ පැවැත්වී ඇති නමුත් බොහෝ දුෂ්කරතාවයන් තවමත් පවතී.

ශිල්පීය වශයෙන් සලකන කල වගා තත්වය උසස් මට්ටමක පවතී. ගොවීන් බොහෝ දෙනෙකු වාර්ෂිකව හොඳ අර්තාපල් අස්වැන්නක් ලබා ගන්නා අතර ඇතැම්හු සැලකිය යුතු අස්වැන්නක් එළවළු වලින්ද ලබා ගනිත්. නමුත් සීමාකාරී සාධක දෙකක් ඇත. පළමුවැන්න ස්ථිර ජල සම්පාදනයක් නොමැතිකම නිසා දෙවැනි වර බෝගය අවිනිශ්චිත වීම සහ තෙවන වර බෝගය කෙසේවත් යෙදිය නොහැකි වීමයි.[1] දෙවැන්න ඉඩම් හිඟය නිසා මුලින් අදහස් කරන ලද පරිදි බෝග මාරුව හෝ කිරි සහ පොහොර ලබා ගැනීම සඳහා දෙනුන් ඇති කිරීමට නොහැකි වීමයි. මෙය අවසානයේදී බෝග වලින් ලැබෙන ආදායම හා අස්වැන්න අඩු වීමට හේතු වෙයි.

ආර්ථික වශයෙන් සලකන කල, අනෙකුත් තරුණ ව්‍යාපාරවල මෙන්ම මූලික සංවර්ධන කටයුතු සඳහා වැය කල මුදල අනවශ්‍ය ලෙස අධික විනි. මෙයට හේතුව හා මෙහි ප්‍රතිඵලය වූයේ ශ්‍රම පලදායීතාවය අඩු වීමයි. ආදායම් තත්වය දැන් සෑහෙන තරමට සතුටුදායක වුවත් ලබා ගත් ණය ආපසු ගෙවා නැති අතර, සමූපකාර සමිතිය සතු ණය ලබා ගැනීමේ ශක්තිය පිරිහී ඇත. (සටහන අ.2.13) සමූපකාරය දුර්වල තත්වයක පවතින තාක් සාමාජිකයන්ට අවශ්‍ය ජලය, ගවයන් හා වාර්ෂික නිෂ්පාදන සඳහා ණය අවශ්‍යතාවයන් සපුරාලිය නොහැකි වනු ඇත.

---

[1] ව්‍යාපාරයෙහි වසන සාමක ගොවීන් කිහිප දෙනෙකු තම මුදලින් නල මාර්ග සවි කර වසරකට බෝග තුනක අස්වැන්නක් ලබා ගනියි.

පත් කරන ලද රජයේ නිලධාරියා විසින් මුලදී ගෙන ගිය බලතල සහිත පාලනය ස්වයං-පාලනය සඳහා ලද දුර්වල අත්දැකීමක් විනි. පසුව නිලධාරීන්, බලය තහවුරු කිරීමට වඩා තරුණයින්ට මග පෙන්වීමට ප්‍රයත්නයක් දරා ඇතත් ඔවුනට ලබා දුන් පුහුණුව ප්‍රමාණවත් නොවීය. තරුණයින්ගෙන් අපේක්ෂිත කාර්යය පිළිබඳව ඔවුන් තුළ පැහැදිලි අවබෝධයක් නොමැත. මෙහි ප්‍රතිඵලය වූයේ, සමුපකාර කාරක සභාවට තෝරා ගනු ලැබූ සාමාජිකයන් පිළිබඳව සාමාන්‍ය අදහස "වැඩිපුර කැගහන්නේ කම්මැලි අය" යනුවෙන් වීමයි. හොඳ නායකත්වයක් දීමට හැකි අය තමන්ගේ පෞද්ගලික තම වැඩවල නිරත වීමට මනාපයක් දක්වයි.

සමාජයීය වශයෙන් කුඩා ඔය ප්‍රජාවද මනම්පිටිය ප්‍රජාව සමඟ සැසඳිය හැකි තත්වයක පවතී. ශ්‍රමය හුවමාරු කිරීම සුළු වශයෙන් දක්නට ලැබුනත්, සාමූහිකව වැඩ කිරීම පිළිබඳව සාමාජිකයන් තුළ ඇත්තේ සුළු විශ්වාසයකි. සමුපකාර සමිතියද ප්‍රබල බල වේගයක් නොවේ. අසමානාත්මතාවය මෙතෙක් ගොඩ නැගී නැතත් නිසි පියවර නොගතහොත් එම තත්වයද ඇති වීමට හොඳටම ඉඩ කඩ ඇත.

### 2.3.4 <u>යට්ටපාත (සිරිමාවෝ උද්‍යානය) තරුණ යෝජනා ක්‍රමය</u>

<u>ඉතිහාසය:</u> කළුතර දිස්ත්‍රික්කයෙහි දක්ෂිණ භාගයෙහි පැලවත්ත අසල පිහිටි මෙම ව්‍යාපාරය විශාල වශයෙන් වැලි දොඩම් වගා කරන සංකීර්ණයකින් කොටසකි. යට්ටපාතට සැතපුම් 10 ක් දුරින් පිහිටි ඉහල හේවැස්ස ප්‍රදේශයෙහි අක්කර 170 ක භූමි භාගයක තරුණයින් 55 දෙනෙකු විසින් 1967 දී වැලි දොඩම් වගාව ආරම්භ කරන ලද්දේ සුළු වශයෙනි. 1967 - 69 යන වර්ෂවල, එනම් ඉහල හේවැස්ස මුල් කාලය තුළදී අනෙක් බොහෝ තරුණ ව්‍යාපාරවල මෙන් නොයෙකුත් කරදර බාධක මතු වීම නිසා 50% ක් පමණ සාමාජිකයෝ එය අත්හැර දැමූහ. ජලය සැපයුම, නිවාස හා පාරවල් ප්‍රමාණවත් නොවීම හා විශාල කැලයක් හෙළි පෙහෙළි කිරීමට සිදු වීම නිසා වැඩ ඉතා අමාරු විය. 1969/70 දී වැලි දොඩම් වගාව පල දරන්නට වීම නිසා තරුණයන්ට ව්‍යාපාරයේ අනාගතය පැහැදිලි වූ අතර එය කෙරෙහි ඔවුන්ගේ බැඳියාව වර්ධනය වූයේය. 1971 ජනවාරි මාසයේදී තවත් තරුණයින් 45 දෙනෙකු ඇතුළත් කර වගා ප්‍රදේශය ව්‍යාප්ත කරමින් ඉහල හේවැස්ස දෙවැනි අදියර ආරම්භ කරනු ලැබූ අතර, 1971 සැප්තැම්බර් මාසයේදී තරුණයින් 500 ක් බඳවා ගැනීමට සැලසුම් කරන ලදී.

<u>මූලික ප්‍රගතිය:</u> ප්‍රමාණයෙන් කුඩා වූ අනෙක් තරුණ යෝජනා ක්‍රම තුන මෙන් නොව ආරම්භයේ සිටම ඉහල හේවැස්ස-යට්ටපාත සංකීර්ණය එක් රජයේ නිලධාරියෙකුගේ කාර්යක්ෂම වූත් ස්ථිර වූත් පාලන ක්‍රමයකට හසු විය. විවිධ දෙපාර්තමේන්තුවල සහාය ආරම්භයේ සිටම ලබා ගැනීමට මෙම නිලධාරියා සමත් වූ හෙයින් එහි දියුණුව ඉතා සීඝ්‍ර විය. විශේෂයෙන්ම යට්ටපාත, ඉහළ හේවැස්ස අදියර දෙකෙහි වූ රජයේ නිලධාරීන්ට හා තරුණයින්ට ඉහල හේවැස්ස නියමු ව්‍යාපාරයේ අත්දැකීම් බොහෝදුරට මහෝපකාරී විය.

ඉඩම හෙළි පෙහෙළි කිරීමෙන් පසු එය කුඩා කොටස්වලට බෙදන බව කරුණයින්ට දන්වන ලදී. සංවර්ධන වැඩ සඳහා ඔවුනට ප්‍රමාණවත් සහනාධාර දෙනු ලැබිණි. මෙම ආධාර කරුණයෙකුට රු. 10,025/- ක් හෝ අක්කරයකට රු. 3,340/- ක් විය.[1/] සැලසුම් කිරීම හා කළමණාකරනය රජයේ නිලධාරීන් විසින් කරන ලද අතර, කරුණයන් ඒ සඳහා යොමු වූයේ සුළු වශයෙනි. කරුණයන් එම කටයුත්ත සඳහා සහභාගි කර ගන්නා බවට පොරොන්දු නොවූ අතර, ඔවුන්ගෙන් එවැන්නක් බලාපොරොත්තු වූයේද නැත. නමුත් මෙය යෝජනා ක්‍රමයේ දියුණුවට බාධාවක් නොවීය.

යෝජනා ක්‍රමයට අළුත් අය බඳවා ගන්නා විට ඔවුන් 25 බැගින් වූ කණ්ඩායම් වශයෙන් වෙන් කරන ලදී. (විශේෂයෙන්ම එකම ජනද කොට්ඨාශයෙන් පැමිණි අය සඳහා) එක් එක් කණ්ඩායමට හෙළි පෙහෙළි කිරීම සඳහා අක්කර 100 ක් ලබා දුන් අතර, අනාගතයේදී ඔවුනට හිමි වන බිම් කොටස්ද එම අක්කර ප්‍රමාණයෙහි විය. මුලදී ඔව්හු පොදු නිවහන්වල වාසය කළ අතර, ඉඩම් හෙළි පෙහෙළි කිරීමෙන් පසු 25 ක් වූ කණ්ඩායම පස්දෙනෙක් බැගින් වූ කණ්ඩායම් පහකට බෙදී ඔවුන්ගේ බිම් කොටස් අසල වූ කුඩා ගෙවල්වල පදිංචියට ගියහ. මේ වනවිට ලොතරැයි ක්‍රමයට අක්කර 3 1/2 බැගින් වූ කොටස් බෙදා වෙන් කර දී තිබුණි. මාස හතරකට පසු තම බිම් කොටස්වල තනා ගත් තාවකාලික නිවෙස්වල කරුණයන් පදිංචි වූ අතර සමහර විශේෂ වැඩ සඳහා අසල්වැසියන් සමඟ ශ්‍රමය හුවමාරු කර ගැනීම හැරුණුකොට, සාමූහිකව වැඩ කිරීම නිමාවට පත් විය. 1 වෙනි රූප සටහනෙන් මෙම තත්වය පැහැදිලි වේ.

<u>වර්තමාන තත්වය:</u> ඉහළ හේවැස්ස පළමුවෙනි හා දෙවෙනි පියවරෙහි දැනට කරුණයන් 107 දෙනෙක් වාසය කරන අතර, යටිපාත ව්‍යාපාරයෙහි කරුණයන්ගේ සංඛ්‍යාව 500 කි. එක් සාමාජිකයෙකුට අක්කර 3 1/2 ක් අයිති වන අතර ඉහළ හේවැස්ස අක්කර 250 ක වැල් දොඩම් වගාවකින් යුක්තය. සෑම කොටසකින්ම අක්කර 1/2 ක් ගෙවත්ත සඳහා ඉඩ හැර ඇත. සාමාන්‍ය වශයෙන් එක් සාමාජිකයෙකුට අක්කර 1 1/2 බැගින් වන සේ මෙතෙක් දුරට යටිපාත කොටසෙහි වැල් දොඩම් වගා කර ඇත. අක්කර 23 ක වූ බිම් ප්‍රමාණයක අන්නාසි වගා කර ඇති නමුත් තවමත් ඒවා පල නොදරයි. එපමණක්නොව අක්කර 140 ක පමණ ආහාර බෝගද වගා කර ඇත. ජනපද නිලධාරීන් තිදෙනෙකු හා ඕවර්සියර්වරුන් නව දෙනෙකු යටිපාත, ඉහළ හේවැස්ස ව්‍යාපාරයන් භාරව සිටින අතර මේ අනුව සාමාන්‍යයෙන් සාමාජිකයන් 50 දෙනෙක් භාරව රජයේ එක් නිලධාරියෙක් වේ. මුළු යටිපාත සංකීර්ණයම සඳහා සමූපකාර සමිතියක් පිහිටුවා ඇති අතර එමගින් සාමාජිකයින්ගේ නිෂ්පාදන එකතු කර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හා පෞද්ගලික සමාගම්වලට විකුණනු ලැබේ. අලෙවි වියදම් හා සංචිත වශයෙන් රාත්තලකට ශත -/04 ක් වූ කොමිස් මුදලක් සමිතිය මගින් අඩු කර ගනු ලබයි. නව ව්‍යාපාරයේ මුළු වියදම හා පැරණි ව්‍යාපාරයේ සමහර වියදම් රජයේ සහනාධාර

---

1/ ව්‍යාපාරයේ පසු අදියරවලදී සහනාධාර මට්ටම අඩු කරන ලදී. 1973 දී කරුණයෙක් සඳහා වූ සහනාධාර ප්‍රමාණය රු. 5,740/- ක් වූ අතර, 1974 දී එකතු වූ අය සඳහා එය කරුණයෙකුට රු. 2,290/- ක් විය.

වලින් කෙරෙන නිසා සමුපකාරය කිසිම ණයක් ලබාගෙන හෝ බෙදා දී හෝ නැත.[1] කෙසේ වුවද කොළඹ කර්මාන්ත ශාලාවට විකුණා මුදල් ලබා ගන්නා තෙක් සාමාජිකයන්ගේ පළතුරු මිලදී ගැනීම සඳහා සමුපකාර සමිතිය මගින් බැංකු අයිරාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු පිළියෙල කර ඇත. එපමණක් නොව ව්‍යාපාරයේ වෙනත් අංශයන්හි අලෙවි මධ්‍යස්ථාන තුනක් ඇතිව සමුපකාරය මගින් සමුපකාර වෙළඳසැලක් පවත්වාගෙන යනු ලැබේ.

1972/73 දී ඉහළ හේවැස්ස ප්‍රථම අදියරෙහි වැල් දොඩම් වගාව උඟුල්ලා ඇති අතර, පිහිටුවන ලද නව වගාව තවමත් පල නොදරයි. 1973 දී මුළු සංකීර්ණයෙන්ම වැල් දොඩම් අස්වැන්න රාත්තල් 3,376,462 ක් විය. අක්කරයක සාමාන්‍ය අස්වැන්න රාත්තල් 5,625 ක් වූ අතර තරුණයකු මසකට ලැබූ ශුද්ධ ආදායම රු. 350/- ක් විය. නව වගාව සම්පූර්ණයෙන් පල දරන විට ආදායම අධික ලෙස ඉහළ යා හැකි අතර, 1974 දී බලාපොරොත්තු වන අස්වැන්න රාත්තල් දස ලක්ෂ නවයකි. මේ අනුව තරුණයෙකු ලබන මාසික ශුද්ධ ආදායම රු. 500/- ඉක්මවිය හැකි යයි සාධාරණව අපේක්ෂා කළ හැක.


<u>විශ්ලේෂනය:</u> අනෙකුත් තරුණ ජනාවාස සඳහා ආදර්ශයක් ලෙස පිළිගත හැකි, ප්‍රථමනින්ම සාර්ථක කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ නිදසුනක් ලෙස නිතොරවම යට්ටපාත යෝජනා ක්‍රමය සලකනු ලැබේ. ව්‍යාපාරය ලබා ඇති කැපී පෙනෙන සුළු භෞතිකමය ජයග්‍රහනය පිළිබඳ කිසිම සැකයක් නැත. ප්‍රමාණවත් ආදායමක් ඉපදවීම අතින් එය ඉතා සාර්ථක අතර උගත් තරුණයින් කෘෂිකර්මය කෙරෙහි ඇද ගැනීමට සමත්ය. නමුත් පූර්ණ තක්සේරුවක් කිරීමේදී සටහන 1-2 හි දක්වා ඇති අනෙක් සාධක මතද සැලකිල්ල යොමු කිරීම වටී.

සෑම බිම් කොටසකින්ම හොඳ ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වනසේ යට්ටපාත ශිල්පීය වශයෙන් හොඳින් සැලසුම් කර ඇත. බිම් හෙළි පෙහෙළි කිරීමෙන් පසු පිහිටුවනු ලැබූ මුල් වැල් දොඩම් වගාවේ අස්වැන්න සරු විය. නමුත්, ඉහළ හේවැස්ස පළමුවෙනි අදියරෙහි දෙවැනි වගාව ප්‍රථම වගාව මෙන්ම පිහිටුවා ඇති නමුත් පැළැටි හොඳින් වැඩෙන බවක් නොපෙනේ. ඉඩම හොඳින් පිළියෙල නොකිරීමත්, පොහොර සැපයුම ප්‍රමාණවත් නොවීමත් මෙයට හේතු වූවා විය හැකිය. පොහොර ආදිය සඳහා කලින් සහනාධාර දුන් නමුත් දැන් තරුණයන්ට තම මුදල් ඒ සඳහා වැය කිරීමට සිදුව ඇත. තනි වගාවක් වශයෙන් වැල් දොඩම් වගාව දිගටම පවත්වා ගැනීම අපහසු බව පෙනෙන නිසාත් වෙළඳපොල තත්වය එතරම්ම හිතකර නොවන නිසාත් බෝග විවිධාංගකරනය (බෝග මාරුවක් වශයෙන් උක් වගාව යෙදීමටද රනිල ආවරන බෝග වැවීමටද දැන් යෝජනා කර ඇත.) පිළිබඳ සැලකිල්ල යොමු කිරීම වැදගත්ය.

---

1/ ඉහළ හේවැස්ස සමුපකාර සමිතිය 1974 අප්‍රේල් මාසයේ සිට පොහොර ලබා ගැනීම සඳහා ණය අත්තිකාරම් දීම ආරම්භ කර ඇත. සහනාධාර නුදුන් මුල් කාලයේදී සාමාජිකයන් තම වගාවන් සඳහා මුදල් යෙදවූයේ පෞද්ගලික ණය ලබා ගැනීමෙන් හෝ ඉතිරි කර ගත් මුදල් වලින්ය.

රූප සටහන 1 : <u>යට්ටපාත ව්‍යාපාරයේ සංවර්ධන රටාව සහ තරුණයින්ගේ සහභාගිත්වය</u>




ශ

කළුතර දිස්ත්‍රික්කයේ යට්ටපාත වැල්දෙඩම් සංකීර්ණයෙහි, 1973 අගෝස්තු 15, කව්වේරිය, කළුතර.

ආර්ථික වශයෙන් බැලූ කල ව්‍යාපාරයේ සංවර්ධන වියදම තරමක් ඉහළ මට්ටමක විය. විමර්ශනය කළ දින වනවිට රු.2,294,000/- ක් වැය වී ඇති බව අ.2.14 සටහනින් පැහැදිලි වෙයි. (අක්කරයකට රු. 2,200/- ක් පමණ) ආයෝජනය කළ මුදල ආපසු ලබා ගැනීමක් අදහස් නොකෙරේ.[1] වියදම් කළ මුදල සාධාරණයැයි සැළකිය හැකි වන්නේ මෙම යෝජනා ක්‍රමය ප්‍රදේශයට අමතර ප්‍රතිලාභ ලබා දෙන පුරෝගාමී ව්‍යවසායක් වන හෙයිනි. එහෙත් මෙවැනි විශාල වැයක් දැරීමෙන් සිදු වන්නේ අනාගතයේ ඇති වන ව්‍යාපාර සංඛ්‍යාව සීමාවීමයි. එය මග හැරවීමට නම් අඩු වශයෙන් සංවර්ධන මුදලින් කොටසක් ණයක් වශයෙන්වත් ලබා දී එය බේග අස්වැන්නෙන් පියවා ගත යුතුය. මුලු යට්ටපාත ව්‍යාපාරයෙහි 1973 වාර්ෂික වියදම රු. 2,34,720/- ක් වූයෙන්, රජයේ නිලධාරීන්ගේ වැටුප්, ව්‍යාපාරයේ වැඩවලට යොදා ගත් රථවාහනවල නඩත්තු වියදම් (සටහන අ.2.15) සමූපකාර සේවකයින්ගේ වැටුප් හා සමූපකාරයෙන් බෙදා දුන් පොහොරවල වියදමින් කොටසක්ද එයට ඇතුළත් වෙයි. අවශ්‍ය වූ පොහොරවලට වියදම් කළ මුදලින් විශාල කොටසක් සංවර්ධන වියදමට ඇතුළත් වූ අතර වසර දෙකක කාලයක් තිස්සේ සහනාධාර පදනමක් මත එය ලබා දෙන ලදී. (සටහන II-3) සාමාජිකයින් ලබන අධික ආදායම ගැන සළකා බලනවිට (සටහන අ.2.16) ඔවුන් ඉතිරි කරන මුදල් වලින් වාර්ෂික නිෂ්පාදන පිරිවැය පියවා ගතහැකි වේ. (දැනට ඉහළ හේවැස්ස පළමුවෙනි අදියරෙහි සිදු වන පරිදි) එපමනක් නොව සමූපකාර සමිතිය මාර්ගයෙන් ලාබ මුදල් නැවත ආයෝජනය කිරීම තවත් උනන්දු කළ හැකිය.

සාමාජිකයින්ගෙන් බොහෝ දෙනෙකු තම බිම් කොටස් හෙඳින් පාලනය කරන අතර, සමහරෙක් වැල් දොඩම් එකතු කිරීම හා අලෙවිය ආදී සමූපකාර සමිතිය හා සම්බන්ධ වැඩ කටයුතුවල පූර්ණ ලෙස නිරත වී සිටිති. සමූපකාර කමිටුව නව දෙනෙකුගෙන් යුක්ත වේ. එයින් අට දෙනෙක් තෝරා පත් කර ගත් අය වෙති. (ව්‍යාපාර කළමනාකරු එහි සභාපති වේ. සටහන අ.2.18 බලන්න) පූර්ණ කාලීනව සමූපකාර සේවයේ නිරත සංඛ්‍යාව 15 දෙනෙකු වන අතර, පිටස්තර අයකු වූයේ කළමනාකරු පමණි. අනෙක් අය (ලිපිකරුවන්, රියැදුරන්, පාරිභෝගික ගබඩා කළමනාකරුවන්, අලෙවි සහකාරවරුන් හා මුරකරුවන්) ව්‍යාපාරයේ සාමාජිකයින් වන අතර, ඔවුන් තම වැල් දොඩම් වගාව සංවර්ධනය කර එහි සාමාන්‍ය නඩත්තු කටයුතු තම භාර්යාවනට හා නෑදෑයිනට පවරා සමූපකාර සමිතියේ වැඩ කටයුතුවල නිරත වෙති.

යට්ටපාත සේවා සමූපකාර සමිතිය අනෙක් තරුණ ව්‍යාපාරවල සමූපකාර සමිතිවලට වඩා කාර්යක්ෂම බවක් හා ස්වයං-පාලන හැකියාවක් පෙන්වයි. නමුත් මෙතෙක් කල් එයින් ඉටු කර ඇති කාර්යයන් සරල ස්වභාවයක වන බව දක්නට ඇත. මේ වන තෙක් සමිතිය මගින් විශාල ප්‍රමාණයක ණය ලබාගෙන හෝ බෙදා දී හෝ නැත. පොහොර බෙදා දීම සමූපකාරය මගින් කෙරුනත්, වැඩි ප්‍රමාණයක් සහනාධාර වශයෙන් දෙන ලදින්, ඒවා ඇනවුම් කිරීම හා පාලනය කිරීම රජයේ නිලධාරීන් විසින් සිදු කරන ලදී. ගොවිපලෙන් පිටත ද්‍රව්‍ය විකිණීම හා

---

1/ 1973 රාජ්‍ය ඉඩම් විකිණීමේ පනත යටතේ මෙම තත්වය ඇත්ත වශයෙන්ම වෙනස් විය හැකිය. ( 16 වෙනි පිටුවේ පසු සටහන බලන්න)

පිළිදී ගැනීම් සියල්ලම මෙතෙක් කල් ව්‍යාපාර කළමනාකරු විසින් කරනු ලැබූ අතර, ඉදිරියටද එම තත්වය පවතිනු ඇත. 1974 දී පූර්ණ වගකීම් භාරය සමූපකාරයට පැවරුන විට එහි හැකියාවන් පරීක්ෂා කිරීමට අවස්ථාව ලැබෙනු ඇත.

අධ්‍යයනය කළ අනි හැම තරුණ ව්‍යාපාරයක් මෙන්ම යට්ටපාත ව්‍යාපාරය සමාජයීය වශයෙන් පෞද්ගලිකත්වයට නැඹුරු වී තිබේ. සම්මුඛ පරීක්ෂණයට භාජන කළ හැම දෙනාගේම අදහස වූයේ සාමූහිකව වැඩ කිරීම පහසු නොවන බවයි. සාමූහික ප්‍රජාවක් ඇති කිරීමට වඩා එවැනි සංකල්පයකින් ඈත්වීමේ ප්‍රවණතාවයක් මෙහිදී දක්නට ලැබිණි. කරුණු කිහිපයක් එයට බලපා ඇත. මුලදී 25 බැගින් වූ කණ්ඩායම් පසුව පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩවලට බෙදීම හා අනතුරුව පෞද්ගලිකව බිම් කට්ටි වෙන් කිරීම, ගොවීන්ගේ ගෙවල් පොකුරු ක්‍රමයට නොව ව්‍යාපාරය පුරා විසිරී තිබීම, ගොවි පවුලේ ශ්‍රමයෙන් පමණක් නොව අසල්වැසියන්ගේ උදව්වෙන් පවා පාලනය කළ නොහැකි පරිදි අක්කර 3 1/2 ක් අයෙකුට බෙදා වෙන් කර දීම යන කරුණුයි. මෙම තත්වය ජනවාසිකයින්ගේ ඉල්ලීම් අනුව ඇති කරනු ලැබුවද මෙයින් සිදු වූයේ පෞද්ගලිකත්වය දියුණුවීම විනා සාමූහිකත්වය ඇති වීමක් නොවේ. සමූපකාර සමිතිය මගින් සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සහයෝගය ඇති කිරීමට ගත් උත්සාහය 1 වන රූප සටහනින් පැහැදිලි වන අතර, මුලින් දැක්වූ වෙන්ම වැඩ කිරීමේ නැඹුරුතාවය මුළුමනින්ම ඉවත් කිරීමට මෙම ක්‍රියා මාර්ගය සපුරා සමත් නොවීය.

යට්ටපාත ව්‍යාපාරයෙහි සාමාජිකයින් ලබන අධික ආදායම හේතුකොටගෙන අනෙකුත් තරුණ ව්‍යාපාරවල දක්නට නොලැබෙන අසමතාවයක් මෙම ව්‍යාපාරයෙහි උද්ගතව ඇත. පසුගිය කන්නයෙහි සාමාජිකයෙක් වැලි දොඩම් වලින් ලත් සාමාන්‍ය මාසික ආදායම රු. 250/- ක් වූ නමුත් (සටහන අ.2.16) සත්‍ය ඉපයුම් පරාසය මසකට රු. 100/- සිට රු. 935/- දක්වා විය. සාමාජිකයින් සමූපකාරයේ පූර්ණ-කාලීන සේවකයින් වීම (ලිපිකරුවන්, රියැදුරන් ආදී වශයෙන්) නිසා ආදායම් විෂමතාවය මෙන්ම සමාජයීය අසමානාත්මතාවයද වැඩි වී ඇත.[1] උපයා ගන්නා ලාබ මුදල් ව්‍යාපාරයෙන් පිටත ආයෝජනය කිරීමෙන් ආර්ථික විෂමතාවය තරමක් දුරට සමනවී තිබෙන අතර මෙම ක්‍රියා මාර්ගය තවම සමාජයීය අසමානාත්මතාවයකට තුඩු දී නැත.[2] නමුත් නුදුරු අනාගතයේදී මෙම තත්වය මතු වීමට ඉඩ ඇති හෙයින් සුදුසු පියවර නොගතහොත් දක්ෂ ගොවීන් විසින්, අසාර්ථක වූ ගොවීන්ගේ ඉඩම් එකතු කර ගැනීමේ නැඹුරුතාවය ඇති වන්නට පිළිවන.

---

1/ තර්කය ඉදිරිපත්ව ඇත්තේ සමූපකාර සාමාජිකයින් විසින් මෙම රැකියා කිරීම ගැන නොව අක්කර 3 1/2 ක බිම් කැබලි (ඔවුන්ගේ පවුල්වල ශ්‍රමය පූර්ණ-කාලීනව ලබා ගැනීමට සැළසුම් කෙරුණු) තබා ගැනීම පිළිබඳවය. මෙනයින් එක් ආදායම් මාර්ගයක ශ්‍රමය අනෙක් ආදායම් මාර්ගය සඳහා යෙදවීමට හැකිවන පරිදි ආදායම් මාර්ග දෙකක් ලබා දීම 1 - 2 සටහනෙහි දක්වා ඇති ප්‍රතිපත්ති කිහිපයකට ගුරුකට පටහැනි වන්නේය.

2/ ඉහල හේවැස්ස පළමුවන අදියරෙහි සාමාජිකයින් 16 දෙනෙකු ව්‍යාපාරය තුළ තම ඉඩම්වල ස්ථිර නිවාස ඉදි කර ඇත. සමහර ඒවා රු. 30,000/- ක් පමණ වටී. නමුත් යට්ටපාත ව්‍යාපාරයෙහි දක්නට ලැබෙන ලක්ෂණය නම් ව්‍යාපාරයෙන් පිටත මුදල් ආයෝජනය කිරීමයි.

## 2.3.5 <u>විස්වමඩුකුලම් තරුණ යෝජනා ක්‍රමය</u>

<u>ඉතිහාසය</u>: අධ්‍යයනය කළ තරුණ යෝජනා ක්‍රම පහෙන් විශාලතම යෝජනා ක්‍රමය වූ විස්වමඩුකුලම් තරුණ යෝජනා ක්‍රමයේ අත්දැකීම් විවිධ ආකාරයෙන් ප්‍රයෝජනවත් වන්නේය. යාපනය හා වවුනියා දිස්ත්‍රික්ක අතර මායිමෙහි පිහිටා ඇති විස්වමඩුකුලම් යෝජනා ක්‍රමය තුළ පිරිස් වැවීම සඳහා වාරිමාර්ග පහසුකම් සළසා ඇත. යාපනය අර්ධ ද්වීපයේ උගත් තරුණයින්ට රැකියා ලබා දීම මෙහි මූලික පරමාර්ථය විය. 1966 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පුනරුත්ථාපනය කරන ලද විස්වමඩු වැවෙන් මූලික වශයෙන් අක්කර 700 කට ගුරුත්ව බලය යටතේ වාරිමාර්ග පහසුකම් ලබා දී ඇත. මෙහි ප්‍රථම අදියර සැළසුම් කර ඇත්තේ තරුණයින් 227 දෙනෙකු සඳහාය.

1966 දී මේ යෝජනා ක්‍රමය සඳහා තරුණයින් 60 දෙනෙකු තෝරා ගන්නා ලදී. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් ගොවීන්ගේ පුතුන් වූ අතර, වැඩිදෙනෙක් අ.පො.ස. සුදුසුකම් ලබා ගොවි කවුදාවේද සේවය කර තිබුණි. (සටහන අ.2.4 - 5) අනෙකුත් හැම තරුණ ව්‍යාපාරයකම අත්දුටු දුෂ්කරතා මෙහිදීද දක්නට ලැබුණ නමුත් තරුණයින් බොහෝ දෙනෙකු 1971 වන විට තම බිම් කොටස් හෙළි පෙහෙළි කොට සංවර්ධනය කර තිබුණේය. පිරිස් ආනයනය කිරීම තහනම් කළ හෙයින් මේ අවස්ථාවේදී පිරිස්වල මිළ සීඝ්‍රයෙන් ඉහළ නගින්නට වීම නිසා (සටහන II-7) ව්‍යාපාරයට ඇතුළත් වීමට අධික ඉල්ලුමක් ඇති විණි. උස්සාන වාරිමාර්ග ක්‍රමය යටතේ බිම් කැබලි 210 කට ජලය සපයමින් 1971 දී විස්වමඩුකුලම් ව්‍යාපාරයේ දෙවෙනි අදියර ආරම්භ කරන ලදී. ඊට පසු වසරේදී විස්වමඩුකුලම් තෙවෙනි අදියර ආරම්භ කෙරිණි. මිටියාවතේ ඉහළ කොටසෙහි මුල් පියවරවලට සපයන වාරි ජලයෙන් ලැබෙන අ අතිරික්තය හා කාන්දු ජලය නැවත ලබා ගත හැකිවන සේ තනා ගත් ළිං වලින් බිම් කොටස් 200 - 300 කට පමණ ජලය සැපයීමට මෙම අදියරෙහි කටයුතු කර ඇත. ගම් පුළුල් කිරීම සඳහා ව්‍යාපාරයේ විවිධ අදියරවලට ආසන්න බිම් කොටස්ද බෙදා දීමට සැළසුමක් පිළියෙළ කරන ලදී. විස්වමඩුකුලම් හා ඊට ආසන්න වැව් වලින් දැනට ජලය සපයනු ලබන හේ ඉදිරියට ජලය සැපයීමට බලාපොරොත්තු වන බිම්වල සැකැස්ම II සිතියමෙන් පැහැදිලි වෙයි.

<u>මූලික ප්‍රගතිය</u>: වසර දෙකක කාලයක් තුළ පොදුව වැඩ කිරීමෙන් පසුව එක් අයෙකුට අක්කර තුන බැගින් බෙදා දෙන බව ජනාවාසය සඳහා තෝරා ගත් මුල් අයට ප්‍රකාශ කරන ලදී. ඉඩම හෙළි පෙහෙළි කිරීම සඳහා සහනාධාර ගෙවන ලද අතර මෙම කාර්යයට එතරම් හුරු පුරුදු නොවූ බොහෝ තරුණයෝ කොන්ත්‍රාත්කරුවන් ලවා එම වැඩ කටයුතු කරවා ගත්හ. තරුණයෝද නිවෙස ඉදි කිරීම්, වැට කඩොළු බැඳීම් හා ළිං කැනීම් ආදී වැඩ කටයුතුවල නිරත වූවෝය. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ජලය ලබා දීම ප්‍රමාද වීම, වැඩ අමාරු කම හා අනාගතය පිළිබඳ අවිනිශ්චිත බවක් තිබීම ආදී කරුණු නිසා 1966 - 68 කාලය තුළ 25% ක් පමණ දෙනා ව්‍යාපාරය අත්හැර ගියහ. නමුත් 1970 වනවිට ව්‍යාපාරය හොඳින් ස්ථාවර වී හොඳ පිරිස් අස්වනු ලබා ගනිමින් පැවතින. (සටහන අ.2.11 සහ II-7)

## සටහන II-7 විශ්වමඩුකුලම පළවෙනි අදියරෙහි මිරිස් නිෂ්පාදනය


| කන්නය | සාමාජික සංඛ්‍යාව | වගා කළ අක්කර ප්‍රමා. | මුළු නිෂ්පාදනය | අක්කරයක සාමාන්‍ය අස්වැන්න | රාත්තලක සාමාන්‍ය මිල | නිෂ්පාදනයේ දළ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යල 1968 | 120 | 171 | හො.1,515 | හො.8.9 | රු. 3.00 | රු. 509,040/- |
| යල 1969 | 158 | 243 | හො.1,631 | හො.6.7 | රු. 3.00 | රු. 548,016/- |
| යල 1970 | 145 | 253 | හො.3,405 | හො.13.4 | රු. 3.50 | රු.1,334,760/- |
| යල 1971 | 145 | 306 | හො.4,407 | හො.14.4 | රු. 4.00 | රු.1,974,336/- |
| යල 1972 | 175 | 324 | හො.4,688 | හො.14.5 | රු. 7.00 | රු.3,675,392/- |
| යල 1973 | 175 | 325 | ලැ.නැ. | ලැ.නැ. | රු. 8.00 | ලැ.නැ. |

මූලාශ්‍රය: දිස්ත්‍රික් ඉඩම් කාර්යාලය - යාපනය.

1967 දී සමුපකාර සංගමයක් පිහිටුවනු ලැබිනි. සහනාධාර ලබා දුන් වසර දෙක ගතවීමෙන් පසුව සමුපකාරය මගින් මිරිස් අක්කරයකට රු. 800/- ක උපරිම ණය මුදලක් ලබා දෙන ලදී. නමුත් ණය ආපසු ගෙවා ඇත්තේ ඉතා සුළු කොටසකි. 1972 වනවිට දී ඇති, රු. 5,86,756.64 ක ණය ප්‍රමාණයක් සාමාජිකයින් 252 දෙනෙකු අතර බෙදා දී තිබුණ නමුත් රු. 4,63,556.64 ක් තවමත් අය විය යුතුව ඇත. (සටහන අ.2.17)

දෙවෙනි හා තෙවෙනි පියවරෙහිදී තරුණයින් බඳවා ගත් වහාම ඔවුනට අක්කර 3 බැගින් වෙන් කර දුන් අතර ඔව්හු තම බිම් කොටස් හෙළි පෙහෙළි කර ගත්හ. II-8 සටහනෙහි දැක්වෙන පරිදි, තෙවෙනි පියවරෙහි ක්‍රියාත්මක කරන ලද්දේ වෙනස් සහනාධාර ක්‍රමයකි. දෛනික යැපීම් දීමනාව වෙනුවට, කැලෑ හෙළි කිරීමෙන් හා මුල් ගැලවීමෙන් වැඩි සහනාධාර මුදලක් එකවර ගෙවන ලදී. තෙවෙනි අදියරෙහි වගා ණය මුදල් ලබා දුන්නේ එක් වසරක් තුළ පමණි. එසේද ගෙවනුයේ තරුණයෙක් සමුපකාරයෙන් පොම්ප කට්ටලයක් මිලදී ගැනීමෙන් පසුවය.

## විශ්වමඩු කුලම් තරුණ ව්‍යාපාරය සහ ඒ අවට ප්‍රදේශය




| | | ඉඩම් කට්ටි ගණන | කර්ෂිකරුවන් ගණන |
|---|---|---|---|
| | විස්වමඩු 1 වන පියවර | 227 | 172 |
| | විස්වමඩු 2 වන පියවර | 210 | 210 |
| | විස්වමඩු 3 වන පියවර | 1000 (යෝජිත) | 220 |
| | ග.ජු. ව්‍යාපාරය | 1200 | 960 |
| | පිරමන්තල් ආරු ව්‍යාපාරය | 602 | 1974 අප්‍රේල් මස පදිංචි කරවීමට |

ප්‍රභවය: ඉඩම් කාර්යාලය, යාපනය          පරිමාණය අඟලට සැතපුම් එකයි

### සටහන II-8 විශ්වමඩුකුලම වැසියන්ට සහනාධාර ගෙවන ලද ආකාරය

| අංශය | අදියර I<br>රු. | අදියර II<br>රු. | අදියර III<br>රු. |
|---|---|---|---|
| මුල ගැලවීම .. .. | 260.00 | 260.00 | 1,050.00 |
| කැලෑ එළි කිරීම .. .. | - | - | 600.00 |
| යැපීම් දීමනා (දිනකට රු.2/- බැගින්, වසර දෙකක් උපරිම ලෙස) .. .. | 1,460.00 | 1,460.00 | - |
| වගා ද්‍රව්‍ය .. .. | 50.00 | 50.00 | - |
| බීජ .. .. | 60.00 | 60.00 | - |
| වගා අරමුදල .. .. | - | - | 800.00 |
| ළිං සඳහා .. .. | 200.00 | 200.00 | 1,500.00 |
| තාවකාලික මඩු .. .. | 80.00 | 80.00 | 50.00 |
| වැසිකිළි සඳහා .. .. | 75.00 | 75.00 | - |
| රෙදිපිළි .. .. | 30.00 | 30.00 | - |
| එකතුව .. .. | 2,215.00 | 2,215.00 | 4,000.00 |

මූලාශ්‍රය: දිස්ත්‍රික්ක ඉඩම් කාර්යාලය - යාපනය.

<u>සටහන</u>:

මෙම එකතුව ගෙවිය යුතු උපරිම ප්‍රමාණයයි. බොහෝ අවස්ථාවලදී මුළු මුදලම ගෙවා නැත. මහා මාර්ග හා වාරිමාර්ග පිරිවැය පොදු ගොඩනැඟිලි වියදම් හා සහනාධාර ගෙවනු නොලැබූ ගොවි පැල්පත් පිළිබඳ වියදම් ඇතුළත් නොවේ.

රජයේ නිලධාරීන් මඟින් පරිපාලන කටයුතු කරනු ලැබූ අතර සමූපකාර සමිතිය ඊට සහභාගී වූයේ සුළු වශයෙනි. ව්‍යාපාරය දියුණුවන්ම සාමූහිකව වැඩ කිරීම එතරම් වැදගත් නොවීය. කුලී ශ්‍රමය මත යැපෙන සාමාජිකයින්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වූයෙන් දිස්ත්‍රික්කය තුළින් හා උඩරට තේ වතු වලින් කුලී ශ්‍රමය ලබා ගන්නා ලදී. (සටහන අ.2.15)

<u>වර්තමාන තත්වය</u>: ව්‍යාපාරයේ අදියර තුනේ දැනට සාමාජිකයින් 600 ක් පමණ සිටින අතර ඊට අමතරව ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ පවුල් 960 ක් පමණ සිටී. ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම සංවර්ධනය වූ පසු සාමාජික සංඛ්‍යාව 1,500 දක්වාද පවුල් සංඛ්‍යාව 1,200 දක්වාද වැඩි වෙයි. 1973 යල කන්නයෙහි අක්කර 778 ක පිරිස් වගා කරන ලද අතර කුඩා බිම් කැබලිවල මිරිස්, පොල් හා අඹ ආදිය වවන ලදී. 1973/74 දී ප්‍රථමවරට තරුණ යෝජනා ක්‍රමයේ අක්කර 434 කද, ගම් පුළුල් කිරීම යටතේ අක්කර 149 කද වී වගා

කළෙත් එයින් හෙඳ අස්වැන්නක් අපේක්ෂා කෙරේ.

ව්‍යාපාරය සඳහා වැය වන වාර්ෂික මුදල රු. 338,328/- ක් පමණ වෙයි. (සටහන අ.2.15) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබෙන ගුරුත්ව හා උස්සාන වාරිමාර්ගවලට වැය වන මුදල මෙයට ඇතුළත් නොවේ. එපමණක්නොව සාමාජිකයින් විසින් කුලියට ගත් තම්කරුවන්ට හා පුද්ගලික ට්‍රැක්ටර්වලට ගෙවන ලද ගාස්තුවද ඇතුළත්ව නොමැත. දැනි වාර්ෂික දළ ආදායම රු. 5,420,000/- ක් වන අතර මේ අනුව තරුණයෙකුගේ සාමාන්‍ය මාසික ආදායම රු. 500/- ක් වන්නේය. එහෙත් තරුණයන් අතර මාසික ආදායම් පරාසය රු. 100/- සිට 1,500/- දක්වා වේ. (සටහන අ.2.16) පළමුවෙනි අදියරෙහි හා දෙවෙනි අදියරෙහි උපයන ලද ආදායම්වල වෙනස ඉතා අඩු නමුත්, තෙවෙනි අදියරෙහි ආදායම තරමක පහත් තත්වයක පවතී. මෙයට හේතු වී ඇත්තේ ඉඩම් තවම සංවර්ධනය වී නොමැති වීම, මාර්ග අපහසුකම, වතුර පොම්ප මිලදී ගැනීමට හා නඩත්තුවට වැය කිරීමට සිදුවීම යන කරුණුය. ව්‍යාපාරයේ අනෙකුත් කොටස්වලට වාරි ජලය නොමිලේ සැපයේ.1/

සමුපකාර සමිතිය යටතේ ට්‍රැක්ටර් යන්ත්‍ර තුනක් ක්‍රියාත්මක වන නමුත් වගා වැඩ කටයුතු වැඩි හරියක් කෙරෙන්නේ සාමාජිකයින් සතු පෞද්ගලික ට්‍රැක්ටර් වලිනි. තරුණ යෝජනා ක්‍රමයේ සාමාජිකයින් ඔවුන් ලබා ගත් ලෑන මුදල් වලින් ට්‍රැක්ටර් යන්ත්‍ර 25 ක් මිලදී ගෙන ඇත. එසේ වුවද මොවුන්ගෙන් බොහෝ දෙනෙකු තමන්ගේ හා තම හිත මිතුරන්ගේ බිම් කොටස්වල වැඩ කිරීමෙන් පසු ව්‍යාපාරයෙන් පිට කොන්ත්‍රාත් ක්‍රමයට සී සෑම් කටයුතු කිරීමට මනාපයක් දක්වති. මෙයට හේතුව ලෙස ඔවුන් පවසනුයේ ව්‍යාපාරයේ වසන සාමාජිකයින්ගෙන් ඔවුනට අය විය යුතු ණය මුදල් නොලැබෙන බවය.

මුලින්ම පිහිටවූ සමුපකාර සමිතියටද තම ණය ආපසු ලබා ගැනීමට අපහසු වූයෙන් (සටහන අ.2.17 සහ 35 වෙනි පිටුව) අදියර තුනෙහිම සාමාජිකයින් ඒකාබද්ධ කරමින් නව සමිතියක් 1972 දී පිහිටුවා ඇත. මෙම සමිතිය මගින් දැනට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. 125,101.95 ක් වන අතර සමුපකාරය මාර්ගයෙන් පිරිස් අලෙවි නොකරන නිසා ණය ආපසු ලබා ගැනීමට අපහසු තත්වයක් පවතී. සමුපකාරයේ ප්‍රධාන කාර්යය වන පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම, සතුටුදායක ලෙස සිදු කෙරේ.

ව්‍යාපාරයේ සාමාජිකයින් බොහෝ සංඛ්‍යාවක් තවමත් විශ්වවිද්‍යාලයේ ස්ථිරව පදිංචි වී නැතත් වගා කතුවේදී එහි පැමිණෙති. (සටහන අ.1.8) පළමුවෙනි අදියරෙහි

---

1/ ක්ෂේත්‍රය පුරා ජලය බෙදා හරින ඇළ මාර්ග වලින් ලැබෙන ජලය සමහරවිට ප්‍රමාණවත් නොවන නිසා පළමුවෙනි අදියරෙහි හා දෙවෙනි අදියරෙහි සමහර සාමාජිකයෝ වතුර පොම්ප මිලදී ගෙන ඇළ මාර්ග වලින් ජලය ලබාගෙන ඇත. ( 42 පිටුව බලන්න)

පදිංචි විවාහක සාමාජිකයින් පමණක් නිවාස තැනීම ආරම්භ කර ඇති නමුත් ඔවුන්ගේ භාර්යා වන්ගෙන් බොහෝ දෙනෙක් තවමත් යාපනය අර්ධද්වීපයෙහි වාසය කරති. මෙනයින් තවමත් මෙම යෝජනා ක්‍රමය ජීවත් වීමේ ස්ථානයකට වඩා මුදල් ඉපයීමේ ස්ථානයක් ලෙස සැලකීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත.

<u>විශ්ලේෂනය</u>: යටිටපාන මෙන්ම, විස්වමඩුකුලම්ද උගත් තරුණයින් කෘෂිකර්මය වෙත යොමු කරවන, පිරිස් නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත බව ලබා ගැනීමට දායක වන ආදර්ශමත් කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරයක් ලෙස හඳුන්වේ. එහෙත් අපේ සමීක්ෂණයට අනුව පෙනී යනුයේ සමූපකාරය එය සතු කාර්යයන් හරිහැටි ඉටු නොකරන බවත්, අවසාන අගැයීමකට පෙර තවත් සලකා බැලිය යුතු කරුණු රාශියක් ඇති බවත්ය.

ශිල්පීය වශයෙන් ව්‍යාපාරය ප්‍රශස්ත දියුණුවක් ලබා ඇත. කෘෂි රසායනික පොහොර, යන්ත්‍රසූත්‍ර හා බුද්ධිමත් ලෙස ශ්‍රමය යෙදවීම ආදී කරුණු නිසා පිරිස් අස්වැන්න ඉතා අධික වී ඇත.1/ (සටහන අ.2.11 –13) සූක්ෂම ලෙස ඉඩම් භාවිතය සිදු වෙයි. විශේෂයෙන්ම වී වගාවට අවසර දීමෙන් පසු වසරින් මාස 10 ක්ම භූමියෙන් වැඩි කොටසක් කවර හෝ වගාවක් යටතේ පවතී.2/ බෝග වගාව සමඟ සත්ව පාලනයද කරගෙන යාමේ අවශ්‍යතාවය මතු වී ඇත. දැනටමත් ව්‍යාපාරය තුළ ගවයන් 4,000 ක් පමණ ඇති කරන අතර, පොහොර හා කිරි සඳහා

---

1/ සාමාජිකයින් බොහෝ දෙනෙක් කොතරම් ප්‍රවීණතාවයක් ලබා ඇත්ද කිවහොත් ඔවුන් පිරිස් පොහොර මිශ්‍රනය මිළදී නොගෙන, තම නිගමනයන් අනුව විවිධ වර්ධන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි පොහොර සංඝටකයන් මිළදී ගෙන ඒවා මිශ්‍රකර වගාවට යොදති. විකිණීමට තිබෙන සැකසූ පොහොර මිශ්‍රනය මිළදී ගැනීම මුදල් නාස්තියක් බව ඔවුන්ගේ අදහසයි.

2/ මනම්පිටියෙහි දක්නට ලැබුන පරිදිම විස්වමඩුකුලම්ද පිරිස් වගාව සඳහා සැළසුම් කර තිබූ හෙයින් පාලක පක්ෂය මුලදී පිරිස් වගාව සඳහා අවසර නුදුන්නේය. වැවෙහි ජල ප්‍රමාණය පිරිස් වගාවට හා වී වගාවට ප්‍රමාණවත් නොවේ යැයිද, ශ්‍රම අවශ්‍යතාවයෙහි යම් යම් ප්‍රශ්න ඇතිවේයැයිද බියක් පැවතුනි. වී වගාව සඳහා අවසර ඉල්ලූ තරුණ යින්ගේ බිම් තැබලි ආපසු ලබා ගන්නා බව පවසමින් ඔවුන් බිය ගන්වන ලදී. නමුත් තනි වගාවක් වශයෙන් වසර කීපයක්ම පිරිස් වගා කළ හෙයින් 1973 දී ව්‍යාප්ත වූ දිලීර රෝගය (ෂියුසේරියම්, රයිසොක්ටෝනියම්) තදබල ප්‍රශ්නයක් විය. මෙම දිලීරය විනාශ කිරීමට භූමිය ජලයෙන් යටකර තිබීම හෝ පිරිස් සමඟ මාරුවට වෙනත් බෝගයක් වැවීමේ අවශ්‍යතාවය මතු විනි. විශේෂයෙන්ම වර්තමාන ආහාර හිඟයද නිසා මේ සඳහා පැහැදිලිම පිළිතුර වූයේ වී වගා කිරීමයි. 1973 දී අක්කර 434 ක වී වගා කළ අතර අමතර ජල සැපයුමක් නොමැතිව අධික ආදායමක් ලබා ගන්නා ලදී. 1974/75 මහ කන්නයේදී අක්කර 2,000 ක් පමණ වගා කළ හැකි වේ යයි බලාපොරොත්තු වේ.

ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී.[1]

ව්‍යාපාරය සැළසුම් කර ඇති ආකාරය ඉතා අනර්ඝය. ලබා ගතහැකි ඉඩම් හා ජල සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය ගත හැකිවන පරිදි හැම පියවරක්ම සැළසුම් කර ඇති බව දෙවැනි සිතියමෙන් පැහැදිලි වෙයි.

ශිල්පීය වශයෙන් සලකන කල ප්‍රශ්න දෙකක් පවතී. එකක් නම් 1973 දී පැතුරුණු දිලීර රෝගයයි. මේ නිසා ව්‍යාපාරයේ සමහර කොටස්වල පීරිස් අස්වැන්න අතිශයින් පහල බැස්සේය. 1973/74 දී හඳුන්වා දෙන ලද පරිදි පීරිස් සමග මාරුවට වී වගා කිරීමෙන් මෙම ප්‍රශ්නය විසඳේවි යැයි බලාපොරොත්තු වේ. අනෙක් අඩුපාඩුව පළමුවෙනි හා දෙවෙනි අදියරෙහි ජලය බෙදා හැරීමේ ඇලවල් සැළසුම් කිරීමේදී සිදුව ඇති දුර්වලතාවයයි. ජලය බෙදා හැරීම සමාකාරව සිදු නොවනවා පමණක්නොව විශේෂයෙන්ම ව්‍යාපාරයේ අග කොටසට වාරි ජලය ප්‍රමාණවත් අයුරින් නොලැබේ. වැසි කාලයේදී සමහර කොටස් ජලයෙන් යට වන්නේය. ව්‍යුහය පිළිබඳ සුළු වෙනස්කම් ඇති කිරීමෙන් සහ ගොවි කටයුතු වඩාත් හොඳින් සම්බන්ධීකරණය කර ජලය පිළිබඳ ප්‍රශ්න මැනවින් පාලනය කිරීමෙන් මෙම අපහසුවද මග හරවාගත හැක. ( 68 වෙනි පිටුව බලන්න) යාපනය අර්ධද්වීපයෙහි මෙන් සෑම ඉඩමකම වාගේ ළිං කැණීමෙන් තෙවෙනි අදියරෙහි හා ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය තුළ මෙම ගැටළුව විසඳාගෙන ඇත. ජලය භාවිතය අතින් මෙය කාර්යක්ෂම නමුදු එය මූලධනය අපතේ යැවීමකි. එපමණක්නොව පහත විස්තර කරන අවැඩදායක සමාජයීය ප්‍රතිඵල ඇති වීමටද ඉඩ තිබේ.

අභ්‍යන්තර ප්‍රතිලාභ ප්‍රවේගය, ආයෝජනය මත ඇති ප්‍රතිලාභ, සාමාජිකයින්ට ලැබෙන ආදායම් හා රජයේ ආයෝජන වලින් ලැබෙන අධිෂ්ඨිත ලාභ ප්‍රයෝජන යන ආර්ථික කරුණු අතින් සළකා බලන කල විස්වමඩුකුලමෙන් ලැබෙන වාර්තා අනර්ඝය. II–9 සටහනෙහි දක්වා ඇති පරිදි 1973 දී පීරිස් විකිණීමෙන් පමණක් ලැබූ ආදායමෙන් මූලික ආරම්භක මූලධන වියදම හා 1972/73 කන්නයෙහි පුනරාවර්තන වියදම්ද පියවාගෙන ඇත. සාමාජිකයින්ට එසකට ලැබෙන ආදායම සාමාන්‍ය වශයෙන් රු. 500/– පමණ වන අතර (සටහන අ.2.16) ව්‍යාපාරිකයින්ගේ, ලිපිකරුවන්ගේ හා ගොවීන්ගේ පුතුන් පමණක්නොව (සටහන අ.2.5) උපාධිධාරීන් පවා ව්‍යාපාරය වෙත ඇද ගැනීමට මෙම තත්වය සමත් වී ඇත. (සටහන අ.2.4) වැඩ අධික කාලයෙහි දිනකට 4,000 ක පමණ පුද්ගලයින් සංඛ්‍යාවකට රැකියා අවස්ථා සැපයෙන අතර යෝජනා ක්‍රමයේ නිපදවන පීරිස් වලින් විදේශ විනිමය සෑහෙන ප්‍රමාණයක් ඉතිරි වෙයි. (සටහන අ.2.16)

---

1/ ජල ගැලීමට භාජනය වන ප්‍රදේශවල තරුණයින්ගෙන් සමහරෙකු පී සෑම සඳහා ගවයන් යෙදීමට පෙළඹී ඇති අතර ට්‍රැක්ටර් හා ඉන්ධන මිලය වැඩිවත්ම මෙම නැඹියාව තවත් වැඩිවීමට ඉඩ ඇති බව පෙනේ.

## සටහන II-9 විස්වමඩුකුලම් ආදායම හා වියදම

| | රු. | අදාළ සටහන |
|---|---|---|
| ඉඩම් සංවර්ධනය, වාරිමාර්ග හා නිවාස සඳහා මුදල් ආයෝජනය .. | 3,198,862.03 | අ.2.14 |
| රජය හා සමූපකාරය මගින් කරන ලද වාර්ෂික වියදම් (1973) .. | 338,328.00 | අ.2.15 |
| සමූපකාරය මගින් දී ඇති වාර්ෂික ණය (1973) .. .. | 125,101.95 | අ.2.17 |
| පෞද්ගලික ප්‍රභව හෝ පෞද්ගලික ඉතිරි කිරීම් වලින් දෙන ලද වාර්ෂික ණය (1973) | 300,000.00 | ඇස්තමේන්තු කරන ලද |
| වාර්ෂික වියදම (1973) සහ මූලධන ආයෝජනය(1966 – 72) | 3,962,291.98 | – |
| බෝග විකිණීමෙන් ලද දළ ආදායම–1973 | 5,420,000.00 | අ.2.16 |

මූලාශ්‍රය: දිස්ත්‍රික් ඉඩම් කාර්යාලය, යාපනය හා විස්වමඩුකුලම් යෝජනා ක්‍රමය.

ව්‍යාපාරය මෙතරම් අධික ලාභයක් ලැබුවත් සමූපකාරයෙන් ලබා ගත් ණය ආපසු ගෙවා ඇත්තේ ඉතා සුළු සංඛ්‍යාවකි. එපමණක්නොව මෑතක් වනතෙක් ඔව්හු තවදුරටත් සහනාධාරද රජයෙන් බලාපොරොත්තු වූහ. විස්වමඩුකුලමේ පටන් ගත් සමූපකාර සමිති දෙක ආපසු පියවා නොගත් ණය පිළිබඳව කලින් සඳහන් කරන ලදී. එම තත්වයට හේතු වූ ප්‍රධාන කරුණු නම්:

(අ) සාමාජිකයින් නිපදවන මිරිස්වලට සමූපකාරය සාමාන්‍යයෙන් ගෙවන්නේ අඩු මිලකි. නමුත් පුද්ගලික වෙළෙන්දෝ ක්ෂේත්‍රයේදීම මිරිස් මිලදී ගන්නා අතර, වර්ග කිරීම ගැන ඔව්හු තැකීමක් නොදක්වති. අස්වැන්න නෙළීමට කලින් පවා එම වෙළෙන්දෝ අත්පිට මුදල් දෙති. මේ නිසා සමූපකාරය මගින් වෙළඳාම සිදු නොවන හෙයින් එය ලබා දුන් ණය ආපසු ගැනීම තහවුරු කර ගැනීමට මාර්ගයක් නැත.

(ආ) පුද්ගලික වෙළෙන්දෝ ඊළඟ කන්නයේ වගා කටයුතුවලටද ණය සපයන බැවින් සමූපකාරයෙන් ණය ලබා ගැනීමට හැකි තත්වයක සාමාජිකයින් සිටීමේ අවශ්‍යතාවයක් නැත.

(ඇ) මිරිස් සඳහා දැන් ලැබෙන මුදල අධික නිසා ගොවීන් බොහෝ දෙනෙකු වගා කටයුතු වලට යොදවන්නේ ඔවුන් ඉතිරි කර ගත් මුදල් හෝ ව්‍යාපාරයේ අනෙක් යහළුවන්ගෙන් ණයට ලබා ගත් මුදල්ය.

පුද්ගලික වෙළෙන්දෝ නිෂ්පාදකයන් පාලනය කරන්නට වීම හා පිරිස් වලින් දැන් ලැබෙන කෘත්‍රිම අධික ලාභය පහත වැටෙන්නට ඇති ඉඩකඩ ආදී භයානක ප්‍රතිඵල ඇතිවිය හැකි නමුත් <u>නිෂ්පාදකයන්</u> ගැන සළකා බලනවිට පුද්ගලික වෙළඳුන් මාර්ගයෙන් ණය ලබා ගැනීම හා නිෂ්පාදනය අලෙවි කිරීම එතරම් අයහපත් තත්වයක් නොවේ.[1] සමූපකාරය වැනි ණය හා අලෙවි ආයතන කෙරෙහි විශ්වාසය අඩුවීම, ලැබූ ලාභ ව්‍යාපාරයෙන් පිට ආයෝජනය කිරීම, දැනටමත් සාමාජිකයින් අතර ආදායම් විෂමතාවය 500% දක්වා දක්නට ලැබීම, අවාසනාවන්ත හෝ දුර්වල සාමාජිකයින්ට උදව් කිරීම සඳහා රක්ෂණ ක්‍රමයක් නොමැතිවීම යන කරුණු යෝජනා ක්‍රමයේ සංවිහිත හැකියාවේ ඌනතාවය හුවා දක්වයි. මෙය තවදුරටත් 44 වැනි පිටුවෙහි විස්තර කෙරේ.

අධ්‍යයනය කල අනෙක් ව්‍යාපාරවල මෙන් නොව පරිපාලනමය වශයෙන් විස්වමඩුකුලමෙහි රජයේ නිලධාරීන්ගේ පාලනය එතරම් ප්‍රමුඛ නොවේ. මෙයට හේතුව සමහරවිට ව්‍යාපාරයේ විශාල ප්‍රමාණයත්, සාමාජිකයින්ගේ උසස් අධ්‍යයන මට්ටමත් විය හැකිය. නමුත් මෙයින් රජයේ නිලධාරීන් තම වගකීමෙන් කොටසක් තරුණයින්ට පැවරීම හෝ තරුණයින් වගකීම භාර ගැනීමට හෝ ඇති කැමැත්ත පිළිබිඹු නොවේ. රජයෙන් වෙන් කරන ලද ඉඩම්වල බලෙන් පදිංචි වී ඇති බවත් සාමාජිකයෝ ජලය අයුතු ලෙස ලබාගන ඇති බවත් පැමිණිලි කරන රජයේ නිලධාරීන් පවසනුයේ ඒවා වැළැක්වීමට ගියවිට "තමන්ගේ වැඩක් බලා ගන්නා ලෙස" තරුණයින් ප්‍රකාශ කර සිටින බවයි. අනෙක් අතට ක්ෂේත්‍රයේ සිටින කණිෂ්ඨ නිලධාරීන් තමන්ට ඉඩ දෙනොත් ව්‍යාපාරයේ පරිපාලනය තමන්ම කර ගන්නා බව සාමාජිකයින් ප්‍රකාශ කරන නමුත් ඔවුන්ට එසේ ඉඩදී ඇති අවස්ථාවලදී පවා ක්‍රියාවෙන් එය ඔප්පු කර ඇත. අපට පෙනී යන පරිදි සමූපකාරයට ගරු කිරීමට හෝ ඉන් අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට සාමාජිකයෝ උනන්දුවක් දක්වා නැත. සමූපකාරය මගින් කළයුතු කෘෂිකාර්මික ද්‍රව්‍ය සැපයීම වැඩි වශයෙන්ම කෙරෙන්නේ රජයේ නිලධාරීන් අතිනි. එමගින් අලෙවිය කෙසේවත් සිදු නොවේ. සාමාජිකයින්ට පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම පමණක් සතුටුදායක ලෙස සිදු කෙරේ. මෙසේම ජලය බෙදා හැරීමේ කොමිටියද (සටහන අ.2.18) එතරම් සාර්ථකදායක නැත. ජලය අනිසි ලෙස ලබා ගැනීම වැළැක්වීමට හෝ ගොවීන්ගේ වැඩ කටයුතු ඒකාබද්ධ කොට වාරිමාර්ග ජලයෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට එම කමිටුව අපොහොසත්ව ඇත. ව්‍යාපාරයේ උද්‍යෝගිමත් සාමාජිකයෝ සමූපකාරයේ සාමාජිකත්වය හෝ ජලය බෙදා හැරීමේ කාරක සභාවේ නිලතල බාර ගැනීමට නොකැමතිව තම වැඩවල නිරතවී සිටිති. කාරක සභාවලට තෝරා ගත් සාමාජිකයින් පවා නිතරම වාගේ රැස්වීම්වලට සහභාගී නොවෙත්.

මෙවැනි තත්වයක් ඇති වීමට අනුමාන කළහැකි හේතු පහත දැක්වේ:

(අ) ආරම්භක අවස්ථාවේදී ගොවීන්ට යෝජනා ක්‍රමයේ පාලන කටයුතුවලට හවුල් වීමට ඉඩ ප්‍රස්තාව නොදුන් අතර, රජයේ නිලධාරීන්ගේ අණට ඔවුන් කීකරු

[1] පාලනයක් නොමැතිව අලෙවි කිරීමෙන් <u>පාරිභෝගිකයින්</u> මත අධික පීඩන පැවරේ.

විය යුතු යයි අපේක්ෂා කරන ලදී. මේනිසා නිලධාරීන් සමඟ ආරවුල් ඇති කර ගැනීමෙන් හා පිතුරන් අතරෙහි ජනප්‍රිය නොවන තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීමෙන් ඔවුන් වැලකුන බව පෙනුනට වැටහුනි. දැන් රජය මගින් සාමාජිකයින්ට වගකීම භාර දෙන්නට උත්සාහ ගත්තද ඔවුන් නිරායාසයෙන්ම එය භාර ගැනීමට මැලි වෙයි.

(ආ) සමහර ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් තම අතේ බලය රඳවා ගැනීමට ඇති කැමැත්ත හා පහසුව නිසා සාමාජිකයින් පරිපාලනමය කටයුතුවලට බඳවා ගැනීමට එතරම් කද උත්සාහයක් නොගනිති.

(ඇ) ප්‍රජාව ඉතා විශාල නිසාද, අදියර තුනෙහිම සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන්වල විශාල වෙනස්කම් දක්නට ලැබෙන හෙයින්ද, තනි සමූපකාර සමිතියක් මගින් තම අවශ්‍යතාවයන් සපුරා ගැනීම ගොවීන්ට එතරම් පහසු කාර්යයක් නොවනු ඇත.

(ඈ) සංවර්ධනය, පෞද්ගලවාදය දෙසට නැඹියාවක් දක්වන අතර, (වගාවෙහිදී, අලෙවියෙහිදී, නිවාස තැනීම් යනාදියේදී) ස්වයං-පාලන ක්‍රමයට ඉතා අවශ්‍ය වන සාමූහික හැඟීම මතුවන පරිදි කටයුතු කිරීමට උනන්දු වී ඇත්තේ සුළු වශයෙනි.

මෙම තත්වය වැඩි දියුණු කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග 2.4.7 ඡේදයෙහි සාකච්ඡා කෙරේ.

සමාජයීය වශයෙන් විස්වමඩුකුලම් ප්‍රජාවෙහි ඒකාග්‍රතාවය අඩු බව අප විසින් දැක ඇත. අනෙක් ව්‍යාපාරවල මෙන්ම සාමූහික වගකීම හෝ සාමූහික ක්‍රියාකාරීත්වය පිළිබඳ හැඟීම ඇත්තේ ඉතා අල්ප වශයෙනි. සාමාජිකයින්ගෙන් බොහෝ දෙනෙකු හොඳ අධ්‍යාපනයක් හා අධික ආදායමක් ලැබුවාවූ නමුත් මුල් අවස්ථාවේදී සාමූහිකව වැඩ කිරීමෙන් හා ජීවත් වීමෙන් ලත් සාමූහික හැඟීමෙන් දැනී ඉතිරිව ඇත්තේ අංශුමාත්‍රයක් පමණකි.

අධික ආදායම් ලැබෙන තාක් මෙම වර්තමාන තත්වය දිගටම පවතින බවට සැකයක් නැත. නමුත් පිරිස් සඳහා ඇති වෙළඳපොල නැති උනහොත් හෝ ලෙඩ රෝග වලින් වගාව විනාශ වී ගියහොත් ප්‍රජාවෙහි දුර්වල පදනම දෘශ්‍යමාන වී ව්‍යාපාරය පවා අසාර්ථක වන්නට ඉඩ තිබේ. මෙම තත්වයට හේතුවී ඇති කරුණු කීපයක් පිළිබඳව අපි දැන් සොයා බලමු.

(අ) විස්වමඩුකුලම ප්‍රත්‍යන්ත ප්‍රදේශයෙහි ගොවීන්ට මුහුණ දීමට ඇත්තේ අපහසු තත්වයකි. සහයෝගීත්වයෙන් කටයුතු කිරීමට නායකත්වය දරන්නවුන්ගෙන් ලැබෙන දිරිය අල්ප නිසා 'තමාට තමාමය' යන නීතිය මෙහි බල පැවැත්වේ.

(ආ) ජනපද ව්‍යාපාරයක මෙන් තීරුවක ආකාරයේ සැළැස්ම අනුව මෙම ව්‍යාපාරය නිර්මාණය කර තිබෙන අතර, එය අන්‍යෝන්‍ය සහයෝගීතාවය කෙරෙහි අහිතකර අන්දමින් බලපායි.

(ඇ) විස්වමඩුකුලම්හි සමාජයීය පහසුකම් මඳකම, සාමාජිකයින් එහි කටයුතුවලට එක හිතින් කැපවීම අධෛර්යමත් කරලයි. (පාසැල උදෙසා වෙන් කර ඇති තුම් භාගයෙහි තරුණයින් සමහරක් බලහත්කාරයෙන් පදිංචි වී ඇත. තැපැල් කන්තෝරු ගොඩනැගිල්ල සාදා වසරකටත් වැඩි කාලයක් ගත වී ඇති නමුදු මෙතෙක් විවෘත කර නොමැත.)

(ඈ) පවුල්වල ඇති බලපෑම නිසා යාපනය ඔවුන්ගේ ස්ථිර වාසස්ථානය ලෙසත්, විස්වමඩුකුලම හුදෙක් මුදල් උපයන ස්ථානය ලෙසත් සැළකීමට හේතු වී තිබේ.

කෙසේ වුවද මේ තත්වය යහපත් අතට හැරෙන බවට සලකුණු කිහිපයක්ම දක්නට ඇත. ට්‍රැක්ටර් පීළයට ගත් සාමාජිකයින් සහ විවාහක සාමාජිකයින් වැඩි දෙනෙක් විස්වමඩුකුලමෙහි ස්ථිර වශයෙන් පදංචි වී සිටිත්.1/ අවට ගම් සමඟ යහපත් සම්බන්ධතාවයක් ඔවුන් පවත්වා ගනී. ඒ සමහරවිට මෙම ගම් වලින් ලබා ගන්නා කුලී ශ්‍රමය නොවන්නට මේ ව්‍යාපාරයේ කටයුතු කිසිවක් කර ගැනීමට හැකි නොවීම නිසා විය හැකිය.2/ තවත් කැපී පෙනෙන දෙයක් නම් සාමාජිකයින් වැඩි දෙනෙක් මුලදී යෙදුනාට වඩා වැඩි වැඩ කොටසකට කායික ශ්‍රමය යෙදවීමයි. මෙය ඇතැම්විට ඔවුන් වැඩට හුරු වීම නිසා විය හැකිය. එසේම ඔවුන්ම වැඩවල යෙදීමෙන් ලැබෙන ලාභය වැඩිවීම නිසාද විය හැකිය. වැඩි ආදායමක් ඉපයීමට හැකිවීම හා එමගින් ලැබෙන ගෞරවය නිසා කලින් උසස් අධ්‍යාපනයක් ලත් අයට නොතරම් යයි සැලකූ කටයුතුවල යෙදීමට තරම් ආත්ම විශ්වාසයක් දැන් ඔවුනට ලැබී ඇත.

## 2.4 තරුණ යෝජනා ක්‍රම අගැයීම

යෝජනා ක්‍රම පහක් පිළිබඳ අපගේ විස්තරයෙන් හා විශ්ලේෂණයෙන් ප්‍රත්‍යක්ෂ වන පරිදි ඇතැම් ව්‍යාපාර ඉහළ ආදායම් මට්ටමක් ලබාගෙන ඇතත්, සමස්ථයක් වශයෙන් විවිධ කාරණා හේතුකොටගෙන සංස්ථාපිත වියදම් සාමාන්‍යයෙන් අධික වීම නිසා මෙම යෝජනා ක්‍රමවල

---

1/ අවිවාහක සාමාජිකයින් විවාහයෙන් පසු තම බිරියන් සමඟ විස්වමඩුකුලමෙහි පදිංචියට කැමැත්තක් දක්වයි. "යාපනයේ හා නිතාවන්ට ආයාචනයක්. අපි විස්වමඩුකුලමට යමු!" නමින් යාපනයේ ප්‍රසිද්ධියට පත් නාම්‍යයක් තිබේ.

2/ ගම්වල කම්කරුවන්ට ගෙවන වේතනය (ආහාර සමඟ දිනකට රු. 5/- සිට රු. 6/-) උඩරට සිට පැමිණි ස්ථිර කම්කරුවන්ට ගෙවන වැටුපට (ආහාර සමඟ මසකට රු. 50/- සිට රු. 80/- දක්වා) වඩා සෑහෙන්නට වැඩිය.

මූලික සංවර්ධන ප්‍රවේගය ඉතාම මන්ද විය. ස්වයං පාලනයෙන් යුක්ත සමූපකාර පිහිටුවීම අපේක්ෂා කළද මෙම ප්‍රජාවන්හි පෞද්ගලික වාදය ප්‍රචලිතව දක්නට ලැබේ. සමූපකාර සමිති දුර්වල වූත්, අක්‍රිය වූත් තත්වයකට වැටී ඇත.

මෙම තත්වය වටහා ගැනීමට නම් යෝජනා ක්‍රම පිළිබඳ විවිධ කටයුතු එකිනෙක ගෙන සලකා බැලිය යුතුය. සැළසුම, ඉඩම් භුක්තිය, මූල්‍ය කටයුතු, කළමනාකාරිත්වය, පුහුණුව ආදී වශයෙනි. යහපත් සාධක තහවුරු කර ගැනීමටත්, අනාගතයේ නිවැරදි කර ගත යුතු හෝ මග හරවා ගත යුතු වන්නේ කවර සාධකදැයි දැන ගැනීමටත් මෙම ක්‍රියා මාර්ගය උපකාරී වෙයි.

### 2.4.1 යෝජනා ක්‍රම සැළසුම

(අ) මුල් තරුණ යෝජනා ක්‍රමවල කළ ආර්ථික සැළසුම ප්‍රමාණවත් නොවූ බව පෙනී යයි. බිම් කට්ටි සංවර්ධනය කිරීමට ප්‍රමාණවත්, නැවත ලබා නොගන්නා සහනාධාර මට්ටමක් නියම කිරීමට හා ඉලක්ක කර ඇති ආදායම් මට්ටම ලබා ගැනීමට තරම් වන බිම් කට්ටියක් නියම කිරීමටත් සැළසුම් සීමා විනි. යෝජනා ක්‍රමය හෝ බිම් කට්ටිය උදෙසා හෝ පිරිවැය හා ආදායම් පිළිබඳ වාර්ෂික අයවැය පිළියෙල කිරීමක් සිදු නොවීය. ඇතැම් ව්‍යාපාර සහතික වශයෙන් අතිරික්ත ශේෂයක් ගෙන ඒමට සමත් වූ නමුදු අනෙක් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් එවැන්නක් සිදු නොවිනි. එයට හේතු වූයේ ආරම්භයේදී ප්‍රමාණවත් මූල්‍ය සැළසුමක් නොමැති වීමය.

(ආ) භෞතික සැළසුම ගැන සලකා බැලීමේදී තරුණ යෝජනා ක්‍රම පිළිබඳ තත්වය වඩා යහපත් බවක් ගනී. ආර්ථික වශයෙන් ඉතාම සාර්ථක බවක් ගන්නා ව්‍යාපාර දෙකක් වන යට්ටපාත සහ විස්වමඩුකුලම් යන දෙකෙහිම ක්‍රම සම්පාදනයෙහි නිපුන ඉඩම් සැළසුම්කරුවන් දැඩි සැළකිල්ලකින් ඒවා සැළසුම් කිරීමේ හේතුවෙන් එම යෝජනා ක්‍රමයන්හි භෞතික සම්පත් සහමුලින්ම වාගේ ප්‍රයෝජනයට ගෙන ඇත. අනිත් අතින් ඉතාමත් අල්ප සාර්ථකත්වයක් ඇති අනිකුත් යෝජනා ක්‍රම දෙකෙහි පිලියම් කළ නොහැකි භෞතිකමය අඩුපාඩුකම් දක්නට ලැබේ. කුඩාඔය, ජල සම්පාදනය කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි අතර පස් සෝදා යාමේ ගැටළුවක්ද ඇත. මනම්පිටියෙහි ජල හිඟය හා ජලාපවහනය පිළිබඳ ගැටළු දක්නට ලැබේ. මේ අඩුපාඩුකම් සාමාජිකයින්ගේ ආදායම කෙරෙහි කෙලින්ම බලපවත්වන අතර එනයින් ව්‍යාපාරවල සමාජයීය හා ආර්ථික ස්ථායිතාව හීන වී ඇත.

(ඇ) අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා උසස් හැකියාවක් ඇති භූමි භාගයක් තෝරා ගැනීම, එම හැකියාව සාක්ෂාත් කර ගැනීම තහවුරු වන පරිදි මනාව සැළසුම් කිරීම හා ආයෝජනය කිරීම සාර්ථක තරුණ යෝජනා ක්‍රමයක් උදෙසා අත්‍යවශ්‍ය මූලික කරුණු බවයි. පහසුවෙන් සංවර්ධනය

කළහැකි උසස් හැකියාවන්ගෙන් යුත් පෙදෙස්වල පමණක් තරුණ යෝජනා ක්‍රම ඇරඹිය යුතු යැයි අපි නිගමනය නොකරමු. එවැනි පෙදෙස් රජයේ මැදිහත්වීමකින් තොරව වුවද ගොවීන් විසින් සංවර්ධනය කරනු ලැබිය හැක. මේ නිසා තරුණ ව්‍යාපාර දියුණු කිරීමට උචිත පෙදෙස හැටියට දැක්විය හැක්කේ පුරෝගාමී ප්‍රයත්නයක් අවශ්‍ය පෙදෙස්ය. මනා සැළසුම් හා බුද්ධිමත් කළමනාකාරීත්වයක්ද ආයෝජන ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක වන්නේ නම් කෙටි කාලයක් තුළදී එවැනි පෙදෙස් වලින් උසස් ආදායමක් ලබා ගැනීමට හැකි වනු ඇත.

## 2.4.2 ජනාවාසිකයින් තෝරා ගැනීම

යම් ව්‍යාපාරයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය කෙරෙහි බලපාන වැදගත්ම කාරණය යෝග්‍ය සුදුසුකම් ඇති ජනාවාසිකයින් තෝරා ගැනීම බව සාමාන්‍ය අදහසයි. නිවැරදි සුදුසුකම් හැටියට සලකන්නේ, වයස අවුරුදු 18 – 25 අතර වීම, VI වන ශ්‍රේණියේ සිට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය දක්වා අධ්‍යාපනය ලබා තිබීම, කෘෂිකාර්මික පසුබිම හා පළපුරුද්ද, අවිවාහක බව, මහන්සි වී වැඩ කිරීමට ඇති කැමැත්ත, පසුබිමෙහි ඇති ඒකාකාර බව, ජනාවාසයෙහි සෙසු තරුණයින් සමඟ වැඩ කිරීමට උචිත මනා ගති පැවතුම් ඇති බව යනාදිය වේ.1/ යෝජනා ක්‍රමයන්හි නිලධාරීහු මෙන්ම සමහර අවස්ථාවල සාමාජිකවරු පැවසූ කාරණයක් නම් ව්‍යාපාරයේ ප්‍රධානතම ප්‍රශ්න පැන නගින්නේ සුදුසු නොවන අන්දමේ, අලස, නුගත්, ආත්මාර්ථකාමී, දබරකාරී, දේශපාලනයට නැඹුරු ජනාවාසිකයින් නිසා බවයි. මෙයට හේතුව ලෙස ඔවුන් දක්වන කරුණ නම්, එම තෝරා ගැනීම් රජයේ නිලධාරීන්ගෙන් සමන්විත අපක්ෂපාත මණ්ඩලයක් මගින් කරනු ලැබුවද මෑත අවුරුදුවල යටත් පිරිසෙයින් අවසාන තේරීම පිළිබඳ වගකීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සතු වීමයි. (සටහන අ.2.3)

රැස් කර ගත් සාක්ෂි අනුව නම් මේ මතයන් පිහිටුවා ඇත්තේ සවිමත් පදනමක් මත නොවන බව පෙනී යයි. පළමුවෙන් අ.2.4 – 5 සටහන් අනුව තරුණ යෝජනා ක්‍රම වැඩි හරියක සාමාජිකයින්ට නියමිත වයස, අධ්‍යාපනික සුදුසුකම්, විවාහක අවිවාහක බව, කෘෂිකාර්මික පසුබිම සහ පළපුරුද්ද යනාදිය ඇති බව අඩුම වශයෙන් පොත් පත්වල සඳහන් කරණු අනුව සත්‍යය. එසේම ව්‍යාපාරවල ඔවුන් සාපේක්ෂ වශයෙන් සම හැකිම් වලින් යුත් කණ්ඩායම් බවට පත්ව ඇත. (සටහන අ.2.6) හැම ව්‍යාපාරයකම සාමාජිකයින් විශාල සංඛ්‍යාවක් ඒවා හැර ගොස් ඇත. (අපගේ නියැදියේ වන ව්‍යාපාර දෙකක මෙම ප්‍රමාණය 80% කි. සටහන අ.2.7) තවදුරටත් රැඳී සිටින බොහෝ දෙනෙක් ජනාවාසිකයින් වීමට නොයෙක් අයුරින්

---

1/ කෘෂිකාර්මික තරුණ ජනාවාස නැමැති අත් පොතේ 10 වැනි ඡේදය බලන්න.

නුසුදුසු බව ඔප්පු වෙයි.[1] "සාවද්‍ය" යැයි සැළකෙන පසුබිමක් ඇති පදිංචිකරුවන් ව්‍යාපාරවල සාර්ථක ගොවීන් හා ප්‍රයෝජනවත් සාමාජිකයින් වී සිටිනු අවස්ථා කිහිපයකදීම දැක ගන්නට ලැබුණි.[2]

අවසාන වශයෙන් සඳහන් කළයුත්තේ ව්‍යාපාරවල ප්‍රශ්නවලට මූල වශයෙන් දේශපාලනික තේරීම හුවා දැක්වීම ඔප්පු කළ නොහැකි බවයි. තරුණ යෝජනා ක්‍රමයන්හි දේශපාලනික වශයෙන් තෝරා ගත් තරුණයින්, රජයේ නිලධාරීන් විසින් තෝරා ගනු ලැබූ තරුණයින්ට වඩා නුසුදුසු ජනාවාසිකයින්ව සිටින බවට සාක්ෂි අපට දක්නට නොලැබුණි. දෙවිදියෙන්ම තෝරා ගත් කණ්ඩායම් අතර සිටින්නේ සමාන පසුබිමකින් යුතුව පැමිණි අය වන අතර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීමට සළකන චරිතය හෝ නිශ්චය කිරීම ආදායම් පාලක නිලධාරියෙක් එබන්දෙකු තේරීමට උපයෝගී කර ගන්නා කරුණු මෙන් විශ්වාසයක් තැබිය නොහැකිය යන්න ඔප්පු කිරීමට තරම් සාක්ෂි නොමැත.[3] යෝජනා ක්‍රමවල නව සමාජයීය හා පරිපාලන සංවිධාන ඇති කිරීමට උත්සාහ දරන විට ඉහතින් සඳහන් කළ ඊට උචිත හෝතික හා වෙනත් කරුණු අඩංගු විය යුතුවාක් මෙන්ම එම සංවිධාන බිහි කිරීමට පදනම් කර ගත් දර්ශනය ජනාවාසිකයින් තෝරා ගැනීමේදී වැදගත් නිශ්චය කිරීමක් විය යුතුය.[4]

මෙම විශ්ලේෂණය අනුව ජනාවාසිකයින් තෝරා ගැනීම නොවැදගත් යැයි අදහස් නොකෙරේ. සුදුසු නොවන අපේක්ෂකයින් ඉවත් කිරීම පැහැදිලිවම වැදගත් කාරණයකි. මෙහිදී අවශ්‍යයෙන්ම සඳහන් කළයුතු වන්නේ, පදිංචි කරුවන් තේරීම කවරෙක් තුමණ නිශ්චය කිරීමක්

---

1/ අ.2.16 සටහන අනුව, යටිටපාත ජනාවාසිකයින් සමහර අය මසකට රු.1000/- ක් පමණ උපයන නමුත් ඇතමුන් සමාන ඉඩම්වල උපයන්නේ මසකට රු. 100 /- කට අඩු මුදලකි. අ.2.9 හා අ.2.11 සටහන් අනුව මනම්පිටියේ තරුණයින් ඇතැමෙක් අවුරුදු 7 ක් ඉක්ම යන තෙක් වගා කර ඇත්තේ ඔවුනට දුන් අක්කර දෙකක බිම් කට්ටියෙන් අක්කර 1/2 ක් පමණ වූ කොටසකි.

2/ පසුගිය අවුරුද්දේ මනම්පිටියේ වැඩිම ආදායමක් ලබාගෙන ඇත්තේ කෘෂිකාර්මික පළපුරුද්දක් ලබා නොමැති කලින් සාප්පු සේවකයෙක් හා ගෘහ සේවකයෙක්ව සිටි පදිංචි කරුවෙකි.

3/ කෙසේ වුවද දේශපාලනික වශයෙන් තේරීමේ වෙනත් අවදානමක් දක්නට ලැබේ. එනම් එබඳු අන්දමින් තේරුණු පදිංචිකරුවකු සුදුස්සකු නොවන බව පෙනී ගියවිට ව්‍යාපාරවාසී ප්‍රජාවගේ වැඩි දෙනෙකු එබන්දෙකුගේ සාමාජිකත්වය පවත්වාගෙන යාමට විරුද්ධ වුවද, ඔහු ලෙහෙසියෙන් අස් කර දැමීමට නොහැකි වීමයි. එහෙත් මෙය පදිංචි කරුවන් තෝරා ගැනීම පිළිබඳ ප්‍රශ්නයකට වඩා යෝජනා ක්‍රම පරිපාලනය පිළිබඳ ප්‍රශ්නයක් වන බැවින් අදාළ අංශයේදී ඒ පිළිබඳව සාකච්ඡා කෙරේ.

4/ මෙය විශේෂයෙන් අදාළ වන්නේ සමූපකාර ගම්මාන හා ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසවලටය. 3 හා 5 වෙනි පරිච්ඡේද බලන්න) උදාහරණයක් හැටියට යටිදැරිය සමූපකාර ගම්මානයේ මුලින් තිබී ශක්තිය (මෙය අපගේ නියැදියට අඩංගු නොවන නමුත් වෙනත් කාර්යයක් සඳහා නිරීක්ෂණය කරන ලදී.) මුලීම සාමාජිකයින් හැම දෙනාම කලකදී එක් පක්ෂයක තරුණ සංවිධානයේ ප්‍රාදේශීය ශාඛාවේ සාමාජිකයින් වීම නිසා ඇති විනි.

අනුව කරනවාද යන්න ගැන වැඩි අවධානයක් යොමු කළත් කවර ක්‍රමයක් අනුව වුවද සියළු අයුරින් පරිසමාප්ත තරුණයින් තෝරා ගැනීමක් සිදු කිරීම සහතික කළ නොහැකි නිසා ඊට වඩා වැදගත් වනුයේ අපේක්ෂකයින් ව්‍යාපාරයෙන් බලාපොරොත්තු වනුයේ කුමක්ද, ඔවුන් එයට බැඳීමෙන් පසු ඇතිවන තත්වය කුමක්ද යන කරුණු බවය. සමීක්ෂණයෙන් උද්ගත වූ කරුණුවලට අනුව තරුණයින් යෝජනා ක්‍රම හැර යාමට හේතු වූ ප්‍රධාන කාරණය වූයේ ව්‍යාපාරය ඔවුන් බලාපොරොත්තු වූ තත්වයක නොපැවතීම හෝ ඔවුන් හට මුලදී පොරොන්දු වී තිබූ දේවල් (ඉඩම්, ජලය, සහකාධාර යනාදිය – අ.2.3 හා අ.2.7 සටහන්) ඔවුනට නොලැබී යාමයි. තවදුරටත් අපට පෙනී යන අන්දමට ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු විය හැකි පරිදි වැඩිම ගණනක් ඉවත්ව ගොස් ඇත්තේ ආර්ථික වශයෙන් බෙලහීන ව්‍යාපාර වලිනි. සංවර්ධන කටයුතු කරන කාල පරිච්ඡේද ඉක්මවා ගොස් වැඩි වැඩියෙන් ඉඩම් කොටස්වල ආර්ථික ප්‍රරෝහනයක් ඇති වූ විට එබඳු අන්දමින් ව්‍යාපාර වලින් ඉවත් වී යාම බෙහෙවින් අඩු වී ඇත. (සටහන අ.2.7) මනම්පිටියේදී අසාර්ථක වූ ජනාවාසිකයින් විස්වමවුකුලම සඳහා තෝරා ගනු ලැබුයේ නම් ඔවුන් හොඳින් කටයුතු කරන්නට ඉඩ තිබුණ බව මෙහිදී කිව හැකිය. පරස්පර විරෝධී ලෙස පෙනී ගියත් හොඳ ශක්‍යතාවයකින් යුතු ව්‍යාපාරවල සාමාජිකයින් <u>කෙබඳු අය වුවත්</u> ඔවුන්ට සාර්ථක ගොවීන් විය හැකිය. නමුත් දැනට දී ඇති කුමන පිණුම් දණ්ඩක් උපයෝගී කරගෙන පදිංචිකරුවන් තෝරා ගත්තද, එම යෝජනා ක්‍රමයේ ආර්ථික ශක්‍යතාවය උසස් බවත් නොගති නම් වෙනත් හේතු නිසා වන කරුණු අසාර්ථක නම්, එබඳු තැනක සාර්ථක ව්‍යාපාරයක් ඇති කළ නොහේ.

තරුණ යෝජනා ක්‍රමවලට පදිංචි කරුවන් තෝරා ගැනීම සහ හඳුන්වා දීමේදී වැදගත් වේ යැයි සැලැකෙන සාධක පහත සම්පිණ්ඩනය කෙරේ.

(අ) දැනට තෝරා ගැනීමට යොදවන නිශ්චය මිම්ම – වයස, අධ්‍යාපනය, ගොවිකටයුතු අත්දැකීම් පසුබිමෙහි ඒකීයත්වය යනාදිය පිළිගත හැකිය. ව්‍යාපාරය පදනම් කර ගැනීමට හේතු වූ දර්ශනයට කැප වීම අතිරේක නිශ්චය මිම්මක් ලෙස එකතු කළ හැක. (2.4.4 ඡේදය බලන්න)

(ආ) මේ නිශ්චය මිම්ම පදනම් වූ සීමාව ඇතුළත කවරෙක් තෝරා ගනු ලබන්නේද, කවරෙක් තේරීම කරන්නේද යන්න සාපේක්ෂ වශයෙන් එතරම් වැදගත් නොවේ. මුලදී වැඩි දෙනෙක් ඉවත්ව යාම වැළැක්විය නොහැකි අතර එය අවැඩදායක තත්වයක් හැටියට සැලකිය යුතු නොවේ.

(ඇ) වඩා වැදගත් වන්නේ අයදුම්කරුවන් ඇතුළත් වීමෙන් පසු ඔවුනට යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු විය හැකි දෑ සහ ඔවුන්ගෙන් බලාපොරොත්තු වන දෑ කුමක්ද යන්න ගැන පැහැදිලි අවබෝධයක් ඇති කර දීමයි. නුසුදුසු ජනාවාසිකයින් බොහෝ දෙනෙක් වැරදි අවබෝධයක් ඇතිව යෝජනා ක්‍රමවලට බැඳී ඇති අතර සුදුසු තවත් අය ව්‍යාපාර පිළිබඳව ඔවුන් තුළ ඇති කළාවූ බලාපොරොත්තු ඉටු නොවීම නිසා ඉවත්ව ගොස් ඇත.

(ඈ) යෝජනා ක්‍රමයට පදිංචි කරුවන් පැමිණි දුක්මනින් ඔවුන්ට වගා කටයුතු පිළිබඳ සියළුම කරුණු හා කළමනාකාරීත්වය ගැන මනා පුහුණුවක් ලබා දීම වැදගත්ය. (2.4.8 ඡේදය බලන්න)

(ඉ) සමහර පදිංචි කරුවන් ව්‍යාපාරයට පැමිණි පසු ඔවුන් එට සුදුසු නොවන බව පෙනී යාම නොවැළැක්විය හැකි කරුණක් වන අතර, ඇතැම්විට ඔවුන් ව්‍යාපාරයෙන් ඉවත්ව යාමට අකමැති විය හැකිය. මේ නිසා ඔවුන් නිත්‍ය පදිංචි කරුවන් කිරීමට ප්‍රථම අවුරුද්දක පරිවාස කාලයකට යටත් කිරීම මැනවි.[1]

(ඊ) සංස්ථාපිත යෝජනා ක්‍රමයක, අත්හැර ගිය සාමාජිකයින් වෙනුවෙන් හෝ එය තවදුරටත් ව්‍යාප්ත කිරීමේදී අවශ්‍ය වන්නාවූ අතිරේක සාමාජිකයින් තෝරා ගැනීම, සුහද බව තහවුරු වන පරිදි පළමු සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක සහයෝගය ඇතිව කළ යුතුය. කෙසේ වෙතත් අවසාන වශයෙන් නිත්‍ය සාමාජිකත්වය පිරිනැමීමට පෙර එක් වසරක පරිවාස සේවා කාලය ක්‍රියාත්මක විය යුතුය.

### 2.4.3 පදිංචි කරුවන් තෝරා ගන්නා මාර්ග

තරුණ යෝජනා ක්‍රමවලට සුදුසු පදිංචි කරුවන් හා ඔවුන් තෝරා ගතයුතු හොඳම ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඔවුන් කවර ප්‍රදේශ වලින් තෝරාගත යුතුද යන්න සළකා බැලිය යුතු වේ.

ජනපද ව්‍යාපාරවල පදිංචි කරුවන් දුර බැහැර ප්‍රදේශ වලින් අධික වියදමක් දරා ගෙන ආ නමුත් තරුණ යෝජනා ක්‍රමයන්හි සාමාජිකයින් තෝරා ගනු ලැබුවේ ඒ ඒ දිස්ත්‍රික්ක තුළින්මය. මෙය දෙවිධියකින් වැදගත් වූ බලපෑම් ඇති කරයි. පළමුවෙන් එය ජනාවාසවල පිරිවැය අඩු කරයි. මේ ක්‍රමය අනුව, නිවසින් දුර බැහැරව පදිංචි වීමට පුද්ගලයින් පෙළඹවීම උදෙසා පිරිනැමිය යුතු සහනාධාරවලට අඩු සහනාධාර ක්‍රමයක් සෑහෙනවා පමණක්නොව, පදිංචිකරුවෝ ඔවුන්ගේ පැරණි ගම්වල හෝ එට ආසන්නව ජීවත් වනවිට, ප්‍රවර්තන අභ්‍යන්තරික සේවා ව්‍යුහ රටාවම (පාරවල්, ආරෝග්‍යශාලා, නිවාස, ජල පහසුව යනාදිය) ප්‍රයෝජනවත් කරගත හැකි වේ. දෙවනුව පිටස්තර ප්‍රදේශ වලින් පදිංචිකරුවන් පැමිණි විට මෙන් නොව ඒ ප්‍රදේශ වලින්

---

1/ විශ්වවිද්‍යාලමෙහි III වන අදියරේ ව්‍යාප්ති කටයුතු උදෙසා දැනට තරුණයින් තෝරාගෙන යනු ලැබේ. පදිංචිකරුවන් ලෙස ඔවුන් පිළිගනු ලැබීමට පෙර එම තරුණයින් භූමිය හෙළි පෙහෙළි කිරීම, ඇළවේලි ඉදි කිරීම ආදී කාර්යයන්හි කම්කරුවන් වශයෙන් සාමූහිකව වැඩ කළයුතු වන්නේය. මෙම යෝජනා ක්‍රමයේ පුරප්පාඩු නිවේදනය කරනු ලැබෙන විට ඉඩම් කච්චේරියෙන් නිකුත් කෙරෙන නිවේදනයේ මෙම කොන්දේසිය නියම කර ඇත.

සාමාජිකවරු තෝරා ගත් විට, ඔවුන් ප්‍රදේශයේ ජනතාව සමඟ ඇති සබඳතාවයේ බිඳීමක් සිදු නොවන හෙයින් ජනාවාසය ප්‍රදේශවාසී ගොවීන්ට ආදර්ශයක් බවට පත්වීමට ඇති අවස්ථා වැඩි වේ. මෙම ක්‍රියා මාර්ගයෙහි ලා පවතින අවදානමක් ද ඇත. එනම් ආසන්නම ගම්වල තරුණයින් මෙයට තෝරා ගතහොත් ගමෙහි පවතින ගතානුගතික බලවේගයන්ට ඔවුන් ගොදුරු වී යෝජනා ක්‍රමය තුළ නව ශිල්ප ක්‍රම යොදා ගැනීමට අපොහොසත් වීමෙන් ගම්වල පවත්නා දුගී භාවය හා නිශ්චලනය යෝජනා ක්‍රමයෙහිද ඇති වීමට පිළිවන.

මේ කරුණ පිළිබඳව තරුණ ව්‍යාපාර පහ පිළිබඳව අපගේ සංක්ෂි අ.2.5, අ.2.6, අ.2.8 හා 21 යන සටහන්වල ඇතුළත්ය. II–10 සටහනේ එම කරුණු සංක්ෂිප්තව දක්වා ඇත.

<u>සටහන II–10</u> තරුණ යෝජනා ක්‍රමවල සාමාජිකවරු පැමිණි මුල් ස්ථානය හා එය ව්‍යාපාරය කෙරෙහි බලපවත්නා අන්දම

| | පදිංචිකරුවන් ගෙන ආ දුර ප්‍රමාණය (සැතපුම්) | | ව්‍යාපාරයේ ස්ථිර වශයෙන්ම පදිංචිව සිටින අයගේ සියයට ප්‍රමාණය | ව්‍යාපාරයේ පදිංචි නොවන සාමාජික වරුන්ගේ නිවසේ සිට දුර ප්‍රමා. සැ. | ව්‍යාපාරය හා යාබද ප්‍රදේශය අතර සම්බන්ධතා වය |
|---|---|---|---|---|---|
| | සාමාන්‍ය | දුරස්තර භාවය | | | |
| මන්ඩලපුෂ | 5 | 1–35 | 96 | 4 | ගැමියන් බොහෝ දෙනෙක් කම්කරුවන් හැටියට වැඩ කරයි. ඊර්ෂ්‍යාව වාර්තා වී තිබේ. |
| මකම්පිටිය | 15 | 7–20 | 100 | – | හොඳ සම්බන්ධතාවයක් සංවේතවත් කරයි. |
| හුඩාඩය | 25 | 20–40 | 100 | – | ඇතැම්විට ඊර්ෂ්‍යාව හා ගැටුම් වාර්තා වී තිබේ. |
| යට්ටපාත | 34 | 9–56 | 100 | – | ගැටුම් නොමැත. කම්කරු සම්බන්ධතා ඇත. සමහර සාමාජිකයින් ප්‍රදේශයෙන් විවාහ සම්බන්ධතා ඇති කරගෙන තිබේ. |

| | පදිංචිකරුවන් ගෙන ආ දුර ප්‍රමාණය (සැතපුම්) | | ව්‍යාපාරයේ ස්ථිර වශයෙන්ම පදිංචිව සිටින අයගේ සියයට ප්‍රමාණය | ව්‍යාපාරයේ පදිංචි නොවන සාමාජික වරුන්ගේ නිවසේ සිට දුර ප්‍රමා. සැ. | ව්‍යාපාරය හා අදාළ ප්‍රදේශය අතර සම්බන්ධතාවය |
|---|---|---|---|---|---|
| | සාමාන්‍ය | දුරස්තර භාවය | | | |
| විස්වමඩුකුලම | 50 | 40-60 | 25 | 55 | ගැටුම් නොමැත. පදිංචිකරුවන් ගමේ ශ්‍රමය ලබා ගැනීම හා ගම්වැසියන් ජනාවාසයෙහි පදිංචි කරුවන්ගෙන් ට්‍රැක්ටර් කුලියට ගැනීම ආදියෙන් ඇති වී තිබෙන සබඳතා. |

මූලාශ්‍රය: 2 වෙනි පරිශිෂ්ටය, අ.2.5, අ.2.6, අ.2.8, අ.2.21 සටහන්

එක් අතකින් තරුණයින් ව්‍යාපාරයට පැමිනි දුර ප්‍රමාණය හා අනෙක් අතින් ව්‍යාපාරයට ඇති කැපවීම, ආර්ථික වශයෙන් ලබා ඇති දියුණුව සහ ව්‍යාපාරය අවට ගම් හා සමාශ්‍රතාවයක් ඇති කර ගැනීම යන කරුණු අතර කිට්ටු සම්බන්ධයක් ඇති බව ප්‍රත්‍යක්ෂ වෙයි.

(අ) ජනාවාසිකයින්ගේ කලින් පදිංචිය යෝජනා ක්‍රමය කෙරෙහි ඇති බැඳීයාවට අදාළ වන අයුරු සැලකීමේදී, විශේෂයෙන් වැඩිම දුරකින් පදිංචිකරුවන් ගෙන ආ විස්වමඩුකුලමෙහි වැඩි දෙනෙකු ව්‍යාපාරය තුළ ස්ථිර වශයෙන් පදිංචි නොවීම හේතුකොටගෙන සාමාජිකයින් වුව හිතින් යෝජනා ක්‍රමයට කැප වීමක් එහි වැඩි නැති බවත් ඔවුන්ගේ ගුපැයීම් වලින් වැඩි හරියක් ඔවුන් ව්‍යාපාරයෙන් පිටස්තරව ගම් පළාත්වල ආයෝජනය කර ඇති බවත් දක්නට ඇත. සාමාජිකයින් වැඩි දෙනෙකු, දුර බැහැර සිට පැමිණ සිටින ව්‍යාපාරයක් වන යට්ටපාත යෝජනා ක්‍රමයෙහිද සාමාජිකයින් තම ආදායමින් වැඩි කොටසක් වැය කර තිබෙන්නේ ව්‍යාපාරයෙන් පිටස්තරවය. එබඳු තත්වයකදී ව්‍යාපාර යෙන් සැතපුම් 10 ක් තුළින්, ප්‍රදේශයේ තරුණයින් තෝරා ගන්නේ නම් මැනවැයි යමෙකුට නිගමනය කළ හැක.

(ආ) කලින් කී ලෙස යෝජනා ක්‍රමය කෙරෙහි ඇති බැඳියාව කෙබඳු වුවද ව්‍යාපාර පනේම උපයා ඇති ආදායම සලකා බලනවිට වැඩිම දුරකින් පැමිනි තරුණයින් සිටින මෙම ව්‍යාපාර දෙක ආර්ථික වශයෙන් අතිශයින් සාර්ථක වී ඇත.

තරුණයින්ගේ මුල් පදිංචි ප්‍රදේශය ඊට හේතු වී යැයි විශ්වාස කිරීම අපහසුය. මෙහිදී වැදගත් වන්නේ සෙසු ව්‍යාපාරවලට වඩා, මෙම යෝජනා ක්‍රම දෙකෙහි වගා කෙරෙන මිරිස් හා වැලි දොඩම් වැනි, බෝග වලට වැඩි මිලක් ලැබෙන බවය. කෙසේ නමුත් යටිටපාත හා විස්වමඩුකුලම යන දෙපොලෙහිම සම්පූර්ණ පරීක්ෂණයට පෞද්ගලිකව යොමු කළ ගොවීන් අතරින් එක් එක් යෝජනා ක්‍රමයක උපරිම ආදායමක් උපයා ඇති තැනැත්තා වැඩිම දුරකින් පැමිණ ඇති තැනැත්තා වේ. (පිළිවෙලින් සැ. 50 හා 60)1/

(ඇ) අනතුරුව අප සලකා බැලිය යුත්තේ තරුණයින් පැමිණි දුර ප්‍රමාණය කවර අයුරකින් යෝජනා ක්‍රමය අවට ප්‍රදේශය හා ඒකාබද්ධ කිරීමෙහි ලා අදාළ වන්නේද, ගම්වාසීන් ව්‍යාපාරයේ සාමාජිකයින් කෙරෙහි දක්වන ආකල්පය කවරේද යනාදියයි. අවාසනාවකට මෙන් මෙම සම්බන්ධතාවය පිළිබඳව ස්ථිර නිගමනවලට එළඹීමට තරම් සාක්ෂි නොමැත. අපගේ නියැදියෙහි වන තරුණ යෝජනා ක්‍රම පහෙන් එකකවත් ජනාවාසිකයින් හා අවට ගම් අතර නියම ඒකාබද්ධතාවයක් දක්නට නොමැතිවා පමණක්නොව අවට ගම් කෙරෙහි ආදර්ශක බලපෑමක් ඇති කිරීමට එකද යෝජනා ක්‍රමයක්වත් සමත්ව නැත. මෙය සමහරවිට, අදාළ තරුණ යෝජනා ක්‍රම වලින් කිසිවකට අවට ගම් වලින් සාමාජිකයින් කිහිප දෙනෙකුට වඩා පැමිණ නොතිබීම නිසා සිදු වන්නක් විය හැකිය.2/ කෙසේ වුවද නව බෝග වර්ග වගා කර උසස් ආදායමක් ලබා ගන්නා ව්‍යාපාර වලින් (එනිසා යාබද ගම්වලට කිසියම් ආදර්ශයක් ගෙන දිය හැක) පෙනී යන පරිදි වැඩිම දුරකින් පැමිණ ඇති ජනාවාසිකයින් සිටින යෝජනා ක්‍රමවල (යටිටපාත හා විස්වමඩුකුලම) ජනාවාසිකයින් හා ගම්වාසීන් අතර වැඩි වශයෙන් කම්කරු ශ්‍රමය ලබා ගැනීමට ඇති අවශ්‍යතාවය මත පදනම් වූ සුහදතාවයක් වර්ධනය වී තිබේ. ලඟපාත ප්‍රදේශ වලින් පැමිණි ජනාවාසිකයින් සිටින යෝජනා ක්‍රමවල (මණ්ඩලපුර හා කුඩාඔය) සාමාජිකයින් ලබන වැඩි ආදායමත්, රජයෙන් ඔවුන්ට ලැබෙන වැඩි සැළකිල්ලත් හේතුකොටගෙන ඔවුන් හා ගම්වාසීන් අතර විරෝධතාවයක් හා ඊර්ෂ්‍යාව ඉස්මතු වී තිබේ. එනම්පිටියෙහි පමණක් (මෙයද, ආසන්න ප්‍රදේශයෙන් පදිංචිකරුවන් තෝරාගෙන ඇත.) ජනාවාසිකයින් හා අසල්වාසීන් අතර නියම මිත්‍රත්වයක් වර්ධනය වී ඇතැයි කිව හැක. නමුත් මෙය ඇතැම්විට යෝජනා ක්‍රමය ආර්ථික වශයෙන් ලබා ඇති දියුණුව මඳවීම හේතුකොටගෙන එහි

---

1/ මෙම සම්බන්ධතා ගැන තවදුරටත් අපගේ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල හා සමූපකාර ගම්මාන පිළිබඳ සාකච්ඡාවේදී සලකා බලනු ලැබේ.

2/ අවට ගම් වලින් සාමාජිකවරුන් වැඩි ගණනක් පැමිණ සිටින ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල හා ඇතැම් සමූපකාර ගම්මානවල තත්වයට වඩා මෙම තත්වය වෙනස් වේ. ඔව්හු නව ව්‍යාපාරවල වැඩ කරන අතර සිය ගමේ නිවසෙහි පදිංචිව සිටිත්. (3 වන හා 4 වන පරිච්ඡේද බලන්න)

සාමාජිකයින්ද, ගැමියන්ද එකම ආර්ථික මට්ටමක සිටීම නිසා ඊර්ෂ්‍යාව හා ගැටීම් ඇති කරන පදනමක් රහිත වීම නිසා සිදුවන්නක් විය හැක.

මෙම විශ්ලේෂනයෙන් අස්ථිර නිගමන කිහිපයකට එළඹිය හැකිය. එනමුත් අවධාරන යෙන් සඳහන් කළ යුත්තේ අප යොදාගෙන ඇති නියැදිය ඉතා කුඩා හෙයින් සාමාන්‍ය නිගමන කරා එළඹීමට තරම් ව්‍යාපාර ගණනක් එයින් නියෝජනය නොවන බවය.

(අ) දුර බැහැර ප්‍රදේශ වලින්[1] පදිංචිකරුවන් තෝරා ගත්විට ඔවුන් නව ශිල්පීය ක්‍රම හා සමාජයීය නවීකරන මාර්ග උපයෝගී කරගෙන මහන්සි වී වැඩ කර මුදල් ඉපයීමට දිරි ගන්නා පුරෝගාමී ආකල්පයක් ඇති කර ගන්නා බව පෙනී යයි.[2] එනමුත් ජනාවාසයේ ප්‍රජාව සමග බැඳියාවකින් යුතුව කටයුතු කිරීමේ ප්‍රවණතාවය ගැඹුරු අන්දමින් ඔවුන් තුළ දක්නට නොමැති අතර ව්‍යාපාරයේ ගුණාංග අවට ගම් කරා පතුරවාලීමට තරම් ආදර්ශමත් හැටියට කටයුතු කිරීමක් සිදු නොවේ.

(ආ) යෝජනා ක්‍රමයට ආසන්න ගම්වල පදිංචිකරුවන් තෝරා ගත් විට එය පිහිටුවීමේ පිරිවැය අඩු කර ගත හැකිවා පමණක්නොව, වටාපිටාවෙන් කොන් වීමට දක්වන නැඹුරුතාවයද අඩු වෙයි. යම් හෙයකින් යෝජනා ක්‍රමය සාර්ථක විනි නම්, සාමාජිකවරු කෙරෙහි ගම්වැසියන් තුළ ඊර්ෂ්‍යාවක් ජනිත විය හැකිය. මෙය සාමාජිකවරු දක්වන ආරම්භක ශක්තිය හා ව්‍යාපාරයේ ආදර්ශමත් භාවය පිරිහී යාමට තුඩු දිය හැකිය.

(ඇ) මෙම ප්‍රශ්නය සඳහා අවිත්ව ආකාරයේ විසඳුමක් යෝජනා කිරීමට පිළිවන.

1. යෝජනා ක්‍රමයට යාබදව ගම් වලින් නොව ඊට තරමක් ඈතින් තරුණයින් තෝරා ගැනීමෙන් යෝජනා ක්‍රමයේ ජන සමූහය හා අවට ප්‍රජාව සමග සෑහෙන පරතරයක් ඇති වේ. එම පරතරය ඒකාග්‍රතාවයා හා අනුකරණය ඇතිවීම වැළැක්වීමට තරම් දුරස්තර නොවිය යුතුය.[3]

---

[1] මෙහිදී වැදගත් වන්නේ නව යෝජනා ක්‍රමවලට තෝරා ගත් පුද්ගලයින්ගේ 'සමාජයීය දුරස්තරතාවය' හා භූගෝලීය දුරස්තරතාවයත්ය. පහතරට වෙරළබඩ අම්බලන්ගොඩ අවට පෙදෙසින් සැ. 20–30 රට තුළට වන මන්ඩලපුර හා යට්ටපාත ව්‍යාපාරවලට ගොස් ඇති තරුණයින්ට වඩා වෙල්ලජ්ටි සිට විස්වමඩුකුලමට සැතපුම් 60 ක් දුර සිට පැමිණි දෙමළ තරුණයින් හා එකී යෝජනා ක්‍රමය අවට ගම්මානවාසීන්ගේ සමාජ සම්බන්ධතාවය පොදු බවය.

[2] ඇත්තවශයෙන්ම යෝජනා ක්‍රමයේ මුදල් උපයා ගැනීමට තරම් වූ භෞතික හා ආර්ථික ශක්‍යතාවයක් ඇති බවටත් මූල්‍ය හා කළමනාකාරිත්ව ප්‍රතිපත්තීන්, මහන්සි වී වැඩ කිරීම හා ආරම්භක ශක්තිය දිරිගන්වන බවත් අදහස් කෙරේ.

[3] මෙයින් පෙනී යනුයේ අවට ගම් වලින් ව්‍යාපාරයට බැඳීමට කැමති පුද්ගලයින් සිටින බවය.

11. ඒකාබද්ධතාවය දියුණු කළහැකි වන පරිදි යාබද ගම් වලින් තරුණයින් කිහිප දෙනෙක් තෝරා ගැනීම හා නවීකරණය ධෛර්යමත් කරවනු උදෙසා වඩා දුර ප්‍රදේශ වලින් අනෙක් අය තෝරා ගැනීම. (මෙය එම ප්‍රදේශවල සේවා වියුක්තිය දුරු කරලීමටද හේතු වේ.) මේ කටයුතු කළයුතු වන්නේ යෝජනා ක්‍රමයේ සමාජ අනුරූපතාවය විනාශ කරලමින් නොවේ.

මෙම සංකල්ප ප්‍රාදේශීය සංවිධාන මණ්ඩල, සමූපකාර ගම්මාන යනාදියෙහි ලබා ඇති අත්දැකීම් මත තවදුරටත් පරීක්ෂාවට භාජනය කෙරේ.

## 2.4.4 ඉඩම් භුක්තිය

නව ජනාවාසවල ඉඩම් පිළිබඳ අයිතිය සාමූහික පදනමක් මත විය යුතුද නැතහොත් පෞද්ගලික පදනමක් මත විය යුතුද යන්න රජයේ ග්‍රාම සංවර්ධන ප්‍රතිපත්තියෙහි තීරණාත්මක සාධකයකි. ඇතැම්විට අධ්‍යයනයට භාජනව ඇති යෝජනා ක්‍රම සිවු වර්ගයෙහි ඉතාම කැපී පෙනෙන ලක්ෂණයද මෙයයි. මෙම සාධකය ශිල්පීය හා ආර්ථික ප්‍රගතිය කෙරෙහි මෙන්ම සමාජ හා පරිපාලනාත්මක සංවිධානය කෙරෙහිද වැදගත් බලපෑමක් ඇති කරයි. එහෙයින් එක් එක් යෝජනා ක්‍රම වර්ගයක අනුගමනය කළ පිළිවෙත ප්‍රවේශමෙන් සළකා බැලිය යුතු වේ.

අප සඳහන් කරන්නට යෙදුන පරිදි තරුණ යෝජනා ක්‍රම මුලදී සාමූහික ව්‍යාපාර ලෙස කාලපරිච්ඡේදයක් පවත්වාගෙන ගොස්, අනතුරුව ඉඩම් පුද්ගලික බිම් කැබලිවලට බෙදා දෙන ලද අතර සාමාජිකයෝ සේවා සමූපකාර සමිතියක් මගින් ඒකාබද්ධ වූහ. ගොවිපල සාමූහිකව පවත්වාගෙන යා යුතුද නැතහොත් එක් එක් අයෙකුට එය කොටස් කර දිය යුතුද යන්න පදිංචි තරුණයින් ගතයුතු තීරණයක් බව ආරම්භයේදී සළකන ලදී. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මුල් අවුරුදු කිහිපය තුළදී ලත් අත්දැකීම් අනුව සියළුම ව්‍යාපාරවල ඉඩම් බෙදා කට්ටි කර දිය යුතු බවට තීරණය කරන ලදී. අනතුරුව අළුතෙන් ආරම්භ කළ යෝජනා ක්‍රමවලදී මෙන්ම පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේදීද ඉඩම හෙළි පෙහෙළි කර ගෙවල් ඉදි කරන තුරු සාමූහිකව වැඩ කිරීමත් අනතුරුව ඉඩම්, කට්ටි කර බෙදා දීමත් අනුගමනය කළ ප්‍රතිපත්තිය විය.

සාමූහික හා පෞද්ගලික වශයෙන් වූ අදියර දෙකෙහි අත්දැකීම් වෙන වෙනම විමසා බැලිය යුතුය.

### (අ) සාමූහිකව කටයුතු කරන කාල පරිච්ඡේදය

සාමූහිකව කටයුතු කරන ආරම්භක කාල පරිච්ඡේදයෙන් අපේක්ෂා කරන්නේ මනා සුපරීක්ෂණයක් යටතේ සාමාජිකයින් නව ගොවිතැන් ක්‍රමවලට හැඩ ගැස්වීම, ඉඩම ඉක්මණින් සංවර්ධනය කිරීම පිළිබඳව තහවුරු වීම සහ ඉඩම කට්ටි කිරීමෙන් පසුව වුවද සාමූහික වගකීම හා සමූපකාර ආකල්පය

පිළිබඳ හැඟීම සාමාජිකයින් අතර පවත්වා ගැනීමට ඉවහල් වන පරිදි කටයුතු කිරීමයි. අපට ලැබුණ සාක්ෂිවලට අනුව මුල් අවදියේදී, (1966–68) අනාගතයේ ඉඩම් කට්ටිවලට බෙදීම පිළිබඳ පැහැදිලි තීරණයක් නොමැතිව සාමූහික ක්‍රමය ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදයේදී හැම ව්‍යාපාරයකම ප්‍රගතිය අතිශයින් අසතුටුදායක වූ බව පෙනී යයි. මන්ඩලපුරයේ තරුණයින් 60 දෙනෙකුට අක්කර 24 ක ගේ සිටුවීමට රු. 2,23,000/– ක් හා අවුරුදු තුනක කාලයක් ගත වීය. මනම්පිටියේ තරුණයින්ගෙන් 80% ක් පළමු අවුරුද්දේම ව්‍යාපාරය හැර ගියේ බොහෝදුරට අනාගත ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳව පැවති අවිනිශ්චිත තත්වය නිසාය. ව්‍යාපාර පහක තරුණයින් 50 දෙනෙකුගෙන් පමණ පෞද්ගලික හා සාමූහික ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න කළවිට ඔවුන්ගෙන් 44 දෙනෙක්ම පැවසුවේ පෞද්ගලික ඉඩම් අයිතියට ඔවුන් කැමති බවය. දෙදෙනෙක් සාමූහික අයිතියට කැමැත්ත දැක්වූ අතර, සිවු දෙනෙක් මේ දෙකම සම්බන්ධ මෙහෙයුම් ක්‍රමයකට, එනම් ඉඩම් කොටසක් සාමූහිකව ගොවිතැන් කිරීමටත් තවත් කොටසක් පෞද්ගලික අයිතිය ඇතිව පවත්වා ගැනීමටත් කැමැත්ත දැක්වූහ. (මේ පිළිබඳව අ.2.10 සටහන බලන්න) පෞද්ගලික හිමිකම ඇතිව ගොවිතැන් කිරීමට කැමැත්ත දැක්වීමට හේතු ලෙස ඔවුන් දැක්වූයේ ආර්ථික වශයෙන් ශීඝ්‍ර දියුණුවක් ලැබීමට ඉඩ ඇතිවීම, මහන්සි වී වැඩ කිරීමෙන් ප්‍රතිඵල ලබා ගත හැකි වීම, නෑදෑයින් උදව්වට පැමිණීම යනාදියයි. සෙසු සාමාජිකයින් ගැන විශ්වාසයක් තැබිය නොහැකි නිසා සාමූහිකව ගොවිතැන් කිරීමෙහි යෙදීම අපහසු බව සාමාන්‍ය අදහස විනි.[1]

යෝජනා ක්‍රම පහේම ඉඩම් කට්ටි කිරීමෙන් පසුව ලද අත්දැකීම් මේ අදහස සනාථ කරයි. මන්ඩලපුරයෙහිදී විශේෂයෙන් සාමූහිකව කළ ගේ වගාවට වඩා තනි තනිව පෞද්ගලික වශයෙන් කළ වැල් දොඩම් වගාව ශීඝ්‍රයෙන් කෙරුන අන්දම කැපී පෙනෙන වෙනසක් විනි. ( 20 වෙනි පිටුව) කෙසේ නමුත් මේ තරුණ මගින් පමණක් සාමූහික ව්‍යාපාර අඩු පලදාවක් ගෙන දෙන බවත් පෞද්ගලිකව කෙරුණු ගොවිතැනින් වැඩි පලදාවක් ගෙන දෙන බවත් නිගමනය කිරීම සාධාරණ නොවේ. තවත් කාරණයන් කිහිපයක්ම සාමූහික කාලපරිච්ඡේදය තුළ පලදාව හීන කිරීමට තුඩු දුනි.

1. අනාගත ඉඩම් ප්‍රතිපත්තියේ අවිනිශ්චිතතාවය: සාමූහික ක්‍රමයට ඇති නොකැමැත්තට වඩා මෙම තරුණ තරුණයන් අධෛර්යමත් කළා විය හැකිය. යටිටපාත හා විස්වමඩුකුලම I හා II වෙනි අදියරෙහිදී ඉඩම හෙළි පෙහෙළි

---

[1] අනික් අතින් සාමූහිකව ගොවිතැන් කිරීම වඩා සුදුසු බව අප සමඟ පැවසූ කිහිපදෙනා ඊට හේතු ලෙස දැක්වූයේ බර වැඩ එකමුතුව කිරීම පහසුවීම, හැමටම සමසේ ලැබෙන ආදායම, කෙනෙකු අසනීපයෙන් සිටී නම් සෙසු අයට උදව් කළහැකි වීම, ට්‍රැක්ටර් වැනි අධික මිළ වන උපකරණ කණ්ඩායමකට පහසුවෙන් මිළට ගතහැකි වීම යනාදියයි.

කර අවසාන වූ පැනින් එය කට්ටිවලට බෙදා දෙන බව සාමාජිකයින්ට මුල සිටම පවසා තිබී අතර සාමූහික භුක්ති ක්‍රමය යටතේද සාමාජිකයෝ, පසුව පෞද්ගලික පදනම යටතේ මෙන්ම වෙහෙස මහන්සියෙන් වැඩ කළහ.

II. යෝජනා ක්‍රම පාලනය කරන රජයේ නිලධාරීන් කිහිප දෙනෙකු හැරෙන්නට අනෙකුත් අය හැම දෙනාම පාහේ සාමූහික ගොවිතැන් ක්‍රමය ගැන එතරම් අවබෝධයක් තුබූ අය නොවීහ. තරුණ යෝජනා ක්‍රමවල සාමූහිකව කටයුතු කරන ලද කාල පරිච්ඡේදයේ ඒවා භාරව කටයුතු කළ නිලධාරීන් දැනට වෙනත් ප්‍රදේශවලට මාරු වී ගොස් සිටින බැවින් අපට ඔවුන් හා සාකච්ඡා කිරීමට අවස්ථාවක් නොලැබුණි. එනමුත් අපට මුණ ගැසීමට හැකි වූ හැම දෙනාම තරුණයින් වැඩි කැමැත්තක් දක්වන පෞද්ගලික ඉඩම් කට්ටි ලබා දීම සුදුසු බව පැවසූහ. තරුණයින්ට ඊට වඩා වෙනස් වූ පිළිවෙතකට අනුව කටයුතු කිරීමට එම නිලධාරීන් දිරි දුන් වගක් නම් නොපෙනුණි.1/

III. ඉඩම කට්ටි කිරීමට තරුණයින්ගෙන් ඉල්ලීමක් නොමැතිවිට පවා ඔවුන්ගේ නෑදෑයෝ එම ඉල්ලීම කරන ලෙස තරුණයින්ට බල කළහ.

IV. සමහර අවස්ථාවලදී ඉඩම් සංවර්ධනය කෙරෙන තුරු තරුණයින්ට සහනාධාරයක් දීමේ ප්‍රතිපත්තියක් වීම නිසා ඔවුන් එම කාල පරිච්ඡේදය දීර්ඝ කරවා ගැනීමට කැමති වූවා විය හැකිය.

මේ තත්වය යටතේ තරුණයින් ඉඩම් කට්ටි කරන ලෙස ඉල්ලා සිටීම පුදුමයකට කරුණක් නොවේ. ඇත්ත වශයෙන් වැදගත් මවිතය දනවන කරුණක් වූයේ 1973 සම්මුඛ පරීක්ෂණවලට භාජන කළ පිරිසගෙන් 12% ක් පමණ සාමූහික ගොවිතැන් ක්‍රමයකට හෝ සාමූහික හා පෞද්ගලික තත්වයන්ගෙන් යුතු ගොවිතැන් ක්‍රමයකට කැමැත්තක් දැක්වීමය. රජයේ නිලධරයන්ගේත් තරුණයින්ගේ පවුල්වල අයගේත් කැඩුරු වීමට එකඟව වැඩි දෙනාගේ තීරණය අනුව ඉඩම කට්ටිවලට බෙදීමට තීරණය කිරීම සමහරවිට නොවැළැක්විය හැකි දෙයක් විණි. නව යෝජනා ක්‍රමයන්හි හා ව්‍යාප්ති ප්‍රදේශයන්හි ඉඩම් සාමූහිකව සංවර්ධනය කළ පසු කට්ටි කැඩීම සිදු කරන බවට පොරොන්දු වීමෙන් අවිනිශ්චිත බලාපොරොත්තු ඉවත් කිරීමද කාර්මික ක්‍රියා මාර්ගයක් වූයේය. ඊට වෙනස් පරිසරයක් යටතේ තවත් විසඳුමක් යෙදීමට ඉඩ තිබුණේදැයි සමූපකාර ගොවිපල හා ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස පිළිබඳ පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ. එනම් ආරම්භයේදී පටන්ම ඉඩම් කට්ටි කිරීම ගැන සඳහනක් නොකර සාමූහික මූලධර්මය පිළි ගන්නා තරුණයින් හා නිලධාරීන් පමණක් ඊට තෝරාගෙන සමූපකාර ගොවිපල ක්‍රමය සාර්ථක කරනු වස් අවශ්‍ය පුහුණු

---

1/ ඇත්ත වශයෙන්ම මෙය ඔවුන්ගෙන් බලාපොරොත්තු වූ තත්වයද නොවේ. (10, 11 වෙනි පිටු බලන්න)

කිරීම් හා සම්පත් යෙදවීම් කෙරේ අවධාරණය යොමු කිරීමයි. කෙසේ වුවත් තරුණ යෝජනා ක්‍රමවල අනාගත ප්‍රගතිය සලකා දැන් අප පරීක්ෂා කළයුතු වන්නේ මූලික සාමූහික කාල පරිච්ඡේද යෙන් පසුව ඉඩම බෙදීම නිසා ඇති වන ප්‍රතිවිපාක පරීක්ෂා කිරීමය.

### (ආ) පෞද්ගලික පදනමක් මත කටයුතු කරන කාල පරිච්ඡේදය

ඉඩම කට්ටි කර එක් එක් අයට බෙදා දීමෙන් පසුව, කලින් රජයෙන් දුන් සහනාධාර මත රඳා පැවැත්මක් නොමැතිව ව්‍යාපාරවල කැපී පෙනෙන දියුණුවක් දක්නා ලද අතර, ගොවීන් වැඩි දෙනෙක් සිය කටයුතු කර ගැනීමෙහි ලා ස්වශක්තිය ලබා ගත්හ. තනි ඉඩම් අයිතියෙන් ලැබෙන සානුබලය ව්‍යාපාර වැඩි හරියක ක්‍රියාත්මක වනු දක්නා ලදී.

කෙසේ වුවද වැඩිදුර විමර්ශනයේදී, ඉඩම් කැබලි කිරීම නිසා කෙලින්ම ඇති වූ අවාසි දායක සිද්ධීන් කීපයක්ම දක්නට ලැබිණ.

1. එක් එක් යෝජනා ක්‍රමයක් ගත් විට ගොවිතැන් කිරීම් පිළිබඳ ශිල්පීය වශයෙන් සෑහෙන වෙනස්කම් තරුණයින් අතර තිබුණි. විස්වමඩුකුලමිහි සමහර ගොවීන් අක්කරයට හොණ්ඩර 30 කට වැඩි පිරිස් අස්වැන්නක් ලබා ගත් අතර සමහරුන් ලබා ගත්තේ අක්කරයකට හොණ්ඩර 5 කට අඩු ප්‍රමාණයකි. යට්ටපාතෙහි සමහර මුල් ආධුනිකයන් ඔවුන්ගේ අක්කර තුනක බිම් කැබැල්ල මුළුමනින්ම වගා කර තිබෙන අතර සමහරුන්ට වගා කළ හැකිව ඇත්තේ එක් අක්කරයක් පමණකි. තත්වය පිළිබඳ මේ වෙනස්කම් වලින් හැඟෙන්නේ සමහර තරුණයින් ගේ තත්වය ඔවුන් සාමූහිකව වැඩ කළ කාල පරිච්ඡේදය තුළදී පැවති තත්වයටත් වඩා අසතුටුදායක බව පමණක්නොව සමස්තයක් වශයෙන් ගත් කළ ව්‍යාපාරයේ ශිල්පීය හැකියාව මුළුමනින් සාක්ෂාත් කරගෙන නැති බවය.

   මෙම වෙනස්කම්වලට හේතූන් වශයෙන් (ව්‍යාපාරයන්හි ඒකාකාර උසස් මට්ටම් අනාගතයෙහි පවත්වාගෙන යාමට නම් [illegible] ගත යුතු) සඳහන් කළ හැකි කරුණු කීපයකි: තරුණයින්ගේ හැකියාවන්හි ඇති වෙනස, බිම් කැබලිවල තත්වයේ වෙනස,[1] විවිධ පුද්ගලයින් රාශියකගේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීමට ඇති අපහසුව,[2] කණ්ඩායමක් වශයෙන් සිටින සමූපකාරිකයන් කොටසක් හා සසඳන කළ පැතිර සිටින විවිධ පුද්ගලයින් රාශියකට ශිල්පීය උපදෙස්

---

1/ කුඩාඔය ප්‍රදේශයේ සමහර බිම් කොටස් ගල් සහිත වන අතර සමහරක් සාරවත් පසින් යුක්තය. විස්වමඩුකුලම් වැව අසලින්ම පිහිටි බිම් කොටස්වලට නිත්‍යව ජලය සැපයෙන අතර ඈත මාර්ගවල කෙලවරින් ඇති බිම්වලට එපරිද්දෙන් ජලය නොලැබේ.

2/ වාරිමාර්ග යෝජනා ක්‍රමයකින් ජලය සැපයෙන ව්‍යාපාරවලදී මෙය විශේෂයෙන් වැදගත් වේ. වෙනි පිටුවෙහි අප මේ පිළිබඳ සඳහන් කර ඇති පරිදි නීති විරෝධී ලෙස ජලය ලබා ගැනීම හෝ පමා වී බිම් සකස් කිරීම නිසා මුළු යෝජනා ක්‍රමයටම හානි වීමට ඉඩ ඇත.

දීමේදී හා මග පෙන්වීමේදී ඇති වන විශාල අපහසුව ආදිය වේ. මීන් සමහරක් පෞද්ගලික කුඩා ඉඩම් ගොවිතැන් කිරීමේ අනිවාර්ය ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ගැටළුය. අනෙක්වා මනා පුහුණුව හා අධීක්ෂණය මගින් සහ පරීක්ෂාකාරීව බිම් කැබලි සැළසුම් කිරීම ආදියෙන් (සෑහෙන ප්‍රමාණයකින් මග හරවා ගත්) මග හරවා ගත හැකි ඒවාය. එසේ වුවද සමහර තරුණයින්ගේ දුර්වල වගා තත්වය වැඩි දියුණු කරවා ගැනීමට නොහැකි වී ඇති නමුත් සමස්තයක් වශයෙන් ගත් කල යෝජනා ක්‍රමයන්හි සාමාන්‍ය තත්වය ඉඩම් කැබලි කිරීමෙන් පසුව දියුණු වී ඇති බවට සැකයක් නැත.1/

II. අභ්‍යර්පික අතින් බැලූ විට අසමාන ආදායම් තත්වයන් විදහා දැක්වූයේ ගොවිතැන් කටයුතුවල අසමාන තත්වය හේතුකොටගෙනය. පසුගිය කන්නයේදී මනම්පිටියේ හොඳම ගොවියා ඉපැයූ සාමාන්‍ය ආදායම මසකට රු. 875/- ක් පමණ විය. ඉපයූ අඩුම ආදායම රු. 50/- ක් විනි. විස්වමඩුකුලමෙහි මෙය මසකට රු. 100/- සහ රු. 1,500/- අතර විය. (සටහන අ.2.16 බලන්න) මේවා ඉතාම අන්තවාදී අවස්ථාවන් වේ. කෙසේ වුවද ආදායම් අතර වෙනස ඉතාම දරුණු වී නැත්තේ සම බිම් කොටස් ප්‍රමාණය අනුව උද්ගත වී ඇති සීමාවන් නිසාය.

මේ අවස්ථාවේදී වඩාත් කැපී පෙනෙන දෙයක් නම් ආර්ථික හේතූන් නිසා සාමූහිකවම ඉටු කළයුතු සමහර ක්‍රියාවන් පෞද්ගලික පදනමක් මත සිදු කරනු ලැබෙන බවය. මේ අනුව කුඩාඩය එක් එක් සාමාජිකයා තම පොහොර සහ රසායන ද්‍රව්‍ය පෞද්ගලිකව වෙනම ලබා ගන්නා අතර, තම එළවළු පෞද්ගලිකව අලෙවි කරයි. මෙම ව්‍යාපාරයේම රජයේද සහාය ඇතිව වාරිමාර්ග යෝජනා ක්‍රමයක් ඉදි කිරීම සඳහා සමූපකාර සමිතිය මගින් බැංකු ණයක් ලබා ගැනීමට යෝජනා කර තිබුණද සාමාජිකයින් විසින් ලබා ගත් ණය ආපසු නොගෙවීම නිසා සමූපකාර සමිතිය ණය ලැබීමට නුසුදුසු තත්වයකට පත් වීමෙන් මෙම කාර්යය ඉටු කිරීමට නොහැකි විය. දැන් උද්ගත වී ඇති

---

1/ මීට පටහැනි තත්වයක් ඇති වූ එක් අවස්ථාවක් පිළිබඳව සඳහන් කළ යුතුය. මන්ඩලපුර හේ වගාවෙහිදී සාමූහික භුක්ති ක්‍රමය යටතේ සංවර්ධන වැඩ වියදමක් සහිතව සෙමින් සිදු වුවත්, පෞද්ගලික හිමිකාරත්වය සහ කළමනාකාරීත්වයක් යටතේ දියුණු කිරීමට බැරි තරම් උසස් ශිල්පීය මට්ටමකට අවසානයේදී එම හේ වගාව දියුණු වුනේය. 1973 දී ඉඩම අතුරු කොටස්වලට බෙදීමෙන් පසුව වගා තත්වය තවම නරක අතට හැරී නැත. (ගම් පුළුල් කිරීම සඳහා කට්ටි කළ හේ වතු බොහොමයක සිදු වූ පරිදි) එහෙත් අනාගතයේදී සමූපකාර සමිතියට පැවරෙන, දැනට යෝජනා ක්‍රමයේ කළමනාකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබෙන අධීක්ෂණ මට්ටම ඒ අයුරින්ම පවත්වා නොගතහොත් වගා තත්වය පිරිහීමට පත්වීමේ තර්ජනය නිරතුරුවම පවතී.

නුවණට හුරු නොවන ක්‍රියා කලාපයක් නම් සාමාජිකයින් දෙදෙනෙකු තම ජල සම්පාදන කටයුතු තමන්ම පිළියෙල කර ගැනීමට හා අනෙක් අයද ඒ අනුව පිළිපැදීමට යාමෙන් අනවශ්‍ය අධික වියදමක් දැරීමට සිදුව තිබීමයි.[1]

තම සමූපකාර සමිතිය කෙරෙහි සාමාජිකයින් තුළ පොදුවේ විශ්වාසයක් නොමැති බව මෙම කරුණු වලින් ප්‍රත්‍යක්ෂ වන අතර මෙය පෞද්ගලික ගොවිපලවල්වල ආර්ථික කාර්යක්ෂමතා වය බෙහෙවින් හීන වීමට තුඩු දෙන තත්වයකි. ඉඩම් බෙදා දීමෙන් පසුව පෞද්ගලිකව ගොවිතැන් කරන කාලයේදී පවා සාමූහික හැඟීම පවතින පරිදි සාමාජිකයින් මුල් කාලයේදී එක්ව එකට වැඩ කිරීම නිසා අත් කරගත යුතුව තිබුණු සාමූහික සංකල්පය ළඟා කරගෙන නොමැති බව පෙනේ.

III. වැඩෙමින් පවතින ආර්ථික අසමානතා තවමත් සමාජ අසමානතා බවට පරිවර්තනය වී නැත. මෙම අසමානතාවයන් තවමත් එතරම් අන්තවාදී නොවීම මෙයට එක් හේතුවකි. අනෙක් හේතුව නම් වඩා සාර්ථක ලෙස ලාභ උපයා ගත් ගොවීන් එම ධනය ව්‍යාපාරයෙන් පිටත කාර්යයන් සඳහා ආයෝජනය කර තිබීමය. කලක් තිස්සේ ස්ථාපනය වූ (ජනපද) ව්‍යාපාරවලදී සිදු වී ඇති පරිදි සාර්ථක ගොවීන් අසාර්ථක ගොවීන්ගෙන් ඉඩම් මිළදී ගෙන ඉඩම් හිමියන් වූ අවස්ථාවන් හෝ සාර්ථක තත්වයෙන් අඩු ගොවීන් වඩාත් සාර්ථක ගොවීන්ගෙන් මුදල් හෝ යෙදවුම් ණයට ගැනීම ආදිය පිළිබඳ අවස්ථා මෙහිදී සිදු වී නැත.[2] අනෙක් අතින් මෙවැනි පන්ති භේද ඇති වීම ගැන තරයේ විරුද්ධ හැඟීම්ද අපට දක්නට නොලැබුණි. එහෙයින් නිසි පියවර වහාම නොගතහොත් මෙම තත්වය ඇතැම් යෝජනා ක්‍රමයන්හී ඇති විය හැකි බව හැඟී යයි.

වඩාත් කැපී පෙනෙන එමෙන්ම වැඩි වෙමින් පවතින සමාජ අසමානත්වය දක්නට ලැබෙන්නේ තරුණයින් සහ ඔවුන්ගේ කුලීකරුවන් අතරයි. (සටහන අ.2.13) වැඩ අධික කාලවලදී අසල ගම් වලින් ගෙන්වා ගත් කුලීකරුවන් එතරම් ගැටළුවක් නොවේ. ඇත්ත වශයෙන් මෙම පුරුද්ද නිසා පලදායීතාවය වැඩි වීම,

---

1/ මෙසේ විස්වමඩුකුලමෙහි ඇති ට්‍රැක්ටර් වලින් බොහොමයක් අයත් වන්නේ සමූපකාර සමිතියට නොව සාමාජිකයින්ටය. මෙම තත්වය ඉහත කී ජල සම්පාදන ක්‍රමයේදී සිදු වන්නාක් මෙන් ආර්ථික වශයෙන් අහිතකර නොවේ. මෙහි බලපෑම ආර්ථික වශයෙන් නොව සමාජයීය වශයෙනි.

2/ නමුත් විස්වමඩුකුලම්, කුඩාඔය යනාදි යෝජනා ක්‍රමයන්හී මේ හා සමාන අවස්ථා කීපයක් දැක ගත හැකි විය. වඩා මහන්සියෙන් වැඩ කරන සාමාජිකයින් දැනටමත් ආරක්ෂිත බිම් කොටස් හා අත හැර දැමූ බිම් කොටස් අනවසරයෙන් තම බිම් කොටස්වලට අඳාගෙන එය විශාල කරගෙන ඇති බව පෙනේ. පැහැදිලිව කිව හැකි කරුණක් නම් එවැනි ගොවීන් තම බිම් කොටස විශාල කර ගැනීමට ක්‍රමයක් ඇත්නම් තමන්ට ලැබී ඇති සීමා සහිත බිම් කොටසෙන් සෑහීමකට පත් නොවන බවය.

ප්‍රදේශය තුළ රැකියා පැතිරීම සහ ගම හා ව්‍යාපාරය අතර එකමුතුකම ඇති වීමට තුඩුදීම යන කරුණු ගැන සළකා බලනවිට සෑහෙන වැදගත් ප්‍රතිඵල ඇති වී තිබේ.[1] නමුත් සමහර අවස්ථාවලදී ස්ථිර කුලී කරුවන් යොදාගෙන ඇත. එක් අවස්ථාවක විශ්වමධුකුලමෙහිදී, උඩරට වතුකරයේ පුරවැසි නොවන දෙමළ ලමුන් යොදාගෙන තිබුනි. මොවුනට යැපීම් සඳහා මසකට රු. 50/- සිට රු. 100/- දක්වා මුදලක් හෝ කන්නයකට රු. 400/- ක් පමණ ගෙවනු ලැබේ.[2] සමහර විශ්වමධුකුලම් කට්ටිකරුවෝ පිටස්තර රැකියාවන්හි නිරත වී සිටිති. (එක් අයෙකු බස් කොන්දොස්තර කෙනෙකු ලෙසද තවත් සමහරු ගුරුවරුන් ලෙසද ආදී වශයෙනි.) ඔවුන්ගේ ඉඩම් කට්ටිවල සියළු වැඩ කරනු ලබන්නේ කුලී කරුවන් විසිනි. බිම් කැබැල්ලේ ප්‍රමාණය පවුල් ශ්‍රමයෙන් පාලනය කර ගත හැකි පමණට වඩා විශාල වන්නට හැරියොත් කුලී ශ්‍රමය මත යැපීමේ ප්‍රවණතාවය වඩාත් ප්‍රචලිත වීමට ඉඩ ඇත.[3]

මෙම අසමතාතාවයන් හැරුණුවිට, සඳහන් කළ යුතු තවත් කරුණක් නම් සාමාන්‍ය වශයෙන් සියළුම තරුණ යෝජනා ක්‍රම සහයෝගිතාවයෙන් වැඩ කිරීම වෙනුවට පෞද්ගලිකත්වය වෙත වැඩි වශයෙන් නැඹුරු වෙන බවය. ( 33 වෙනි පිටුව) සමහර ව්‍යාපාරවල පවතින පුරෝගාමී ස්වභාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන්ද, තරුණයින්ගේ පවුල්වල බලපෑම නිසාද, මුල් සමූහ කාල පරිච්ජේදයේදී ලබා ගත් කලකිරෙන සුළු අත්දැකීම් නිසාද, ජන සමූහයක් වැඩීම මර්දනය වන

---

1/ කුලී කරුවන් යොදා ගැනීම වැළැක්වුවහොත් යට්ටපාත වැනි යෝජනා ක්‍රමයක සාමාන්‍ය පවුලකට අවුරුද්ද පුරා වැඩ කර ගත හැකි බිම් ප්‍රමාණය අක්කරයකට වැඩි වන්නේ ස්වල්ප වශයෙනි. මේ තත්වය යටතේ අවුරුද්දකට දස මසකටත් වැඩි කාලයක් තුළ පවුලේ ශ්‍රමය පුර්ණමතින් යොදා ගත නොහැක. මෙනිසා උපයන ආදායම විශාල වශයෙන් අඩු වේ. දෙමසක් තුළ කුලී ශ්‍රමය යොදා ගතහොත් වගා කළහැකි ප්‍රමාණය අක්කර තුන පමණ දක්වා වැඩි කර ගත හැකි වන අතර ආදායමද එම අනුපාතය අනුව වැඩි වේ. එසීයේ වැඩි කාලයක් මුළුල්ලේ පවුලේ ශ්‍රමය පූර්ණමතින් යෙදවේ.

2/ සේවකයන් හා සේව්‍යයන් විසින් ඉදිරිපත් කළ ගෙවීම් ප්‍රමාණයන් මෙහි දක්වා ඇත. නමුත් ඇත්ත වශයෙන්ම ගෙවා ඇති වේතන ඊට වඩා අඩු වීමට පිළිවන.

3/ ඊට ප්‍රතිවිරුද්ධව, කලින් සඳහන් කළ ( 21 වෙනි පිටුව)පහත විස්තර කරන කරුණු දැක්විය හැකිය. අඩු තරමින් විශ්වමධුකුලමේවත් තරුණයින් දැන් තම ශ්‍රමය යොදා වැඩ කර ගැනීම මුල් අවදියට වඩා වැඩි කර ඇත. ඊන් ලැබෙන වාසි සහ වැඩි ආදායම හේතුකොටගෙන මෙය පහත් තත්වයේ ක්‍රියාවක් ලෙස තවදුරටත් සළකනු නොලැබේ.

පරිදි විශාල වශයෙන් විසිරී යන අයුරින් බිම් කට්ටි බෙදා දීම නිසාද, සහයෝගීතාවයෙන් වැඩ කිරීම සඳහා පුහුණුවක් නැති කමින්ද අදාළ බොහෝ නිලධාරීන්ගේ බලපෑම් වලින්ද මෙම තත්වය උද්ගත වී ඇත. ආරම්භක සාමූහික කාල පරිච්ඡේදයෙන් පසුව, අන්‍යොන්‍ය විශ්වාසය හා ඔවුනොවුන් මත රඳා පැවැත්ම පිළිබඳ හැඟීම පෞද්ගලික කාල පරිච්ඡේදය තුළටද එළඹීම වෙනුවට සිදුව ඇත්තේ ඊට ශුද්ධරාම පටහැනි ක්‍රියාවකි.

IV. ඉඩම් භුක්තිය පෞද්ගලික කිරීම නිසා පරිපාලනමය වශයෙන්ද තරුණ යෝජනා ක්‍රම කෙරෙහි බලපෑම් කීපයක් සිදු වී ඇත. සාමූහික කාල පරිච්ඡේදයේදී බලය මුළුමනින් කේන්ද්‍ර ගත වූයේ රාජ්‍ය නිලධාරීන් වෙතය. කළමනාකාරීත්ව යෙහි ලා තරුණයින්ගේ සහභාගීත්වය දිරිමත් කරනු නොලැබිනි. නමුත් ඉඩම් වෙන් කිරීමෙන් පසුව ඔවුන්ට තම තමන්ගේ කාර්යයන් ගැන වග බලා ගැනීමට සිදු විය. සීමිත අවස්ථා කිහිපයකදී ඔවුන් කාර්යක්ෂම අයුරින් මෙය ඉටු කර ඇත. මේ අනුව මන්ඩලපුර හා යට්ටපාත තේ සහ වැලි දොඩම් වගාවන් අලෙවි කර ගැනීමට ඇති එකම මග භාවිතා කරමින් තරුණයින් විසින් මෙම කාර්යය සිය සමූපකාර සමිතිය මගින් ඉතා කාර්යක්ෂම ලෙස ඉටු කර ගනිති.

නමුත් එකම මොහොතේ ප්‍රතිවිරුද්ධ ප්‍රවණතා දෙකක් ඇති වී තිබේ. එකක් නම් වැඩි උත්සාහයකින් වැඩ කළ සාමාජිකයෝ සමූපකාර පරිපාලන කමිටුවල සාමාජිකත්වය ලබා ගැනීමට ඉදිරිපත් නොවීමය.1/ දෙවැන්න නම් ඇතැම් යෝජනා ක්‍රමවල, සාමූහික කාල පරිච්ඡේදයේදී මෙන් රජයේ නිලධාරීන් මත රඳා පැවැත්ම වඩා පහසු (සමහරවිට වඩා ආරක්ෂාකාරී) යයි සිතා එම පාලනය තවදුරටත් පවත්වාගෙන යාම සුදුසු යයි සමස්ථයක් වශයෙන් සියළුම සාමාජිකයෝ සිතා සිටිමයි.2/

මෙම තත්වය කලිනුදු දක්වා ඇති පරිදි මන්ඩලපුරදී මෙන් ඒකාධිකාරී රජයේ නිලධාරියෙක් විසින් තරුණයින් අනවශ්‍ය කාර්යයන්හි යෙදවීමට හෝ කුඩාඔයදී මෙන් ඇතැම් ආත්මාර්ථකාමී සාමාජිකයින්ගේ අදහස් මුදුන් පමුණුවා ගැනීමට

---

1/ මෙසේ කුඩාඔය සමූපකාර සමිතියේ කාරක සභිකයින් වැඩට වඩා කථාවට දක්ෂ තරුණයින් හැටියට පොදුවේ පිළිගනු ලැබේ. මොවුන් තමන්ගේම අභිවෘද්ධිය අගය කරන අතර සමූපකාර සමිතිය ලබා ඇති අපකීර්තිය මෙනයින් තවත් වැඩි වේ.

2/ වාරිමාර්ග ජලය බෙදා හැරීම තමන්ට කළ නොහැකි බව විස්වපඩුකුලමේ තරුණයන් ප්‍රකාශ කරන අතර එය රජයේ නිලධාරීන් විසින් කළයුතු බව ඔවුන්ගේ අදහසයි. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වඩා හොඳින් ඔවුනට මෙය කළහැකි බව හොඳින් පැහැදිලි අතර රජයේ නිලධාරීන් ඉවත් කර ඔවුන්ට මෙම වගකීම භාර ගැනීමට බල කළ යුතුය.

මත් පාදයි. පෞද්ගලික බිම් කොටස් ලබා දීමෙන් පසු සාමාජිකයින් ස්වයං-පාලන ක්‍රමයට නිතැතින්ම නැඹුරු වන හෙයින් සාමූහික කාල පරිච්ඡේදයට වඩා, යථෝක්ත අවදානම මදක් අඩු විය හැක.[1] නමුත් තවමත් මෙය පැහැදිලිව පෙනෙන කරුණකි.

පසු කාලයක වෙන් වෙන්ව ජීවත් වීමේදී අවශ්‍ය වන සාමූහික හැඟීම හෝ සහයෝග යෙන් කටයුතු කිරීම පිළිබඳ හැඟීම උත්පාදනය කිරීමට මූලික සාමූහික කාල පරිච්ඡේදය අපොහොසත් වූවා පමණක් නොව, ඉඩම බෙදීමෙන් පසුව සමූපකාර සමිතියේ ස්වයං-පාලනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමටද අපොහොසත් විනි.

## (ඈ) නිගමනය

තරුණ යෝජනා ක්‍රමයන්හි අනුගමනය කරන ඉඩම් අයිතිය පිළිබඳ ද්වි-මාර්ග භුක්ති ක්‍රමය හේතුකොට ඇති වන සමහර අයහපත් ලක්ෂණ දක්නට ලැබුනත් සංවර්ධනය හා සමානාත්මතාවය එකට අඳින ප්‍රජාවක් පිහිටවීම සඳහා මෙම ක්‍රමය ක්‍රියාත්මක නොකළ හැකි යයි අපි විශ්වාස නොකරමු. මේ උපාය මාර්ගය සාර්ථක කර ගැනීමට දිය යුතු අවශ්‍යතා තවම සපුරා නැත. එමෙන්ම සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය මැන ගැනීම සඳහා සාධාරණ අවස්ථාවක් තවම ලබා දී නැත. අප විශ්ලේෂනයෙන් මතු වුනු ප්‍රධාන කරුණු හා අනාගත තරුණ යෝජනා ක්‍රමයෙහි දෙවැනි අදියරේදී තරුණයින් අතර පෞද්ගලික වාදය ඇති වීම වැළැක්වීමට හේතු විය හැකි යෝජනා කීපයක් පහත දැක්වෙයි:

1. අනාගත ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය පිළිබඳ අවිනිශ්චිත බවක් සහිතව සාමූහිකව ගොවිතැන් කළ මුල් කාලයේදී වර්ධන වේගය ඉතා අල්ප විය. තවද එම සමූහ ගොවිතැන් ක්‍රමය, තරුණයින්ද ඔවුන්ගේ පවුල්වල අය විසින්ද ඔවුන්ට මග පෙන්වූ නිලධාරීන් විසින්ද බාර ගත්තේ නොකැමැත්තෙනි. සාමූහික ප්‍රතිපත්ති කෙරෙහි ඇති බැඳියාව පදනම් කරගෙන නිලධාරීන්ද, තරුණයින්ද තෝරා නොගත් නිසා සමහරවිට මෙය වැළැක්විය නොහැකි වූවා වන්නට පිළිවන. ඔවුන්ට ලබා දුන් පුහුණුව හා සේවාවන් සාමාන්‍යයෙන් ප්‍රමාණවත් නොවීය. අදාළ සෑම පුද්ගලයෙකු ගේම බලාපොරොත්තුව වූයේ ඉඩම් ඉතා ඉක්මනින්ම කට්ටිවලට වෙන් කෙරෙන බවය. ඉඩම මූලිකව සංවර්ධනය කිරීමෙන් පසු පෞද්ගලික බිම් කට්ටිවලට එය වෙන් කර දෙනු ලැබෙන බව ආරම්භයේදීම තරුණයින් වෙත පැවසුන, 1970 න් පසු ඇරඹී යෝජනා ක්‍රමයන්හි සංවර්ධන වේගය වඩාත් වේගවත් විනි.

   අනාගතයේදී ඇති කරන ව්‍යාපාරවලදී ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය පිළිබඳ මෙවැනි අවිනිශ්චිත තත්වයක් ඇති වන සේ කටයුතු නොකළ යුතු බව අපගේ නිර්දේශ යයි. ඉඩම සාමූහික පදනමක් මත සංවර්ධනය කිරීමෙන් පසුව පෞද්ගලික බිම් කොටස් වශයෙන් බෙදා දෙන බව තරුණයින්ට පවසා සාමූහික හැඟීම පසුව පෞද්ගලිකව ගොවිතැන් කරන කාලයේදීද තහවුරුව පවතින සේ ඉතා

---

[1] ව්‍යාපාරය තමන් විසින්ම පාලනය කිරීමට නොහැකි වී ඇත්තේ තමන්ගේ නිදහසෙන් 70% සිට 80% ක් රජයේ නිලධාරීන් නිසා නැති වී තිබීමෙනැයි වස්වමඩුකුලමේ තරුණයින් සමඟ කල සාකච්ඡාවකදී හෙළි වූ බව ප්‍රකාශ කිරීම මෙහිදී වැදගත් වනු ඇත.

සූක්ෂම පුහුණුවක් ලබා දිය යුතුය. එසේ නැතහොත් මුල සිට අග දක්වාම සාමූහිකව ගොවිතැන් කරන බව පැහැදිලිව ප්‍රකාශ කර සාමාජිකයින් එම තත්වයන්ට ගැලපෙන පරිදි තෝරාගෙන පුහුණු කළ යුතුය.

II. ඉඩම් බෙදා දීමෙන් පසුව පෞද්ගලිකව ගොවිතැන් කරන කාලයේදී සෑම ව්‍යාපාරයකම වාගේ සීඝ්‍ර දියුණුවක් දක්නට ලැබුණි. නමුත් සමාජයීය හා ආර්ථික අසමතාවයේ බීජ ඒ සමඟම රෝපනය වන්නට වූවා පමණක්නොව නියම පරිමාණයට පහත් මට්ටමකින් සමහර කාර්‍යයන් කළ නිසා අකාර්‍යක්ෂමතාවයද ඇති විනි. එපමණක් නොව මූලික බලාපොරොත්තුවක් වූ පරිපාලන කටයුතුවලදී සාමූහික වගකීම භාර ගැනීම ඉටු නොවීය. තරුණයින්ගේ කැමැත්ත වූයේ රජයේ නිලධාරීන් දිගටම පාලන කටයුතු කරගෙන යාම වූ අතර සාමූහික වැඩ කටයුතුවලට තරුණයින් සහභාගී කරවා ගැනීම අපහසු විය.

කෙසේ වුවද, ප්‍රථම පියවරේදී යෝජනා කළ ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් පසුව පහත සඳහන් ක්‍රියා පිළිවෙල දෙවැනි පියවරේදී අනුගමනය කිරීමෙන් මෙම ගැටළු මග හරවා ගත හැකි බව අපේ හැඟීමයි.

(අ) සාමූහික වැඩ හා ස්වයං-පාලන ක්‍රමය පිළිබඳව සාමාජිකයින්ට සූක්ෂම එමෙන්ම නිරන්තර පුහුණුවක් දිය යුතුය.

(ආ) හැකි ඉක්මණින් සමූපකාර සමිතිය මාර්ගයෙන් සාමාජිකයින්ට වැඩ කටයුතුවල වගකීම පවරා දී රජයේ නිලධාරීන් උපදේශක තත්වයට පත් කළ යුතුය.

(ඇ) ඉඩම හා අනෙකුත් යෙදවුම් භාවිතා කළ යුතු අයුරු දැක්වෙන කොන්දේසි යටතේ සමූපකාර සමිතිය මාර්ගයෙන් බිම් කොටස් පෞද්ගලික බදු ක්‍රමයකට පවරා දිය යුතුය.

(ඈ) ඉඩම් එක් කර ගැනීම හෝ ව්‍යාපාරයේ සාමාජිකයින් හෝ සාමාජිකයින් නොවන්නන් අතර ඉඩම් පවරා ගැනීම පිළිබඳව තදබල පාලන ක්‍රමයක් බල පැවැත්විය යුතු වන්නේ සෑම සාමාජිකයෙකුම සමාන බිම් ප්‍රමාණයක් තබා ගැනීම වැදගත් නිසාය.

(ඉ) බිම් කොටස් අයිතිකරුවා විසින්ම තම බිම් කොටසේ වැඩ කටයුතු වලින් වැඩි හරියක් ඉටු කළ යුතු අතර බිම් කොටසේ විශාලත්වය සාමාන්‍ය පවුලකට පාලනය කළ හැක්කක් විය යුතුය. (ශ්‍රමය අධිකව අවශ්‍ය වන කෙටිකාල පරිච්ඡේද හැර)

(ඊ) අසනීපවලට භාජනය වීමෙන් හෝ බෝග හානි වීම ආදිය නිසා අසරණ වන තත්වයකට පත් සාමාජිකයින්ට පිහිට වීම සඳහා සමූපකාර සමිතිය මගින් රක්ෂණ ක්‍රමයක් හෝ අරමුදලක් ආරම්භ කළ යුතුය.

(උ) ණය දීම, අලෙවිය, යෙදවුම් සැපයීම, තවාන් පාත්ති පිහිටුවීම යනාදී සිනෑම ආකාරයක ආර්ථික වාසි ලබා දෙන වැඩ කටයුතු සඳහා සාමූහික සංකල්පය උනන්දු කරවිය යුතුය.

(ඌ) බෝගවලට අවශ්‍ය ශිල්පීය ක්‍රියා මාර්ග පහසුවෙන් කළ හැකි වන පරිදි ගොවීන්ගේ නිවාස එකිනෙකට ආසන්නව පොකුරු ක්‍රමයට පිහිටුවිය යුතුය.

III. භූමියෙන් විශාල ප්‍රමාණයක් පෞද්ගලික පදනමක් මත බෙදා දීම හා තවත් කොටසක් සාමූහික අයිතිය ඇතිව නඩත්තු කිරීමේ විකල්ප ප්‍රතිපත්තියද සළකා බැලීමට පිළිවන. මීට කලින් මෙය මින්ඩලපුරයෙහි අත්හදා බලා ඇත. 1971 – 1973 දක්වා මින්ඩලපුරයෙහි වැලි දොඩම් වගාව පෞද්ගලික පදනමක් මත පැවති අතර තේ වගාව සාමූහිකව කරගෙන යන ලදී. නමුත් තරුණයින්ගේ කැමැත්ත වූයේ තේ වගාව පෞද්ගලිකව බෙදා දෙන තුරු තමන්ට කලින් ලැබුණු පෞද්ගලික බිම් කොටස් කෙරෙහි වැඩි අවධානය යොමු කරවීමය. (20 වෙනි පිටුව) අනෙක් බොහෝ රටවලද මෙම ප්‍රවණතාවය දක්නට ලැබී ඇත. පෞද්ගලිකව ඉටු කිරීමට ඉඩ නුදුන් පමණකින්ම නොසළකා හැරිය නොහැකි කාර්යයන් පමණක් සාමූහිකව ඉටු කිරීමේ පරමාර්ථය සඳහා වෙන් කර තැබීම වැඩදායක බව පෙනී යයි. නිදසුන් වශයෙන් පෞද්ගලික ඉඩම් කැබලිවල ඉන්දවීම සඳහා පැල ගලවා ගත යුතු සමූහ තවාන් පාත්ති, සාමූහික අත්හදා බැලීමේ බිම් කැබලි, යන්ත්‍රෝපකරණ සැපයෙන එක් මධ්‍ය ස්ථානයක් ආදී වශයෙනි.

## 2.4.5 නිෂ්පාදන ක්‍රම

තරුණ යෝජනා ක්‍රම මගින් ගොවීන් කාණ්ඩ කිරීමේ අරමුණු වලින් එකක් නම් මහා පරිමාණ වශයෙන් පමණක් උපයෝගී කර ගත හැකි යන්ත්‍රසූත්‍ර හා ක්‍රම භාවිතයට ඉඩ දීම, නව නිෂ්පාදන ක්‍රම පුළුල්ව හොඳින් තහවුරු වන පරිදි තරුණයින් පුහුණුකිරීම පහසු කරවීම හා සාමූහික ක්‍රියා මාර්ග වලින් ශ්‍රම ඵලදායීතාවය වැඩි කිරීමය. එම පරමාර්ථ කෙතෙක් දුරට අදාළ තරුණ ව්‍යාපාර පහෙන් ඉටු වී ඇත්දැයි පරීක්ෂා කර බැලිය යුතුය.

මෙම තරුණ ව්‍යාපාර බොහොමයක වගා කරන ප්‍රධාන බෝගවල අස්වැන්න අතිශයින් උසස් මට්ටමක වීය. විස්වමඩුකුලමෙහි අක්කරයට මිරිස් හොන්ඩර 14.5, මින්ඩලපුරයේ අක්කරයට වැලි දොඩම් රු. 9,000 ක් ආදී වශයෙනි. කුඩාඔයෙහි අර්තාපල් අස්වැන්න පවා සැහෙන අගයක විනි. (සටහන අ.2.11) හොඳින් සුපරීක්ෂාකාරී වීම, පුහුණුව හා මහන්සි වී වැඩ කිරීම නිසා මෙම උසස් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී ඇත. නමුත් ගොවි ශ්‍රමයේ උපරිම ප්‍රතිඵල ලබාගෙන ඇත්ද? මූලධන භාවිතය කොතෙක් දුරට අවම වූයේද?

සෑම අවස්ථාවකදීම ඉඩම් හෙළි පෙහෙළි කිරීම, කායික ශ්‍රමය මගින් කර ඇති බව අ.2.12 සටහනෙන් පෙනී යයි.1/ ශිල්පීය කාර්යක්ෂමතාවය හා කාර්යයේ තත්වය උසස් කරමින් මනම්පිටියෙහි හා විස්වමඩුකුලම්හි වගා කටයුතු සඳහා ට්‍රැක්ටර් යන්ත්‍ර භාවිතා කර ඇත. නමුත් මේ සඳහා වැය වන මුදල් ප්‍රමාණය අධික බව මැනවින් වටහා ගත් තරුණයෝ, කායික ශ්‍රමය හා ජී තරකුන් යොදවා වැඩ කිරීමට දැක්වූ නැඹුරුතාවය හොඳින් පැහැදිලි වේ. වල් කෙලීම හා අස්වනු නෙලීම කරන ලද්දේ කායික ශ්‍රමයෙනි. සමූපකාර සමිති මාර්ගයෙන් රජයට සපයනු ලබන පොහොර හා කෘෂි-රසායනික ද්‍රව්‍ය සෑම තැනම පාහේ භාවිතා කරනු ලැබ ඇත. මෙම ක්ෂේත්‍රයේ කොතෙකුත් අකාර්යක්ෂමතා තිබුණත්, රජයේ නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් (විස්වමඩුකුලම්) හෝ පුද්ගලික වෙළඳුන්, මිතුරන් හා නෑදෑයින් මගින් (කුඩාමය) මේ දක්වා කලට වේලාවට යෙදවුම් ලබා ගැනීමට තරුණයින් සමත් වී ඇත.

මෙසේ තරුණ යෝජනා ක්‍රම සාමාන්‍ය වශයෙන් ශිල්පීය නවීකරණ ක්‍රම හා අඩු පිළ නිෂ්පාදන ක්‍රම පිළිබඳ ලක්ෂ්‍ය ළඟා කරගෙන ඇත. කෘෂිකාර්මික පසු බිමක් ඇති උගත් තරුණයින් නව දියුණු වගා ක්‍රමවලට හොඳින් ප්‍රතිචාරය දක්වන බවත් (ජනපද ව්‍යාපාරවල ගොවීන් හා සසඳන කල) තුලනාත්මකව සලකන කළ මෙරටට අළුත් වූ නව වගාවන් සාර්ථක ලෙස කිරීමේ පරිචයක් ඔවුනට ඇති බවත් ඔවුන් පැහැදිලිව පෙන්වා ඇත.2/ නිෂ්පාදන ක්‍රමවල අඩුපාඩුකම්වලට හේතු වී ඇත්තේ පහත සඳහන් කරුණුය:

(අ) යෙදවුම් පිළට ගැනීම සමූපකාරය මගින් නොව පෞද්ගලිකව සිදුවීම නිසා පිළ අධික වී ඇත.

(ආ) පෞද්ගලික භුක්ති ක්‍රමය හේතුකොටගෙන, මෙහෙයුම්වල පරිමාණය කුඩා වීම නිසා ට්‍රැක්ටර් වලින් සී සෑම වැනි ඇතැම් ක්‍රියා සඳහා අධික පිළක් ගෙවීමට සිදුව ඇත. (කෙසේ වුවත්, බොහෝ මෙහෙයුම්වල පිළ පරිමාණ සංවේදී නොවේ. ඇතැම් මෙහෙයුම්හි පරිමාණය කුඩා වීමෙන් පවුලේ ශ්‍රමය භාවිතා කළහැකි වීම නිසා, පිරිවැය ඇත්ත වශයෙන් අඩු වී ඇත.)

(ඇ) ශ්‍රමය නුවමාරු කර ගැනීමට නොහැකි වීම පිරිවැය අධික වීමට හේතු විය හැකිය. (ඊට ප්‍රතිවිරුද්ධව පවුලේ ශ්‍රමය භාවිතා කිරීම නිසා ශ්‍රම පිරිවැය අඩු වී ඇත.)

(ඈ) අනවශ්‍ය ලෙස කුලී ශ්‍රමය මත යැපීම, පිරිවැය අධික වීමට හේතුවනවා පමණක්නොව ආත්ම විශ්වාසයද අඩු කරයි. (මෙම ප්‍රශ්නය මග හරවා ගැනීමට යෝජනා 2.4.4 ඡේදයෙහි සඳහන් කර ඇත.)

---

1/ ඉඩම් හෙළි පෙහෙළි කිරීම හා අනෙකුත් කටයුතු සඳහා කුලී ශ්‍රමය තරමක් දුරට යොදවා ඇත. ශ්‍රම නුවමාරුව එතරම් ප්‍රයෝජනයට ගෙන නැත. (සටහන අ.2.18) නමුත් මෙය අවශ්‍යයෙන්ම වියදම් වැඩි නොකරන නමුත් එය ආදායම් වෙනස් ක්‍රමයකට බෙදා හරිනු ලබයි.

2/ තරුණ ජනාවාස යෝජනා ක්‍රම පිළිබඳ වාර්තාව - 1972 ජනවාරි, IV වැනි කොටස සී (III)

සමස්ථයක් වශයෙන් බැලූ කල තරුණ යෝජනා ක්‍රමවල සාමාජිකයින් පුරාණ ගම්වල හා ජනපද ව්‍යාපාරවල ගොවීන්ට වඩා නිෂ්පාදන ක්‍රම අතින් හා පිරිවැය සංකල්පය අතින් සැලකිය යුතු උසස් තත්වයක් පෙන්වා ඇති බවට සැකයක් නැත.

### 2.4.6 <u>මූල්‍ය ප්‍රතිපත්තිය</u>

මුදල් පිළිබඳව තරුණ යෝජනා ක්‍රමයන්හි අවශ්‍යතාවයන් වනුයේ (සටහන I–2) අඩු පිරිවැයකින් යුතුව යෝජනා ක්‍රමය පිහිටුවීම, අවම සහනාධාර, ඉපැයීම් මගින් වාර්ෂික පිරිවැය සීඝ්‍රයෙන් පියවා ගැනීම හා තරුණයින්ට ප්‍රමාණවත් ආදායමක් ලබා දීම ආදියයි. ඉහත මිනුම් දඬු අනුව තරුණ ව්‍යාපාර පහේ ක්‍රියාකාරිත්වය අගයනු වටනේය.

(අ) <u>ආරම්භක මුදල් යෙදවුම</u>: සටහන II–11 මගින්, එක් එක් තරුණ යෝජනා ක්‍රමයන්හි තරුණයෙකු සඳහා වියදම් කරන ලද සාමාන්‍ය මුදල හා බෝග අක්කරයක් සඳහා වියදම් කළ මුදල සමග මූලධන ආයෝජනය පෙන්වා දෙයි. කරුණු කීපයක් නිසා මෙම සංඛ්‍යා සැලකිය යුත්තේ ප්‍රවේශමිනි. දෙපාර්තමේන්තු කීපයක් සම්බන්ධවීම නිසා සහ සමහර වාර්තා සාරානුකූල නොවූයෙන් ව්‍යාපාර සඳහා කරන ලද වියදම් සියල්ලම ආයෝජන සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් නොවීම පළමුවැන්නයි.[1] දෙවැන්න අවස්ථා කිහිපයකදී ඇතැම් වියදම් ව්‍යාපාරයට පමණක් නොව රට අවට ප්‍රදේශ වලටද අදාළ වූ ඒවා වීමයි. එම මූලික ආයෝජනයම යොදමින් සමහර යෝජනා ක්‍රමවල තරුණයින් සංඛ්‍යාව හා වගා කරන අක්කර ප්‍රමාණය වැඩි කිරීමට හැකි වීම තෙවැනි කාරණයයි.

<u>සටහන II–11</u> <u>තරුණ යෝජනා ක්‍රමවල මූලධන ආයෝජනය</u>

| ව්‍යාපාරය | මූලික ආයෝජනය රු. | ආයෝජනය තරුණයෙකු සඳහා රු. | ආයෝජනය අක්කරයක් වගා කිරීමට රු. |
|---|---|---|---|
| මන්ඩලපුර | 458,916.80 | 3,761.61 | 2,216.98 |
| මනම්පිටිය | 305,000.00 | 6,777.77 | 6,100.00 |
| කුඩාඔය | 182,710.00 | 5,536.66 | 4,938.10 |
| යට්ටපාත | 2,294,000.00 | 3,779.24 | 2,231.52 |
| විස්වමඩුකුලම් | 3,198,862.00 | 5,021.76 | 2,967.40 |
| සාමාන්‍ය | 1,287,897.76 | 4,975.41 | 3,690.80 |

මූලාශ්‍රය: සටහන් අ.2.1, අ.2.11 හා අ.2.14 න් සංඛ්‍යාලේඛන උපුටා ගන්නා ලදී.

---

1/ සම්බන්ධ වූ දෙපාර්තමේන්තු නම් ඉඩම් කොමසාරිස්, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයයි. ගිණුම්වල සාවද්‍යතාවය පිළිබඳ බොහෝ නිදසුන් වලින් එකක් වශයෙන් රාජ්‍ය ගිණුම් පිළිබඳ සහකාර ගණන් පරීක්ෂක විසින් මනම්පිටිය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත යවන ලද ලිපියකින් පහත සඳහන් කොටස උපුටා දැක්විය හැක. " 1970/71 අවසානය තෙක් රු.120,062/- ක මුළු වියදමක් ලිපි ගොනු වලින් පෙනී යයි. එහෙත් ලෙජර් ගිණුම නිසි පරිදි පවත්වාගෙන ගොස් නැති නිසා ඇත්තවශයෙන් වියදම තහවුරු කර ගැනීම අසීරුය." (ලිපි ගොනු අංකය 3/51/3 – 120 වෙනි පිටුව – 1972-01-31 වෙනි දින)

කෙසේ වුවද, මෙම සංඛ්‍යාලේඛන අනුව දැක්වෙන පිරිවැය වෙසෙසින් අධික බවට සැකයක් නැත. මෙම මුදල් තරුණයින්ගෙන් අය කර නොගන්නා හෙයින් සාමාජිකයෝ අධික වරප්‍රසාද ලත් කණ්ඩායක් බවට පත්වන අතර අනාගතයේදී පිහිටවිය හැකි ව්‍යාපාර සංඛ්‍යාව මේ නිසා අතිශයින් සීමා වේ.

ව්‍යසනාවකට මෙන් සටහන 11-12 හි විශ්ලේෂනය කර ඇති පිරිවැයෙහි ප්‍රධාන අංග, මැතදී පිහිටුවනු ලැබූ යෝජනා ක්‍රමයන්හි සිදු කර ඇති පරිදි, සෑහෙන ඉතිරි කිරීම් කළ හැකි අංග වන්නේය.

සටහන 11-12 ප්‍රධාන කාර්‍යය අනුව මූලධන ආයෝජනය(1966 - 1973)

| ව්‍යාපාරය | ඉඩම් සංවර්ධන ගාස්තු (ශ්‍රමය හා ද්‍රව්‍ය) රුපි. | ප්‍රධාන උපකරණ (යන්ත්‍ර, වාරිමාර්ග, ජල සැපයුම්) රුපි. | යටිතල පහසුකම් සඳහා වියදම් (මාර්ග හා ගොඩනැගිලි) රුපි. | ඉඩම් සංවර්ධන ගාස්තු මුළු ආයෝජනයේ ප්‍රතිශතයක් වශයෙන් % |
|---|---|---|---|---|
| මන්ඩලපුර | 437,000.00 | ලැ.නැ. | 21,916.80 | 95.22 |
| එනම්පිටිය | 235,000.00 | 40,000.00 | 30,000.00 | 77.05 |
| කුඩාඔය | 71,700.00 | 51,500.00 | 59,510.00 | 39.24 |
| යට්ටපාත | 1,800,000.00 | ලැ.නැ. | 794,000.00 | 69.39 |
| විශ්වමඩුකුලම් | 600,687.03 | 2,480,000.00 | 118,175.00 | 18.78 |
| සාමාන්‍ය | 628,877.40 | 857,166.67 | 204,720.36 | 37.19 |

මූලාශ්‍රය: සටහන අ.2.14

සටහන:

ශ්‍රම වියදම හා ද්‍රව්‍ය වියදම ලෙස වෙන් වෙන් වශයෙන් ඉඩම් සංවර්ධන වියදම ලබා ගත නොහැකි විය.

මූලධන වියදමෙන් වැඩි කොටසක් වැය වූයේ ඉඩම් සංවර්ධනය සඳහා වූ ශ්‍රම පිරිවැයටය. ද්‍රව්‍ය සහ උපකරණ සඳහා සාපේක්ෂව අනවශ්‍ය වියදම් කර නැත. ඉඩම් සංවර්ධනය කිරීම උදෙසා කළ වියදම එක් ව්‍යාපාරයක මුළු ආයෝජනයෙන් 90% ක් වූ අතර සියළුම ව්‍යාපාරවල මූලධන පිරිවැයෙන් සාමාන්‍යයෙන් 37% ක් පමණ විය. තරුණයින්ට දීර්ඝ කාලයක් සහනාධාර ගෙවීම නිසා සහ මූලික සංවර්ධන වේගය හෙමින් සිදු වීම නිසා සංවර්ධන පිරිවැය මෙසේ අධික වී ඇත. ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ තත්වය පැහැදිලි කර දීමෙන් හා ( 63 වෙනි පිටුව) වැඩ අවසන් කළ පසු සහනාධාර ගෙවීම යන කරුණු වලින් නව යෝජනා ක්‍රමයන්හි මෙම තත්වය දැනටමත් නිවැරදි කරගෙන ඇත.

තරුණයින් වගා කරන බෝග වලින් ලැබෙන ආදායමෙන් ආපසු ගෙවිය හැකි වන පරිදි අඩුතරමින් ද්‍රව්‍ය හා උපකරණ වලින් කොටසක්වත් දීමනාවක් වශයෙන් නොව ණයක් වශයෙන් ලබා දෙන්නේ නම් රජය විසින් දැරිය යුතු මූලධන වියදම තවත් අඩු කළ හැකි වන්නේය.

(ආ) <u>පුනරාවර්තන වියදම්</u>: ආරම්භක සංවර්ධන අවධියෙන් පසු, පුනරාවර්තන වියදම් මූලික දීමනාවට ඇතුළත් කළවිට, නඩත්තු වියදම්වල වගකීම සමූපකාර සමිති මගින් බාර ගත යුතුය. බැංකු ණයකින් හෝ සාමාජිකයින්ගේ බෝග විකිණීමෙන් ලැබෙන මුදල් වලින් අඩු කර අවශ්‍ය මුදල් ලබාගෙන සාමාජිකයින්ට ණය සැපයීමද සමූපකාරය මගින් කළ යුතුය.

තරුණ ව්‍යාපාරවල වාර්ෂික පිරිවැය පිළිබඳ නිරවද්‍ය සංඛ්‍යාලේඛන ලබා ගැනීම ලෙහෙසි කාර්යයක් නොවන්නේය. රජයේ වියදම් දෙපාර්තමේන්තු කීපයක් අතර බෙදී යයි. බොහෝ අවස්ථාවල සමූපකාර සමිතියෙහි වියදම් වාර්තා වී ඇත්තේ දුර්වල ලෙසිනි. එපමණක් නොව ගොවීන්ගේ වියදම් වලින් විශාල ප්‍රමාණයක් පිළිබඳ විස්තර පුද්ගලික මාර්ග වලින් ලැබෙන අතර ඒවා කිසිසේත්ම වාර්තා ගතව නොමැත. කෙසේ වුවද සටහන II-13 හි දක්වා ඇති සංඛ්‍යාලේඛන කච්චේරිවල ඉඩම් අංශයේ ගිණුම් වලින්, සමහර සමූපකාර සමිති ගිණුම් වලින් හා සාමාජිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ලබාගෙන ඇති අතර අපගේ කාර්යය සඳහා ඒවායේ නිරවද්‍යතාවය ප්‍රමාණවත් වෙයි.

<u>සටහන II-13</u> <u>තරුණ යෝජනා ක්‍රමවල පුනරාවර්තන වියදම් 1972/73</u>

| යෝජනා ක්‍රමය | රජයේ වියදම් (කාර්ය මණ්ඩල, ප්‍රවාහන යනාදිය) | සමූපකාර වියදම් (කාර්ය මණ්ඩල ට්‍රැක්ටර් යනාදිය) | සාමාජිකයින්ගේ වියදම් | | |
|---|---|---|---|---|---|
| | | | සමූපකාර ණය | ආයතනික නොවන ණය | එකතුව |
| | 1 | 2 | 3 | 4 | |
| | රු. | රු. | රු. | රු. | |
| මණ්ඩලපුර | 19,000 | 11,000 | 20,000 | - | 50,000 |
| මනම්පිටිය | 15,000 | - | 10,000 | 10,000 | 35,000 |
| කුඩාඔය | 500 | 10,500 | 20,000 | 20,000 | 51,000 |
| යටිටපාත | 82,600 | 52,120 | 100,000 | - | 234,720 |
| විශ්වමඩුකුලම් | 80,000 | 40,000 | 125,101 | 300,000 | 545,000 |
| සාමාන්‍යය | 39,420 | 22,724 | 55,020 | 66,000 | 183,144 |

මූලාශ්‍ර: අ) ඉඩම් අංශයේ ගිණුම්, ගාල්ල, පොළොන්නරුව, නුවරඑළිය, කළුතර හා යාපනය කච්චේරි

ආ) ව්‍යාපාර සමූපකාර සමිති වාර්තා

ඇ) සාමාජිකයින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා

සටහන්:

1. රජයේ වියදම්වලට ඇතුළත් වනුයේ කාර්ය මණ්ඩල වියදම් හා පූර්ණකාලීනව ව්‍යාපාරයේ වැඩට යොදා ගත් වාහන හෝ ට්‍රැක්ටර්වලට ගිය වියදම පමණි.

2. සමුපකාර වියදම්වලට සාමාජිකයින්ගෙන් කෙලින්ම අය නොකරන සමිතියේ පරිපාලන හා මෙහෙයුම් වියදම් ඇතුළත් වෙයි.

3. සමුපකාර වලින් ලබා දෙන සාමාජික ණයට ඇතුළත් වනුයේ කෘෂිකාර්මික හා පාරිභෝගික නොවන ණය පමණි.

4. සම්මුඛ පරීක්ෂණයට යොමු කළ සාමාජිකයින් විසින් දරණ ලදැයි ඔවුන් කියා සිටියාවූද, සමුපකාර ණය මුදලින් පියවනු නොලැබුවාවූද සාමාන්‍ය වියදම් අනුව ආයතනික නොවන ණය ඇස්තමේන්තු කර ඇත.

සටහන II–13 න් පෙනී යන පරිදි පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකත්වය සාමාන්‍යයෙන් අල්ප වේ. නමුත් යටිතල පහසුකම් හැරෙන්නට අනෙකුත් සමුපකාර සමිති ණය ලබා ගැනීමට සුදුසු බව ඔප්පු කර නොමැති අතර ඒවායින් බලාපොරොත්තු වූ වගකීම ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව පෙනේ. එමනිසා සාමාජිකයෝ සිය කෙටිකාලීන ආයෝජන සඳහා, පුද්ගලික ණය දෙන්නන්ගේ, පිතුරන්ගේ, නෑදෑයින්ගේ හා ඇතැම්විට තම ඉතිරි කිරීම්වල පිහිට පතා ඇත. අධි මිල ලබා දෙන බෝග වගා කරන ව්‍යාපාරවල ශිල්පීය හෝ ආර්ථික කාර්යක්ෂමතාවය සැළකිය යුතු ලෙස අඩු කරලීමට මෙම තත්වය හේතු වී නැති නමුත් (සටහන II–14 හා 2.4.5 ඡේදය බලන්න) එනයින් ඇති වී තිබෙන සමාජයීය ප්‍රතිවිපාක වඩාත් උග්‍රය. (59 වෙනි පිටුව) මෑත අනාගතයේදී සමුපකාර සමිති ක්‍රියාකාරී ණය දෙන ආයතන බවට පත් වීම ඉතා වැදගත්ය.

(ඇ) <u>ගොවීන්ගේ ආදායම:</u> තරුණ යෝජනා ක්‍රමවල ශුද්ධ ඉලක්ක ආදායම වූයේ මසකට රු. 250/– සිට රු. 300/– කි. සටහන අ.2.16 මගින් පෙන්වා දෙන පරිදි අදාළ තරුණ යෝජනා ක්‍රම පහෙන් තුනක්ම මාසික සාමාන්‍ය ආදායම් මට්ටම රු. 500/– ඉක්මවා ඇත. එක් යෝජනා ක්‍රමයක් එම මට්ටම කරා ළඟා වෙමින් පවතී. නමුත් මනම්පිටියෙහි පමණක් ආදායම ඉලක්ක මට්ටමට අඩු අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජනාවාසිකයින් බොහෝ දෙනෙකු ව්‍යාපාරය හැර යාමේ අවදානම එහි පවතී.

ආයෝජනය කළ මූලධනයට හා ශ්‍රමයට සරිලන ප්‍රතිලාභ මෙම ආදායම් වලින් නිරූපනය කරන්නේදැයි ඊළඟ ඡේදයේදී පරීක්‍ෂා කෙරේ. සාමාජිකයින් ලාභ මුදල් ඇත්ත වශයෙන්ම කෙසේ වියදම් කළේද යන්න පිළිබඳව තොරතුරු එකතු කර ගත නොහැකි වූ නමුත් එම ලාභ මුදල් නැවත ව්‍යාපාරයෙහි ආයෝජනය කර ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක් බව පැහැදිලිය. විස්වමඩුකුලමෙහි පෙනෙන පරිදි ඉපැයූ ලාභ මුදල් වලින් වැඩි ප්‍රමාණයක් යොදවා ඇත්තේ

සොහොයුරියන්ගේ දෑවැදි වශයෙනුත්, යාපනය අර්ධද්වීපයේ නිවාස තැනීමටත්ය.[1] අනෙක් ව්‍යාපාරවල ඉතුරු කර ඇති මුදල් ප්‍රමාණය ඉතා සුළුය. විවිධ අවස්ථාවලදී රජයේ කළමනාකරුවන් විසින් අනිවාර්ය ඉතිරි කිරීම් ක්‍රම ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න දරා ඇතත් ඒවා වැඩි කල් පැවතී නැත. යෝජනා ක්‍රම කෙරෙහි ඇති බැඳීයාව වැඩි කිරීම සඳහා යෝජිත විවිධ උපක්‍රම සමඟම, උපයනු ලැබෙන අධික ආදායම භාවිතා කළයුතු ආකාරය පිළිබඳව ගොවීන්ට පුහුණුව ලබා දීම ක්ෂණික අවශ්‍යතාවයක්ව පවතී.

(ඈ) <u>ආර්ථික අගැයීම</u>: සමහර ආයෝජන හා ඉපැයුම් පිළිබඳ සංඛ්‍යාලේඛන අවිනිශ්චිත නිසා අදාළ තරුණ ව්‍යාපාරවල නිවැරදි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් කිරීම එතරම් පහසු නොවේ. ව්‍යාපාර වලින් පැන නැගෙන අධිතීයක ලාභ ප්‍රයෝජන, ප්‍රමාණාත්මකව අගය කිරීමේ දුෂ්කරතාවය කාර්යය තවත් සංකීර්ණ කරයි. කෙසේ වුවද පහත දක්වා ඇති පරිදි දළ ගණනය කිරීමක් කළ හැකිය.

මෙම ගණනය කිරීම ප්‍රශ්න කීපයකටම විෂය වන බව පිළිගත යුතුය. මේ අනුව අපේ නියැදියට හසු වූ තරුණ යෝජනා ක්‍රම තුනක්ම ආර්ථික අංශයෙන් සතුටුදායක දියුණුවක් ලබා ඇති බව පෙන්වා දෙන අතර මූලධන ආයෝජනයට ලැබුණු ප්‍රතිලාභ සිත් ඇද ගන්නා සුළුය. මෙම සාර්ථකත්වයේ පදනම මිරිස් හා වැලි දොඩම්වල වර්තමාන අධික මිල ගණන බව අමතක නොකළ යුතුය. මෙහි දිගුකාලීන ස්ථාවරතාවයෙහි අවිනිශ්චිත බව අධිකය. එනිසා ආර්ථික අගැයීමේ ප්‍රතිඵල විශ්ලේෂණයේ අනෙක් අංශ වලින් වෙන් කර ගත යුතු නොවේ.

### 2.4.7 <u>යෝජනා ක්‍රමයන්හි කළමනාකරණය</u>

තරුණ යෝජනා ක්‍රම කළමනාකරණ ප්‍රතිපත්තිය වූයේ රජයේ නිලධාරීන් ශිල්පීය උපදෙස් දීම සහ අරමුදල් පාලනය කිරීම හා තරුණයින්ගේ ස්වාමියෙකු වශයෙන් නොව ගුරුවරයෙකු ලෙස මාර්ගෝපදේශකත්වය ලබා දීමයි. පසුව කළමනාකරණ වගකීම සමුපකාර සමිති මගින් තරුණයින් වෙත පැවරිය යුතුය.

(අ) අවස්ථා කිහිපයකදී හැරුණුවිට, සාමාන්‍යයෙන් තරුණයින් කළමනාකරණ කාර්යයෙහි නියැලී සිටීම දක්නට නැත. මෙම තත්වයට හේතු පහත දැක්වේ:-

1. විශේෂයෙන් සාමූහිකව වැඩ කරන කාලය තුළදීත් සමහර අවස්ථාවල ඉඩම් බෙදා වෙන් කළ පසුවත් ඇතැම් රජයේ නිලධාරීන් තමන් සතු බලතල තරුණයින් සමඟ කොටස් කර ගැනීමට ඇති අකැමැත්ත.

---

[1] අනික් අතට සාමාජිකයින් 25 දෙනෙකු තම ලාභ මුදල් ට්‍රැක්ටර් සඳහා ආයෝජනය කර ඇති අතර ඒවා ව්‍යාපාරයේම තබා ඇත. මෙම සාමාජිකයින්ගෙන් වැඩිම මුදලක් ඉපැයූ තැනැත්තා තම බිම් කොටසෙහි රු. 60,000/- ක් පමණ වටිනා ස්ථිර නිවසක් ඉදි කර ඇත.

## සටහන II–14 තරුණ යෝජනා ක්‍රමයන්හි වැය සහ ප්‍රතිලාභ

| යෝජනා ක්‍රමය | ප්‍රාග්ධන පිරිවැය රු. | ප්‍රාග්ධන පිරිවැය වාර්ෂික ආපසු ගෙවීම් (1) රු. | පුනරාවර්තන පිරිවැය රු. | සම්පූර්ණ වාර්ෂික වියදම් රු. | දළ ආදායම 1972/73 (2) රු. | ශුද්ධ ආදායම 1972/73 (3) රු. | ශුද්ධ ආදායම මුළු වාර්ෂික වියදමෙහි ප්‍රතිශතයක් වශයෙන් 1972/73 | සම්පූර්ණ දළ ආදායම මුළු ප්‍රාග්ධන පිරිවැයෙහි ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|---|---|---|---|
| මන්ඩලපුර | 459,000 | 47,047 | 50,000 | 97,047 | 160,000 | 62,953 | 65 | 35 |
| මනම්පිටිය | 305,000 | 31,262 | 35,000 | 66,262 | 110,000 | 43,738 | 66 | 36 |
| කුඩාඔය | 183,000 | 18,757 | 51,000 | 69,757 | 198,000 | 128,243 | 184 | 108 |
| යට්ටපාත | 2,300,000 | 235,750 | 235,000 | 471,050 | 1,820,000 | 1,348,940 | 286 | 79 |
| විශ්වමඩුකුලම් | 3,200,000 | 328,000 | 545,000 | 873,000 | 5,420,000 | 4,547,000 | 521 | 168 |
| සාමාන්‍යය | 1,289,400 | 132,163 | 183,200 | 315,423 | 1,541,600 | 1,226,175 | 224 | 85 |

මූලාශ්‍රය: සටහන් අ.2.14 සිට අ.2.17

සටහන්: (1) ව්‍යාපාරයන්හි ආයෝජනය කළ වාර්ෂික මූලික වියදම්වල වටිනාකම ගණනය කිරීමේදී එය මුළු වශයෙන්ම, 10% පොළී අනුපාතිකයක් සහිත, අවුරුදු 5 ක සහන කාලසීමාවකින් පසුව අවුරුදු 20 කදී ගෙවා නිම කළ යුතු ණයක් වශයෙන් සැපයූ ලෙස උපකල්පනය කර ඇත.

(2) අවිධිමත් රැකිරක්ෂා ජනනය මගින් ව්‍යාපාරය තුළ ඇති වන අවිධිමත් වාසිත්, ව්‍යාපාරයේ ආදර්ශ බලපෑම නිසා ඇති වන නිෂ්පාදන වැඩිවීමත්, බදු සහ විදේශ විනිමය ඉපැයීම් හෝ ඉතිරි කිරීම් ආදියෙන් වන රජයේ ආදායමේ වැඩිවීමත්, දළ ආදායමෙහි වටිනාකමෙන් බැහැර කර ඇත.

(3) විශ්ලේෂණයට යොමු වන කාලසීමාව ඉතා කෙටි බැවින් ඒ කාලය තුළ, පිරිවැය හා ප්‍රතිලාභ අඩු කර නැත.

II. කළමනාකරණ කටයුතුවලට සහභාගී වීමට රජයේ නිලධාරීන් විසින් තරුණයින් උනන්දු කරන ලද බොහෝ අවස්ථාවලදී පවා එම තරුණයින් වගකීම් භාර ගැනීමට අකමැති විය. මෙවැනි තත්වයක් ඇති වී ඇත්තේ සෑම කටයුත්තකම නිලධාරීන්ට භාර කර සිටීම පහසු යැයි මුල් කාලයේ සිටම තරුණයින් සිතන්නට පුරුදු වී සිටීම (සමහර අවස්ථාවලදී එය ඔවුන් අතර ආරවුල් ඇති වීම වැළැක්වෙන වඩා ප්‍රවේසම් මගක් නිසාත්), තමන්ගේ යහළුවන් සම්බන්ධයෙන් අප්‍රසන්න තීරණ ක්‍රියාත්මක කිරීමට මැළිකමක් දැක්වීම සහ කමිටුවලට සහභාගී වීමෙන් කාලය නාස්ති කර ගැනීමට වඩා තමන්ගේ ඉඩම්වල වැඩ කටයුතු කර ගැනීමට දක්වන කැමැත්ත ආදී කරුණු නිසාය. එමනිසා මෙයින් සිදු වන්නේ බොහෝ තරුණ යෝජනා ක්‍රම මගින් පවත්වන සමූපකාර කමිටුවල තනතුරු සඳහා ඉදිරිපත් වන්නන් 'කට ඇති පුතුන්' මිස මහන්සි වී වැඩ කරන්නන් නොවීමේ නැඹුරුතාවය ඇති වීමය.

III. තරුණ යෝජනා ක්‍රමවල සාමාන්‍ය ප්‍රවණතාවය පුද්ගලිකත්වය දෙසට නැඹුරු වී ඇති අතර ස්වයං-පාලනය සඳහා අත්‍යාවශ්‍ය සාමූහික වගකීම පිළිබඳ හැඟීම මෙතෙක් මතු වී නැත.

IV. සමහර තරුණ යෝජනා ක්‍රමවල සාමාජික සංඛ්‍යාව බොහෝ විශාල වන අතර ස්වයං-පාලනය අපහසු වන පරිදි විසිරී ඇත.

V. ස්වයං-පාලනය සඳහා දී ඇති පුහුණුව සාමාන්‍යයෙන් ප්‍රමාණවත් නොවේ.

(ආ) කළමනාකාරණයෙහි ලා තරුණ සහභාගිත්වය නොලැබීම හේතුකොටගෙන, ඇතැම් අවස්ථාවක රජයේ ඒකාධිකාරී නිලධාරියෙකුගේ අනිසි පාලනයට හෝ තවත් අවස්ථාවක ආත්මාර්ථකාමී කමිටු සාමාජිකයින්ගේ පාලනයකට තරුණයින් මෙන්ම යෝජනා ක්‍රමද ඉලක්ක වන බව කලින් පෙන්වා දෙන ලදී. සාමාජිකයින් පුහුණු කිරීමෙන් සහ කලින් සඳහන් කරන ලද පරිදි නිලධාරීන් ඉවත් කිරීමෙන්ද ව්‍යාපාරවල සාමූහික හැඟීම වර්ධනය කිරීමට වෙනත් ක්‍රියා මාර්ග ගැනීමෙන්ද තත්වය එක්තරා ප්‍රමාණයකට දියුණු කළ හැකි බැව් අප විසින් යෝජනා කරන ලදී. නමුත් මෙම කරුණු ක්‍රියාකාරී වෙතැයි විශ්වාස කිරීමට පෙර අප විසින් මේ සම්බන්ධව සළකා බැලිය යුතු ප්‍රශ්න රාශියක් ඇත:

I. කළමනාකරුවන් ලෙස සුදුසු වන්නේ කවර අන්දමේ රජයේ නිලධාරීන්ද?

තරුණ යෝජනා ක්‍රම කළමනාකරුවන් වශයෙන් අනුයුක්ත කර ඇති බොහෝ නිලධාරීන් කලින් පළපුරුදුකම් ලබා ඇත්තේ, ඉඩම් සංවර්ධන අඥා පනතෙහි පරිපාලනය ඉඩම් බෙදා වෙන් කිරීම, ඉඩම් ආරවුල් සමථයකට පත් කිරීම, ඉඩම්වල අනවසරයෙන් පදිංචි වීම පිළිබඳ රෙගුලාසි පැනවීම, ගම් පුළුල් කිරීමේ හෝ ජනපද ව්‍යාපාරවල පදිංචිකරුවන්ට සහනාධාර මුදල් සැපයීම යනාදී ක්ෂේත්‍රයන්හි පමණක් වේ. එසේ වුවද, තරුණ යෝජනා ක්‍රමවලදී ඔවුනට, ඉඩම් සැළසුම් කරුවන්, ගොවිපල කළමනාකරුවන්, ව්‍යාපෘති සේවකයින්,

පෞත් තබන්නන්, අනුශාසකවරුන් හා ගුරුවරුන් වශයෙන් සේවය කරන්නටද සිදු වේ. මේ ආකල්ප සියල්ලක්ම ඇති පුද්ගලයෙකු සොයා ගැනීම අතිශයින් දුෂ්කර කාර්යයකි. උදාහරණයක් වශයෙන් මන්ඩලපුර ඉඩම් කට්ටි පරිපාලක එනා පළපුරුද්දක් සහ සුදුසුකම් වලින් හෙබි පුද්ගලයෙකි. ඔහු නිසියාකාරව තම ශිල්පීය කාර්යයන් ඉටු කළද, කළමනාකාරණයෙහි ලා තරුණ සහභාගිත්වය සපුරා වර්ධනය කර නොමැත. එනම්පිටියේ ඉඩම් කට්ටි ඕවර්සියර් හට යෝජනා ක්‍රමයේ තරුණයින්ගේ පසුතලයට සමාන පසුතලයක් ඇත. ඔහු සාමාජිකයින්ගේ හිත් දිනාගෙන සිටියද තරුණ ව්‍යාපාරයෙහි සවුපකාරය මැනවින් ක්‍රියාකාරී කරවීම පිළිබඳ පුහුණුවක් හෝ පළපුරුද්දක් ඔහු ලබා නැත.1/

අනාගතයේදී තරුණ යෝජනා ක්‍රමයන්හි කළමණාකරුවන් ලෙස කවරෙක් තෝරා පත් කර ගනු ලැබුවද ඔවුන්ගෙන් අපේක්ෂා කරන සියළුම කාර්යයන්ට උරදීමට ඔවුන් අපොහොසත් විය හැකි බැවින් සිය කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීමට නම් ඔවුනට සාරානුකූල ප්‍රජාවක් දීම අවශ්‍යය.2/ නමුත් මේ ප්‍රශ්නය වෙනත් විධියකින්ද විමර්ශනය කළ හැක.

II. කළමණාකරු වශයෙන් රජයේ නිලධාරියෙක් අවශ්‍යමද?

සුදුසු කළමණාකරුවන් සොයා ගැනීමේ අපහසුව පවතින නිසාත් මුල් අවස්ථා වලදී නිලධාරීන්ට දී තිබුණ බලතල ඔවුන්ගෙන් සාමාජිකයින්ට පැවරීමේදී ඇති වන ගැටළු නිසාත්, නිලධාරීන් පසෙකින් උපදේශක තත්වයන්හි තබා ආරම්භයේ සිටම පූර්ණ වගකීම සවුපකාර සමිතිවලට පැවරීම වඩාත් යෝග්‍ය නොවන්නේදැයි කෙනෙකුට ප්‍රශ්න කිරීමට පිළිවන.

මෙතෙක් මේ ගැන අත්හදා බලා නැති නිසා තරුණ ව්‍යාපාරවල පළපුරුද්දෙන් පමණක් මේ ප්‍රශ්නයට පිළිතුරු දිය නොහැකිය. අවු ආයෝජනයක් සඳහා 2.4.6 ඡේදයෙහි යෝජනා කර ඇති නිර්දේශ පිළිගනු ලැබේ නම් රජයේ අරමුදල් පාලනය සඳහා රජයේ නිලධාරියෙකුගේ අවශ්‍යතාවය අඩු වන හෙයින් යථෝක්ත අත්හදාබැලීම පිළිබඳ ප්‍රයත්නයක් දැරිය යුතු යයි තරයේ හඟී යයි.3/ මේ ප්‍රශ්නය ගැන පසුව එන පරිච්ඡේදවලදී සාකච්ඡා කෙරේ.

---

1/ වැඩි විස්තර සඳහා අ.2.18 සටහන බලන්න.

2/ පසුගිය කාලයේදී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් තරුණ ව්‍යාපාර කළමණාකරුවන් සඳහා දෙන ලද පුහුණුව සාමාන්‍යයෙන් ප්‍රමාණවත් නොවිනි.

3/ දැන් වසා ඇති බොහෝ තරුණ යෝජනා ක්‍රමයන් රජයේ නිලධාරියෙකුගේ පාලනය <u>තිබියදී පවා</u> රජයේ අරමුදල් අනිසි ලෙස උපයෝගී කර ගත් බව සැළකිල්ලට ගත යුතුය.

III. සමුපකාර ස්වයං-පාලනය වඩාත්ම සාර්ථක කර ගැනීමට පිළිවන් වන්නේ කවර අන්දමේ තරුණයින් හටද?

ජනාවාසිකයින් තෝරා ගැනීම පිළිබඳව කළ සාකච්ඡාවලදී (2.4.2 ඡේදය) "උත්කෘෂ්ට ජනාවාසික වර්ගයක්" නොමැති යයි නිගමනය කළාක් මෙන්ම "උත්කෘෂ්ට ජනසමූහයක්" හඳුනා ගැනීමද අසීරු කාර්යයක් වන්නේය. තරුණයින් අතර එකඟත්වය වැදගත් අවශ්‍යතාවයකි. විශේෂ වූ කළමනාකරණ වෘත්තීන් (පොත් තැබීම, අය වැය සැකසීම ආදියට) 1/ සඳහා ජෙ.පා.ස.ප. විභාගය හෝ එයට වඩා උසස් මට්ටමක අධ්‍යාපනයක් ඇතැම් සාමාජිකයින්ට අවශ්‍ය වනු ඇත. ඇත්ත වශයෙන්ම වැදගත් වනුයේ ජනාවාසිකයින්ගේ පසුතලය නොව, ඔවුන් යෝජනා ක්‍රමයේ සාමාජිකයින් වූ විට ඇති කරනු ලැබෙන වාතාවරණය, ඔවුන් ලබන පුහුණුව හා සේවාවත්ය.

IV. කුමන අන්දමේ ගොවි සංවිධානයක් ස්වයං-පාලනය සඳහා අවශ්‍ය වේද?

සෑම ව්‍යාපාරයකටම සාමාජිකයින් නව දෙනෙකුගෙන් යුක්ත සමුපකාර කමිටුවක් ඇති බව අ.2.18 සටහන පෙන්වයි. නීතියක් වශයෙන් මෙයින් අට දෙනෙකු තරුණයින් විසින් තෝරා පත් කර ගනු ලැබෙන අතර සභාපති වශයෙන් යෝජනා ක්‍රමයේ කළමණාකරු පත් කරනු ලැබේ. නිෂ්පාදන ඉලක්ක නියම කිරීම, කොන්ත්‍රාත් සැකසීම, ණය පාලනය කිරීම, පොහොර මිළදී ගැනීම සහ විකිණීම, ට්‍රැක්ටර් ක්‍රියා කරවීම, ජලය බෙදා හැරීම, බෝග වර්ග විකිණීම හා සාමාජිකයින්ගේ විනය පිළිබඳ සොයා බැලීම යනාදිය මෙම කමිටු මගින් බලාපොරොත්තු වේ. නමුත් ගොවි සංවිධානවල ඇති නොයෙක් අඩු ලුහුඩුකම් නිසා ඒවායේ සාර්ථකත්වය හීන වී ඇත:

(අ) යට්ටපාත සමුපකාර සමිතියට හැර අනෙක් සමුපකාර සමිතිවලට පූර්ණකාලීන සේවකයින් නැත. යට්ටපාත සහ මන්ඩලපුර මෙන් ඇතැම් සමුපකාර සාමාජිකයින් හට විශේෂ වෘත්තියයන් සඳහා වැටුපක් ගෙව්වත්, මොවුන් තමන්ට අයිති ඉඩම්වල වගා කටයුතු කරන පූර්ණකාලීන ගොවීන් වශයෙන් සළකනු ලැබේ. 2/

---

1/ අධ්‍යයනයට යොමු වූ සමුපකාර සමිති පහේම ලේකම්වරු මෙම මට්ටමට එළඹී ඇත.

2/ සමුපකාර සාමාජිකයින් අතරින් වඩාත් ප්‍රශංසනීය ආකල්පයෙන් හෙබි මන්ඩලපුර හේ ලේකම් හට (අ) තමාගේ පැෂන් වගාව සාර්ථක කරගත නොහැකි වූයේ සමුපකාරයේ අනෙක් කටයුතු නිසාය. (ආ) එමෙන්ම ඔහුට තමාගේ පෞද්ගලික බිම් කට්ටියෙහි වගා කටයුතු සඳහා ව්‍යාපාරයේ සාමාජිකයින්ගේ සහාය නොලැබේ. (ඇ) මෙහි හෝ වෙනත් යෝජනා ක්‍රමයක පෞද්ගලික ගොවිතැන් ක්‍රමයට වඩා සාමූහික ගොවිතැන් ක්‍රමයට කැමැත්ත පළ කළ සාමාජිකයින් ටික දෙනාගෙන් එක් අයෙකි, ඔහු. (සටහන අ.2.10)

(ආ) ඉටු කළයුතු විවිධ කාර්යයන් සඳහා ප්‍රමාණවත් කමිටු හෝ ආයතන නැත. විස්වමඩුකුලමේ ජලය බෙදා හැරීමේ කමිටුවක් හා එනම්පිටියේ ශුභසාධක කමිටුවක් ඇතත් මෙම කමිටු දෙකම කාර්යක්‍ෂම අයුරින් ක්‍රියාත්මක නොවේ.

(ඇ) සමුපකාර නීති රීති හා අතුරු ව්‍යවස්ථා යෝජනා ක්‍රමයේ අවශ්‍යතාවයන් හා සමීපව නොගැළපේ. විවිධ කමිටු සහ රජයේ නිලධාරීන් විසින් කෙරිය යුතු රාජකාරි කටයුතු සහ වගකීම් පැහැදිලිව දක්වා නොමැති අතර නීති රීතිවලට පටහැනිව ක්‍රියා කිරීමේදී දිය යුතු දඬුවම් නියම කර නැත.

(ඈ) යෝජනා ක්‍රම බොහොමයක නිලධාරීන් හා කමිටුද එවායේ සාමාජිකයින්ද අතර අදහස් හුවමාරුව හා අවබෝධය පිළිබඳ උග්‍ර ඌනතාවයක් දක්නට ඇත. අවස්ථා කිහිපයකදී ව්‍යාපාරයේ සාමාජිකයින් පමණක් නොව කමිටු සාමාජිකයින්ද තම සමුපකාර සමිතියට නීති රීති හා අතුරු ව්‍යවස්ථා මාලාවක් ඇති බව දැන නොසිටියහ.

මනා කළමණාකරන සංවිධානයක් බිහි කර නිලධාරීන් හා තරුණයින් පුහුණු කිරීමෙනුත් මෙම අඩු ලුහුඩුකම් බොහෝ දුරට මග හරවා ගත හැක.1/ මෙම ක්ෂේත්‍රයෙහි වැදගත් දියුණුවක් දක්නට ඇති සමුපකාර ගොවිපලවල්හි සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසයන්හි කළමනාකරණ අත් දැකීම් ගැන සළකා බැලීමෙන් පසු නැවතත් මෙම විෂයය පිළිබඳව සාකච්ඡා කෙරේ.

(ඇ) තරුණ යෝජනා ක්‍රමයන්හි කළමනාකරණ අවශ්‍යතාවයන් ගැන කරන ලද විශ්ලේෂනවලදී මතු වී පෙනුනු වැදගත් කරුණු පහත දැක්වේ:

I. සමුපකාර සමිතියක් මගින් ස්වයං-පාලනය සාර්ථක කර ගැනීමට නම් සාමාජිකයින් සංඛ්‍යාව කුඩා විය යුතු අතර නො විසිරී තිබිය යුතුය. එමෙන්ම සාමාජිකයින් නිරතුරුව මුන ගැසී ඔවුනොවුන් කෙරෙහි විශ්වාසය ජනිත කර ගත යුතුය.

II. සමුපකාර සමිතියෙන් අපේක්ෂා කරන කාර්යයන් ක්‍රියාත්මක කරවීමට, ප්‍රමාණවත් කමිටු සංඛ්‍යාවක් තිබිය යුතු අතර අවශ්‍ය නම් වැටුප් ලබන සේවකයින්ද සිටිය යුතුය.

III. රජයේ නිලධාරීන් සහ සාමාජිකයින් විසින් පැහැදිලිව අවබෝධ කර ගනු ලැබ පිළිපැදිය යුතු යෝග්‍ය සමුපකාර නීති රීති හා අතුරු ව්‍යවස්ථා මාලාවක් තිබිය යුතුය.

---

1/ සංවිධානය හා පුහුණුව පිළිබඳ යෝජිත ක්‍රමයන් 6 වෙනි උප ග්‍රන්ථයෙහි දක්වා ඇත.

IV. ආරම්භක අදියරෙහිදී රජයේ නිලධාරීන් කළමණාකරුවන් ලෙස අනුයුක්ත කෙරේ නම් ඔවුන් ප්‍රවේශමෙන් තෝරා ගත යුතු අතර ඔවුන් ක්‍රමයෙන් ඉවත් කර උපදේශක තත්වයකට පත් කෙරෙන ස්ථිර කාලසීමාවක් නියම කළ යුතුය. එහෙත් ඇතැම් අවස්ථාවලදී සමූපකාර සමිති මගින් පූර්ණ වගකීම වහාම තරුණයින් වෙත පැවරීම අගනේය.

V. පසුගිය කාලයට වඩා දැන් නිලධාරීන්ගේ සහ තරුණයින්ගේ පුහුණුව ගැන දැඩි සැලකිල්ලක් දැක්විය යුතුය.

## 2.4.8 පුහුණුකිරීම් සහ සේවාවන්

තරුණ යෝජනා ක්‍රම සමූපකාරවල සාමාජිකයින් පුහුණුකිරීම් හා ඔවුනට සේවාවන් සැපයීමේ තීරණාත්මක වැදගත්කම අවධාරණයෙන් සඳහන් කළෙමු. විශේෂයෙන්ම කෘෂිකර්මය ගැනත්, ට්‍රැක්ටර් පැදවීම[1] සහ සෑහෙන පමණ දුරට ගණන් තැබීම හා කළමනාකරණය ගැනත් පුහුණුවක් මුල් අවස්ථාවලදී සාමාජිකයින් හට දෙන ලදී. (සටහන අ.2.19) ඉන් පසුව කෘෂිකර්ම සහ සමූපකාර දෙපාර්තමේන්තුවල නිලධාරීන් වරින් වර මෙම ව්‍යාපාර වෙත ගියහ. නමුත්, විශේෂයෙන්ම සමූපකාර කළමනාකරණය සම්බන්ධයෙන් තරුණයින් ලැබූ මාර්ගෝපදේශකත්වය ප්‍රමාණවත් නුවූ බව ප්‍රත්‍යක්ෂ වේ.

වර්ග හතරක යෝජනා ක්‍රමයන්හි ජනාවාසිකයින් පුහුණුකිරීමේ පළපුරුද්ද පදනම් කරගෙන සකසන ලද අභ්‍යාස අවශ්‍යතාවයන් සඳහා ආදර්ශ මාර්ගෝපදේශ හා කළමනාකරණ කාර්ය පටිපාටිය 6 වැනි උප ග්‍රන්ථයෙහි දක්වා ඇත. වැදගත් ප්‍රතිපත්තිමය කරුණු පමණක් පහත දැක්වේ.

(අ) පුහුණුවක් අවශ්‍ය ප්‍රධාන විෂයයන් වනුයේ, ගොවිපලවල් සැළසුම් කිරීම, අය වැය සැකසීම, සටහන් තැබීම සහ ගණන් තැබීම, කණ්ඩායම් සංවිධානය සහ නායකත්වය හා කෘෂිකාර්මික ශිල්ප ක්‍රමයයි.

(ආ) කාර්යයෙහි නිරතව සිටියදීම සුහදව, අඛණ්ඩව කෙරෙන පුහුණුව අවශ්‍යය. සතිපතා පුහුණු සැසිවාර පැවැත්වීම ජනාවාස වැඩ සටහනෙහි ක්‍රමික ලක්ෂණයක් වීම වැඩදායකය.

(ඇ) අදාළ රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන් විසින් නොකඩවා පශ්චාත් පුහුණු පාඨමාලා පවත්වා සේවාවන් සැපයිය යුතුය.[2]

---

1/ ඇතැම් යෝජනා ක්‍රමයන්හි සාමාජිකයින් සියළු දෙනාම පාහේ ට්‍රැක්ටර් පදවන්නන් බව ප්‍රකාශ කළත් එහි ප්‍රයෝජනවත් බව අවිනිශ්චිතය.

2/ ඇත්ත වශයෙන් මෙය විශේෂයෙන්ම වැදගත් වන්නේ ව්‍යාපාරයේ පූර්ණකාලීනව සේවය කරන නිලධාරීන් ඉවත් කළ පසුවය.

## 2.4.9 යෝජනා ක්‍රමයන්හි ප්‍රමාණය සහ සැළැස්ම

ප්‍රජා සම්බන්ධතාවය ඇති කිරීම හා ස්වයං–පාලන ක්‍රමය පහසු කිරීම සඳහා තරුණ යෝජනා ක්‍රමවලට බඳවා ගත යුතු සාමාජික සංඛ්‍යාව 50 – 100 ට නොවැඩි විය යුතු යයි අදහස් කෙරුන බව කලින් සඳහන් කර ඇත. සඳහන් කරන ලද ව්‍යාපාර පහෙන් තුනක්ම නියමිත සීමාව ඉක්මවා නැති අතර ඉතිරි ව්‍යාපාර දෙකෙහි විශාල 'සේවා ඒකක' කුඩා 'නිෂ්පාදන ඒකක' ගණනාවකට බෙදීමෙන් පහසුවෙන් මෙම ගැටළුව මග හරවා ගත හැක.

ප්‍රජා සංවර්ධන සාධකයන් වශයෙන් තරුණ ව්‍යාපාරවල සැළැස්ම පිළිබඳව යොදවා ඇත්තේ සුළු අවධානයකි. ජනපද ව්‍යාපාරයන්හි තීරු–ක්‍රමයට පදිංචි කරවීම මගින් සාමූහික හැඟීම වැඩීමට අනුබලයක් නොලද බව පිළි ගන්නා ලදී. (ෆාමර් – 1967) කෙසේ වුවත්, සෑම ව්‍යාපාරයකම සාමාජිකයින්ට තම පෞද්ගලික බිම් කොටස්වල නිවාස තනා ගැනීමට ඉඩ දී ඇති නිසා ව්‍යාපාරයේ එක් කෙළවරක සිට අනික් කෙළවරට සැතැප්ම හයක් පමණ දිගට යාර සියයෙන් සියයට නිවාස තනා ඇත. අපට පෙනෙන පරිදි මෙම විසිරුණු සැළැස්ම නිසා සමාජයීය හා පරිපාලනමය ප්‍රශ්න මතු වී ඇත.

ජනාවාස රටාව පිළිබඳ තීරණය තරුණයින්ගේ ඉල්ලීම්වලට කන් දීමකි. සෑම යෝජනා ක්‍රමයකම සියළුම සාමාජිකයින් කැමැත්ත දැක්වූයේ ගමක පොකුරක් මෙන් ජීවත් වනවාට වඩා තම පෞද්ගලික බිම් කැබලිවල ඉදි කර ගත් නිවහනක ජීවත් වීමටය. (සටහන අ.2.20) ඔවුන්ගේ අදහස පරිදි බෝග සොරුන්ගෙන් ආරක්‍ෂා කිරීමට හා වෙනත් ප්‍රශ්න 'වලින් ගැලවීමටද' බෝග වගාව අසල ඔවුන් ජීවත් විය යුතුය. නමුත් ජන සමූහය මේ ආකාරයට භෞතික වශයෙන් බෙදීම නිසා සැකය වැඩි දියුණු වනවා පමණක්නොව තවදුරටත් සමාජයීය වශයෙන්ද බෙදී යයි. එක්ව වැඩ කළ මුල් අවස්ථාවලදී, සාමූහික හැඟීමක් ජනනය කිරීමට අපොහොසත්වීම හා පසුව පෞද්ගලිකත්වය වැඩි දියුණු වීම යන කරුණු දෙකෙහි ප්‍රතිඵලයකි, මෙම විසුරුණු සැළැස්ම.

ගමක පොකුරක් වශයෙන් ජීවත් වීම ප්‍රජා සම්බන්ධතාවය ඇති කිරීමට පමණක්නොව නොයෙක් සේවා සැපයීමේදීද පහසු වන්නේය. අපගේ අදහසේ හැටියට මෙම විසිරී ඇති පෞද්ගලික බිම් කොටස්වල පදිංචි වීමට තරුණයින් කරන ඉල්ලීමට අනුබල නොදිය යුතු අතර අනාගතයේදී එම ඉල්ලීම ප්‍රතික්‍ෂේප කළ යුතුය. එනිසා නිවෙස් සෑදීම කුඩා ගෙවතුවල පොකුරක ආකාරයට සිදු විය යුතු අතර (10 – 100 දක්වා) ඒවා හැකි පමණ වගා කරන බිම් කොටස් වලට ආසන්න විය යුතුය. සාමූහිකව මුර සේවයේ යෙදීමෙන් නැතහොත් ශ්‍රමය හුවමාරු කිරීමෙන් හෝ වැඩ අධික කාලයේදී නැවතීම සඳහා බිම් කොටස්වල පැල්පත් ඉදි කිරීමෙන් වගාව ආරක්‍ෂා කිරීම හා සාත්තු කිරීම පිළිබඳ ගැටළුව විසඳා ගැනීමට පිළිවන.

## 2.4.10 ගම හා තරුණ යෝජනා ක්‍රම අතර සම්බන්ධතාවය

නව ජනාවාසවල අවසාන පරමාර්ථය විය යුත්තේ ඒවා අවට ගම් වලින් වෙන් වූ ඒකකයක් නොවීම හා මුළු ප්‍රදේශයේම දියුණුවට ආධාර වන, එමෙන්ම ප්‍රදේශවාසීන්ගේ නෙත් යොමු විය යුතු ආදර්ශ ස්ථානයක් වීමය. මෙය ඉතාම වැදගත් වන්නේ මෙම යෝජනා ක්‍රම වෙනුවෙන් රජය, මූලධනය හා නිලධාරීන් වශයෙන් (අනෙක් ගම් හා සසඳන විට) අසමානුපාතික ප්‍රමාණයක් ආයෝජනය කර තිබීම නිසා එනයින් අවට ගම් වලටත් ශුභසාධනයක් නොසැලසෙන්නේ නම් එම විශාල ආයෝජනය සාධාරණීකරනය කළ නොහෙන හෙයිනි.

2.4.3 ඡේදයෙහි අප දුටු පරිදි යෝජනා ක්‍රම හා අවට ගම් අතර සාමාන්‍ය මිත්‍රත්ව සම්බන්ධතාවයක් ඇතත් මෙම ප්‍රජාවන් දෙක අතර තිබිය යුතු සත්‍ය සමාජයීය ඒකාග්‍රතාවය දක්නට ලැබුණේ ඉතා සුළු වශයෙනි. එය පහත සඳහන් අයුරු පැහැදිලි කළ හැකිය.

I. යෝජනා ක්‍රමවල වසන තරුණයින් බොහෝ දෙනෙකු දුර සිට පැමිණ ඇති නිසා ගම් වැසියෝ සැමවිටම ඔවුන් සාදරයෙන් පිළි නොගනිත්.

II. යෝජනා ක්‍රමවල සාමාජිකයින්ට විශේෂ වරප්‍රසාද හා පහසුකම් ලැබෙන නිසා අසල ගම්වාසීන් තුළ ඔවුන් කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇති වෙයි.

III. සමහර අවස්ථාවලදී යෝජනා ක්‍රම භාරව සිටින නිලධාරීන් ගම්වැසියන් හා නිදහසේ ගැවසීමට තරුණයින්ට හෝ තරුණයින් හා එසේ ගැවසීමට ගම්වැසියන්ට අනුබල නොදෙති.

IV. යෝජනා ක්‍රමයන්හි සාමාජිකයින්ගේ පෞද්ගලික වාතාවරනයද මිශ්‍ර යෝජනා ක්‍රමය හා එහි අසල්වැසියන් අතර සම්බන්ධතාවයේදී තරමක් දුරට බලපා ඇත.

අපගේ අදහසේ හැටියට අනාගතයේදී මෙම තත්වයෙන් අඩක්වත් මග හරවා ගැනීමට නම් යෝජනා ක්‍රමයට ආසන්න ප්‍රදේශ වලින්ම තරුණයින් තෝරා ගත යුතුය. අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට ගත හැකි තවත් පියවර නම්, සාමාජිකයින්ට උපදෙස් දීමේදී හා ව්‍යාපාරය සැළසුම් කිරීමේදී ගමෙහි නායකයින් හවුල් කර ගැනීම, ගම් හා යෝජනා ක්‍රම ග්‍රාමීය ආයතනවල විෂය සීමාව යටතට පත් කිරීම (ගොවි කාරක සභා, කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු යනාදිය) හවුලේ ශ්‍රමදාන ව්‍යාපාර හා ගොවිපල චාරිකා සංවිධානය කිරීම යනාදියයි.

ගම හා යෝජනා ක්‍රම අතර ආර්ථික සම්බන්ධතාවය විශාල වශයෙන්ම පහත සඳහන් කරුණුවලට සීමා වී ඇත. අසල ගම්වල කම්කරුවන්ට යෝජනා ක්‍රමයෙහි රැකියා සැපයීම, ප්‍රාදේශීය වෙළඳුන් හා ප්‍රවාහන කරුවන් මගින් සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම (සමහරවිට නිෂ්පාදන කටයුතුවලට මුදල් දීම), සහ යෝජනා ක්‍රමයේ සාමාජිකයෝ ප්‍රාදේශීය ගොවීන්ට යම් යම් සීමිත සේවා ලබා දීම. (විස්වමඩුකුළම්හී ට්‍රැක්ටර් සැපයීම – 38 වෙනි පිටුව හා මන්ඩලපුරයේ අලෙවි සේවා – 22 වෙනි පිටුව පසු සටහන) වැදගත් අවස්ථා දෙකකදී

ව්‍යාපාරවල යොදන ලද ආයෝජනය අනුව අසල ගම්වාසීන්ටද කෙලින්ම ප්‍රතිලාභ සැලසී ඇත. එනම්, යටිටපාත ගුදි කරන ලද මාර්ගය නිසා ප්‍රදේශයෙහි විවෘත බවක් ඇති වීම හා විස්වමඩුකුලමේ වාරිමාර්ග ක්‍රමය නිසා ගම් පුළුල් කිරීමට අවස්ථාව සැලසීම. (සිතියම II) නමුත් සාමාන්‍ය වශයෙන් බලන කල තරුණ යෝජනා ක්‍රමය සඳහා කරන ලද ආයෝජනයන් අවට ගම්වාසීන්ට ඒතරම් සවලදායී වී නොමැත.

මෙකී අන්තර් සම්බන්ධතාවයන් නිසා ඇති වන මේ මාදිලියේ ප්‍රතිලාභ, නිසැකවම විශාල වශයෙන් වැඩි දියුණු කළ හැක්කේ යෝජනා ක්‍රම සැළසුමෙහිදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඒකාග්‍රතාවය වර්ධනය කිරීමට අකලංක ප්‍රයත්නයක් දැරීමෙනි. කලින් සඳහන් කරන ලද අවස්ථා දෙක හැරුණුවිට මෙම තත්වය මෙතෙක් දියුණු වී ඇත්තේ අහම්බෙනි.[1] ආර්ථික ඒකාබද්ධතාවය හා ප්‍රතිලාභ දියුණු කරගත හැකි ක්‍රම කීපයක් පහත යෝජනා කරනු ලැබේ.

I. නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට ගුඩ ප්‍රස්ථාව ඇති එහෙත් එය තනිවම ගම්මුන්ට පමණක් කළ නොහැකි ප්‍රදේශවල මෙවැනි යෝජනා ක්‍රම පිහිටුවීම. එමෙන්ම මෙම ගොවිපල ආදර්ශයට ගෙන අවට සිටින ගොවීන් හට එය අනුගමනය කළහැකි විය යුතුය.

II. දැනට පවතින යටිතල පහසුකම් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන අයුරු යෝජනා ක්‍රම සැළසුම් කිරීම හා අසල්වාසීන්ටද සේවය ලබා ගත හැකි වන සේ තවදුරටත් යටිතල පහසුකම් සැපයීම.

III. නිෂ්පාදන පිළියෙල කිරීම සඳහා හෝ යෝජනා ක්‍රමයේ හා ගම්වාසීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ව්‍යාපාරයට ආසන්නව අවිහියක කම්හාන්ත ඇති කිරීම.

IV. ගම්වාසී ගොවියන්ට හා සාමාජිකයින්ට හවුලේ සහභාගී විය හැකි පරිදි පුහුණුවීමේ පන්ති, ගොවිපල චාරිකා හා ආදර්ශන බිම් කැබලි සංවිධානය කිරීම.

තරුණ යෝජනා ක්‍රම බොහොමයක්ම ආර්ථික හා සමාජයීය අංශයෙන් බලන කල ඒවා අවට ගම් වලින් දුරස්තරව පිහිටි හුදකලා සංවෘත ඒකකයන් බවට නිගමනය කළ යුතුව ඇත. පුළුල් වෙනස්කම් ඇති කිරීමේදී, ඒවායේ බලපෑම මේ නිසා බොහෝදුරට අඩු වී ඇත. නමුත් තත්වය ප්‍රමුමතින්ම වෙනස් කිරීමේ හැකියාව යෝජිත පිළිවෙත්වලට ඇත.

---

1/ එලෙසම ඇතැම් යෝජනා ක්‍රමවල ප්‍රයෝජනයට ගත් ශිල්පීය නවීකරණ ක්‍රමවල ආදර්ශන බලපෑමක් දක්නට ලැබුණි. විස්වමඩුකුලම්, යටිටපාත හා මන්ඩලපුරය අවට ප්‍රදේශවල වැඩි දියුණු වූ පිරිස් හා වැල් දොඩම් වගාව ව්‍යාප්ත වීම පැහැදිලිව දැක්විය හැක. යෝජනා ක්‍රමයේ අත්දැකීම පතුරුවාලීමට විධිමත් පියවර ගනු ලැබේ නම් මෙම බලපෑම තවත් වැඩි දියුණු කළ හැක.

## 2.5 නිගමන හා නිර්දේශ

අපේ අධ්‍යයනයෙන් පෙනෙන පරිදි තරුණ ව්‍යාපාරවල මූලික සඵලතාවයන් සහ ඌනතාවයන් පහත දැක්වේ:

I. <u>ආර්ථික සඵලතාවය:</u> මිළ අධික බෝග මත පදනම් වූ තරුණ ව්‍යාපාර අන්තිමේදී ආර්ථික වශයෙන් සාර්ථකව ගෙන ගිය හැකි ව්‍යාපාර බවට පත් වී ඇති අතර ඒවායේ සාමාජිකයින්ට හොඳ ආදායමක් ලැබේ. මෙවැනි බෝග වගා නොකළ ව්‍යාපාරවල තත්වය පහත වැටී වසා දමා ඇත. නැතහොත් ඒවා ඉදිරියටත් රජයේ මූල්‍ය සැපයුම හා කළමණාකරනය මත යැපෙමින් පවතී.

II. <u>පිහිටුවීමේ වියදම්:</u> මෙම ආර්ථික සඵලතාවය ලඟා කරගෙන ඇත්තේ මූලික සාමූහික කාල සීමාවේදී අධික වියදමක් දැරීමෙනි. අධික සහනාධාර ගෙවීමත්, අනාගත ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය අවිනිශ්චිත වීමත්, අයෝග්‍ය පුහුණුකිරීම් හා කළමනාකරණ ක්‍රමත් මෙයට හේතු විය. මෙම කරුණු තරුණයින් යෝජනා ක්‍රම කෙරෙහි පෙළඹවීම අඩු කිරීමට හා පහත් ශ්‍රම ඵලදායීතාවයකටද තුඩු දුන්නේය.

III. <u>පෞද්ගලිකත්ව ආකල්පය:</u> ඉඩම් පෞද්ගලික බිම් කට්ටිවලට වෙන් කර දීමෙන් පසු සාමාජිකයින් බොහෝ දෙනෙක් කඩිනමින් කටයුතු කර ඉක්මණින්ම අනුන් මත යැපීමේ අවශ්‍යතාවයෙන් නිදහස් විනි. නමුත් මෙයින් සිදු වූයේ අධික ලෙස කුලී ශ්‍රමය මත යැපෙන පෞද්ගලිකත්වයට නැඹුරු සමාජයක් බිහි වීමයි. සාමූහිකව වැඩ කිරීම හෝ සාමූහිකව සේවා ප්‍රයෝජනය ලබා ගැනීම අඩු වූවා පමණක් නොව සමාජයීය හා ආර්ථික විෂමතාවයන් පෙනෙන්නට විය. (මෙතෙක් සීමිත තත්වයක)

IV. <u>ස්වයං-පාලනය:</u> සමූපකාර සමිතිවල දුර්වලතාවය සහ රජයේ නිලධාරීන් බොහෝ දෙනෙකු බලතල ඔවුන් වෙතම තබා ගැනීමට කැමැත්ත දැක්වීම යන කරුණු නිසා ඇතැම් සීමිත කටයුතු කිහිපයකදී හැරෙන්නට, කළමනාකරණයෙහි ලා සාමාජික සහභාගීත්වය වැළකිණි.

V. <u>අවට ප්‍රදේශ සමඟ ඒකාග්‍රතාවය:</u> මෙම තරුණ යෝජනා ක්‍රම අවට ගම් වලින් වෙන් වූ හුදකලා සංවර්ධන ඒකක බවට පත් වී ඇති අතර ගම් සමඟ සම්බන්ධතාවය අඩු නිසා ඒවාට ලැබෙන ප්‍රතිලාභද අල්පය. මෙම කණ්ඩායම් දෙක අතර ඒකාග්‍රතාවය ඇති කිරීමට දරා ඇත්තේ සුළු උත්සාහයකි.

දැනට ක්‍රියාත්මක වන හා අළුතින් පිහිටුවීමට බලාපොරොත්තු වන තරුණ යෝජනා ක්‍රම දියුණු කිරීම සඳහා අපගේ විශ්ලේෂනයන්ගෙන් මතු වූ කරුණු පහත දැක්වෙයි:

1. <u>ව්‍යාපාර සැළසුම් කිරීම</u> (ඡේදය 2.4.1)

(අ) වසර 3 සිට 5 දක්වා කාලයක් තුළ කළයුතු වියදම හා අපේක්ෂිත ආදායම ඇස්තමේන්තු කර වඩාත් සුපරීක්ෂාකාරීව සකසන ලද මූල්‍ය සැළසුමක් අවශ්‍ය වේ.

(ආ) යෝජනා ක්‍රමයන්හි ආදර්ශය අවට පෙදෙසටද පැතිරීමට අවස්ථාවක් සැලසෙන පරිදි සෑහෙන ආර්ථිකමය හැකියාවන් ඇති පෙදෙස්වල මෙම යෝජනා ක්‍රම පිහිටුවිය යුතුය.

2. <u>පදිංචිකරුවන් තෝරා ගැනීම</u> (ඡේදය 2.4.2): පදිංචිකරුවන් තෝරා ගැනීමේදී දැනට අනුගමනය කරන නිශ්චය ජීවීම සතුටුදායකය; ව්‍යාපාරය පදනම් වූ භුක්ති ක්‍රමය හා කළමනාකරණ ක්‍රමය පිළි ගැනීම මෙයට එක් විය යුතුය. වඩාම වැදගත් වනුයේ:

(අ) අයදුම්කරුවන් ව්‍යාපාරයට බඳවා ගැනීමට පෙර ඔවුන් ව්‍යාපාර මගින් බලාපොරොත්තු වන දෙය හා ව්‍යාපාරය ඔවුන්ගෙන් බලාපොරොත්තු වන දෙය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා දීම.

(ආ) තරුණයින්ට පූර්ණ සාමාජිකත්වය දීමට පෙර ඔවුන් මාස 6 - 12 ක පරිවාස සේවා කාලයකට යටත් කිරීම.

(ඇ) තරුණයින් යෝජනා ක්‍රමයට බඳවා ගනු ලැබූ අවස්ථාවේ සිට ඉතා සූක්ෂම පුහුණුවක් ලබා දීම.

(ඈ) අමතර සාමාජිකයින් බඳවා ගැනීමේදී පරන සාමාජිකයින්ද එයට හවුල් කර ගැනීම.

3. <u>පදිංචිකරුවන් තෝරා ගන්නා මාර්ග</u> (ඡේදය 2.4.3)

(අ) පදිංචිකරුවන් තෝරා ගැනීමේදී ඔවුන් බොහෝ දෙනෙකු අසල ගම්වල අය වීම. මෙවිට පදිංචි කරවීමේ වියදම් අඩු වනවා පමණක් නොව ව්‍යාපාරය අවට ගම් වලින් වෙන් වීමද අඩු වෙයි.

(ආ) සාමාජිකයින්ගෙන් කිහිප දෙනෙක් තරමක් ඈත ප්‍රදේශ වලින්ද තෝරා ගැනීම. එවිට එම ප්‍රදේශවල රැකියා විරහිත බව හා ඉඩම් හිඟය පිළිබඳ ප්‍රශ්න වලින් සහනයක් සැලසේ. එපමණක් නොව මොවුන් නව ශිල්පීය ක්‍රම ව්‍යාපාරයට හඳුන්වා දෙන පුරෝගාමීන් විය හැක.

4. <u>ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය</u> (ඡේදය 2.4.4)

(අ) සංවර්ධන අදියරෙහිදී ඉඩම සාමූහික අයිතියකට යටත් වන්නේ නම්, එය සීමිත කාලසීමාවකට පමණක් බව හා පසුව තරුණයින්ට එය බෙදා දෙන බව හෝ දිගටම සාමූහික ගොවිතැන් ක්‍රමයම අනුගමනය කරන බව හෝ මුලින්ම තරුණයින්ට පැහැදිලි කළ යුතුය. තරුණයින් තෝරා ගැනීම හා පුහුණුකිරීම ඒ අනුව කළ යුතුය. මුල් තරුණ යෝජනා ක්‍රමවල පැවති අවිනිශ්චිතභාවය මුළුමනින්ම නැති කළ යුතුය.

(ආ) ඉඩම් කුඩා කැබලිවලට බෙදන්නේ නම්:

I. ඉඩමේ ප්‍රමාණය පවුලේ ශ්‍රමය යොදවා පාලනය කළ හැකි ප්‍රමාණයක විය යුතුය. (වැඩ අධික කාලවලදී හැරෙන්නට)

II, ඉඩම් භාවිතය, හිමිකම පැවරීම, කුලී ශ්‍රමය භාවිතා කළයුතු ආකාරය හා සමුපකාර සේවාවන් ලබා ගත යුතු ආකාරය යනාදී දැඩි නීති රෙගුලාසි යටතේ ඉඩම් සමූපකාර සමිතිය මාර්ගයෙන් බදු දීමේ ක්‍රමයක් ඇති කළ යුතුය.

III. බිම් කොටස් හා නිවාසවල සැළැස්ම අසල්වාසීන් තුළ සාමූහිකත්වය ඇතෙන පරිදි විය යුතුවා පමණක් නොව පසු කලකදී සාමූහිකත්වයේ වඩාත් උසස් සවරූප ජනිත වන පරිදි විය යුතුය.

IV. පෞද්ගලිකව වැඩ කරන අවස්ථාවට පවා සාමූහික හැඟීම එළඹෙන පරිදි නිරන්තරව සාමාජිකයින් පුහුණු කළ යුතුය.

5. <u>මූල්‍ය ප්‍රතිපත්තිය</u> (ඡේදය 2.4.5, 2.4.6)

(අ) ශ්‍රම සූක්ෂම ශිල්පීය ක්‍රම මත යැපිය හැකි වන පරිදි මූලධන ආයෝජනය හා සහනාධාර සැපයීම අවම විය යුතුය.

(ආ) මූලධන ආයෝජනයෙන් වැඩි ප්‍රමාණයක් දීමනාවක් වශයෙන් නොව ණයක් වශයෙන් දිය යුතුය.

(ඇ) පුනරාවර්තන වියදම් පියවිය යුත්තේ ව්‍යාපාරයේ සමූපකාර සමිතිය මගින් පිළියෙල කෙරෙන බැංකු ණය වලිනි.

6. <u>කළමනාකරණ ප්‍රතිපත්තිය</u> (ඡේදය 2.4.7): රජයේ ආධාරය ඇතිව සාමාජිකයින් ස්වයං-පාලනය ක්‍රමය කරා ළඟා වීම:

(අ) ජන සමූහය කුඩා ප්‍රසංහිත, සමාකාර සමාජයක් විය යුතුය.

(ආ) විවිධ කාර්යයන් සඳහා කාරක සභාද, සමූපකාර නීති රීති හා අතුරු ව්‍යවස්ථාද සහිතව සාරානුකූල සමූපකාර කළමනාකරණ සංවිධානයක් සකස් කළ යුතු අතර කාරක සභා සාමාජිකයින් හා නිලධාරීන් අතර පැවරෙන වගකීම් පැහැදිලිව වෙන් කර දැක්විය යුතුය.

(ඇ) රජයේ කළමනාකරුවෙකු පත් කරනු ලැබෙන විට ඔහු උපදේශක තත්වයකට ක්‍රමයෙන් ඉවත් කැරෙන නිශ්චිත කාලසීමාවක් නියම කළ යුතුය. අනාගතයේදී රජයේ කළමනාකරුවන් නොමැතිව ව්‍යාපාර ආරම්භ කිරීමට ප්‍රයත්නයක් දැරිය හැක.

(ඈ) නිලධාරීන්ට හා සාමාජිකයින්ට වඩාත් සූක්ෂම කළමනාකරණ පුහුණුවක් ලබා දිය යුතුය.

7. <u>පුහුණුකිරීම් හා සේවා</u> (ඡේදය 2.4.8)

(අ) ගොවිපල සැළසුම් කිරීම, අය වැය සකස් කිරීම, ගණන් තැබීම, සමූහ සංවිධානය, කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම යනාදිය පිළිබඳව පුහුණුවක් දිය යුතුය.

(ආ) කාර්යයෙහි යොදවන අතරම අඛණ්ඩව, ප්‍රහදව, පුහුණුව ලබා දිය යුතුය.

(ඇ) ව්‍යාපාරය හා සම්බන්ධ රජයේ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන් විසින් පශ්චාත් පුහුණුව හා සේවාවන් සැපයීම සිදු කළ යුතුය.

8. <u>ප්‍රමාණය හා සැළසුම</u> (ඡේදය 2.4.9)

(අ) ගොවීන් පිවත් විය යුත්තේ ගමක පොකුරු ක්‍රමයටය.

(ආ) යෝජනා ක්‍රමයෙහි සාමාජිකයින් 50 කට වඩා ඇත්නම් එය විශාල සේවා ඒකකයක් වටා කුඩා නිෂ්පාදන ඒකකවලට බෙදිය යුතුය.

9. <u>අවට පරිසරය සමඟ සම්බන්ධතාවය</u> (ඡේදය 2.4.10): ව්‍යාපාරය හා අවට ගම්වල එකමුතුව වැඩ කිරීම සහ පුළුල් සංවිධානයක් සඳහා යෝජනා ක්‍රමය කේන්ද්‍රස්ථානයක් කිරීම:

(අ) සාමාජිකයින් බොහෝ දෙනෙකු තෝරා ගත යුත්තේ අවට ගම් වලිනි.

(ආ) ගම හා යෝජනා ක්‍රමය එකම ග්‍රාමීය ආයතන විෂය සීමාවට යටත් විය යුතුය.

(ඇ) ආර්ථික සම්බන්ධතාවයන් වැඩි කිරීමට ද්විතීයක කර්මාන්ත ඇති කළ යුතුය.

(ඈ) පුහුණුවීම් පාඨශාලා හා වෙනත් කටයුතු හවුලේ සංවිධානය කළ යුතුය.

## 3 වන පරිච්ඡේදය

## සමූපකාර ගම්මාන

### 3.1 හැඳින්වීම සහ අරමුණු

1971 මැයි මාසයේදී ශ්‍රී ලංකා රජය පහත සඳහන් අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා සමූපකාර කෘෂිකාර්මික ව්‍යාපාර පටන් ගැනීමට තීරණය කළාය.

(අ) රැකියා සැපයීම – ග්‍රාමීය සේවා වියුක්තිය ඉතාමත්ම ඉහළ ගොස් ඇති නිසා කෘෂිකාර්මික අංශයෙහි නිෂ්පාදනය වැඩි කිරීම තුළින් රැකියා සැපයීමට සිදු වී තිබේ.

(ආ) ප්‍රමාණවත් තරම් ආදායමක් සැපයීම – රැකියා නැති තරුණයින් කෘෂිකර්මයෙහි යෙදවීමට නම් විකල්ප රැකියා වලින් ලබා ගත හැකි ආදායම සමඟ මනාව සැසඳෙන ආදායමක් ගොවිතැනින් ලබා ගත හැකි විය යුතුය.

(ඇ) විදේශ විනිමය රැක ගැනීම – විදේශ විනිමය වැය කරමින් ආයාත කරනු ලබන ආහාර ද්‍රව්‍ය සඳහා ආදේශක නිපදවීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

(ඈ) ප්‍රාග්ධන වියදම් හැකිතාක් දුරට අඩු කිරීම – සමාජ සුභසාධන කටයුතු සඳහා මෙන්ම සංවර්ධන කටයුතු සඳහාද විශාල වශයෙන් මුදල් වැය කළයුතු අවධියක කෘෂිකර්මය සඳහා වඩ වඩා සහනාධාර සැපයීම අපහසු මෙන්ම අයෝග්‍ය දෙයකි. වියළි කලාපයේ දුෂ්කර ප්‍රදේශවල ජනපද පිහිටුවීමට උත්සාහ කිරීමේදී විශාල මූලධනයක් වැය කිරීමට සිදු වූ නිසාත් එසේම නොයෙකුත් සමාජ-ආර්ථික ගැටළු උද්ගත වූ නිසාත් හැකි සෑම අවස්ථාවකදීම තෙත් කලාපයේ ඇති සම්පත් උපයෝගී කර ගතයුතු වේ.

ප්‍රාරම්භක යෝජනා

සැළසුම් ක්‍රියාවලිය: 1971 සැප්තැම්බර් මාසයේදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අත් පොතක මෙසේ සඳහන් වේ –

I. ඡන්ද කොට්ඨාශ පදනම අනුව සමූපකාර ගම්මාන පිහිටුවිය යුතුය. මෙහිදී රැකියා හිඟය ඉතාම උග්‍ර ප්‍රදේශවලටත්, යටිතල පහසුකම් සංවිධානය කිරීම සඳහා යන වියදම ඉතා අඩු ප්‍රදේශවලටත් මූලිකත්වය දිය යුතුය.

II. මේවාට මුදල් දෙනු ලබන්නේ මහජන බැංකුව මගිනි. පහත සඳහන් ක්‍රම දෙක අනුව මුදල් සපයනු ලැබේ:

(අ) රජයේ ඉඩම් නැති තැන්වලදී ඉඩම් පවරා ගැනීමේ වියදම සඳහාත්, රජයේ ඉඩම්වල නව යෝජනා ක්‍රම ආරම්භ කෙරෙන අවස්ථාවන්හිදී සංවර්ධන කටයුතු සඳහා යන වියදම පියවා ගැනීම පිණිසත් අක්කරයකට රු. 1,600/- ක් දක්වා දීමනාවක් දීම;

(ආ) යෝජනා ක්‍රමය අනුමත වූ පසු සමිතියට ණය මුදලක් ලබා දීම.

III. සාමාජිකයින් ව්‍යාපාරයේ සිට සැ. 5 ක් ඇතුළතින් තෝරා ගත යුතු අතර එසේ කළ යුත්තේ ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අදහසද විමසා, දිසාපති විසිනි.

මේ සඳහා උචිත භූමි භාගයන් තෝරා ගැනීමේදී පහත සඳහන් වර්ගවලට අයිති ඉඩම්වලට ප්‍රමුඛත්වය දිය යුතු වේ.

I. සංවර්ධන කටයුතු සඳහා වෙන් කොට ඇති එහෙත් මෙතෙක් වගා කොට නැති රජයේ ඉඩම්,

II. වගාව සඳහා පුද්ගලයින්ට දෙන ලද එහෙත් මැනවින් සංවර්ධනය කොට නොමැති රජයේ ඉඩම්,

III. අනවසරයෙන් වගා කරනු ලබන, එසේම ආරක්‍ෂක ප්‍රදේශ ලෙස තවදුරටත් සැළකිය නොහැකි කැලෑ ඉඩම් වන සංරක්‍ෂකගේ අනුමැතිය ඇතිව පවරා ගැනීම,

IV. වගා කර නොමැති පුද්ගලික ඉඩම් සහ

V. වගා කොට ඇති එහෙත් මැනවින් නඩත්තු කරනු නොලබන පුද්ගලික ඉඩම්.

අක්කර 200 ක් හෝ ඊට වඩා විශාල ව්‍යාපාර ආර්ථික වශයෙන් ප්‍රරෝහණතාවයක් ඇති සේ සළකන ලද අතර ඒකකයක අවම ප්‍රමාණය අක්කර 100 ක් ලෙස දක්වන ලදී. අක්කර 100 ට අඩු ඒකක ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ පිළිවෙල යටතේ සංවර්ධනය කිරීම සඳහා ඉතුරු කරන ලදී. මේ ව්‍යාපාර සඳහා යෝජනා, දිස්ත්‍රික් නිලධාරීන් සහ වෙනත් සුදුසු පුද්ගලයින් විසින් සකස් කළයුතු වූ අතර යටත් පිරිසෙයින් තුන් අවුරුද්දක් සඳහාවත් වූ යෝජනා ක්‍රම සැළසුමට ප්‍රාග්ධන වියදම්, ජිනිස් බල අවශ්‍යතා සහ ශ්‍රම භාවිතය, පුනරාවර්තන වියදම්, ගොවිපල ආදායම සහ වියදම්, ආයෝජන වැඩ පිළිවෙල, මුදල් ප්‍රවාහය, ප්‍රාග්ධන ආපසු ගෙවීම හා සේවා නියුක්ති හැකියාවන් ඇතුළත් විය යුතුව තිබුණි.

මේ යෝජනා, කෘෂිකර්ම හා ඉඩම්, ක්‍රම සම්පාදන හා රැකීරක්‍ෂා යන අමාත්‍යාංශවල සහ මහජන බැංකුවේ නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් විසින් පරීක්‍ෂා කොට අනුමත කළ යුතු වේ. මේ ගොවිපලවල් සඳහා තෝරා ගත යුතු සාමාජිකයින් පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුය.

(අ) ව්‍යාපාරයට සැතපුම් 5 ක් ඇතුළත එම මැතිවරණ කොට්ඨාශය තුළම පදිංචි අය විය යුතුය;

(ආ) වයස අවුරුදු 18 ටත් 35 ටත් අතර විය යුතුය;

(ඇ) සහභාගිත්වය සහ මුදල් ආයෝජනය පිළිබඳව නියම කරනු ලබන වැඩ පිළිවෙලට ඔවුන් එකඟ විය යුතුය.

සාමාජිකයින් විසින් විශේෂ සමුපකාර සමිතියක් පිහිටුවීමට හෝ ප්‍රාථමික සමුපකාර සමිතියකට සම්බන්ධවීම කළ යුතුය.

මුදල් යෙදවීම: පහත සඳහන් මූලාශ්‍ර වලින් මුදල් ලබා ගැනීමට අපේක්ෂා කෙරිනි.

I. සාමාජිකයින්ගේ කොටස් ප්‍රාග්ධනය,

II. රජයේ දීමනා,

III. අනිකුත් අනුමත කළ ආයතන වලින් ලැබෙන සමාන්තර ප්‍රාග්ධනය

IV. මහජන බැංකුවෙන් ලැබෙන ණය මුදල්,

V. රජය විසින් අනුමත කරන ලද අනිකුත් සහනාධාර ක්‍රම හෝ ණය ක්‍රම.

රු. 500 - 1000 අතර වූ කොටස් මුදලක් සෑම සාමාජිකයෙකු විසින්ම ගෙවිය යුතු වූ අතර, එය මහජන බැංකුවෙන් ණය මුදලක් වශයෙන් ලබාගෙන අවුරුදු 5 ක් ඇතුළතදී පොලී මුදල්ද සහිතව කොටස් වශයෙන් ගෙවිය යුතු වේ. ඒ ඒ ප්‍රදේශවල ඇති සමුපකාර සංවිධානවලටද, මේ ගොවිපලවල් සඳහා මුදල් ආයෝජනය කළ හැකි වන්නේය. පහත සඳහන් කටයුතු සඳහා රු. 1,600/- දක්වා උපරිම සහනාධාරයක් රජයෙන් ලබා ගත හැක.

(අ) පෞද්ගලික ඉඩම් රජයට ගන්නා විට ඉඩම් ලබා ගැනීමේ වියදම පියවීම සඳහා,

(ආ) මූලික සංවර්ධනයක් අවශ්‍ය රජයේ ඉඩම්වල නව ව්‍යාපාර පටන් ගැනීමේදී ප්‍රාග්ධන වියදම්, ගොවිපල උපකරණ, ගොඩනැගිලි, පාරවල්, වැටකඩොලු, ඉඩම් සැකසීම යනාදී වියදම් පියවීම සඳහා.

මාස 36 ක් ඇතුළතදී පියවිය යුතු කෙටිකාලීන ණය සහ අවුරුදු 3 - 10 අතර කාලයක් තුළදී පියවිය යුතු මධ්‍යකාලීන හා දීර්ඝකාලීන ණය පහත සඳහන් කටයුතු සඳහා මහජන බැංකුව විසින් සපයනු ඇත.

(අ) රජය විසින් සපයන ලද සහනාධාරවලට වැඩියෙන් අවශ්‍ය වන ප්‍රාග්ධන වියදම්; සහ/හෝ

(ආ) පුනරාවර්තන වියදම්.

කළමනාකාරිත්වය: මේ ව්‍යාපාර පරිපාලන කමිටුවක් විසින් පාලනය කළ යුතුය. මේ කමිටුවට වග කියනු ලබන ව්‍යාපාර කළමනාකරුවකු සිටිය යුතුය. ආරම්භයේදී නිල බලයෙන් පත්වන සාමාජිකයින් බහුතර සංඛ්‍යාවක් මේ කමිටුවල සිටිය යුතුය. මේ ගොවිපලවල් සඳහා රජයේ ආයතන විසින් නිරන්තරයෙන්ම සහාය දීම අපේක්ෂා කරන ලදී. සමුපකාර සමිතිය විසින් ආරම්භයේදී ඉඩම දීර්ඝකාලීන බද්දක් යටතේ තබා ගත යුතුය. එගා කටයුතුවලදී:

I. දෛනික වැටුප් ක්‍රමයකට හෝ වැඩ කොටස් ක්‍රමයකට මුළු ව්‍යාපාරයම එකම ඒකකයක් ලෙස පවත්වා ගත හැකිය;

II. එක් එක් ඒකකය එක් එක් සාමාජික කණ්ඩායම්වලට දීමෙන්, ඒකක කිහිපයක් වශයෙන්ද වැඩ කළහැකි වේ. මෙවුන් භෞතික සැළැස්ම, සැපයුම්, වගා සැළැස්ම, බෝග රටාව, ණය පහසුකම් හා අලෙවිය යනාදිය ගැන කළමනාකාරිත්වය සකස් කරන සැළසුමකට අනුව වැඩ කළ යුතුය;

III. වගා කටයුතු සඳහා සෑම සාමාජිකයෙකුටම හෝ සෑම පවුලකටම එක් ඉඩම් කොටසක් පැවරිය හැකි නමුත් එම ඉඩම් ස්ථිර පදනමක් මත පවරනු නොලැබේ.

සමිතිය විසින් සියළුම සැපයුම් සහ නිෂ්පාදන අලෙවිය පාලනය කළ යුතුය. සංවිධානයේ සියළුම මූලපාමය සහ පාලනමය කටයුතුද එය විසින්ම සංවිධානය කළයුතු වේ. ව්‍යාපාරය පිළිබඳ සියළුම අධීක්ෂණ කටයුතු දිස්ත්‍රික් කෘෂිකාර්මික සංවර්ධන මණ්ඩලයේ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අතුරු-කමිටුවේ වගකීම විය යුතුය.

## 3.2 සමුපකාර ගම්මාන පිළිබඳ සාර්ව තත්වය - 1973

1971-1973 කාලයේදී අක්කර 14,581 ක් සංවර්ධනය කිරීම සඳහා සමුපකාර ගොවිපලවල් 65 ක් අනුමත කරන ලදී. 1973 වනවිට ගොවිපලවල් 43 ක වැඩ කටයුතු කරගෙන යමින් තිබුණ අතර 1974 අප්‍රියෙල් මාසය වනවිට සමුපකාර ගම්මාන 52 ක් ක්‍රියාත්මක වෙමින් තිබුණි. (සටහන III-1) මෙම යෝජනා ක්‍රමයන්හි සේවා අවස්ථා සැපයීමට අපේක්ෂා කළ පුද්ගලයින් 6,193 කගෙන් 3,183 කට සේවා අවස්ථා ලබා දී තිබුණේය. මෙය බලාපොරොත්තු වූ ඉලක්කයෙන් සියයට 59 කි.

## 3.3 සමුපකාර ගම්මාන පහ පිළිබඳ විස්තරය

අධ්‍යයනය පටන් ගන්නා විට පිහිටුවා තිබුනේ ගම්මාන 43 කි. නියැදිය සඳහා තෝරා ගත් ගම්මාන පහට අක්කර 1,531 ක් (මුළු ප්‍රමාණයෙන් 11% ක්) අයත් වූ අතර ඒවායේ සාමාජිකයින් 647 දෙනෙක් වූහ. 1974 අප්‍රියෙල් මාසය වනවිට සමුපකාර ගම්මානවල වැඩ කරමින් සිටි පුද්ගලයින් 3,183 දෙනාගෙන් 20% දෙනෙක් නියැදියෙහි වූහ. අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද සමුපකාර ගම්මාන පහ නම් ලස්සනගම, බැද්දේගම, පීපිලිමාන, ගිලීමලේ සහ ප්‍රොවිඩන්ස්ය.

## සටහන III-1 සමුපකාර ගම්මාන 1971 - 1974

| | 1971 | 1972 | 1973 | 1974 | මුළු ගණන |
|---|---|---|---|---|---|
| අනුමත කරන ලද සමුපකාර ගම්මාන ගණන .. | 9 | 30 | 26 | - | 65 |
| 1974 අප්‍රියෙල් මාසයේදී ක්‍රියාත්මක වෙමින් පැවති සමුපකාර ගම්මාන ගණන .. .. | 4 | 14 | 25 | 9 | 52 |
| සමුපකාර ගම්මානවලට අයත්ව තිබුණ ඉඩම් අක්කර ගණන | 1,839 | 6,579 | 6,163 | ලැ.නැ. | 14,581 |
| සේවායේ සැපයීමට බලාපොරොත්තු වූ රැකියාවන් ප්‍රමාණය | 785 | 3,088 | 2,320 | - | 6,193 |
| සපයන ලද රැකියාවන් ප්‍රමාණය | 187 | 841 | 1,558 | 597 | 3,183 |

මූලාශ්‍රය: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය

### 3.3.1 ලස්සනගම සමුපකාර ගොවිපල

පසුතලය

කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරනියගල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ පිහිටි ලස්සනගම සමුපකාර ගම්මානය 1972 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. මෙය අධ්‍යයනය කරන විටද ලස්සනගම සමුපකාර ගම්මානය අවුරුද්දකට වඩක් වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් තිබුනි.

ගොවිපලේ මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 549 ක් විය. පවරා ගැනීමට පෙර මෙම ඉඩමේ අවුරුදු 20 ක් පමණ වයසැති රබර් වගාව නොසැළකිල්ලට පාත්‍ර වෙමින් තිබුනි. බඩි රබර් අක්කර 150 කින් පමණ කිරි ලබා ගත් අතර අක්කර 200 ක පමණ වැලි දොඩම්, එළවළු, ධාන්‍ය වර්ග සහ අල වර්ග වගා කොට තිබුනි. අක්කර 142 ක් වැලි දොඩම් වගාවට යට වී තිබුණේය. අක්කර 365 ක පමණ එනම්, මුළු අක්කර ප්‍රමාණයෙන් සියයට 65 ක පමණ, නොයෙකුත් බෝග වගා කොට තිබුනි.

සාමාජිකයින් 80 දෙනෙකුගෙන් පමණ පළමුව ඇරඹි ගොවිපලෙහි සාමාජික සංඛ්‍යාව පසුව 317 දක්වා වර්ධනය විය. 1973 දෙසැම්බර් මාසයේදී සාමාජිකයින් 297 දෙනෙක් සිටි අතර ඉන් 135 දෙනෙක් කාන්තාවන් විහි. ප්‍රදේශයේ, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ සභාපතිත්වය යටතේ සමුපකාර සමිතියක් පිහිටුවන ලදී. ආරම්භයේදී සාමාජිකයින් 4 දෙනෙකු

පාලක මණ්ඩලයේ සිටි අතර පසුව එය 8 දක්වා වැඩි විය. සභාපති තනතුරෙහි වෙනසක් සිදු නොවීය.

1973 දෙසැම්බර් මාසයේදී ක්ෂේත්‍ර අධ්‍යයනය කළ අවස්ථාවෙහි සාමාජිකයින් 300 ක් පමණ බෝග සහ පශු පාලන කටයුතුවල නියැලී සිටියහ. ගොවිපල සැළැස්ම අනුව අවුරුදු පහක කාලය තුළදී අක්කර 480 ක් සංවර්ධනය කිරීමට අපේක්‍ෂා කරන ලදී. බෝගවලට සම්බන්ධ සියළුම සංවර්ධන කටයුතු පළමුවන අවුරුදු දෙක තුළදී කළයුතු වූ අතර මේ ඉලක්කය සපුරාලිය හැකි විනි. මීට අමතරව සාමාජිකයින් විසින් ඌරු කොටුවක්, මී මැසි පෙට්ටි කිහිපයක් සහ තාරාවන් රංචුවක්ද නඩත්තු කරන ලදී. අලෙවිය සඳහා පිඹිඩි මල් වගා කිරීමද දියුණු වෙමින් පැවතුනි.

සංවර්ධන සැළැස්ම සහ ලබා ඇති ප්‍රගතිය

III-2 ලේඛනයෙහි 1973 සිට 1977 දක්වා වූ සංවර්ධන සැළැස්ම සඳහන් වේ. මේ සැළැස්ම අනුව අක්කර 330 ක් වගා කිරීමට බලාපොරොත්තු වන අතර මෙයට වැලි දොඩම් අක්කර 200 ක්ද, මුං ඇට සහ මිරිස් අක්කර 50 ක්ද, තණකොළ අක්කර 50 ක්ද, එළවළු සහ මල් අක්කර 30 ක්ද ඇතුළත්ය. මෙතෙක් කල් නොසැළකිල්ලට පාත්‍ර වී තිබුණු රබර් අක්කර 150 ක්ද සැළැස්මේ පළමුවන අවුරුද්ද තුළදී පුනරුත්ථාපනය කළ යුතු විය.

අවුරුදු පහ තුළදී පුනරුත්ථාපනය කිරීමට නියමිත අක්කර 480 න් අක්කර 372 ක් (77%) පළමුවන අවුරුද්ද තුළදීද අක්කර 98 ක් දෙවැනි අවුරුද්ද තුළදීද හෙළි පෙහෙළි කර වගා කළයුතු විය. මෙවිට සංවර්ධන කටයුතු වලින් 97% කට අධික ප්‍රමාණයක් සම්පූර්ණ වන්නේ යැයි අපේක්‍ෂා කෙරේ. (සටහන III-2) මෙය ඉමහත් බලාපොරොත්තු වලින් පිරි සැළැස්මක් වූ නමුත් මේ පුරෝගාමී සමූපකාරිකයින්ගේ ප්‍රගතිය දිරිමත් කරවන සුළු විය. ඇත්තෙන්ම අක්කර 347 ක් වගා කිරීම, සැළැස්මෙන් 93% ක් පළමුවන වසරේදීම සම්පූර්ණ වීමකි.

සැළැස්ම අනුව මීට අමතරව මී මැසි පාලන අංශයක්, කිරි පට්ටියක්, ඌරු කොටුවක් සහ කුකුළු කොටුවක්ද පිහිටුවීමට ඉලක්ක කරන ලදී. අවුරුදු පහ අවසානයේදී කුකුළන් 10,000 ක්, මී මැසි පෙට්ටි 500 ක්, ගවයින් 100 දෙනෙක් සහ ඌරන් 500 ක් ඇති කිරීමට ඇස්තමේන්තු කර තිබුනි. මේ අංශයේ ප්‍රගතිය එතරම් සතුටුදායක නැත. ඌරු ගාල ඉලක්කයද ඉක්මවා දියුණු වී ඇති නමුත් බලාපොරොත්තු වූ මී මැසි ජනපද 100 න් පිහිටුවා තිබුණේ 26 ක් පමණකි. කුකුළු කොටුව සහ ගව ගාල ආරම්භ කොට නොතිබුනි. ගොවිපලෙහි තාරාවන් 450 දෙනෙකු පමණ සිටි අතර මෙය ලාභදායක කටයුත්තකැයි පාලකයෝ බලාපොරොත්තු වූහ.

සාමාජිකයින්ගේ පාවිච්චිය සඳහා ගොඩනැගිලි 50 ක් පමණ ගොඩ නැගිය යුතු විය. අවුරුදු පහ අවසානයේදී රබර් කර්මාන්ත ශාලාවක් සහ පළතුරු ඇහිරීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමේ අපේක්‍ෂාවක් විය. පස් අවුරුදු සංවර්ධන වැඩ පිළිවෙල සඳහා වැය වන මුළු

වියදම රුපියල් 13,24,500/- කැයි ගණන් බලා තිබුණි. මේ කාලයේදී ලබා ගැනීමට බලාපොරොත්තු වන ආදායම ගණනය කර තිබුණේ නැත.

## සටහන III-2    1973 - 1977 සංවර්ධන සැලැස්ම

| බෝගය | 1973 (අක්කර) | 1974 (අක්කර) | 1975 (අක්කර) | 1976 (අක්කර) | 1977 (අක්කර) | මුළු ගණන (අක්කර) |
|---|---|---|---|---|---|---|
| වැල් දොඩම් .. | 150 | 50 | - | - | - | 200 |
| මුං ඇට .. | 20 | 5 | - | - | - | 25 |
| මිරිස් .. | 10 | 5 | 5 | 5 | - | 25 |
| තණකොළ .. | 25 | 25 | - | - | - | 50 |
| එළවළු .. | 15 | 10 | - | - | - | 25 |
| මල් .. | 2 | 3 | - | - | - | 5 |
| රබර් .. | 150 | - | - | - | - | 150 |
| | 372 | 98 | 5 | 5 | - | 480 |
| **පශු පාලනය** | | | | | | |
| ඌරන් .. | 100 | 100 | 100 | 100 | 100 | - |
| ගවයින් .. | 50 | 50 | - | - | - | - |
| මී මැසි පෙට්ටි .. | 100 | 200 | 200 | - | - | - |
| කුකුලන් .. | 1,000 | 2,000 | 2,000 | 5,000 | - | - |

මූලාශ්‍රය: ලක්සපතගම සමුපකාර ගම්මානයේ ඇති ලේඛන

## සටහන III–3 සැළසුම් කරන ලද වියදම් සහ අරමුදල් ලබා ගන්නා ක්‍රම 1973 – 1977

### ආදායම

| විස්තරය | ප්‍රමාණය රු. |
|---|---|
| රබර් | 20,000 |
| නිවාඩු මධ්‍යස්ථානය | 1,000 |
| විවිධ | 5,000 |
| කුකුල් පාලනය | 7,500 |
| බැංකු වලින් | 25,000 |
| ණය මුදල් | 1,266,000 |
| මුළු එකතුව | 1,324,500 |

### වියදම්

| විස්තරය | | ප්‍රමාණය රු. |
|---|---|---|
| වැල් දොඩම් | | 300,000 |
| මුං ඇට | | 7,500 |
| මිරිස් | | 12,500 |
| තණකොළ | | 5,000 |
| එළවළු | | 5,000 |
| මල් | | 150,000 |
| කෘෂිරසායනික ද්‍රව්‍ය | | 4,000 |
| යන්ත්‍රසූත්‍ර | | 4,500 |
| | එකතුව | 488,500 |
| **පශු පාලනය** | | |
| ඌරන් පාලනය | | 20,000 |
| ගව පාලනය | | 45,000 |
| මීමැසි පාලනය | | 5,000 |
| කුකුල් පාලනය | | 15,000 |
| | එකතුව | 85,000 |
| **රබර්** | | |
| පොහොර | | 25,000 |
| උපකරණ | | 30,000 |
| ද්‍රව්‍ය කාමරය | | 30,000 |
| ජල සැපයුම | | 20,000 |
| වතුර ටැංකි | | 12,500 |
| වතු කාමරය | | 25,000 |
| ගබඩා කාමරය | | 45,000 |
| | එකතුව | 187,500 |
| **රථ වාහන** | | |
| වෑන් එකක් | | 45,000 |
| ට්‍රැක්ටර් එකක් | | 50,000 |
| ජීප් එකක් | | 35,000 |
| | එකතුව | 130,000 |
| නිවාඩු මධ්‍යස්ථාන | | 10,000 |
| උපකරණ | | 5,000 |
| | එකතුව | 15,000 |
| සාමාජිකයින් සහ වාසස්ථාන | | 250,000 |
| ගබඩා කාමරය | | 5,000 |
| කන්තෝරුව | | 15,000 |
| පුස්තකාලය | | 10,000 |
| සංස්කෘතික මධ්‍යස්ථානය | | 25,000 |
| අලෙවි හල | | 15,000 |
| විදුලි බලය | | 25,000 |
| පුනරාවර්තන වියදම් | | 50,000 |
| | එකතුව | 395,000 |
| ඉතිරිය | | 23,500 |
| | මුළු එකතුව | 1,324,500 |

මූලාශ්‍රය: ලස්සනගම සමූපකාර සමිතියේ වාර්තා

වර්තමාන සමාජ තත්වය


සමූපකාර ගම්මානයේ සියළුම සාමාජිකයෝ ගොවිපලේ පදිංචි වී සිටියහ. පිරිමි සාමාජිකයෝ, 20 දෙනෙකුට පමණ ඉඩ කඩ ඇති තාවකාලික ගොඩනැගිලිවල පදිංචි වී සිටි අතර කාන්තාවන් සඳහා නිවාස දෙකක ඉඩකඩ සපයා තිබුණි. ගොවිපලේ එකට පදිංචි වී සිටින නිසා පොදු හැඟීම් වර්ධනය වී ඇත. සාමාජිකයින් සරීර වැඩ කණ්ඩායම්වලට බෙදී, එක් එක් කණ්ඩායමක් විශේෂිත බීම් කැබැල්ලක් වගා කිරීම හේතුකොටගෙන කණ්ඩායම් ඇතුළත සාමූහික හැඟීමක් වැඩෙනු දක්නට ඇත.

මේ ඉඩම රජයට පවරා ගැනීමට පෙර එහි වැඩ කරමින් සිට, දැනට සමූපකාර ගම්මානයේ සාමාජිකත්වය ලබා සිටින වයසක සාමාජිකයෝ තරුණ සාමාජිකයින් සමඟ ළඟින් ඇසුරු නොකරති. වයසක සාමාජිකයෝ රබර් නිෂ්පාදන කටයුතුවල යෙදී සිටියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් විවාහකයින් වූ අතර ඔව්හු වත්තෙහි ලැයිම්වල සිය පවුල් සමඟ පදිංචි වී සිටියහ. අසල පිහිටි ගම් වලින් පැමිණ සිටි තරුණ සාමාජිකයින්ගේ ජීවන රටාව වයසක සාමාජිකයින්ගේ ජීවන රටාවට වඩා වෙනස් විණි. වයසක සාමාජිකයින් ඒකාධිකාරී දරුණු පාලනයකට හුරු වී සිටි අතර තරුණ සාමාජිකයින්ගේ පසුතලය වූයේ මීට වෙනස් ජීවන ශෛලියක් ඇති ගැමි ගොවි සමාජයයි. එසේම බොහෝ තරුණ සාමාජිකයින් ගොවිතැන පළමුවරට ජීවනෝපායක් වශයෙන් පටන් ගෙන තුබුයෙන් කණ්ඩායම් ක්‍රමය ඔවුනට අළුත් දෙයක් විණි.

ගම්මානයේ කළමනාකාරීත්වය

1973 අගෝස්තු මාසයේදී සමූපකාර ගම්මානයේ අධ්‍යක්ෂ මණ්ඩලය පුද්ගලයින් 9 දෙනෙකුගෙන් සමන්විත විය. එනම් දෙහිඕවිට පාර්ලිමේන්තු මන්ත්‍රී, දැරනියගල ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කෑගල්ල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී, කෑගල්ල උප දිසාපති, දැරනියගල ගම් සභාවේ සභාපති සහ ජනාවාසිකයින් නියෝජනය කළ සාමාජිකයින් සිවු දෙනෙක් වශයෙනි. 1973 දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය, දෙහිඕවිට පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාගෙන් සහ සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත විණි. (පිරිමි 4, කාන්තා 4) අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින සාමාජිකවරුන් මහ සභාව විසින් ඡන්දයෙන් තෝරා ගන්නා ලදහ. විශේෂ සමූපකාර සමිතිය පාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම විය. 1972 ඔක්තෝබර් මාසයේ සිට මාස 10 ක් ඇතුළතදී අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් 12 ක් පවත්වන ලදී. ආරම්භයේ සිටම අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමාගේ උද්යෝගය සමූපකාර සමිතියේ සාමාජිකයින් විසින් අගය කොට සලකන ලද්දේය.

ගම්මානයෙහි සම්පූර්ණ කළමණාකාරීත්වය හා අධීක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු නේවාසික කළමනාකරුවෙක් සිටියේය. සාමාජිකයින් කාණ්ඩවලට බෙදා විවිධ වැඩ කටයුතු පවරන ලදී. හැම කණ්ඩායමකටම සාමාජිකයින් විසින් තෝරා ගනු ලැබ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නායකයෙකු විය. ගොවිපලෙහි සංවිධානය පහත සටහනෙහි පෙනෙන ආකාරයට විණි.




කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ පවතින සමාන්තර සමූපකාර ගොවිපල්වල අධ්‍යක්ෂ මණ්ඩලය සතු උපරිම සාමාජික නියෝජනත්වය 3 දෙනෙක් බව සළකන විට, මෙම ගම්මානයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් රජයේ නිලධාරීන් ඉවත් කිරීම හා සාමාජිකයින් 8 දෙනෙකුගෙන්ද පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාගෙන්ද සමන්විත වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සැකසීම වැදගත් වන්නේය.

ගොවිපලෙහි පාලනය ලෙන්ගතු, අධිපත්‍ය ස්වභාවයක විනි. ව්‍යාපාර කළමනාකරු සමඟ වගකීම් බෙදා ගැනීම සඳහා කමිටුවක් නොතිබීම පාලනයෙහි සාමාජිකයින්ගේ සහභාගිත්වය නැති බවට ලකුණකි. මෙවැනි තත්වයක් යටතේ නිෂ්පාදනය වැඩි වීම සිදු විය හැකි වුවද කළමනාකරණ යෙහි ලා වගකීම භාර ගැනීමට පරිචයක් නොලද, ඇතැම්විට අකමැති අකරනම්‍ය සාමාජික සමූහයක් ඇති වීමටද මෙම තත්වය තුඩු දිය හැක.

වීශ්ලේෂනය

ආර්ථික අංශය: 1963 ජූලි මාසය දක්වා මුදල් පිළිබඳ ප්‍රකාශනය III–4 සටහනෙහි දැක්වේ. මේ අනුව මාස 11 ක කාලයක් ඇතුළතදී රු. 7,64,316/– ක මුළු වියදමක් සහ රු. 8,64,183/– ක මුළු ආදායමක් දැක්වේ. සාමාන්‍ය මාසික ආදායම රු. 78,500/– ක් වන අතර සාමාන්‍ය මාසික වියදම රු. 69,400/– ක් පමණ වන්නේය.

ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ දීමනාව රු. 4,25,000/– ක් පමණ විය. එය මුළු වියදමින් 55% කට අධික වන අතර මුළු වත්කම් වලින් 49% ක් පමණ වේ. මුළු වියදමින් රු. 30,558/– ක් (39%) ප්‍රාග්ධන වියදම් සඳහාද, රු. 4,63,758/– ක් (61%) පුනරාවර්තන වියදම් සඳහාද විය. මාස 11 ක් ඇතුළතදී එක් සාමාජිකයෙකුට වැය වූ සාමාන්‍ය වියදම රු. 2,800/– ක් පමණ වූ අතර ඉන් රු. 1,700/– ක් පුනරාවර්තන වියදම් සඳහාද රු. 1,100/– ක් ප්‍රාග්ධන වියදම් සඳහාද විය. පුනරුත්ථාපනය සහ සංවර්ධනය මගින් අක්කර

347 ක් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනු ලැබූයෙන් අක්කරයකට සාමාන්‍යයෙන් වැය වූ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පිළිවෙලින් රු. 865/- සහ රු. 1,335/- කි. අක්කරයක් සංවර්ධනය කිරීම සඳහා වැය වූ මුළු වියදම රු. 2,200/- ක් විය. රජයෙන් ලැබුණු රු. 4,25,000/- ක දීමනාව ප්‍රාග්ධන වියදම් කටයුතු සඳහා යොදන ලදැයි උපකල්පනය කළහොත් ගොවිපලේ පුනරුත්ථාපනය සහ සංවර්ධනය කරන ලද ඉඩම් අක්කරයක් සඳහා ගිය සාමාන්‍ය වියදම රු. 1,225/- කි. නැතහොත් ගොවිපලේ සම්පූර්ණ අක්කර 549 ක ප්‍රමාණය සැලකුවහොත් එය අක්කරයකට රු. 775/- කි.

ප්‍රධාන ආදායම් මාර්ගය වූ රබර් විකිණීමෙන් ලද ආදායම රු. 1,45,988/- ක් වූ අතර ඒ අනුව එක් සාමාජිකයෙකුට සාමාන්‍ය ආදායම රු. 540/- කි. එක් සාමාජිකයෙක් සඳහා වූ පුනරාවර්ථන වියදම රු. 1,700/- ක් වූ නිසා රබර් විකිණීමෙන් මෙම මුදලින් 32% ක් පමණක් පාසා පියවිණි.

සංවර්ධනය කරන ලද අක්කර 345 න් අක්කර 150 ක් පමණ දැනටමත් රබර් වගාව යටතේ වූයෙන් ඒ සඳහා ගිය පුනරාවර්තන වියදම් අධික බව පෙනී යයි. ගොවිපලේ ලාබදායකත්වය ගණනය කිරීමට තවම කල් මදි මුවද සංවර්ධන කටයුතු බලාපොරොත්තු වූ ඉලක්කය කරා ළඟා වී තිබීම වැදගත් කරුණකි.

ශිල්පීය අංශය: ස්වභාවික දිය පහර වලින් නිරතුරුව පෝෂණය කරනු ලබන වතුර ටැංකි 10 ක් පමණ ගොඩ නගා ඇත. මල් වැවීමේ අංශය සඳහා විශාල වශයෙන් මුදල් වැය කොට තිබේ. මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා අවශ්‍ය විශේෂ දක්ෂතාවයන් ගොවිපලෙහි තිබිණි.

කළමනාකරණය: මේ ගොවිපල දේශපාලන නායකයකු වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගේ මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වූවේය. රජයේ නිලධාරීහු දිගු කලක් ගොවිපල සමඟ සම්බන්ධතාවයක් පවත්වා නැත. ව්‍යාපාර කළමනාකරු කෙලින්ම සභාපතිගේ දේශපාලන නායකත්වය අවබෝධ කර පිළි ගැනීම, ඉහළ මට්ටමෙහි පීතෘමය පරිපාලන ආකල්පයක් හා සාමාන්‍ය සාමාජික මට්ටමෙහි යටහත් අවනතභාවයක් පිළිබඳ ආකල්පයක් ඇති වීමට තුඩු දී ඇත. බලය පැවරීමට කිසියම් උත්සාහයක් ගැනීම මගින් ගොවිපලෙහි පරිපාලන වගකීම බෙදා ගැනීමේ ක්‍රියාවලිය ඉක්මන් කළ හැකිය. සමූපකාර ගම්මානයේ සාමාජිකයින් 8 දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටීම මගින්, ආධිපත්‍ය ස්වභාවයේ කළමනාකරණ තත්වය මුවා වීමට පිළිවන.

ගොවිපලේ ව්‍යාපාරික කටයුතු අධික වීම නිසා ක්‍රමානුකූල ගිණුම් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය විය. වඩාත් තාර්කික තීරණ ගැනීමට ආධාරකාරී වන ආකාරයෙන් සරල පිරිවැය ගිණුම් ක්‍රමයක් හඳුන්වා දීම යෝග්‍ය යයි හැඟේ.

සමාජයීය අංශ: සාමාජිකයින් අතර ප්‍රජා හැඟීමක් සාර්ථකව වර්ධනය වී ඇත. සමාජ ආර්ථික කටයුතු අතින් පොදු ගැනීම් සහිත ස්ථිර කණ්ඩායමක් ඇති කිරීමට, පොදුවේ

සටහන III–4 1972 සැප්තැම්බර් මාසයේ සිට 1973 ජූලි මාසය දක්වා ලැබූ වත්කම් සහ බැරකම්

(1973 ජූලි මාසයේ සිට පිළියෙල කරන ලදී)

ආදායම්

| විස්තරය | ගිය මාසයේ අවසානය දක්වා රු. | වර්තමාන මාසය රු. | මුළු ගණන රු. |
|---|---|---|---|
| මුදල් සහ බැංකු ශේෂය | 64,406.50 | 10,101.52 | 74,508.02 |
| රජයේ සහනාධාර(ප්‍රාග්ධන) | 309,000.50 | 93,500.50 | 425,000.50 |
| නිශ්චිත දේපල විකිණීම | 17,150.00 | – | 17,150.00 |
| මහජන බැංකු ණය | 50,000.00 | – | 50,000.00 |
| විකිණීම් | 3,933.48 | 986.40 | 4,919.88 |
| පුනරාවර්තන වියදම් | 93,319.88 | – | 93,319.88 |
| දැව විකිණීමෙන් | 4,005.07 | 2,000.00 | 6,005.07 |
| වැරදීමෙන් | 9,657.93 | – | 9,657.93 |
| රබර් විකිණීමෙන් | 143,245.55 | 2,742.84 | 145,988.39 |
| විවිධ ආදායම් | 4,426.79 | 1,365.61 | 5,792.40 |
| සංචාරක මධ්‍යස්ථානයට | 4,533.75 | 493.00 | 5,026.75 |
| දෙහිඕවිට සංවර්ධන අරමුදල | 19,815.00 | – | 19,815.00 |
| ණය මුදල් | 7,000.00 | – | 7,000.00 |
| මුළු ගණන | 730,494.45 | 111,189.87 | 864,183.82 |

වියදම්

| විස්තරය | ගිය මාසයේ අවසානය දක්වා රු. | වර්තමාන මාසය රු. | මුළු ගණන රු. |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 270,819.37 | 29,739.27 | 300,558.64 |
| ප්‍රවාහන වාර්තා | 134,790.00 | 5,398.38 | 140,188.18 |
| කොන්ත්‍රාත්තුව | 891.00 | 1,061.00 | 1,952.00 |
| මහජන බැංකුව(ණය වාරිකය) | 2,665.50 | 850.00 | 3,515.58 |
| මිළදී ගැනීම් | 5,246.88 | 5,510.60 | 10,757.48 |
| ණය වාරිකය | 105,694.20 | 97.50 | 150,791.70 |
| විවිධ වියදම් | – | 10,107.00 | 10,107.00 |
| පරිපාලන වියදම් | 59,633.24 | 3,995.46 | 63,228.20 |
| සංචාරක මධ්‍යස්ථානයට | 1,797.36 | 919.79 | 2,717.15 |
| රබර් අංශය | 19,623.02 | 10,591.71 | 30,214.24 |
| හිඟකම් | 277.78 | – | 277.78 |
| ග්‍රාමීය බැංකු(කොටස් මුදල්) | 50,000.00 | – | 50,000.00 |
| ණය ලබා ගැනීම සඳහා | 9.00 | – | 9.00 |
| මුළු ගණන | 651,448.23 | 68,269.71 | 764,316.95 |

මූලාශ්‍රය: ලස්සකගම සමූපකාර ගොවිපලේ වාර්තා

වැඩ කිරීම සහ පොදුවේ ජීවත් වීම අනු බලයක් වී ඇත. සාමාජිකයින්ගේ නායකත්ව ලක්‍ෂණ කළමනාකාරිත්වය මගින් දිරි ගන්වනු ලැබිණි.

### 3.3.2 බැද්දේගම සමූපකාර ගම්මානය

පසුතලය

මෙම ගොවිපල 1972 ජුනි මාසයේදී ආරම්භ වූයෙන් ඊට මාස 15 කට පමණ පසු මේ අධ්‍යයනය කරන ලදී. මේ වත්තට අයත්ව තිබුණු කුඹුරු අවට ගම්වාසීන් විසින් වගා කරමින් තිබුණ අතර පසුව ඒවා ගොවිපලට පවරා ගන්නා ලද්දේය. අවුරුදු 50 ක් පමණ කාලයක් තිස්සේ මේ වත්තේ පදිංචි වී සිටි පවුල් 40 කට පමණ, මේ ගොවිපල ආරම්භ කිරීම නිසා, හදිසියේන්ම වත්ත හැර යාමට සිදු විය. මොවුන්ගෙන් සමහරු අසල පිහිටි රජයේ ඉඩම්වල පදිංචි වූ අතර ඇතැම්හු සමූපකාර ගම්මානය අවට සීමාවේ පදිංචි වූහ. පසුව ඔවුන්ගේ දරුවන් කීප දෙනෙක් සමූපකාර ගම්මානයේ සාමාජිකයින් වශයෙන් බඳවා ගන්නා ලදී.

ගොවිපලේ මුළු භූමි ප්‍රමාණය අක්කර 736 කි. කලින් පිලගොඩවත්ත නමින් වූ මෙම පුද්ගලික වතුයාය පවරා ගන්නා ලද අවස්ථාවෙහි එය නොසැළකිල්ලට පාත්‍ර වෙමින් තිබිණි. සමූපකාර සමිති මගින් තේ අක්කර 120 ක්ද, රබර් අක්කර 110 ක්ද නිෂ්පාදන ලබා ගත හැකි පරිදි පුනරුත්ථාපනය කරන ලද්දේය. ඊට අමතරව මයියොක්කා, කෙසෙල්, උක් සහ වැලි දොඩම් වගාවන්ද ආරම්භ කරනු ලැබිණ.

සාමාජිකයින් 200 කගෙන් යුතුව ගොවිපල ආරම්භ කරන ලද අතර, 1973 ඔක්තෝබර් මාසය වනවිට ඉන් ඉතිරි වී සිටියේ 135 දෙනෙකි. (පිරිමි 106, කාන්තාවන් 29) 1973 ඔක්තෝබර් මාසයේදී අධ්‍යක්‍ෂ මණ්ඩලය, විසින් අළුත් සාමාජිකයින් 60 දෙනෙක් තෝරා ගැනීමට වැඩ පිළිවෙලක් අවසාන කරමින් සිටියාය.

මේ වත්ත පවරා ගැනීමට ටික කලකට කලින් නිපැයුමක් ඇති සංවර්ධිත තත්වයක පැවති නිසා, මුලින්ම කළයුතු වූයේ රබර් සහ තේ වැනි පවත්නා බෝග පුනරුත්ථාපනය කිරීමය. ඊට අමතරව වැලි දොඩම්, වී සහ වෙනත් බෝගද වගා කරන ලදී.

මාස 15 ක් ඇතුළතදී සිදු වී ඇති සංවර්ධන කටයුතු ප්‍රමාණය සතුටුදායකය.

මේ අධ්‍යයනය කරන විට ගවයින් 8 දෙනෙක් සහිත ගව පට්ටියක් ඇති කොට තිබුණේය. මෙය වූ කලී සංවර්ධන සැළැස්ම අනුව තෙවැනි වසරේදී ඉටු කළයුතුව තිබුණු කාර්යයකි. කුකුළු කොටුවක් පටන් ගැනීමට සැළසුම් කර තිබී නමුත් එය ආරම්භ කොට නොතිබුණේය.

සංවර්ධන සැළැස්ම සහ ලබා ඇති ප්‍රගතිය

III-5 ලේඛනයෙහි සිවු අවුරුදු සංවර්ධන සැළැස්ම දැක්වේ. මේ කාලය තුළදී නගා සිටුවීමට බලාපොරොත්තු වූ මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 555 කි. මෙයින් 42% ක් I වෙනි අවුරුද්ද තුළදීද, 15% ක් දෙවෙනි අවුරුද්දේදීද, 20% ක් අවසාන අවුරුද්දේදීද තවත් 21% ක් සැළැස්මේ අවසාන වසරේදීද දියුණු කිරීමට බලාපොරොත්තු විය. සම්පූර්ණ සැළැස්ම විසින් කෙටිකාලීන බෝග සහ මිශ්‍ර බෝග වගා කිරීමට නියමිත භූමියද ඇතුළුව, අක්කර 766 ක් නගා සිටුවීමට බලාපොරොත්තු විය.

පළමුවෙනි මාස 15 ඇතුළතදී සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වූයේ අක්කර 288 ක ප්‍රමාණය වුවද ඇත්තෙන්ම මේ කාලය තුළදී අක්කර 306 ක් සංවර්ධනය කර තිබූයෙන් මේ අනුව ඉලක්කය දළ වශයෙන් 18% කින් ඉක්මවිණි. මින් අක්කර 230 ක් (75%) රබර් සහ තේවලට යටව තිබුණ අතර අනෙක් අක්කර 76 හි වී, වැලි දොඩම් සහ අනෙකුත් බෝග වවා තිබුණේය.

පළමුවන වර්ෂයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ කුකුළු කොටුව ආරම්භ කර නොතිබුනද තෙවෙනි වර්ෂයේ ආරම්භ කිරීමට සැළසුම් කර තිබී කිරි පට්ටිය, ගවයින් 8 දෙනෙකුගෙන් සමන්විතව පළමුවැනි අවුරුද්දේම ආරම්භ කර තිබිණි.

වර්තමාන තත්වය

සමාජ තත්වය: සාමාජිකයින් 135 දෙනාගෙන් ගොවිපලේ පදිංචිව සිටියේ එක් අයෙකු හෝ දෙදෙනෙකු පමණි. සෙසු අය අවට ගම්වල සිට දිනපතා වැඩට පැමිණියහ. සෑම උදෑසනම සාමාජිකයින් ඒ ඒ වැඩ සඳහා කණ්ඩායම්වලට බෙදන ලදී. මෙම කාණ්ඩ සංවිධානයෙහි ලා දැඩි ක්‍රියා මාර්ගයක් අනුගමනය නොකරන ලද අතර කිසියම් එක් කාර්යයක් සඳහා මනාපයක් දැක්වූ පුද්ගලයෝ එක් කණ්ඩායමකට රැස්වීමේ නැඹුරුතාවය දක්නට ලැබිණි. රබර් කපන්නන්, රබර් කර්මාන්ත ශාලාවේ වැඩ කරන්නන්, තේ දළු නෙලන්නන් සහ කුඹුරු ගොවිතැන් කරන්නන් වෙන් වෙන්ව කණ්ඩායම්වලට අයත් විය. මෙවැනි විශේෂ හැකියාවක් නැති අයට නොයෙක් ආවස්තිතික කාර්යයන් පවරන ලදී. දිගු කලක් තිස්සේ එකට වැඩ කළ අය අතර එක්තරා එක්සත්කමක් සහ එකඟත්වයක් දක්නට ලැබුණේය. එක් කණ්ඩායමක පොදු ශුභ සිද්ධියට අහිතකර කිසියම් බලපෑමක් සිදු වූ අවස්ථාවලදී එක්සත්කම පිළිබඳ මෙම හැඟීම ප්‍රචලිතව දක්නට ලැබුණේය. නිදසුනක් වශයෙන් වැඩ ප්‍රමාණය අධික යැයි සළකනු ලැබූ විට කාණ්ඩයේ සාමාජිකයෝ මේ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළහ. කෙසේ වුවද ගොවිපලේ මුළු සාමාජිකත් වයටම බලපාන ප්‍රශ්න උද්ගත වූ විට ඔවුන් අතර එතරම් එක්සත්කමක් තිබුණ බව පෙනී ගියේ නැත.

## සටහන III-5 අපේක්ෂිත ආදායම් හා වියදම්

| විස්තරය | ආදායම් | | | | | වියදම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පළමු වසර රු. | දෙවන වසර රු. | තුන්වන වසර රු. | හතරවන වසර රු. | මුළු ගණන රු. | පළමු වසර රු. | දෙවන වසර රු. | තුන්වන වසර රු. | හතරවන වසර රු. | මුළු ගණන රු. |
| බෝග පුනරුත්ථාපනය | 174,692 | 500,414 | 527,798 | - | 1,202,904 | 222,330 | 111,130 | - | - | 333,460 |
| නව බෝග | 8,800 | 52,650 | 125,720 | 276,435 | 463,605 | 26,825 | 99,360 | 155,595 | 188,345 | 470,125 |
| පශු පාලනය | 20,000 | 93,000 | 159,000 | 252,000 | 524,000 | 21,850 | 32,525 | 37,525 | 25,850 | 117,750 |
| එකතුව | 203,492 | 646,064 | 812,518 | 528,435 | 2,190,509 | 271,005 | 243,015 | 193,120 | 214,195 | 921,335 |

මූලාශ්‍රය: බැද්දේගම ගොවිපලේ වාර්තා

ගොවිපලේ කළමනාකරණය

බැද්දේගම උප දිසාපති, සමුපකාර පරීක්ෂක, තේ පාලන උපදේශක, කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, රබර් පාලක උපදේශක, පශු වෛද්‍ය නිලධාරි, ප්‍රදේශයේ ගම් සභා නියෝජිත සහ දිස්ත්‍රික් ඉඩම් නිලධාරි යන අයගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ මාස 2 1/2 ක් පමණ සිටි සමුපකාරයේ සාමාජිකයින් දෙදෙනා ඉල්ලා අස් වූ අතර, ඉන් එක් අයෙකු ගොවිපල අත්හැර ගියේය. පහළ මට්ටමෙහිදී සමුපකාර ගම්මානයෙහි එදිනෙදා කටයුතු කරගෙන යාම සඳහා ඉඩම් කට්ටි පරිපාලක වරයෙක් හා සංවර්ධන සහකරුවෙක් සිටියෝය.

1973 ඔක්තෝබර් මස 18 වන දිනදී සාමාජික කණ්ඩායම් සංවිධානය III-6 සටහනෙහි දැක්වේ.

කළමනාකරු විසින් සාමාජිකයින් අතුරින් පත් කරන ලද පරිපාලකවරු සාමාජිකයින් විසින් කරනු ලබන වැඩවල ප්‍රමාණය සහ තත්වය පරීක්ෂා කරනු ඇතැයි අපේක්ෂා කරන ලද්දේය. මෙම කාර්යය හැරුන විට වෙනත් විශේෂ කාර්යයක් ඔවුන් විසින් ඉටු කරනු ලැබීම අවශ්‍ය නොවීනි.

සටහන III-6 වැඩ කණ්ඩායම්

| අනු ක්‍රමික අංකය | කටයුත්ත | සාමාජික සංඛ්‍යාව | පරිපාලක සංඛ්‍යාව | කණ්ඩයේ සාමාජික ගණන |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| 1. | කුලිරු වැඩ | 21 | 1 | 22 |
| 2. | රබර් කැපීම | 12 | 3 | 15 |
| 3. | තේ දළු කැඩීම | 6 | 1 | 7 |
| 4. | තේ දළු කැඩීම | 8 | 1 | 9 |
| 5. | තේ දළුකැඩීම | 9 | 1 | 10 |
| 6. | රබර් සැකසීම | 3 | - | 3 |
| 7. | වැල් දොඩම් වැල් සැකසීම | 3 | - | 3 |
| 8. | කාර්යාලයීය වැඩ | 3 | - | 3 |
| 9. | වැවිලි අංශය | 2 | - | 2 |
| 10. | පෙවන ගස් කප්පාදු කිරීම | 1 | - | 1 |
| 11. | වල් කෙලීම | - | 1 | 1 |
| | එකතුව | 68 | 8 | 76 |

කාර්ය ක්‍රමය

මේ ගොවිපලෙහි 'කාර්ය' ක්‍රමයක් පැවතුනි. තේ දළු නෙලන්නන් විසින් දිනකට තේ දළු රාත්තල් 40 ක් නෙලිය යුතු වූ අතර රබර් කපන්නකු විසින් එක් ඉඩම් කට්ටියක් හෝ රබර් ගස් 200 ක දිනකට කිරි කැපිය යුතු විනි. පස සෝදා යාම වැළැක්වීම සඳහා පවතින කානු සැකසීමේදී දිනකට දම්වැල් 1 1/2 ක් සැකසිය යුතු වූ අතර කානු අළුතින් කැපීමේදී දිනකට දම්වැල් 1 ක් කැපිය යුතු වේ. මේ වැඩ ප්‍රමාණයන් ව්‍යාපාර කළමනාකරු විසින් නියම කරනු ලැබුයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මේ වැඩ ඉලක්ක තීරණය කිරීමේදී ව්‍යාපාර කළමනාකරු හා සාමාජිකයින් අතර අදහස් හුවමාරුවක් සිදු වූ බවක් පෙනෙන්නට නැත. මේ කාර්ය ක්‍රමය මාස 3 ක් පමණ අත්හදා බලා පසුව එය අතහැර දමා දිනකට පැය 8 ක් වැඩ කිරීමේ ක්‍රමය පටන් ගන්නා ලද්දේය. කාර්ය ක්‍රමය අතහැර දැමීමට එක් හේතුවක් වූයේ ඇතැම් සාමාජිකයින් උදේ 5 ට පමණ වැඩට පැමිණ උදේ 10.30 පමණ වනවිට වැඩ අවසන් කොට ආපසු යාමයි. පැය 8 ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව නිෂ්පාදන අඩු වූයෙන් කාර්ය ක්‍රමය නැවත යෙදවීමට සිදු විනි.

මේ කාර්ය ක්‍රමය කළමනාකරු සහ සාමාජිකයින් අතර ඇති සම්බන්ධතාවයේ අවදානම් සහිත තත්වයක් විනි. සාමාජිකයින් එය අදහස් කළේ පීඩාකාරී ක්‍රමයක් ලෙසිනි. දෛනික වැඩ ප්‍රමාණය නියම කිරීමට කළමනාකරුට බලතල තිබූ අතර මෙහිදී බොහෝවිට ඔහු සාමාජිකයින්ගේ අදහස් විමසුවේ නැත. තම පෞද්ගලික කාර්යයක නියුතු වීම සඳහා ඉක්මනින් නිවෙස් බලා යනු වස් සාමාජිකයෝ වෙහෙස මහන්සි වී වැඩ කර සිය දෛනික වැඩ ප්‍රමාණය නියමිත වේලාවට කලින් අවසන් කළහොත්, පසු දින වැඩ ප්‍රමාණය සෑහෙන අයුරින් වැඩි කරන ලදී. අසහනයට පත් ඇතැම් සාමාජිකයෝ මෙම නියමයන් පිළි ගැනීමට ප්‍රතික්ෂේප කළවිට ඔවුනට පවසන ලද්දේ අකමැති නම් ගොවිපල හැර යන ලෙසය.

විශ්ලේෂනය

ආර්ථික අංශය: අවුරුදු 4 තුළ අපේක්ෂිත ආදායම සහ වියදම III-5 සටහනෙහි දැක්වේ. මුළු වියදම රු. 9,21,325/- යයි බලාපොරොත්තු වූ අතර, අපේක්ෂිත ආදායම රුපියල් 2,190,509/- ක් වේ යයි ඇස්තමේන්තු කරන ලදී. මේ අනුව අතිරික්තය රුපියල් 1,269,174/- ක් වන අතර එය මුළු වියදමින් සියයට 140 ක ප්‍රතිලාභයකි. වර්ෂයකට ලබන සාමාන්‍ය ආදායම රු. 547,627/- ක් වන්නේ යැයි අපේක්ෂා කළෙන් සාමාන්‍ය වාර්ෂික වැය රු. 2,30,333/- ක් විය. එක් පුද්ගලයෙකුට ලැබෙන සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 2,738/- යයිද, සාමාන්‍ය වාර්ෂික වියදම රු. 1,151/- යැයිද ගණන් බලා තිබීන. (සාමාජික ගණන 200 කැයි සලකා) පශු පාලන ව්‍යාපාරයන් සඳහා වූ විය පැහැදම, අවුරුදු 4 ක කාලසීමාව සඳහා මුළු වියදමෙන් සියයට 12 කට අධික වීමට තිබී අතර එනයින් ලැබෙන ආදායම එම කාලසීමාව සඳහා වූ මුළු ආදායමෙන් සියයට 24 කට ආසන්න වන්නේයැයි අපේක්ෂා කෙරිනි.

## සටහන III-7 නියත ආදායම හා වියදම

### 1972 ජූලි – 1973 ඔක්තෝබර්

| ලැබීම් විස්තරය | ප්‍රමාණය රු. | වියදම විස්තරය | ප්‍රමාණය රු. |
|---|---|---|---|
| රජයේ දීමනාව | 70,000.00 | **ප්‍රාග්ධනය** | |
| | | කැලෑ හෙළි කිරීම | 23,587.50 |
| ණය මුදල් | 15,000.00 | ගුඩම් සැකසීම | 16,943.75 |
| විවිධ වත්කම් | 80,344.36 | උපකරණ | 12,715.76 |
| | | ගොඩනැගිලි | 1,338.90 |
| | | ගවයින් මිළදී ගැනීම | 3,000.00 |
| | | ජල සැපයුම | 862.75 |
| | | එකතුව | 58,448.66 |
| | | **පුනරාවර්තන** | |
| | | පැල සිටුවීම | 8,528.85 |
| | | පොහොර සහ කෘෂි-රසායනික ද්‍රව්‍ය | 12,033.93 |
| | | නිෂ්පාදන අංශය | 41,409.35 |
| | | කිරි පට්ටිය | 2,228.79 |
| | | වාහන නඩත්තුව | 372.30 |
| | | වල් නෙලීම | 3,584.50 |
| | | එකතුව | 68,157.72 |
| | | **පරිපාලනය** | |
| | | කාර්යාලයීය වැටුප් | 7,403.10 |
| | | ආරක්ෂක සේවා | 6,795.34 |
| | | තැපැල් | 917.72 |
| | | වාහන | 1,484.54 |
| | | යැපීම් දීමනා, අතිකාල දීමනා | 163.50 |
| | | වෙනත් වියදම් | 20,657.75 |
| | | එකතුව | 37,421.95 |
| මුළු එකතුව | 165,344.36 | මුළු එකතුව | 164,028.33 |

මූලාශ්‍රය: බැද්දේගම ගොවිපලේ වාර්තා

1972 ජූලි මාසයේ සිට 1973 ඔක්තෝබර් මාසය දක්වා නියත වශයෙන් කරන ලද වියදම් සහ ආදායම් පිළිබඳ විස්තර III-7 සටහනෙහි දැක්වේ. මේ කාලයේදී කරන ලද මුළු වියදම රු. 164,028/- ක් වූ අතර ලබා ගත් මුළු ආදායම රු. 165,344/- ක් වේ. මේ මාස 15 කාලය තුළදී සාමාජිකයින් 135 දෙනාගෙන් එක් පුද්ගලයෙකුට ලැබෙන සාමාන්‍ය ආදායම රු. 1,229/- ක් වූ අතර එක් පුද්ගලයෙක් සම්බන්ධයෙන් වූ සාමාන්‍ය වියදම රු. 1,220/- ක් විය. ප්‍රමාණාත්මක පදනමක් මත එක් අයෙක් සඳහා වූ වාර්ෂික වියදම රු. 975/- කි; වාර්ෂික ආදායම රු. 980/- කි.

රු. 164,026/- ක මුළු වියදමින් රු. 105,578/- ක් පුනරාවර්තන වියදම් වූ අතර රු. 58,448/- ක් ප්‍රාග්ධන වියදම් විය. (පුනරාවර්ථන 65%, ප්‍රාග්ධන 35%) මාස 15 ක කාළය තුළදී එක් පුද්ගලයෙකුට අදාළ වන සාමාන්‍ය ප්‍රාග්ධන වියදම් රු. 420/- ක් වූ අතර, පුනරාවර්තන වියදම රු. 780/- ක් විය. මේ දක්වා පුනරුත්ථාපනය කොට සංවර්ධනය කර තිබුණු මුළු අක්කර ප්‍රමාණය අක්කර 306 ක් වූයෙන් එම කාලය තුළ අක්කරයකට අදාළ වන සාමාන්‍ය ප්‍රාග්ධන වියදම රු. 535/- ක් වූ අතර, අක්කරයක ප්‍රාග්ධන වියදම රු. 190/- ක්ද, පුනරාවර්තන වියදම රු. 345/- ක්ද විණි.

අක්කරයකට අදාළ වන වාර්ෂික සාමාන්‍ය වියදම රු. 428/- ක් වූ අතර ඉන් රු. 152/- ක් ප්‍රාග්ධන වියදම් සඳහාද අනෙක් රු. 276/- පුනරාවර්තන වියදම් සඳහාද වැය විය. මේ අනුව ඉඩම් පුනරුත්ථාපනය හා සංවර්ධනය සඳහා ගිය වියදම එතරම් අධික නොවන බව පෙනේ.

කළමනාකරණ අංශය

1973 ජූනි මාසය වන තුරුම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින්ගේ නියෝජිතයින් ඇතුළත් විය යුතු යයි අධ්‍යක්ෂ මණ්ඩලය කල්පනා කොට නොතිබිණි. 1973 ජූලි මාසයේදී සාමාජිකයින් දෙදෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරා පත් කර ගන්නා ලදී. නමුත් මෙම සාමාජික නියෝජිතයින්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටිය හැකි වූයේ මාස 2 1/2 ක පුළු කාලයක් සඳහා පමණකි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි රජයේ නිලධාරීන් තීරණවලට එළඹීමේ කාර්යයෙහිදී සාමාජිකයින් යොදා ගැනීමට එතරම් උනන්දුවක් නොදැක්වූ බව මෙයින් පෙනේ. වගකීම් භාරය පිළි ගැනීමට සහ කළමනාකරණ කාර්යයෙහි සහභාගී වීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමුපකාරිකයින් පුහුණු කරනු ඇතැයි, කෘෂිකර්ම අමාත්‍යාංශය අදහස් කළද අවාසනාවකට මෙන් ඒවායේ පාලනයේ සිටින ඇතැම් නිලධාරීහු මේ කාර්යය ගැන උනන්දුවක් නොදැක්වූහ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මේ ආකල්පය කළමනාකාරිත්වයේ පහත්ම මට්ටමටද කා වැදී ගියේය. ගොවිපල සම්බන්ධයෙන් වැදගත් තීරණ ගැනීමේදී සාමාජිකයින් සම්බන්ධ කරවා ගැනීම අනවශ්‍ය එමෙන්ම අවහිර ඇති කරවන ක්‍රියා මාර්ගයක් ලෙස ව්‍යාපාර කළමනාකරුවන් විසින් සළකන ලදී. මේ ගොවිපලවල්ද දියුණු කළ යුත්තේ හා පාලනය කළ යුත්තේ අනෙකුත් පෞද්ගලික වතු පාලනය කරන ආකාරයෙන්ම යයි මොවුහු සිතූහ. ගොවිපල කළමනාකරුවන්ගේ කාර්ය භාරය

පැහැදිලි කරමින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ගැන මොවුහු නොදැන සිටියහ. ගොවිපල පාලනය සම්බන්ධයෙන් කිසියම් පුහුණුකිරීමක් හෝ මග පෙන්වීමක් මොවුන්ට ලබා දී නොතිබුණු අතර, මේ ව්‍යාපාරයන්හි අරමුණු පිළිබඳව ඔවුන්ට පැහැදිලි අවබෝධයක් නො තිබුණි. ව්‍යාපාර කළමනාකරුවන්ගේ මූලික අභිලාශය වූයේ සාමාජිකයින් තුළින් දැඩි විරෝධතාවයක් උද්ගත නොවන්නට වග බලා ගනිමින් ඔවුන් ලවා හැකිතාක් වැඩ කරවා ගැනීම, ගොවිපලේ භෞතිකමය සම්පත් සංවර්ධනය කිරීම හා වැදගත් සේවයක් ඉටු කළායැයි හොඳ නමක් ලබා ගැනීමය. මේ ආකල්පය නිසා සාමාජිකයින් කෙරෙහි විශේෂයෙන්ම ඒ නිසා සාමූහික උනන්දුව අඩු වීමට ඇති ඉඩ කඩ ගැන කළමනාකරුවෝ සැලකිලිමත් වූයේ නැත. එසේම ගොවිපලේ සිටින වඩාත් තරුණ සාමාජිකයින් ගැන විශේෂ අවධානයක් කළමනාකරුවෝ නොදැක්වූහ.

## සමාජයීය අංශය

ගොවිපල සංවර්ධනයේදී සාමාජික සහභාගිත්වය ඉතාමත් දුර්වල තත්වයක පැවතියේය. ආරම්භක අවධියේදී සාමාජිකයින් සමූපකාර ගොවිපලක අරමුණු පිළිබඳව කිසියම් කැප වීමකින් යුක්තව සිටි බව කියනු ලැබේ. ඔවුන් තමන්ගේම උපකරණ ගෙනැවිත් වෙහෙස මහන්සි වී වැඩ කළහ. මෙසේ ආරම්භක අවධියේදී ඔවුන් ඉතා උනන්දුවෙන් සහ සාමූහිකව වැඩ කළ නිසා ඔවුන්ගේ නිෂ්පාදන ඉලක්කයන් ඉක්මවා යාමට ඔවුන්ට හැකි විය. මෙපරිද්දෙන් වැඩ කළ අතීතය කෙරෙහි තෘප්තිමත් හැඟීමකින් ආපසු බලන සාමාජිකයෝ වර්තමානයේ පවතින තත්වය ගැන කනස්සලු වෙති. සමාජයීය බැඳීයාවන් නොමැතිවීම හා උදාසීන බවට හේතුව ලෙස ඔවුන් කළමනාකාරිත්වයේ අදූරදර්ශී ආකල්පය හුවා දක්වයි. ගොවිපලෙහි පාලනය මීට වඩා හොඳ වූයේ නම්, ගොවිපල මීට වඩා දියුණු වීමට ඉඩ තිබුන බව සාමාන්‍ය සාමාජිකයාගේ මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින සාමාජිකයෝද පැවසූහ.

උපදෙස් දීමේදීත්, වැඩ ප්‍රමාණ නියම කිරීමේදීත් ඇතැම් පහසුකම් ලබා ගැනීම සඳහා සාමාජිකයින් විසින් කරන ලද ඉල්ලීම් ගැන සලකා බැලීමේදීත් පෙනෙන පරිදි ව්‍යාපාර කළමනාකරුවෝ ආධිපත්‍ය ස්වරූපයකින් කටයුතු කිරීමට නැඹුරු වී ඇත. සමූපකාරයෙහි කටයුතුවලට සහභාගීව සිය කටයුතු සැළසුම් කර පාලනය කර ගැනීමට අවස්ථාව ඇති පිරිසක් ලෙස සාමාජිකයින් පිළිබඳව නොසලකා ඔවුනට සෑහෙන වැටුපක් නොදී වහලුන්ගෙන් මෙන් ඔවුන්ගෙන් වැඩ ගත් 'සූරාකන්නන්' ලෙස සාමාජිකයින් විසින් කළමනාකරුවන් සළකන ලදී.

සාමාජිකයින් 40 කට 50 කට පමණ පදිංචි වී සිටිය හැකිව තිබි, ගොවිපලේ වූ ඉඩ පහසුකම් ඇති නිවාස කළමනාකරු විසින් පරිහරණය කරන ලදී. සාමාජිකයින්ගේ හැඟීම වූයේ, රජයේ වැටුප් ලබන කළමනාකරුට සිය රාජකාරිවලට හානි සිදු නොවන පරිදි ගොවිපලෙන් පිට පදිංචිව සිටිය හැකි බවය. සාමාජිකයින්ට මේ නිවාසය ලබා දුන්නා නම් ජනාවාසයක මූලාරම්භය එමගින් ඇති වන්නට ඉඩ තිබුණි.

ගොවිපලට අයිති ඇතැම් දේවල් ගොවිපලේ සාමාජිකයින් විසින් සොරා ගත් අවස්ථා තිබුණේය. සාමාජිකයින්ගේ සාමාන්‍ය ආකල්පයෙන් පෙනී ගියේ, සාමූහික සංකල්පයෙහි අර්ථය හෝ

සටහන III-8 සංවර්ධන සැළැස්ම

| | පළමු වසර අක්කර | දෙවන වසර අක්කර | තුන්වන වසර අක්කර | හතරවන වසර අක්කර | පස්වන වසර |
|---|---|---|---|---|---|
| **පුනරුත්ථාපනය** | | | | | |
| තේ .. .. | 94 | – | – | – | |
| රබර් .. .. | 42 | – | – | – | |
| පොල් .. .. | 10 | – | – | – | |
| වී .. .. | 50 | – | – | – | |
| **නව බෝග** | | | | | |
| තේ .. .. | – | 10 | 15 | 25 | |
| ගෝතමාලා වර්ගයේ තණ | 5 | 10 | 15 | 15 | |
| තැඹිලි .. .. | – | 10 | 10 | 10 | |
| පොල් .. .. | – | 5 | 15 | 15 | |
| ගම්මිරිස් .. | – | 2 | 3 | 3 | |
| වැලි දොඩම් .. | 5 | 10 | 10 | 10 | |
| කෝපි .. .. | – | 1 | 2 | 2 | |
| කෙසෙල් .. | – | 5 | 5 | 5 | |
| උක් .. .. | 5 | 10 | 10 | 10 | |
| අන්නාසි .. .. | – | 1 | 2 | 2 | |
| එළවළු .. .. | 5 | 10 | 10 | 10 | |
| මල් .. .. | – | – | 1 | 1 | |
| වැලි දොඩම් .. | 5 | 10 | 10 | 10 | |
| දියුණු කරන ලද තණ | 6 | 1 | 2 | – | |
| තණ (ගවයින්ගේ ආහාරය සඳහා) .. | 10 | 2 | 3 | – | |
| මුළු ගණන | 237 | 87 | 113 | 118 | |
| **පශු පාලනය** | | | | | |
| කුකුලන් .. .. | 4,000 | 1,000 | 1,500 | – | |
| කිරිපට්ටි පාලනය (සතුන් ගණන) .. | – | – | 5 | – | 30 |

මූලාශ්‍රය: බැද්දේගම සමූපකාර ගොවිපලේ වාර්තා

එහි ප්‍රතිවිපාක පිළිබඳ නිසි අවබෝධයක් ඔවුනට නොතිබූ බවය. මේ පිළිබඳව කළමනාකාරිත්වය මෙන්ම සාමාජිකයින්ද වගකිව යුතු වේ.

### 3.3.3 මීපිලිමාන සමුපකාර ගම්මානය

නුවරඑළිය ආදායම් පාලක කොට්ඨාශය තුළ පිහිටි මීපිලිමාන සමුපකාර ගම්මානය ආරම්භ කරන ලද්දේ 1973 සැප්තැම්බර් මාසයේදීය. අධ්‍යයනය කරන විට මාස 10 ක් පමණ ගොවිපල ක්‍රියාත්මක වෙමින් තිබුනි. ආරම්භයේදී ගොවිපලට අයත් වූයේ අක්කර 83 ක් පමණක් වුවද, අක්කර 170 ක් සංවර්ධනය කිරීමට සැළසුම් කොට තිබුනි. මේ ඉඩම් මීට කලින් කැලෑ දෙපාර්තමේන්තුව සතු කැලෑ ඉඩමක් විය.

ආරම්භක සැළැස්ම අනුව 50 දෙනෙකුට සේවා අවස්ථා ලැබෙන පරිදි කිරිපට්ටියක් හා තණ බිමක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ නමුත් මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ නිසා අතිරේක වැඩ පිළිවෙලක් සකස් කොට ඉන් කොටසක් ක්‍රියාත්මක කරන ලදී. 1973 පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ මාස 10 තුළ අක්කර 25 ක් පමණ හෙළි කොට අක්කර 10 ක තණ භූමියක් ඇති කොට තිබුණ අතර, අක්කර 8 ක අවුරුද්දට කන්න දෙකක් අර්තාපල් වගා කොට තිබුනේය. සම්පූර්ණ සාමාජිකත්වය 50 ක් වුවද උද්යෝගිමත් සාමාජිකයෝ 30 දෙනෙක් ගොවිපලේ සිටියහ. පසු කාලයේදී සාමාජිකයින් අළුතින් බඳවා ගැනීම නිසා මුළු සාමාජිකත්වය 100 දක්වා වැඩි වූ අතර ඔවුන්ගෙන් 60 - 70 දක්වා ප්‍රමාණයක් ගොවිපල අතහැර ගියහ.

විශේෂ සමුපකාර සමිතියක් පිහිටුවන ලද අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, සංවර්ධන නිලධාරියකු සහ සමුපකාර සාමාජිකයින්ගේ නියෝජිතයින් 7 දෙනෙක්ගෙන් සමන්විත විය. සංවර්ධන නිලධාරියා ව්‍යාපාර කළමනාකරු වශයෙන් කටයුතු කළේ ඉඩම් කච්චේරි පරිපාලකවරයෙකුගේ සහාය ඇතිවය.

1973 දෙසැම්බර් මාසයේදී මේ අධ්‍යයනය කරන විට ගොවිපලේ සාමාජිකයින් 30 දෙනෙක් පමණ කැළය හෙළි කිරීමේත්, කිරිපට්ටිය සඳහා තණ වගා කිරීමේත්, යෙදී සිටියහ. කිරිපට්ටිය සඳහා ගොඩනැගිලි සෑදීමටත්, කැලය හෙළි පෙහෙළි කිරීමටත් අක්කර 35 ක පමණ තණකොළ වගා කිරීමටත් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු යොදවා තිබුනි. අක්කරයක් හෙළි කොට එහි තණකොළ වගා කිරීම සඳහා රු. 300/- ක දීමනාවක් සාමාජිකයින්ටද ලැබුනේය.

අක්කර 50 ක් වගා කිරීම තුළින් එක් කන්නයකට රු. 73,750/- ක ආදායමක් ලැබේ යයි බලාපොරොත්තු වන ලදී. ප්‍රාග්ධන වියදමද ඇතුළුව මුළු වියදම රු. 86,130/- ක් විනි. පළමුවෙනි මාස 10 දී ප්‍රධාන සැළැස්ම හා පරිපූරක සැළැස්මෙන් කොටසක් ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්නයක් දරන ලදී.

**සංවර්ධන සැළසුම් සහ ලබා ඇති ප්‍රගතිය**

සංවර්ධන සැළැස්ම අනුව ගවයින් 300 කගෙන් යුත් කිරි පට්ටියක් සාමාජිකයින් 50 [illegible] විසින් පවත්වාගෙන යාම අපේක්ෂා කෙරිණි. (සටහන III-9) අවසානයේදී එක් එක් සාමාජිකයෙක් හට දෙනුන් 4 දෙනා බැගින්ද (කිරි ලබා ගන්නා දෙනුන් 3 දෙනෙක්) නැම්බියන් 2 දෙනා බැගින්ද නඩත්තු කිරීමට නියමිතව තිබිණි. දෙනුන් 200 කගෙන් අඩුම වශයෙන් 150 ක්වත් දිනකට කිරි පයින්ට් 15 බැගින් දිනපතා සාමාන්‍යයෙන් කිරි පයින්ට් 1800 ක් ලබා ගැනීමට අපේක්ෂා කරන ලදී. එක් අක්කරයක දෙනුන් 2 නෙකුට තණ සැපයිය හැකි වන අයුරු අක්කර 140 ක 'කිකොයු' වර්ගය තණ වැවීමට සැළසුම් කරනු ලැබිණි. එක් අයෙකුට අක්කර 1/4 බැගින් තරුණයින් 50 දෙනාට සිය ගෙවතු සඳහා අක්කර 12 1/2 ක් වෙන් කරන ලදී. පොදු ගොඩනැගිලි, පාරවල් ආදියත් සමඟ ගොවිපලෙහි සම්පූර්ණ ප්‍රමාණය අක්කර 170 ක් විනි.

දෙනුන්ට තණ කැවීම, කිරි දෙවීම හා දෙනුන් ඇති කිරීම, කාරකයින් විසින් පොදු වැඩ පිළිවෙලක් අනුව කළ යුතු වූවේය. පොහොර ආදිය යොදා පෞද්ගලිකව නඩත්තු කර ගැනීම සඳහා එක් එක් සාමාජිකයෙක් හට තණ බිම් අක්කර 2 බැගින් දීමට සැළසුම් කරන ලදී. දෙනුන් 2 දෙනෙක් සහ නැම්බියක් මිළදී ගැනීම සඳහා සමිතියෙන් ණය මුදලක් ලැබේ. මෙසේ ලබා ගත් ගවයින් ගොවිපලෙහි තබා ගැනීමට සාමාජිකයින්ට පිළිවන.

තණ අක්කර 140 ක් දියුණු කිරීම අදියර දෙකකදී සම්පූර්ණ කිරීමටත් ඉලක්ක ආදායම දෙවෙනි අදියර අවසානයේදී ලබා ගැනීමටත් බලාපොරොත්තු විය. පළමුවැනි සංවර්ධන අදියරේ අයවැය ලේඛනය සාමාජිකයින් 20 දෙනෙකු සඳහා පිළියෙල කරන ලදී. ඇස්තමේන්තු කරන ලද පරිදි පුද්ගලයෙකුට ලැබෙන සාමාන්‍ය වාර්ෂික ලාබය රු. 1,422/- ක් විනි. ගව ආහාර, තණ වගා නඩත්තු, සියයට 8 බැගින් ප්‍රාග්ධනය සඳහා පොලිය සහ වැටුප් සඳහා යන වියදම්වලට ඉඩ හැර මෙම ගණනය කරන ලදී.

1973 පෙබරවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළදී වැඩපිළිවෙල අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවීය. කැලෑ අක්කර 25 ක් හෙළි කර අක්කර 10 ක පමණ තණ වගා කරන ලදී. ගව මඩුව සෑදීම සඳහා පුද්ගලික කොන්ත්‍රාත්කරුවකු යොදා කටයුතු පිළියෙල කිරීම සඳහා රු. 48,750/- ක් වැය වූවේය. අක්කරයකට රු. 300/- බැගින් වැය කර අක්කර 30 - 35 දක්වා ප්‍රමාණයක් තණ වගාව යටතට පත් කිරීම සඳහා තවත් කොන්ත්‍රාත් කරුවෙකු යොදවා ගන්නා ලදී. 1974 ජනවාරි 1 වන දින වන විට තණ අක්කර 50 ක් නගා සිටුවීමට සැළසුම් කරන ලද නමුදු දියුණු කිරීමට හැකි වූයේ අක්කර 10 ක් පමණකි. අක්කර 100 ක් නගා සිටුවීම සඳහා යන වියදම රු. 281,000/- ක් යයි ගණන් බලන ලදී. මෙයට ගව පට්ටියට යන වියදම සහ යටිතල පහසුකම් සඳහා වූ වියදමද ඇතුළත් වේ. (සටහන III-9 බලන්න) ඇස්තමේන්තු කරන ලද මුළු වියදමින් 39% කටත් වඩා ගවයින් මිළදී ගැනීම සඳහා වැය කළයුතු විය. සැළසුම් කරන ලද ප්‍රාග්ධන වියදම පුද්ගලයෙකුට රු. 5,600/- ක් වූ අතර අක්කරයකට රු. 2,810/- ක් විය.

## සටහන III–9 කිරිපට්ටියක් පිහිටුවීම සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම

| විස්තරය | ප්‍රමාණය රු. |
|---|---|
| අක්කර 100 ක් නගා සිටුවීම – කැලෑ හෙළි කිරීම හා වැට බැඳීම .. .. .. | 31,000.00 |
| ගවයින් 100 කට ගාල, නැම්බියන් 50 කට මඩුව හා ආහාර ගබඩාව .. .. .. | 95,000.00 |
| දිය සැපයීම සඳහා .. .. .. | 12,000.00 |
| විදුලිබලය .. .. .. | 18,000.00 |
| මාර්ග .. .. .. | 5,000.00 |
| ගවයින් 100ක් හා දෑවුරුදු නැම්බියන් 50 .. .. | 110,000.00 |
| උපකරණ .. .. .. | 10,000.00 |
| එකතුව | 281,000.00 |

### කිරි පට්ටිය (සැළසුම් කරන ලද)

| විස්තරය | කට්ටි කරුවාට වැටෙන ගණන | මුළු පට්ටිය |
|---|---|---|
| කිරි දරණ ගවයින් .. | 3 | 150 |
| සාමාන්‍ය ගවයින් .. | 1 | 50 |
| නැම්බියන් (අවු. 2 – 3 වයසැති) | 1 | 25 |
| නැම්බියන් (අවු. 1 – 2 වයසැති) | – | 25 |
| නැම්බියන් (අවු 1 ට අඩු) | 1 | 50 |
| එකතුව | 6 | 300 |

මූලාශ්‍රය: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලිපි ගොනු.

හොඳ ගව පට්ටියක් ලබා ගැනීමට නොහැකි වූ නිසා වසරකට තෙවරක් අක්කර 50 ක් වගා කිරීමට අතිරේක වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. (සටහන III–10) එක සාමාජිකයෙකුට එක කන්නයකට ලැබෙන සාමාන්‍ය ආදායම රු. 1,475/– ක් ලෙස ගණන් බලන ලදින් මේ අනුව පුද්ගලයෙකුට ලැබෙන දළ වාර්ෂික ආදායම රු. 4,425/– ක්ද මාසික ආදායම රුපියල් 370/– ක්ද වන්නේය. ප්‍රාග්ධන වියදම රු. 51,500/– ක්ද පුනරාවර්තන වියදම රුපියල් 34,630/– ක්ද (40%) වන්නේ යැයි අපේක්ෂා කරන ලදී. (සටහන III–10) භාණ්ඩ අලෙවිය මගින් රු. 73,750/– ක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ අතර, පුනරාවර්තන වියදම් පියවීමෙන් පසු මෙය රු. 39,120/– ක අතිරික්තයක් පෙන්නුම් කරයි. මෙනයින් ප්‍රතිෂ්ඨාපන කාල පරිච්ඡේදය අවුරුදු 1.3 ක් වනු ඇත.

## වර්තමාන තත්වය

සමාජයීය තත්වය: සාමාජිකයෝ අවුරුදු 18 – 20 අතර තරුණයෝ වූහ. නේවාසික සහ අනිකුත් පහසුකම්වල හිඟකම නිසා ඔව්හු ගොවිපලෙහි පදිංචි නොවූහ. ඔවුන්ගේ නිවෙස්වල සිට සැතපුම් 1/2 සිට 8 දක්වා දුරක් දිනපතා යාම් ඒම් කිරීමටත්, මුදලින් ආධාර ලබා ගත් තම දෙමව්පියන් සමඟ ජීවත් වීමටත් ඔව්හු වඩා කැමති වූහ.

තරුණ කීපයක්, විශේෂයෙන් භෞතිකමය හා ආර්ථිකමය සාධක ගොවිපලේ ජනාවාසයක් වර්ධනය වීම සඳහා හිතකර නොවීය. කළමනාකරුවන් ලෙස කටයුතු කළ රජයේ නිලධාරීන් තරමක් ආධිපත්‍ය ස්වභාවයේ පුද්ගලයින් වූ බවට සාමාන්‍ය හැඟීමක් විය.

ගොවිපලෙහි කළමනාකාරිත්වය: දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරි සහ සමූපකාරයෙහි නියෝජිතයින් 7 දෙනෙකුගෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලයක් නිර්මාණය කර තිබිණි. මෙනයින් ගොවිපල පිළිබඳ වගකීම විශේෂ සමූපකාර සමිතියකට පැවරුණි. ගොවිපලේ සංවර්ධන සැළසුම ක්‍රියාත්මක කිරීමේ ලා ඉඩම් කට්ටි පරිපාලක වරයෙක් සම්බන්ධ කර ගන්නා ලදී. මෙහි ව්‍යාපාර කළමනාකරු සංවර්ධන නිලධාරියා වීය. මෙම ව්‍යාපාර කළමනාකරු නුවරඑළිය කච්චේරියේ කටයුතු කළ අතර සතියකට කීප වරක් ගොවිපලට පැමිණියේය. 1973 පෙබරවාරියේදී පුද්ගලයින් 50 දෙනෙකුත් 1973 ජූනි මස පුද්ගලයින් 25 දෙනෙකුත් 1973 අගෝස්තු මාසයේදීත් සාමාජිකයින් බඳවාගෙන තිබුණි. ගොවිපලට බඳවා ගත් පුද්ගලයින් 100 දෙනෙකු අතුරින් සාමාජිකයෝ 25 – 30 ක් පමණ ගොවිපලෙහි කටයුතු කරගෙන ගියහ. මාස දහයක් පමණ වූ කෙටි කාලයක් තුළ ගොවිපල අත්හැර යන්නවුන්ගේ අනුපාතය සියයට 70 – 75 අතර වීම සැළකිල්ලට ගත යුතු කරුණක් විය. පරිපාලක තැනගේ අඥාදායී ආකල්පය සාමාජිකයින් විසින් හෙළා දකින ලදී.

දවසක වැඩ සඳහා සාමාජිකයින් හට රු. 3/– ක දීමනාවක් ගෙවන ලද අතර කොටස් ප්‍රාග්ධනය සඳහා මෙම දීමනාවෙන් දිනකට ශත –/50 ක් අඩු කරන ලදී. ලෝක ආහාර වැඩ පිළිවෙල යටතේ සාමාජිකයින් සඳහා ආහාරපාන සපයන ලදී. කාර්ය පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත ගෙවීමේ ක්‍රමයක් අරඹා, 1973 ඔක්තෝබර් මස අවසානය වනවිට දෛනික වැටුප් ක්‍රමය ඉවත් කරන ලදී. ඉඩම් අක්කරයක කැලෑ හෙළි පෙහෙළි කර තණ වැවීම සඳහා ගෙවීම රු. 300/– ක් වීය. 1974 ජනවාරි අවසාන භාගය වනවිට අක්කර 12 ක් පමණ හෙළි පෙහෙළි කොට තිබුණි.

අක්කර 8 ක අර්තාපල් වගා කරන ලද අතර එක් එක් සාමාජිකයාට අක්කර 1/4 ක බිම් කැබැල්ලක් වගා කන්නයේදී ඒ පිළිබඳ වගකීමද ඇතුළත්ව වෙන් කර දෙන ලදී. ශුද්ධ ලාභය සාමාජිකයින්ගේ පැමිණීමට සමානුපාතික වශයෙන් ඔවුන් අතර බෙදා දිය යුතු වූයේය. දෙවන බෝගයෙන් (අස්වැන්නෙන්) සෑහෙන කොටසක් ඇතැම් සාමාජිකයින් විසින් සොරකම් කරන ලදැයි පැවසිණි.

## සටහන III-10 ඇස්තමේන්තුගත වියදම සහ ආදායම කෘෂිකාර්මික වැඩ සටහන (අක්කර 50)

| ආදායම | | වියදම | |
|---|---|---|---|
| විස්තරය | ප්‍රමාණය රුපි. | විස්තරය | ප්‍රමාණය රුපි. |
| අර්තාපල් | 25,000 | **ප්‍රාග්ධන** | |
| | | වැට බැඳීම | 7,500 |
| කැරට් | 18,750 | බිම් සැකසීම | 27,500 |
| | | ගොඩනැගිලි | 10,000 |
| ගෝවා | 25,000 | ඉසින යන්ත්‍ර 10 ක් | 3,500 |
| | | උදලු සහ වතුර දමන භාජන | 1,500 |
| රාබු | 5,000 | පුල්ලිය | 1,500 |
| | | **පුනරාවර්තන** | |
| | | පොහොර | |
| | | හුණු හොණ්ඩර 250 | 2,000 |
| | | විශේෂ අර්තාපල් හො. 100 | 3,800 |
| | | එළවළු හො. 100 | 9,200 |
| | | **බීජ වර්ග** | |
| | | බීජ අර්තාපල් හො. 208 | 15,680 |
| | | ගෝවා | 750 |
| | | කැරට් | 1,050 |
| | | රාබු | 400 |
| | | **කෘෂි-රසායන** | |
| | | අර්තාපල් | 750 |
| | | රාබු | 150 |
| | | කැරට් | 250 |
| | | ගෝවා | 600 |
| මුළු ගණන | 73,750 | මුළු ගණන | 86,130 |

මූලාශ්‍රය: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලිපි ගොනු

## සටහන III-11 වාර්ෂික ආදායම සහ වියදම - 1973 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා

| ලැබීම් | ප්‍රමාණය රු. | වියදම් | ප්‍රමාණය රු. |
|---|---|---|---|
| රජයේ දීමනාව | 36,506.00 | ගොඩනැගිලි | 16,626.38 |
| ආදායම (අර්තාපල් වගාව) | 36,396.00 | වගාව | 38,078.10 |
| කොටස් | 168.00 | උපකරණ | 2,198.81 |
| තැන්පතු | 937.00 | ශ්‍රමය | 26,135.50 |
| ආදායම (අර්තාපල් | | සමුපකාර සමිතියට අදාළ) | 149.45 |
| වගාව) | 16,543.87 | ගමන් වියදම් ආදිය ) | 72.50 |
| මුළු ගණන | 90,550.87 | මුළු ගණන | 83,260.74 |

මූලාශ්‍රය: කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලිපි ගොනු.

විශ්ලේෂණය

ශිල්පීය අංශය: අක්කර 140 ක තණ බිමක්ද සහිතව කිරි පට්ටියක් සංවර්ධනය කිරීම සඳහා මූලිකව කරන ලද සැළැස්ම ශිල්පීය වශයෙන් යෝග්‍ය වූවේය. කෙසේ වුවද, මූලික සැළැස්ම හෝ දෙවනු කෘෂිකාර්මික වැඩ සටහන හෝ වැඩදායක ලෙස ක්‍රියාත්මක නොකිරීමෙන් පෙනී යනුයේ සැළසුම් කිරීමෙන් පමණකින් ප්‍රතිපල පිළිබඳව සහතික විය නොහැකි බවයි. අවශ්‍ය වනවිට මූලික සැළැස්ම වෙනස් කිරීම හෝ දුර්වල තැන්වලට පිළියම් යෙදීම හෝ අරමුණු කරගෙන ප්‍රගතිය පිළිබඳ වාරික සමාලෝචනයක් කිරීම අත්‍යවශ්‍ය වන්නේය.

ආර්ථිකමය කරුණු

1973 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා ගොවිපලේ ලැබීම් සහ වියදම් III-11 සටහනේ දක්වනු ලැබේ. මෙම ගිණුම් වලින් පෙන්වනුයේ සම්පූර්ණ ලැබීම් රු. 90,550/- ක් සහ මුළු වියදම රු. 83,260/- ක් බවයි. සාමාන්‍ය මාසික වියදම රු. 8,300/- ක් පමණ විය. ගොවිපලේ ක්‍රියාකාරී සාමාජික සහභාගිත්වය 40 ක් ලෙස සැලකුවහොත් මෙම කාලය පුරා එක් සාමාජිකයෙක් සඳහා වූ වියදම රු. 2,080/- ක් විය. රු. 83,260/- ක වියදම අතුරින් රජයේ මුළු දීමනාව (රු. 36,506/-) ප්‍රාග්ධන කාර්යයන් සඳහා පමණක් පොදු බව උපකල්පනය කෙරේ නම් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ ප්‍රතිශතය පිළිවෙලින් මුළු වියදමින් 44 ක් සහ 56 ක් වෙයි. ගොවිපලේ මුළු ප්‍රදේශය අක්කර 83 ක් වනවිට එක් අක්කරයක සාමාන්‍ය වියදම රු. 1,000/- ක්ද, එක් අක්කරයක් සඳහා සාමාන්‍ය ප්‍රාග්ධන වියදම රු. 440/- ක්ද විය. කෙසේ වුවද ක්ෂේත්‍ර අධ්‍යයනය කළ කාලය වනවිට තණ වගා

කොට තිබුණේ අක්කර 10 ක පමණි. අක්කර 8 ක දෙවරක් අර්තාපල් වගා කොට තිබීම සහ තණ බීජ සඳහා අක්කර 15 ක් හෙළි පෙහෙළි කිරීම නිසා සංවර්ධනය කළ හෝ වැව කළ මුළු ප්‍රදේශය අක්කර 33 ක් වූවේය. ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වෙන් කල මුදල රු. 36,506/- ක් වූ බැවින් එක් අක්කරයක සාමාන්‍ය ප්‍රාග්ධන ආයෝජනය රු. 1,100/- (31%) වූ අතර එක් අක්කරයක සාමාන්‍ය ප්‍රවර්තන වියදම රු. 2,500/- ක් වූයේය.

මුළු ලැබීම් වන රු. 90,550/- ක් අතුරින් රජයේ දීමනාව රු. 36,506/- ක් (40%) වූ අතර රු. 54,044 /- ක ඉතිරිය අර්තාපල් අස්වනු දෙකකින් ලැබූ ආදායම වේ. මෙය ගොවිපලේ කෘෂිකාර්මික කටයුතු වලින් 1973 දෙසැම්බර් දක්වා ලබා ගත් එකම ආදායම විය. සාමාජිකත්වය 40 ක් ලෙස සළකන විට, එක් සාමාජිකයකුගේ සාමාන්‍ය ආදායම රු. 1,350/- ක් වේ. එම කාලය තුළම එක් සාමාජිකයෙක් සඳහා සාමාන්‍ය වියදම රු. 2,080/- ක් වූ අතර (මුළු ක්‍රියාකාරී සාමාජිකත්වය 40) එක් සාමාජිකයකු ලැබූ සාමාන්‍ය ආදායම රු. 1,350/- ක් වූයේය. මෙය වියදමෙන් 65% ක් පියවීමකි. ගොවිපලේ මුළු වියදමට ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වියදම් කළ මුදල්ද ඇතුළත් වන හෙයින් මෙම මුදල් ප්‍රමාණය කෙටි කලක් තුළ සම්පූර්ණයෙන් පියවා ගැනීමට අපේක්ෂා කිරීම යථාර්ථවාදී නොවේ. මාස 10 ක කාලයක් තිස්සේ පුනරාවර්තන වියදම රු. 46,754/- ක් වූ අතර, සාමාන්‍යය එක් සාමාජිකයෙකුට රු. 1,170/- ක් වේ. අර්තාපල් විකිණීමෙන් එක් සාමාජිකයකු ලැබූ සාමාන්‍ය ආදායම රු. 1,350/- ක් වූ නිසා එය එක් සාමාජිකයෙකුගේ සාමාන්‍ය ප්‍රවර්තන වියදම රු. 180/- කින් ඉක්මවීමකි.

එක් සාමාජිකයෙක් සඳහා ප්‍රාග්ධන වියදම රු. 912/- ක් සහ මුළු ප්‍රාග්ධන වියදම රු. 36,506/- ක් වූ බව සිතා ගතහොත් එක් සාමාජිකයෙකුට රු. 180/- ක් බැගින් සාමාජිකයින් 40 දෙනාගේ අතිරික්තය නිසා ප්‍රාග්ධන වියදම අවුරුදු 5 ක කාලයකදී ආපසු ගෙවීමට හැකි විය යුතුය.

කළමනාකරණ අංශය

ගොවිපලේ කළමනාකාරිත්වයේ කාර්යක්ෂමතාවය පිළිබඳව නිරීක්ෂණ කිහිපයක් දැක්විය හැකිය.

I. ප්‍රථම වර්ෂයේ ක්‍රියාකාරිත්වය අපේක්ෂිත ඉලක්කයෙන් පහළ තත්වයක විය;

II. ආරම්භක සැළැස්ම අතපසු වූ පසු කාලානුරූපව සකස් කරන ලද අතිරේක කෘෂිකාර්මික සැළැස්මද ප්‍රගතියක් දක්වා නැත.

III. සේවා අවස්ථා සැපයුම, අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 50 සිට සියයට 60 දක්වා වූ අතර එයද අරමුණු කළ ඉපැයුම් මට්ටමේ නොවීය.

IV. මාස දහයක කාලසීමාව තිස්සේ ගොවිපල අත්හැර යන්නන්ගේ අනුපාතිකය සියයට 70 ක් පමණ ඉහළ ගොස් තිබුණි.

V. නිවාස සඳහා විශාල ආයෝජනයක් සහ ලෝක ආහාර ආධාර සඳහා විධි විධාන සලසා තිබුණ නමුදු ගොවිපලෙහි අර්ථවත් ජනාවාසයක් වර්ධනය වී තිබුණේ නැත.

VI. ව්‍යාපාරය පාලනය කරමින් සිටි නිලධාරීන් තරමක දරදඬු පාලනයක් ගෙන ගියේ යැයි හැඟීමක් පැවතිණි.

සමාජයීය අංශය

ශක්තිමත් ආර්ථික සහ සමාජයීය පරමාර්ථයන්ගෙන් හෙබි ඒකාබද්ධ වූ ජනාවාසිකයින් සමූහයක් මෙහි ඇති වී නොමැත. ජනාවාසිකයින් පොදුවේ සමාන වයසේ අය මෙන්ම එක සමාන සමාජයීය හා අධ්‍යාපන පසුබිම් සහිත අය වූ නමුදු තත්වය මෙසේ වීම අභාග්‍ය සම්පන්න විය. ගොවිපලෙහි ප්‍රථම අර්තාපල් වගාව කරන ලද්දේ සාමූහික පදනමක් මතය. එක් කන්නයක් අවසානයේදී පොදු හැඟීම වූයේ සාමූහික කෘෂිකාර්මික කටයුතු සතුටුදායක නොවන බවයි. සාමූහික වගාව ඉන් ඉදිරියට නොපැවති අතර දෙවන බෝගය වැවීම සඳහා ඉඩම් අක්කර 1/4 බැගින් එක් එක් පුද්ගලයෙකුට බෙදා දෙනු ලැබීය. අස්වැන්න සමුපකාර සමිතිය සතු විය යුතු විනි. කෙසේ වුවද බොහෝ පුද්ගලයින් තමන් විසින්ම අස්වැන්නෙන් බාගයක් තබා ගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවැටුම වූයේ ප්‍රථම වගාවෙන් භාගයක් පමණි. සංවිධානය අකාර්යක්ෂම වූ බවත් සාමාජිකයින් සමූහ ගොවිතැන පිළිබඳ සංකල්පය දෙසට සහ එහි දර්ශනය දෙසට යොමු නොකරන ලද බවත් පැහැදිලිය. තමන්ගේ මුල් ගෙවල් වලින් සහ දෙමවුපියන්ගෙන් ඈත් වූ ස්වාධීන ආර්ථික හා සමාජයීය ජීවන ක්‍රමයක් බිහි කිරීම සඳහා එකාවන්ව වැඩ කිරීමට තරුණ සාමාජිකයින් පුහුණු කිරීමෙහි ලා මෙම ගොවිපල සාර්ථක වී නැත.

## 3.3.4 ගිලීමලේ සමුපකාර ගම්මානය

පසුතලය

රත්නපුර දිස්ත්‍රික්කයෙහි රත්නපුර ආදායම් පාලක නිලධාරී කොට්ඨාශය තුළ ගිලීමලේ සමුපකාර ගම්මානය පිහිටුවා ඇත. මෙය 1972 ජනවාරි මාසයේදී පටන් ගෙන තිබුණ අතර අධ්‍යයනය කරන ලද්දේ 1973 සැප්තැම්බර් මාසයේදීය. ගොවිපලෙහි භූමි ප්‍රමාණය අක්කර 250 ක් විය.

1973 සැප්තැම්බර් මාසයේදී අක්කර 38 ක පමණ කෙසෙල්, වැලි දොඩම්, මිරිස්, ගොඩ වී, මයියොක්කා සහ වෙනත් අල වර්ග වගා කොට තිබුණි. 1971 දෙසැම්බර් මාසයේ සිට 1973 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ අවස්ථා හයකදී පමණ සාමාජිකයින් 133 දෙනෙකු බඳවාගෙන තිබුණේය. 1973 සැප්තැම්බර් මාසය වනවිට ගොවිපලේ රැඳී සිටියේ 70 දෙනෙකු පමණි. මේ අනුව ඔවුන්ගෙන් 47% ක් පමණ නොයෙකුත් හේතූන් නිසා ගොවිපල අත්හැර ගොස් ඇති බව පෙනේ. ගොවිපලේ සිටි සාමාජිකයින් 70 දෙනාගෙන් 20 දෙනෙකු කාන්තාවෝ වූහ. සාමාජිකයෝ 40 දෙනෙක් පමණ නොකඩවා ගොවිපලට පැමිණියෝය.

පුද්ගලයින් 9 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්‍ෂ මණ්ඩලයකින් හෙබි විශේෂ සමූපකාර සමිතියක් පිහිටුවන ලදී. ඒ 9 දෙනාගෙන් එක් අයෙක් සාමාජිකයින්ගේ නියෝජිතයෙක් විය. සමූපකාර දෙපාර්තමේන්තුවේ පරීක්‍ෂක වරයෙකු ගොවිපල භාරව සිටි අතර ඔහුගේ සහායට ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සංවර්ධන සහකරුවෙකු සිටියේය. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපති, ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විය.

III-12 සටහනෙහි 6 වන තීරුවෙන් 1973 සැප්තැම්බර් මාසයේදී ගොවිපලෙහි පැවති බෝග සහ සත්ව පාලන ව්‍යාපාර පිළිබඳ විස්තර දැක්වේ. මාස 20 ක් තුළදී අක්කර 38 ක් පමණ වගා කොට තිබුණි. වගා කටයුතු සඳහා සෑම සාමාජිකයෙකුටම අක්කර 0.7 ක් පමණ පවරා තිබුණි. ගොවිපලේ ආදායම වැඩි වශයෙන් ලබා තිබුණේ කුකුළු පාලනයෙනි. සෑම සාමාජිකයෙකුටම කුකුලන් 10 දෙනෙකු පමණ සිටියේය. දැව විකිණීමෙන් රු. 28,000/- ක පමණ ශුද්ධ ලාභයක් ලැබී තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් අක්කර 35 කුත් සාමාජිකයින් විසින් අක්කර 20 කුත් වශයෙන් ගොවිපලෙහි අක්කර 55 ක් හෙළි පෙහෙළි කොට තිබුණේය. සාමාජිකයෙකුට වැඩ කළ දිනකට රු. 3.50 බැගින් ගෙවන ලද අතර ඉන් ශත -/40 ක් සාමාජිකයින්ගේ ප්‍රාග්ධන කොටස සඳහා ගන්නා ලද ණය මුදල පියවීම සඳහා අඩු කර ගන්නා ලදී.

සංවර්ධන සැළැස්ම සහ ලබා ඇති ප්‍රගතිය

ආරම්භක සැළැස්ම අතිශයින් බලාපොරොත්තු ඇති කරවන සුළු ස්වභාවයක විය. බෝග 16 ක් යොදා අක්කර 331 ක් වගා කිරීමට සැළසුම් කර තිබුණි. (සටහන III-12) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් දෙවනුව වෙනත් සැළැස්මක් පිළියෙල කරන ලදී. ඒ අනුව බෝග 8 ක්, අක්කර 150 ක වගා කිරීමට අපේක්‍ෂා කෙරිනි. තුන් වෙනුව කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් එක් අවුරුදු සංවර්ධන වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. (සටහන III-12 4 වන තීරුව) මේ වැඩ පිළිවෙල සඳහා වූ මූලධනමය අවශ්‍යතා III-13 සටහනෙහි දැක්වේ.

මේ සංවර්ධන සැළැස්ම අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් තරමක් දුරට සංශෝධනය කරනු ලැබිනි. නව සැළැස්ම (III-12 සටහනේ 5 වන තීරුව) අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ කොට තිබූ පරිදි අක්කර 100 ක් වගා කිරීමට බලාපොරොත්තු වූ නමුදු බෝග සංයෝගය වෙනස් විය. මාස 20 ක් ඇතුළතදී මේ වගා වැඩ පිළිවෙල ක්‍රියාත්මක වී තිබූ ආකාරය III-12 සටහනේ 6 වන තීරුවෙන් දැක්වේ. මාස 12 ක් ඇතුළතදී අක්කර 23 ක් පමණ වගා කොට තිබුණ අතර මෙයින් හුවා දැක්වෙනුයේ ක්‍රියාකාරීත්වයෙහි සියයට 77 ක ඌනතාවයකි.

ආරම්භක සැළැස්මෙහි කුකුළු පාලනය, කිරි පට්ටි පාලනය සහ එළු ගාලක් යනාදිය සඳහා විධිවිධාන යොදා තිබුනද, 1973 සැප්තැම්බර් මාසයේදී කුකුලන් 475 ක් පමණ ඇතිව කුකුළු කොටුව පමණක් ආරම්භ කර තිබුණි. සාමාජිකයින් සඳහා (අඩි 60X20) ගොඩනැගිල්ලක්, (අඩි 15X20) මුළුතැන් ගෙයක්ද සහිතව ගොඩ නගා තිබුනත් ඔවුන් මෙහි පදිංචි වීමට නොපැමිණි නිසා මෙම ගොඩනැගිල්ල කාර්යාලය සහ ගබඩාව වශයෙන් පාවිච්චි කරන ලදී.

## වර්තමාන තත්වය

### කළමනාකරණය

මෙම ගොවිපල විශේෂ සමූපකාර සමිතියක් වශයෙන් ලේඛනගත කරන ලද අතර අධ්‍යක්ෂක මණ්ඩලයෙහි පුද්ගලයින් 9 දෙනෙක් සිටියහ. එහි සභාපති වශයෙන් ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කටයුතු කළේය. ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කුඹුරු සම්පාදන නිලධාරී, කෘෂිකර්ම උපදේශක, සංවර්ධන සහකාර, ගම් සභාවේ සභාපති, සමූපකාර පරීක්ෂක, ගමේ ගොවි මහතෙකු සහ සමූපකාරිකයින්ගේ නියෝජිත වරයෙකුද අධ්‍යක්ෂක මණ්ඩලයේ සේවය කළහ. අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටි සමූපකාර පරීක්ෂක තැන ව්‍යාපාර කළමනාකරු වශයෙන්ද කටයුතු කළේය.

සමිතියේ සාමාජිකත්වය විසින් පුද්ගලයින් 9 දෙනෙකුගෙන් සමන්විත වැඩ කමිටුවක් පත් කොට තිබුනි. මේ කමිටුව සති දෙකකට වරක් රැස්විය යුතු වූ අතර ලබා ඇති ප්‍රගතිය මේ රැස්වීම්වලදී සාකච්ඡා කළයුතු විය. වැඩ කමිටුවේ සිටි පුද්ගලයින් 9 දෙනා දෛනික වැඩ කණ්ඩවල නායකයින් ලෙසද කටයුතු කළහ. අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටි සාමාජික නියෝජිතවරයා වැඩ කමිටුවේ සභාපති වරයා ලෙස කටයුතු කළ අතර ඔහු විසින් සාමාජිකයින් කණ්ඩවලට බෙදා ඔවුන්ට නොයෙක් වැඩ කොටස් පවරන ලදී. ගොවිපලෙහි උපකරණ යනාදිය ඔහුගේ භාරයේ පැවතුනි. ඔහු ගොවිතැන් කටයුතුවල නිරත නොවී ගම්මානයේ කාර්යාලයීය රාජකාරී කටයුතු ඉටු කළේය.

සෑම කණ්ඩායමකම සාමාජිකයින් 4 – 15 දක්වා ගණනක් සිටි අතර එහි නායකයා, තමන් වැඩ කරන අතරම අනෙක් අයගේ වැඩ කටයුතු පරීක්ෂා කළේය. ඒ ඒ දිනයේ කළ වැඩ නායකයින් විසින් වාර්තා කරන ලදී. ගොවිපල පොදුවේ වගා කරන ලද අතර විශේෂ ශ්‍රම ප්‍රාගුණ්‍යය ලබා තිබුනේ ඉතා අඩු වශයෙනි. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් විසින් සාමාජිකයින්ගේ වැඩ කටයුතු පාලනය කිරීම සඳහා නීති රීති පද්ධතියක් සකස් කරන ලදී. ආරම්භයේදී සාමාජිකයින් මේවා පිළි ගැනීමට මැලි වූ නමුත් පසුව එයට එකඟ විය.

### සමාජයීය තත්වය

ගම්මානයෙහි ජනාවාසයක් පිහිටුවීම ලෙහෙසි කාර්යයක් වී නොමැත. සාමාජිකයෝ තම තමන්ගේ ගම්වල සිට ගොවිපලේ වැඩට පැමිණියහ. අවස්ථා හයකදී සාමාජිකයින් 130 දෙනෙකු බඳවාගෙන තිබූ අතර රැඳී සිටියේ ඉන් 70 ක් පමණි. මාස 20 ක කාලය තුළදී ගම්මානය හැර ගිය අයගේ අනුපාතය 53% කි. 1973 ජනවාරි මාසයේදී සාමාජිකයින් 30 දෙනෙකු නෙරපා දමන ලදී. සමිතියේ නීති රීති අනුව සෑම සාමාජිකයෙකු විසින්ම මසකට යටත් පිරිසෙයින් දින 20 ක්වත් ගොවිපලෙහි වැඩ කළයුතුව තිබුණු අතර සාමාජිකයින් 28 දෙනෙකු පමණ සෑහෙන කාලයක් තිස්සේ වැඩට පැමිණ තිබුණේ මසකට දින දෙකක් හෝ තුනක් පමණි. එමනිසා ඔවුන් අස් කරන ලදී. මේ තීරණය ගන්නා ලද්දේ මහා සභා රැස්වීමකදී රහස් ඡන්දයෙනි. අස් කරන ලද සාමාජිකයින් පස් දෙනෙක් ගම්මානයේ කුකුලන් හොරකම් කිරීම පිළිබඳ වැරදි කරුවන් වී තිබුනි.

## සටහන III–12 සංවර්ධන සැළසුම් සහ නියම සංවර්ධනය–1973 සැප්තැම්බර්

| විස්තරය | පළමු සැළැස්ම අක්කර | දෙවන සැළැස්ම අක්කර | තුන්වන සැළැස්ම (1 වන අවුරුද්ද) අක්කර | හතරවන සැළැස්ම (1 වන අවුරුද්ද) අක්කර | 1973 සැප්තැම්බර් වන විට ලබා තිබූ ප්‍රගතිය අක්කර |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| **බෝග** | | | | | |
| කුරුඳු | 25 | 25 | – | – | – |
| කෝපි | 40 | 40 | – | 10 | – |
| ගම්මිරිස් | 10 | 10 | – | 10 | – |
| පේර | 5 | – | – | – | – |
| කරාබුනැටි | 5 | – | – | 5 | – |
| තේ | 50 | 50 | – | – | – |
| අනිකුත් බෝග | 15 | – | – | – | – |
| කෙසෙල් | 40 | – | 20 | 20 | 8 |
| කජු | 30 | – | 15 | 5 | – |
| අඹ ලුණුරු | 25 | – | 5 | – | – |
| වැල් දොඩම් | 5 | – | 5 | 15 | 9 |
| බුලත් | 5 | – | 5 | – | – |
| එළවළු | 26 | – | 30 | – | – |
| මාළු මිරිස් | 10 | – | – | – | – |
| මයියොක්කා | 40 | – | 20 | 15 | 7 |
| මල් | 1/4 | – | – | – | – |
| කරාබු | – | 10 | – | – | – |
| කිතුල් | – | 5 | – | – | – |
| පුවක් | – | 5 | – | – | – |
| වී | – | – | – | – | 12 |
| පෙයාර්ස් | – | 5 | – | – | – |
| අල | – | – | – | – | 1 |
| මිශ්‍ර බෝග | – | – | – | 20 | – |
| මිරිස් | – | – | – | – | 1 |
| මුළු ගණන | 331 1/4 | 150 | 100 | 100 | 38 |
| **පශු පාලනය** | | | | | |
| කිරි පට්ටිය (ගවයින් ගණන) | 50 | – | – | – | – |
| කුකුල් පාලනය (කුකුලන්) | 2,500 | – | – | – | 475 |
| ඌරු ගාල (ඌරුවන්) | 100 | – | – | – | – |

මූලාශ්‍රය: ගිලිමලේ සමූපකාර ගම්මානයේ වාර්තා

මෙවැනි සාමූහික ගොවිතැන් ක්‍රමයක් සඳහා පෙළඹවීමක් හෝ උද්‍යෝගයක් ඇති කිරීමට හැකිවන පරිදි ඒකාබද්ධ හැඟීමකින් යුත් ජන සමූහයක් බිහි කිරීමෙහි ලා මෙම ගම්මානයෙහි සාමාජිකයෝ සාර්ථක අයුරින් කටයුතු කර නැත. අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සිටින සාමාජික නියෝජිත යාද ඇතුළුව සාමාජික නායකයින් කිහිප දෙනෙක් ව්‍යාපාර කළමනාකරු හා ඔහුගේ සහකරුවන් සමඟ කුළුපග වී ඇති අතර සාමාන්‍ය සාමාජිකත්වය මෙම තත්වය කෙරෙහි සෑහීමකට පත්ව නොමැත.

## විශ්ලේෂණය

### ආර්ථික අංශය

පළමුවන සංවර්ධන සැළැස්ම මගින් අවුරුදු 6 ක කාල පරිච්ඡේදයක් තිස්සේ ලබා ගැනීමට බලාපොරොත්තු වූ ආදායම් සහ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වූ මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර III-13 සටහනේ දැක්වේ. අවුරුදු හයක් තුළදී, අපේක්ෂා කළ වියදම රු. 24,64,413/- ක් වූ අතර, මෙහිදී ප්‍රාග්ධන වියදම රු. 7,02,380/- ක්ද, පුනරාවර්තන වියදම රු. 1,762,033/- ක්ද විය. මේ අනුව 28% ක් ප්‍රාග්ධන වියදම්ද, 72% ක් පුනරාවර්තන වියදම්ද වූ බව පෙනේ. සාමාන්‍ය වාර්ෂික වියදම රු. 410,735/- ක් ලෙස ගණන් බලා තිබූ අතර සාමාන්‍ය ප්‍රාග්ධන වියදම වශයෙන් රු. 117,063/- ක්ද, පුනරාවර්තන වියදම් වශයෙන් රු. 297,672/- ක්ද ගණනය කර තිබුණි. පුද්ගලයින් 100 දෙනෙකුට පමණ ගොවිපලේ රැකියා සපයා දීමට බලාපොරොත්තු වූ නිසා අවුරුදු හයක් සඳහා සැළසුම් කරන ලද ප්‍රාග්ධන වියදම් අනුව පුද්ගලයෙකුට රු. 7,000/- ක්ද අක්කරයකට රු. 2,800/- ක්ද අදාළ වන්නේය. එසේම පුනරාවර්තන වියදම් පුද්ගලයෙකුට රුපියල් 17,620/- ක්ද, අක්කරයකට රු. 7,000/- ක්ද විය. අවුරුදු හයක් ඇතුළතදී එක පුද්ගලයෙකු සඳහා කරන සාමාන්‍ය වියදම රු. 24,620/- ක් ලෙසද, ඒ කාලය තුළදීම අක්කරයක් සඳහා ආයෝජනය කිරීමට බලාපොරොත්තු වූ මුදල රු. 9,800/- ක් ලෙසද ගණන් බලා තිබුණි. මේ අනුව අවුරුදු 6 ක කාලසීමාවක් උදෙසා පුද්ගලයෙකුට අදාළ වන සාමාන්‍ය වාර්ෂික වියදම රු. 4,106/- ක්ද, (ප්‍රාග්ධන රු. 1,170/- යි, පුනරුත්ථාපන රුපියල් 2,936/- යි) අක්කරයකට අදාළ වන සාමාන්‍ය වාර්ෂික වියදම රු. 1,632/- ක්ද (ප්‍රාග්ධන රු. 466/- යි. පුනරාවර්තන වියදම් රු. 1,166/- ක්) විය.

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් පසුව පිළියෙල කරන ලද එක් අවුරුදු වැඩ පිළිවෙල සහ අපේක්ෂිත ආදායම සහ වියදම් පිළිබඳ විස්තර III-14 සටහනෙහි දැක්වේ. මේ සැළැස්ම අනුව එක් වර්ෂයක් ඇතුළතදී අක්කර 100 ක් වගා කිරීමට අපේක්ෂා කළ අතර, මේ කාලයේදී එක් පුද්ගලයෙකු සඳහා එක් අක්කරයකට යන සාමාන්‍ය වියදම රු. 2,290/- ක් ලෙස ගණන් බලා තිබුණි. මෙනයින් අපේක්ෂිත ආදායම රු. 350/- ක් වූයෙන් අපේක්ෂිත ආදායම අපේක්ෂිත වියදමට වඩා අඩු වූ බව පෙනේ.

**සටහන III-13 අපේක්ෂිත වියදම් සහ ආදායම්**

| | දෙවන වසර රු. | තුන්වන වසර රු. | හතරවන වසර රු. | පස්වන වසර රු. | හයවන වසර රු. | හත්වන වසර රු. |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම | 321,060 | 166.040 | 88,230 | 42,350 | 42,350 | 42,350 |
| පුනරාවර්තන වියදම | 224,249 | 263,563 | 274,441 | 331,826 | 329,428 | 338,526 |
| මුළු වියදම | 545,309 | 429,603 | 362,671 | 374,176 | 371,778 | 380,876 |
| වත්කම් | 698,518 | 1,036,955 | 992,238 | 1,190,301 | 1,143,047 | 1,260,243 |
| අතිරික්තය | 153,209 | 607,352 | 629,567 | 816,225 | 771,269 | 879,387 |

මූලාශ්‍රය: ගිලිමලේ සමූපකාර ගොවිපලේ වාර්තා

1972 ජනවාරි මස සිට 1973 අගෝස්තු මාසය දක්වා වූ මාස 20 තුළ ගොවිපල සඳහා කරන ලද වියදම් සහ ගොවිපලින් ලබා ගන්නා ලද ආදායම් පිළිබඳ විස්තර III-14 සටහනෙන් දැක්වේ. මුළු වියදම රු. 1,50,443/- කි. මුළු ආදායම රු. 1,78,091/- කි. සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 70 සේ සළකන විට, එක් පුද්ගලයෙක් සඳහා වූ සාමාන්‍ය වියදම රු. 2,150/- ක් වූ අතර, සාමාන්‍ය ආදායම රු. 2,540/- ක් විය. පුද්ගලයෙක් සඳහා සාමාන්‍ය වාර්ෂික වියදම (සමානුපාත ක්‍රමය යටතේ ගණන් බලනවිට) රු. 1,290/- ක් වන අතර, ආදායම රු. 1,524/- කි. සම්පූර්ණ වියදමින් ප්‍රාග්ධන වියදම 44% ක්ද, පුනරාවර්තන වියදම 50% ක්ද වේ. මේ අනුව ඒකපුද්ගල වාර්ෂික වියදම වූ රු. 1,290/- න් රු. 575/- ක් ප්‍රාග්ධන වියදම් වූ අතර අනෙක් රු. 715/- පුනරාවර්තන වියදම් විනි. අක්කර 38 ක් සංවර්ධනය කොට තිබුන නිසා මාස 20 ක් තුළදී එක් අක්කරයකට සාමාන්‍ය ප්‍රාග්ධන වියදම රු. 1,980/- ක්ද පුනරාවර්තන වියදම රු. 2,512/- ක්ද විය. අක්කරයකට අදාළ වන සාමාන්‍ය වාර්ෂික වියදම වූ රු. 2,700/- න් රු. 1,185/- ක් ප්‍රාග්ධන වියදම් වූ අතර රු. 1,515/- ක් පුනරාවර්තන වියදම් විය. පුනරාවර්තන වියදම් ගැන සළකන විට ඉන් රු. 43,713/- ක් (පුනරාවර්තන වියදමින් 52% ක්) වැය වූයේ දැව සංස්ථාවට පුරස්කාරක ගෙවීම් වශයෙනි.

සම්පූර්ණ ආදායම වූ රු. 1,78,091/- න් රු. 72,041/- ක් (40%) දැව විකිණීමෙන් ලබා ගන්නා ලදී. කෙසේ වුවද පුරස්කාරකයන් ගෙවූ පසු ලැබූ ශුද්ධ ආදායම රු. 28,828/- ක් විය. මේ අනුව දැව සඳහා වූ පුරස්කාරක ගෙවීම ගොවිපලෙහි වූ මුළු ආදායමින් 60% කි. රු. 50,000/- ක් (28%) රජයේ දීමනාව වූ අතර තවත් රුපියල්

35,000/- ක් (19%) බැංකු ණයක් විය. අතිශයින් අධෛර්‍යමත් කරවන සුළු ලක්‍ෂණයක් වූයේ මාස 20 ක් ඇතුළතදී සමිතිය විසින් උපයන ලද ආදායම රු. 11,348/- ක් නැතහොත් මුළු වත්කම් වලින් 7% ක් පමණක් වීමය. ව්‍යසනාවකට මෙන් දැව වලින් රු. 28,000/- කට වැඩි ශුද්ධ ලාභයක් ලැබුන අතර එම ලාභය මේ කාලය තුළදී ගොවිතැන් කටයුතු වලින් ලැබුණ ආදායම මෙන් දෙගුණයක් සහ අඩක් පමණ විය. දැව වලින් ලැබුන ආදායම නිසා ගොවිපලේ ප්‍රශ්න තරමක් මග හැරී ගිය නමුදු ගොවිපල ඉතා ඉක්මණින් මූලපමය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට ඉඩ ඇති හෙයින් මෙයින් වැලකීමට නම් එහි සංවර්ධන වේගය සෑහෙන ප්‍රමාණයකට දියුණු කළ යුතුය.

ශිල්පීය දෘෂ්ටිකෝනයෙන් සළකා බලනවිට කෘෂිකර්‍ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද සංවර්ධන සැළැස්ම යෝග්‍ය වූවේය. ඉඩම සහ එය අවට වාතාවරණය ආර්ථික වශයෙන් සාර්ථක ගොවිපලකට තුඩු දෙන සුළුය.

කළමනාකරණ

තරුණයින්ගෙන් සමන්විත සමුපකාර ගොවිපලක් පාලනය කිරීම පිළිබඳ අත්දැකීමක් කළමනාකරුවන්ට නොතිබිණි. ව්‍යාපාර කළමනාකරු දැඩි විනය පාලකයෙකු වූ බව පෙනේ. "අවවාද දීමෙන් යහ මගට යොමු කළ නොහැකි පුද්ගලයින් සිටින බව අපට පෙනී ගිය විට අපි ඔවුනට ඊට පසු වැඩට පැමිණීමට නොහැකි වන ආකාරයකට අවවාද කළා. ඇත්තෙන්ම අපි ඔවුන්ට තර්ජනය කළා..." යනුවෙන් ව්‍යාපාර කළමනාකරු පැවසීය. සාමාජිකයින් ස්වල්ප දෙනෙක් සමඟ නිලධාරීන් ඉතා කිට්ටුවෙන් ඇසුරු කළ අතර ඔවුන්ගේ සහාය ඇතිව සමූපකාර ගම්මානයේ කටයුතු තරමක් හිතුවක්කාර ආකාරයෙන් කරගෙන යන ලදී. වැඩ කාණ්ඩ තුලින් සාමාජිකයින් කළමනාකරණ කාර්යයනට සහභාගී වීම සාර්ථක නොවීය. නිලධාරීන් තුළ සාමාජිකයින් කෙරේ විශ්වාසයක් නොතිබී හෙයින් මෙම තත්වය අවබෝධ කර ගත් සාමාජිකයෝ යටත් නොවන ආකල්පයක් ආරූඪ කර ගත්හ.

සමාජයීය අංශ

ගොවිපලෙහිදීත් සාමාජිකයින් කටයුතු කළේ, ඒ වනවිට පවා ඔවුන් සිය උපන් ගමෙහි සාමාජයටත්, එහි දෙමාපිය සබඳකම් වලටත් පරිබාහිර නොවූ අය වශයෙනි. කළමනාකාරීත්වයේ ආධිපත්‍ය ස්වරූපය නිසා බොහෝ සාමාජිකයින් තුළ, සිය ආරක්‍ෂාව පිළිබඳ පරමාර්ථයන් සඳහා කිසියම් එක්සත්කමක් දියුණු වී ඇති බව පෙනුනි. නිලධාරීන්ගේ හොඳ හිත දිනාගත් සාමාජිකයින් ස්වල්ප දෙනා බලගතු කාණ්ඩයක් හැටියට පෙනී සිටි අතර, සාමාන්‍ය සාමාජිකයින් ඔවුන් කෙරෙහි විශ්වාසයක් හෝ සැළකිල්ලක් දැක්වූයේ නැත. අසල්වැසි ගම්වල ප්‍රජාව විසින්ද ගොවිපලෙහි ජන සමූහය එනාව හඳුනාගෙන පිළිගනු නොලැබිණි. එනාව ප්‍රතිෂ්ඨාපිත සම්ප්‍රදායයන්ගෙන් හෙබි ගැමි ජන සමූහය, සමූපකාර ගම්මානයේ ප්‍රජාව සමඟ සම්බන්ධකම් පවත්වා ගන්නේ එකී ප්‍රජාවද ගමටම අයිති සාමාජිකයින් සේ සලකන විනා නව සමාජ රටාවක නියෝජිතයින් වශයෙන් සළකා නොවේ.

**සටහන III-14** 1972 ජනවාරි - 1973 අගෝස්තු කාලය තුළ නියත ආදායම් සහ වියදම් විස්තරය

| ආදායම විස්තරය | ප්‍රමාණය රු. | වියදම විස්තරය | ප්‍රමාණය රු. |
|---|---|---|---|
| රජයේ දීමනා | 50,000 | **ප්‍රාග්ධන** | |
| බැංකු ණය | 35,000 | ගොඩනැගිලි | 16,475 |
| ඇට විකිණීම | 72,041 | උපකරණ | 4,686 |
| | | කාර්යාලයීය උපකරණ | 1,521 |
| ටෙන්ඩර් තැන්පතු | 1,100 | කුකුල් පාලනය | 517 |
| ඉඩම් කැබලි සඳහා ඇප | 8,000 | කැලෑ හෙළි කිරීම හා පස් සංරක්ෂණය | 38,409 |
| | | පුහුණුව | 1,542 |
| වී.සේ.ස. සමිති කොටස් මුදල් | 500 | ගොඩනැගිලි | 3,543 |
| ඇතුළත් වීමේ ගාස්තු | 102 | වැට බැඳීම් | 469 |
| කුකුල් පාලනය | 7,847 | එකතුව | 67,162 |
| වෙනත් වත්කම් | 1,528 | **පුනරාවර්තන** | |
| එළවළු | 1,973 | කුකුල් පාලනය | 1,185 |
| | | බීජ වර්ග සහ කෘෂි රසායන | 1,812 |
| | | කුකුල් ආහාර | 13,633 |
| | | අළුත්වැඩියා කිරීම් | 113 |
| | | වැටුප් | 750 |
| | | විවිධ | 4,278 |
| | | උත්සව අත්තිකාරම් | 4,575 |
| | | කොටස් මුදල් (ණය ආපසු ගෙවීම) | 8,149 |
| | | ප්‍රවාහනය | 1,415 |
| | | ගමනා ගමනය | 408 |
| | | ගමනා ගමන සහ යැපීම් දීමනා | 1,458 |
| | | ලිපි ද්‍රව්‍ය | 693 |
| | | මුද්‍රණය | 873 |
| | | තැපැල් ගාස්තු | 96 |
| | | බැංකු ගාස්තු | 130 |
| | | ඇට සඳහා පුරස්කාරක දීමනා | 43,713 |
| | | එකතුව | 83,281 |
| | 178,091 | මුළු එකතුව | 150,443 |

මූලාශ්‍රය: ගිලීමලේ සමූපකාර සමිතියේ වාර්තා

### 3.3.5 ප්‍රොවිඩන්ස් සමූපකාර ගම්මානය

පසුතලය

ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ උප දිසාපති කොට්ඨාශය තුළ මෙම ගම්මානය පිහිටා ඇත. මේ ගොවිපල 1971 අගෝස්තු මාසයේදී පටන් ගන්නා ලදී. මෙම අධ්‍යයනය කරනවිට ගොවිපල අවුරුදු දෙකක් පමණ තිස්සේ ක්‍රියාත්මක වී තිබිනි. මේ ගොවිපලට අක්කර 125 ක් පමණ අයත් වන අතර සමූපකාර සමිතිය ආරම්භ කළ අවස්ථාවෙහි අතහැර දමා තිබූ පොල් අක්කර 7 ක් හා කුරුඳු අක්කර 4 ක් සමිතිය සතු විනි. සෙසු භූමි ප්‍රමාණය වනගතව තිබුනි.

අධ්‍යයනය කරන ලද කාලයෙහි සාමාජිකයින් විසින් වැලි දොඩම් අක්කර 13 ක් සහ අක්කරයක පමණ අල වර්ග වගා කොට තිබුනි. මීට අමතරව පශු පාලන ව්‍යාපාර අරඹා තිබී අතර කුකුලන් 1000 ක් පමණ සිටි කුකුල් කොටුවක්ද, 20 කගෙන් පමණ යුත් ඌරු පට්ටියක්ද, මුරා වර්ගයේ දෙනුන් 8 දෙනෙකුගෙන් යුත් කිරිපට්ටියක් හා එළුවන් 11 දෙනෙක්ද මෙම ගොවිපලෙහි නඩත්තු කරගෙන යමින් තිබුණේය.

සාමාජිකයින් 50 දෙනෙකුගෙන් යුතුව සමූපකාර සමිතිය ආරම්භ කරන ලද අතර අවුරුදු 2 කට පමණ පසුව එහිදී සිටියේ 30 දෙනෙකු පමණකි. ඉන් 7 දෙනෙක් කාන්තාවෝ වූහ. අවුරුදු දෙකක කාලය තුළදී ගොවිපල අතහැර ගිය අයගේ අනුපාතය 40% කි.

අධ්‍යයනය කළ අවස්ථාවෙහි දිනපතා සාමාජිකයින් 10 – 15 වැඩට පැමිණියහ. ඉඩම් පවරා ගන්නා විටත්, පැවති පොල් අක්කර 7 ක සහ කුරුඳු අක්කර 4 ක වගාව පවත්වාගන යන ලදී. සමූපකාර සමිතියේ අවුරුදු දෙකක කාලය තුළ වැලි දොඩම් අක්කර 14 ක් සහ අල වර්ග වගා කරන ලද අතර කුකුල් කොටුවක්, ඌරු ගාලක්, ගව ගාලක් සහ එළුවන් ඇති කිරීමද ආරම්භ කොට තිබුනි.

අවුරුදු දෙකක කාලය තුළදී සම්පූර්ණ වියදම රු. 1,31,700/– ක් වූයෙන් ඉන් රු. 15,000/– ක් ප්‍රාග්ධන වියදම් සඳහාද, රු. 1,16,377/– ක් පුනරාවර්තන වියදම් සඳහාද විය. මුළු වත්කම් ප්‍රමාණය රු. 1,68,432/– ක් වූ නමුත් ගොවිපලේ කටයුතු වලින් ලැබුනේ රු. 44,864/– ක් පමණි. ඉතිරි ප්‍රමාණය ලැබුනේ රජයේ දීමනා සහ ණය මුදල් වලිනි.

සංවර්ධන සැළැස්ම සහ ලබා ඇති ප්‍රගතිය

වර්ෂ තුනක කාලය සඳහා පිළියෙල වී ඇති සංවර්ධන සැළැස්ම III–17 සටහනින් දැක්වේ. මේ කාලය තුළදී අක්කර 157 ක පමණ කෙටිකාලීන සහ ස්ථාවර බෝග වගා කිරීමට අපේක්ෂා කරන ලදී. ඉඩම් වලින් 35% ක් පළමුවෙනි අවුරුද්දේදීද, 52% ක් ඊලඟ අවුරුද්දේදීද ඉතිරි 13% සැළැස්මේ අවසාන වර්ෂයේදීද සංවර්ධනය කිරීමට බලාපොරොත්තු විනි. පළමු දෙවසරෙහිදී සැළසුම් කරන ලද සංවර්ධන කටයුතු සහ නියත ක්‍රියාකාරීත්වය III–15 සටහනෙහි

සඳහා ඇත. මෙම අවුරුදු දෙකක කාලය තුළදී කරනු ලද මුළු කෘෂිකාර්මික කටයුතු ප්‍රමාණය සලකන විට එය ඉලක්කයෙන් 18% ක් පමණි.

කුකුළු කොටුවක් හා කිරිපට්ටියක් ඇරඹීමට සැළසුමෙහි විධි විධාන සලසා තිබුණේය. තෙවන අවුරුද්ද වනවිට ගව පට්ටියෙහි ගවයින් 20 ක් සිටින පරිදි සැළසුම් කර තිබුනි. පළමුවන අවුරුද්දේදී කුකුලන් 1,500 ක්ද, දෙවෙනි අවුරුද්දේදී කුකුලන් 1,000 ක්ද, තෙවන අවුරුද්දේදීත් කුකුලන් 1,000 ක්ද ඇති කිරීමට බලාපොරොත්තු වන ලදී. කෙසේ වුවත් සැළැස්ම ක්‍රියාත්මක කිරීමේදී, එළුවන් 6 දෙනෙක්ද, ඌරන් 18 දෙනෙක්ද, කුකුලන් 1,000 ක් පමණද, ගවයින් 8 දෙනෙක් පමණද ඇති කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිනි. පශු පාලන කටයුතුවල ක්‍රියාකාරිත්වය ඉලක්ක වලින් අපේක්ෂිත පරිදි විය.

සාමාජිකයින්ට දීමනා ගෙවීම

ආරම්භයේ සිට 1973 සැප්තැම්බර් මාසය දක්වා සාමාජිකයින්ට දිනකට රු. 1.70 බැගින් දීමනාවක් දෙන ලදී. ඊට අමතරව ලෝක ආහාර සහනාධාරද දෙන ලදී. 1970 සැප්තැම්බර් මාසයෙන් පසුව දීමනාවේ වෙනසක් ඇති කරන ලද්දේය. කුකුළු කොටුවෙහි වැඩ කළ කාන්තාවන් දෙදෙනාට මසකට රු. 125/- බැගින්ද, ඌරු කොටුව, ගවගාල හා එළුගාල බලා ගත් පුද්ගලයින් දෙදෙනාට මසකට රු. 150/- බැගින්ද ගෙවන ලදී. කැලෑ හෙළි කිරීමේ නියැලී සිටි සාමාජිකයින්ට අක්කරයකට රු. 60/- බැගින් ලැබුනි. වල් මර්දනය සඳහා අක්කරයකට රු. 40/- ක්ද, කානු හෑරීම සඳහා දම්වැලකට රු. 1/- බැගින්ද, වැල් දොඩම් වගාවට පොහොර දැමීම සඳහා අක්කරයකට රු. 20/- බැගින්ද, අක්කරයක වැල් දොඩම් වැල් සකස් කිරීම සහ පරාග පෝෂණය සඳහා රු. 20/- ක්ද, අක්කරයක අල වර්ග වගාව සඳහා බිම් සකස් කිරීමට රු. 60/- ක්ද ගෙවන ලද්දේය. මේ නව දීමනා මට්ටම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

නිශ්චිත දෛනික වැටුප් ක්‍රමය කොන්ත්‍රාත් ක්‍රමයට වෙනස් කිරීමට තුඩු දුන් හේතු කිහිපයකි. සාමාජිකයින් විශාල ප්‍රමාණයක් ගොවිපල අතහැර යාම සහ පැමිණීම අසතුටුදායක වීම නිසා දීමනාවෙහි අප්‍රමාණවත් බව ප්‍රත්‍යක්ෂ වුණේය. ගොවිපලෙහි නැවතී සිටි සාමාජිකයින් පවා උදාසීන ස්වභාවයකින් පසු වූ අතර ඔවුනට ලැබෙන ශුද්ධ ලාභය අතිශයින් අඩු බවට පැමිණිලි කළහ. සමිතිය විසින් එක් සාමාජිකයෙක් වෙනුවෙන් කොටස් ප්‍රාග්ධනය වශයෙන් ලබා ගත් රු. 500/- ක ණය මුදල පියවනු වස් මසක් පාසා රු. 11.50 බැගින් වැටුපෙන් අඩු කර ගන්නා ලදී. මේ නිසා මේ අවධිය වනවිට සාමාජිකයින්ගේ දීමනාව වැඩි කිරීමත් ඒ සමඟම වැඩ ප්‍රමාණය වඩාත් කාර්යක්ෂම කිරීමත් අත්‍යවශ්‍යව පැවතුනි.

වර්තමාන තත්වය

සමාජයීය තත්වය

මේ ගොවිපල අවුරුදු දෙකක් පමණ තිස්සේ ක්‍රියාත්මක වෙමින් පැවතුන නමුදු එහි ජනාවාසයක් ඇති කිරීමට පාලකයින්ට නොහැකි විය. අසල්වැසි පවුල් දෙකක සාමාජිකයින් 7

දෙනෙක්ද ඇතුළත් 10 දෙනෙකුගෙන් පමණ සමන්විත කුඩා කණ්ඩායමක් විසින් ගොවිපලේ කටයුතු ඉටු කරනු ලැබිනි. ගොවිපල පාලනය කිරීමේ වගකීම්භාරය සාමාජිකයින් වෙත පැවරීමට කළමනාකාරිත්වය විසින් ප්‍රයත්නයක් දරන ලදි. ආධිපත්‍ය ස්වරූපයක වූ කළමනාකාරිත්ව ආකල්පයක් කෙරෙහි සාමාජිකයින් විසින් දක්වන ලද විරෝධතාවයේ ප්‍රතිඵලයකි, මෙම ප්‍රයත්නය. අධ්‍යයනය කරන ලද අවස්ථාවෙහි කළමනාකාරිත්වය ගොවිපල කෙරෙහි සැළකිල්ලක් නොදැක්වීමේ නැඹුරුතාවය දක්නට ලැබුණ අතර සාමාජිකයින් මෙම තත්වයට කැමති වූවායේ පෙනුනි.

ගොවිපලෙහි කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය රජයේ නිලධාරීන් පස් දෙනෙකුගෙන් හා අම්බලන්ගොඩ උප දිසාපති, (සභාපති) සමුපකාර පරීක්ෂක, කෘෂිකර්ම උපදේශක, ඉඩම් කට්ටි පරිපාලක, යන අයගෙන් සහ අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති වරයා, බටපොළ ගම් සභාපති, ධර්මාශෝක විද්‍යාලයේ ගුරුවරයෙකු සහ සාමාජිකයෙකුගේ පියෙක්ද යන සිවු දෙනාගෙන්ද සමන්විත විනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලදී, නිරීක්ෂකයෙක් වශයෙන් සාමාජිකයෙකු කැඳවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලද අතර, ඉඩම් කට්ටි පරිපාලක තැන ව්‍යාපාර කළමනාකරු වශයෙන් කටයුතු කරමින් මේ තීරණ ක්‍රියාත්මක කළේය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජික නියෝජිත වරයා ගොවිපල මට්ටමේදී සාමාජිකයින්ගේ නායකයා ලෙස ක්‍රියා කරමින් ව්‍යාපාර කළමනාකරුට ඔහුගේ කටයුතු ඉටු කිරීමට සහාය වීය. සමිතියේ සාමාජිකයින් කුඩා කාණ්ඩවලට බෙදී සිටි අතර, ඒ සෑම කණ්ඩායමකටම නායකයෙක් වීය. ගොවිපලේ කටයුතු සම්බන්ධයෙන් සැබෑ උනන්දුවක් දැක්වූයේ සාමාජිකයින් ඉතා ස්වල්ප දෙනෙකු පමණි. මේ ප්‍රමාණය සාමාජිකයින්ගේ දෛනික පැමිණීම අතින් ඉතා දුර්වල වීමෙන් වඩාත් පැහැදිලි වේ. සාමාජිකයින් 10 දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමේ 7 දෙනෙක්ම පවුල් දෙකක සාමාජිකයින් වීම කැපී පෙනුණ විශේෂත්වයක් විනි. ඒ කණ්ඩායමේ නායකයා මේ පවුල් දෙකින් එකකට අයත් වූ අතර ඔහුගේ පියා අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළේය.

විශ්ලේෂනය

ආර්ථික අංශය

තුන් අවුරුදු සැළැස්ම III–17 සටහනෙහි දැක්වේ. අවුරුදු තුන සඳහා මුළු වියදම රු. 143,305/– ක් වූ අතර එම කාලය සඳහා සාමාන්‍ය වාර්ෂික වියදම වශයෙන් රුපියල් 48,435/– ක් ගණන් බලා තිබුනි. මේ කාලය තුළදී අපේක්ෂිත මුළු වත්කම් රු.11,50,820/– ක් වූයෙන් සාමාන්‍ය වාර්ෂික වත්කම රු. 50,273/– ක් වීය. සැළසුම් කාලසීමාව තුළ ආදායමෙහි අතිරික්තය බලාපොරොත්තු වූ වියදමට වඩා රු. 5,515/– ක් විය. මෙම අධ්‍යයනය කරන විට ගොවිපල අවුරුදු දෙකක් පමණ ක්‍රියාත්මක වෙමින් පැවතුන නිසා එම අවුරුදු දෙක සඳහා සකස් කොට තිබුණු සැළැස්ම සහ එම කාලය තුළ ගොවිපල ලබා තිබූ දියුණුව සැසඳිය හැක.

මේ අවුරුදු දෙකක කාලය තුළදී වියදම් කිරීමට අපේක්ෂා කළ මුළු මුදල රුපියල් 1,15,485/- ක් වූ අතර නියත වශයෙන් රු. 1,31,700/- ක් වියදම් කොට තිබුනි. සැළසුම් කරන ලද වියදමට වැඩියෙන් රු. 16,315/- ක් (14%) වැය වී තිබුණේය. මේ කාලය තුළදී ලබා ගැනීමට බලාපොරොත්තු වූ ආදායම රු. 96,100/- ක් වූ අතර ඇත්තෙන්ම ලබා ගත් ආදායම රු. 44,800/- ක් (ගොවිතැන් කටයුතු වලින්) විය. මෙය ඇස්තමේන්තු කරන ලද ආදායමෙන් 47% ක් පමණි. මේ අනුව අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළදී වියදම් කිරීමට බලාපොරොත්තු වූ මුළු මුදලට වඩා 14% ක් වැඩියෙන් වැය වූයෙන් එක් අවුරුද්දක නියත ආදායම අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 53 ක ඌනතාවයක් සටහන් කළේය.

සටහන III-15 අවුරුදු දෙකක් සඳහා සැළසුම් කරන ලද වැඩ ප්‍රමාණය හා කර ඇති වැඩ ප්‍රමාණය

| බෝගය | සැළසුම් කළ අක්කර ප්‍රමා. | වගා කළ අක්කර ගණන | ලබා ඇති ප්‍රගතිය (%) |
|---|---|---|---|
| වැල් දොඩම් .. .. | 20 | 13 | 65 |
| තණ .. .. | 7 | 0 | - |
| තණ (වෙනත් බෝග සමඟ) | 50 | - | - |
| එළවළු හා පළතුරු .. | 25 | 1 | 4 |
| කුරුඳු .. .. | 5 | 4 | 80 |
| පොල් .. .. | 20 | 7 | 35 |
| රතු ළූණු හා මිරිස් .. | 10 | 0 | - |
| එකතුව | 137 | 25 | 184 |

සටහන III-16 ඇස්තමේන්තු කළ ආදායම

| විස්තරය | පළමු වසර රු. | දෙවන වසර රු. | තුන්වන වසර රු. |
|---|---|---|---|
| බිත්තර .. .. | 1,800 | 5,400 | 7,200 |
| කිරි .. .. | 8,760 | 13,140 | 16,520 |
| වැල් දොඩම් .. .. | 8,500 | 8,500 | 8,500 |
| රතු ළූණු .. .. | 6,250 | 6,250 | - |
| මිරිස් .. .. | 7,500 | 7,500 | - |
| අල හා එළවළු .. | 7,500 | 10,000 | 7,500 |
| පොල් .. .. | - | 5,000 | 7,500 |
| කුකුලන් විකිණීම (රු. 2.50 ගණනේ රු. 3000 ක්) .. | - | - | 7,500 |
| එකතුව | 40,310 | 55,790 | 54,720 |

## සටහන III-17 තුන් අවුරුදු සංවර්ධන සැළැස්ම

| විස්තරය | පළමු වසර | දෙවන වසර | තුන්වන වසර |
|---|---|---|---|
| කුකුල් පාලනය (කුකුලන් ගණන) | 1,500 | 1,000 | 1,000 |
| ගව පාලනය (මුරා වර්ගයට අයත්) | 10 | 5 | 5 |
| වැලි දොඩම් (අක්කර) | 10 | 10 | - |
| තණ (අක්කර) | 5 | 2 1/2 | 5 |
| තණ (වෙනත් වගාවන් සමඟ) | 25 | 25 | - |
| එළවළු සහ පළතුරු (අක්කර) | 10 | 15 | 10 |
| කුරුඳු (අක්කර) | - | 5 | 5 |
| පොල් (අක්කර) | - | 20 | - |
| වැටු (අක්කර) | 2 1/2 | 2 1/2 | - |
| මිරිස් (අක්කර) | | | |

මූලාශ්‍ර: ප්‍රොවිඩන්ස් සමුපකාර ගොවිපලේ වාර්තා

ආර්ථිකමය වශයෙන් අසතුටුදායක අයුරින් මුදල් වැය කර ඇති බව මෙහිදී සැළකිල්ලට ගත යුතු වේ. මුළු වියදම වූ රු. 1,31,700/- න් 90% ක්ම (රු. 1,16,300/-) පුනරාවර්තන කටයුතු සඳහා වැය කොට තිබුනි. අනෙක් අතට මේ කාලයේදී ලබා ගත් මුළු වත්කම රු. 44,800/- ක් වූයෙන් එය පුනරාවර්තන වියදමින් 38% ක් පමණකි. ප්‍රාග්ධන වියදම් ගැන සළකන විට ඒවා දිගු කාලයකදී පියවා ගත හැකි යයි බලාපොරොත්තු විය හැකි නමුදු ගොවිපලේ පුනරාවර්තන වියදම් වලින් 60% කටත් වඩා පියවා ගැනීමට නොහැකි වීම, දැඩි අවධානයක් යොමු විය යුතු කරුණකි.

ගොවිපලේ ආර්ථික ක්‍රියාකාරිත්වය අගැයුම් කරන විට පෙනී යන වැදගත් කරුණු කිහිපයකි.

1. අවුරුදු දෙකක කාලය තුළදී කරන ලද වියදම එනම්, රු. 1,31,700/- එම කා ලය සඳහා වියදම් කිරීමට බලාපොරොත්තු වූ මුදල එනම්, රු.1,15,485/- ට වඩා 14% කින් වැඩි වන්නේය.
2. අවුරුදු දෙකක කාලය තුළ ගොවිපල කටයුතු වලින් ලැබුණු වත්කම එනම්, රු. 44,800/- අපේක්ෂිත ආදායම වූ රු. 96,100/- හා සසඳන විට සියයට 53 ක ඌනතාවයක් සටහන් වේ.
3. මේ අවුරුදු දෙක තුළද ගොවිපලේ සිදු වී ඇති කෘෂිකාර්මික නිෂ්පාදනය අතිශයින් පහත් තත්වයක විය. සටහන III-19 මේ බව පෙනී යයි.

4. ඇතැම් කටයුතු පිළිබඳ අපේක්ෂාවන් එතරම් සතුටුදායක නැත. උදා: කිරි පට්ටිය, ඌරු පට්ටිය, වැලි දොඩම් වගාව යනාදිය බලාපොරොත්තු වූ පරිදි සාර්ථක නොවීය.

5. සැළැස්මෙන් බලාපොරොත්තු වූයේ පුද්ගලයින් 50 දෙනෙකුට පමණ රැකියා අවස්ථා සැපයීමටය. අධ්‍යයනය කළ අවස්ථාවෙහි ගොවිපලට සාමාන්‍යයෙන් දිනපතා පැමිණියේ සාමාජිකයින් 10 දෙනෙක් පමණි. මේ නිසා පුද්ගලයෙක් සඳහා දරන ලද වියදම ඇස්තමේන්තු කරන ලද වියදමින් පස් ගුණයක් පමණ විය.

මේ සියල්ල නිසා ගොවිපලේ ආර්ථික කටයුතු අසතුටුදායක තත්වයකට පත් වී තිබුණි. මේ ගොවිපලේ කළමනාකාරිත්වය විසින් වඩා ඥානාන්විත මූල්‍ය පාලනයක් අනුගමනය නොකළහොත් ගොවිපල ලාභ දායක ආර්ථික ව්‍යාපාරයක් වේ යයි අපේක්ෂා කළ නොහැක.

සටහන III-18 ඇස්තමේන්තු කළ වියදම

| විස්තරය | පළමු වසර රු. | දෙවන වසර රු. | තුන්වන වසර රු. |
|---|---|---|---|
| **පශු පාලනය** | | | |
| කිරි පට්ටියට සතුන් මිළදී ගැනීම | 6,000 | 3,000 | 3,000 |
| තෘණ .. .. .. | 500 | 250 | 500 |
| උපකරණ .. .. .. | 250 | – | – |
| ගව මඩුව .. .. | 3,000 | 1,500 | 1,500 |
| පුන්නක්කු (ටොන් 2) .. | 560 | – | – |
| නඩත්තුව (දිනකට රු. /– බැගින්) | 5,400 | 2,700 | 2,700 |
| කුකුලන් මිළදී ගැනීම (කුකුලකු රු. 4/– බැගින්) .. .. | 7,250 | 5,500 | 5,500 |
| ගොඩනැගිලි හා උපකරණ .. | 6,000 | 4,000 | 4,000 |
| කුකුල් ආහාර (ටොන් 6) .. | 2,880 | 1,920 | 1,920 |
| එකතුව | 31,840 | 18,870 | 19,120 |
| **ගොවිතැන** | | | |
| වැට කඩොලු බැඳීම .. .. | 8,000 | 6,400 | |
| අල වගාව .. .. | 5,000 | 7,500 | 5,000 |
| වැලි දොඩම් වගාව (අක්කරයට රු. 1,000/– බැගින්) | 10,000 | 10,000 | – |

| විස්තරය | | පළමු වසර රු. | දෙවන වසර රු. | තුන්වන වසර රු. |
|---|---|---|---|---|
| ගොඩනැගිලි (15' . 10') | .. | 3,000 | - | - |
| පොල් ගස් යට තණ වගාව | .. | 500 | 500 | - |
| පැලැටි මිලදී ගැනීම .. | .. | - | 675 | - |
| රතුළුණු (අක්කර 2 1/2) | .. | - | 5,500 | - |
| මිරිස් (අක්කර 2 1/2) | .. | - | 5,700 | 5,700 |
| අනෙකුත් .. | .. | 1,000 | - | - |
| | එකතුව | 27,500 | 37,275 | 10,700 |
| | මුළු එකතුව | 59,340 | 56,145 | 29,820 |

මූලාශ්‍රය: ප්‍රොවිඩන්ස් සමූපකාර ගොවිපල

ශිල්පීය කරුණු

මේ ඉඩම පවරා ගැනීමට අවුරුදු කිහිපයකට පෙර එය නොසැළකිල්ලට ලක් වෙමින් තිබුණි. පස් පරීක්ෂාවන් සිදු කර තිබුනේ නැත. කෙසේ වුවත් අපේක්ෂිත සාමාජික සංඛ්‍යාව පනස් දෙනෙක් පමණ වූ නිසා සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කළ හැකියේ පෙනිණි. ගොවිපලේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 20% ක් පමණක් හෙළි කොට තිබීමෙන් පෙනී යන්නේ කළමනාකාරීත්වයෙහි දුබලතාවය විනා සැළැස්මෙහි ඇති ශිල්පීය සාවද්‍යතාවයක් නොවේ. හොඳින් පාලනය කරමින් පැවති කුකුළු කොටුව හැරුණුවිට සෙසු පශු පාලන කටයුතු අසතුටුදායක තත්වයක පැවතුණි. ඌරන් සඳහා සුදුසු මඩු සාදා තිබුණේ නැත. කිරි පට්ටිය එතරම් හොඳින් නඩත්තු කරමින් නොතිබුණ අතර ඒ සඳහා ශිල්පීය උපදෙස් ලබා ගත යුතුව තිබුණේය.

කළමනාකරණ අංශය

කළමනාකාරීත්වයේ කාර්යක්ෂමතා වය අගය කෙරෙනුයේ ප්‍රතිඵල අනුසාරයෙනි. මේ ගොවිපල සමාජයීය හා ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටියද එම තත්වයෙහි ගැඹුරු බව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට අවබෝධයක් නොමැති සේ පෙනුනි. ඇතැම් සාමාජිකයින් මේ ගැටළු පිළිබඳව අවබෝධයක් ඇතිව සිටි බවක් පෙනුනත් කිසියම් වාසනාවන්ත සිදුවීමක් තුළින් මේ තත්වය හොඳ අතට හැරේවිය යන අපේක්ෂාවෙන් ඔවුන් සිටි බවක්ද දක්නට ලැබිනි.

ගොවිපලෙහි කළමනාකාරීත්වය උදාසීන බවක් දැක්වූ අතර ආසන්න ආර්ථිකමය විනාශය ඔවුන් විසින්ද අපේක්ෂා කරන ලදී. නිලධාරීන් තුළ නායකත්වය ගැනීමේ ලක්ෂණ එතරම් දක්නට නොතිබුණි. අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටි අය මෙන්ම ව්‍යාපාර කළමනාකරුටද යථා පුහුණුවක් දීම අවශ්‍ය වූවේය. කෘෂිකාර්මික ව්‍යාපාරයක් පාලනය කිරීම ගැන නිලධාරීන්ට දැනුමක් නොතිබුණ අතර මේ තත්වය යටතේ, වැරදි කර යළි පාඩම් ඉගෙන ගනිමින් සංවර්ධන සැළැස්මක් ක්‍රියාත්මක කළ හැකි යයි කිසිසේත් සිතිය නොහැක.

සමාජයීය අංශ

සාමාජිකයින් පදිංචි වී සිටියේ ගොවිපලෙහි නොව අසල ගම්වලය. පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වූ සවභාවයක් සාමාජිකයින් තුළ දක්නට නොලැබුණි. මෙවැනි කාණ්ඩයක් බිහි වීම සඳහා අවශ්‍ය ආර්ථික සානුබල සහ පරිපාලන මාර්ගෝපදේශකත්වය ලැබී තිබුණේ නැත.

මේ ගොවිපල අවට ගම් සමඟ ඒකාබද්ධ වීම අතින් එතරම් සාර්ථකත්වයක් ලබා නොතිබුණි. අවට ගම්වල සිටි බොහෝ අය මේ ඉඩමින් අක්කරයක් හෝ දෙකක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටි අය වූහ. ගම් කිහිපයකින් තරුණයින් 50 දෙනෙකු පමණ තෝරාගෙන සමූපකාර ගොවිපලක් පිහිටුවීම ගම්වැසියන්ගේ අපේක්ෂාවන්ට පටහැනි විය. බඳවා ගත් තරුණයින් පනස් දෙනා පවා, ගොවිතැන සුදුසු වෘත්තියක් ලෙස නොසැලකූයෙන් වැඩිකල් ගොවිපලෙහි රැඳී නොසිටියහ. ගොවිපල හැර යන්නන්ගේ සංඛ්‍යාව ඉතාමත් ඉහළ මට්ටමක පැවතුණි. ඉතිරි සාමාජිකයින්ගේ උද්‍යෝගයද පිරිහෙමින් පැවතුනේය.

### 3.4 සමූපකාර ගම්මාන අගැයුම

භෞතික සැළසුම්

ගිලීමලේ සහ ලස්සනගම යන සමූපකාර ගොවිපලවල්වල බලාපොරොත්තු වලින් පිරි සංවර්ධිත සැළසුම් දක්නට ලැබුණි. සැළසුම් ක්‍රියාත්මක කිරීමේදී ලස්සනගම හොඳින් කටයුතු කළ නමුදු ගිලීමලේ එය එතරම් හොඳින් නොකෙරිනි. අඩුම බලාපොරොත්තු සහිත සංවර්ධිත සැළැසීම දක්නට ලැබුනේ බැද්දේගම සමූපකාර ගම්මානයෙහිය. එහි ඇතැම් ඉලක්ක ඉක්මවනු ලැබිනි. ප්‍රොවිඩන්ස් සහ මීපිලිමාන යන ගොවිපලවල්වල සැළසුම්ද සමාන්තර මට්ටමක විය. මේ දෙකෙන් මීපිලිමාන ගම්මානයෙහි කටයුතු ප්‍රොවිඩන්ස්හි කාර්යයනට වඩා හොඳ තත්වයක විනි. පහලොස් මාසයක් ඇතුළතදී බැද්දේගම සමූපකාර ගොවිපල අක්කර 306 ක් පමණ නගා සිටවූ අතර සාමාජිකයින් එකසිය තිස්පස් දෙනෙකු පමණ ඒ සඳහා යොදා ගන්නා ලදී. මේ කාලය තුළ ඔවුන්ගේ ඉලක්කය වූයේ අක්කර 258 ක් වගාව යටතට පත් කිරීමටය. මෙනයින් 18% කින් ඉලක්කය ඉක්මවා ගිය බව පෙනේ. ලස්සනගම ගොවිපල එහි පළමුවන වසර තුළදී අක්කර 372 ක් නගා සිටුවීමට බලාපොරොත්තු වූ අතර ඉන් 347 ක්, එනම් 93% ක් දියුණු කිරීමට එයට හැකි විය. අනිත් ගොවිපලවල් තුනේ ප්‍රගතිය එතරම් සතුටුදායක නොවීය. ඒ ඒ ගොවිපලෙහි සැළසුම් ක්‍රියාත්මක කිරීම අතින් ලබා ගත් අත්දැකීම් මත පිහිටා පහත සඳහන් පොදු නිරීක්ෂණ සහ නිගමන ඉදිරිපත් කළ හැකි වේ.

දීර්ඝ කාලීන සහ කෙටි කා ලීන සැළසුම්

දීර්ඝකාලීන සැළැස්මක් සහ අංග සම්පූර්ණ කෙටිකාලීන සංවර්ධිත සැළැස්මක් පිළියෙල කිරීම අත්‍යවශ්‍ය දෙයකි. දීර්ඝකාලීන සැළැස්මේදී සාමාන්‍ය භෞතික සහ මූල්‍ය අංශ දැක්විය යුතුය.

## <u>සටහන III-19</u> 1971 නොවැම්බර් සිට 1973 ඔක්තෝබර් දක්වා නියත ආදායම සහ වියදම් විස්තරය

### ආදායම

| අංශය | ප්‍රමාණය රු. |
|---|---|
| බිත්තර | 19,242 |
| කුකුලන් | 4,512 |
| ට්‍රැක්ටර් කුලිය | 10,778 |
| කුරඳු | 84 |
| වැල් දොඩම් | 1,102 |
| එළවළු | 486 |
| මිරිස් | 155 |
| පොල් | 1,449 |
| කොටස් මුදල් | 6,053 |
| අනෙකුත් ආදායම් | 857 |
| කිරි | 142 |
| පලතුරු | 4 |
| රජයේ දීමනාව | 92,250 |
| වැල් දොඩම් සහනාධාරය | 4,818 |
| ණය | 26,500 |
| | 168,432 |

### වියදම

| | ප්‍රමාණය රු. |
|---|---|
| <u>ප්‍රාග්ධනය</u> | |
| කුකුළු කොටුව | 4,492 |
| ඌරු කොටුව | 1,317 |
| ගව මඩු | 791 |
| එළු මඩුව | 125 |
| කාර්යාලය | 1,292 |
| ගොවිපල උපකරණ | 2,373 |
| වැට කඩොලු | 2,347 |
| ගබඩා | 2,586 |
| එකතුව | 15,323 |
| <u>පුනරාවර්තන වියදම්</u> | |
| සාමාජික දීමනා | 18,989 |
| වැල් දොඩම් | 18,404 |
| එළවළු පාත්ති | 1,071 |
| කුකුල් පට්ටිය | 2,378 |
| එළුවන් සඳහා | 2,071 |
| ඌරු කොටුව | 533 |
| සුළු මුදල් | 5,770 |
| උත්සව දීමනා | 2,936 |
| කුකුල් කොටුව | 19,585 |
| ගවයින් | 3,625 |
| විවිධ දීමනා | 29,773 |
| පාලනය | 900 |
| අනෙකුත් දීමනා | 10,342 |
| | 131,700 |

මූලාශ්‍ර: ප්‍රොවිඩන්ස් ගොවිපලේ වාර්තා

ඇතැම්විට අවුරුද්දක් සඳහා වන කෙටි කාලීන සංවර්ධන සැලැස්මේදී සවිස්තරව සැලසුම් කරන ලද භෞතිකමය සංවර්ධනය, ශ්‍රමය, උපකරණ ආදී වශයෙන් අවශ්‍ය වන්නාවූ ප්‍රධාන යෙදවුම් ඒ ඒ අංශ සඳහා වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සහ අරමුදල් ලබා ගන්නා මූලාශ්‍ර යනාදිය දැක්විය යුතු වේ. මේ සඳහා විවිධ විෂයයන් පිළිබඳව අවබෝධයක් ඇති මේ කාර්යය සඳහා නිරතුරුව නියැලී සිටින දිස්ත්‍රික් මට්ටමේ පිරිසක් අවශ්‍යය. විවිධ දෙපාර්තමේන්තු කිහිපයකින් හිතුමනාපයට තෝරා ගත් පුද්ගලයින් කිහිප දෙනෙක් සිය අදහස් එක්කොට සැලැස්මක් වශයෙන් ඉදිරිපත් කරන වැඩ පිළිවෙල සාර්ථක වීමට ඉඩ නැත.

දීර්ඝකාලීන සැලසුම් පිළියෙල කිරීමේදී සහ කෙටිකාලීන ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු හතරකි:

(අ) ශිල්පීය ශක්‍යතාවය

(ආ) ශ්‍රම අවශ්‍යතාවය

(ඇ) මූල්‍ය අවශ්‍යතා වය

(ඈ) සමාජයීය අංශය

(අ) ශිල්පීය ශක්‍යතාවය: කිසියම් ව්‍යාපාරයක ශිල්පීය ශක්‍යතාවය තීරණාත්මක වශයෙන් වැදගත් වන අතර සැලසුම් සම්පාදන අවදියේදී ඒ ගැන සාවධානව නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍යය. දිස්ත්‍රික්ක මට්ටමේදී වැදගත් ශිල්පීය කරුණු ඇතුළත් ලේඛනයක් සකස් කළ හැකි නමුදු ඒ ඒ ගොවිපලේ පිහිටීම සහ ප්‍රදේශය අනුව ඇතැම් විශේෂ අංශ පිළිබඳව අවධානය දැක්වීමට සිදු වනු ඇත. ශිල්පීය අංශය ගැන සැලකීමේදී පහත සඳහන් කරුණු තුනට මූලිකත්වය දිය යුතුය.

I. පවත්නා සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ගත හැකි වන පරිදි ගොවිපලේ ශිල්පීය හැකියාවන් පරීක්ෂා කර බැලීම;

II. ගොවිපලක් සංවර්ධනය කිරීමේදී මතු විය හැකි උග්‍ර ශිල්පීය බාධාවන් මොනවාද යන්න ගැන යථා අවබෝධයක් ලබා ගැනීම;

III. මුදල් අපතේ යාම වැළැක්වීම.

ගොවිපලෙහි පස සහ දේශගුණික තත්වය අනුව සළකන විට යෝජිත බෝග කොතෙක් දුරට ගැලපේද යන්න පරීක්ෂා කළ යුතුය. උදාහරණයක් ලෙස ප්‍රොවිඩන්ස් ගොවිපල ගැන සළකන විට, දීර්ඝ කාලයක් තිස්සේ එය නොසැලකිල්ලට ලක් වෙමින් පැවති නිසා පස සේදායාම තදින් සිදු වී ඇති හෙයින් නව වැල් දොඩම් වගාව එතරම් හොඳින් දියුණු නොවූ බව පෙනේ. ගිලිමලේ අක්කර 331 ක සත තැලය හෙළි කිරීමත් සමගම බෝග 16 ක් පමණ වගා කිරීමට උත්සාහ කිරීම එතරම් ඥානාන්විත සැලැස්මක් හැටියට සැළකිය නොහැක. මාස විස්සක් පමණ කාලයක් තුළ කරන ලද සංවර්ධන කටයුතු වලින් පසුව මේ ගම්මානයට සම්පූර්ණ කළහැකි වූයේ සැලැස්මෙන් 11% ක් පමණකි. පීපිලිමාන ගොවිපලෙහි මාස 10 ක් ගත වීමෙන් පසුව වුවද ගොවිපලට සුදුසු වර්ගයේ

සතුන් සොයා ගැනීමට හැකි වී නොතිබුණි. මේ කරුණු සැළසුම් අවදියේදී පරීක්‍ෂාවට භාජනය කළ යුතුව තිබුණි.

ශිල්පීය හැකියාව ගැන සැළකීමේදී, උපයෝගී කරගත හැකිව තිබූ ඇතැම් සම්පත් පැවති බව පෙනී යයි. බැද්දේගම මාස 15 ක් ගත වීමෙන් පසුව වුද, අංග සම්පූර්ණ ජේ කර්මාන්ත ශාලාවක්, කළමනාකාරීත්වයෙහි සහ සාමාජිකත්වයෙහි උනන්දුව නැති නිසා උපයෝගී කරගෙන නොතිබුණු බව දක්නට ලැබුනි. ආරම්භයේදීම සැළසුම් සම්පාදකයින් විසින් මේ කර්මාන්ත ශාලාව ගැන සැළකිලිමත් වී එය ප්‍රයෝජනයට ගැනීමට ප්‍රයත්නයක් දැරිය යුතුව තිබුණේය. එසේම ගිලීමලේ සැළසුම්කරුවන් අදාළ වත්කම් පිළිබඳව සැළකිලිමත් වූයේ නම් එහි තිබුණ දැව අඩු වඩාත් ලාභදායී අයුරින් ප්‍රයෝජනයට ගත හැකිව තිබුණි.

ලස්සනගම ගොවිපලෙහි ඉතා විශාල එමෙන්ම නොයෙකුත් පහසුකම් ඇති ගොඩනැගිල්ලක් සංචාරක මධ්‍යස්ථානයක් සඳහා යොදාගෙන තිබුණ නමුත් එහි සාමාජිකයින් පදිංචි වී සිටියේ ඉතා කුඩා එමෙන්ම සනීපාරක්‍ෂාවෙන් තොර නිවාසවලය. මෙවැනි දේවල් නිසා නොයෙකුත් සමාජ, ආර්ථික ප්‍රතිවිපාක ඇති විය හැකිය.

අනවශ්‍ය වියදම් මග හරවා ගැනීමේ ප්‍රයත්නයකදී, යෝජිත සියළුම අංග අත්‍යවශ්‍යමදැයි සැළසුම් සම්පාදකයින් සැළකිල්ලට ගත යුතුය. උදාහරණයක් ලෙස ලස්සනගම වතුර ටැංකි 10 ක් පමණ ඉදි කිරීමත් ඒවාට ජලය ලබා ගැනීම සඳහා ජල නල ක්‍රමයක් යොදා තිබීමත් කොතෙක් දුරට ප්‍රයෝජනවත්ද යන බව ප්‍රශ්න කිරීමට පිළිවන. එසේම ගොවිපල සඳහා ජීප් රථයක් සහ වතුර පොම්ප පිළදී ගැනීමට එතරම් ඉහළ ප්‍රමුඛත්වයක් දිය යුතුද යන්න ප්‍රශ්න කිරීමට පිළිවන.

ගොවිපල පිහිටුවීම සඳහා සුදුසු භූමි භාගයක් තෝරා ගැනීම ඉතා වැදගත් වේ. අර්ධ වශයෙන් දියුණු කරන ලද, නැතහොත් කලක් හොඳින් සංවර්ධනය කර තිබී නමුත් පසුව එතරම් හොඳින් නඩත්තු නොකරන ලද ඉඩමක් ගොවිපලක් පිහිටුවීම සඳහා සුදුසු විය හැක. බැද්දේගම සහ ලස්සනගම යන ගොවිපලවලට මේ වාසිය ලැබී තිබේ. ගොවිපලෙහි තේ, රබර්, පොල් යනාදී බෝග ආරම්භයේ සිටම පැවතීම නිසා මුල සිටම ඉඩම දියුණු කිරීමට සිදු වන පුරෝගාමී තත්වයකදී මෙන් නොව සාමාජිකයින් තුළ මෙන්ම කළමනාකාරීත්වය තුළදී ආරක්‍ෂාව හා බලාපොරොත්තුව පිළිබඳ හැඟීමක් ඇති වන්නේය.

ගොවිපලක් සඳහා වනගත ඉඩමක් තෝරා ගත් විට, අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් දියුණු කරන ලද ඉඩමක් ඇති අවස්ථාවකට වඩා නොයෙකුත් ගැටළුවලට මුහුණ පෑමට කළමනාකරුවන්ට හා සාමාජිකයින්ට සිදු වේ. සංවර්ධනය නොකරන ලද ඉඩම් සඳහා කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් පොදු දීමනාවක් නිශ්චය කොට තිබීම යථාර්ථවාදී නොවේ. මෙහිදී කිසියම් නම්‍යතාවයක් තිබීම වඩාත් අගනේය.

ආශ්‍රිත ඉඩම් සඳහා සැළසුම් සම්පාදනය කිරීමේදී පස, වාරිමාර්ග සහ බෝග යනාදිය පිළිබඳව විශේෂඥයින්ගේ අදහස් විමසා බැලීම අවශ්‍ය වන්නේය. මේ අනුව ගොවිපල සඳහා

භූමි භාගයක් තෝරා ගැනීම මේ හා අදාළ නොයෙක් විෂයයන් පිළිබඳව දැනීම ඇති අයගෙන් සමන්විත කණ්ඩායක් විසින් ඒ ඒ ප්‍රදේශයේ ඇති සම්පත් පිළිබඳව දන්නා ප්‍රදේශවාසීන්ගේ අදහස්ද විමසා කළයුතු අතර, විවිධ වර්ගවල ඉඩම් සඳහා (සංවර්ධිත ඉඩම්, අත්හැර දමා තිබූ ඉඩම්, වනගත ඉඩම් යනාදිය) සම්පත් වෙන් කළ යුත්තේ අදාළ ඉඩමේ අවශ්‍යතාවයන් පදනම් කරගෙනය.

(ආ) ශ්‍රම අවශ්‍යතාවය :  අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් ශ්‍රමය පවත්නා විට සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කළහැකි වන්නේ අඩි වශයෙන් පමණි. අනෙක් අතට ගොවිපලෙහි අවශ්‍ය ප්‍රමාණයට වඩා ශ්‍රමය පවත්නා විට ඒ බව එක වරටම පැහැදිලි නොවනු ඇත. අතිරික්ත ශ්‍රමය නිසා ශ්‍රමයෙන් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට නොහැකි වන අතර මේ බව සමහරවිට කළමනාකාරිත්වයට හෝ සාමාජිකයින්ට ප්‍රත්‍යක්ෂ නොවනු ඇත. මෙම තත්වය දිගු කාලයක් පැවතුනොත් අර්ධ සේවා නියුක්තිය ගොවිපලෙහි ලාභදායිත්වය කෙරෙහි අහිතකර අයුරින් බලපාන්නේය. කෙටි කාලීන සංවර්ධන සැළැස්මක් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රම අවශ්‍යතාවයන් පිළිබඳ ඌන-තක්සේරුවක් හා අධි-තක්සේරුවක් යන දෙවර්ගයම සාවද්‍යතාවයෙන් පළමුවැන්න එතරම්ම හානිකර නොවේ. ඌන තක්සේරුවක් ඇති විට පසු කාලයකදී මේ තත්වය අවබෝධ කරගෙන ශ්‍රම අවශ්‍යතා පිළිබඳ වඩාත් යථාර්ථවාදී තක්සේරුවක් කිරීමෙන් මෙම ප්‍රශ්නය විසඳා ගැනීමටත් පුළුවන.

කෙසේ වුවද ශ්‍රම අවශ්‍යතාවයන් අධි-තක්සේරු කිරීම මෙන්ම ඌන-තක්සේරු කිරීමද ගොවිපලෙහි කාර්යක්ෂමතාවය කෙරෙහි බලපාන නිසා සැළසුම් සම්පාදකයින් සෑමවිටම මේ පිළිබඳ සමාන්තර අත්දැකීම් සැළකිල්ලට ගනිමින් සිය ඇස්තමේන්තු පිළියෙල කිරීමට උත්සාහ කළ යුතුය. ඒ ඒ අවස්ථා සළකා පත් කරන කමිටුවකට වඩා, අවිච්ඡින්න ස්වභාවයක පවතින දිස්ත්‍රික් සැළසුම් කමිටුවක් පත් කිරීම පිණිස මෙයද එක් හේතුවක් ලෙස සැළකීමට පුළුවන.

මේ ගැන සළකන විට ලස්සනගම සමූපකාර ගොවිපලෙහි ශ්‍රම අවශ්‍යතාවයන් ඇස්තමේන්තු කිරීම වඩා නිරවද්‍ය ආකාරයකින් සිදු වී ඇති අතර බැද්දේගම ගොවිපලෙහි ඒ පිළිබඳව අධි-තක්සේරුවක් කර ඇති බව පෙනේ. නමුත් ගොවිපල අත්හැර යන අයගේ සංඛ්‍යාව අධික නිසා මෙම තත්වය පුළුවනින්ම අවබෝධ නොවීය. මීපිලිමානෙහි ශ්‍රම අවශ්‍යතාවයන් පිළිබඳව බරපතල ඌන තක්සේරුවක් කර තිබුණු බව පෙනේ. සැළසුම් ක්‍රියාත්මක කිරීම ඉතාමත්ම සෙමින් සිදු වූ අතර ඇතැම් වැඩ කොන්ත්‍රාත් ක්‍රමයට කරවා ගැනීමට සිදු විය. ඉතාමත්ම බලාපොරොත්තු සහිත සැළැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ශ්‍රම ප්‍රමාණය අඩුවෙන් තීරණය කිරීම, සැළසුම් ක්‍රියාත්මක කිරීම අඩ පන වීමට තුඩු දෙන මූලික හේතුවක් ලෙස දැක්වීමට පුළුවන. කෙසේ වුවද ගිලීමලේ මෙන් මෙහිදීද අනිකුත් සමාජ, ආර්ථික සහ පරිපාලන ගැටළු සඵලතාවය කෙරෙහි තදින් බලපා ඇති නිසා මේ කරුණ පමණක් අවධාරනය කිරීම සාවද්‍යය.

(ඇ) මූල්‍ය අවශ්‍යතාවය

ගොවිපලක මූල්‍ය අවශ්‍යතාවය තරමක් නිවැරදි ආකාරයකින් දීර්ඝකාලීන සැළැස්මෙහි දැක්වීමට පුළුවන. පස් අවුරුදු සැළැස්මක් ප්‍රයෝජනවත් වන නමුදු තුන් අවුරුදු සැළැස්මක්, ප්‍රමාණවත් විය හැක. මෙවැනි දීර්ඝකාලීන සැළැස්මක ප්‍රයෝජනය සීමාසහිතය. සංසන්දනාත්මක

දෘෂ්ටි කෝණයකින් ඒ ඒ යෝජනා ක්‍රම තෝරා ගැනීම සඳහා මෙය ප්‍රයෝජනවත් විය හැකිය. කෙසේ වුවද ක්‍රියාත්මක වැඩපිළිවෙලක් ලෙස එහි ඇති වැදගත්කම ඉතාමත්ම සීමාසහිතය. දීර්ඝ කාලීන සැළැස්ම සකස් කිරීමේදී සැළකිල්ලට ගනු ලබන ගොවිපලට බාහිර සහ එය තුළ පවත්නා විචල්‍යයන් සහ උපකල්පනයන් බොහෝවිට අනපේක්ෂිත මාර්ගයකට යොමු වන හෙයින් මූලික සැළැස්ම ඉක්මණින්ම යථාර්ථවාදී නොවන ස්වභාවයකට පත් වන්නේය. මේ සීමාසහිතකම් හැරුණු විට දීර්ඝ කාලීන සැළැස්මක් සැකසීම නොයෙකුත් කරුණු නිසා අත්‍යවශ්‍ය වෙතැයි සිතිය හැකිය.

ප්‍රයෝජනවත් දීර්ඝකාලීන සැළසුම්වල ඒ ඒ බෝග සහ පශු පාලනය පිළිබඳ ඇස්තමේන්තු, ගොවිපලේ විවිධ කාර්යයන් සඳහා සැළසුම් කරන ලද ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් හා අපේක්ෂිත ආදායම අඩංගු විය යුතුය. දීර්ඝකාලීන සැළැස්මේ අඩංගු වන සෑම වර්ෂයක් සඳහාම මේ ඇස්තමේන්තු සකස් කිරීම අවශ්‍යය. මේ කටයුත්තේදී යෝජිත බෝග සහ ව්‍යාපාර පිළිබඳව අත්දැකීමක් ඇති දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් යොදවා ගැනීම ආධාරකාරී වනු ඇත.

කෙටිකාලීන (වාර්ෂික) වැඩ සටහන්වලදී ගොවිපලේ එක් එක් අංශයක් සඳහා වන වියදම් සහ ආදායම් ඇස්තමේන්තු සුපරීක්ෂාකාරීව පිළියෙල කළ යුතුය. මෙවායේ ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරුවලට අමතරව ශ්‍රම අවශ්‍යතාවයන්ද දැක්විය යුතුය. මේ වැඩ සටහන් වලදීද ත්‍රෛමාසික කාලසීමාවන් වෙන් වෙන්ව දක්වා පහත සඳහන් තොරතුරු ඇතුළත් කළ යුතුය:

I. භෞතික සංවර්ධනය පිළිබඳ ඇස්තමේන්තුව – එනම්, ඒ ඒ බෝගය වැවීමට බලාපොරොත්තු වන අක්කර ගණන, බලාපොරොත්තු වන තුකුලන් හෝ වෙනත් සතුන් ගණන;

II. ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ ඇස්තමේන්තු;

III. ගොවිපලෙන් සහ වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගැනීමට බලාපොරොත්තු වන ආදායම් පිළිබඳ ඇස්තමේන්තු.

පළමුවන අවුරුද්ද තුළදී ගොවිපලේ විවිධ අංශ සඳහා යන වියදම්, භාවිතා කරනු ලැබෙන යෙදවුම් හා ලැබෙන ආදායම් පිළිබඳ නියම ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන්, පසුකාලීන වර්ෂ සඳහා වඩා නිරවද්‍ය සැළසුම් මෙන්ම දීර්ඝකාලීන සැළසුම් සකස් කිරීමට හැකි වන්නේය.

අධ්‍යයනය කරන ලද සමුපකාර ගම්මාන පහේ සැළසුම් එක් අවුරුද්දක සිට අවුරුදු 7 දක්වා විය. පීපිලිමාන අවුරුදු 1 යි. ප්‍රොවිඩන්ස් අවුරුදු 3 යි. බැද්දේගම අවුරුදු 4 යි. ලස්සනගම අවුරුදු 5 යි. ගිලීමලේ අවුරුදු 7 යි. මේ අධ්‍යයනයෙන් පෙනී යන වැදගත් කරුණක් නම් මේ ගොවිපල පහේ සැළසුම්වල කිසියම් සමානත්වයක් නොවීමයි. උදාහරණයක් වශයෙන් ලස්සනගම ගොවිපලෙහි අපේක්ෂිත ප්‍රතිලාභ ගණන් බලා නොතිබුණි. එසේම ඒ ඒ වර්ෂයේදී එක් එක් බෝගය හෝ ව්‍යවසාය සඳහා වැය කළ යුතු මුදලද ගණනය කර නැත. මෙවැනි විස්තර නොමැතිව සැළසුම්වල ඇති ප්‍රයෝජනය ඉතාමත්ම සීමිත වේ.

බද්දේගම ගොවිපලෙහි ආදායම් සහ වියදම් ගණන් බැලීමේදී බෝග කොටස් දෙකකට බෙදා තිබුණි. පුනරුත්ථාපනය කරන ලද බෝග සහ අළුත් බෝග යනුවෙනි. සැළසුම් කිරීමේදී සිදු වන වැරදි නිසා ගොවිපල අසාර්ථක වීමට බොහෝදුරට ඉඩ තිබේ. ප්‍රොවිඩන්ස් ගොවිපලෙහි සැළසුම් වඩා හොඳින් සකස් කොට තිබුණු නමුදු ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පැහැදිලිව ගණන් බලා නොතිබුණි. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් ගිලිමලේ ගොවිපල සම්බන්ධයෙන් සකස් කොට තිබූ එක් අවුරුදු සැළැස්ම ඊට කලින් සකස් කොට තිබූ සැළැස්මට වඩා සතුටුදායක වූවේය.

(ඈ) සමාජයීය අංශය: සැළසුම්වලට අනුව මෙතෙක් ලබා ඇති ප්‍රගතිය, සමාලෝචනය කිරීම - සමූපකාර ගොවිපලක් සම්බන්ධයෙන් තාර්කික සැළැස්මක් සකස් කිරීමෙන්ම ඒ ගොවිපල සාර්ථක වේ යයි කිව නොහැකිය. කෙසේ වුවද සැළසුම් සම්පාදනයේදී සිදු වන වැරදි නිසා ගොවිපල අසාර්ථක වන්නට බොහෝදුරට ඉඩ ඇත.

ගොවිපලක් දියුණු කිරීම සඳහා යෝග්‍ය සැළැස්මක් අවශ්‍ය වන අතර එහිදී සාමාජිකයින්ගේ උනන්දුවද කළමනාකරුවන්ගේ හැකියාවද විශේෂයෙන් වැදගත් වේ. සැළසුම් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතුය.

(අ) භෞතික ප්‍රගතිය

(ආ) ආර්ථික සාධනයන් - I. මුදල්
II. පිරිවැය
III. ප්‍රතිලාභ

(ඇ) සමාජයීය පරිසරය- I. අභ්‍යන්තර එක්සත්කම
II. බාහිර ඒකාග්‍රතාවය

සැළැස්මක මේ සියළුම අංග පිළිබඳව සළකනවිට කෘෂි-ව්‍යාපාර පාලනයේදී එය 'පාලනය' යනුවෙන් හැඳින්වෙන සංකල්පය අවබෝධ කරගත යුතු වන්නේය. මෙහිදී පාලනය සහ සැළසුම් ක්‍රියාත්මක කිරීම පැහැදිලි කර දීම සඳහා සටහනක් උපයෝගී කර ගනු ලැබේ. (රූප අංක I බලන්න) මේ සටහන අනුව, දීර්ඝකාලීන සහ කෙටිකාලීන සැළසුම්වල ආර්ථික, සමාජයීය හා භෞතික යන අංග ක්‍රියාකාරී පරිපාටියක් තුළින් අදාළ අංශයන්හී අරමුණු කරා යොමුවන අන්දම දැක්වේ. 'පාලන' ක්‍රම දාමයේදී අනුගමනය කළයුතු පියවර හතරකි.

(අ) සමාලෝචනය හා වාර්තා කිරීම

(ආ) තෝරතුරු විශ්ලේෂණය

(ඇ) කළයුතු වැඩ පිළිබඳව තීරණය කිරීම

(ඈ) අදහස් හුවමාරුව සහ උපදෙස්

දෙවන රූප සටහනින් දැක්වෙන පරිදි, සැළසුම් ක්‍රියාත්මක වන අතරම යම් යම් නිශ්චිත කාල පරිච්ඡේදවලදී සහ සැළැස්ම මැනවින් ක්‍රියාත්මක නොවන අවස්ථාවලදීද ඒ පිළිබඳව සමාලෝචනයක්

කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය විශ්ලේෂණය සඳහා සුදුසු ස්වරූපයකින් වාර්තා ගත කළ යුතුය. රූප සටහනෙහි (අ) මගින් සමාලෝචනය සහ වාර්තා කිරීමේ අවදිය දැක්වේ. ඊළඟට විශ්ලේෂණය (ආ) මගින් දැක්වේ. විශ්ලේෂණයෙහිදී අලුත් තීරණ ගැනීමත් සමහරවිට අලුත් ආකාරයකට ක්‍රියාත්මක කිරීමත් අවශ්‍ය වනු ඇත. මේ අවධියේදී සැළසුම් වඩා ගතානුගතික යයි හැඟී ගියහොත් හෝ ඒවායින් ගොවිපලේ සාකල්‍යතාවය අඩුවෙන් ඇස්තමේන්තු කෙරී ඇතැයි පෙනී ගියහොත් අලුත් ඉලක්කයන් තීරණය කිරීමට පුළුවන. ඊට ප්‍රතිවිරුද්ධ තත්වයක් සිදුව ඇත්නම් ඒ අනුව ක්‍රියා කිරීමට පිළිවන. සමාලෝචනය හා උපදෙස් දීම අතර කාල පරතරය හැකිතාක් දුරට පටු විය යුතුය. මෙසේ සමාලෝචනය කිරීම, විශ්ලේෂණය කිරීම, තීරණ ගැනීම සහ උපදෙස් දීම වැනි ක්‍රියාවලිය අවිච්ඡින්න විය යුතුය.


සමාලෝචනය සාරානුකූල විය යුතු අතර භෞතික, ආර්ථික සහ සමාජයීය අංශ එයින් ආවරණය විය යුතුය. බෝග වගා කිරීමේදී හෝ පශු පාලනයේදී ලබා ඇති ප්‍රගතිය, මුදල් යෙදවීම, වියදම් සහ ආදායම් යන කරුණු මෙන්ම කළමනාකාරිත්වයේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වය ඇතුළු සමාජ පරිසරයද සමාලෝචනයෙහිදී සැළකිල්ලට ලක්විය යුතු වේ.

පදිංචිකරුවන් තෝරා ගැනීම

සමාජයීය හා ආර්ථික වශයෙන් සමූපකාර ගොවිපලක සාර්ථකත්වය වූ කලී කාලයක් හිස්සේ ක්‍රියාත්මක වන සාධක රාශියක අන්තර් ක්‍රියාවලිය මත රඳා පවතී. ගොවිපලේ සාමාජිකයින්ගේ ස්වභාවය මේ සාධක වලින් එකක් පමණි. සාමාජිකයින් එකට වැඩ කිරීමටත්, එකට ජීවත් වීමටත් හැකි ස්වභාවයේ අය විය යුතුය. ඔවුන් ගොවිපලෙහි සමාජයීය ඒකකයක් වශයෙන් පවත්නා ප්‍රජාවක් බවට පත් වීමට හැකි අය විය යුතුය.

(අ) වයස: ඉහත සඳහන් කරුණු ගැන සළකනවිට අවුරුදු 18 – 35 යන වයස් පරතරය ගොවිපලේ සාර්ථකත්වය සඳහා වැදගත් වන්නේ යයි සිතිය හැකිද? බද්දේගම සහ ලස්සනගම සමූපකාර ගම්මානයන්හි සාමාජිකයින් ගණනාවක් අවුරුදු 35 වයස් මට්ටමට ආසන්නව සිටි අතර පීපිලිමාන සහ ගිලීමලේ බොහෝ සාමාජිකයින් අවුරුදු 18 ට ළඟා වූ අය වූහ. ලස්සනගම සහ බද්දේගම යන සමූපකාර ගොවිපලවල් පීපිලිමාන සහ ගිලීමලේ සමූපකාර ගොවිපලවල්වලට වඩා සාර්ථක වූයේ, ඒවායේ සාමාජිකයින් වැඩි දෙනෙක් වැඩි වයසක අය වීමේ ප්‍රතිඵලයක් යැයි සැළකිය නොහැක. කෙසේ වුවද අපගේ අදහස නම් සාමාජිකයින් තෝරා ගැනීමේදී තරුණ සහ වයසක අය මෙන්ම ගැහැණු හා පිරිමි යන දෙවර්ගයෙන්ම තෝරා ගැනීම වඩා හොඳ බවය. තරුණයින්ගේ උනන්දුවත්, වයසක අයගේ පළපුරුද්ද හා පැසුනු බුද්ධියත් නිසා වඩා යහපත් තත්වයක් ඇති වීමට ඉඩ ඇති අතර මේ තත්වය ව්‍යාපාරය පාලනය කරන නිලධාරීන් සහ සාමාජිකයින් අතර වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති වීමටද තුඩු දෙනු ඇත. ඉහල වයස් සීමාව පිළිබඳව කිසියම් නම්‍යතාවයක් තිබීම අවශ්‍ය යයි හැඟේ. රජයට පවරා ගත් වතු සම්බන්ධ අවස්ථාවන්හිදී අවුරුදු 18 – 35 අතර වයස් සීමාව දැඩි ලෙස අනුගමනය කිරීමෙන්,

# ක්‍රියාත්මක කිරීම හා පාලනය පිළිබඳ ක්‍රියාවලිය



එහි වැඩ කරන කම්කරුවන් හට ගම්මානයට බැඳීම සඳහා වයස පිළිබඳ සුදුසුකම නොලැබීමට පිළිවන.

(ආ) අධ්‍යාපන මට්ටම: මේ ගොවිපලවල්වලට සම්බන්ධ වී ඇති බොහෝ තරුණ සාමාජිකයින් විධිමත් අධ්‍යාපනය ලබා ගත් අය වෙති. කෙසේ වුවද අවුරුදු 35 වයස් සීමාවට ආසන්නව සිටින ඇතැම් අයදුම් කරුවන් සමහරවිට විධිමත් අධ්‍යාපනයක් ලබා නොතිබුනත් ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස වලින් පෙනී ගොස් ඇති පරිදි හොඳ සාමාජිකයින් වීමට ඉඩ තිබේ. අවුරුදු 35 ක් පමණ වන යෝග්‍ය පුද්ගලයින් අධ්‍යාපන සුදුසුකම් ගැන නොසැලකා තෝරා පත් කර ගැනීම යෝග්‍ය යයි හැඟේ. කෙසේ වුවද සාමාජිකයින්ගේ අවම අධ්‍යාපන සුදුසුකම නිර්දේශ කොට ඇති නිසා අඩු තරමින් මූලික අධ්‍යාපනයවත් ලබා ඇති පිරිසක් බඳවා ගැනීමට ඉඩ සැලසෙන බවත් ඒ නිසා එක්සත්කම වර්ධනය වීමට ඉඩ ඇතැයි යන න්‍යායාත්මක තර්කය ප්‍රතික්ෂේප කිරීමක් මෙහිදී අදහස් නොකෙරේ.

(ඇ) සාමාජිකයින්ගේ සමාගූතාවය: මෙය තරමක් නොපැහැදිලි සංකල්පයකි. ගොවිපලවල්වල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන අයට බොහෝවිට ග්‍රාමීය පෙදෙස් අයත් වන අතර ඔවුන් හට බොහෝදුරට කෘෂිකාර්මික ගැමි පසුතලයක් ඇත. කෙසේ වුවද නාගරාසන්න ප්‍රදේශවල ගොවිපලවල් පටන් ගන්නා විට (උදා: වශයෙන් පිළිමාන සහ ප්‍රොවිඩන්ස්) ග්‍රාමීය පසුබිමකින් පැවතෙන සාමාජිකයින් මෙන්ම අර්ධ හෝ පූර්ණ නාගරික පසුබිමකින් එන අයද සිටීමට පිළිවන. මෙවැනි අවස්ථාවන්හිදී ග්‍රාමීය සහ නාගරික පසු බිම්වලට අයත් වන තරුණයින්ට එකම ප්‍රජාවක් ලෙස කටයුතු කළ නොහැකිද? පිළිමානෙහි නාගරික පසු බිමකින් පැමිණි තරුණයින් ගොවිපල තුළ එතරම් හිතකර තත්වයක නොපවතින නමුත්, ගොවිපලේ රැඳී ඇත. ප්‍රොවිඩන්ස්හි නාගරික පසු බිම්වලට අයත් තරුණයින් මෙන්ම ග්‍රාමීය පසුබිම්වලට අයත් තරුණයින්ද දීමනා මඳකම නිසාත්, සමාන වෙනත් හේතු නිසාත් ගොවිපල අත්හැර ගොස් ඇත. එමනිසා තරුණයින් ග්‍රාමීය පසු බිම්වලට අයත් වන්නේද නැත්නම් නාගරික පසු බිම්වලට අයත් වන්නේද යන්න එතරම් වැදගත් වන බවක් නොපෙනේ.

සාමාන්‍යයෙන් අවුරුදු 18 – 25 අතර පමණ වයසේ අයදුම්කරුවෝ සෑහෙන තරමක ඒකාකාර වූ මට්ටමක අධ්‍යාපනයක් ලැබුවෝ වෙත්. අවුරුදු 25 – 35 අතර වයසේ අයද සාමාන්‍ය වශයෙන් යම් ප්‍රමාණයක විධිමත් අධ්‍යාපනයක් ලැබූ අය වෙති. තරුණ සාමාජිකයින් හා වැඩිමහල් සාමාජිකයින් අතර අධ්‍යාපනය අතින් වූ පරතරය ඔවුන් අතර එක්සත්කම වර්ධනය වීමට බාධාකාරී වූ බවක් නොපෙනේ. ලස්සනගම සහ බද්දේගම ගොවිපලවල්වල වැඩිමල් සාමාජිකයින් ගෙන් සෑහෙන ගණනක් කිසිදු ආකාරයක අධ්‍යාපනයක් නොලැබූ හෝ එසේ නැතහොත් ඉතා සීමිත වූ ආකාරයක අධ්‍යාපනයක් ලැබූ අය වූයෙන් වැඩිමහල් හා තරුණ සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම අතර සැලකිය යුතු අසමානත්වයක්ද ඇති නමුදු මෙම තත්වය සමාජයීය ජීවිතයට හෝ ජන සමූහයක් නිර්මානය වීමට හානිකර වූ බවක් නොපෙනේ. ඇත්ත වශයෙන්ම කිවහොත් වෙනත් ගොවිපලවල දක්නට ලැබුණු තරමට වැඩියෙන් එනාව කැපී පෙනුනු සමගියක් හා සබැඳියාවක් මොවුන් අතර තිබිණි.

කණ්ඩායම්වලට බෙදීමකට තුළ භේද මග පෑදූ බවක් නොපෙනිනි. එසේ වුවද දින සතරක ක්ෂේත්‍ර අධ්‍යයනයකින් ගැඹුරු සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් කිරීමට හැකියාවක් නොතිබුණු බැවින් මෙහි සඳහන් වනුයේ, අවස්ථානුකූල අදහසකි.

ගොවිපලට පැමිණීමට පෙර පදිංචිව සිටි ගම් අනුව හෝ කිසියම් ආගමික හැඟීම් උඩ හෝ කණ්ඩායම්වලට බෙදීමක් නොවීය. ස්වාභාවික වශයෙන්ම තලින් තුබූ දැන හඳුනුම්කම් සහ සම්බන්ධකම් ගොවිපලේදී තවදුරටත් දැඩි වූ බවක් පෙනේ. එය ගොවිපලේ අසමගිය හෝ ගැටුම් ඇති කිරීමට හේතු වූ බවක් ප්‍රත්‍යක්ෂ නොවීය.

දේශපාලන පක්ෂපාතිත්වය එතරම් වැදගත් ලෙස සැළකුනු බවක් නොපෙනුනි. විවිධ දේශපාලන පක්ෂවලට ලැදියාවක් දක්වන අය ලෙස ප්‍රසිද්ධ සාමාජිකයින් සම්බන්ධයෙන් පවා විශේෂ කණ්ඩායම්වලට බෙදීමක් දක්නට නොවීය. අනිත් අතට එවැනි ලැදියාවන් නිසා ඇති වූ කැපී පෙනෙන එජසත්කමක් හෝ සබැඳියාවක්ද නොතිබිණි. උදාහරණයක් වශයෙන් ප්‍රොවිඩන්ස් ගොවිපලෙහි සාමාජිකයින් තෝරා ගනු ලැබ තිබුණේ යම් පක්ෂයක තරුණ සංවිධානයේ ආධාරය ඇතිවය. එසේ වුවද මේ හේතුවෙන් ගොවිපල අතහැර යන අයගේ සංඛ්‍යාවේ අඩු වීමක් හෝ වඩාත් විශේෂ ලෙස ඒකාබද්ධ වූ ජනාවාසයක් ඇති වීමක් හෝ සිදු නොවිනි.

(ඈ) පළපුරුද්ද: ගොවිතැන් කටයුතු පිළිබඳ පළපුරුද්ද තේරීම් සාධකයක් වශයෙන් ප්‍රයෝජනවත් නමුත් එවැන්නක් එක් සම්මුඛ පරීක්ෂණයකින් සාර්ථක ලෙස මැනීමට හැකිවේ යයි සිතිය හැකි නොවේ. අනෙත් අතින් බලනවිට සමූපකාර ගොවිපලවල ප්‍රධාන අරමුණු වලින් එකක් වනුයේ රැකියා විරහිත ගැමි තරුණ තරුණියන්ට රැකියා පහසුකම් ලබා දීම බැවින් ඔවුන්ගෙන් එතරම් සැළකිය යුතු මට්ටමක කෘෂිකාර්මික පළපුරුද්දක් බලාපොරොත්තු වීමටද නොහැකිය. ලස්සනගම ගොවිපලේ සාමාජිකයින් වූ, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ එතරම් විශේෂිත පළපුරුද්දක් ලබා නොතිබුණු තරුණියන් 135 දෙනෙකු පමණ ලස්සනගමදී වැල් දොඩම්, එළවළු හා වෙනත් බෝග වගා ක්‍රම ගැන සීඝ්‍ර පුහුණුවක් ලැබූහ. පැහැදිලිවම නාගරික පසු බිමකින් පැමිණි පීපිලිමාන සමූපකාර ගොවිපලේ තරුණ සාමාජිකයින් සම්බන්ධයෙන්ද මේ තත්වයම දක්නට හැකි විය. එබැවින් තේරීම් සාධකයක් වශයෙන් කෘෂිකාර්මික පළපුරුද්ද එතරම් අදාළ නොවිය හැක.

වැඩිමහල් සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනයක් ලබා තිබීම අවශ්‍යතාවයක් නොවිය යුතුය. සමූපකාර ගොවිපල් ජනාවාසයක් ගොඩ නැංවීමේදී සමාග්‍රතාවය අභිමත වන අතර බොහෝවිට අත්‍යවශ්‍යද වේ. සාමාජිකයින්, තමන් අයත්ව සිටින විශේෂිත ජනාවාස ක්‍රමයේ දර්ශනය තේරුම් ගෙන ඊට ඇප කැපවී සිටීම වඩාත් වැදගත් වන්නේය.

ජනාවාසයේ මුල්ම පදිංචිකරුවන් කණ්ඩායම, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අනුදැනුම ඇතිව ප්‍රාදේශීය ආයතනවල දිස්ත්‍රික්ක මට්ටමේ මාණ්ඩලික නිලධාරීන් විසින් තෝරා ගැනීමත් ඉන් අනතුරුව තෝරා ගැනීම් ගොවිපලේ කළමනාකාරිත්ව මණ්ඩලය විසින් කරනු ලැබීමත් සුදුසු යයි සිතිය හැකි වේ. ව්‍යාප්ති කටයුතු භාරව සිටින රජයේ ආයතන, ජනාවාසයට අවශ්‍ය සේවාවන් අඛණ්ඩව වඩ වඩාත් කාර්යක්ෂම අන්දමින් සපයා දිය යුතු වේ. සියළුම

ජනාවාසිකයින්ට විධිමත් පුහුණුවක් ලබා දීම අවශ්‍ය නොවිය හැකිය. එසේ වුවද තීරණයන් ගැනීමේදී සහ ගොවිපලේ කළමනාකරණ කාර්යයන්හිදී සම්බන්ධ වීමටත් සහභාගී වීමටත් සාමාජිකයින්ට ඉඩ කඩ සැළැස්වීමෙන් ඔවුන්ගේ ආත්ම ධෛර්යයත්, ඇපකැප වීමත් තව තවත් දැඩි කළ හැකි වේ.

පුහුණුවක් ලබා නොතිබුණත් තම ගොවිපලට කැප වූ හැඟීමක් සාමාජිකයින් තුළ තිබුන බවත්, ඒ හැඟීම ආධිපත්‍ය ස්වරූපයේ අදහස් දැරූ පාලකයින්ගේ ආකල්පය නිසා දුර්වල වූ බවත් බද්දේගම ගොවිපලේ දක්නට ලැබුණි. ගොවිපලේ සැළසුම් හා සංවිධානය පිළිබඳව අවබෝධයක් සාමාජිකයින් තුළ තිබිය යුතු අතර කල් යාමේදී ගොවිපලේ නොයෙකුත් වෙනස්වීම් සිදු විය හැකි බවත් ඔවුන් තේරුම් ගත යුතු වේ. තරුණ ව්‍යාපාරයන් සඳහා පරිවාස සේවා කාල ක්‍රමයක් යොදා ගැනීම සුදුසු විය හැකි නමුත් එය සෑම ජනාවාසයකටම පොදුවේ අදාළ කල යුතුද යන්න අවිනිශ්චිතය.

පදිංචිකරුවන්ගේ ප්‍රභවස්ථාන සහ ගොවිපල තුළ ඔවුන්ගේ පදිංචිය

පදිංචිකරුවන්ගේ කලින් පදිංචියත් ගොවිපලේ ඔවුන්ගේ පැවැත්මත් ආකාරයත් අතර කිසියම් සහබන්ධනයක් තිබෙන බවක්, සවුපකාර ගොවිපලවල් පහ පිළිබඳව අපගේ අධ්‍යයනයෙන් නිගමනය කළ නොහැකි විය. ලස්සනගම සාමාජිකයින් අතුරෙන් සැතපුම් 10 ක් පමණ දුරින් පැමිණියද ඔවුන් තුළ වූ බැඳියාව පිළිබඳ හැඟීමෙහි ඌනතාවයක් නුවූ අතර ගොවිපල අතහැර යාමේ ප්‍රමාණයද සියයට 6 ක තරම් අඩු මට්ටමක පැවතිනි. සමීප ගම් වලින් ආ සාමාජිකයින් තුළ ව්‍යාපාරය කෙරෙහි පැවති බැඳියාවේ සහ සැතපුම් 10 ක් පමණ ඈතින් වූ පෙදෙස් වලින් පැමිණි අයගේ බැඳියාව පිළිබඳ හැඟීමේ පැහැදිලි වෙනසක් දක්නට නොවීය. අධ්‍යයනය කළ අනෙක් ගොවිපලවල් සම්බන්ධයෙන්ද පොදුවේ මෙම තත්වයම කිව හැකි වේ. සාමාජිකයින් කණ්ඩායම් වශයෙන් ගොවිපලේ පදිංචිව සිටීමෙන් ඔවුන් අතර ඉතා කිට්ටු පුද්ගලික සබඳතාම් ඇති වීමටත් වැඩි දියුණු වීමටත් මග පෑදිනි. සාමාජිකයින් ප්‍රථමයෙන්ම ගොවිපලේම පදිංචිව සිටීම කරුණු කීපයක් මත රඳා පැවතිනි. උදාහරණයක් වශයෙන්, සාමාජිකයින්ගේ පරිහරණය සඳහා පිළිවෙළින් තනන ලද විශාල ශාලාව සතුටුදායක තත්වයක නොවූයෙන් එහි විසීම ඉතාමත් දුෂ්කර බව සාමාජිකයින්ට පෙනී ගියේය. ගොවිපලේ ජීවන වියදම් තත්වයද තවත් වැදගත් සාධකයක් විනි. තම ගම්වල නිවෙස්හි සිට දිනපතා ගොවිපලට පැමිණීමට හැකි වූ අය සිය දෙමව්පියන්ගේ අනුග්‍රහය ලැබීමේ වාසිය භුක්ති වින්දහ. මුදලින් දීමනාවකුත්, ආහාර සහනාධාරත් සාමාජිකයින්ට ලැබුණු නමුත් දුෂ්කරතාවයන් එයින් නිම නොවිනි. මාසය අවසානයේදී තමන්ට අවශ්‍ය පෞද්ගලික බඩු බාහිරාදිය මිළදී ගැනීමට වත් මුදලක් ඔවුන් අත ඉතිරි නොවීය. එබැවින් සාමාජිකයින් ගොවිපලට පැමිණෙන්නේ කවර ස්ථානයක සිටද යන කරුණ, ඔවුන්ට ගොවිපලේ නිවාස පහසුකම් දීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රශ්න සමඟ එකට විමසා බැලිය යුත්තකි.

ගොවිපලක සාමාජිකත්වය සමීප ගම් වලින් පමණක්නොව අනෙක් පිට ප්‍රදේශ වලින්ද පැමිණෙන අයගෙන්ද සමන්විත විය යුතු බව අවශ්‍යයෙන් පැහැදිලි විය. ගොවිපලෙහි තැනක් තමන්ටද ලැබේ යයි ආසන්න ගම්වැසියන් බලාපොරොත්තු වීම ස්වභාවිකය. ප්‍රදේශයේ පුද්ගලයින්

හැකි පමණින් ගොවිපලට ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සංවිධාන හා ආයතන දේශපාලන බලධාරීන් ගෙන් හා රජයේ බලධාරීන්ගෙන් තරයේ ඉල්ලා සිටිනු ඇත.

ගොවිපලේ නේවාසික සාමාජිකයින්ට ගෙවනු ලබන දීමනාව දිනකට රු. 5/- දක්වාවත් වැඩි කිරීම අවශ්‍යය. ගෙවීම මෙසේ වැඩිකරනවාත් සමඟම එක් එක් සාමාජිකයෙකුගෙන් ලැබෙන නිෂ්පාදනතාවය වැඩි කිරීමට වග බලා ගත හැකිවන පරිදි ගොවිපලේ වැඩ කටයුතුද ප්‍රතිසංවිධානය කළ යුතු වේ. කෙටිකාලීන වැඩ පිළිවෙලේ එක් කොටසක් වශයෙන් අල, බතල හා එළවළු වැවීමට සාමාජිකයින් දිරි ගැන්වීමෙන් ආහාර වියහියදම් අඩු මට්ටමක තබා ගැනීමට හැකි වනු ඇත.

ඉඩම් භුක්ති ක්‍රමය

සමූපකාර ගම්මානයන්හි වගාව සඳහා වෙන් කළ ප්‍රදේශය සමූපකාර සමිතිය මගින් පොදුවේ සියළු දෙනාටම අයිති විය යුතු වූ අතර නිවාසයන් තනා ගැනීම සඳහා අක්කර කාලක භූමි භාගයක් එක් එක් සාමාජිකයෙකුට ලැබිය යුතු විය. ගිලීමලේ හා ප්‍රොවිඩන්ස් ගම්මානයන්හි වගා කල බිම් කොටස පොදු හිමිකාරිත්වය අනුව වූ අතර කිසිදු පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට බිම් කැබලි වෙන් කර දෙනු නොලැබිනි. නිවෙස් තැනීම සඳහා පුද්ගලිකව අදාළ වන බිම් කැබලි ඒ වනවිටත් වෙන් කර තිබුණේ නැත. අක්කරයකට නියමිත මුදල් ප්‍රමාණයක් සාමාජිකයින්ට ගෙවා තනිව හෝ කණ්ඩායම් වශයෙන් කැලෑව හෙළි කර බිම සකස් කොට තණ කොළ සිටුවීමට ඉඩ සලස්වන කොන්ත්‍රාත් ක්‍රමයක් මීපිලිමානේ කළමනාකරුවන් යොදාගෙන තිබිනි. වගා කිරීමෙන් පසු එම ඉඩම් ප්‍රමාණය සාමාජිකයින් වෙනුවෙන් සමිතියට අයිති වුනේය. ප්‍රථම අර්තාපල් වගාව සාමූහික පදනමක් යටතේ අත්හදා බලන ලදී. කළමනාකාරිත්වය මේ වැඩ පිළිවෙල පිළිබඳව සෑහීමකට පත් නොවිය. දෙවන වාරයේ අර්තාපල් වගාව සඳහා අක්කර 1/4 බැගින් වූ බිම් කැබලි සාමාජිකයින්ට වෙන් කර දෙන ලදී. සෑම බිම් කට්ටියකම පලදාව සමිතියට භාර දිය යුතු වූ අතර එක් එක් සාමාජිකයෙක් වැඩට පැමිණ තිබී ප්‍රමාණයන්ට අනුපාතිකව ලාභ බෙදා දිය යුතු විනි. ගෙවතු සඳහා බිම් කැබලි බෙදා වෙන් කර නොතිබිනි.

බද්දේගම ගොවිපලේ ඉඩම් වගාව සඳහා පොදු අයිතිය පදනම් වූයේය. සාමාජිකයින් කණ්ඩායම් වශයෙන් රබර්, තේ, පොල්, වී සහ වෙනත් බෝග වගාවන්වල යෙදුනු අතර, නිෂ්පාදනය සමූපකාර සමිතිය විසින් ලබාගෙන විකුණන ලදී. ආහාර බෝග නිෂ්පාදනය වැඩි කිරීම දිරි ගැන්වීමේ වැඩ පිළිවෙලක් සමඟම අක්කරයක බිම් කොටස බැගින් හෙළි කර අල බතල වැවීමට සාමාජිකයින්ට ඉඩ දෙන ලදී. නිවෙස් සඳහා වෙන් කළයුතු වූ ඉඩම් කැබලි බෙදා වෙන් කර තිබුනේ නැත.

ලස්සනගම ගොවිපලේ වැල් දොඩම් වවන ලද්දේ ඒ සඳහා යෙදවුනු අක්කර 140 ක බිම් ප්‍රදේශයේ අක්කර 10 බැගින් වූ ඉඩම් කැබලි 10 දෙනෙකුගෙන් යුතු වූ කණ්ඩායම්වලට වෙන් කර දීමෙනි. එක් එක් බිම් කැබැල්ලෙන් ලැබුණු ලාභය බෙදා දිය යුතු වූයේ කණ්ඩායමේ සාමාජිකයින් වැඩට පැමිණි දින ගණනේ අනුපාතය අනුවය. රබර් වැවූ අක්කර 150 ක ප්‍රදේශය පොදු අයිතිය යටතේ පැවතුනි. කොන්ත්‍රාත් ක්‍රමයක් අනුව සෑම රබර් කිරි රාත්තලකටම සාමාජිකයින්ට ගෙවීමක් කරන ලදී.

ගෙවතු සඳහා වෙන් කර දෙනු ලබන ඉඩම් කැබලි හැර, සවුපකාර ගම්මානයන්හි ඉඩම්වල අයිතිය සාමාජිකයින් වෙනුවෙන් පොදුවේ සමිතිය වෙත තබා ගැනීම අදහස් කරන ලදී. මෙම ක්‍රමයේ වාසිද අවාසිද තිබිණි. ඒකීය කළමනාකාරී අධිකාරයක් යටතේ විශාල ඉඩම් පෙදෙසක් වගා කිරීමේදී පරිමාණ ආර්ථික පිරිමැහීම් සහිතව වාණිජ්‍ය පදනමක් මත සැළසුම් කළ කෘෂිකාර්මික කටයුතුවල යෙදිය හැකි විය. ඉඩම් සම්බන්ධයෙන් පොදු හිමිකාරත්වය ඇතිව කාර්යක්ෂම කළමනාකාරිත්වයක් යටතේ වාණිජමය පදනමක් මත වගා කටයුතු කෙරෙන විට තරුණ සාමාජිකයින් තුළ කෘෂිකර්මය කෙරෙහි පෙළඹවීමක් හා එවැනි කටයුතුවල රැඳීමට මනාපයක් ඇති විය. සාමූහික වැඩ පිළිවෙලක් යටතේ මූල්‍ය හා වෙනත් ආධාර වෙන් කිරීම හා පරිපාලනය වඩාත් පහසු වූයේය.

තරුණ ජනාවාසිකයින් කණ්ඩායම් වශයෙන් ගොවිපලේ විසීම, සමාජයීය සබඳතාවයන් වර්ධනය කිරීමට තුඩු දුන් අතර එකී සබඳතාවය වගකීම් හා සහෝදරත්වය පිළිබඳ හැඟීම් ඇති කරවීමට හේතු විය. අනෙක් අතට ඉඩම් සාමූහික අයිතිය යටතේ තබා ගැනීමෙන් හා වගා කිරීමෙන් අවැසි සිදු වූ අවස්ථාද විනි. සාමාජිකයින් ගොවිපලට බැඳුනේ, පෞද්ගලික අයිතිය එකම ක්‍රමය වශයෙන් අනුගමනය කළ හා අගය කළ සමාජ රටාවකින් නිසා පාරම්පරික වශයෙන් සාමූහික අයිතිය පිළිබඳව හැඟීමක් හෝ එය ක්‍රියාත්මක වන ආකාරය ගැන පළපුරුද්දක් හෝ ඔවුන්ට නොතිබිනි. ඔවුන් ගොවිපලට බැඳුනේ මෙම නව ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ අදහසින් වුවද ගොවිපලෙහිදීත් ඉන් පිටතදීත් සාමාජිකයින් ඇති කර ගත් විවිධ සම්බන්ධතාවයන් අනුව බොහෝවිට ඔවුන් අධෛර්යයට පත් විණි. සවුපකාර ගම්මානයන්හි පාලක මණ්ඩලයේ තනතුරු දැරූ රජයේ සේවකයින්ගෙන් බොහෝ දෙනෙකු එලිපිටම සාමූහික අයිතිය විවේචනය කළහ. සාමූහික අයිතිය හා සාමූහික වගා ක්‍රමය අසාර්ථක වීම නියත බව ඔව්හු දැඩි ලෙස විශ්වාස කළ හැකි පරිද්දෙන් කියා පෑහ. බොහෝ ව්‍යාපාර කළමනාකාරවරුද පෞද්ගලික අයිතියට පක්ෂ වූ අතර තමන් ඒ පිළිබඳව දරන අදහස් වසන් කිරීමට අදහස් නොකළහ. සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ දෙමව්පියන් පෞද්ගලික හිමිකාරිත්වය පිළිබඳව තමන්ගේ විශ්වාසයත් සාමූහික කෘෂිකාර්මික ව්‍යාපාරයන් ගැන තමන් තුළ පවතින සැකයත් ප්‍රකාශ කළහ. රජයේ අනුග්‍රහය ඇතිව කැරෙන ව්‍යාපාර ගැන විශ්වාසයක් තැබීමටද ඔව්හු පසුබට වූහ. කෙසේ වුවත් මෙබඳු උදාසීන කරවන සුළු තත්වයන් යටතේ වුව සාමාජිකයින් සමහර දෙනෙකු තවදුරටත් ගොවිපලවල නතර වී දැඩි වෙහෙසක් දරා වැඩ කර තිබීම ප්‍රශංසනීය වන්නේය.

## නිෂ්පාදන ක්‍රම

බද්දේගම, ලස්සනගම හා ප්‍රොවිඩන්ස්හි ගම්මානවල නිෂ්පාදන ක්‍රම අතින් පොදු අංග ලක්ෂණ කිහිපයක්ම විය. ඒ මෙම ගොවිපල තුනටම එතෙක් පැවති වගාවන් පුනරුත්තාපනය කිරීමටත් අළුත් වගාවන් ඇති කිරීමටත් සිදු වීමයි. මීට අමතරව ලස්සනගම හා ප්‍රොවිඩන්ස් ගම්මානයන්හි පශු පාලන ව්‍යාපාර ආරම්භ කෙරුණ අතර බද්දේගම ගොවිපලේ කුඩා කිරි පට්ටියක් ඇකිනි. ගිලීමලේ ගොවිපලේ සාමාජිකයින්ට කැලෑව හෙළි කිරීමටත්, අළුත් වගාවන් යෙදීමටත්, තුතුලන් ඇති කිරීමේ ව්‍යාපාරයක් පටන් ගැනීමටත් සිදු විය. මීපිලිමානේ පුනරුත්තාපනය කිරීම සඳහා පැරණි වගාවන් නොතිබී අතර ඔවුන්ට හෙළි කිරීමට සිදු වූයේද පඳුරු සහිත ලඳු කැලෑවය.

මෙම ගොවිපලවල වවන ලද වගාවන් අතර තේ, රබර්, පොල්, කුරුඳු, වී, වැල් දොඩම්, මල්, තණ, උක් හා එළවළු වර්ග යනාදියද විය.

ගිලීමලේ සහ මීපිලිමාන ගොවිපලවල කැලෑ හෙළි කිරීම සඳහා සහාය පිණිස පිටතින් කොන්ත්‍රාත් කරුවන් සේවයේ යොදවා ගැනිණි. බිම් සකස් කිරීම සඳහා ලස්සනගම, ප්‍රොවිඩන්ස්, මීපිලිමාන හා බද්දේගම ගොවිපලවල් ට්‍රැක්ටර් යොදවා ගන්නා ලදී. පස් සංරක්ෂණ ක්‍රම සෑම ගොවිපලකම යොදා ගැනිණි.

ගොවිපල කිහිපයකම තේ, රබර්, පොල් සහ කුරුඳු වගාවන් අළුතින් නොපිහිටුවන ලද අතර පුරාණ වගාවන්ම පුනරුත්ථාපනය කැරිණි. නිෂ්පාදන ක්‍රියාවලියෙහි වැදගත් අංගයක් වූ කලට වේලාවට පොහොර යෙදීම වැනි කාර්ය පිළිබඳව සියළුම ගොවිපලවල් එතරම් සැළකිල්ලක් නොදැක්වූ බව ප්‍රත්‍යක්ෂ විය. පොහොර යෙදීම වැසි ලැබීමත් සමඟම කළයුතු වූවත් එම කාර්යය කලට වේලාවට කිරීම සඳහා නිසි වැඩ පිළිවෙලත් නොයෙදිනි. බද්දේගම ගොවිපලේ වගා පුනරුත්ථාපන වැඩ පිළිවෙල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත වුවද සාමාජිකයින් සමහර දෙනෙකුට එය අභිමත නොවූ බැවින් ක්‍රියාත්මක කිරීම පමා කරන ලදී.

පහත දැක්වෙන ක්‍රියා පරිපාටීන් මෙම ගොවිපලවල අනුගමනය කරන ලදී:

1. සාමූහික හෝ ඒකාබද්ධ කාර්යයන්: සෑම සමූපකාර ගොවිපලකම ආරම්භයේදී කැලෑ හෙළි කිරීම, බිම සකස් කිරීම සහ පැල සිටුවීම ආදී කාර්යයන් සම්බන්ධයෙන් සාමූහිකව වැඩ කළ කෙටි කාලසීමාවනක් පැවතිනි. සමහර අවස්ථාවලදී කළමනාකරු විසින් ප්‍රදේශයේ කැපී පෙනුනු නායකයින්ගේද සහාය ඇතිව සංවිධානය කැරුනු ශ්‍රමදාන කටයුතු මගින්ද සාමාජිකයින්ට උදව් ලැබිනි.

2. විශේෂිත ඉඩම් කැබලි සම්බන්ධයෙන් වෙනම යොදවන ලද ස්ථාවර කණ්ඩායම්: ලස්සනගමදී වැල් දොඩම් අක්කර 140ක් පමණ වගා කරන ලද්දේ මෙම පදනම යටතේය. දස දෙනෙකුගෙන් යුතු වූ (සාමාන්‍යයෙන් කාන්තාවන්) කණ්ඩායම්වලට අක්කර දහයක් පමණ වූ බිම් කැබැල්ල බැගින් වෙන් කර දෙන ලද අතර කණ්ඩායමෙහි අය එම ඉඩම තමන්ගේ බිම් කොටස වශයෙන් සලකා සාමූහිකව එහි වැඩ කළහ. අක්කර 10 යේ බිම් කැබැල්ල ඇතුළත එක් එක් සාමාජිකයාට කුඩා කොටස් වෙන් කර දෙන අනු බෙදීම් නොවීය. කාන්තාවන් අතින් කරනු ලැබීමට දුෂ්කර වැඩ යයි සළකන ලද විශේෂයෙන්ම භාරදූර කටයුත්තක් ඉටු කිරීම සඳහා පිරිමි සාමාජිකයින් ගෙන් උදව් ලබා ගත් අවස්ථාවලදී හැර එම බිම් කැබැල්ලේ සියළුම වැඩ කටයුතු කණ්ඩායමේ කාන්තාවන් සියළු දෙනාම විසින් කරන ලදී.

3. විශේෂිත ඉඩම් කැබලි සම්බන්ධයෙන් වෙනම නොබෙදන ලද ස්ථාවර කණ්ඩා: සමහර සාමාජිකයින් විසින් දක්වන ලද විශේෂ දක්ෂතාවයන් සහ සහෝදරත්වයේ හැඟීම් හේතුකොට ගෙන ස්ථාවර කණ්ඩායම් වශයෙන් එවැනි සාමාජිකයින් දිගින් දිගටම විශේෂ කාර්යයන්හි පමණක් යෙදවීමේ ක්‍රමයක් බද්දේගම හා ගිලීමලේ ඇති වී තිබිණි. බද්දේගම ගොවිපලේ වී ගොවිතැන,

මෙම කාර්යය සඳහා විශේෂ හැකියාවක් දැක්වූ කණ්ඩායමක් විසින් භාර ගන්නා ලදී. එලෙසම රබර් කිරි කැපීම සහ තේ දළු නෙළීමද කරන ලද්දේ මෙම කටයුතු ගැන විශේෂ හුරු පුරුදු කම් දැක්වූ කණ්ඩායම් විසිනි. මෙම කණ්ඩායම ඉහත (2) යටතේ දැක්වුනු කණ්ඩායම්වලට වඩා වෙනස් විය. ඉහත දක්වන ලද කණ්ඩායමේ විශේෂිත බිම් කොටස් සමඟ වෙන්කොට හඳුන්වන ලද අතර මෙම කණ්ඩායම් ස්ථාවරව පැවතුනත් ඉහත පරිද්දෙන් ඔවුන් වගා කළ හෝ අස්වැන්න ලබා ගත් බිම් කොටසක් සමඟ වෙන්කොට හැඳින්වීමක් ඔවුන් සම්බන්ධයෙන් නොවීය. ප්‍රොවිඩන්ස් ගොවිපලේ එවැනි කණ්ඩායම් කලින් කලට එක් එක් කාර්යයට මාරු කරන ලද නමුත් බද්දේගම සහ ගිලීමලේ එවැනි විශේෂ වැඩ පිළිවෙලක් නොතිබුණි.

4. යම් යම් විශේෂිත කාර්යයන් සඳහා ඇති කැරුණු තාවකාලික (ස්ථාවර නොවූ හා වෙන්කොට හඳුන්වනු නොලැබූ) කණ්ඩායම්: දවසේ වැඩ ආරම්භ කිරීමේදී විශේෂ වැඩ කණ්ඩායම් ඇති කර ගොවිපලේ දවස තුළ කිරීමට තිබූ වැඩ එම කණ්ඩායම්වලට පැවරීමේ පුරුද්දක් ගිලීමලේ සහ බද්දේගම පැවතුනි. ගිලීමලේ මෙම කාර්යය කරන ලද්දේ ආයුධ හා උපකරණ නිකුත් කරනු ලබන අවස්ථාවේදී සාමාජිකයින්ගේම නායකයින් විසිනි. බද්දේගම ගොවිපලේ, මෙම කාර්යය කරමින ආධිපත්‍ය ස්වරූපයකින් කළමනාකරු විසින් ඉටු කැරිනි.

5. කොන්ත්‍රාත් වැඩ (තනි වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන්): තනිව හෝ කණ්ඩායම් වශයෙන් කොන්ත්‍රාත් ක්‍රමයක් යටතේ කරන ලද කාර්යයන් ජීපිලිමාන, ප්‍රොවිඩන්ස් හා ලස්සනගම ගොවිපලවල පැවතුනි. ජීපිලිමාන ගොවිපලේ අක්කරයක් හෙළිකොට එහි තණ කොළ වගා කළ සාමාජිකයකුට රු. 300/- බැගින් ගෙවන ලදී. සාමාජිකයින්ගේ වුවමනාවෙන්ම සංවිධානය වූ කණ්ඩායමක් විසින් මෙම කටයුත්ත කරන ලද්දේ නම් එම ගෙවීම් ප්‍රමාණයම එම කණ්ඩායමකට ගෙවන ලදී. ලස්සනගම කිරි කපන්නන්ට, කරන ලද වැඩ ප්‍රමාණයට (එනම් රබර් කිරි රාත්තලකට ශත -/25 බැගින්) ගෙවනු ලැබිනි. ජීපිලිමාන ගොවිපලේ තණ කොළ වැවීමට සාමාජිකයින්ට ගෙවූ පදනම මතම පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුද තණ කොළ වැවීමට යොදන ලදී.

6. පෞද්ගලික පදනම මත වගා කිරීම සඳහා ඉඩම් කැබලි: ජීපිලිමානේ සාමාජිකයින් අර්තාපල් වගා කළේ තනි වශයෙනි. එක් සාමාජිකයෙකු විසින් අක්කර 1/4 බැගින් අර්තාපල් වගා කරන ලදී. මෙම තනි වගාවන්වල නිෂ්පාදනය සියල්ලම සමූපකාර සමිතියට ගන්නා ලදී. ආහාර බෝග වගා කිරීම වැඩි කරවීමට දෛනික දීමක් වශයෙන් සාමාජිකයෙකුට අක්කර 1/2 බැගින් වූ ඉඩම් කැබලි තාවකාලිකව තනිව වගා කිරීමට බද්දේගම ගොවිපලේ ඉඩ දෙන ලදී. ඒවායෙහි නිෂ්පාදන (මයියොක්කා) එක් එක් බිම් කොටස වගා කල සාමාජිකයෙකුටම අයත් විය.

7. කාර්ය ක්‍රමය: දවසේ දීමනාව හිමි වීමට නම් අවසන් කළයුතු වූ 'වැඩක්' හෝ 'වැඩ ප්‍රමාණයක්' නියම කිරීමේ ක්‍රමයක් බද්දේගම ගොවිපලේ ක්‍රියාත්මක විය. වැඩ ප්‍රමාණය නියමිත කරන ලද්දේ පෞද්ගලික පදනමක් මතය. මෙම වැඩපිළිවෙල කණ්ඩායම් ක්‍රමය සමඟම ක්‍රියාත්මක කොට අධීක්ෂණ වැඩ පිළිවෙලක් ඒ සමඟම යොදවන ලදී.

8. අනිවාර්ය කොන්ත්‍රාත් ක්‍රමය: මාසිකව කළයුතු වූ අනිවාර්ය වල් නෙලීමේ ක්‍රියා පිළිවෙලක් බද්දේගම පැවතිනි. මේ සඳහා නියමිත වූ ගෙවීමක් කරන ලද අතර, ඒ සම්බන්ධ යෙන් තමන්ට හිමි වැඩ ප්‍රමාණය ඉටු නොකිරීම ගොවිපලේ වැඩට පැමිණීම වහාම අත්හිටුවනු ලැබීමට හේතු විය.

මූල්‍ය ප්‍රතිපත්ති:

අරමුදල් ලැබුනු මාර්ග අනුව බෙදා දක්වමින් ගොවිපලවල් එකෙක් එක එකට ලැබුනු මුදල් පිළිබඳ විශ්ලේෂයක් අංක III-20 සටහනින් දැක්වේ. රු. 1,458,600/- ක් වූ මුළු ලැබීම් ප්‍රමාණයෙන් රු. 673,756/- ක් (46%) ගොවිපලවලට රජයෙන් ලැබුනු දීමනා විය; රු. 545,210/- ක් (38%) ගොවිපලවලදීම උපයා ගන්නා ලද මුදල් වූ අතර රුපියල් 219,819/- ක් (15%) බැංකු ණය වලින් ලබා ගැනිනි. මෙම ගණන් අදාළ වන්නේ ගොවිපල වලට ලැබුනු දීමනා, බැංකු ණය සහ උපයන මුදල් සමහනය කළ විට පමණකි. එසේ වුවද රජයේ දීමනාවන් මුළු ලැබීම්වල ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ ගිලීමලේ ගොවිපලට ලැබුනු සියයට 29 ක ප්‍රමාණයේ සිට ප්‍රොවිඩන්ස් ගොවිපලට ලැබුනු සියයට 55 ක ප්‍රමාණය දක්වා රජයේ දීමනා ප්‍රමාණය වෙනස් වූ බව තුලනාත්මක අධ්‍යයනයකින් පෙනී යයි. එක් එක් ක්‍රියාකාරී සාමාජිකයකු වෙනුවෙන් රජයේ දීමනාව (අංක III-21 සටහන බලන්න) බද්දේගම ගොවිපලේ සාමාජිකයින් වෙනුවෙන් ලැබුනු රු. 415/- ක අවමයේ සිට ලස්සනගම ව්‍යාපාරයේ සාමාජිකයෝ වෙනුවෙන් ලැබුනු රු. 1,550/- ක උපරිමය දක්වා වෙනස් විය. ප්‍රොවිඩන්ස් සහ පීපිලිමාන ගොවිපල වලටද පිළිවෙලින් එක් සාමාජිකයෙකු වෙනුවෙන් රු. 1,535/- ක් හා රු. 1,460/- ක් බැගින් වූ දීමනාවක් ලැබිණි.

සමහනය කළ අවස්ථාවේ මුළු ලැබීම් වලින් සියයට 15 ක සාමාන්‍යයක් දැක්වූ බැංකු ණය බද්දේගම ලබා ගත් සියයට 9 ක් ප්‍රමාණයේ සිට ගිලීමලේ ගොවිපල ලබා ගත් සියයට 21 ක ප්‍රමාණය දක්වා වෙනස් විය. පීපිලිමාන ගොවිපල බැංකු ණය ලබාගෙන නැත. ලස්සනගම සහ ප්‍රොවිඩන්ස් ගොවිපලවල්හි මුළු ලැබීම් වලින් සියයට 16 ක ප්‍රමාණයක් බැංකු වලින් ණය වශයෙන් ලැබූ මුදල්ය.

සියළුම ගොවිපලවල් එකට ගත් කළ සාමාන්‍යයෙන් සියයට 38 ක් වූ ගොවිපල් ආදායම මුළු ලැබීම්වල ප්‍රතිශතයක් වශයෙන් බලන කළ ප්‍රොවිඩන්ස් ගොවිපලේ සියයට 29 ක ප්‍රමාණයේ සිට පීපිලිමානේ සියයට 60 ක ප්‍රමාණය දක්වා වෙනස් විය. ලස්සනගමට ලැබුනු මුදලින් සියයට 32 ක් ලැබුනේ මෙම මාර්ගයෙනි. බද්දේගමට හා ගිලීමලේට ලැබුණු ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 49 ක් හා සියයට 50 ක් විය. ලස්සනගම ගොවිපලට රු. 19,815/- ක ආධාර මුදලක් ලැබුණු අතර අන් කිසිදු ගොවිපලකට එවැනි අරමුදල් ලැබීමක් නොවිනි.

ගොවිපලේ මුළු ඉඩම් ප්‍රමාණය, වගා කල අක්කර ගණන, ක්‍රියාත්මක සාමාජික සංඛ්‍යාව, ක්ෂේත්‍ර අධ්‍යයනය කල කාලය දක්වා ගොවිපල පැවතුන කාලසීමාව ගැන විස්තර III-23 දරණ

සටහනෙහි දැකිය හැකි වේ. ගොවිපලවල් පහ ක්‍රියාත්මකව පැවතුනු කාලසීමාවන් මාස 10 ක සිට 24 ක් දක්වා වූ බැවින් තර්කානුකූල විශ්ලේෂණයක් කිරීමට නම් ඒවා සම්බන්ධ ගණන් ප්‍රමාණයන් සංසන්දනාත්මක පදනමක් මත සකස් කළ යුතු වේ. දත්තයන් වාර්ෂික කාලසීමාවන් අනුව ප්‍රමාණානුකූල පදනමක් මත ගැලපීමෙන් ඒ සඳහා යත්න දරා ඇත. (සටහන් III-21 සහ III-22)

වාර්ෂික පදනමක් මත සකස් කරනු ලැබූ ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් III-21 සටහනෙහි දැක්වේ. එක් සාමාජිකයකු වෙනුවෙන් බද්දේගම රු. 415/- ක් බැගින්ද, ගිලීමලේ රු. 600/- ක් බැගින්ද, පීපිලිමාන රු. 1,460/- ක් බැගින්ද, ප්‍රොවිඩන්ස් රු. 1,535/- ක් බැගින්ද, ලස්සනගම රු. 1,550/- ක් බැගින්ද ලැබීය. වාර්ෂික දීමනාව වගා කළ අක්කර ගණන සමඟ සංසන්දනය කරන විට අඩුම ප්‍රමාණය ලැබුනේ බද්දේගමටය. (අක්කරයකට රුපියල් 183/- බැගින්) වැඩිම ප්‍රමාණය ලැබුනේ ප්‍රොවිඩන්ස් ගොවිපලටය. (අක්කරයකට රු. 3,300/- බැගින්) බද්දේගම ලැබූ බැංකු ණය එක් සාමාජිකයකු වෙනුවෙන් රු. 89/- ක් වූ අතර ලස්සනගම ලැබූ ප්‍රමාණය සාමාජිකයෙකු වෙනුවෙන් රු. 520/- කි. පීපිලිමාන බැංකු ණය ලබා ගත්තේ නැත. සංවර්ධනය කළ ඉඩම් ප්‍රමාණය සමඟ බැංකු ණය සංසන්දනය කරන විට බද්දේගම අක්කරයකට රු. 39/- ක් බැගින්ද, ප්‍රොවිඩන්ස් ගොවිපල අක්කරයකට රු. 945/- ක් බැගින්ද ලබාගෙන ඇත.

ගොවිපලේම කටයුතු වලින් උපයා ගැනුනු වාර්ෂික ආදායම පීපිලිමාන සම්බන්ධයෙන් සාමාජිකයෙකුට රු. 2,161/- කිද, ගිලීමලේ රු. 1,021/- කිද, බද්දේගම රු. 476/- කිද විය. එම ආදායම සංවර්ධනය කළ අක්කර ගණනට සංසන්දනය කර බැලූවිට පීපිලිමාන වැඩිම ආදායමක් උපයන ගොවිපල වශයෙන්ද (අක්කරයකට රු. 1,965/- ක්) බද්දේගම අඩුම ආදායමක් උපයන ගොවිපල වශයෙන්ද (අක්කරයකට රු. 210/- ක්) පෙනිනි. එක් එක් සාමාජිකයෙකු වෙනුවෙන් වාර්ෂික ලැබීම් (සියල්ල ඇතුළත්ව) බලනවිට පීපිලිමාන වාර්ෂිකව වැඩිම මුදලක් ලැබූ ගොවිපල (එක් සාමාජිකයෙකු වෙනුවෙන් රු. 3,622/- ක් බැගින්) වූ අතර බද්දේගම වාර්ෂිකව අඩුම මුදල් ප්‍රමාණයක් ලැබූ ගොවිපල (එක් සාමාජිකයෙකු වෙනුවෙන් රුපියල් 977/- ක් බැගින් ) විය.

වියදම් පිළිබඳ විශ්ලේෂණයක් III-22 සටහනෙහි දැක්වේ. එක් එක් සාමාජිකයෙකු වෙනුවෙන් කළ වාර්ෂික වියදම අඩුම වූයේ බද්දේගමටය. (රු. 960/-). වැඩිම වූයේ ප්‍රොවිඩන්ස් ගොවිපලේය. (රු. 4,505/-). සංවර්ධනය කළ අක්කරයකට වාර්ෂික වියදම අඩුම වූයේ බද්දේගම ගොවිපලේ වූ අතර (රු. 580/-), අක්කරයකට වැඩිම වියදමක් දරන ලද්දේද ප්‍රොවිඩන්ස් ගොවිපලේය. (රු. 4,700/-). සා මාජිකයෙකු වෙනුවෙන් සාමාන්‍ය ප්‍රාග්ධන වාර්ෂික වියදම අඩුම වූයේ බද්දේගම ගොවිපලේය. (රු. 336/-). සාමාජිකයෙකු වෙනුවෙන් වැඩිම සාමාන්‍ය වාර්ෂික ප්‍රාග්ධන වියදම දරන ලද්දේ ප්‍රොවිඩන්ස් ගොවිපලේය. (රු. 2,566/-). අක්කරයක් වෙනුවෙන් අඩුම වාර්ෂික ප්‍රාග්ධන වියදම බද්දේගම වූ අතර (රු. 428/-). එය වැඩිම වූයේ පීපිලිමානයෙහිය. (රු. 1,320/-).

සේවයේ යොදවා ගැනුනු සාමාජිකයෙකු වෙනුවෙන් සාමාන්‍ය ප්‍රාග්ධන වියදම බද්දේගම ගොවිපලේ රු. 420/- ක් වූ අතර ගිලීමලේ රු. 1,343/- ක් විය. මෙම සඳහන වාර්ෂික සංඛ්‍යාලේඛන සම්බන්ධයෙන් නොව ක්ෂේත්‍ර අධ්‍යයනයේ කාලසීමාව තෙක් දරණ ලද වියදම්වල මුළු එකතුවටය. එම පදනම අනුවම සේවයේ යොදවා ගන්නා ලද සාමාජිකයකු වෙනුවෙන් සාමාන්‍ය වියදම බද්දේගම ගොවිපල සම්බන්ධයෙන් රු. 1,220/- ක් වූ අතර ප්‍රොවිඩන්ස් ගොවිපල සම්බන්ධයෙන් රු. 4,390/- ක් විය.

ව්‍යාපාරවල කළමනාකාරිත්වය

ගොවිපලවල වැඩ කටයුතු ගෙන යාම සඳහා පිහිටුවන ලද විශේෂ සමූපකාර සමිති පහකට අධ්‍යයනය කළ ගොවිපලවල් පහ භාරව තිබිණි. සියළු කටයුතුවල පාලනය දේශපාලන නායකත්වයක් විසින් ඉසිලූ ළස්සනගම හැර, අනෙක් ගොවිපලවල කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් වගකීම දැරුවේ ඒ ඒ ව්‍යාපාරය භාරව සිටි රජයේ නිලධාරීන්ය. තීරණයක් ගැනීම කෙරෙහි කෙලින්ම බලපෑමක් කිරීමට සාමාජිකයින්ට ඉඩ සළසා දීමක් මෙම ගොවිපලවල නොතිබූ බව පැහැදිලි විය. මේ නිසා සාමාජිකයින්ගේ නියෝජිතයින්ට තම හැකියාවන් දියුණු කර ගැනීමට හෝ කළමනාකාරණයෙහි සහභාගිත්වය වෙත ළඟාවීමට හෝ ඉඩක් නොලැබිනි.

පුහුණුකිරීමේ කටයුතු හා සේවාවන්

ජනාවාසිකයින්ට හා ගොවිපල් කළමනාකරුවන්ට ඔවුන්ගේ කටයුතුවල ශිල්පීය අංශයන් පිළිබඳවත් සමූපකාර කළමනාකාරිත්වයෙහි එන සංකල්ප පිළිබඳවත් පුහුණුවක් ලබා දීම සතුටුදායක අන්දමින් ඉටු වී නැත. ගිලීමලේ ගොවිපලේදී මේ සම්බන්ධයෙන් උත්සාහයක් කළමනාකරුවන් විසින් දරණ ලද වුවද පුහුණුවට අඩංගු වූ විෂයයන්ද පුහුණුව දෙනු ලැබූ ආකාරයද ගැන සාමාජිකයින් විසින් අගය නොකරන ලදී. පුහුණුවේ ශිල්පීය අංශයන් විධිමත් ලෙස හා අවිධිමත් ලෙස ඉටු කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසිනි. කළමනාකාරිත්ව කටයුතු ජනාවාසිකයින් වෙත ක්‍රමයෙන් පැවරීමට ඇති අවශ්‍යතාවය ගැන බද්දේගම ගොවිපලේ කළමනාකරුවන්ට හැඟීමක් නොවීය.

ප්‍රමාණය සහ සැළැස්ම

බද්දේගම වැනි විශාල ගොවිපලවල් අවම වියදමකින් හා උපරිම නිෂ්පාදනත්වයකින් යුතුව දියුණු කිරීමට නම් ඒ සඳහා දක්ෂතාවයන් ඇති, පුහුණු කරනු ලැබූ කළමනාකරුවන් අවශ්‍ය වේ. ඊට වඩා කුඩා වූ ප්‍රොවිඩන්ස් වැනි ගොවිපලවල්ද සීඝ්‍රයෙන් සංවර්ධනය කරවීමට නම් හැකියාවන්ගෙන් යුතු වූ කළමනාකරුවන් අවශ්‍ය වේ. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා යෙදවීමට වඩාත් හොඳ ඉඩම් තිබුනේ නම් සමූපකාර ගොවිපලවල් පිහිටුවීමට ආන්තික ඉඩම් තෝරා ගැනීම ඥානාන්විත පියවරක් නොවූ බව පෙනී යයි.

### අවට ගම් සමග තිබූ සම්බන්ධය

අසල ගම් සමග මේ ජනාවාස එක්සත් කිරීම සඳහා ඉතා කල්පනාකාරී වැඩ පිළිවෙලක් සකස් කළයුතු බව පෙනී ගියේය. ශ්‍රමදාන කඳවුරු වැනි දේවල් මගින් ගම්මුන්ට සමූපකාර ගොවිපලට පැමිණීමටත්, සමූපකාර ගොවිපලේ සාමාජිකයින් ගම්වලට යාමටත් අවස්ථාව සලසා දීම යෝග්‍ය යයි හඟුනි. එසේම අසල්වාසී ගම් වලින් සාමාජිකයින් තෝරා ගැනීමද මෙම කාර්යයට ආධාරක වන්නට ඉඩ තිබුණි.

### 3.5 නිගමන හා නිර්දේශ

I. සමූපකාර ගම්මාන පිළිබඳව සැළසුම් කිරීමේදී දීර්ඝකාලීන සහ කෙටිකාලීන සැළසුම් කිරීම අවශ්‍ය වේ. ශිල්පීය ශක්‍යතාවය, ශ්‍රම අවශ්‍යතාවය, ප්‍රාග්ධනමය ව්‍යායාම්‍යන්* සහ සමාජ අංශ, මෙවැනි සැළසුම් සකස් කිරීමේදී සැළකිල්ලට ගත යුතුය. සෑම දිස්ත්‍රික්කයක් සඳහා දිස්ත්‍රික් සැළසුම් ඒකකයක් තිබීම ඉතා මත්ම යෝග්‍යය. අවිච්ඡින්න සංවර්ධන ඒකකයක් තිබීම ඉතා මත් වැඩදායකය.

II. සැළසුම් ක්‍රියාත්මක කිරීමේදී පාලන කාර්යය නිරතුරුවම කළයුතු වේ. කළමනාකාරීත්වය විසින් මෙම කාර්යය සාර්ථක ලෙස ඉටු කිරීමට ගොවිපලෙහි කළමනාකරුවන් සාමාජික යින්ගේ කමිටුවක් සමග සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

III. පුද්ගලයින් තෝරා ගැනීමේදී තරුණ සහ වයසක, එමෙන්ම කිට්ටු ගම් වලින් සහ දුර ගම් වලින් යනාදී වශයෙන් නානාවිධ ප්‍රජාවක් ඇති වන පරිදි තෝරා ගැනීම, අසල්වැසි ගම් වලින් හෝ එක් විශේෂ ප්‍රදේශයකින් පමණක් සමාගමනාවයකින් යුතු පුද්ගලයින් තෝරා ගැනීමට වඩා හොඳය.

IV. සමූපකාර ගොවිපලවල්වල කෘෂිකාර්මික ඉඩම් පොදුවේ වගා කිරීම පිළිබඳව පොදු අයිතියක් තිබීමත් වැදගත්ය. වාසස්ථානය සඳහා සාමාජිකයින්ට පුද්ගලික පදනමක් මත ඉඩම් කැබලි දීම මැනවි.

V. සාමාජිකයින් විසින් තෝරා ගනු ලැබූ නායකයින්ගෙන් සමන්විත කුඩා ස්ථිර කණ්ඩ හිතුමතාපයට තෝරා ගනු ලබන කණ්ඩවලට වඩා කාර්යක්ෂම බව කිව හැකිය.

VI. ප්‍රාග්ධනමය තීරණ පදනම් කළයුත්තේ වාණිජමය කෘෂිකාර්මික ව්‍යාපාර සඳහා සුදුසු අයුරින් සකස් කරන ලද තොරතුරු මතය.

VII. ගොවිපලවල්වල කළමනාකාරීත්වය සංකේන්ද්‍රිත ආධිපත්‍ය ස්වරූපයේ පාලනයක් කරා නොව සහභාගී කළමනාකාරීත්වයක් සඳහා යොමු විය යුතුය.

VIII. පුහුණුකිරීම බොහෝදුරට කළයුත්තේ දිස්ත්‍රික් නිලධාරීන් විසිනි. විධිමත් පුහුණුකිරීමේ පාඨමාලාවලට වඩා වැඩ කරමින් සිටියදී කරන පුහුණුකිරීම් යෝග්‍ය බව පෙනේ.

IX. සමූපකාර ගම්මානවල සාමාජිකයින් සහ අවට ගම්වාසීන් අතර මිත්‍ර සම්බන්ධතාවයන් තහවුරු කිරීම සඳහා පියවර ගත යුතු වේ.

සටහන III-20 ආදායම් මූලාශ්‍ර

| ගොවිපල | රජයේ සහනාධාර රු. | % | බැංකු ණය රු. | % | ගොවිපල ආදායම් රු. | % | පරිත්‍යාග රු. | % | මුළු වත්කම් රු. | % | පැවති කාලය මාස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලස්සනගම | 425,000 | 49 | 143,319 | 16 | 276,049 | 32 | 19,815 | 3 | 864,183 | 100 | 11 |
| බද්දේගම | 70,000 | 42 | 15,000 | 9 | 80,344 | 49 | - | - | 165,344 | 100 | 15 |
| පීපිලිමාන | 36,506 | 40 | - | - | 54,044 | 60 | - | - | 90,550 | 100 | 10 |
| ප්‍රොවිඩන්ස් | 92,250 | 55 | 26,500 | 16 | 49,682 | 29 | - | - | 168,432 | 100 | 24 |
| හිලිමලේ | 50,000 | 29 | 35,000 | 21 | 85,000 | 50 | - | - | 170,000 | 100 | 20 |
| | 673,756 | | 219,819 | | 545,119 | | 19,815 | | 1,458,509 | | |

මූලාශ්‍රය: සමූපකාර ගොවිපලවල් පතේ ඇති වාර්තා

## සටහන III–21 වත්කම් පිළිබඳ විශ්ලේෂණය

| ගොවිපල | රජයේ සහනාධාර | | බැංකු ණය | | ගොවිපල ආදායම් | | වාර්ෂික මුළු වත්කම් ගොවිපලේ මුළු කාලය | ක්‍රියාත්මක සාමාජිකයින් ගණන | ගොවිපල පැවති කාලය | එක් සාමාජිකයෙකුට වැටෙන වාර්ෂික වත්කම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එක් සාමාජිකයෙකුට වැටෙන මුදල | වගා කරන ලද අක්කරයකට වැටෙන මුදල | එක් සාමාජිකයෙකුට වැටෙන මුදල | වගා කරන ලද අක්කරයකට වැටෙන මුදල | එක් සාමාජිකයෙකුට වැටෙන මුදල | වගා කරන ලද අක්කරයකට වැටෙන මුදල | | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | | | රු. |
| ලස්සනගම | 1,550 | 1,275 | 520 | 427 | 1,000 | 822 | 864,183 | 300 | 11 | 3,142 |
| බද්දේගම | 415 | 183 | 89 | 39 | 476 | 210 | 165,344 | 135 | 15 | 977 |
| පීපිලිමාන | 1,460 | 1,325 | – | – | 2,161 | 1,965 | 90,550 | 30 | 10 | 3,622 |
| ප්‍රොවිඩන්ස් | 1,535 | 3,300 | 441 | 945 | 828 | 1,780 | 168,432 | 30 | 24 | 2,807 |
| ගිලීමලේ | 600 | 790 | 420 | 552 | 1,021 | 1,340 | 178,091 | 50 | 20 | 2,137 |

මූලාශ්‍රය: සමූපකාර ගොවිපලවල් පසේ ඇති වාර්තා

## සටහන III-22 වියදම් පිළිබඳ විශ්ලේෂණය

| ගොවිපල | එක් සාමාජිකයකු වෙනුවෙන් කළ වාර්ෂික වියදම: ප්‍රාග්ධන | පුනරාවර්තන | මුළු | වගා කරන ලද අක්කරයකට වැටෙන වාර්ෂික වියදම: ප්‍රාග්ධන | පුනරාවර්තන | මුළු | එක් ගොවිපලක් සඳහා මුළු වියදම | ගොවිපල පැවති කාලය | එක් සාමාජිකයෙකු සඳහා වැය කළ සාමාන්‍ය වියදම | එක් සාමාජිකයෙකු සඳහා ගිය සාමාන්‍ය ප්‍රාග්ධන වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | | රු. | රු. |
| ලස්සනගම | 1,200 | 1,848 | 3,048 | 900 | 1,380 | 2,280 | 764,316 | 11 | 2,547 | 1,100 |
| බද්දේගම | 336 | 624 | 960 | 428 | 152 | 580 | 164,028 | 15 | 1,220 | 420 |
| පීපිලිමාන | 1,460 | 1,870 | 3,330 | 1,320 | 1,680 | 3,000 | 83,260 | 10 | 2,775 | 1,216 |
| ප්‍රොවිඩන්ස් | 2,566 | 1,939 | 4,505 | 550 | 4,150 | 4,700 | 131,700 | 24 | 4,390 | 510 |
| ගිලීමලේ | 575 | 715 | 1,290 | 1,185 | 1,515 | 2,700 | 150,443 | 20 | 2,149 | 1,343 |

මූලාශ්‍රය: සමුපකාර ගොවිපලවල් පහේ ඇති වාර්තා

## සටහන III-23 වගා කළ මුළු ඉඩම් ප්‍රමාණය, පශු පාලන කටයුතු, මුළු සාමාජිකත්වය සහ පැවති කාලය

| ගොවිපල | මුළු අක්කර ගණන | වගා කළ අක්කර ගණන | පශු පාලන කටයුතු | ක්‍රියාත්මක සාමාජිකත්වය | ක්ෂේත්‍ර අධ්‍යයනය කරන විට කොතරම් කල් පැවතියේද යන්න (මාස) |
|---|---|---|---|---|---|
| ලස්සනගම | 549 | 365 | ඌරන් පාලනය, තාරාවන් | 300 | 11 |
| බද්දේගම | 736 | 306 | කිරි පට්ටි පාලනය | 135 | 15 |
| පීපිලිමාන | 83 | 33 | - | 30 | 10 |
| ප්‍රොවිඩන්ස් | 125 | 64 | කුකුළු පාලනය, කිරිපට්ටි පාලනය, එළුවන් | 30 | 24 |
| ගිලීමලේ | 250 | 38 | කුකුළු පාලනය | 50 | 20 |

## 4 වන පරිච්ඡේදය

### ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ( කෘෂිකාර්මික ව්‍යාපාර)

### 4.1 හැඳින්වීම සහ අරමුණු

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල '... ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ පොදු කාර්යය සඳහා මහජන නියෝජිතයින් සහ රජයේ නිලධාරීන් එකමුතු කිරීමට උත්සාහ කරනු ඇත... ප්‍රදේශයෙන් ලබා ගත හැකි අමු ද්‍රව්‍ය මෙන්ම ඉඩම් හා ස්වභාවික සම්පත් පිළිබඳවද විමසා බලා, ජනතාවට රැකී රක්ෂා සැපයීමට සමත් යෝජනා ක්‍රම බිහි කිරීමට මෙම මණ්ඩල විසින් අපේක්ෂා කරනු ලැබේ.. වෙනත් වචන වලින් කිවහොත්, තම ප්‍රදේශය සඳහා කුඩා සැලසුම් සෑදීමට සංවර්ධන මණ්ඩලවලට අවස්ථාව සලසනු ඇත....'1/ 1971 වර්ෂය ආරම්භයේදී ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල පිහිටුවන ලදී. 1971 නොවැම්බර් මස නිකුත් කරන ලද පස් අවුරුදු සැළැස්මේ පහත සඳහන් අයුරින් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයන්හී කාර්යයන් විස්තර කොට ඇත. 'එක් අතකින් විවිධ රාජ්‍ය ආයතනද, අනෙක් අතින් ප්‍රාදේශීය ජනතාව සහ ඔවුන් නියෝජනය කරන ආයතනද සම්බන්ධ කරන ප්‍රධාන පුරුක වශයෙන් ක්‍රියා කරන්නේ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයි. රජයේ නිලධාරීන්ගෙන් සහ සමූපකාර සමිති, ගොවි කාරක සභා, ජනතා කොමිටි සහ ගම් සභා වැනි ආයතනවල නියෝජිතයින්ගෙන් මෙම මණ්ඩල සමන්විත වේ. මේ මණ්ඩලවල කාර්යයන් අතර, සංවර්ධන යෝජනා ක්‍රම සකස් කිරීමද තම තමන්ගේ ප්‍රදේශ සඳහා සංවර්ධන වැඩපිළිවෙල සකස් කිරීමද වේ. තවද, ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා සහාය වීමද, සැළැස්ම ක්‍රියාත්මක කෙරෙන ආකාරය විමසිල්ලට භාජනය කිරීමේදී ඊට සහාය වීමද, මේ මණ්ඩලය මගින් කෙරෙන අතිකුත් කාර්යයන් අතර වෙති.'2/

'ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල මගින් කෘෂිකාර්මික සංවර්ධනය' යන නමින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මගින් සකස් කොට ඇති අත්පොතෙහි ප්‍රා.ස.මණ්ඩලවල කාර්ය භාරය හා අරමුණු පහත සඳහන් ආකාරයට දක්වා තිබේ.

'(අ) ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සංවර්ධන සැළැස්මක් ක්‍රියාත්මක කිරීම,

(ආ) රජයේ සේවාවන් සහ ජනතා උත්සාහයන් එකමුතු කිරීම,

(ඇ) ප්‍රදේශයෙහි රජයේ කටයුතු සමාලෝචන කිරීම සහ නිවැරදි ක්‍රියා මාර්ගයක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.'

---

1/ එච්.ඒ. ද ඇස්.ගුණසේකර, ස්ථිර ලේකම්, කෘෂි සම්පාදන හා රක්ෂණ අමාත්‍යාංශය ('ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල මගින් කෘෂිකාර්මික සංවර්ධනය' - කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලදී - අගෝස්තු 1971)

2/ පස් අවුරුදු සැළැස්ම (1972 - 1976)

## 4.2 සාර්ව තත්වය - 1973

1971 මුල් භාගයේ සිට 1973 දෙසැම්බර් දක්වා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් යෝජනා ක්‍රම 1,198 ක් අනුමත කරන ලදී. මේවා අතුරින් 503 ක් (41%) කෘෂිකාර්මික යෝජනා ක්‍රම වූ අතර, 628 ක් (52%) කාර්මික යෝජනා ක්‍රම විය. අනිකුත් යෝජනා ක්‍රම 67 ක් (7%) විය. අනුමත කළ යෝජනා ක්‍රම අතුරින් 918 ක් (76%) 1973 දෙසැම්බර් මස අවසානය වනවිට ක්‍රියාත්මක වෙමින් පැවතුනි. කෘෂිකාර්මික යෝජනා ක්‍රම 503 ක් අතුරින් 87 ක් පශු පාලන ව්‍යාපාර විය. කෘෂිකාර්මික ව්‍යාපාර 416 ට අක්කර 10,623 ක් වූ ප්‍රදේශයක් අයත් විය. රජයේ ඉඩම් හෝ අක්කරගත් පෞද්ගලික ඉඩම් වලින් අක්කර 25 සිට 100 දක්වා වන ප්‍රමාණයන් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපල විවෘත කිරීම සඳහා යොදා ගනු ලැබිණ. මෙම යෝජනා ක්‍රම සඳහා අරමුදල් ලබා ගත්තේ අක්කරයකට රු. 1,600/- බැගින් දෙන රජයේ දීමනාවකින්, සමූපකාර සමිතිවල තැන්පත් මුදල් වලින්, වෙළඳ බැංකු වලින් ගත් ණය මගින් සහ සාමාජිකයින්ගෙන් අය කළ කොටස් දායක මුදල් වලිනි. 1971 ආරම්භයේ සිට 1973 දෙසැම්බර් මස අවසානය දක්වා කෘෂිකාර්මික යෝජනා ක්‍රම මගින් රැකියාවන් 11,250 ක් සපයන ලද අතර, කා ල පරිච්ඡේදය අවසානයේදී පුද්ගලයින් 7,600 ක් මෙම ව්‍යාපාරයන්හි රැකියාවල්වල නියුතුව සිටියහ.

1971 ආරම්භයේ සිට 1973 දෙසැම්බර් දක්වා ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ සටහන මගින් ඇති කරනු ලැබූ මුළු රැකියා ප්‍රමාණය 22,449 ක් විණි. 1973 දෙසැම්බර් වනවිට පැවතුණු ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල 918 ක් මගින් පුද්ගලයින් 13,872 දෙනෙකුට රැකියාවන් සපයන ලදී. අළුතෙන් ඇති කරනු ලැබූ මුළු රැකියාවන්ගෙන් 61% ක්, ස්ථාවර හෝ අඛණ්ඩ ස්වභාවයේ වූවේය. 1973 දක්වා ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම සඳහා මුදා හරින ලද අරමුදල් පහත සඳහන් අයුරින් විය.

<u>සටහන IV-1</u> ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම සඳහා වෙන් කරන ලද හා මුදා හරින ලද අරමුදල්

| කාල පරිච්ඡේදය | වෙන් කරන ලද ප්‍රමාණය රු. | මුදා හරින ලද ප්‍රමාණය රු. |
|---|---|---|
| 1970/1971 | 60,000,000 | 5,958,624 |
| 1971/1972 | 75,000,000 | 15,469,185 |
| 1972/1973 | 15,000,000 | 14,049,781 |
| | 150,000,000 | 35,477,590 |

මූලාශ්‍රය: ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1973 වර්ෂය තුළ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම සඳහා මුදා හරින ලද රු. 14,049,781/- න් ප්‍රමාණයෙන් රු. 6,566,580/- ක් කෘෂිකාර්මික ව්‍යාපාර සඳහා විය.

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ලා රජයේ නිලධාරීහු 650 ක් පමණ පැමිණ වී සිටිති. මේ නිලධාරීන්ගෙන් 550 දෙනෙක් පමණ දිස්ත්‍රික්ක සේවය සඳහා ප්‍රාදේශීය සංවර්ධන සහකාරවරුන් ලෙස බඳවා ගත් තරුණ උපාධිධාරීහු වෙති.

## 4.3 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රම පහ පිළිබඳ විස්තරය

මෙහිදී පියුම් ලෙස අධ්‍යයනය කිරීම සඳහා, පීද්දෙනිය, හෝකිගල, අරණ්ගල, උඩපුවෙලි සහ යටිනුවර යන යෝජනා ක්‍රම පහ තෝරා ගන්නා ලදී. මුල් යෝජනා ක්‍රම තුන අතිරේක ආහාර බෝග වගාව මත පදනම් වූ කෘෂිකාර්මික ව්‍යාපාර විනි. උඩපුවෙලි, සමුපකාර තුහුල් පාලන ව්‍යාපාරයකි. යටිනුවර, ගෙවතු කිරි පට්ටි පාලන ව්‍යාපාරයක් වේ. මේ එක් එක් යෝජනා ක්‍රමයක් පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත අදාළ සංඛ්‍යා සටහන්වල දක්වා ඇත.

### 4.3.1 <u>පීද්දෙනිය</u>

පසුතලය

පීද්දෙනිය ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපල පිහිටා ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය උප දිසාපති කොට්ඨාශය තුළය. ගොවිපලේ කටයුතු 1971 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. මෙම ගොවිපල පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන 1973 නොවැම්බර්-දෙසැම්බර් කාලය තුළ පවත්වන ලද අතර, ඒ වනවිට ගොවිපල වර්ෂ දෙකක් තිස්සේ ක්‍රියාත්මක වෙමින් තිබුණි. මෙම ව්‍යාපාරය අනුමත කල ක්‍රමසම්පාදක අමාත්‍යාංශය ගොවිපල සඳහා අවස්ථා තුනකදී රු. 3,89,426/- ක් වෙන් කළේය. ආරම්භක අවස්ථාවේදී ගොවිපල අක්කර 113 ක වැඩ කටයුතු ඇරඹූ අතර ඊට පසුව එය අමතර අක්කර 50 ක් සහ 90 ක් බැගින් අක්කර 250 ක් දක්වා ව්‍යාප්ත කරන ලදී.

ගොවිපලෙහි මූලික වශයෙන් 76 දෙනෙක් සාමාජිකත්වය ලැබූහ. මොවුහු සාමාන්‍යයෙන් අවුරුදු 30 ක් හෝ ඊට වැඩි වයසේ වූද, කෘෂිකර්මය සහ හේන් වගාව පිළිබඳ වැඩි පළපුරුද්දක් ඇත්තාවූද අය වූහ. ඔවුහු මුලදී එක් එක් අය අතර අක්කර 1 1/2 බැගින් පෞද්ගලික බිම් කට්ටි වශයෙන් බෙදාගෙන අක්කර 113 ක් වගා කළහ. 1973 දෙසැම්බර් මාසයේදී ගොවිපලේ සාමාජිකයින් 175 දෙනෙකු වූ අතර අක්කර 185 ක් බෝග වගාව යටතේ විනි. මුළු සාමාජික යින්ගෙන් 40 දෙනෙක් කාන්තාවෝ වූහ.

## සංවර්ධන සැළැස්ම සහ ලැබූ ප්‍රගතිය

අවුරුදු හතර සඳහා සැළසුම් කරන ලද බෝග රටාව (සටහන IV–2) එම කාලයටම අදාළ වූ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයක් සමඟ සකස් කර තිබීනි. (සටහන IV–3). මූලික වශයෙන් අක්කර 100 ක් සැළැස්මට ඇතුලත් විය. ඒ යටතේ මිරිස්, රටකජු, රතු ළූනු සහ බොම්බයි ළූනු වගා කළයුතු විය. පළමුවන වර්ෂය තුළ වගා කල යුතු මුළු බිම් ප්‍රමාණය අක්කර 39 ක් වූ අතර දෙවන වර්ෂය තුළ එම ප්‍රමාණය අක්කර 78 කුත්, දෙවන වර්ෂය තුළ අක්කර 90 කුත්, සිවුවන වර්ෂය තුළ අක්කර 100 කුත් විය. මූලසමය සැළැස්මට අනුව (සටහන IV–3) මුළු වියදම ඉක්මවූ ප්‍රතිලාභය දෙවන වර්ෂය තුළ 50% ක් විය යුතු අතර, තෙවන වර්ෂය තුළ එය 43% ක් විය යුතු වූයේය. සිවුවන වර්ෂය සඳහා එම ප්‍රතිලාභය 60% ක් විය යුතු විනි. පළමුවන වර්ෂය තුළ ශුද්ධ ආදායම මුළු වියදමින් 54% ක් පමණක් විය යුතු වූයේය.

වර්ෂ හතරේ කාලය ඇතුළත ගොවිපලෙන් ලබා ගතයුතු වූ මුළු ශුද්ධ ආදායම රුපියල් 1,13,481/– ක් විනි. වර්ෂ හතරක් සඳහා ප්‍රාග්ධන වියදම රු. 1,25,468/– ක් විය යුතු වූවත් මෙන්ම අපේක්ෂා කරන ලද ප්‍රතිලාභය ප්‍රාග්ධන වියදමෙන් 92% ක් වූයේය. මේ නිසා ප්‍රාග්ධන පියවීමේ කාල පරිච්ඡේදය අවුරුදු 1.1 ක් විය. වර්ෂ හතර ඇතුළත මුළු වියදම වන රු. 5,00,798/– ඉක්මවා රු. 1,15,481/– ක අතිරික්තයක් ලබා ගත යුතු විනි. නැතහොත් එය මුළු වියදමෙන් 23% කි. කන්න හතර තුළ වගා කරනු ලැබූ නියම බිම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු IV–8 සටහනේ දක්වා තිබේ. ගොවිපල සතුව තිබූ අක්කර 100 ක් දක්වා වූ මූලික සංවර්ධන සැළැස්ම, 1973 දී අක්කර 250 ක් දක්වා විහිදෙනසේ ව්‍යාප්ත වූ අතර, අක්කර 185 ක මුළු බිම් ප්‍රමාණයක් වගා කරන ලදී. මෙම තත්වය තෙවන වර්ෂය තුළ, අක්කර 90 ක් වගා කිරීමට පිළියෙල කළ මූලික සැළැස්මට එකඟ වන්නේය.

## වර්තමාන තත්වය

ඉඩම් කට්ටියේ ප්‍රමාණය: ගොවිපලේ බිම් ප්‍රමාණය සාමාජිකයින් අතර ඉඩම් කට්ටි වශයෙන් වෙන් කොට දී තිබුණි. පළමු පියවරේදී එනම්, 1971 අගෝස්තු මාසයේදී අක්කර 113 ක මුළු බිම් ප්‍රමාණය එක් එක් සාමාජිකයෙකුට අක්කර 1 1/2 බැගින් සාමාජිකයින් 76 දෙනෙකු අතරේ වගා කිරීම සඳහා බෙදා දෙන ලදී. මෙම පියවරේදී සාමාජිකත්වය සඳහා තෝරා ගන්නා ලද්දේ පිරිමින් පමණකි. දෙවනුව තෝරා ගන්නා ලද පිරිමින් 69 දෙනෙකු හා කාන්තාවන් 40 දෙනෙකු අතර වඩාත් කුඩා බිම් කට්ටි ලෙස ඉඩම් වෙන් කර දෙන ලදී. අතිරේකව බැඳෙන සාමාජිකයින්ටද ඉඩ කඩ සැලසීම සඳහා සෑම පිරිමියකුටම අක්කරය බැගින්ද සෑම කාන්තාවකටම අක්කර 1/2 බැගින්ද බෙදා දෙනු ලැබීය. කාන්තාවන්ට අක්කර 1/2 බැගින් දෙනු ලැබුවේ ඔවුන් ඊට වඩා ඉඩම් ප්‍රමාණයක් පිළිබඳව කටයුතු කිරීමට සමත් නොවේය යන හැඟීමද නිසාය.

## සටහන IV–2 සැළසුම් කරන ලද බෝග රටාව

| | පළමු වසර | | දෙවන වසර | | තෙවන වසර | | සිවුවන වසර | |
|---|---|---|---|---|---|---|---|---|
| | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| මිරිස් .. | 25 | – | 50 | – | 60 | – | 60 | – |
| රට කජු .. | 5 | – | 10 | – | 10 | 10 | 10 | 10 |
| රතු ළූණු .. | 2 | 5 | 4 | 10 | – | 10 | 10 | 10 |
| බොම්බයි ළූණු | – | 2 | – | 4 | – | – | – | – |
| අක්කර .. | 32 | 7 | 64 | 14 | 70 | 20 | 80 | 20 |

මූලාශ්‍රය: කෘෂි සම්පාදන අමාත්‍යාංශය – ප්‍රාදේශීය සංවර්ධන අංශය.

සටහන IV-3 සංවර්ධන සැළැස්ම

| | පළමු වසර | | දෙවන වසර | | තෙවන වසර | | සිවුවන වසර | |
|---|---|---|---|---|---|---|---|---|
| | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ප්‍රාග්ධනය** | | | | | | | | |
| බිම් හෙළි පෙහෙළි කිරීම | 5,500 | - | 5,500 | - | 2,750 | - | - | - |
| වැට බැඳීම | 6,838 | - | 6,838 | - | 3,000 | - | - | - |
| උපකරණ .. .. | 3,042 | - | 1,000 | - | 1,000 | - | 2,500 | - |
| තාවකාලික ගබඩා සහ මඩු .. | 5,000 | - | - | - | - | - | - | - |
| වැව් අළුත්වැඩියා කිරීම .. | - | 12,000 | - | - | - | - | - | - |
| ජල නල (6'') .. | - | 18,000 | - | - | - | - | - | - |
| අමතර කොටස් .. .. | - | 500 | - | - | - | - | - | - |
| වතුර පොම්ප සඳහා මඩුවක් සහ ඉන්ධන ගබඩා .. .. | - | 6,000 | - | - | - | - | - | - |
| පී.වී.සී. පයිප්ප .. | - | 21,000 | - | - | - | - | - | - |
| ඉසින යන්ත්‍ර .. .. | 5,000 | - | - | - | - | - | - | - |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර් .. | - | 10,000 | - | - | 10,000 | - | - | - |
| **ජංගම** | | | | | | | | |
| බීජ වර්ග, පොහොර, කෘෂි-රසායනික ද්‍රව්‍ය | 8,720 | 8,860 | 23,740 | 17,720 | 34,400 | 17,720 | 34,400 | 17,720 |
| ශ්‍රමික ගාස්තු .. .. | 19,500 | 7,000 | 39,000 | 14,000 | 48,000 | 15,000 | 48,000 | 15,000 |
| නඩත්තුව හා යන්ත්‍ර සඳහා .. | - | 500 | 500 | 500 | 1,000 | 1,000 | 2,000 | 1,000 |
| මුළු වියදම | 53,650 | 83,860 | 76,578 | 32,330 | 100,150 | 33,720 | 86,900 | 60,000 |
| දළ ලැබීම් .. .. | 54,200 | 31,000 | 108,400 | 62,000 | 150,160 | 60,000 | 150,160 | 60,000 |
| ක්ෂය කිරීම්, පොලිය, ප්‍රවාහන වියදම් | 4,421 | 5,350 | 8,450 | 6,500 | 10,400 | 7,060 | 10,400 | 7,060 |
| ශුද්ධ ආදායම | 49,779 | 25,650 | 99,950 | 55,500 | 139,760 | 52,940 | 139,760 | 52,940 |

මූලාශ්‍රය: ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - ප්‍රාදේශීය සංවර්ධන අංශය

## සටහන IV–4 ගොවිපලවල් හතේ ආදායම් සහ වියදම්

| ගොවි පලේ අංකය | වගා කරන කන්නය | කුලී ශ්‍රමය | කමත් ගේම ශ්‍රමය | පවුලේ ශ්‍රමය | අනිකුත් වියදම් | කුලී ශ්‍රමය හා අනෙකුත් යෙදවුම් වල පිරිවැය | මුළු වියදම | මුළු ලැබීම් | මුදල්මය අතිරික්තය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| | 1971 මහ | 1,500 | 300 | – | – | – | 1,800 | 525 | |
| | 1972 යල | 300 | 80 | – | – | – | 380 | 600 | |
| 1 | 1972 මහ | 1,500 | 460 | 328 | 397 | – | 2,685 | 7,000 | |
| | 1973 යල | 500 | 80 | 80 | – | – | 660 | 90 | |
| | මාස 24 | 3,800 | 920 | 408 | 397 | 4,197 | 5,525 | 8,215 | 4,018 |
| | 1971 මහ | 300 | 200 | – | – | | 500 | 320 | |
| | 1972 යල | 20 | 40 | – | – | | 60 | 70 | |
| 2 | 1972 මහ | 300 | 340 | – | 250 | | 890 | 2,000 | |
| | 1973 යල | – | 40 | 80 | – | | 120 | – | |
| | | 620 | 620 | 80 | 250 | 870 | 1,570 | 2,390 | 1,520 |
| | 1971 මහ | 30 | 500 | 500 | – | | 1,030 | 300 | |
| | 1972 යල | – | 100 | 100 | – | | 200 | – | |
| 3 | 1972 මහ | 600 | 500 | – | – | | 1,420 | 2,700 | |
| | 1973 යල | – | 200 | – | – | | 200 | – | |
| | | 630 | 1,300 | 600 | 320 | 320 | 2,850 | 3,000 | 2,050 |
| | 1971 මහ | – | 400 | – | – | | 400 | 100 | |
| | 1972 යල | – | 100 | – | – | | 100 | – | |
| 4 | 1972 මහ | 300 | 300 | – | 525 | | 790 | 4,050 | |
| | 1973 යල | 105 | 60 | – | – | | 163 | – | |
| | | 405 | 860 | – | 525 | 930 | 1,455 | 4,150 | 3,220 |
| | 1971 මහ | 200 | 240 | 120 | – | | 560 | 380 | |
| | 1972 යල | – | – | – | – | | – | – | |
| 5 | 1972 මහ | 520 | 440 | 200 | 342 | | 1,502 | 4,720 | |
| | 1973 යල | 20 | 32 | – | – | | 52 | 70 | |
| | | 740 | 712 | 320 | 342 | 1,082 | 2,114 | 5,170 | 4,088 |
| | 1971 මහ | 180 | 300 | 200 | – | | 680 | 300 | |
| | 1972 යල | – | – | – | – | | – | – | |
| 6 | 1972 මහ | 760 | 400 | 100 | 350 | | 1,610 | 3,532 | |
| | 1973 යල | – | 60 | 40 | – | | 100 | 150 | |
| | | 940 | 760 | 340 | 350 | 1,290 | 2,390 | 3,982 | 2,692 |
| | 1971 මහ | 100 | 200 | 200 | – | | 500 | 300 | |
| | 1972 යල | 60 | 60 | – | – | | 120 | 200 | |
| 7 | 1972 මහ | 175 | 400 | 200 | 325 | | 1,100 | 5,400 | |
| | 1973 යල | 40 | 40 | – | 300 | | 380 | – | |
| | | 375 | 700 | 400 | 625 | 1,000 | 2,100 | 5,900 | 4,900 |

පුද්ගලික ගොවිපලවල පිරිවැය ව්‍යුහය: සාමාජිකයින් 7 දෙනෙකු විසින් වගා කල ගොවිපල කිහිපයක් ගෙන ඒවායේ පිරිවැය ව්‍යුහය අධ්‍යයනය කිරීමට උත්සාහයක් දරන ලදී. සම්මුඛ සාකච්ඡා වලින් ලබා ගත් තොරතුරුවලට 1971 මහ, 1972 යල සහ මහ, 1973 යල යන කන්න හතර පිළිබඳ විස්තර ඇතුළත් විය. ශ්‍රමය හා අනිකුත් යෙදවුම් පිළිබඳ තොරතුරු වලට අමතරව පිරිවැය ප්‍රතිලාභවලට අදාළ කළහැකි වන පරිදි ශුද්ධ පැයිම්වල වටිනාකම ඇස්තමේන්තු කිරීමටද උත්සාහයක් දරන ලදී. කෙසේ වෙතත් විමර්ශනය පිළිබඳව සීමාවන් දෙකක් විනි: ප්‍රථමයෙන්, සසම්භාවී නියැදි ක්‍රමය උපයෝගි කරගනු නොලැබිනි. දෙවනුව, ගොවීන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවන් පදනම් වූයේ වර්ෂ දෙකක් තුළ සිදුවීම් පිළිබඳව ඔවුන්ගේ මතකයෙන් කිව හැකි වූ තොරතුරු මතය. මෙම අධ්‍යයනයේ කාර්යයන් සඳහා එක් දිනක ශ්‍රමයෙහි වටිනාකම රු. 4/- ක් ලෙස ගණනය කරන ලදී. ගොවිපලවලී හයේ ආදායම් සහ වියදම් පිළිබඳ දත්ත IV-4 සටහනේ පෙන්වා දී ඇත.

ගොවිපලවල් සඳහා දරන ලද පිරිවැය ශීර්ෂ තුනක් යටතේ වර්ග කළ හැකිය:

I. බීජ වර්ග, පොහොර සහ කෘෂි-රසායනික ද්‍රව්‍ය වැනි ද්‍රව්‍යාත්මක යෙදවුම් පිළිබඳ පිරිවැය,

II. කුලී ශ්‍රමය සඳහා දරන පිරිවැය,

III. ගොවියාගේම ශ්‍රමය හා පවුලේ ශ්‍රමය පිළිබඳව ඇස්තමේන්තු කළ පිරිවැය.

මෙම කාණ්ඩ තුන අතුරින් පළමු කාණ්ඩ දෙකට එනම් යෙදවුම් සඳහා දරන පිරිවැයට සහ කුලී ශ්‍රමයට ගෙවන පිරිවැයට සෘජු මුදල් ගෙවීම් ඇතුළත් වේ. තුන්වන කාණ්ඩයට එනම්, ගොවියාගේම ශ්‍රමය හා පවුලේ ශ්‍රමය පිළිබඳව ඇස්තමේන්තු කරන ලද පිරිවැය අවශ්‍යයෙන්ම මුදල් වියදමක් නොවේ. නමුත් එය කාල්පනික නිෂ්පාදන පිරිවැය ගණන් බැලීම සඳහා අවශ්‍ය වේ.

මෙලෙස ගොවීන් 7 දෙනාගේ මුදල් පිරිවැය පහත සඳහන් අයුරින් වෙයි.

<u>සටහන IV-5</u> <u>මුළු පිරිවැයට සහ මුළු ලැබීම්වලට අදාළ මුදල් පිරිවැය</u>

| ගොවියාගේ අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| මුදල් පිරිවැය | 4,197 | 870 | 950 | 930 | 1,082 | 1,290 | 1,000 |
| මුළු පිරිවැය | 5,525 | 1,520 | 2,850 | 1,455 | 2,114 | 2,390 | 2,100 |
| මුළු ලැබීම් | 8,215 | 2,390 | 3,000 | 4,150 | 5,170 | 3,982 | 5,900 |
| මුදල් පිරිවැය මුළු පිරිවැයේ සියයට ගණනක් ලෙස | 76 | 55 | 33 | 64 | 50 | 54 | 47 |
| මුදල් පිරිවැය මුළු ලැබීම්වල සියයට ගණනක් ලෙස | 51 | 36 | 31 | 22 | 21 | 32 | 17 |
| කුලී ශ්‍රමය මුදල් පිරිවැයේ සියයට ගණනක් ලෙස | 9 | 28 | 33 | 56 | 31 | 27 | 62 |

මෙම ගොවීන් හත් දෙනා පිළිබඳ 'මුදල් පිරිවැය' සංයුතිය මුළු පිරිවැයෙන් සියයට 33 සිට සියයට 76 දක්වා විචලනය විය. මුදල් පිරිවැය, ඉඩම් වගා කිරීමෙන් ලැබුණු මුළු ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 17 සිට සියයට 51 දක්වා විචලනය විය. කුලී ශ්‍රමය, මුදල් පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස ගතහොත් එය සියයට 9 සිට සියයට 62 දක්වා විචලනය වූයේය. කෙසේ වුවත්, සාමාන්‍යයක් ලෙස ගත් කල කුලී ශ්‍රමය සඳහා දැරූ පිරිවැය මුදල් පිරිවැයෙන් 35% ක් පමණ විණි. මෙයින් හැඟී යන්නේ මුදල් පිරිවැයෙන් ආසන්න වශයෙන් 2/3 ක් පොහොර සහ කෘෂි-රසායනික් ද්‍රව්‍ය වැනි යෙදවුම් සඳහා දරන ලද බවයි. මුදල් පිරිවැය, මුළු පිරිවැයෙන් සාමාන්‍ය ගණනක් ලෙස සියයට 54 ක් පමණ වූ අතර මුදල් පිරිවැයෙන් 2/3 ක් පොහොර වැනි යෙදවුම් සඳහා වියදම් කරනු ලැබීය.

ගොවිපලේ කළමනාකරණය

මෙම ගොවිපල අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත විශේෂ සමුපකාර සමිතියක් වශයෙන් සංවිධානය කරන ලදී. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට වීරකැටිය උප දිසාපතිතැන (සභාපති), ප්‍රාදේශීය සංවර්ධන සහකාරතැන (ලේකම්), සමුපකාර පරීක්ෂකවරයෙක් සහ සාමාජිකයින් තිදෙනෙක්ද ඇතුළත් වූහ. මේ ගොවිපලේ වගාව කරන ලද්දේ පුද්ගලික ඉඩම් කැබලි පදනම මතය. මේ හා සමාන අනිකුත් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපල කිහිපයක මෙන් පිද්දෙනිය ගොවිපලේද වගාවට බලපාන තීරණ ගැනීම පෞද්ගලික සාමාජිකයින් විසින්ම කරන ලදී. මෙනයින්, මෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙන්ම ව්‍යාපාර කළමනාකරුගේද කාර්යයන් පොදු ඉඩම් අයිතිය ඇති සමුපකාර ගොවිපලවල එම කාර්යයන්ගෙන් විශාල ලෙස වෙනස් විය.

පිද්දෙනියේ සමුපකාර සමිතිය සේවා සමුපකාරයක් විණි. බීජ වර්ග, පොහොර, කෘෂි-රසායනික ද්‍රව්‍ය සහ උපකරණ වැනි කෘෂිකාර්මික යෙදවුම් ලබා ගැනීමේ ලා මෙම සමිතිය උපකාරී විය. ගොවිපලේ වෙන් කරන ලද ඉතිරි කිරීම් වලින් ණය සපයනු ලැබීය. වීරකැටිය උප දිසාපති කාර්යාලයට සම්බන්ධ ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන විසින් ගොවිපල මැනවින් අධීක්ෂණය කරන ලදී.

විශ්ලේෂණය

ආර්ථිකමය කරුණු: කන්න පහක් තිස්සේ ගොවිපලෙහි වගා කටයුතු වලින් ලද මුළු ආදායම රු. 2,03,452/- ක් ලෙස ගණනය කොට ඇත. (සටහන IV-8). ක්ෂේත්‍ර විමර්ශනයක් කළ 1973 දෙසැම්බර් කාලය වන විටත්, මහ කන්නයේ වගා අස්වැන්න නෙලාගෙන නොතිබුණි. වැස්ස නියමි වෙලාවට ලැබුණ නිසා අස්වැන්න සාර්ථක විය යුතුව තිබුණි. ගොවිපලෙහි නියම වියදම IV-7 සටහනේ දක්වා ඇත. රු. 23,551/- ක (20%) ප්‍රාග්ධන වියදමක්ද ඇතුළුව රු. 1,15,697/- ක මුළු මුදලක් ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබුණ අරමුදලින් වියදම් කොට තිබුණි. මෙය රු. 87,755/- ක අතිරික්තයකි. නැතහොත් මුළු පැහැදමෙන් සියයට 76 කි.

මුළු සාමාජිකත්වය 173 ක් වේ යයි සිතා ගත් විට, අවුරුදු දෙකකුත් මාස 4 ක කාල පරිච්ඡේදයක් සඳහා ඒක පුද්ගල ප්‍රාග්ධන වියදම රු. 136/- ක් වී තිබේ. එම කාල පරිච්ඡේදයේම එක් සාමාජිකයෙකුට වැටෙන සාමාන්‍ය විය පැහැදම රු. 670/- ක් විය. එක් කන්නයක උපයන ලද ඉහළම ආදායම වූ රු. 1,75,088/- ක් (සටහන IV-8) උපයන ලද්දේ 1972 මහ කන්නයේදීය. එම කන්නයේදී සාමාජිකයින් 70 දෙනෙකු විසින් ඔවුන්ගේ බිම් කැබලි වගා කරන ලදුව එක් අයෙකු කන්නය තුළදී රු. 2,501/- ක ආදායමක් ලැබිය. කෙසේ වුවද, 1971 මහ කන්නයේදී එක් සාමාජිකයෙකුගේ සාමාන්‍ය ආදායම රු. 234/- ක් විය. එය 1972 මහ කන්නයේ සාමාන්‍ය ආදායමෙන් 9% කි. මෙම දැඩි විචලනය සිදු වූයේ ප්‍රධාන වශයෙන්ම ගොවිපලේ ආරම්භක අදියරෙහිදී ගොවිතැන් කටයුතු අකාලයේ කරන ලද නිසාය. 1972 යල කන්නයේදී එක් සාමාජිකයෙකුගේ සාමාන්‍ය ආදායම රු. 78/- ක් වූයේය.

කළමනාකරණ අංශය

පෞද්ගලික බිම් කැබලි අයත් සාමාජිකයින්ට සමූපකාර සමිතිය විසින් සතුටුදායක ලෙස සේවය ඉටු කරන ලදී. එහෙත් නිෂ්පාදන අලෙවිය නොසලකා හැර තිබීමෙන් ගොවිපලේ නිෂ්පාදන මිළදී ගැනීම හා මිළ ගණන් වෙළෙන්දන්ගේ පාලනයට ලක් වූ බැවින් මෙම තත්වය ගොවීන් කෙරෙහි අයහපත් අයුරින් බලපා තිබේ. හොඳ අස්වැන්නක් ලැබීම වැඩි වශයෙන් කාලගුණය මත රඳා පැවති අතර කාලගුණය අසමාන සහ අවිනිශ්චිත තත්වයක වූ හෙයින් සාර්ථක අස්වැන්නකින් හැකි ඉහළම ආදායමක් ලැබීම අත්‍යවශ්‍ය වූයේය. කෙසේ වුවද, හොඳ අස්වැන්නක් ලැබුන පසු ප්‍රාදේශීය වෙළඳපලේ භාණ්ඩ ගොඩ ගැසීම නිසා ඉල්ලුම් හා සැපයුම් තත්වයන් අනුව මිළ පහල වැටේ. මෙසේ වන්නේ පළාත්බද වෙළෙන්දෝ වෙළඳපලේ කටයුතු ඔවුන්ගේ අවශ්‍යතාවයනට සරිලන පරිදි පාලනය කළ හෙයිනි. යහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් හොඳ අස්වැන්නක් සමග ඉහළම ආදායමක් ගොවීන්ට ලබා ගත හැකි වූ අවස්ථාවලදී පවා ඔවුන්ට සහාය වීම පිණිස ආයතනික සැකැස්මක් හෝ අලෙවි ක්‍රමයක් නොවීය. මෙම සේවාවන් හා අනිකුත් ආධාරක සේවා වන්ද සැළසීම පිළිබඳව කළමනාකාරිත්වය උනන්දු විය යුතුව තිබුනි.

දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ මෙන්ම මධ්‍යස්ථානයේ නිලධාරීන්ද ගොවිපල සංවර්ධනය කිරීමේ ලා දැඩි උද්යෝගයක් දක්වා තිබුනි. ගොවීන් සහ නිලධාරීන් අතර සම්බන්ධතාවය සතුටුදායක විය.

සමාජයීය කරුණු

ගොවිපලේ සාමාජිකයින්ට ගොවිපලෙහිම පදිංචි වීමට හෝ එහි අර්ධ-ස්ථාවර නිවාස තැනීමට හෝ අවසර දී තිබුණේ නැත. ගොවිපලෙහි එක්ව ජීවත් වෙමින් එකට වැඩ කරන පොදුජන සමාජයක් බිහිව තිබුනේ නැත. සාමාජිකයින් අසල්වැසි ගම්වල සිට පැමිණි අතර ඔව්හු පොදුවේ අන්‍යොන්‍ය වශයෙන් ප්‍රහදව හා උපකාරීව වැඩ කළහ. බොහෝ අවස්ථාවලදී එකම පවුලේ සාමාජිකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් ගොවිපලෙහි වැඩ කළහ. විවිධ වයස් කාණ්ඩවලට අයත් ගැහැණුන් සහ පිරිමින්ද යොවුන් වියේ අයද ගොවිපලේ වැඩ කිරීම මගින සමාජ සම්බන්ධතාවයක් ඇති වීමට තුඩු දුන්නේය.

## සටහන IV-6 අරමුදල් වෙන් කිරීම

| | අක්කර 10 ක් සඳහා වෙන් කිරීම් | අක්කර 50 ක් සඳහා වෙන් කිරීම් | අක්කර 90 ක් සඳහා වෙන් කිරීම් | මුළු ගණන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| බිම් හෙළි පෙහෙළි කොට සකස් කිරීම | 20,000 | 10,000 | 18,000 | 48,000 |
| බිම් සකස් කිරීම | 35,000 | 17,500 | 31,500 | 84,000 |
| පස සංරක්ෂණය | 5,000 | 2,500 | 4,500 | 12,000 |
| වැට බැඳීම | 15,000 | - | - | 15,000 |
| උපකරණ | 80,000 | 40,000 | 72,000 | 192,000 |
| ගොඩනැගිලි | 5,000 | 2,500 | 4,500 | 12,000 |
| මුළු ගණන | 160,000 | 72,500 | 130,500 | 363,000 |

මූලාශ්‍රය: ක්‍රම සම්පාදන අමාත්‍යාංශය – ප්‍රාදේශීය සැලසුම් අංශය.

## සටහන IV-7 1971 අගෝස්තු මස සිට 1973 දෙසැම්බර් මස දක්වා වියදම්

| | රු. |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | |
| වැට බැඳීම | 5,273.90 |
| උපකරණ | 15,269.00 |
| ගොඩනැගිලි | 1,980.68 |
| වැව් අළුත්වැඩියා කිරීම | 1,028.20 |
| අනු එකතුව | 23,551.78 |
| පුනරාවර්තන වියදම් | |
| සාමාජිකයින්ට ගෙවීම් | 29,623.12 |
| ට්‍රැක්ටර් ගාස්තු | 28,588.25 |
| බීජ වර්ග | 13,530.00 |
| පොහොර සහ කෘෂි-රසායනික ද්‍රව්‍ය | 20,404.19 |
| අනු එකතුව | 92,145.56 |
| මුළු ගණන | 115,697.34 |

මූලාශ්‍රය: හම්බන්තොට කච්චේරිය.

සටහන IV-8 ගොවීන්ගේ සංඛ්‍යාව, 1971 - 1973 කාල පරිච්ඡේදයේදී කරන ලද නිෂ්පාදනයේ වටිනාකම හා බිම් ප්‍රමාණය

| කන්නය | වගා කටයුතු කරන ගොවීන්ගේ සංඛ්‍යාව | වගා කළ අක්කර ප්‍රමාණය | නිෂ්පාදනයේ ප්‍රකාශිත වටිනාකම රු. | එක් සාමාජිකයෙකුගේ සාමාන්‍ය ආදායම රු. |
|---|---|---|---|---|
| 1971 මහ | 76 | 113 | 17,864 | 234 |
| 1972 යල | 70 | 105 | 5,500 | 78 |
| 1972 මහ | 70 | 105 | 175,088 | 2,501 |
| 1973 යල | 59 | 88 | 5,000 | 84 |
| 1973 මහ | 173 | 185 | - | - |
| | | | 203,452 | |

### 4.3.2 තෝනිගල ගොවිපල

පසුතලය

තෝනිගල ගොවිපල පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය උප දිසාපති කොට්ඨාශයට අයත් ප්‍රදේශයේය. ගොවිපල 1972 සැප්තැම්බර් මස ආරම්භ කළ අතර, ක්ෂේත්‍ර අධ්‍යයනය කරන ලද්දේ ඊට මාස 15 කට පසුවය. අක්කර 40 ක ගොවිපල පියවර දෙකකදී සංවර්ධනය වුවකි. පෞද්ගලික යෝජනාව වූයේ අක්කර 25 ක් සංවර්ධනය කොට, මිරිස්, රතු ළූනු ආදිය වගා කිරීමයි. (සටහන IV-9). මෙම යෝජනාව කරන ලද අවස්ථාවෙහි සාමාජිකත්වය අපේක්ෂා කළ සාමාජිකයින් විසින් අක්කර 6 ක් වැඩ කරමින් තිබුණි. අක්කර 25 ගේ ව්‍යාපාරයෙන් ලැබූ ප්‍රගතිය මගින් දිරි ගන්වන ලදුව තවත් අක්කර 15 ක බිම් කට්ටියක් ගොවිපලට එකතු කරන ලදී. ගොවිපලට විවිධ සේවා සමූපකාර සමිතියක් තිබුණි. වාරිමාර්ග විදුලිබල හා මහා මාර්ග අමාත්‍යාංශයට අයත් ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය මගින් ගොවිපලට අඟල් 6 ක වතුර පොම්පයක් ලබා දී තිබුණේය. 1973 යල කන්නයේදී ගොවිපලේ ප්‍රථම අස්වැන්න සාර්ථක අන්දමින් නෙළා ගෙන තිබුණි.

ප්‍රථම අධ්‍යයනය පැවැත්වූ කාලයේදී ගොවිපලේ සාමාජිකයෝ වී වගාව සඳහා අක්කර 38 ක බිමක් සකස් කරමින් සිටියහ. ගොවිපලට සමාන්තරව ගලා යන පදවිය ඔයෙන් අවුරුද්ද පුරාම ජලය ලබා ගන්නා ලදී. ඇල මාර්ගය අසල පොල් අතු මඩුවක පොම්පය සවි කොට තිබුණි. අඟල් 14 X 12 ප්‍රමාණයේ ගඩොල් ඇලිය බෙදුම් ඇළ අඩි 3,000 ක් දික් වූ අතර එමගින් කුඹුරුවලටම ජලය යෙදා හරින ක්ෂේත්‍ර ඇළ මාර්ග 9 කට ජලය සපයන ලදී. (III රූප සටහන බලන්න).

ගොවිපලේ සාමාජිකයින් 40 දෙනෙකු විසින් වගා කරන ලද ප්‍රථම බෝගය පිළිබඳ තොරතුරු IV-11 සටහනේ පෙන්වා දී ඇත. පළමු අස්වැන්නෙන් රු. 1,20,400/- ක

ආදායමක් ලැබුණි. 1973 මහ කන්නයේදී වුං ඇට අක්කර 2 කින් රාත්තල් 1,600 ක අස්වැන්නක් ලැබුණි.

## වර්තමාන තත්වය

සමාජ තත්වය: සමූපකාර පදනමකට වඩා පුද්ගලික පදනමක් මත ගොවිපල සැළසුම් කරන ලද නිසා ජනාවාසයක් බිහිවේ යැයි මුලදී අපේක්ෂා කළේ නැත. කෙසේ වුවද අන්‍යෝන්‍ය සුහදතාවය පිළිබඳ හැඟීමක් සාමාජිකයින් අතර වර්ධනය වී තිබුණි. ඔව්හු හොඳ සහයෝගයෙන් එකමුතු වී තිදෙනෙකුගෙන් යුක්ත කණ්ඩ වලින් කුඹුරු වැඩ කළහ. ව්‍යාපාර භාරව කටයුතු කල රජයේ නිලධාරීන්, විශේෂයෙන් ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන, ගොවිපලේ කටයුතුවලදී තිව්වූ සහභාගිත්වයක් දැක්වූ බව පෙනෙන්නට තිබුණි. මෙම නිලධාරීන්ගේ කටයුතු සාමාජිකයින් විසින් අගය කරන ලද අතර ගොවිපල දියුණු කිරීමට සහ ගොවිපල තුළින් ස්ථාවර සමාජයීය-ආර්ථික ඒකකයක් නිර්මාණය කිරීමට සාමාජිකයින් දරන ප්‍රයත්නය කෙරෙහි නිලධාරීහු පැහැදී සිටියහ.


## ගොවිපලේ කළමනාකරණය

ආයතනික වශයෙන් ගොවිපල එම ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිතිය යටතේ වූ නමුදු, එහි පරිපාලනය ප්‍රධාන වශයෙන් කරන ලද්දේ උප දිසාපති සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධන සහකාර විසිනි. ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාවේදී, රජයෙන් වෙන් කල අරමුදල් සංවර්ධන කටයුතු සඳහා වියදම් කිරීමට සිදු වී තිබුණු හෙයින් මෙම පරිපාලනය අවශ්‍ය විය. ගොවිපලේ සංවර්ධනය සඳහා ආරම්භක අවස්ථාවලදී සාමාජිකයින් විසින් කරන ලද වැඩ කොටස් සඳහා ගෙවීමක් නොකරන ලදී. පසුකාලීන සංවර්ධනය සඳහා අරමුදල් ඉතිරි කර ගැනීම අරභයා අනුගමනය කරන ලද මෙම පිළිවෙත සාමාජිකයින්ට තේරුම් කරදී ඔවුන්ගේ කැමැත්ත ලබා ගන්නා ලදී. සමහරවිට අත්පිට ගෙවීමක් නොමැතිව වුවද ගොවිපලේ වැඩ කිරීමට පවා සාමාජිකයින්ගේ විශ්වාසය දිනා ගැනීමේ ලා ගොවිපලේ නිල සහ නිල නොවන නායකත්වය සමත් වී තිබුණි. මේ අයුරින් රු. 24,398/- ක වියදමින් අක්කර 40 ක කැලෑ ඉඩමක් හෙළි පෙහෙළි කොට 1973 යල කන්නයේදී වගා කිරීම සඳහා සකස් කිරීමටත්, අඩි 3,000 ක් දිග බෙදුම් ඇළක් සහිත වාරිමාර්ග ක්‍රමයක් සෑදීමටත්, ක්ෂේත්‍ර ඇල මාර්ග 9 ක් තැනීමටත් සමත් වී ඇත.

## විශ්ලේෂනය

ආර්ථිකමය කරුණු: අක්කර 25 ක් සඳහා මූලිකව සැළසුම් කල ප්‍රාග්ධන වියදම රු. 39,250/- ක් විය. තවත් අක්කර 15 ක් සඳහා පසුව ප්‍රාග්ධන වියදම රු.24,250/- ක් වූ නිසා මුළු ප්‍රාග්ධන වියදම රු. 63,500/- ක් විය. (සටහන් IV-9). වෙන් කරන ලද රු. 79,907/- ක් (සටහන් IV-10) 1972 සැප්තැම්බර් මාසයේ සිට 1974 ජනවාරි දක්වා වියදම් වී ඇත්තේ රු. 24,398/- කි. මේ නිසා රු. 55,509/- ක ඉතිරියක් විය. මෙලෙස ප්‍රාග්ධන ශීර්ෂයන් සඳහා දරන ලද වියදම, වෙන් කල මුදලින් 30% ක් වී තිබේ.

සටහන III



සටහන IV-9 සැළසුම් කරන ලද වියදම

| විස්තරය | අක්කර 25 | අක්කර 15 |
|---|---|---|
| 1 | 2 | 3 |
| **ප්‍රාග්ධන** | | |
| කැලෑ හෙළි පෙහෙළි කිරීම (අක්කරයකට රු. 200/- බැගින්) | 5,000 | 3,000 |
| බිම් සකස් කිරීම (අක්කරයකට රු. 300/- බැගින්) | 8,750 | 4,500 |
| පස සංරක්ෂණය (අක්කරයකට රු. 50/- බැගින්) | 1,250 | 2,250 |
| වැට බැඳීම (අක්කරයකට රු. 150/- බැගින්) | 3,750 | 2,250 |
| උපකරණ (අක්කරයකට රු. 800/- බැගින්) | 20,000 | - |
| ගොඩනැගිලි ආදියට | 500 | - |
| වාරිමාර්ග | - | 12,000 |
| පොදු වාඩිය සඳහා | - | 250 |
| අනු එකතුව | 39,250 | 24,250 |
| **පුනරාවර්තන** | | |
| බීජ වර්ග (මිරිස්) අක්කර 20 කට රාත්තල් 60 ක් රු. 5.50 බැගින් | 300 | |
| රතු ළූනු (අක්කර 5 කට) හොන්ඩර 60 ක් හොන්ඩරයක් රු. 36/- බැගින් | 2,160 | |
| පොහොර | 300 | |
| කෘෂි-රසායනික ද්‍රව්‍ය | 1,500 | |
| ශ්‍රමය, ජලනල, නඩත්තුව හා අනිකුත් වියදම් (පුද්ගලයින් 15 දෙනෙකුට) | | 23,400 |
| අනු එකතුව | 4,290 | 23,400 |
| එකතුව | 43,540 | 47,650 |

මූලාශ්‍රය: කුම සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සැළසුම් අංශය

මූලික සංවර්ධන සැළසුම්වල සැළසුම් කරන ලද මුළු වියදම රු. 91,190/- ක් විය. මෙයින් රු. 63,500/- ක් (69%) ප්‍රාග්ධන වියදම් වූ අතර රු. 27,690/- ක් (31%) පුනරාවර්තන වියදම් වූයේය. ගොවීන් 40 දෙනා විසින් දරණ ලද පුනරාවර්තන වියදම පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි වූ හෙයින් මෙම අනුපාතය සියළු තත්වයටද අදාළ වනු ඇත. මෙම උපකල්පනය අනුව, වියදම් රු. 35,400/- විය යුතු වේ. මෙයින් රු. 24,398/- ක් (69%) ප්‍රාග්ධන වියදම් විය යුතු අතර (ඇත්තෙන්ම එය එසේ වීය) රු. 11,002/- ක් ප්‍රක්ෂේපිත පුනරාවර්තන වියදම් විය යුතු වේ.

මාස 15 ක් තිස්සේ කෘෂිකාර්මික නිෂ්පාදිතයේ වටිනාකම රු. 1,20,400/- ක් වූ බව IV-11 සටහනේ දක්වා ඇත. මෙහි එකතු කළ වටිනාකම රු. 85,000/- ක් විය. ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය විසින් සපයන ලද, ආසන්න වශයෙන් රු. 45,000/- ක් ලෙස තක්සේරු කර ඇති වතුර පොම්පයේ වටිනාකම ආයෝජනය කරන ලද්දක් ලෙස සැලකිය හැකි වේ. මෙසේ වූ විට මුළු ආයෝජන ප්‍රමාණය රු. 80,400/- දක්වා ඉහළ නැගෙනු ඇත. මෙවැනි තත්වයකදී මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරික්තය රු. 40,000/- ක් විය යුතුය. ගොවිපල මාස 15 ක් ක්‍රියාත්මක වූ බැවින් වාර්ෂික අතිරික්තය රු. 32,000/- ක් විය යුතු වේ. එනයින් ප්‍රාග්ධන පියවීමේ කාල පරිච්ඡේදය අවුරුදු 2.5 ක් විය යුතුය. මෙම ප්‍රමාණය අනුව වාර්ෂික ආයෝජනය රු. 64,320/- ක් විය යුතු වන අතර, ආයෝජනයේ සාමාන්‍ය ප්‍රතිලාභය සියයට 50 ක් විය යුතුය. වාර්ෂිකව සියයට 10 ක අනුපාතයක් ක්ෂයවීම් සඳහා ඉවත් කරන ලද්දේ නම්, එහි ප්‍රතිඵලයක් ලෙස රු. 26,931/- ක වාර්ෂික අතිරික්තයක් මගින් ආසන්න වශයෙන් 42% ක ප්‍රතිලාභයක් ලැබිය යුතු වේ. මෙය ඉතා ධෛර්යමත් කරුණකි.

පරිපාලනමය කරුණු

තීරණ ගැනීමේ ක්‍රියාවලිය මෙන්ම නියම මෙහෙයුම්ද විකේන්ද්‍රගත කරනු ලැබ ඇති අතර ඒවා වෙන් වෙන්ව කරගෙන යනු ලැබේ. වගා කිරීම සඳහා අක්කර තුනක නිශ්චිත බිම් කැබලි අයත් වූ සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුක්ත කණ්ඩ මගින් වගා කටයුතු කරන ලදී. මූලික සකස් කිරීමේ කටයුතු ඉටු කර නායකත්වය දෙන ලද්දේ, පුරෝගාමී අසල්වැසි කණ්ඩයක් එක් රැස් කළ හා නිලධාරී සහයෝගය ලැබූ පළාත්බද ගොවියකු විසින් බව පෙනී යයි. නිලධාරීන්ගේ ධෛර්ය්‍ය හා සහයෝගිත්වය නිරතුරුව ලැබෙමින් තිබුණු අතර ව්‍යාපාරය යහපත් සමාජ පදනමක් සහිත පරිසරයකට ළඟා වී තිබුණි. ආරම්භක කටයුතු එකමුතු වී කරන ලදී. ඉපැයුම් වලින් කොටසක් දෙවනුව ඉතිරි කරන ලද අතර, නොකඩවා වගා කිරීමට උදව් දෙන වාරිමාර්ග ක්‍රම ඇති කිරීම වැනි සංවර්ධන වැඩ කටයුතුවලට එම ඉතිරි කිරීම් යොදන ලදී. අසල පිහිටි පෞද්ගලික ගොවිපලක යොදාගෙන තිබුණු ක්‍රමය ආදර්ශයට ගෙන මෙම ගොවිපලෙහි උත්සාහ වාරිමාර්ග ක්‍රමය සකස් විණි.

සමාජයීය කරුණු

තෝනිගල ගොවිපලේ සාමාජිකයින්ගෙන් වැඩි දෙනෙකුගේ වයස 30 ගණන්වල වූ අතර ඔවුන්ට කෘෂිකර්මය පිළිබඳ දිගු පළපුරුද්දක්ද තිබුණි. මොවුන්ගෙන් බොහෝ දෙනෙකුට ගොවිපලේ ආදායමට අතිරේකව හේන්, ගෙවතු හෝ අනිකුත් කෘෂිකාර්මික ව්‍යාපාර අයත්ව තිබුණේය. ගොවිපලේ මූලික සංවර්ධන ක්‍රියාවලිය තුළින් බිහි වූ නායකයා ගෞරවයට පාත්‍ර වූයේ ගොවිපලෙහි ප්‍රගතිය හා සංවර්ධනය උදෙසා ඔහු පිරිනැමූ ප්‍රරෝගාමී දායකත්වය නිසාය. රජයේ නිලධාරීන්ගේ සහායද, ලබා ගත හැකිව තිබී අරමුදල්ද යොදවා සාමාජිකයෝ ගොවිපල සංවර්ධනය කර ඔවුන්ගේ වගා කටයුතු වලින් ආදායමක්ද ලබා ගත්හ. ගොවිපලේ නායකයා නිලධාරීන් සමඟ කිට්ටු සම්බන්ධතා ඇතිව සිටියේය.

ගොවිපලෙහි තම ඉතිරි කිරීම් ආයෝජනය කිරීමට තීරණය කිරීමේදී මෙම ව්‍යාපාරයේ ප්‍රතිඵල පිළිබඳව ඔවුන් තුළ ඇති විශ්වාසය මැනවින් පැහැදිලි කර තිබුනි. සාමාජිකයින් තිදෙනෙකු ගෙන් යුතු කණ්ඩවලින් ගොවිපල වගා කිරීමට පිළියෙල කිරීම ප්‍රයෝජනවත් ක්‍රමයක් වූයේය. මේ ගොවිපල, සමූපකාර ගොවිපලක් නොවුවද සමූපකාර ක්‍රමයේ හරය සහ ඒකීයතාවය මෙහි දක්නට ලැබුනි.

**සටහන IV-10** 1972 සැප්තැම්බර් සිට 1974 ජනවාරි දක්වා වෙන් කල වියදම් සහ නියම වියදම්

| | වෙන් කල ප්‍රමාණය රු. | නියම වියදම රු. | වෙනස රු. |
|---|---|---|---|
| කැලෑ හෙළි පෙහෙළි කිරීම | 8,000 | 7,964 | 36 |
| බීජ සකස් කිරීම | 14,750 | 2,442 | 12,308 |
| වැට බැඳීම | 6,000 | 2,714 | 3,286 |
| පස සංරක්ෂණය | 1,250 | 4,336 | -3,086 |
| උපකරණ | 32,000 | 5,692 | 26,308 |
| වාරිමාර්ග | 16,657 | - | 16,657 |
| පොදු පහසුකම් | 1,250 | 1,250 | - |
| එකතුව | 79,907 | 24,398 | 55,509 (ඉතිරිය) |

මූලාශ්‍රය: ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන අංශය.

**සටහන IV-11** 1973 යල නිෂ්පාදනය පිළිබඳ විස්තර

| | වගා කල අක්කර ප්‍රමාණය | නිෂ්පාදනය හොන්ඩර | වටිනාකම රු. |
|---|---|---|---|
| මිරිස් .. | 20 | 160(වියළි) | 112,000 |
| බොම්බයි ළූනු | 2 1/4 | 12 | 2,700 |
| ලූනු ඇට .. | 1 1/4 | 12 | 2,700 |
| එළවළු .. | 4 1/2 | - | 3,000 |
| එකතුව | 28 | | 120,400 |

මූලාශ්‍රය- ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන අංශය.

### 4.3.3 අරංගල

පසුතලය

මෙම ව්‍යාපාරය පිහිටියේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල උප දිසාපති කොට්ඨාශයේය. මෙහි කටයුතු සාමාජිකයින් 20 දෙනෙකු ඇතිව 1972 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. 1973 ඔක්තෝබර් මාසයේ ක්ෂේත්‍ර අධ්‍යයනය කරන ලද කාලයේදී සාමාජිකයින් 10 දෙනෙක් ගොවිපලේ සිටියහ.

ගොවිපලේ අක්කර 18 ක් පිළිබඳ සංවර්ධන සැළැස්ම IV-13 සටහනේ දක්වා ඇත. මිරිස්, රතු ළූනු, දුම්කොළ, වී, රට කජු, එළවළු සහ බොම්බයි ළූනු වගා කළයුතු වූයේය. වර්ෂා කාලවලදී පමණක් ජලය ලබා ගතහැකි කිට්ටුවෙන් පිහිටි ඇලේ ජලයත්, වැසි ජලයත් මත මහ කන්නයේ වගාව රඳා පැවතියේය. අවුරුද්ද තිස්සේම කරනු ලැබෙන සූක්ෂම වගාව මඟින් සාමාජිකයින්ට ස්ථාවර ආදායමක් ලබා දීමට අපේක්ෂා කරන ලදී.

ක්ෂේත්‍ර අධ්‍යයනය පැවැත්වූ කාලයේ සාමාජිකයින් 10 දෙනෙක් එක් එක් අයෙකු විසින් අක්කර 1 කට තරමක් අඩු බිම් කට්ටියක් බැගින් වගාව සඳහා පිළියෙල කරමින් සිටියහ. සාමාන්‍යයෙන් ගොවිපලේ හදිසි වැඩ සඳහා තම පවුල්වල අයගේ උදව්ව සාමාජිකයින් විසින් ලබා ගන්නා ලදී. යල් කන්නයේදී වියළිව පවතින ළිඳක් පමණක් තිබුණු හෙයින් ගොවිපලේ වගා කටයුතු අවුරුද්දේ මාස 6 කට පමණ සීමා වූයේය.

සංවර්ධන සැළැස්ම හා ලැබූ ප්‍රගතිය

ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් විසින් සකස් කරන ලද සංවර්ධන සැළැස්ම අවුරුදු 3 ක කාලයක් සඳහා විය. (සටහන IV-13). කරන ලද වැඩ ප්‍රමාණය IV-15 සටහනේ දැක්වේ. 1972 ජූනි මස සිට 1973 සැප්තැම්බර් මස දක්වා වගා කරන ලද මුළු අක්කර ප්‍රමාණය 21 1/2 ක් ලෙස වාර්තා කොට තිබේ. සංවර්ධනය කරන ලද ප්‍රදේශයෙන් අක්කර 12 ක් (56%) මිරිස් වලින් යුක්ත විය. අක්කර 6 ක් (28%) බෝංචි වලින් යුක්ත විය. ගොවිපලෙහි වවන ලද ප්‍රධාන බෝග මේවා විනි. පළමු වසරේදී ඇස්තමේන්තු කල අක්කර 10 න් අක්කර 8 ක් වගා කරන ලදී. මෙය සාමාජිකයින් 13 දෙනෙකු විසින් කරන ලදී. ඊළඟ වර්ෂයේදී ඇස්තමේන්තු කරන ලද අක්කර ප්‍රමාණය 9 1/2 ක් වුවත් අක්කර 13 1/2 ක් වගා කරන ලදී. සාමාජිකයින් 10 දෙනාගෙන් එක් එක් අයකු විසින් අක්කර 1.3 ක සාමාන්‍ය ප්‍රමාණයක් වගා කොට තිබුණි.

**සටහන IV-12** **වෙන් කළ අරමුදල් හා නියම වියදම්**

| කාර්යය | වෙන් කරන ලද ප්‍රමාණය රු. | නියම වියදම රු. |
|---|---|---|
| අක්කර 18 ක වැට බැඳීම | 2,700 | 35 |
| කැලෑ හෙළි පෙහෙළි කිරීම | 3,600 | 1,050 |
| බිම් හෙළි පෙහෙළි කිරීම සහ සැකසීම | 6,300 | 2,815 |
| පස සංරක්ෂණය | 900 | - |
| ගොඩනැඟිලි තැනීම | 900 | - |
| ගොවිපල උපකරණ හා වාරිමාර්ග | 14,400 | 10,939 |
| එකතුව | 28,800 | 14,839 |

මූලාශ්‍රය: කෘෂි සම්පාදන අමාත්‍යාංශය-ප්‍රාදේශීය සංවර්ධන අංශය.

**සටහන IV-13** **සංවර්ධන සැලැස්ම**

| වර්ෂය | කන්නය | මිරිස් | රතු ළූනු | දුම්කොළ | වී | රට කජු | එළවළු | බෝම්බයි ළූනු | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | යල | 2 | 1 1/2 | 1 1/2 | - | - | - | - | 5 |
| | මහ | 2 | 1 | - | 2 | - | - | - | 5 |
| 2 | යල | 2 | 1 | 1 | - | - | 1/2 | - | 4 1/2 |
| | මහ | 2 | 1 | - | 2 | - | - | - | 5 |
| 3 | යල | 1 | 1 | 1 | - | 1 | 1/2 | 1/2 | 5 |
| | මහ | 1 | 1 | - | 3 | - | - | - | 5 |

මූලාශ්‍රය: කෑගල උප දිසාපති කාර්යාලය

සාමාජිකයින් විසින් පෞද්ගලිකව අස්වැන්න තෙලා විවෘත වෙළඳපලේ විකුණන ලදී. ඒ අනුව එළවළු ආදියෙහි විකුණු ප්‍රමාණ පිළිබඳ දත්ත ගොවීන් විසින් සපයන ලද තොරතුරු මත පදනම් වී ඇත. ප්‍රථම වගා වර්ෂය තුළ සාමාජිකයින් විසින් බෙණ්ඩි රාත්තල් 12,000 ක් සහ අමු මිරිස් හොණ්ඩර 5 ක් විකුණන ලදී. 1973 ප්‍රථම කාර්තුව තුළ තක්කාලි නිෂ්පාදනය රාත්තල් 50 ක්ද, වියලි මිරිස් නිෂ්පාදනය රාත්තල් 50 ක්ද, පතෝල නිෂ්පාදනය රාත්තල් 1,500 ක්ද වූයේය.

වර්තමාන තත්වය

ගොවිපලේ කළමනාකරණය: පෞද්ගලික පදනම මත වගා කටයුතු සිදු කෙරිනි. ප්‍රාථමික සමූපකාර සමිතියක් විසින් ගොවිපල පරිපාලනය කරන ලද නමුත් ගොවිපලේ කටයුතුවලට එහි සම්බන්ධතා වය අවම විය. ගොවිපලේ මූලික අවස්ථාවලදී බීජ වර්ග, පොහොර වැනි යෙදවුම් සැපයීම සඳහා මේ සමූපකාර සමිතිය මගින් තරමක් අසාර්ථක වූ ප්‍රයත්නයක් දරනු ලැබිනි. නාඋල උප දිසාපති කාර්යාලය ගොවිපලට සැ. 1 1/2 ක් පමණ දුරින් පිහිටි අතර ප්‍රාථමික සමූපකාර සමිතියට වඩා මේ කා ර්යාලය සමඟ නිතර සාමාජිකයින් විසින් වඩාත් සබඳතා පවත්වා ගන්නා ලදී. නාඋල ප්‍රාදේශීය සංවර්ධන සහකරු ගොවිපලේ කටයුතු කෙලින්ම අධීක්ෂණය කළේය. 1972 මැයි මසදී, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල කුකුල් පාලන ව්‍යාපාරයක් මේ ගොවිපලට ආසන්නව පටන් ගැනුණු අතර ප්‍රාථමික සමූපකාර සමිතිය විසින් එය පරිපාලනය කරන ලදී. අට මාසයක් ක්‍රියාත්මක වීමෙන් පසු මෙම කුකුල් පාලන ව්‍යාපාරයට රු. 7,100/- ක පාඩුවක් සිදු වී තිබුනි. සමූපකාර සමිතියට අරගල ගොවිපල පාලනය කිරීමට ප්‍රවීනත්වයක් ඇද්ද යන බවට සැකයක් මෙම අත්දැකීම තුළින් උද්ගත වන්නට ඇත.

සමාජයීය තත්වය

ගොවිපලේ ක්‍රියාකාරී සා මාජිකත්වය පුද්ගලයින් 10 දෙනෙකුගෙන් යුක්ත විය. මින් 6 දෙනෙක් පිරිමින් වූ අතර, 4 දෙනෙක් කාන්තාවෝ වූහ. ගොවිපලේ කලින් තනන ලද ගොඩනැගිලි 4 ක් විය. ප්‍රධාන වශයෙන් බෝග ආරක්ෂා කිරීමට හා ගොවිපලේ දේපල රැක බලා ගැනීමට ගොවිපලේ සාමාජිකයෝ දෙදෙනෙක් පදිංචි වී සිටියහ. සාමාජිකයින් විසින් තම බිම් කැබලි පෞද්ගලිකව වගා කරන ලදී. ඔව්හු ඉදිරියටත් තම දෙමාපිය පරිසරයෙන් අත් නොවූ කොටසක් ලෙස හා සිය ගැමි ප්‍රජාවේ සාමාජිකයින් ලෙස ජීවත් වූහ.

විශ්ලේෂණය

ආර්ථිකම කරුණු: තරුණයින් 18 දෙනෙකුට පමණ අඛණ්ඩ සේවා නියුක්තියක් සැලසීමට ගොවිපල අපේක්ෂා කළාය. ගොවිපලේ වියදම් සඳහා රු. 28,800/- ක් වෙන් කොට තිබුනි. මේ වියදම් පිළිබඳ වර්ග කිරීමක් IV-12 සටහනේ දක්වා ඇත. 1972 පෙබරවාරි මස සිට 1973 ඔක්තෝබර් මස දක්වා මාස 20 ක් ඇතුළත නියත සංවර්ධන වියදම රු. 14,839/- ක් විය. මූලිකව සැළසුම් කළ මූලධනය වියදම අක්කරයක් සඳහා සහ එක් පුද්ගලයෙකු සඳහා රු. 1,600/- ක් විනි. නමුත් රු. 14,839/- ක නියම වියදම අනුව සාමාන්‍ය ඒක පුද්ගල වියදම රු. 1,140/- ක් වන අතර, සාමාන්‍යයෙන් එක අක්කරයකට වියදම රු. 820/- ක් වනුයේ සාමාජිකයින් 13 දෙනෙකු හා අක්කර 18 ක් යන පදනම මතය. කෙසේ වෙතත් වර්ෂයකට සාමාජිකයින් 10 දෙනෙකු පමණ අක්කර 10 ක් පමණ වගා කරන බැවින් එක් පුද්ගලයෙකුගේ මෙන්ම එක් අක්කරයකද සාමාන්‍ය වියදම රු. 1,483/- ක් විය යුතුය. ප්‍රාග්ධන ශීර්ෂයක් සඳහා රජයේ මුදල් වියදම් කරන ලදී. මේ අතර පුනරාවර්තන වියදම් වලින් කොටසක් ආපසු ගෙවිය යුතු ණය මුදල් වශයෙන් විවිධ සේවා සමූපකාර සමිතිය විසින් යොදන

ලද අතර බීජ වර්ග, පොහොර ආදිය සැපයීම සඳහා වන වියදමින් කොටසක් සාමාජිකයින් විසින්ම සපයන ලදී.

ගොවිපලේ නිෂ්පාදන විකිණීමෙන් සාමාජිකයින්ට මාස 20 ක් තුළ රු. 13,277/- ක් ලැබී තිබුනි. මේ අනුව මාසයක සාමාන්‍ය ඉපැයීම් රු. 663/- කි. මුළු සාමාජිකත්වය 13 ක් වී නම් එක් සාමාජිකයෙකුගේ දළ මාසික ආදායම රු. 51/- ක් විය යුතුව තිබුණ අතර, 10 දෙනෙකුගේ සාමාජිකත්වය යටතේ එය රු. 66/- ක් විය යුතුය. පහත් ආදායමට හේතු වූයේ ප්‍රධාන වශයෙන්ම අස්වැන්න අවිනිශ්චිත තත්වයක වූ වර්ෂාව මත රඳා පැවතීමයි. 1972 මුල් කොටසේදී ඉඩම් වගා කිරීම පිළිබඳව දරන ලද ප්‍රථම උත්සාහය අසාර්ථක වූයේ අකාලයේදී වාග කිරීම සහ අප්‍රමාණවත් වර්ෂාව නිසාය. විශේෂයෙන්ම වර්ෂා ජලයෙන් වගා කටයුතු කිරීමට ගොවිපලවල් අපේක්ෂා කරයි නම් අප්‍රමාණවත් වර්ෂාව පිළිබඳ බියක් නොමැති මහ කන්නයට පමණක් වගා කටයුතු සීමා කිරීමට සිදු වනු ඇත.

කළමනාකරණ අංශය

කළමනාකාරිත්වය සතු ප්‍රධාන කාර්යය වූයේ බීජ වර්ග, පොහොර හා කෘෂි-රසායන ද්‍රව්‍ය වැනි යෙදවුම් සැපයීම, කන්නය සඳහා සාමාන්‍යයෙන් පිළිගත හැකි වගා සැළැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, වාරිමාර්ග ක්‍රමයක් සැකසීම, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සැලසීම, නිෂ්පාදිතය අලෙවි කිරීමේදී ආධාර කිරීම යනාදියයි. ස්ථාවර ජල සම්පාදනයක් සැපයීමේ කරුණ පිළිබඳව කළමනාකාරිත්වය මගින් අර්ථවත් පියවරක් ගෙන තිබී නැති බව පෙනී යයි.

<u>සටහන IV-14</u> - 1972 ජූනි සිට 1973 සැප්තැම්බර් දක්වා වැඩූ බෝග වලින් ලද ආදායම

| කාල පරිච්ඡේදය | මිරිස් රු. | බෝංචි රු. | තක්කාලි රු. | පතෝල රු. | වම්බටු රු. | මුළු ගණන රු. |
|---|---|---|---|---|---|---|
| 1972 ජූනි - දෙසැ. | 600 | 4,355 | - | - | - | 4,955 |
| 1973 ජන. - මාර්තු | 513 | - | 20 | 508 | - | 1,041 |
| 1973 අප්‍රේ. - ජූනි | 3,854 | - | - | - | - | 3,854 |
| 1973 ජූලි-සැප්. | 3,360 | - | - | - | 67 | 3,427 |
| මුළු ගණන | 8,327 | 4,355 | 20 | 508 | 67 | 13,277 |

මූලාශ්‍රය: කෘෂි සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන අංශය.

සටහන IV-15 1972 ජූනි සිට 1973 සැප්තැම්බර් දක්වා සාමාජිකයින් විසින් වගා කරන ලද ඉඩම් ප්‍රමාණය

| කාල පරිච්ඡේදය | | වගා | කරන | ලද | දෑ | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බෝංචි | මිරිස් | තක්කාලි | පතෝල | දුම්කොළ | තල | වම්බොටු | මුළු ගණන අක්කර |
| 1972 ජූනි - දෙසැ. | 6 | 2 | - | - | - | - | - | 8 |
| 1973 ජන. -මාර්තු | - | 3 1/2 | 1/4 | 2 | - | - | - | 5 3/4 |
| 1973 අප්‍රි. - ජූනි | - | 4 1/2 | 1/4 | - | 1/4 | 1/4 | - | 5 1/4 |
| 1973 ජූලි - සැප්. | - | 2 | - | - | - | - | 1/2 | 2 1/2 |
| එකතුව | 6 | 12 | 1/2 | 2 | 1/4 | 1/4 | 1/2 | 21 1/2 |

මූලාශ්‍රය: කෘෂි සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන අංශය.

ආරම්භක සැළැස්මේ ළිං කැනීමටත්, පොම්ප සවි කිරීමේ වියදම සඳහාත් මුදල් ප්‍රතිපාදන සලසා නොතිබුණ නිසා ගොවිපලට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විනි.

ව්‍යාප්ත සේවාවන් සැළකිය යුතු ලෙස කාර්යක්‍ෂම වී තිබුනි. අලෙවි කටයුතු හොඳින් සංවිධානය කොට නොතිබුණු හෙයින් ගොවීන්ට තම නිෂ්පාදිතයන් සඳහා හොඳම මිලක් ලබා ගත නොහැකි විය. සමූපකාර සමිතිය එතරම් ක්‍රියාශූර වී නොතිබිනි. රජයේ නිලධාරීන්ගේ සම්බන්ධතාවය හා රජයේ අරමුදල් නාස්ති කිරීම වැළැක්වීමේ ලා ඔවුන් ගත් උත්සාහය, කෘෂිකාර්මික කටයුතු නොනවත්වා කරගෙන යාමට තුඩු දී ඇත. සාමාජිකයින් ගොවිපලේ රැඳීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ රජය විසින් වැය කරන ලද ආරම්භක මුදල් සහ ණයට යෙදවුම් සැපයීමයි.

සමාජයීය කරුණු

සාමාජිකයෝ පෞද්ගලිකවාදයට නැඹුරුව සිටි අතර පොදුජන සමූහයක් ගොවිපලේ බිහි නොවීය. ගොවිපලේ සාර්ථකත්වය ඌන වීම නිසා ගොවිපල ගැන ඉතා අඩු සැළකිල්ලක් දැක්වූ අසල්වැසි ප්‍රජාවන් සමඟ සබඳතාවක් තිබුණේ කලාතුරකිනි. අසාර්ථක තෙලවරකින් යුතු වුද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඇරඹුවාවූද රජයේ ගොවිපලක් පසුව තරුණ යෝජනා ක්‍රමයකට වෙනස් කිරීමද මේ හැඟීමට තුඩු දුන්නේය.

## 4.3.4 උප්පුවේලි කුකුල් පාලන ව්‍යාපාරය

පසුතලය

මෙම කුකුල් පාලන ව්‍යාපාරය ත්‍රිකුණාමලයේ උප්පුවේලි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ අරඹන ලද්දේ 1971 ඔක්තෝබර් මාසයේදීය. මෙම ව්‍යාපාරය පිළිබඳව ක්ෂේත්‍ර අධ්‍යයනය කරන අවස්ථාව වනවිට එය අවුරුදු දෙකක් තිස්සේ ක්‍රියාත්මක වී තිබුණි. මෙහි පුද්ගලයෝ 20 දෙනෙක් රැකියා ලබා සිටියහ. මුරකරුවෙක් සහ පශුවෛද කරුවන් දෙදෙනෙක්ද වූහ. මූලික ප්‍රාග්ධන වියදමින් කොටසක් පියවා ගැනීම සඳහා රජය මගින් දීමනාවක් වශයෙන් රු. 25,000/- ක් දෙන ලදී. මෙම දීමනාවෙන් එක් සේවා නියුක්ත පුද්ගලයෙකුට අදාළ වන ප්‍රමාණය රු. 1,250/- ක් විය. කෙසේ වුවද, මුළු ප්‍රාග්ධන ආයෝජනය රු. 25,000/- ඉක්මවා තිබුණි. නිෂ්පාදනය කරන ලද බිත්තර, ත්‍රිකුණාමලයේ විවිධ සේවා සමූපකාර සමිතිය මගින් කොළඹ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට විකුණන ලදී. මෙම ව්‍යාපාරය ආයතනික වශයෙන් විවිධ සේවා සමූපකාර සමිතිය මගින් පරිපාලනය කෙරුණ නමුත් පරිපාලනයෙහි ලා ප්‍රාදේශීය බලධාරීහු සමීප ලෙස සම්බන්ධ වූහ.

මෙම කුකුල් පාලන ව්‍යාපාරයට රජයේ ඉඩම් අක්කර භාගයක් ආරම්භ කර තිබුණු අතර ව්‍යාපාරයේ වැඩිදුර ව්‍යාප්තිය සඳහා අමතර අක්කර 2 ක් වෙන් කොට තිබුණි. රුපියල් 61,825/- ක වියදමින් ගොවිපලෙහි තනන ලද කුකුල් කොටු 7 ක කුකුලන් 5,000 ක ධාරිතාවක් තිබුණි. ගොවිපලෙහි කුකුලන් 4,300 ක් සිටි අතර ඉන් 3,050 ක් බිත්තර දමන කිකිලියන් සහ 200 ක් මසට ඇති කරන සතුන් විය. ඉතිරි කොටස පැටවුන් විහ. ගොවිපලෙහි නිෂ්පාදිතය ත්‍රිකුණාමල විවිධ සේවා සමූපකාර සමිතිය මගින් කොළඹ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට විකුණන ලදී. සාමාජිකයෝ රු. 75/- සිට රු. 150/- දක්වා විචලනය වූ රු. 117/- ක සාමාන්‍ය මාසික ආදායමක් උපයා ගත්හ. ගොවිපලෙහි රැකියාවන් සපයන ලද පුද්ගලයින් 20 දෙනෙකු අතුරින් 17 දෙනෙකුට ව්‍යාපාරයේ මුදලින් වැටුප් ගෙවනු ලැබූ අතර 3 දෙනෙකුට විවිධ සේවා සමූපකාර සමිතියේ මුදලින් වැටුප් ගෙවන ලදී.

වර්තමාන තත්වය

ගොවිපලේ කළමනාකරණය: සාමාජිකයින් හත් දෙනෙකුගෙන් යුක්ත අධ්‍යක්ෂ මණ්ඩලයට උප දිසාපති තැන (සභාපති) ද ත්‍රිකුණාමල විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ වරයෙකු වූ රජයේ පශු වෛද්‍ය වරයාද, ත්‍රිකුණාමල විවිධ සේවා සමූපකාර සමිතියේ නියෝජිතයකුද, ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැනද, ගොවිපලේ සාමාජිකයින්ගේ නියෝජිතයින් දෙදෙනෙක්ද ඇතුළත් වූහ. ආරම්භක අවස්ථාවලදී ගොවිපලේ පරිපාලනය ප්‍රධාන වශයෙන්ම කාර්යක්ෂම අයුරින් ගොවිපල පරිපාලනය කළ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ වගකීම වූ නමුත් සාමාජිකයෝ පිළිගත හැකි ප්‍රමාණයට පරිපාලනයේ ලා මැදිහත් කරවා ගනු නොලැබිණි. ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන ව්‍යාපාරයට පූර්ණකාලීනව බැඳී සිටියේය.

වසර දෙකකට පමණ පසු, ශිල්පීය හා මූල්‍යමය කරුණු කිහිපයක් පිළිබඳ අවස්ථාවලදී හැර පරිපාලනය සියතට ගැනීමට සාමාජිකයින් සුදුසුය යන හැඟීමක් බොහෝ රජයේ නිලධාරීන් තුළ වූයේය. මේ කාලයේදීම වාගේ ගොවිපල සඳහා වූ සමිතියේ මූල්‍යමය බැඳීම රුපියල් 84,000/- ක් තරම් ඉහළ වූ නිසා ව්‍යාපාරය කෙරෙහි සමිතියේ වැඩි පාලනයක් තිබිය යුතු යයි ත්‍රිකුණාමල විවිධ සේවා සමුපකාර සමිතිය අදහස් කළාය. තොග හා විකුණුම් පාලනය කිරීම සඳහා සමුපකාර ශාඛා කළමනාකාරවරයෙකු ව්‍යාපාරයට පත් කරන ලෙසත්, වැඩිපුර ගැහැණු ළමයින් කිදෙනෙකු ව්‍යාපාරයේ සාමාජිකාවන් ලෙස තෝරා ගන්නා ලෙසත්, විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති විසින් ඉල්ලා සිටින ලදී. රජයේ නියෝජිතයින් පස් දෙනෙක් විවිධ සේවා සමුපකාර සමිතියේ නියෝජිතයින් දෙදෙනෙක් හා ගොවිපලේ සාමාජිකයින් නියෝජනය කරන එක් පුද්ගලයෙකුද ඇතිව නව අධ්‍යක්ෂ මණ්ඩලයක් 1973 මාර්තුවලදී පත් කරනු ලැබීය. ප්‍රාදේශීය ආදායම් නිලධාරී යටතේ වැඩ කළ ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන විසින් ව්‍යාපාරයේ පරිපාලනය ඉදිරියටත් කරගෙන යන ලද නමුත් ඔහුගේ වගකීමෙන් කොටසක් ව්‍යාපාරයේ පූර්ණකාලීන ලෙස වැඩ කළ විවිධ සේවා සමුපකාර සමිති කළමනාකාර තැනටද පැවරිනි.

සමාජ තත්වය

සාමාජිකයින් හෙඬින් සංකලනය වූ වැඩ කිරීමේ කණ්ඩායමක් ලෙස නිර්මානය වී තිබුනි. ඇතැම් කාන්තාවන් විවාහ වී ගොවිපල අතහැර ගියේ නම් අළුත් අය බඳවා ගැනීම කළහැකිව තිබුනි. පරිපාලන බලතල සහිතව, ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන සමඟම විවිධ සේවා සමුපකාර සමිතියේ පූර්ණකාලීන කළමනාකරුවකුද සිටීම නිසා සාමාජිකයින්ගේ පක්ෂපාතීත්වය බෙදී යාම පිළිබඳ අභාග්‍ය සම්පන්න තත්වයක් ඇති වීමට පිළිවන.

විශ්ලේෂනය

ආර්ථික කරුණු: මාස 23 ක් තිස්සේ ගොවිපලෙහි මුළු ආදායම රු.3,23,291/- ක් වූ අතර මේ පදනම අනුව වාර්ෂික ආදායම රු. 1,68,240/- ක් විය. සාමාජිකයින් 17 දෙනෙකුගේ පදනම අනුව වාර්ෂික ඒක පුද්ගල ව්‍යාපාරික පිරිවැටුම රු. 9,900/- ක් විනි. මාස 23 ක් තිස්සේ මුළු වියදම රු. 3,74,625/- ක් විය. මෙයින් රුපියල් 3,00,806/- ක් (80%) පුනරාවර්තන වියදම් වූ අතර රු. 73,819/- ක් (20%) ප්‍රාග්ධන වියදම් විනි. සාමාන්‍ය මාසික වියදම රු. 16,250/- ක් වූ අතර එම පදනම අනුව වාර්ෂික සාමාන්‍ය වියදම රු. 1,95,000/- ක් විය (එක් සාමාජිකයෙකුට රු. 11,480/- කි). මාස 12 කට අදාළ වියදම රු. 1,56,600/- ක් වී ඇති අතර මෙය රු. 1,68,240/- ක වාර්ෂික ලැබීම්වලට අදාළ කරවිය හැක. මෙලෙස වාර්ෂික ලැබීම් විසින් රු. 11,640/- කින් වාර්ෂික පුනරාවර්තන වියදම ඉක්මවනු ලැබීය. මෙම පදනම මත ප්‍රාග්ධන පියවීමේ කාල පරිච්ඡේදය අවුරුදු 6.3 ක් විය යුතුය.

සරල මාර්ග ක්ෂයවීමේ ක්‍රමය යොදුවේ නම් හා කුකුල් කොටු ආදියේ ප්‍රාග්ධන වියදම වර්ෂ පහක් තිස්සේ ක්ෂය කළේ නම්, වාර්ෂිකව පියවිය හැකි ප්‍රමාණය රු. 14,763/- ක් වෙයි.

මෙම ප්‍රමාණය වාර්ෂික ලැබීම් වන රු. 1,68,240/- න් අඩු කළ විට වාර්ෂික ශුද්ධ ලැබීම් වන්නේ රු. 1,53,477/- කි. මෙම ප්‍රමාණය වාර්ෂික පුනරාවර්තන වියදම වන රුපියල් 1,56,600/- සමඟ සසඳා බැලුවහොත්, ව්‍යාපාරික කටයුතු වලින් වාර්ෂිකව රු. 3,123/- ක ඌනතාවයක් වූ බව පෙනේ.

කළමනාකරණ අංශය

ගොවිපලේ ආරම්භයේ සිට 1973 මාර්තු මස දක්වා එහි පරිපාලනය සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය මට්ටමේ රජයේ නිලධාරීන්ගේ වගකීම විය. විවිධ සේවා සමුපකාර සමිතියේ සමුච්චිත මූලධනය බැඳීම රු. 84,000/- ක් වනතුරු ප්‍රාග්ධනයෙන් කොටසකුත්, මුළු පුනරාවර්තන වියදමත් විවිධ සේවා සමුපකාර සමිතිය විසින් දරන ලදී. සභාපති ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපයටත්, හමුදාවන්ටත් බිත්තර සහ මසට ගන්නා කුකුලන් සැපයූ විවිධ සේවා සමුපකාරය විසින් ගොවිපලේ නිෂ්පාදිත අලෙවි කිරීම භාර ගන්නා ලදී. ව්‍යාපාරය සමඟ විශාල මූලධනය බැඳීමක් තිබීම සහ දිගුකාලීන සම්බන්ධතාවයක් තිබීමේ ප්‍රතිඵලය වශයෙන්, කළමනාකාරිත්ව බලතල සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් බලධාරීන් සමඟ විවිධ සේවා සමුපකාර සමිතිය තරඟ කළාය. ගොවිපලෙහි නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීම සහ විවිධ සේවා සමුපකාර සමිතියේ සේවකයකු පූර්ණකාලීන ව්‍යාපාර කළමනාකරුවෙකු ලෙස නිරත කරවීමත් සමගම මෙම තරඟය උච්ච අවස්ථාවට පත් වූයේය. ගොවිපලෙහි නුදුරු අනාගතය පිළිබඳව බලාපොරොත්තුවක පෙරනිමිති දක්නට නොවීය.

එක් අතකින් ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැනගේත් අනික් අතින් විවිධ සේවා සමුපකාර සමිතිය විසින් පත් කරන ලද පූර්ණකාලීන කළමනාකරුගේත් ද්විත්ව පාලනය පිළිබඳ තත්වය, සාමාජිකයින්ගේ සම්බන්ධතාවන් කෙරෙහි බලපෑමට ලක් ඇත. මාස 23 කට පසු පවා කළමනාකාරිත්වය විසින් සාමාජිකයින් පරිපාලන කටයුතුවල පුහුණුකිරීමේ ලා උත්සාහයක් දරා නොතිබීම බරපතල වරදකි.

සමාජයීය කරුණු

සාමාජිකයින්ගේ සමාජ පසුබිම එක සමාන වූ අතර, සමාගුතාවයෙන් යුත් ප්‍රජා ඒකකයක් බිහි කිරීම සඳහා මෙම තත්වය හිතකර විය. අවුරුදු 18 - 33 දක්වා වයස් පරතරය ඇති අය ගොවිපලේ සිටි අතර සාමාන්‍ය වයස අවුරුදු 20 ක් පමණ විනි. ඔවුන් සියළු දෙනාම අවිවාහක අය වූ අතර ගොවිපලේ සිට සැතපුම් 1/2 සිට 4 දක්වා දුර ඇති අසල්වැසි ගම් වලින් පැමිණි අය වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු 9 වන ශ්‍රේණිය දක්වා උගත් අය හෝ අ.පො.ස. (සා.පෙ.) සමත් අය වූහ. අසල්වැසි ජනතාව මෙම ව්‍යාපාරය පිළිගෙන, ගොවිපලටත් එහි සාමාජිකයින් වෙතත් තම හෙඳ හිත පතුරුවා තිබුණු බව පෙනී යයි. සාමාජිකයින් භුක්ති වින්ද ප්‍රබල ආර්ථික සහයෝගිතාව සහ මූලික පියවරවලදී සම්බන්ධ වූ රජයේ නිලධාරීන් විසින් පැහැදිලිව පෙන්වන ලද ඇඩී උනන්දුව, තරමක් තාජතිකර වූ සමාජ කොටසක් ගොඩ නැගීමේ ලා උපකාරී වී තිබුණි. විවිධ සේවා සමුපකාර සමිතිය සහ රජයේ නිලධාරීන් මගින් කැරුණු ද්විත්ව පාලනය නිසා කට්ටි ගැසීම් සහ බෙදීම්වලටත් අනෙකුත් දුෂ්කරතාවයන්ටත් මුහුණ දීමට සිදු විය හැක.

සටහන IV-16

## 1971 ඔක්තෝබර් සිට 1973 අගෝස්තු දක්වා වියදම

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රියෙල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | මුළු ගණන | 1972 ඔක්. සිට '73 දෙසැ. දක්වා | '71 ඔක්.- '73 අගෝ. දක්වා මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආහාර හා බෙහෙත් | 9,066 | 8,139 | 9,745 | 11,435 | 11,945 | 9,367 | 9,102 | 10,831 | 79,630 | 114,144 | 193,774 |
| පුහුණු වන්නන්ට දීමනා | 1,559 | 1,544 | 1,559 | 1,556 | 1,501 | 1,836 | 1,782 | 1,661 | 12,998 | 16,849 | 29,847 |
| විවිධ වැටුප් .. | 120 | 228 | 532 | 268 | 311 | 649 | 369 | 312 | 2,789 | 4,105 | 6,894 |
| විවිධ වියදම් .. | 293 | 442 | 269 | 160 | 139 | 564 | 372 | 584 | 2,823 | 3,486 | 6,309 |
| ප්‍රවාහන කුලී .. | 330 | - | 260 | 93 | 65 | 227 | - | - | 975 | 1,396 | 2,371 |
| ලිපි ද්‍රව්‍ය හා තැපැල් ගාස්තු | 23 | 28 | 25 | - | 14 | 85 | 8 | 5 | 188 | 189 | 377 |
| ජලය .. .. | 11 | 38 | 25 | - | 27 | - | 60 | 25 | 186 | 223 | 409 |
| බිත්තර මිලදී ගැනීම .. | 130 | 2,121 | 8,435 | 1,856 | 3,852 | 14,077 | 2,323 | 367 | 33,161 | - | 33,161 |
| විදුලිබලය .. | - | 1,205 | 525 | - | 341 | 339 | - | 41 | 2,451 | 3,053 | 5,504 |
| විකුණුම් වියදම් .. | - | 209 | 111 | 61 | 122 | 177 | 123 | - | 803 | - | 803 |
| කුකුලන් මිලදී ගැනීම .. | - | - | 1,063 | 1,063 | 1,489 | 3,426 | 522 | 2,795 | 8,232 | - | 10,358 |
| රසකැවිලි .. .. | - | - | - | - | - | - | 62 | 14 | 76 | - | 76 |
| අලෙවි වියදම් .. | - | - | - | - | - | - | - | - | - | 503 | 503 |
| කිකිළියන් මිලදී ගැනීම | - | - | - | - | - | - | - | - | - | 5,957 | 5,957 |
| මසට ඇති කරන කුකුලන් මිලදී ගැනීම .. | - | - | - | - | - | - | - | - | - | 4,463 | 4,463 |
| මුළු ගණන | 11,532 | 13,954 | 22,549 | 16,492 | 19,806 | 30,747 | 14,723 | 16,635 | 146,438 | 154,368 | 300,806 |

මූලාශ්‍රය: ත්‍රිකුණාමල කච්චේරියේ වාර්තා.

සටහන IV-17  1971 ඔක්තෝබර් සිට 1973 අගෝස්තු දක්වා කාලය තුළ ලැබීම්

| කාල පරිච්ඡේදය | ප්‍රමාණය රු. |
| --- | --- |
| 1971 ඔක්තෝබර් සිට 1972 දෙසැම්බර් දක්වා | 153,069 |
| 1973 ජනවාරි .. .. .. | 16,172 |
| 1973 පෙබරවාරි .. .. .. | 18,252 |
| 1973 මාර්තු .. .. .. | 25,340 |
| 1973 අප්‍රියෙල් .. .. .. | 21,227 |
| 1973 මැයි .. .. .. | 23,521 |
| 1973 ජූනි .. .. .. | 32,760 |
| 1973 ජූලි .. .. .. | 16,310 |
| 1973 අගෝස්තු .. .. .. | 16,640 |
| එකතුව | 323,291 |

මූලාශ්‍රය: ත්‍රිකුණාමල කච්චේරියේ වාර්තා

සටහන IV-18  1971 ඔක්තෝබර් සිට 1973 අගෝස්තු දක්වා ප්‍රාග්ධන වියදම්

| විස්තරය | ප්‍රමාණය රු. |
| --- | --- |
| තුනුව මඩු .. .. .. | 61,825.42 |
| උපකරණ හා කැම දමන භාණ්ඩ .. | 9,593.87 |
| ජලය සපයන උපකරණ .. .. | 1,001.73 |
| පැටවු රකීමේ උපකරණ .. .. | 298.60 |
| ටෙන්ඩර් තැන්පත් සඳහා .. .. | 1,100.00 |
| | 73,819.62 |

මූලාශ්‍රය: ත්‍රිකුණාමල කච්චේරියේ වාර්තා

## 4.3.5 යටිනුවර

### මැද පළාත කිරිපට්ටි ව්‍යාපාරය

පසුතලය

ගෙවතු කිරිපට්ටි ව්‍යාපාරවල තරුණයින් 20 දෙනෙකුට රැකියාවන් සැපයීම සඳහා මෙම යෝජනා ක්‍රමය නිර්මාණය කරන ලදී. මූලික සැළැස්ම වූයේ සාමාජිකයින් 12 දෙනෙකු විසින් කිරිපට්ටි ඇති කරනු ලැබීමයි. ගව මඩු තැනීමේදී අවශ්‍ය වන ප්‍රාග්ධන වියදමෙන් කොටසක් රජයේ දීමනාවෙන් දැරීමට අපේක්ෂා කරන ලද අතර මුල් දෙනුන් තොගය මිළදී ගැනීම සඳහා ණය පිළියෙල කරගත යුතු විය. ගව පට්ටිය පාලනය කිරීම, දියුණු කළ තෘණ වර්ග වැවීම ආදී කාර්යයන්හිදී අවශ්‍ය ශිල්පීය උපදේශ රජයේ නිලධාරීන්ගෙන් ලබා ගත යුතු විය. ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් සැපයුම්, ණය සහ අලෙවි පහසුකම් සළස්වන ලදී. සංශෝධිත සැළැස්මක් මගින් සාමාජිකත්වය පුද්ගලයින් 20 දෙනෙකු දක්වා දීර්ඝ කරන ලද අතර මූල්‍යමය විය පැහැදමද සංශෝධනය කරන ලදී (සටහන IV-19).

සටහන IV-19 පළමු සහ දෙවන සංවර්ධන සැළසුම්වල සැළසුම් කරන ලද වියදම්

| විස්තරය | පළමු සංවර්ධන සැළැස්ම (වියදම්) | | දෙවන සංවර්ධන සැළැස්ම (වියදම්) | |
|---|---|---|---|---|
| | සැළසුම් කරන ලද ඒක පුද්ගල වියදම | පුද්ගලයින් 13 දෙනෙකු සඳහා සැළසුම් කරන ලද වියදම | සැළසුම් කරන ලද ඒක පුද්ගල වියදම | පුද්ගලයින් 20 දෙනෙකු සඳහා සැළසුම් කරන ලද වියදම |
| 1 | 2 | 3 | 4 | 5 |
| රජයේ දීමනා | | | | |
| සතුන් මිළදී ගැනීම | 3,500 | 42,000 | - | - |
| ගොඩනැගිලි: මිටි, ගඩොල් සිමෙන්ති | 1,200 | 14,400 | 1,200 | 24,000 |
| උපකරණ හා ආම්පන්න | 200 | 2,400 | 200 | 4,000 |
| මාස 6 කට ආහාර | 1,500 | 18,000 | - | - |
| බයිසිකල් | 350 | 4,200 | 350 | 7,000 |
| අනු එකතුව | 6,750 | 81,000 | 1,750 | 35,000 |
| සමූපකාරයෙන් සාමාජිකයින්ට ලැබෙන ණය | - | - | 4,000 | 80,000 |
| බැංකුවෙන් සමූපකාරයට ලැබෙන ණය | 6,250 | 75,000 | - | - |
| එකතුව | 13,000 | 156,000 | 5,750 | 115,000 |

මූලාශ්‍ර: 1. මහනුවර කච්චේරිය

2. ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන අංශය

මෙම ව්‍යාපාරය 1972 ජනවාරි 1 දා සිය කටයුතු ආරම්භ කළ අතර, ක්ෂේත්‍ර අධ්‍යයනය පවත්වන ලද කාලය වනවිට නැතහොත් 1973 ඔක්තෝබර් වනවිට මාස 10 ක් තිස්සේ ක්‍රියාත්මක වී තිබුනි.

ගෙවතු කිරිපට්ටි ව්‍යාපාරයේ තරුණයින් 20 දෙනෙකු නියැලී සිටි අතර, ක්ෂේත්‍ර අධ්‍යයන කාලය තුළ මෙයින් 11 දෙනෙක් මුණ ගැසිනි. 1973 ජූනි මාසයේදී කිරිපට්ටි 20 හි සිටි මුළු සතුන් සංඛ්‍යාව 96 ක් විය. නරඹන ලද කිරිපට්ටි 11 හේ සිටි සතුන්ගේ තොගය 52 ක් වූ අතර ඉන් 32 ක් එළදෙනුන් සහ 20 ක් වසු පැටවුන් විය; මෙම සංඛ්‍යාව කිරිපට්ටි 20 පුරා ප්‍රක්ෂේපනය කළහොත් සතුන්ගේ සංඛ්‍යාව 95 ක් වෙයි. නියැදි දත්ත අනුව කරන ලද ප්‍රක්ෂේපනයෙන්ද, වාර්තා කරන ලද සතුන්ගේ සංඛ්‍යාව නිරවද්‍ය එකක් වූ බව පෙනේ. අධ්‍යයනය කරන ලද කිරිපට්ටි 11 හේ එක් දිනක කිරි නිෂ්පාදනය පයින්ට් 110 ක් විය. එඬේර බිම් අක්කර ප්‍රමාණය 29.25 ක් වූ අතර එක් කිරිපට්ටියකට අයත් වන සාමාන්‍ය එඬේර බිම් ප්‍රමාණය අක්කර 2.6 ක් විය. එක් කිරි පට්ටියක සතුන් 5 දෙනෙකු වන්නේය යන පදනම අනුව එක් සතෙකුට ඇති තණ බිම් ප්‍රමාණය අක්කර 0.5 ක් විය.

සාමාජිකයින්ට උදවු කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන සහකාරවරයකු මෙහි වූයේය. ආහාර ගබඩා කිරීමෙන් සහ කිරි එකතු කිරීමෙන්ද ප්‍රවාහනය කිරීමෙන්ද, කිරි මණ්ඩලයේ එකතු කිරීමේ මධ්‍යස්ථානයට ඒවා අලෙවි කිරීමෙන්ද ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිතියද සාමාජිකයින්ට සේවය කළේය.

සංවර්ධන සැළැස්ම සහ ලැබූ ප්‍රගතිය

ආරම්භක සාමාජිකයින් 12 දෙනාට සැපයූ වැඩවලට අතිරේකව ව්‍යාපාරයේ පරිපාලනයට හා සේවයට තවත් පුද්ගලයින් දෙදෙනෙකු පත් කළයුතු වූයේය. ඇස්තමේන්තු කළ මුළු ප්‍රාග්ධන වියදම රු. 81,000/- ක් වූ අතර (සටහන IV-19) ඒ අනුව එක් සේවා නියුක්ත පුද්ගලයකුගේ ආයෝජනය රු. 5,780/- ක් පමණ වේ. විස්තර සහිත පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු පිළියෙල වී නොතිබුණ නමුත් රු. 75,000/- ක ප්‍රමාණයක් එක්වරම වාණිජ බැංකුවකින් සමූපකාරයට ණයක් ලෙස ලබාගත යුතුව තිබුනි. මෙම ණය ආපසු ගෙවීමද අවුරුදු 4 ක් තිස්සේ පැතිරිය යුතු වූයේය. එක් සාමාජිකයකුගේ මාසික වාරිකය රු. 125/- ක් විය යුතු විනි. මෙලෙස ඒක පුද්ගල පුනරාවර්තන වියදම රු. 5,350/- ක් විය යුතු වන අතර මුළු වියදම රු. 1,56,000/- ක් වෙයි. මේ අනුව ඒක පුද්ගල සාමාන්‍ය වියදම රුපියල් 11,130/- ක් විය යුතුය.

ආරම්භක යෝජනාව IV-19 සටහනේ 4 සහ 5 යන තීරු වලින් දැක්වෙන පරිදි දෙවනුව වෙනස් කරන ලදී. වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම රු. 35,000/- ක් වූ අතර කිරි පට්ටි පාලනය කිරීම සඳහා සාමාජිකයින් 20 දෙනෙකු බඳවා ගැනීමට නියමිත වූ හෙයින් ඒක පුද්ගල ආයෝජනය රු. 1,750/- ක් විය යුතු වූයේය. ආරම්භක සැළසුමේ මීට අනුරූප සංඛ්‍යාව රු. 5,780/- ක් විය. මුළු වියදම වන රු. 1,15,000/- න් රු. 80,000/-

පුනරාවර්තන වියදම් විය යුතු වූ අතර ඒක පුද්ගල සාමාන්‍ය වියදම රු. 5,750/- ක් විය යුතු වූයේය. ආරම්භක යෝජනාවේ මීට අනුරූප සංඛ්‍යාව රු. 11,130/- ක් විය.

කුම සම්පාදන අමාත්‍යාංශයෙන් මුදා හරින ලද අරමුදල් වලින් රු. 38,200/- ක ප්‍රමාණයක්, ආපසු ලබා නොගන්නා දීමනාවක් වශයෙන් සාමාජිකයින්ට ගෙවා තිබුණු අතර මෙම මුදල් ගව මඩු තැනීම සඳහා පාවිච්චි කොට තිබුණි. බලධාරීන් විසින් පිරිනමන ලද රුපියල් 2,000/- ක දීමනාවට වැඩියෙන් ගවමඩු සඳහා ඔවුන්ට වියදම් වූ බව සාමාජිකයින්ගෙන් බොහෝ දෙනෙක් පෙන්වා දුන්හ. සාමාජිකයින් 13 දෙනෙකුට ණය වශයෙන් රු. 25,113/- ක් ගෙවා තිබුණු අතර එක් සාමාජිකයකුගේ සාමාන්‍ය ණය ප්‍රමාණය රු. 1,030/- ක් පමණ විය. 1973 ජුනි දක්වා ආපසු ගෙවනු ලැබූ මුළු ණය ප්‍රමාණය රු. 2,270/- ක් විය; මෙය මුළු ණයෙන් 9% කි.

මෙලෙස ව්‍යාපාරයේ මුළු වියදම රු. 63,313/- ක් වී තිබුණු අතර ඉන් 60% ක් ප්‍රාග්ධන වියදම්ද, 40% ක් පුනරාවර්තන වියදම්ද වූයේය. ආරම්භක සැළැස්මට අනුව සැළසුම් ගත වියදම රු. 1,56,000/- ක් වූ අතර සංශෝධිත සැළැස්මට අනුව එය රු.1,15,000/- ක් වූයේය. මෙයින් එක් සාමාජිකයකුගේ සාමාන්‍ය මාසික වියදම රු. 316/- ක් විය යුතුව තිබුණු අතර ඉන් රු. 190/- ක් ප්‍රාග්ධන වියදම වූයේය.

වර්තමාන තත්වය

කිරිවල නිෂ්පාදන වියදම: එක් එක් කිරි පට්ටියේ සිටින සතුන් සංඛ්‍යාව, පුන්නක්කු ආදියේ පාරිභෝජනය සහ කිරි නිෂ්පාදනය 19-20 සටහනෙහි දක්වා ඇත. ව්‍යාපාරයේ කිරි පට්ටි 20 ක් අතුරින් 11 ක් පිළිබඳව නැතහොත් 55% ක නියැදියක් පිළිබඳව අධ්‍යයනය කරන ලදී. සටහනින් දක්නට ලැබෙන දත්ත අධ්‍යයන නියැදිය පිළිබඳව වේ.

කිරිපට්ටි 11 හේ සිටි මුළු සතුන් සංඛ්‍යාව 52 ක් විය. මින් 32 දෙනෙක් එළ දෙනුන් වූ අතර පැටවු 20 දෙනෙක් වූහ. එක් කිරි පට්ටියක සාමාන්‍ය සතුන් සංඛ්‍යාව 4.7 ක් විය. එක් කිරි පට්ටියකට අයත් එළදෙනුන්ගේ සාමාන්‍ය සංඛ්‍යාව ආසන්න වශයෙන් 3 ක් වන අතර පැටවුන්ගේ සාමාන්‍ය සංඛ්‍යාව 1.8 ක් විය. සෑම කිරි පට්ටියකටම සිමෙන්ති ගඩොලින් සාදන ලද බිත්ති හා ඇස්බැස්ටොස් සෙඩ් වහලක් සහිතව ගොඩ නැගූ මඩුවක් තිබුණි. කිරි පට්ටි දෙකකට හැර ජලය සඳහා තිබූ පහසුකම් ප්‍රමාණවත් වූයේ නැත.

ජල හිඟය නිසා එළ දෙනුන්ගේ වැඩි පිරිසිදුවක් නොවූ අතර ගවමඩුද හෙඳින් නඩත්තු කිරීමක් නොවීය. මේ හේතුව ගව ඇලෙහි දුර්වල තත්වයටත්, අප්‍රමාණවත් කිරි නිෂ්පාදනයටත් දායක වූවා විය හැකිය. කුඩාම කිරි පට්ටියට සතුන් දෙදෙනෙකු අයත් වූ අතර විශාලම කිරි පට්ටියට 9 දෙනෙකු අයත් විය (නැතහොත් එළ දෙනුන් 6 දෙනා හා පැටවුන් 3 දෙනෙකි).

කිරි පට්ටිවල පුන්නක්කු, හාල් කුඩු සහ තණ පාරිභෝජනය පිළිබඳ විස්තර IV–20 සටහනේ දී තිබේ. දෛනික මුළු පුන්නක්කු පාරිභෝජනය රාත්තල් 69 ක් විය. හාල් කුඩු හා තණ පාරිභෝජනය දෛනිකව පිළිවෙලින් රාත්තල් 68 ක් සහ මිටි 67 ක් විය. මේ අනුව එක් කිරි පට්ටියක සාමාන්‍ය දෛනික පාරිභෝජනය පුන්නක්කු රාත්තල් 6.2 ක්, හාල් කුඩු රාත්තල් 6 ක් පමණ සහ තණ මිටි 6 ක් විය.

<u>සටහන IV–20</u> කිරි පට්ටි 12 ගේ සතුන්, ආහාර පාරිභෝජනය හා කිරි නිෂ්පාදනය පිළිබඳ විස්තර

| කිරි පට්ටියේ අංකය | එළදෙනුන් සංඛ්‍යාව | පැටවුන් සංඛ්‍යාව | මුළු සතුන් සංඛ්‍යාව | එක් දිනකට කිරි පයින්ට් ගණන | කිරි පයින්ට් එකකට සත -/50 බැගින් කිරි පට්ටියේ ලාභය | ඇස්තමේන්තු කළ මාසික ආදායම (රුපියල්) | පුන්නක්කු පාරිභෝජනය (දිනකට රාත්තල්) | තණ පාරිභෝජනය (දිනකට රාත්තල්) | හාල් කුඩු පාරිභෝජනය (දිනකට රාත්තල්) | වවන ලද එකීර (තණ) බිම (අක්කර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 1 | 6 | 3 | 9 | 9 | 4.50 | 135 | 10 | 15 | 18 | 1.25 |
| 2 | 5 | 2 | 7 | 15 | 7.50 | 225 | 12 | 7 | 10 | 2.5 |
| 3 | 2 | 1 | 3 | 5 | 2.50 | 75 | 2 | 3 | – | 1 |
| 4 | 2 | 1 | 3 | 6 | 3.00 | 90 | 3 | 5 | – | 1.5 |
| 5 | 2 | 3 | 5 | 20 | 10.00 | 300 | 10 | 4 | – | 3. |
| 6 | 1 | 1 | 2 | 4 | 2.00 | 60 | – | 4 | 2 | 8 |
| 7 | 3 | – | 3 | 4 | 2.00 | 60 | 3 | 2 | – | 2 |
| 8 | 2 | 2 | 4 | 10 | 5.00 | 150 | 8 | 6 | 16 | 5 |
| 9 | 3 | 3 | 5 | 12 | 6.00 | 180 | 9 | 7 | 16 | 2 |
| 10 | 3 | 3 | 6 | 15 | 7.50 | 225 | 5 | 8 | 2 | 1.5 |
| 11 | 3 | 2 | 5 | 10 | 5.00 | 150 | 7 | 6 | 4 | 1.5 |
| | 32 | 20 | 52 | 110 | 55.00 | 1,650 | 69 | 67 | 68 | 29.25 |

එක් සතෙකුගේ දෛනික සාමාන්‍ය පාරිභෝජනය තණ මිටි 1.3 ක් වූ අතර, සාමාන්‍ය පුන්නක්කු පාරිභෝජනය රු. 2.1 ක් පමණ විය. කිරිපට්ටි 4 ක සතුන්ට ආහාර වශයෙන් හාල් කුඩු දුන්නේ නැත. එළදෙනුන් 23 දෙනෙකු හාල් කුඩු පාරිභෝජනය කරතැයි යන පදනම අනුව එක් එළදෙනකුගේ දෛනික සාමාන්‍ය සහල් කුඩු පාරිභෝජනය ආසන්න වශයෙන් රාත්තල් 3 ක් විය.

කිරි නිෂ්පාදනයේ ඇස්තමේන්තු කරන ලද වියදම් හා ප්‍රතිලාභ IV–22 සටහනේ දක්වා ඇත. කිරිපට්ටි II හේ දින 30 ක් සඳහා ඇස්තමේන්තු කළ කිරි නිෂ්පාදනය පයින්ට් 3,300 ක් වූ අතර එක් කිරි පට්ටියක දින 30 ක සාමාන්‍ය නිෂ්පාදනය කිරි පයින්ට් 300 ක් විය. මෙම නිෂ්පාදිතයේ වටිනාකම (පයින්ට් 3,300) කිරි පයින්ට් 1 ක් ශත –/50 බැගින් ගත් කළ රු. 1,650/– ක් විය. කිරිපට්ටි වලින් 41% ක් රු. 90/– ට අඩු දළ මාසික ආදායමක් බැගින් ලැබූ බවත්, 25% ක් රු. 125/– ත් රු. 150/– ත් අතර ආදායමක් ලැබූ බවත්, කිරි පට්ටිවල ආදායම් ව්‍යාප්ති රටාව පෙන්වයි. කිරි විකිණීමෙන් එක් කිරි පට්ටියකට අයත් වන සාමාන්‍ය මාසික ලැබීම් රු. 142.50 ක් වූයේය.

නියැදියට ඇතුළත් වූ සෑම කිරි පට්ටියකම ගවරැල පවත්වා ගැනීම සහ පුන්නක්කු හාල් කුඩු හා තණ යනාදියේ පාරිභෝජනය පිළිබඳව වියදම් ඇස්තමේන්තු කිරීමට උත්සාහයක් දරන ලදී (සටහන් IV–21). සෑම සාමාජිකයෙකු විසින්ම වවන ලද තණ බිම් වලින් තණ ලබාගෙන තිබී හෙයින් තණ සඳහා වූ වියදම ගණනය කළ නොහැකි විය. යටිනුවර ප්‍රදේශයේ පැවතුනු මිළ (නැතහොත් තණ මිටියක් ශත –/75) ම් අයුරින්ම යොදා ගන්නා ලදී. තණ පිළිබඳ ඇස්තමේන්තු කළ මෙම වියදම යොදා ගැනීමෙන් සත්ව ආහාරවල වියදම විශාල ලෙස ඉහළ නැගුනි. මෙම කරුණෙහිදී සාමාජිකයින් විසින් වවන ලද තණවල මුදල්මය වියදම සැළකිය යුතු නොවූ තරම්ය. කැලෑ හෙළි පෙහෙළි කිරීම, බිම් සකස් කිරීම, වැට බැඳීම ආදිය පිළිබඳව සඳහන් කිරීමට තරම් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදමක් නොවීය. පවුල් ශ්‍රමය යොදා ගත් හෙයින් පුනරාවර්තන වියදමක් නොවූ තරම්ය. මෙවැනි කරුණු නිසා පුන්නක්කු හා හාල් කුඩුවල වියදම පමණක් ඇස්තමේන්තු කරන ලදී. 1973 දෙසැම්බර් මාසයේදී පැවතුන පළාත්බද මිළ ගණන් අනුව පුන්නක්කු රාත්තලක් ශත –/50 ක් ලෙසත්, හාල් කුඩු රාත්තලක් ශත –/15 ක් ලෙසත් මිළ කරන ලදී.

කිරි පයින්ට් එකක නිෂ්පාදන වියදම (එය මුදල්මය වියදම ලෙස හැඳින්විය හැක) එක් එක් කිරි පට්ටිය සඳහා ඇස්තමේන්තු කොට IV–22 සටහනේ 6 වන තීරුවේ දක්වා ඇත. කිරි පට්ටි මෙහෙයවූ සහ අයිතිව සිටි සාමාජිකයින්ගෙන් ලබා ගත් සංඛ්‍යා තොරතුරු මත මෙම ඇස්තමේන්තු පදනම් වී ඇත. මෙම තොරතුරුවල නිරවද්‍යතාවයට සාධක කීපයක් බලපෑ හැක.

I. කාලයක් තිස්සේ සතුන්ට දෙන ලද පුන්නක්කු සහ හාල් කුඩු ප්‍රමාණය විවිධ විය. සාමාන්‍ය සංඛ්‍යාවන් සාමාජිකයින් විසින් ගණනය කරනු ලබන විටකදී එහි සාවද්‍ය තාවක් තිබිය හැකිය.

II. පළාත්බද ගව ආහාර සැපයීමේ තත්වය පාරිභෝජනයට බලපා ඇත. ඒ පිළිබඳ නිතරම වෙළඳපලේ හිඟයක් විය.

III. සිල්ලර වෙළඳපලේ මෙම දුරස්තර තත්වය නිසා පුන්නක්කු හා හාල් කුඩු මිළ උච්චාවචනය වූ අතර සාමාජිකයින් ඔවුන්ට මුදල් තිබුණු අවස්ථාවලදී ආහාර මිළදී ගැනීම කරනවා විය හැකිය.

IV. පලාත්බද ඇති හාල් කුඩුවල තත්වය විවිධ විය.

V. කිරි පට්ටි පවත්වා ගැනීමේදී දැරීමට සිදු වන වියදම ඉහළ නංවා පෙන්වීමේ අදහසින් පාරිභෝජනය පිළිබඳ සංඛ්‍යා තොරතුරු අතිශයෝක්තියෙන් දැක්වීමට සාමාජිකයින් සැලකිල්ලක් දැක්වූවා විය හැකිය.

<u>සටහන IV-21</u> <u>ඇස්තමේන්තු කල නඩත්තු වියදම සහ මාසික විකුණුම් ප්‍රතිලාභ</u>

| කිරි පට්ටියේ අංකය | එළදෙනුන් සංඛ්‍යාව | පැටවුන් සංඛ්‍යාව | පාරිභෝජනය කළ පුනක්කුවල වියදම (දින 30 කට) රුපියල් | පාරිභෝජනය කළ තණ කොළ වියදම (දින 30 කට) රුපියල් | පාරිභෝජනය කළ හාල් කුඩුවල වියදම (දින 30 කට) රුපියල් | පාරිභෝජනය කළ පුනක්කු හා හාල් කුඩුවල වියදම (දින 30 කට) රුපියල් | පුනක්කු, හාල් කුඩු හා තණ කොළ මුළු වියදම (දින 30 කට) රුපියල් | එක් දිනක කිරි නිෂ්පාදනය (පයින්ට්) | කිරි නිෂ්පාදනයේ ආදායම (දින 30 කට) රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 1 | 6 | 3 | 150 | 340 | 81 | 231 | 571 | 9 | 135 |
| 2 | 5 | 2 | 180 | 157 | 45 | 225 | 382 | 15 | 225 |
| 3 | 2 | 1 | 30 | 67 | - | 30 | 97 | 5 | 75 |
| 4 | 2 | 1 | 45 | 113 | - | 45 | 158 | 6 | 90 |
| 5 | 2 | 3 | 150 | 90 | - | 150 | 240 | 20 | 300 |
| 6 | 1 | 1 | - | 90 | 45 | 45 | 135 | 4 | 60 |
| 7 | 3 | - | 45 | 45 | - | 90 | 90 | 4 | 60 |
| 8 | 2 | 2 | 120 | 135 | 72 | 192 | 327 | 10 | 150 |
| 9 | 3 | 2 | 135 | 157 | 72 | 207 | 364 | 12 | 180 |
| 10 | 3 | 3 | 75 | 180 | 9 | 84 | 264 | 15 | 225 |
| 11 | 3 | 2 | 105 | 135 | 18 | 123 | 258 | 10 | 150 |
| | | | 1,035 | 1,509 | 342 | 1,377 | 2,886 | 110 | 1,650 |

මූලාශ්‍රය: කිරි පට්ටි අයිතිකරුවන් විසින් සපයන ලද තොරතුරු.

මේ අනුව ඇස්තමේන්තු කරන ලද කිරි නිෂ්පාදන මුදල් පිරිවැය IV-22 සටහනෙහි දැක්වේ.

VI. කිරි පයින්ට් එකක වියදම එක් කිරි පට්ටියක ශත -/18 ක අවමයේ සිට අනිත් කිරි පට්ටියක ශත -/85 ක උපරිමය දක්වා විචලනය විය. කිරි පට්ටි

11 හේ කිරි පයින්ට් එකක සාමාන්‍ය නිෂ්පාදන වියදම ශත -/41 ක් වී තිබේ. කිරි පට්ටි 11 අතුරින් 7 ක (63%) සාමාජිකයින් කියා සිටියේ තම වියදම, මෙම පයින්ට් එකක සාමාන්‍ය වියදම වන ශත -/41 ට අඩු වූ බවයි. සෑම සාමාජිකයකුගෙන්ම කිරි පයින්ට් එකකට සේවා ගාස්තු වශයෙන් ශත -/8 ක් සමූපකාර සමිතිය විසින් අය කරන හෙයින් කිරි පයින්ට් එකක මුළු වියදම ශත -/49 ක් දක්වා ඉහළ නැග තිබේ.

## කිරි පට්ටි ව්‍යාපාරයේ පරිපාලනය

මෙය ගෙවතු කිරි පට්ටි ව්‍යාපාරයක් වූ හෙයින්, උප දිසාපති කොට්ඨාශයේ විවිධ ග්‍රාම සේවක වසම්වල ඒවා පිහිටා තිබුනි. ව්‍යාපාරයේ සුපරීක්ෂණය ගැන වගකීමට බැඳී සිටි ප්‍රාදේශීය සංවර්ධන සහකාර තැන විසින් ව්‍යාපාරයේ ප්‍රගතිය ගැන මධ්‍යම ආණ්ඩුවේ නිලධාරීන්ට වාර්තා කරන ලදී.

සටහන IV-22 කිරිවල නිෂ්පාදන වියදම පිළිබඳ ඇස්තමේන්තුව

| කිරිපට්ටියේ අංකය | දින 30 කට නිපදවන ලද කිරි ප්‍රමාණය (පයින්ට්) | දින 30 ක ප්‍රවාහන හා හැලි කුලී වියදම (රුපියල්) | දින 30 ක කිරි අලෙවියෙන් ලද ආදායම (රුපියල්) | වෙළඳ ලාභය හෝ අතිරික්තය (රුපියල්) | කිරි පයින්ට් එකක නිෂ්පාදන පිරිවැය |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 1 | 270 | 231 | 135 | 96 | .85 |
| 2 | 450 | 225 | 225 | - | .50 |
| 3 | 150 | 30 | 75 | 45 | .20 |
| 4 | 180 | 45 | 90 | 45 | .25 |
| 5 | 600 | 150 | 300 | 150 | .25 |
| 6 | 120 | 45 | 60 | 15 | .37 |
| 7 | 120 | 45 | 60 | 15 | .37 |
| 8 | 300 | 192 | 150 | 42 | .64 |
| 9 | 360 | 207 | 180 | 27 | .57 |
| 10 | 450 | 84 | 225 | 141 | .18 |
| 11 | 300 | 123 | 150 | 27 | .41 |
| | 3,300 | 1,377 | 1,650 | 273 | |

මූලාශ්‍රය: කිරි පට්ටි අයිතිකරුවන් විසින් සපයන ලද තොරතුරු.

සත්වාහාර ගබඩා කර තබා ගැනීමෙන් හා ඒවා ව්‍යාපාරයේ සාමාජිකයින්ට විකිණීමෙන්ද කිරි එකතු කිරීමෙන් හා ඒවා ළඟම ඇති කිරි මණ්ඩලයේ එකතු කිරීමේ මධ්‍යස්ථානයට විකිණීමෙන්ද සාමාජිකයින් වෙනුවෙන් එහි ගෙවුම් ලබා ගැනීමෙන්ද විවිධ සේවා සමුපකාර සමිතිය සාමාජිකයින්ට සේවය කළේය. මෙම සේවාවන් හැරුණුවිට විවිධ සේවා සමුපකාර සමිතිය කිරි පට්ටිවල පරිපාලනයට මැදිහත් වූයේ ඉතා සුළුවෙනි.

ව්‍යාපාරයේ පුද්ගලවාදී සවරූපය නිසා එක් එක් ගෙවතු කිරි පට්ටිය පිළිබඳ වගකීම එක් එක් සාමාජිකයින්ටම අයත් විය. සාමාන්‍යයෙන් සාමාජික ගෘහයක සිටින සියළු දෙනාම වාගේ සතුන් රැක බලා ගැනීම සහ නඩත්තුව පිළිබඳව සැහෙන වැඩ කොටසක් ඉටු කළහ. කිරි පට්ටිය පිළිබඳව මුළු පවුලේම උනන්දුවක් දක්නට තිබුණු අතර එය පවුල් ආදායමෙහි එක් මූලාශ්‍රයක් වූයේය.

සමාජ තත්වය

ව්‍යාපාරයේ සාමාජිකයින් 20 දෙනාට එකට රැස්වීමට හෝ නිතර හමුවීමේ ක්‍රමයක් ඇති කර ගැනීමට අවස්ථාවක් ලැබුණේ නැත. රු. 2,000/- ක දීමනාව ලැබූ තරුණයෝ තම දෙමව්පියන්ගේ ඉඩම්වල ගව මඩු සෑදූහ. ඔවුන්ගේ දෙමව්පියන්ගේ ගෙවතුවල කිරි පට්ටි ඇති කරන ලද නිසා ව්‍යාපාරය මගින් තරුණයින්ට නිදහස් ආදායමක් නොලැබිනි. විවාහ වී වෙනම පදිංචි වීමට තීරණය කරන තරුණයින්ට කිරි පට්ටිවල පිහිටීම ප්‍රශ්න ඇති කරවීමට තුඩු දෙනවා විය හැකිය. මෙම කිරි පට්ටි තම ජීවන තත්වය උසස් කිරීමට උදව් දෙන පවුලේ ව්‍යවසායන් ලෙස නිවසේ සාමාජිකයින් සැලකූ නමුත් ව්‍යාපාරය මගින් අර්ථවත් සේවා අවස්ථාවන් සැලසීමක් අපේක්ෂා කළ තරුණයින් හට ලැබුනේ සුළු ප්‍රතිලාභයකි.

විශ්ලේෂණය

ආර්ථිකමය කරුණු

එක් සාමාජිකයකුගේ ඇස්තමේන්තු කල මාසික ආදායම රු. 200/- ක් විය. ග්‍රාම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය නිලධාරීන් විසින් වාර්තා කරන ලද පරිදි 1973 ජූලි සිට සැප්තැම්බර් දක්වා මාස 3 ක කාලයක් සඳහා කිරි පට්ටි 20 හි දළ ආදායම රු. 10,027/- ක් වූ අතර මාසයකට එය රු. 3,342/- ක් විය. කිරි පට්ටි 11 කින් යුත් නියැදිය සඳහා ඇස්තමේන්තු කළ ආදායම් සංඛ්‍යා අනුව බැලුවොත් (IV-20 පටහනේ 7 වන තීරුව බලන්න) කිරි පට්ටි 20 හි මුළු මාසික ආදායම රු. 3,000/- ක් වන්නේය. මෙලෙස වාර්තා කරන ලද ආදායමට වඩා ඇස්තමේන්තුවේ සිදු වූ විචලනය 10% ක් පමණ වන අතර එක් සාමාජිකයකුගේ ඇස්තමේන්තු කරන ලද ආදායම රු. 200/- ක් විය යුතුව තිබිණි. එමෙන්ම වාර්තා කරන ලද මාසික ආදායම රු. 167/- ක් වුවද ඇස්තමේන්තු කරන ලද ආදායම රු. 150/- ක් පමණ වූයේය.

සාමාජිකයින් 20 දෙනාගේම මාසික සාමාන්‍ය දළ ලැබීම් රු. 3,342/- ක් ලෙස උප කල්පනය කළහොත් මාස 10 ක් තිස්සේ මුළු ලැබීම් රු. 33,420/- ක් විය යුතුය. එමෙන්ම මාස 10 ක් සඳහා ප්‍රාග්ධන වියදම් රු. 63,313/- කුත්, පුනරාවර්තන වියදම් රු. 13,770/- කුත් වෙයි. මේ අනුව මුළු වියදම් රු. 77,083/- කි. පුනරාවර්තන වියදම් රු. 13,770/- ක් විය යුතු බවත් දළ ලැබීම් රු. 33,420/- ක් විය යුතු බවත් කල්පනා කළහොත්, එහි ප්‍රතිඵල ලෙස රු. 19,650/- ක අතිරික්තයක් ඇති වේ. මේ පදනම අනුව ප්‍රාග්ධන පියවීමේ කාල පරිච්ඡේදය අවුරුදු 2.7 ක් විය යුතුය. කෙසේ වුවද නිපදවන කිරි පයින්ට් එකක් සඳහා සමූපකාරයෙන් සපයන සේවාවන්ට ශත -/08 බැගින් වියදම් වන බව කල්පනා කලහොත් මාස 10 ක් සඳහා මෙය රු. 2,640/- ක් වේ. මේ පදනම අනුව ප්‍රාග්ධන පියවීමේ කාල පරිච්ඡේදය අවුරුදු 3.1 ක් විය යුතුය; මෙය අසතුටුදායක තත්වයක් නොවේ.

පරිපාලනමය කරුණු

පවුලේ අයගේ උදව් ලැබූ සාමාජිකයින් කිහිප දෙනෙකුට කිරි පට්ටිවල පරිපාලනය පිළිබඳ වගකීම පැවරී තිබුනි. ගව ආහාර සැපයීම, කිරි එකතු කිරීම හා චිකිත්සා විවිධ සේවා සමූපකාර සමිතිය විසින් කරන ලදී. කෙසේ වුවත් මෙම කිරි පට්ටිවල දෛනික පරිපාලනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට මෙම සමිතිය අපොහොසත් විනි. ගව ආහාර සැපයීම ක්‍රමවත් නොවූ අතර සම්මුඛව සාකච්ඡා කල සාමාජිකයින් බොහෝ දෙනෙකු විසින් කරන ලද ප්‍රධානම පැමිණිල්ල මෙය විය. කිරි එකතු කිරීම පිළිබඳවද ගැටළු සමහරක් ඉදිරිපත් විය. වට දෙකකදී කිරි එකතු කරන ලද අතර පළමු වටය එකතු කිරීම පාන්දරින් කරන ලදී. දෙවන වටය දවසේ මැද පමණ එකතු කරන ලදී. යෙදී තිබුණු තත්වය අනුව ගොවිපලවල් කීපයකින් ලබා ගත් කිරි එකට මිශ්‍ර කිරීම නිසා ගොවිපලකින් ලබා ගත් හොඳ කිරි තවත් එකකින් ලබා ගත් නරක කිරි සමඟ මිශ්‍ර වීමෙන් සම්පූර්ණ කිරි ප්‍රමාණය ප්‍රතික්ෂේප කළ අවස්ථා ඇතැයි පැවසේ.

සමාජයීය කරුණු

ව්‍යාපාරයේ සාමාජිකයින් වූ තරුණයින්ට අයිතිව ඔවුන් විසින් මෙහෙයවන ව්‍යාපාරයකට වඩා මෙම කිරි පට්ටි පවුලට අයත් වූ ඒවා බව සළකන ලදී. තමන්ගේ ගැටළු ගැන සාකච්ඡා කිරීමට තරුණයින් රැස් වූයේ කලාතුරකිනි. වෘත්තීමය වශයෙන් යෝග්‍යතම පූර්ණකාලීන ව්‍යවසායයන් ඇති කර ගැනීමට ව්‍යාපාරය තරුණයින්ට උදව් කළේ නැත. මෙම ව්‍යාපාර පවුලේ ආදායමේ අඩුව පුරවන එක්තරා මූලාශ්‍රයක් පමණක් විය.

## 4.4 ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපල පිළිබඳ අගැයීමක්

### 4.4.1 <u>භෞතිකමය සැළසුම</u>

පුද්ගලික බිම් කට්ටිවල පදනම මත ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර කරගෙන යන නිසා සැළසුම් පිළිබඳ සවිස්තර ක්‍රියාකාරීත්වය පෞද්ගලික ගොවීන් කිහිප දෙනෙකුගේ තීරණ මත

රැඳෙනු ඇත. මධ්‍යස්ථානයේ බලධාරීන්ට මෙකී තීරණවලට බලපෑම් කළ හැක්කේ කිසියම් සීමිත ප්‍රමාණයකට පමණි. සාමාන්‍යයෙන් ගොවිපළ සැලසුම් කිරීම නිලධාරීන් කණ්ඩායමක වගකීමක් වේ. අධ්‍යයනය කරන ලද ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර 5 අතුරින් තුනක් වගා කටයුතු පිළිබඳව විය. අක්කර 250 කින් හා සාමාජිකයින් 175 කගෙන් යුතු වූ මිද්දෙනිය ගොවිපළ විශාල ව්‍යාපාරයක් වූයේය. තෝනිගල ගොවිපළට සාමාජිකයින් 40 දෙනෙකු විසින් වගා කළ අක්කර 40 ක් අයත්ව තිබුන අතර, අරංගල සාමාජිකයෝ 10 දෙනෙක් අක්කර 18 ක ගොවිපළ භාරව සිටියහ. මෙම ව්‍යාපාර තුන සැලසුම් කිරීමේදී ශිල්පීය කරුණු අතිශයින් වැදගත් විය. අවුරුද්ද පුරාම වාගේ ජලය ලැබීම සහ වතුර පොම්පයක් අයත් වීම විශාල ලෙස තෝනිගල ගොවිපලේ සාර්ථකත්වයට තුඩු දුන්නේය. මිද්දෙනිය ගොවිපලේ වැඩ කටයුතු සඳහා වාර්තාව මත රඳා පැවැත්මට සිදු වීමෙන් අවදානම හා අවිනිශ්චිත බව පිළිබඳ අන්තරාය පැවතුනේය. එහි වගාවන් පහකින් දෙකක් පමණක් සාර්ථක විය. තත්වය මෙසේ වුවත් අක්කර 1 1/2 ක පිරිස් වැනි බෝග වැවීමෙන් ගොවීන්ට වඩා උසස් ජීවන තත්වයක් හිමි වුහ. කෙසේ වුවද ප්‍රධාන වශයෙන් ජලය පිළිබඳ දුෂ්කරතාවය හේතුවෙන් අරංගල ගොවිපළ ගැටළු සහිත තත්වයකට පත් වූයේය. අසතුටුදායක කාලගුණය නිසා බෝග පාළුවේ අවදානම වැඩි ගොවිපලවල සෑම ගොවියකුටම අවු ගනණේ අක්කර 1 1/2 ක් වත් වෙන් කළ යුතු වේ.

### 4.4.2 ජනපදිකයින් තෝරා ගැනීම

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවලට සාමාජිකයින් තේරීමේදී විවිධ වයස් කාණ්ඩවලට, අධ්‍යාපනික පසුබිම්වලට හා අත්දැකීම්වලට අයත් වන පුද්ගලයින් තෝරා ගැනීමෙන් මිද්දෙනිය ගොවිපළ කටයුතු කළ ආකාරය ප්‍රයෝජනවත්ය. එවිට තරුණ සහ පළපුරුද්දක් නැති අයට දෙමව්පියන්ගෙන් මෙන්ම වැඩි මහලු අයගෙන්ද පළපුරුදු සහෝදර සාමාජිකයින්ගේද උදව් ලැබේ. ගමේ වැඩි මහලු අයගෙන් සමහරක් ගොවිපළ අළ දක්වන උනන්දුව අසල්වැසි ගම් හා ගොවිපළ අතර කිට්ටු සම්බන්ධයක් ඇති කරවීමට තුඩු දෙන්නේය. තෝනිගල වුවද වැඩිහිටි අය තරුණයින් සමඟ කටයුතු කිරීම සතුටුදායක බව ප්‍රත්‍යක්ෂ විනි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස අරංගල ගොවිපලෙහි තෝරා ගන්නා ලද තරුණයින්ගේ කාණ්ඩය සතුටුදායක සමාජ ආර්ථික පදනමක් මත ගොවි ප්‍රජාවක් ගොඩනැඟීමේ ලා සාර්ථකව කටයුතු කොට නැත.

### 4.4.3 ජනපදිකයින්ගේ ප්‍රභව ස්ථාන

මෙතෙක් ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල වැඩ සටහන අනුව ජනාවාස බිහි කිරීමක් අපේක්ෂා නොකෙරේ. මිද්දෙනිය ගොවිපලේ තමන්ට වගා කිරීමට ලැබුන බිම් කට්ටිවල ස්ථිර හෝ අර්ධස්ථිර නිවාස තැනීමට සාමාජිකයින්ට අවසර නොදෙන ලදී. තෝනිගල සමහර සාමාජිකයින් විසින් පොතුරු ක්‍රමයට කටු මැටි පැල්පත් තනාගෙන තිබේ. මෙලෙස ප්‍රතිපත්තිමය වශයෙන් සාමාජිකයින්ට ගොවිපලෙහිම වාසය කිරීමට අවසර දී නැති නම් ඔවුන් අසල ගම්වල සිට පැමිණෙන අය විය යුතුය. කෙසේ වුවද සාමාජිකයින්ට ගොවිපලෙහිම වාසය කිරීමට අවසර නොදීම පිළිබඳව කරුණු හැදෑරීමට සිදුවනවා විය හැක. සේවා වියුක්තිය පුළුල්ව පැතිර ඇති හෙයින් ගොවිපළ අසල පදිංචි කරුවන්ට පමණක් ගොවිපලෙහි සේවා අවස්ථාවන් සීමා කිරීමෙන් විෂම තත්වයක් ඇති වීමට පුළුවන.

### 4.4.4 ඉඩම් භුක්ති ක්‍රමය

ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ඉඩම් පුද්ගලික බිම් කට්ටිවලට බෙදිය යුතුද නැතහොත් පොදු අයිතිය යටතේ තබාගෙන සමූපකාර සංවිධානයක් මගින් පරිපාලනය කළයුතුද යන්නය. ප්‍රායෝගිකව මේ ක්‍රම දෙකම ක්‍රියාත්මක වී ඇත. තීරණය ප්‍රතිපත්තිමය කරුණකි.

### 4.4.5 නිෂ්පාදන ක්‍රම

වී වගාව සම්බන්ධ නිෂ්පාදන තත්වය උස් බිම් බෝග සම්බන්ධ නිෂ්පාදන තත්වයට වඩා තරමක් වෙනස් වේ. වී වගාව සම්බන්ධව සළකන කල ගොවීන්ගෙන් වැඩි දෙනෙකු අතර වඩාත් නවීන වගා පිළිවෙත් පිළිබඳ දැනුම මෙන්ම පෝර භාවිතය සහ රෝග හා කෘමිනාශක ශිල්පීය ක්‍රම අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයද සාපේක්ෂ වශයෙන් ඉහළය. කෙසේ වුවද උස් බිම් බෝග වගා කිරීම පිළිබඳනවීන ක්‍රම ගැන දැනුම සීමිත වන අතර මේ සම්බන්ධ ව්‍යාප්ති කටයුතු සූක්ෂමකරණය අවශ්‍ය වේ. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල වගාවේ මූලික හා අවසාන අවස්ථා තුළ ඇති වන ශ්‍රම අවශ්‍යතාවන් වැඩි වශයෙන් පවුල් ශ්‍රමය මගින් සපුරා ගනු ලැබේ. අධ්‍යයනය කල ගොවිපල තුනේම කුලී ශ්‍රමය භාවිතා කරන ලදී.

### 4.4.6 මූල්‍යමය කරුණු

අරංගල, තෝනිගල හා පීද්දෙනිය යන ගොවිපලවල එක් සාමාජිකයෙකුට හා එක් අක්කරයකට වැය වූ වාර්ෂික ප්‍රාග්ධන ආයෝජනය නිගමනය කරන ලද්දේ ප්‍රමාණානුකූල පදනමක් මතය. පීද්දෙනියේ ඒක පුද්ගල වාර්ෂික ප්‍රාග්ධන වියදම රු. 200/- ක් වූ අතර එක් අක්කරයක වාර්ෂික ප්‍රාග්ධන වියදම රු. 189/- ක් වූ බව IV-23 සටහන දක්වයි. තෝනිගල මේ පිළිබඳ තුලනාත්මක සංඛ්‍යාවන් පිළිවෙලින් රු. 1,384/- ක් හා රු. 1,464/- ක් වේ. පීද්දෙනියේ ප්‍රාග්ධන වියදම පහත් මට්ටමක තබා ගැනීම වැදගත් කරුණකි. වගා කටයුතු වලින් උපයා ගන්නා ලද ඒක පුද්ගල මාසික ආදායමේ සාමාන්‍ය සංඛ්‍යාවන් තෝනිගල ගොවිපලේ රුපියල් 200/- කි. අරංගල එය රු. 66/- ක් වන අතර පීද්දෙනියේ එය රු. 42/- ක් වෙයි. පීද්දෙනියේ මුළු සාමාජික සංඛ්‍යාව වූ 173 දෙනාම ආරම්භයේ සිටම වගා කටයුතු පටන් නොගත් හෙයින් එම ගොවිපල පිළිබඳව නිවැරදි දර්ශනයක් මින් නොසැපයෙයි.

සටහන IV-23 වාර්ෂික ප්‍රාග්ධන වියදම

| ගොවිපල | සාමාජික සංඛ්‍යාව | සංවර්ධනය කරන ලද අක්කර සංඛ්‍යාව | එක් සාමාජික යකුගේ වියදම රු. | එක් සංවර්ධිත අක්කරයක වියදම රු. |
|---|---|---|---|---|
| අරංගල | 10 | 10 | 888 | 888 |
| තෝනිගල | 40 | 38 | 1,384 | 1,464 |
| පීද්දෙනිය X | 173 | 185 | 200 | 189 |

X ට්‍රැක්ටර් ගාස්තු හා සාමාජිකයින්ට කල ගෙවීම්ද මෙම සංඛ්‍යාවන්ට ඇතුළත් වේ.

### 4.4.7 යෝජනා ක්‍රමවල පරිපාලනය

මිද්දෙනිය, හෝනිගල සහ අරංගල යන ගොවිපලවල අත්දැකීම අනුව ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර පරිපාලනය කිරීමේ ලා විශේෂ සමූපකාර සමිති ඇති කිරීම දැනට පවතින විවිධ සේවා සමූපකාර සමිතිවලට පරිපාලනය භාර දීමට වඩා හොඳ වූ බව පෙනේ. මෙම ගොවිපලවල සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට තරම් දැනට පවතින ප්‍රාථමික සමූපකාර සමිති සමත් වූ බවක් නොපෙනේ. මෙම ව්‍යාපාර පුද්ගලික පදනමක් මත ක්‍රියාත්මක වූ නිසා බොහෝ පරිපාලනමය තීරණ ගන්නා ලද්දේ ලාභදායිතාවය සළකාගෙනය. මූලික අවස්ථාවලදී, නිලධාරීන් ගොවිපලෙහි මූලික ව්‍යුහය සකස් කිරීමේ නියැලී සිටි අවස්ථාවන්හිදී හැර ස්ථාවර සංවර්ධනය රඳා පැවතියේ පෞද්ගලික සාමාජිකයින් මතය.

### 4.4.8 පුහුණුව හා සේවාවන්

සමාජීය හා අංශතනික කරුණුවලට වඩා ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල බෝග වැවීම පිළිබඳ ශිල්පීය කරුණු ගැන පුහුණුවක් අවශ්‍ය වූයේය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් මෙම කාර්යය ක්‍රියාවට නංවන ලදී. ප්‍රධාන වශයෙන් අවශ්‍ය වූ සේවාව වූයේ බීජ වර්ග, ණය, පොහොර සහ කෘෂි-රසායනික ද්‍රව්‍ය සැපයීම මෙන්ම අලෙවි පහසුකම් සැලසීමත්ය. මෙම කාර්යයන් ක්‍රියාවට නැංවීමේ ලා ප්‍රාථමික සමූපකාර සමිති කාර්යක්ෂම වූ බවක් සැලකීමට නුපුළුවන.

### 4.4.9 ප්‍රමාණය සහ සැළැස්ම

පෞද්ගලික බිම් කට්ටිවල ප්‍රමාණය සාමාජිකයින්ගේ ආදායමට බලපාන වැදගත් සාධකයක් වූයේය. වැවිය යුතු බෝගයන්හි ලාභදායීතාව සහ නිෂ්පාදිතය අනුව බිම් කට්ටි ප්‍රමාණය තීරණය කළයුතුව ඇත. එමෙන්ම කිසියම් සාමාජිකයකුට ආධාර නොමැතිව කිසියම් විශේෂ බිම් ප්‍රමාණයක් වගා කළ හැකි වීද යන්නත් විභාග කළයුතුව ඇත. ගොවිපලේ දෛනික කටයුතුවලට උදව් කිරීම පවුලේ සාමාජිකයින්ගේ සාමාන්‍ය පිළිවෙත විය. මෙය සමූපකාර ගොවිපලවල සිදු නොවේ. ගොවිපලේ සැළැස්මට වඩා වැදගත් වන්නේ එහි පිහිටීමයි. ගොවිපල පිහිටුවීමට භූමියක් තේරීමේදී භූ-විෂමතාව, පස, දේශගුණය හා ජලය ආදී අංශ අනුව ඉඩම් කට්ටියක ශක්‍යතාව විග්‍රහ කිරීම වැදගත් වන්නේය. මෙම කරුණෙහිදී ප්‍රදේශයේ දිගු කලක් ජීවත් වී ඇති ගොවීන්ගේ අත්දැකීම් ප්‍රයෝජනවත් වනු ඇත.

### 4.4.10 ගම් සමඟ ඇති සම්බන්ධකම්

අධ්‍යයනය කරන ලද සියළුම ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල් සහ අසල්වැසි ගම් අතර තිබූ සබඳතාවන් සාමාන්‍යයෙන් යහපත් විය. යාබද ගම්වල බොහෝ දෙනෙකු ගොවිපල කෙරෙහි දැක්වූ උනන්දුව මෙම ප්‍රහදතාවයට හේතු විය.

## 4.5 නිගමන

1. ප්‍රධාන වශයෙන් අතුරු ආහාර බෝග වවනු ලැබෙන ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන ප්‍රධානතම සාධකය වාරිමාර්ග පහසුකම් වේ. හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ වියදමකින් වාරිමාර්ග පහසුකම් සැලසිය හැකි ස්ථානයක ගොවිපල පිහිටුවිය යුතු අතර සාමාජිකයින්ගේ ඉහිරි කිරීම් වඩාත්ම හොඳින් උපයෝගී කරගත හැක්කේ වාරිමාර්ග පහසුකම් දියුණු කිරීම සඳහා යෙදවීමෙනි.

වාරිමාර්ග පහසුකම් ලබා ගැනීමට අසීරු අවස්ථාවලදී බෝග පාළුව පිළිබඳ අවදානම හැකි තරම් අඩු කර ගනු සඳහා වගා සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැඩි සැළකිල්ලක් යොමු කළ යුතුය.

2. පෞද්ගලික බිම් කට්ටි පදනමක් මත ඉඩම වගා කෙරෙන විට විවිධ පසුතල වලින් යුත් ගොවීන් යෙදවීමට පිළිවන. මෙම පෞද්ගලික බිම් කට්ටි පෞද්ගලිකව සාමාජිකයින්ගේ වගකීම ලෙස සලකනු ලැබෙතත්, සාමාජිකයින්ගේ දෙමව්පියන් හා නෑදෑයින් ගොවිකටයුතුවලදී සහාය වෙන නිසා ප්‍රායෝගික වශයෙන් මෙම බිම් කැබලි පොදුවේ පවුල් ගොවිපලවල් වන්නේය. තත්වය මෙසේ හෙයින් අධ්‍යාපනය, වයස හා වෙනත් අවශ්‍යතාවයන් පිළිබඳ සීමා ලිහිල් කිරීමෙන් වඩාත් පුළුල් කණ්ඩායමකින් අපේක්ෂිත අයදුම්කරුවන් තෝරා ගත හැකි වන්නේය.

3. වැඩසටහෙනි අරමුණ ජනාවාසයක් බිහි කිරීම නොවේ නම් ගමනා ගමන පහසුව තකා අසල්වැසි පෙදෙසින් සාමාජිකයින් තෝරා ගැනීම වඩාත් අගනේය.

4. බෙහෙවින් වැඩදායක වන්නේ පෞද්ගලික බිම් කට්ටි ක්‍රමයද නැතහොත් සාමූහික ක්‍රමයද යන බව දැනට ලබාගත හැකි තොරතුරු අනුව තීරණය කළ නොහැක. පෞද්ගලික මෙන්ම සාමූහික ක්‍රමයත් සාර්ථකව ක්‍රියාත්මක වී ඇත. සාමූහික ව්‍යාපාරයකදී, සැළසුම, සංවිධානය, සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පාලනය ආදී ඇතැම් කළමනාකරණ කාර්යයන් තීරණාත්මක වශයෙන් වැදගත් වන්නේය. පෞද්ගලික ව්‍යාපාරයකදී යෙදවුම් සහ අලෙවි පහසුකම් ඉතාමත් වැදගත් වේ.

5. කෘෂිකර්ම ව්‍යාප්ති කාර්ය මණ්ඩලය මගින් ගොඩ බෝග පිළිබඳ ශිල්පීය උපදෙස් හා තොරතුරු පුළුල්ව ලබා ගැනීමට සැළැස්වීම අවශ්‍යය.

6. අධ්‍යයනය කළ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරයන්හි පෞද්ගලික බිම් කට්ටි පදනමක් මත වගා කටයුතු කරගෙන යනු ලැබූ අතර, යටිතල පහසුකම් පිළිබඳ වියදම් රජයේ දීමනා වලින් පියවන ලදී. නිෂ්පාදිතය සාමාජිකයින්ට හිමි විනි. උපකරණ නඩත්තුව, වැට කඩොළු, මංමාවත් ආදිය සඳහා අනාගතයෙහි වියදම් දැරීමට සිදු වන විට අරමුදල් හිඟකම මතු විය හැක. සාමාජික දායකත්වයෙන්ද යුතුව අරමුදලක් පිහිටුවීම වැඩදායකය.

7. ගොවි ව්‍යාපාර පරිපාලනයෙහිදී විශේෂ සමුපකාර සමිති, ප්‍රාථමික සමුපකාර සමිතිවලට වඩා කාර්යක්ෂම විය.

8. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල යෝජනා ක්‍රමයන්හිදී අභ්‍යාස පහසුකම් සැළසිය යුතු වූයේ ගොවිපලේ ආයතනික හා සමාජයීය කරුණුවලට වඩා ශිල්පීය ව්‍යාප්ති සේවා පිළිබඳවය.

9. අසල්වැසි ගම් සමඟ වූ සම්බන්ධතා වයනී සාමාන්‍යයෙන් සතුටුදායකව පැවති බව ප්‍රත්‍යක්ෂ විනි. පෞද්ගලික බිම් කට්ටි සංවර්ධනය කිරීමේ කාර්යයෙහි ලා අසල්වැසි ගම් වලින් විශාල සංඛ්‍යාවක් පුද්ගලයින් මැදිහත් කරවා ගැනීම මෙම තත්වයට තුඩු දුන් බව පෙනී යයි.

# 5 වෙනි පරිච්ඡේදය

## ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස

### 5.1 හැඳින්වීම

1972 අගෝස්තු මස 26 වෙනි දින ජාතික රාජ්‍ය සභාවේදී සම්මත කරන ලද 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියට අනුව පෞද්ගලික ඉඩම් අයිතිය එක් පවුලකට ගොඩ ඉඩම් අක්කර 50 ක් නැතහොත් මඩ ඉඩම් 1/ නම් අක්කර 25 ක් වශයෙන් සීමා වන්නේය. මෙම සීමාවට වැඩි පෞද්ගලික ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් අත් කර ගනු ලැබෙන අතර රැකියා අවස්ථා සහ පලදායිතාවත් වැඩි වන අයුරින් එම අතිරික්ත ඉඩම් සංවර්ධනය කිරීමට හෝ ඒවා නැවත පදිංචි කරවීම සඳහා උපයෝගී කර ගැනීමට අදහස් කෙරේ.

නියමිත සීමාව ඉක්මවා ඉඩම් ඇති ඉඩම් හිමියන් එම ඉඩම් පිළිබඳ විස්තර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත ප්‍රකාශ කර සිටිය යුතු අතර තමන් සතුව තබා ගැනීමට කැමති අක්කර 50 පිළිබඳව සඳහන් කිරීමට ඔවුනට පිළිවන. අක්කර දශ ලක්ෂයක් පමණ මේ අයුරින් ප්‍රකාශයට පත් කරනු ලැබේවි යයිද නැවත බෙදා දීම සඳහා මේවායින් අක්කර 450,000 ක් පමණ ලබා ගත හැකි වේයැයිද අපේක්ෂා කරන ලදී. 2/ නුදුරු ගම්මානයන්හි ඉඩම් හිඟය උග්‍රව පවතින තෙත් කලාපයේ තේ, රබර් සහ පොල් වතු බොහොමයක් මෙම ඉඩම්වලට අයත් වන්නේය.

ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියෙහි පරමාර්ථ පහත සඳහන් පරිදි විනි:

(අ) අත් කර ගන්නා ඉඩම්වල තව තවත් රැකියා අවස්ථා ඇති කිරීම සහ පලදායිතාවය වැඩි කිරීම. පෞද්ගලික හිමිකාරත්වය යටතේ බොහෝ වතු (පනතේ විධි විධාන වලට සමාගම් වතු අයත් නොවිනි) මැනවින් පාලනය කර නොතිබි බවත්, වෙනස් හිමිකාරත්වයක් සහ පාලනයක් යටතේ ඒවායෙහි රැකියා අවස්ථා සහ පලදායිතාවය වැඩි කර ගත හැකි බවත් අදහස් කරන ලදී.

(ආ) ඉඩම් ප්‍රමාණය සහ ධනය බෙදී යාම පිළිබඳ විෂමතාවයන් අඩු කිරීම. සමානත්මතාවය පිළිබඳ අදහසක් ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියෙහි විශේෂයෙන් සඳහන් කර

---

1/ ඉඩම් හිමියාගේ දෙමව්පියන්ට සහ වයස අවුරුදු 18 ඉක්මවූ දරුවන්ට ඇතැම් අවස්ථාවලදී පවුලේ ඉඩම් වලින් අක්කර 50 ක් (හෝ 25 ක්) තබා ගැනීමට හිමිකම් ලැබිනි.

2/ 1974 අගෝස්තු මාසය වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරන ලද සම්පූර්ණ අක්කර ප්‍රමාණය, අක්කර 550,000 ඉක්මවීය.

නොතිබුනත්, මෙම නීතිය පසු තලයෙන් වූ දේශපාලනික පරමාර්ථය වූයේ ඉඩම් රහිත ගොවි ජනතාව වෙත නැවත ඉඩම් ලබා දීම බව රජයේ මැතිවරණ ප්‍රකාශනයෙන් 1/ සහ මෙම පනත් සාකච්ඡාවට භාජනය වූ පාර්ලිමේන්තු විවාද වලින් පැහැදිලි විනි. 2/

(ඇ) සමාජවාදය දෙසට ජන සමාජය නැඹුරු කරවීමේ කාර්යයට දායක වීම. සාමූහික අයිතිය පිළිබඳ ප්‍රවණතාවයන් සහ ආත්ම විශ්වාසය ඇති කිරීම හා ග්‍රාමීය අංශයෙහි පවතින සූරාකෑම වැළැක්වීම ආදී කරුණු ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ නිර්මාපකයින්ගේ සිත් තුළ තදින් බල පැවැත්වූ බව මැතිවරණ ප්‍රකාශනයෙන්, පොදු වැඩ පිළිවෙලින්, 3/ ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් 4/ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පිළිබඳව වූ පාර්ලිමේන්තු වාද විවාද වලින් නැවත ප්‍රත්‍යක්ෂ වූනේය.

1–2 සටහනෙහි දක්වා ඇති ජනාවාස ප්‍රතිපත්ති පිළිබඳ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම පහසු කරවන නව සාධක ගණනාවක් ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය නිසා ඇති විනි.

I. අඩු වියදම: ජනාවාසය සඳහා ලැබෙන ඉඩම් දැනටමත් සංවර්ධිත තත්වයක පවතින නිසාත් පදිංචි කරවනු ලබන පුද්ගලයින් සමීප ස්ථානයන්හි පදිංචිව සිටින නිසාත් ආයතනමය විය හියදම් අඩු වන්නේය.

II. සීඝ්‍ර සංවර්ධනය සහ ප්‍රමාණවත් ආදායම: මෙම ඉඩම් වලින් බොහොමයක් දැනටමත් නිෂ්පාදනයෙහි නිරත හෙයින් පොහොර භාවිතයෙන් සහ පුනරුත්ථාපනය පිළිබඳව සැලකිල්ලක් දැක්වීමෙන් පොදුවේ සීඝ්‍ර සංවර්ධන වේගයක් සාක්ෂාත් කර ගත හැකි වනු ඇත.

III. සමූපකාර පදනම මත වැඩ කිරීම: ඉඩම් දැනටමත් සංවර්ධනය කර ඇත්තේ විශාල ඒකක වශයෙනි, සමූපකාර පදනමක් මත ඒවායේ වැඩ කිරීමට ශ්‍රමිකයෝ පුරුදුව සිටිති. සේවය සඳහා ගම් වලින් තෝරා ගනු ලැබෙන තරුණ සාමාජිකයින්, සමූපකාර ක්‍රමයට ඔවුන් දක්වන බැඳියාව අනුව තෝරා ගැනීමට පිළිවන. පෞද්ගලික කුඩා ඉඩම් කට්ටිවලට ඉඩම් වෙන් කිරීම සඳහා වන බලපෑම් මැඩ පැවැත්වීමට මේ අනුව හැකි වනු ඇත.

---

1/ 1970 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනය.

2/ 1972 අගෝස්තු 1, 4, 17 සහ 18 වැනි දින හැන්සාඩ් වාර්තාව.

3/ සමගි පෙරමුනේ පොදු වැඩ පිළිවෙල – 1970.

4/ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව – 1972 – 16(2)(ඊ) ඡේදය.

IV. ස්වයං-පාලනය: වතු කම්කරුවන් විනය පාලනයකට අනුබැඳිව සිටිත්. බැහැරින් පනවනු ලැබෙන පාලනය වෙනස් කර තමන්ගේම පාලන ක්‍රමයකට ඔවුන් හුරු පුරුදු කිරීම අවශ්‍යය. මෙය ඇත්ත වශයෙන්ම පහසු කාර්යයක් නොවේ.

V. ප්‍රදේශය සමග ඒකාබද්ධතාවය: කලින් මෙම වතු යායවල්, අවට ගම් වලින් වෙන්ව පැවතුනේය. එහෙත් ගම් වලින් ජනතාව වතු යායවලට ගෙන ඒම එකී බාධකය දුරුවත් කිරීමට ආධාරකාරී වනු ඇත.

VI. අතීතයෙන් වෙන්වීම: ඉඩම් ප්‍රතිසංස්කරණය සමාජ ව්‍යුහය වෙනස් කිරීම පිළිබඳ මූලික වැඩ පිළිවෙලක් නිසා ජනාවාස ප්‍රතිපත්තිය පිළිබඳවද මූලික පරිවර්තනයන් සිදු කිරීමට එයින් ඉඩ කඩ සැළසේ.

මෙම සාධක කෙතෙක් දුරට උපයෝගී කරගෙන තිබේද, කෙතෙක්දුරට ප්‍රයෝජනවත් වී තිබේද යන බව, මෙතෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් පිහිටුවන ලද ජනාවාස පිළිබඳව අපගේ විශ්ලේෂනයෙහිදී මූලික වශයෙන් විස්තර කෙරේ.

ඉඩම් ප්‍රකාශයට පත් කිරීම

1972 දෙසැම්බර් වන විට ඉඩම් පිළිබඳ සියළුම විස්තර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත ප්‍රකාශයට පත් කළ යුතුව තිබිනි. අයිති කරුවනට හිමි වන අක්කර 50 පිළිබඳව මෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරනු ලැබෙන කොටස කවර අයුරකින් උපයෝගී කර ගනු ලැබේද යන්න පිළිබඳව නිගමනයකට එළඹෙන තෙක් සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය නීරායාසයෙන්ම මුල් හිමිකරුවන් වෙත ආපසු බදු දෙන ලදී. අක්කර දස ලක්ෂයක් පමණ සඳහා ප්‍රකාශන 5,487 ක් ලැබිනි. මෙසේ ප්‍රකාශයට පත් කළ අක්කර ප්‍රමාණය ප්‍රධාන බෝග වශයෙන් බෙදී යන අයුරු V-I සටහනෙහි දැක්වේ.

සටහන V–1   ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත ප්‍රකාශයට පත් කරන ලද ඉඩම්, ප්‍රධාන බෝග වශයෙන් වර්ගීකරණය

| ප්‍රධාන බෝගය | ප්‍රකාශයට පත් අක්කර ප්‍රමාණය | මුළු ගණනින් ප්‍රතිශතය |
|---|---|---|
| තේ | 203,504 | 20.4 |
| රබර් | 149,299 | 14.9 |
| පොල් | 220,199 | 22.0 |
| කොකෝවා | 8,404 | 0.8 |
| වී | 56,533 | 5.7 |
| කැලෑ, පතන සහ වගා නොකල ඉඩම් | 203,727 | 20.4 |
| වෙනත් බෝග 1/ | 158,334 ¥ | 15.8 |
| එකතුව | 1,000,000 ¥ | 100.0 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම

1/ මිශ්‍ර සහ සුළු බෝග වගාවන්ගෙන් යුත් ඉඩම් සහ වර්ග කර නැති හෝ විස්තර සඳහන් කර නොමැති බෝග වලින් යුත් ඉඩම් මෙම ගනයට ඇතුළත් වේ.

¥ "වෙනත් බෝග" යටතේ ඇති අක්කර ප්‍රමාණය සහ ප්‍රකාශයට පත් කර ඇති අක්කර ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාලේඛන ආසන්න වශයෙන් වේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් නිරවද්‍ය සංඛ්‍යාලේඛන පිළියෙල කරන ලද්දේ ඉහත දක්වා ඇති ප්‍රධාන බෝග වලින් යුත් ඉඩම් සඳහා සහ කැලෑ හෝ වගා නොකල ඉඩම් සඳහා පමණකි.

### ව්‍යවස්ථාපිත නියමය සහ ඉඩම් පැවරීම

කලින් හිමිකරුවන්ගේ ඉඩම් කොටස නියම කිරීමේ සහ ඉතිරිවා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරීමේ කාර්යය 1974 අගෝස්තු මාසයේදී සම්පූර්ණ කරන ලදී. නැවත බෙදා දීම සඳහා ලැබෙන ඉඩම් ප්‍රමාණය අක්කර 559,337 ක් විනි; කලින් මෙම ඉඩම් භාවිතා වූ ආකාරය V–2 සටහනෙහි දැක්වේ.

සටහන V-2 අවසාන වශයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරන ලද ඉඩම් - 1974 අගෝස්තු 26

| ප්‍රධාන බෝගය | ප්‍රමාණය | මුළු ගණනින් ප්‍රතිශතය |
|---|---|---|
| තේ | 135,760 | 24.27 |
| රබර් | 82,944 | 14.83 |
| පොල් | 115,350 | 20.62 |
| වී | 16,270 | 2.91 |
| කොකෝවා | 245 | 0.04 |
| කරාබුනැටි | 7,699 | 1.38 |
| මිශ්‍ර | 14,513 | 2.59 |
| කැලෑ, පතන සහ වගා නොකළ | 182,257 | 32.58 |
| කුරුඳු | 777 | 0.15 |
| වෙනත් | 1,861 | 0.33 |
| අත්හැර දැමූ තේ සහ රබර් | 1,701 | 0.30 |
| එකතුව | 559,377 | 100.00 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.
අධ්‍යයනය මුද්‍රණය කරගෙන යනු ලබද්දී මෙම සංඛ්‍යාලේඛන ලැබිණි.

අත්පත් කර ගන්නා ලද ඉඩම් වලින් තුනෙන් එකක් පමණ බිම් කට්ටිවල ප්‍රමාණයට අනුව වර්ග කර ඇති අන්දම V-3 සටහනෙන් දැක්වේ. ඉතිරි අක්කර ප්‍රමාණය සඳහා වූ වර්ගීකරණය මේ ආකාරයෙන් සිදු කරනු නොලැබිණි. V-3 සටහනෙහි වර්ගීකරණය පිළිබඳ නිරීක්ෂණ කිහිපයක් දැක්විය හැක.

I. ඉඩම් කට්ටි වැඩිම ප්‍රමාණය සහ අක්කර වැඩිම ප්‍රමාණය අක්කර 50 ට අඩු කුඩා ඉඩම් ප්‍රමාණය යටතට වැටේ. මෙය අත්පත් කර ගත් මුළු අක්කර ප්‍රමාණයෙන් සියයට 27 කි. මුළු ප්‍රමාණයෙන් සියයට 43 ක් අක්කර 100 ට අඩු බිම් කට්ටි යටතට වැටේ.

II. තේ, රබර් සහ වී ප්‍රධාන වශයෙන් අක්කර 50 ට අඩු බිම් කට්ටි වේ. (පිළිවෙලින් 31%, 33% සහ 50%) තේ සම්බන්ධයෙන් බිම් කට්ටිවල ප්‍රමාණය විශාල වන්නේය. සියයට 21 ක් අක්කර 250 - 500 ප්‍රමාණයේ වන අතර සියයට 15 ක් පමණක් අක්කර 50 ට අඩු බිම් කට්ටිවල වේ.

III. කැලෑ සහ වගා නොකළ ඉඩම් ප්‍රධාන වශයෙන් අක්කර 250 - 500 ඉඩම් ප්‍රමාණයේ වේ. (මුළු ප්‍රමාණයෙන් 24% සහ 20% ) එවැනි ඉඩම්වල කට්ටි බොහොමයක් අක්කර 50 ට අඩුය. (මුළු ප්‍රමාණයෙන් 53% සහ 62%)

කලින් හිමිකරුවන්ට වන්දි ගෙවීම

කලින් ඉඩම් හිමිකරුවන්ට[1/] සාධාරන වන්දි මුදලක් ගෙවීමට ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියෙන් ඉඩ කඩ සැළසේ. මෙම වන්දි මුදල් "මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතයක් අනුව" මුදලින් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ ඇපකර මගින් ගෙවීමට පිළිවන. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 42 වන ඡේදය) මෙම ඇපකර අවුරුදු 25 ක කාලසීමාවකට වන අතර අවුරුද්දකට 7% ක පොලියක් ඒවාට අයත් වේ.[2/] මෙම ඉඩම් අවසාන වශයෙන් ලබා ගන්නවුන්ගෙන් වන්දි මුදලද ගෙවිය යුතු පොලියද අය කර ගැනීමට අදහස් කෙරේ.

ඉඩම් බෙදා දීම

මෙම ඉඩම් විකිණීමට, කුලවාරු කිරීමට හෝ බදු දීමට, එසේ නැතහොත් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා, සත්ව පාලනය සඳහා, සමූපකාර හෝ සාමූහික ගොවිපලක් සඳහා හෝ ගොඩනැගිලි සඳහා හෝ යම් පොදු කාර්යයක් සඳහා හෝ පවරා දිය හැකි බව නීතියෙහි සඳහන් වේ. එසේම මෙම ඉඩම් උචිත පුද්ගලයන්ට හෝ ආයතනවලට හෝ රාජ්‍ය සංස්ථාවලටද පවරා දිය හැක. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 22 වන වගන්තිය) 1974 අගෝස්තු මාසය වනවිට විවිධ ආයතන සඳහා බෙදා දී ඇති හෝ බෙදා දීමට සළකුනු කර ඇති ඉඩම් ප්‍රමාණය V-4 සටහනින් දැක්වේ.

---

1/ ගෙවිය යුතු වන්දි මුදල් ගණන් බලනු ලැබෙනුයේ ඉකුත් අවුරුදු පහ ඇතුළත එම ඉඩමෙන් උපයා ගත් සාමාන්‍ය වාර්ෂික ලාභය පදනම් කරගෙන හෝ ආදායම් බදු සහ ධන බදු තක්සේරුව සඳහා දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රකාශ කර ඇති පරිදි ඉඩමෙහි තක්සේරු අගය පදනම් කරගෙනය. එවැනි තක්සේරුවක් කර නොමැති අවස්ථාවන්හිදී ප්‍රධාන තක්සේරුකරුගේ අදහස් විමසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව එම ඉඩම් තක්සේරු කරනු ඇත. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියෙහි 28 වන ඡේදය)

2/ මෙසේ නිගමනය කර ඇති පොලී ප්‍රමාණය, ඉඩම් තමන් සතුව තබාගෙන ගොවිතැන් කිරීමෙන් ලබා ගත හැකි ලාබයට වඩා වැඩි බවට අදහස් දක්වා ඇත. කෙසේ වෙතත් මෙම පොලියද ඇපකර මගින් ගෙවිය හැකි බව මෙහිදී සැළකිල්ලට ගත යුතුය. අවුරුදු 25 කට පසුව ඒවායේ වටිනාකම වර්තමානයේ වටිනාකමින් බොහෝසෙයින් අඩු වනු ඇත.

අනෙක් අතට මෙම ඇපකර ඒවායේ පරිනත කාලය ඉක්මවීමට පෙර කෘෂිකර්ම ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව විවිධ සංවර්ධන කාර්යයන් සඳහා හෝ රජයට හිමි විය යුතු ණය මුදල් ගෙවීම සඳහා භාර දීමට පිළිවන. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 42 (අ) සහ (ඇ) ඡේද.)

**සටහන V–3** 1973 ඔක්තෝබර් මස 15 වෙනි දින වන තෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරන ලද ඉඩම්–භෝග සහ හිමි කට්ටි ප්‍රමාණය අනුව

| කට්ටි ප්‍රමාණය | තේ | | රබර් | | පොල් | | වී | | කැලෑ | | වගා නොකළ | | වෙනත් | | මුළු ගණන | | සම්පූර්ණ ප්‍රමාණයෙන් ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර | කැබලි ප්‍රමා. | අක්කර |
| 0– 50 | 331 | 6591 | 523 | 8099 | 1333 | 20901 | 875 | 6176 | 148 | 2908 | 165 | 2736 | 426 | 5674 | 3801 | 53085 | 79.7 | 27.1 |
| 50– 100 | 69 | 4853 | 79 | 5427 | 160 | 10783 | 19 | 817 | 45 | 2971 | 34 | 2507 | 56 | 3561 | 462 | 30919 | 9.7 | 15.8 |
| 100– 150 | 49 | 6054 | 19 | 2297 | 63 | 7640 | 3 | 505 | 32 | 3909 | 17 | 2140 | 25 | 3030 | 208 | 25575 | 4.4 | 13.0 |
| 150– 200 | 24 | 4273 | 8 | 1422 | 28 | 4584 | 4 | 651 | 11 | 2046 | 22 | 3757 | 15 | 2738 | 112 | 19471 | 2.3 | 9.9 |
| 200– 250 | 10 | 2324 | 6 | 1487 | 12 | 2581 | 2 | 700 | 18 | 3642 | 9 | 1938 | 12 | 2615 | 69 | 15287 | 1.4 | 7.8 |
| 250– 500 | 25 | 8753 | 7 | 2517 | 9 | 3136 | 5 | 1660 | 19 | 6286 | 13 | 3980 | 8 | 2871 | 86 | 29203 | 1.8 | 14.9 |
| 500– 750 | 5 | 2884 | 4 | 2492 | 1 | 611 | – | – | 1 | 615 | 4 | 2507 | 2 | 1131 | 17 | 10240 | 0.4 | 5.2 |
| 750–1000 | 4 | 3357 | 1 | 833 | – | – | – | – | 3 | 2815 | 1 | 759 | 1 | 991 | 10 | 8755 | 0.2 | 4.5 |
| 1000 වැඩි | 2 | 2497 | – | – | – | – | – | – | 1 | 1001 | – | – | – | – | 3 | 3498 | 0.1 | 1.8 |
| එකතුව | 519 | 41586 | 647 | 24574 | 1606 | 50236 | 908 | 10509 | 278 | 26193 | 265 | 20324 | 545 | 22611 | 4768 | 196033 | 100. | 100. |
| සම්පූර්ණ ප්‍රමාණයේ ප්‍රතිශතය | 10.9 | 21.2 | 13.6 | 12.5 | 33.7 | 25.6 | 19.0 | 5.4 | 5.8 | 13.4 | 5.6 | 10.4 | 11.4 | 11.5 | 100 | 100 | – | – |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, සංඛ්‍යාලේඛන කාර්යාලය.

**සටහන V-4  ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරන ලද ඉඩම් බෙදා දීම - 1974 අගෝස්තු 26**

| ලබන අය | | | අක්කර ප්‍රමාණය | මුළු ගණනින් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| රාජ්‍ය වැවිලි සංස්ථාව | .. | .. | 31,791 | 5.69 |
| උඩරට සමූපකාර වතු සංවර්ධන මණ්ඩලය | | | 87,235 | 15.61 |
| සමූපකාර ජනාවාස | .. | .. | 38,704 | 6.93 |
| දිස්ත්‍රික් ඉඩම් අධිකාර | .. | .. | 177,719 | 31.81 |
| විවිධ සේවා සමූපකාර සමිති | | .. | 48,143 | 8.62 |
| විශේෂ සමූපකාර සංවිධාන | .. | .. | 19,750 | 3.54 |
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | .. | 111,375 | 19.94 |
| ගම්වැසියන් අතර | .. | .. | 13,833 | 2.48 |
| දිසාපතින් | .. | .. | 6,450 | 1.15 |
| පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | | .. | 4,891 | 0.88 |
| පොල්, තේ, රබර් පර්යේෂණායතනය | | .. | 2,184 | 0.39 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය | | .. | 1,235 | 0.22 |
| වන සංරක්ෂණ | .. | .. | 785 | 0.14 |
| දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල | .. | .. | 754 | 0.13 |
| වෙනත් | .. | .. | 14,528 | 2.60 |
| | | එකතුව | 559,377 | 100.00 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

මෙම කරුණු සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යාලේඛන දැනට ලබා ගත නොහැකි වුවත් පොදුවේ කොයෙකුත් ආයතනවලට දී ඇති ඉඩම් පහත සඳහන් පරිදි වේ.

I. හෙළින් පවත්වාගෙන ගියාවූ විශාල තේ සහ රබර් වතු රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ලබාගෙන ඇත.

II. එතරම් හෙළින් පාලනය කරගෙන යනු නොලැබුවාවූද අඩු පලදායිතාවයක් ඇත්තාවූද, මැදරට තේ වතු සහ රබර් වතු මෙම කාර්ය සඳහා විශේෂයෙන් පිහිටුවන ලද උඩරට සමූපකාර වතු සංවර්ධන මණ්ඩලයට භාර දී ඇත.

III. ඇතැම් සැලකිය යුතු අවස්ථාවලදී හැරෙන්නට සමූපකාර ජනාවාස සඳහා දී ඇති ඉඩම් අසතුටුදායක තත්වයකින් පාලනය කරන ලද ඒවා වන අතර එම ඉඩම්වල පලදායිතාවයද බෙහෙවින් හීනය.

IV. ගම්වැසියන් හට කුඩා බිම් කට්ටි වශයෙන් බෙදා දෙන ලද්දේ උග්‍ර ඉඩම් හිඟයක් පවතින ප්‍රදේශවල ඇති ඉඩම්ය.

V. දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලධාරීන්ට සහ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පවරන ලද ඉඩම් වලින් කොටසක් පවුලකට අක්කර දෙක බැගින් ආහාර නිෂ්පාදනය සඳහා තාවකාලික බදු ක්‍රමයක් යටතේ ගම්වැසියන් හට ලබා දී ඇත. මේ ඉඩම් තලින් ප්‍රධාන වශයෙන් කැලෑ ඉඩම් හෝ වගා නොකල ඉඩම් විනි.

## 5.2 සමූපකාර ජනාවාස - සාර්ව තත්වය

රාජ්‍ය සංස්ථා මගින් ඉඩම් විශාල වශයෙන් පාලනය කරනු ලැබීම හෝ ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් බෙදා දීම සැලකිල්ලට භාජන විය යුතු වැදගත් සංවර්ධන ක්‍රම වුවද මෙම අධ්‍යයනයෙහි දක්නට ලැබෙන අනෙකුත් ජනාවාස පිළිබඳ අත්දැකීම්වලට ඒවා නියමාකාරව නො ගැලපේ.1/ මෙහිදී අපගේ අදහස් සමූපකාර ජනාවාසවලට පමණක් සීමා වනු ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ වතු යායවල්වල සමූපකාර ජනාවාස පිහිටුවීම සඳහා ඉදිරිපත් කර ඇත්තේ සවිමත් තර්කයකි.

I. වතු යායවල් වැඩි හරියක්, විශේෂයෙන් තේ සහ රබර් වවන ලද වතු, විශාල වශයෙන් පාලනය කිරීමට අදහස් කරන ලද නිසා මේවා කුඩා බිම් කැබලිවලට වෙන් කළහොත් කාර්යක්ෂමව පාලනය කළ නොහැක.2/

---

1/ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය සහ වැවිලි කර්මාන්තය පිළිබඳව පසුව අධ්‍යයනයක් කිරීමට අපි අදහස් කරමු.

2/ තේ සහ රබර් වතු කුඩා බිම් කැබලිවලට කඩා වෙන් කිරීම පිළිබඳ වූ අත්දැකීම් පොදුවේ ගත් කළ බෙහෙවින් අයහපත් විනි. කුඩා පවුල් බිම් කට්ටිවල අක්කරයක නිෂ්පාදනය සහ ශ්‍රම සූක්ෂමතාවය ඉහළම තත්වයක පවතින්නේය යන හේතුව උඩ ඉඩම් නැවත බෙදා දීමේ ප්‍රතිසංස්කරණයක් සඳහා කරුණු ඉදිරිපත් කළ සේවා නියුක්තිය පිළිබඳ වූ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දූත පිරිසද අක්කර 50 කට වැඩි තේ සහ රබර් වතු යායවල් කුඩා ඉඩම් කැබලිවලට වෙන් කිරීමට ඇති හේතු අතිශයින් අඩු බව පෙන්වා දුන්නේය. (සේවා නියුක්ති අවස්ථාවන් අපේක්ෂාවන් සමඟ සැසඳීම-ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ලංකාව සඳහා ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් 1971 - 325 වන ඡේදය)

II. සමාජවාදී අර්ථ ක්‍රමයක් යටතේ තනි ඒකක වශයෙන් වතු යායවල් පාලනය කළ හැක්කේ දෙවිධියකට පමණි. එනම්, රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් හෝ සාමූහික ගොවිපලවල් වශයෙනි. රාජ්‍ය වැවිලි සඳහා ලබා ගත හැකි කළමණාකරන සම්පත් සීමිත වන්නේය. සාමූහික ගොවිපලවල් වශයෙන්ද කිසියම් වැඩ කොටසක් ඉටු කළ හැකි වනු ඇත.

III. ඉහත දක්වා ඇති සාමාජික සහ ආර්ථික ලක්ෂණ හේතුකොටගෙන (192 පිටුව) ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් අත් කර ගන්නා ලද වතුවල සාමූහික ගොවිපලවල් සඳහා වඩා හොඳ අවස්ථාවක් ලැබෙන බව පෙනී යයි. එම සාමූහික ගොවිපලවල් ක්‍රියාත්මක කිරීමට අභ්‍යාසයක් ගනු ලැබේ නම් මෙම වතුවල එම උත්සාහය ගෙන බැලීම අගනේය.

සමූපකාර ජනාවාස සඳහා ඇති කරන ලද සැලසුම් සම්පාදන සහ පාලනමය කාර්ය භාරය V–5 සටහනෙහි දැක්වේ.

<u>සටහන V–5</u> සමූපකාර ජනාවාස සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ කාර්ය මණ්ඩලය

| මට්ටම | සංවිධානය | නිලධාරීහු | සමූපකාර ජනාවාස පිළිබඳ කටයුතු |
|---|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ මූලස්ථානය | සමූපකාර ජනාවාස අංශය | අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂවරු, ඉඩම් භාවිත සැලසුම් කරුවෝ, ඉඩම් ඉංජිනේරුවන්, ජනාවාස සැලසුම් කරුවෝ, ගිණුම් හා පාලන කාර්ය මණ්ඩලය. | ජනාවාස සැලසුම් සැකසුම. අරමුදල් ලබා ගැනීම හා පාලනය. සැලසුම් ක්‍රියාත්මක කිරීම පිරික්සීම. කාර්ය මණ්ඩලය සහ සමූපකාර සාමාජිකයින් පුහුණු කිරීම. |
| දිස්ත්‍රික් නිලධාරීයා | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් පත් කරනු ලැබෙන අධ්‍යක්ෂක, රජයේ දිසාපති, (දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ සභාපති) දිස්ත්‍රික් ඉඩම් නිලධාරී, ගොවිජන සේවා සහකාර කොමසාරිස්, දිස්ත්‍රික් | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය, උපදේශක මණ්ඩලයකි. දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයෙහි අධ්‍යක්ෂක හට පහත සඳහන් කටයුතු පැවරේ: ජනාවාස සැලසුම. සැලසුම ක්‍රියාත්මක කිරීම. සැපයුම් ලබා ගැනීම. ජනාවාස ගිණුම් පාලනය. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය අධීක්ෂණය. |

| මට්ටම | සංවිධානය | නිලධාරීහු | සමූපකාර ජනාවාස පිළිබඳ කටයුතු |
|---|---|---|---|
| | | කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී, සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, මැනුම් අධිකාරී | සමූපකාර ජනාවාස අංශය වෙත වාර්තා කිරීම. |
| ක්ෂේත්‍ර මට්ටම | ව්‍යාපාර සංවිධායකයෝ | සමූපකාර ජනාවාස අංශය විසින් පුහුණු කරන ලද තරුණ නිලධාරීන් 40 දෙනෙක්. එක් සමූපකාර ජනාවාසයකට එක් අයෙක් බැගින් අනුයුක්ත කෙරේ. ඇතැම්හු දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කෙරේ. | සමූපකාර කමිටුවලට උපදෙස් දීම හා ඒවා අධීක්ෂණය. සැපයුම් ඇණවුම් කිරීම දීමනා ගෙවීම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම. |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම - සමූපකාර ජනාවාස අංශය.

සුදුසු කාර්ය මණ්ඩලය ලබා ගැනීමෙහි ලා සිරිත් පරිදි ඇති වන දුෂ්කරතාවයට මුහුණ දීමටද සිදු විය. මෙහෙයින් දුෂ්කර කාර්යයන් පිළිබඳ අත්දැකීම් ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාපාර සංවිධායකයින් හට නොතිබුණේය. මෙම තත්වය ක්‍රමයෙන් හොඳ අතට හැරෙමින් පවතී.

## සමූපකාර ජනාවාස පිළිබඳ ක්‍රියාකාරී ප්‍රතිපත්තිය

සමූපකාර ජනාවාස සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පොදුවේ නම්‍ය ස්වභාවයක පවතී. ප්‍රතිපත්ති පිළිබඳ චක්‍රලේඛන කිහිපයක් සකස් වෙමින් පැවතුනද ඒවා සාමාජිකයන් වෙත යවා නැත. පහත කෙටියෙන් දක්වන පරිදි ඒකීය, ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත.

| කාරණය | ප්‍රතිපත්ති විස්තරය |
|---|---|
| 1. සැලසුම් සම්පාදනය | අ) ප්‍රාදේශීය නිලධාරීන් සහ ජනතා සංවිධානවල මෙන්ම සාමාජිකයන් තෝරාගෙන තිබේ නම් එම සාමාජිකයින්ගේද අදහස් විමසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ශක්‍යතා අධ්‍යයනය පිළියෙල කරනු ලැබේ. |
| | ආ) සාමාජිකයින් විසින් තහවුරු කරනු ලැබීමට යටත්ව තාවකාලික සැලැස්මක් සකස් කෙරේ. |
| | ඇ) වාර්ෂික ක්‍රියාත්මක වැඩ සටහන සහ මාසික කාර්ය වැඩ සටහන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ සාමාජිකයන් විසින් සකස් කර සමාලෝචනය කරනු ලැබේ. |

| කාරණය | ප්‍රතිපත්ති විස්තරය |
|---|---|
| 2. මුදල් කටයුතු | අ) බෝග විකිණීමෙන් ලබන ආදායම් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී ක්ෂණික අවශ්‍යතාවයන් සඳහා ගුඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ණය මුදල් අත්තිකාරම් වශයෙන් දෙනු ලැබේ. |
| | ආ) අනාගතයේ ඇති විය හැකි අවශ්‍යතාවයන් සඳහා සමුපකාරය විසින් අනුමත කරන ලද උපරිම ණය සීමාව ඇතුළත මහජන බැංකුවෙන් ණය වශයෙන් මුදල් ලබා ගනු ඇත. |
| | ඇ) අනවශ්‍ය පරිදි පොලී ගෙවීම් සහ නිසි පරිදි මුදල් නොයෙදවීම වැළැක්වීම සඳහා ගුඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ උපදෙස් පිට බැංකු ණය මුදල් වාර මුදල් වලින් දෙනු ලැබේ. |
| 3. තෝරා ගැනීම | අ) වතු යායෙහි වැඩ කරන පුරවැසි කම්කරුවන් හට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. |
| | ආ) පුරවැසි නොවන කම්කරුවන් හට සමුපකාරය විසින් සේවයේ යොදවන ලද කම්කරුවන් වශයෙන් වැඩ කිරීමට පිළිවන. |
| | ඇ) අනෙකුත් සාමාජිකයන් අසල්වැසි ගම් වලින් තෝරා ගනු ලැබෙනුයේ අවශ්‍යතාවය, පසුතලය සහ සාමූහිකත්වය පිළිබඳ දර්ශනයට ඇති බැඳියාව අනුවය. |
| | ඈ) ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන කාර්යය පිළිබඳව සාමාජිකයන් තෝරා ගනු ලබන අවස්ථාවේදී ඔවුන්ට පැහැදිලි අවබෝධයක් දෙනු ලැබේ. |
| 4. අයිතිය | අ) මුළු ගුඩම සාමූහිකව සාමාජිකයින්ට අයිති වේ. |
| | ආ) අක්කරයකින් 1/8 කට නො අඩු ප්‍රමාණයක් පෞද්ගලික ගෙවත්ත වශයෙන් වෙන් කර දෙනු ලැබේ. |
| | ඇ) ගුඩමේ අයිතිය පිළිබඳ අවසාන නිගමනය ගැන (දීර්ඝකාලීන බදු වශයෙන්ද එසේ නැතහොත් කුලිය ගෙවා පසුව පීලයට ගැනීමේ ක්‍රමය මගින්ද) සාකච්ඡා කරගෙන යනු ලැබේ. |

5. කළමණාකරණය

අ) සමුපකාර අතුරු ව්‍යවස්ථා 21–1 යටතේ විධායක කමිටුව, තෝරා පත් කරනු ලබන සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සහ පත් කරනු ලබන සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සමන්විත වනු ඇත. (මෙම තිදෙනා කෘෂිකාර්මික පලදාව වර්දන කමිටුව, විවිධ සේවා සමුපකාර සමිතිය හා දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය නියෝජනය කෙරේ.)

ආ) වැඩි ප්‍රාග්ධන ආයෝජනයක් සහ ශිල්පීය වශයෙන් සංකීර්ණත්වයක් ඇති අවස්ථාවන්හිදී මූලික වශයෙන් වැඩි පාලනයක් අවශ්‍ය යයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සලකන්නේ නම් අතුරු ව්‍යවස්ථා 21–6 යටතේ තෝරා පත් කරනු ලබන සාමාජිකයන් 3 දෙනෙකුගෙන්ද පිටතින් පත් කරනු ලබන්නවුන් 4 දෙනෙකුගෙන්ද සමන්විත වන විධායක කමිටුවක් අවුරුද්දක් නොඉක්මවූ කාලයක් සඳහා පිහිටුවීමට පිළිවන.

ඇ) ව්‍යාපාරයේ සංවිධායක හට විධායක බලයක් නොලැබේ. ඔහු සාමාජිකයින්ට සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට උපදෙස් දෙන අතර සමුපකාරය හා අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණ කටයුතුද කරන්නේය.

ඈ) සමුපකාරයේ සාමාජිකයන් දෛනික නිෂ්පාදනය සහ කළමනාකරණය උදෙසා තෝරා ගත් නායකයන්ගෙන් යුත් වැඩ කණ්ඩායම්වලට බෙදී යති.

6. සාමාජිකයින්ට ගෙවීම

අ) රජය විසින් අනුමත කරන ලද වේතනයට නොඅඩු ප්‍රමාණයක දෛනික යැපීම් දීමනාවක් මූලික වශයෙන් සාමාජිකයින්ට ගෙවනු ලැබේ. (පුරවැසි නොවන කම්කරුවන් හටද එම ප්‍රමාණයම ගෙවනු ලැබේ.)

ආ) මුදල් තත්වය අනුව ලාබ බෙදා දෙනු ලැබෙනුයේ සමුපකාර අතුරු ව්‍යවස්ථා අනුවය.

7. අසල්වැසි පරිසරය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම

අ) ජනාවාසය සැලසුම් කිරීමෙහිදී මුල සිටම ප්‍රාදේශීය ග්‍රාමීය ආයතන ඒ හා සම්බන්ධ වී කටයුතු කරනු ඇත.

ආ) විධායක කමිටුවෙහි නියෝජනත්වය මගින් කෘෂිකාර්මික පලදාව වර්දන කමිටුව සහ විවිධ සේවා සමුපකාර සමිතිය පාලනයෙහිදීද මාර්ගෝපදේශකත්වයෙහිදීද සම්බන්ධ වී කටයුතු කරනු ඇත.

ඇ) ජනාවාසය වතු යායක් නොව නව ගමක් බවට පත් වන පරිදි ඒකාබද්ධ ශ්‍රමදාන වැඩ කටයුතු මගින් අසල්වැසි ගම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

8. පුහුණුව අ) නිලධාරීන්ට හා සමුපකාර සාමාජිකයින්ට ක්‍රමානුකූලව සහ නිරතුරුව පුහුණුවක් දීම සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

ඉහත සඳහන් ප්‍රතිපත්ති පෙරදැරි කරගෙන නියමු ජනාවාස 30 ක් ආරම්භ කිරීමට මුලින් තීරණය කරන ලද්දේය. අවුරුද්දක පමණ අත්දැකීමෙන් පසුව අවශ්‍ය වන පරිදි ප්‍රතිපත්ති සමාලෝචනය කරන අතර ඒ අනුව තවත් ජනාවාස පිහිටුවනු ඇත. 1974 ජනවාරි මාසය වන විට සමුපකාර ජනාවාස 18 ක් පිහිටුවනු ලැබ ඇති අතර මෙම ජනාවාස පිළිබඳ මූලික තොරතුරු V-6 සටහනෙහි දැක්වේ.

## 5.3 ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස පහ පිළිබඳ විස්තර

සෙරපිස්, දම්පුලහේන, නේමැන්ඩි, යැරෝ සහ පාන්හැම් යන සමුපකාර ජනාවාස පහ සවිස්තර අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණි. ඉහත සඳහන් පළමු ජනාවාස දෙක කලින් පොල් වතු වූ අතර වෙනත් බෝග වැවීම සහ සත්ව පාලන කටයුතු මගින් විවිධාංගකරනය සඳහා ඉඩකඩ ඒවායෙහි ඇත. තෙවැන්න මිශ්‍ර බෝග වලින් යුත් වතු යායක් වන අතර, එහි කොකෝවා, තුරඤ්ඤ, කෝපි, පොල් යනාදිය වවා තිබේ. අනෙකුත් වතු දෙක තේ සහ රබර් වතුය. මෙම වතු රජයට අත් කර ගන්නා අවස්ථාවේදී ඇතැම් වතු හොඳින් පාලනය කර නොතිබුන අතර, අනෙක්වා මැනවින් පාලනය කර තිබුණි. ප්‍රධාන ජනාවාස වර්ග නියෝජනය කරන ජනාවාස වශයෙන් මේවා තෝරා ගැනීමට හේතු 1 වෙනි පුවියෙහි විස්තර කර ඇත.

ජනාවාස පහ පිළිබඳ සවිස්තර තොරතුරු පස්වෙනි පුවියෙහි දක්වා ඇත.(අ.5.1 සිට අ.5.8. දක්වා වූ සටහන්) පුවියෙහි දක්වා ඇති තොරතුරු සහ මෙම පර්යේෂණයෙහි ඉතිරි කොටසෙහි දැක්වෙන තොරතුරුද, විශ්ලේෂනයද අදාළ වන්නේ ක්ෂේත්‍ර අධ්‍යයනය සහ වාර්තා සකස් වූ කාලයටය. (1974 ජනවාරි සිට අප්‍රියෙල්)

### 5.3.1 <u>සෙරපිස් සාමූහික ගොවිපල</u>

පසුතලය

සෙරපිස් සාමූහික ජනාවාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙලට ආසන්නව අක්කර 200 ක් පමණ වූ පොල් වත්තක පිහිටා ඇත. 1972 දෙසැම්බර් මාසයේදී මෙම වත්ත පිළිබඳ තොරතුරු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී මෙම වත්ත පොල් අක්කර 184 කින්ද, පොල් අතර වගා කරන ලද තෘණ අක්කර 30 කින්ද සමන්විත විනි. V-7 සටහනෙහි දක්වා ඇති පරිදි කිරි පට්ටියක්, කුකුල් කොටුවක් සහ ඌරු

සටහන V–6 1974 ජනවාරි 1 වන දින වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සමූපකාර ජනාවාස පිළිබඳ තොරතුරු

| ගොවිපලේ නම | ආරම්භ කළ දිනය | අක්කර ප්‍රමාණය | වචා ඇති ප්‍රධාන බෝග | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | තේ | රබර් | පොල් | වෙනත් ගස් බෝග | පළතුරු බෝග | වී | අනෙක් ආහාර බෝග | වෙනත් ව්‍යාපාර | | සාමාජික සංඛ්‍යාව |
| දම්පුලහේන | ජනවාරි '73 | 155 | – | – | 150 | – | 10 | – | 8 | 750 | කෙසෙල් | 30 |
| කෝමැන්ඩි | ජූලි '73 | 375 | – | 10 | 10 | 328 | – | – | – | 250 | ,, | 50 |
| මොඩර් | සැප්. '73 | 124 | – | – | 120 | – | 2 | 4 | 7 | 1,300 | ,, | 30 |
| අවුකොරලකන්ද | සැප්. '73 | 254 | – | 201 | – | – | – | – | – | – | | 104 |
| යැරෝ | ඔක්. '73 | 361 | 261 | – | – | – | – | 10 | 6 | – | | 73 |
| පැරඩයිස් | ඔක්. '73 | 1,018 | 150 | 337 | 20 | – | – | 219 | 10 | – | | 147 |
| ගල්පොකුන | ඔක්. '73 | 213 | – | – | 212 | – | 11 | 1 | 11 | 38 | දෙහුන් | 50 |
| අරච්චිවයිවිල්ලු | ඔක්. '73 | 325 | – | – | 318 | 1 | – | 7 | 17 | 1,000 | කෙසෙල් | 60 |
| ඔරිවාඩි | ඔක්. '73 | 92 | – | – | 2 | 1 | 18 | 1 | 21 | 1,000 | ,, | 35 |
| සෙරපිස් | ඔක්. '73 | 200 | – | – | 184 | – | – | 7 | 14 | 1,000 | ,, | |
| | | | | | | | | | | 30 | තණ(අක්කර) | 51 |
| පාන්හැම් | නොවැ. '73 | 409 | – | 379 | 11 | – | – | 9 | – | – | | 48 |
| ඇංගස්ලන්ඩ් | නොවැ. '73 | 365 | 235 | – | – | – | – | – | – | – | | 135 |
| ඔලුපැලියාව | නොවැ. '73 | 258 | – | – | 237 | – | 8 | 21 | 19 | 1,500 | කෙසෙල් | 43 |
| ලිනාවත්ත | නොවැ. '73 | 112 | – | – | 109 | 1 | 2 | 1 | 2 | – | | 35 |
| දඹවින්න | නොවැ. '73 | 27 | – | – | 26 | – | – | 1 | – | – | | 13 |
| එල්ලාවල | නොවැ. '73 | 192 | 171 | – | – | – | – | – | – | – | | 130 |
| දිල්ල | දෙසැ. '73 | 290 | 48 | 84 | 140 | – | – | 1 | – | 2,000 | ගම්මිරිස් | 101 |
| පිල්ලනිය | දෙසැ. '73 | 470 | – | 450 | 5 | – | – | 2 | – | – | | 26 |
| එකතුව | | 5,240 | 865 | 1,461 | 1,544 | 331 | 51 | 284 | 115 | | | 1,161 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම – සමූපකාර ජනාවාස අංශය.

ගාලක්ද තිබුණ අතර ඇතැම් තැන්වල වී ද වගා කර තිබුණේය. කුඹුරු ගොවිතැන් කර තිබුණේ වතු යායෙහි හිමිකරුවන් විසිනි. මේ සඳහා ඔවුන් අසල්වැසි ගම් වලින් මී හරකුන් කුලියට ලබාගෙන තිබුණි. වත්තෙහි ඇති කරන ලද සතුන් හට එම වත්තෙහිම නිෂ්පාදනය කල තෘණ වර්ග, පුන්නක්කු යනාදිය සපයන ලදී. කිරි පට්ටියෙහි දෙනුන් 80 ක් අතරින් එක් අවස්ථාවක දෙනුන් 50 කගෙන් කිරි ලබා ගෙන තිබුනේය. කුකුල් කෑමවල මිළ වැඩි වීම නිසා කුකුල් කොටුව විකුණන ලදි. බෝග සහ සතුන් සාමාන්‍ය වශයෙන් හොඳින් නඩත්තු කර තිබුණ අතර පොල් වගාවට අවුරුදු දෙකක් පමණ පොහොර දමා තිබුණේ නැත. වත්ත රජයට ගන්නා ලද අවස්ථාවෙහි නිෂ්පාදන වාර්තාවන් පිළිබඳ තොරතුරු V-7 සටහනෙහි දැක්වේ.

**සටහන V-7 සෙරපිස් ගොවිපලේ නිෂ්පාදන වාර්තා 1971/1972**

| කාර්යය | ප්‍රමාණය | නිෂ්පාදන අක්කර ප්‍රමාණය | සටහන් |
|---|---|---|---|
| පොල් | අක්කර 184 | ගෙඩි 574,126(අක්කරයකට 3,120) | කොප්පරා මෙන් විකුණනු ලැබේ. |
| කිරි පට්ටිය | දෙනුන් 80 | දිනකට පයින්ට් 500-1000 | කිරි මණ්ඩලය කම්හල වතුයාය අසලම වේ. |
| ඌරුගාල | ඌරන් 80 | මසකට රාත්තල් 1000 ක් විකුණනු ලැබේ. | බේකන්, හැම් සහ සොසේජස් ගොවිපලේ නිපදේ. |
| කුකුල් කොටුව | කුකුලන් 3000 | ලැ.නැ. | - |
| වී | අක්කර 7.5 | වසරකට බුසල් 600 | වසරකට දෙවරක් අස්වැන්න ලැබේ. |
| ගඩොල් කැපීම | පෝරනු 3 | වසරකට ගඩොල් 50,000 | කොන්ත්‍රාත්කරුවකු විසින් නිෂ්පාදනය කෙරේ. |

මූලාශ්‍රය: ව්‍යාපාර සංවිධායක සහ වතු කම්කරුවෝ - සෙරපිස් ගොවිපල.

ගොවිපලෙහි ගොඩනැගිලි V-8 සටහනෙහි දැක්වෙන පරිදි වේ. දක්වා ඇති වටිනාකම ප්‍රකාශිත ආකෘති පත්‍රයෙහි දක්වා ඇති පරිදි අයිතිකරුගේ තක්සේරුව අනුව වන්නේය. නිල වශයෙන් තවම තක්සේරුවක් කර නොමැත. මෙම වත්ත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරීමට පෙර (1973 ජූලි) ගොඩනැගිලිවල සවි කර තිබී උපකරණ වැඩි හරියක් සහ සියළුම සතුන්ද (කරත්තය සඳහා යොදවන ගවයන් පස් දෙනෙකු හැර) කලින් හිමිකරුවන් විසින්

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අනුමැතිය සහිතව රැගෙන ගොස් තිබුණි.1/

**සටහන V-8 රජයට අත් කර ගත් අවස්ථාවෙහි සෙරපිස් ගොවිපලේ ගොඩනැගිලි**

| ගොඩනැගිල්ල | සංඛ්‍යාව | අයිතිකරුගේ තක්සේරුව | තත්වය |
|---|---|---|---|
| නිලධාරී බංගලාව | 2 | රු. 20,000/- | හොඳ තත්වයේ පවතී. ගඩොල් බිත්ති සහ පොල් අතු වහල, විදුලි බලය සහ ජල සැපයුම ඇත. |
| කම්කරු නිවාස | 15 | රු. 40,000/- | ස්ථිර සහ අර්ධ ස්ථාවර |
| කිරි දොවන මඩු | 1 ) | රු. 20,000/- ) | සවි කළ උපකරණ 8 ක් ගලවාගෙන ගොස් ඇත. කොන්ක්‍රීට් බිම - යහපත් තත්වයේ පවතී. |
| ගව මඩු | 3 ) | ) | |
| දූරු ශාල | 3 | රු. 10,000/- | අළුත්වැඩියා කළ යුතුය. |
| බේකන් කම්හල | 1 | රු. 15,000/- | යහපත් තත්වයේ පවතී. උපකරණ ගලවා ඇත. |
| කුකුල් කොටු | 2 | රු. 15,000/- | ලී සහ පොල් අතු සෙවිලි වහල |
| කොප්පරා මඩු | 2 | ලැ.නැ. | ගඩොල් බිත්ති, හොඳ තත්වයේ පවතී. |
| ගබඩා | 3 | ලැ.නැ. | සාමාන්‍ය තත්වයේ පවතී. |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සහ පෞද්ගලික නිරීක්ෂණය.

මෙම වත්තෙහි සේවකයන් 39 දෙනෙක් සේවයෙහි නිරතව සිටි අතර ඔවුන්ගෙන් 35 දෙනෙක් නේවාසිකව පදිංචිව සිටියහ. ඔවුන්ගේ පවුල්වල සාමාජික සංඛ්‍යාව සහිතව වත්තෙහි මුළු ජනගහණ සංඛ්‍යාව 170 ක් පමණ විනි. පුරවැසි නොවන පවුල් දෙකක් පමණ සිටියත් අනෙක් සියල්ලෝ සිංහලයෝ වූහ. සේවා නියුක්තිය සහ පවුල් සංයුතිය පිළිබඳ විස්තර V-9 සටහනෙහි දැක්වේ. එම සේවකයන් බොහෝ දෙනෙක් සාමාන්‍යයෙන් අවුරුදු 22 ක් පමණ එහිම සේවය කර තිබී අතර ඔවුන් විසින් එය තම නිවස ලෙස සළකන ලදී. වත්තෙහි ජනගහන සංඛ්‍යාවෙන් වැඩි දෙනෙක් කාන්තාවන් විනි. (54%) ඔවුන්ගේ සාමාන්‍ය වයස් ප්‍රමාණය 41 ක් විය. කෙසේ වෙතත් රැකියා විරහිත තරුණයින් 29 දෙනෙක් වත්තෙහි සිටියෙන් එම වත්ත රජයට අයත් කර ගත් පසු එහි රැකියාව ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඔවුන් අතර තිබුණි.

1/ දැනට ඉතිරිව ඇත්තේ කලින් අයිතිකරුවන් ගෙන ආ මුවන් 6 දෙනෙකුගෙන් පැවත එන 100 ක් පමණ වූ තිත් මුව රංචුවක් පමණි. පොල් වගාව අතරතුර ආහාර බෝග වැවීමත් සමග (213 පිටුව) මෙම මුව රංචුව තර්ජනයක් බවට පත් වනු ඇත.

**<u>සටහන V-9</u>** රජයට අත් කර ගත් අවස්ථාවෙහි සෙරපිස් වත්තේ ශ්‍රම හවුදාව

| | මාසික වැටුප් ලබන කම්කරුවෝ පුරුෂ | දෛනික වැටුප් ලබන කම්කරුවෝ පුරුෂ | දෛනික වැටුප් ලබන කම්කරුවෝ ස්ත්‍රී | නේවාසික නොවන කම්කරුවෝ ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|---|
| කම්කරුවන් සංඛ්‍යාව | 8 | 10 | 17 | 4 | 39 |
| සාමාන්‍ය වේතනය (මාසික හෝ දෛනික) | 151.88 (107.50 සිට 200.00 දක්වා) | 3.66 | 2.80 | 2.80 | - |
| සාමාන්‍ය වයස | 43 | 44 | 39 | 40 | 41 |
| සෙරපිස් වත්තේ සේවය කළ සාමාන්‍ය අවුරුදු ගණන | 25 | 22 | ලැ.නැ. | 15 | 22 |
| පවුලේ සාමාජික සංඛ්‍යාව (කම්කරු ඇතුළුව) | 7.5 | 5.4 | 5.2 | 5 | 5.7 |
| පවුලේ කම්කරු සංඛ්‍යාව (සෙරපිස් වත්තේ සේවය කරන කම්කරුවන් හැර) | 2 (භාර්යාවන්) | 8 (භාර්යාවන්) | 10 (ස්වාමි පුරුෂයින්) | - | 20 |
| සෙරපිස් වත්තේ පිට සේවය කරන පවුලේ සාමාජික සංඛ්‍යාව | 1 (පුතා) | 1 (දුව) | 4 | 2 | 8 |
| සෙරපිස් වත්තේ සාමාජිකත්වය අපේක්ෂා කරන පවුලේ සේවා විරහිත සංඛ්‍යාව | 9 | 6 | 14 | - | 29 |
| පුරවැසි කම්කරු සංඛ්‍යාව | 7 | 9 | 14 | 4 | 34 |
| පුරවැසි නොවන කම්කරු සංඛ්‍යාව | 1 | 1 | 3 | - | 5 |

මූලාශ්‍රය: සෙරපිස් වත්තේ කම්කරුවන් සහ එහි පවුල්වල සාමාජිකයින් සමඟ කරන ලද සාකච්ඡා එගිනි.

සෙරපිස් වත්ත පාලනය කරන ලද්දේ මෙම වත්තෙහි අයිතිකරුටම අයිති වෙනත් වතු යායක් වූ ඔරෙන්ජ් ශ්‍රොව් වත්ත පාලනය කළ වතු අධිකාරිවරයෙකු විසිනි. කෑගල්ල දිස්ත්‍රික්කයේ මහ ඔයෙන් ඔබ්බේ සැතපුම් දෙකක් පමණ දුරින් මෙම වත්ත පිහිටා තිබුණි. සෙරපිස් වත්තෙහි වැඩ කටයුතු වතු කොන්දොස්තර වරයෙකු සහ කංකානම්වරුන් දෙදෙනෙකු හට පැවරී තිබුණි. උසස් ගුම වලදායිතාවයක් සහ කම්කරුවන් හට සාමාන්‍යයෙන් කාරුණික ආකල්පයක්ද ඇතිව සෙරපිස් වතු යාය කාර්යක්ෂම අයුරින් පාලනය කරගෙන ගිය බවත් ප්‍රත්‍යක්ෂ වූනේය. එක් පවුලකට සතියකට නොමිලයේ පොල් ගෙඩි 10 ක්, ඔවුන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම, වත්ත තුළම එළදෙනෙක් ඇති කිරීමට සහ කුඩා බිම් කැබැල්ලක් වගා කිරීමට අවසර දීම, පාසැල් යන ළමයින්ට පොත් සහ රෙදි පිළි සපයා දීම, උත්සව අත්තිකාරම් ලබා දීම සහ වෛද්‍ය පහසුකම් සැපයීම වැනි සුභ සාධක කාර්යයන්හි ප්‍රතිලාභයන් කම්කරුවන්ට හිමිව තිබිණි. මෙම සුහද සම්බන්ධතාවය අසල්වැසි ගම්වැසියන් හට ලැබී නැත. ඔවුනට සෙරපිස් වත්තට ඇතුළුවීම තදින්ම තහනම් කර තිබුණේය. කෙසේ වෙතත් වත්තෙහි අය සහ ගම් වැසියන් අතර සම්බන්ධතාවය එතරම්ම ප්‍රකෝපකාරී තත්වයක පැවැති බවක් නොපෙනේ.

මෙම වත්ත රජයට අත් කර ගැනීමට පෙර එහි ලාබදායිතාවය පිළිබඳ නිරවද්‍ය නිගමනයක් කළ නොහැක්කේ වැය සහ ආදායම් තත්වය පිළිබඳ වාර්තා ලබා ගත නොහැකි හෙයිනි. මෙවැනි වාර්තා, තොරතුරු පවත්වාගෙන යන ලද්දේ ඔරෙන්ජ් ග්‍රෝව් වතු යාය සම්බන්ධයෙන් පමණකි. සෙරපිස් වත්ත එහි එක් කොටසක් පමණක් විය. නව සංවර්ධන වැඩ සටහනින් පෙනී යනුයේ (සටහන V–II) මෙම වත්ත මැනවින් පාලනය කර තිබූ බව හා හොඳ ලාබයක් එයින් ලැබූ බවටත් සැකයක් නොමැති බවයි. එහි ලාබදායිතාවය සහ කළමණාකරන තත්වයද 1971/73 කාලසීමාවේදී පහත වැටුන බව දක්නට ලැබේ. මෙසේ සිදුව ඇත්තේ සත්ව පාලනය පිරිහීම හේතුකොටගෙන එම ව්‍යාපාර නතර කිරීම නිසා සහ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය සම්මත කිරීමට මඳ කලකට සහ ඉන්පසුවත් ප්‍රති ආයෝජනය කිරීමට (විශේෂයෙන් පොහොර සම්බන්ධයෙන්) සැළකිල්ලක් නොදැක්වීම නිසාය.

සමූපකාර ජනාවාසය ආරම්භ කිරීම

ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය සම්මත කරන ලද දින සිට (1972 අගෝස්තු 26) 1973 ජූනි මාසය තෙක් සෙරපිස් වත්ත කලින් හිමිකරුවන් හට ආපසු බදු දෙන ලද අතර 1973 ජූලි මාසයේදී ව්‍යවස්ථාපිත බද්ද අවසාන වූයෙන් මුළු වතුයාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරිනි.1/ එවකට එහි සේවය කරමින් සිටි සේවකයන්ගෙන් යුතුව එම වතු යායෙහි සේවයෙහි යෙදවිය හැකි අවස්ථාවන් අනුව හැකිතාක් දුරට තවත් සාමාජිකයන් හට රැකියා අවස්ථා සැපයීමේ පරමාර්ථය සහිතව සෙරපිස් වත්තෙහි සමූපකාර ජනාවාසයක් පිහිටුවීමට කොමිෂම විසින් අදහස් කරන ලදී.

1/ කලින් අයිතිකරුට හිමි අක්කර 50 ඔහුගේ වෙනත් වත්තකින් ඔහුට දෙන ලදී.

සමූපකාර ගොවිපලක් සඳහා සැලසුම් සකස් කිරීමට ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට සහාය වූවාය.[1] මූලික නිගමනයකට අනුව හෙළි දරව් වූයේ සත්ව පාලනය නැවත ආරම්භ කිරීම, පොල් සහ වී වගා කිරීම, පොල් නැවත සිටුවීම සහ පොල් පැල අතර සහ වතු යායේ අනෙක් තැන්වල මයියොක්කා, කෙසෙල්, සෝයා බෝංචි, බුං ඇට, වැල් දොඩම් ආදිය වගා කිරීමේ කටයුතු මගින් ක්‍රමයෙන් වැඩි වන ආදායම් මට්ටම සහිතව පුද්ගලයින් 60 දෙනෙකුට පමණ පූර්ණකාලීන රැකියාවන් සැපයීමට හැකි බවය. යෝජිත නිෂ්පාදන වැඩ සටහන පිළිබඳ විස්තර V-10 සටහනේ දැක්වේ.

දළ වශයෙන් රු. 100,000/- පමණ මූලික ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය බව ඇස්තමේන්තු කරන ලදී. මෙයින් වැඩි හරියක් අවශ්‍ය වනුයේ ගවයන්, උපකරණ සහ පොහොර මිළදී ගැනීම සඳහාය. මෙයින් රු. 3,000/- ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ණය මුදලක් වශයෙන් දීමට නියමිතව තිබී අතර ඉතිරි මුදල් මහජන බැංකුව විසින් ණයට දෙනු ලැබේ. යෝජිත වැඩ සටහනෙහි ඇස්තමේන්තු ගත වී ඇති වැය සහ ප්‍රතිලාභ පිළිබඳ කෙටි විස්තරයක් V-11 සටහනෙහි දැක්වේ.

<u>සටහන V-10</u> <u>නිෂ්පාදන වැඩ සටහන - සෙරපිස් සාමූහික ගොවිපල</u>

| ව්‍යවසාය | | 1973 (අගෝ.-දෙසැ.) | 1974 | 1975 | 1976 | 1977 |
|---|---|---|---|---|---|---|
| | | අක්කර | අක්කර | අක්කර | අක්කර | අක්කර |
| පොල් - පල දරන | | 184 | 170 | 155 | 140 | 125 |
| පොල් - නැවත සිටවූ පැල | | - | 15 | 30 | 45 | 60 |
| තණ බිම් | .. | 40 | 50 | 60 | 70 | 70 |
| මයියොක්කා | .. | 5 | 10 | 15 | 15 | 15 |
| කෙසෙල් | .. | 5 | 10 | 10 | 10 | 10 |
| සෝයා බෝංචි | | 5 | 10 | 15 | 15 | 15 |
| බුං ඇට | .. | 5 | 10 | 10 | 10 | 10 |
| ඉඳල් ඉරිඟු | .. | 5 | 5 | 5 | 5 | 5 |
| වැල් දොඩම් | .. | 10 | 10 | 10 | 10 | 10 |
| වී | .. | 7.5 | 7.5 | 7.5 | 7.5 | 7.5 |
| කිරි පට්ටිය | දෙනුන් | 40 | 50 | 60 | 70 | 70 |
| කුකුළ් කොටුව | .. | - | - | ? | ? | ? |
| ඌරුහාල | .. | - | - | ? | ? | ? |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සමූපකාර ජනාවාස අංශය

---

1/ සෙරපිස් ගොවිපල සම්බන්ධයෙන් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කලක සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සමඟ කටයුතු කර ඇත. අනෙක් ගොවිපලවලට වඩා මෙම ගොවිපල සම්බන්ධයෙන් වඩාත් සවිස්තර තොරතුරු ඒ අනුව ලබා ගත හැකි විනි.

## සටහන V–11 සෙරපිස් සංවර්ධන වැඩ සටහන – ඇස්තමේන්තුගත පිරිවැය හා ප්‍රතිලාභ

| | 1973/74 රුපි. | 1974/75 රුපි. | 1975/76 රුපි. | 1976/77 රුපි. | 1977/78 රුපි. |
|---|---|---|---|---|---|
| **1. පිරිවැය** | | | | | |
| පොල් – නැවත සිටවීමේ වැය | 4,025 | 6,250 | 8,475 | 10,700 | 12,925 |
| – නඩත්තු වැය | 22,800 | 19,992 | 18,085 | 16,180 | 14,245 |
| එකතුව | 26,825 | 26,242 | 26,560 | 26,880 | 27,170 |
| කිරිපට්ටිය – ප්‍රාග්ධනය | 47,500 | 18,000 | – | 12,000 | 10,000 |
| – පුනරාවර්තන | 30,000 | 28,000 | 29,000 | 30,000 | 30,000 |
| එකතුව | 77,500 | 46,000 | 29,000 | 42,000 | 40,000 |
| මයියොක්කා – මුළු වැය | 2,150 | 4,300 | 6,450 | 6,450 | 6,450 |
| කෙසෙල් " " | 1,850 | 3,000 | 3,000 | 3,000 | 3,000 |
| සෝයා බෝංචි " " | 3,000 | 6,000 | 9,000 | 9,000 | 9,000 |
| මුං ඇට " " | 3,300 | 5,600 | 6,600 | 6,600 | 6,600 |
| ඉරිඟු " " | 3,000 | 3,000 | 3,000 | 3,000 | 3,000 |
| එකතුව | 13,300 | 21,900 | 28,050 | 28,050 | 28,050 |
| වැල් දොඩම් – ප්‍රාග්ධනය | 19,725 | – | – | – | – |
| – පුනරාවර්තන | 4,700 | 6,600 | 7,050 | 6,850 | 5,550 |
| එකතුව | 24,425 | 6,600 | 7,050 | 6,850 | 5,550 |
| වී (කන්න දෙක) | 6,750 | 6,750 | 6,750 | 6,750 | 6,750 |
| මුළු පිරිවැය – ප්‍රාග්ධනය | 91,300 | 52,900 | 43,275 | 57,500 | 56,725 |
| – පුනරාවර්තන | 57,500 | 54,592 | 54,135 | 53,030 | 49,795 |
| එකතුව | 148,800 | 107,492 | 97,410 | 110,530 | 106,520 |
| **2. ප්‍රතිලාභ** | | | | | |
| පොල් .. | 92,500 | 83,000 | 75,000 | 67,000 | 59,000 |
| කිරි පට්ටිය .. | 84,000 | 96,000 | 96,000 | 115,200 | 135,000 |
| මයියොක්කා .. | 4,200 | 8,400 | 12,600 | 12,600 | 12,600 |
| කෙසෙල් .. | 6,000 | 9,600 | 9,600 | 9,600 | 9,600 |
| සෝයා බෝංචි .. | 5,500 | 11,000 | 16,500 | 16,500 | 16,500 |
| මුං ඇට .. | 5,880 | 11,700 | 11,700 | 11,700 | 11,700 |
| ඉදල් ඉරිඟු .. | 4,500 | 4,500 | 4,500 | 4,500 | 4,500 |
| වැල් දොඩම් .. | 9,000 | 27,000 | 27,000 | 22,400 | 18,000 |
| වී .. | 10,000 | 10,000 | 10,000 | 10,000 | 10,000 |
| මුළු එකතුව | 221,580 | 261,200 | 262,900 | 269,500 | 276,900 |
| **3. ශුද්ධ ලාභය ..** | 72,780 | 153,708 | 165,490 | 158,970 | 170,380 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

මෙම සැළැස්ම සකස් කිරීමෙහිදී වත්තෙහි වැඩ කළ කම්කරුවන්ගේද කලින් සිටි වතු අධිකාරීගේ සහ ප්‍රධාන ලිපිකරුගේද (ඔරෙන්ජ් ශ්‍රේණිහි සිටින) අදහස් විමසන ලදී. එහි සේවය කරන කම්කරුවන් හට සමූපකාර සමිතියේ සාමාජිකයින් විය හැකි බවත් පුරවැසි නොවන අය හට එම සමිතියට සේවය කරන කම්කරුවන් ලෙස ඉදිරියටත් සිටිය හැකි බවත් 1973 ජුලි මාසයේදී දන්වන ලදී. අතිරේක සාමාජික සංඛ්‍යාව අසල ගම් වලින් තෝරා ගනු ලබන බව සාමාජිකයන් හට දැන්වූ විට ඔව්හු පහත සඳහන් ඉල්ලීම් කළහ:—

(අ) සිය පවුල්වල සිටින රැකියා නොමැති සාමාජිකයන් හට වත්තේ (සටහනV–9) රැකියාවක් ලබා දෙන තෙක් පිටතින් කිසිවෙක් සේවයෙහි නොයෙදීම. වත්තෙහි ලබා ගැනීමට තිබූ සේවා අවස්ථා ස්වල්පය වැඩිදුරටත් සාධාරණ අයුරින් ප්‍රයෝජනයට ගත යුතු වූ හෙයින් මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙකී තීරණයට විරුද්ධව කම්කරුවෝ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය වෙත පෙත්සම් යැවූහ.

(ආ) ඔවුන්ගේ වර්තමාන ආර්ථික තත්වය සහ ඔවුන් මෙතෙක් භුරුපුරුදුව සිටින සුභසාධක පහසුකම් යනාදියද ලබා දීම. ස්වල්ප දෙනෙකුගේ ආදායම් තාවකාලිකව පහත බැස්මක් සිදු විය හැකි වුවද ඔවුන් වෙහෙස මහන්සි වී වැඩ කළහොත් අවසාන වශයෙන් ඔවුන්ගේ ප්‍රතිලාභයන් වැඩි විය හැකි බව ඔවුන්ට දන්වන ලදී.

අයදුම්කරුවන් 300 ක් අතුරින් තරුණයින් 5 දෙනෙක්ද ඇතුළුව 20 දෙනෙක් සමූපකාරයේ අතිරේක සාමාජිකයන් වශයෙන් 1973 අගෝස්තු මාසයේදී තෝරා ගනු ලැබින. මේ අය තෝරා ගැනීම සඳහා පත් කරන ලද කමිටුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ අධ්‍යක්ෂ, කෘෂිකර්ම උපදේශක සහ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ලේකම්ගෙන්ද සමන්විත විනි. සෙරපිස් වත්තේ සිට සැතපුම් පහක් පමණ ඈතුළත ගම් වලින් සියළුම නව සාමාජිකයන් තෝරා ගනු ලැබින. මොවුන්ගෙන් වැඩි දෙනෙක් දුප්පත් ගොවීන්ගේ දරුවන් වූ අතර, ඔව්හු වත්තෙහි සිටි පැරණි කම්කරුවන්ට වැඩි අධ්‍යාපනයක් ලත් අය වූහ. ඔවුන්ගෙන් ඇතමෙක් සිය පාසැල් දිවියෙන් පසුව වත්තෙහි පොල් ලෙලි ගසන කම්කරුවන් ආදීන් වශයෙන් සේවය කර තිබුණි. වැඩිදුර විස්තර සඳහා අ.5.3 – අ.5.6 සටහන් බලන්න.

සමූපකාරය පිහිටුවාගෙන යනු ලබන තෙක් එම වත්ත පාලනය කිරීම සඳහා 1972 ජුලි මාසයේදී තරුණ ව්‍යාපාර සංවිධායකයෙක් අනුයුක්ත කරන ලදී. ඔහුට අයත් කාර්යය වූයේ කලින් සිටි වතු කොන්දොස්තර සහ කංකානම් වරුන්ගේ සහයෝගය ඇතිව අතුරු කාලසීමාව තුළදී වතු යාය පාලනය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂාකාරී වීම, කලින් තිබූ ප්‍රමාණයටම කම්කරුවන්ගේ වැටුප් ගෙවීම, නිෂ්පාදන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ, බීජ වර්ග යනාදිය ඇනවුම් කිරීම සහ වතු යායෙහි කම්කරුවන් සහ අවට ගම් වැසියන් සමඟ ඇති වූ විවිධ

ගැටලු[1] සම්බන්ධයෙන් කටයුතු කිරීමයි.

1973 ඔක්තෝබර් මස 1 වෙනි දින සමූපකාරයේ නව සාමාජිකයෝ වැඩ ආරම්භ කළ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සභාපති වශයෙන්ද ව්‍යාපාර සංවිධායක ලේකම් වශයෙන්ද ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලද්දේය. සංවර්ධන නිලධාරී සහ කෘෂිකර්ම උපදේශකද මෙම මණ්ඩලයට පත් කරන ලද අතර කලින් සිටි වතු කම්කරුවන් දෙදෙනෙක් සහ නව සාමාජිකයන්ගෙන් එක් අයෙකුද වශයෙන් තෝරා ගත් නියෝජිතයන් තිදෙනෙක්ද අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් විනි. පසුව මෙය විධායක කමිටුව වශයෙන් හඳුන්වනු ලැබීනි.

මෙම කමිටුවෙහි සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජිතයන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සමූපකාර ජනාවාස වැඩ සටහන සහ එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම සඳහා සාමාන්‍ය රැස්වීමක් පවත්වන ලදි. සියළුම සාමාජිකයන් හට සමාන අයිතිවාසිකම් ඇතිව සේවය කිරීමට සිදු වන බව ඔවුන්ට අවබෝධ කර දෙන ලදී. ස්ත්‍රී, පුරුෂ, තරුණ, මහළු සෑම දෙනාටම මූලික වශයෙන් දිනකට රු. 3.50 ක් වූ ආරම්භක දීමනාවක් ලැබෙන බවද ඔවුන්ට දන්වනු ලැබුනි. එක් කන්නයක් අවසානයෙහි ගොවිපලෙහි ලාබදායිත්වය පදනම් කරගෙන කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂා කිරීමට ඔවුනට පිළිවන. මූලික වශයෙන් කළමණාකරන කටයුතු විධායක කමිටුවට පැවරෙන අතර ආරම්භයේදී එම කමිටුව, පත් කරනු ලබන සාමාජිකයන් වැඩි දෙනෙකුගෙන් සමන්විත වනු ඇත. එහෙත් ගොවිපල මනාව සංස්ථාපනය වූ පසුව එහි සාමාජිකයින් විසින්ම සම්පූර්ණ කමිටුව පත් කර ගනු ලැබේ. මේ අතරතුර දෛනික වැඩ කටයුතු සඳහා කණ්ඩායම් නායකයින් හා නියෝජිතයින් තෝරා ගැනීමට ඔවුනට පිළිවන.

මෙතෙක් ප්‍රගතිය

මෙම සමීක්ෂණය කරගෙන යනු ලැබූ කාලයෙහි (1973 දෙසැම්බර් 21 සහ 22) සමූපකාරයේ සාමාජිකයන් 51 දෙනෙක් වත්තෙහි සේවය කරමින් සිටියහ. මෙයින් 34 දෙනෙක්

---

1/ 1973 අගෝස්තු අග භාගයේදී අසල ගම්වැසියන් වත්තෙහි පොල් සහ කෙසෙල් කැන් සොරකම් කරගෙන යද්දී කම්කරුවන් විසින් අල්ලා ගනු ලැබූ සිද්ධීන් දෙකක් ඇති විනි. එක් අවස්ථාවකදී සොරා අල්ලාගෙන වත්තෙහිදීම ඔහුට පහර දෙන ලද අතර, අනෙක් අවස්ථාවේදී මුරකරුට ගම් වැසියන් විසින් පහර දෙන ලදී. මුරකරු දෙසතියක් පමණ රෝහලේ ප්‍රතිකාර ලැබීය.

එවැනි දේවල් සම්බන්ධයෙන් කටයුතු කර ලත් අත්දැකීමක් ව්‍යාපාර සංවිධායක හට නොතිබුණි. මෙම සිදුවීම් වලින් පැහැදිලි වනුයේ එක් ක්‍රමයක් වෙනුවට තවත් ක්‍රමයක් ඉක්මණින් නොයොදා, පවතින ක්‍රමය ඉවත් කිරීමෙහිදී ඇති වන අන්තරායකාරී තත්වයයි.

එහි සේවය කළ පැරණි කම්කරුවන් වූ අතර, 17 දෙනෙක් ඔවුන්ගේ නිවසේ සිට අසළ ගම් වලින් පැමිණි තරුණයින් වූහ. පුරවැසි නොවන කම්කරුවන් පස් දෙනෙක් කලින් මෙන් කම්කරුවන් ලෙස සේවය කළහ. V-12 සටහනෙහි විස්තර දැක්වේ.

කෘෂිකාර්මික වැඩ සටහන පිළිබඳ ප්‍රගතිය V-13 සටහනින් දැක්වේ. අක්කර 24 ක පොල් වගාව යටතේ විවිධ බෝග වගා කරන ලදී. මෙය අපේක්ෂිත ඉලක්කය වූ අක්කර 25 ට ආසන්න විමකි. එහෙත් කලින් බලාපොරොත්තු වූවාට වැඩි අක්කර ප්‍රමාණයක මයියොක්කා සහ කෙසෙල් වවන ලද අතර, බීජ වර්ග ලබා ගැනීමෙහි ඇති වූ දුෂ්කරතාවයන් නිසා ධාන්‍ය වැවීමෙහි ලා අපේක්ෂිත අක්කර ප්‍රමාණය අඩු විනි. කන්න දෙකක පොල් අස්වැන්න ලබා ගන්නා ලදී. පිළිවෙලින් එය පොල් ගෙඩි 101,432 සහ 51,628 ක් විනි. පළමුවන අස්වැන්නෙන් කොප්පරා පාරම් 65 ක් පිළියෙල කරන ලද්දේය. එහෙත් පොල්වලට හෝ තෘණ භූමිවලට පොහොර යොදා නොතිබුනි. මෙම සමීක්ෂණය කරගෙන යන ලද අවස්ථාවෙහි සිරි පට්ටි ආරම්භ කර නොතිබුණ අතර ගොඩනැගිලිවල සුළු අළුත්වැඩියා කිරීම් කිහිපයක් කරගෙන යනු ලැබීණ. පසුව 1974 ජනවාරි මාසයේදී දෙනුන් 30 ක් මිළයට ගන්නා ලදී. යල වී වගාව ඔක්තෝබර් මාසයේදී කපා පාගනු ලැබුයෙන් වී බුසල් 180 ක් ලැබුනි. (අක්කරයකට බුසල් 24.5 යි) අසල්වැසි ගම් වලින් කුලියට ලබා ගත් හරකුන් යොදවා සී සා මහ කන්නයේ වී වගාව කර තිබුනි.

<u>සටහන V-12</u> <u>සෙරපිස් සමූපකාර සාමාජිකයෝ</u>

| වර්ගය | කලින් රැකියාව | අංකය | කලින් ඉපැයුම් | දැන් ඉපැයුම් |
|---|---|---|---|---|
| සාමාජිකයෝ (පුරුෂ) | දෛනික වැටුප් ලබන වතු කම්කරුවෝ | 9 | දිනකට රු. 3.66 | දිනකට රු. 3.50 |
| සාමාජිකයෝ (පුරුෂ) | මාසික වැටුප් ලබන වතු කම්කරුවෝ | 7 | මසකට රු. 107.50- රු. 200.00 | දිනකට රු. 3.50 |
| | රැකියා නොමැති තරුණයින් | 14 | - | - |
| සාමාජිකයෝ (ස්ත්‍රී) | දෛනික වැටුප් ලබන නේවාසික කම්කරුවෝ | 14 | දිනකට රු. 2.80 | දිනකට රු. 3.50 |
| සාමාජිකයෝ (ස්ත්‍රී) | දෛනික වැටුප් ලබන නේවාසික නොවන කම්කරුවෝ | 4 | දිනකට රු. 2.80 | දිනකට රු. 3.50 |
| සාමාජිකයෝ (ස්ත්‍රී) | රැකියා නොමැති තරුණියන් | 3 | - | - |
| පුරවැසි නොවන කම්කරුවෝ (පුරුෂ) | නේවාසික වතු කම්කරුවෝ | 2 | 1Xරු.6.50 දිනකට 1Xරු. 3.66 දිනකට | කලින් මෙනි |
| ,, (ස්ත්‍රී) | - එම - | 3 | දිනකට රු. 2.80 | - එම - |

මූලාශ්‍රය: සාමාජිකයින් සමග සම්මුඛ සාකච්ඡා ඇසුරෙනි.

## සටහන V–13   සෙරපිස් කෘෂිකාර්මික වැඩ සටහන – 1973 දෙසැම්බර් 22 තෙක් ප්‍රගතිය

| කාරණය | | යෝජිත ප්‍රථම වසරේ වැඩ සටහන | 1973 දෙසැම්බර් 22 තෙක් ප්‍රගතිය |
|---|---|---|---|
| පොල් | .. | අ) අක්කර 170 ක නඩත්තුව | මුර දෙකක් කඩාගෙන ඇත. පෝර දැමීම හා වල් පැල මර්දනය තවම කර නැත. |
| | | ආ) අක්කර 15 ක් නැවත සිටුවීම | තවම ඉටු කර නැත. |
| කිරි පට්ටිය | .. | දෙනුන් 40 ක් ගෙන ඒම | ඉඩ කඩ වෙන් කර ඇත. (1974 ජනවාරි මාසයේදී ලබාගෙන ඇත) |
| මයියොක්කා | .. | අක්කර 5 ක් පැරණි පොල් වගාව යට | අක්කර 10 ක් වගා කර ඇත. |
| කෙසෙල් | .. | අක්කර 5 ක් පැරණි පොල් වගාව යට | අක්කර 10 ක් වගා කර ඇත. |
| සෝයා බෝංචි | | අක්කර 5 යි | තවම වගා කර නැත. (බීජ සපයා ගැනීමට නොහැකිය) |
| මුං ඇට | .. | අක්කර 5 යි | එක් අක්කරයක් වගා කර ඇත. (අනෙක්වා සඳහා බීජ නොමැත) |
| ඉදල් ඉරිඟු | .. | අක්කර 5 යි | තවම වගා කර නැත. |
| වැල් දොඩම් | .. | අක්කර 10 යි | අක්කර 10 ක බිම සකස් කර තිබේ. පැල සිටුවා නැත. |
| අන්නාසි | .. | සැළැස්මෙහි නැත | අක්කර 2 ක බිම සකස් කර ඇත. |
| බතල | .. | සැළැස්මෙහි නැත | අක්කර 3 ක වගා කර ඇත. |
| වී | .. | අක්කර 7 1/2 | මහ කන්නය වගා කර ඇත. |

මූලාශ්‍රය: සෙරපිස් යෝජනා ක්‍රම කළමණාකරු සහ කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස සිට 1974 පෙබරවාරි අග භාගය තෙක් වතුයායෙහි වියදම රු. 43,510/– ක් විනි. මෙම මුදලින් වැඩි හරියක් සාමාජිකයනට කරන ලද ගෙවීම් විය. මහජන බැංකුවෙන් ඉල්ලා සිටින ලද ණය මුදල තවම ලැබී නැති නිසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මුදල අත්තිකාරම් වශයෙන් දෙන ලද්දේය. මෙම කාලය තුළ බෝග විකිණීමෙන් ලද ලාභය රු. 46,609.10 ක් විනි. මෙම මුදල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට වෙත භාර දෙන ලදි. අය සහ වැය පිළිබඳ විස්තර සටහන V–14 හි දැක්වේ.

සටහන V-14 1973 ඔක්තෝබර් සිට 1974 පෙබරවාරි දක්වා සෙරපිස් ගොවිපලේ අය සහ වැය

| අය | | වැය | |
|---|---|---|---|
| කොප්පරා විකිණීමෙන් | 35,431.00 | කම්කරුවන්ට ගෙවීම | 21,106.48 |
| | | හරක් මිළයට ගැනීම | 11,600.00 |
| පොල් විකිණීමෙන් | 7,828.10 | පැල යනාදිය මිළයට ගැනීම | 6,560.00 |
| විවිධ නිෂ්පාදන විකිණීමෙන් | 3,350.00 | උපකරණ මිළයට ගැනීම, ගොඩනැගිලිවල සුළු අළුත්වැඩියා සහ විවිධ කරුණු සඳහා වැය | 4,244.52 |
| | 46,609.10 | | 43,510.00 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම

විධායක කමිටුව සාමාන්‍යයෙන් මසකට එක් වරක් පමණ රැස් වූවාය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නියෝජිතයින් කොළඹ සිට පැමිණි විට සාමාන්‍යයෙන් පොදු රැස්වීම් පවත්වන ලදි. ස්ථිර වැඩ කණ්ඩායම් එතෙක් සකස් කර නොතිබිණි. සෑම උදෑසනකම පෙරේට්ටුව සඳහා සාමාජිකයෝ කාර්යාලයට පැමිණි අතර කොන්දොස්තරගේද සහාය ඇතිව ව්‍යාපාර සංවිධායක විසින් වැඩ පවරන ලදී.

විශ්ලේෂණය

පහත දක්වා ඇති නිරීක්ෂණයන්හි පරමාර්ථය වනුයේ සෙරපිස් ගොවිපලෙහිදී පළමු මාස කිහිපය තුළ ලත් අත්දැකීම් තුලින් අවබෝධ කර ගත් සාවද්‍යතාවයන් අනෙකුත් ගොවිපලවල්හිද සිදු වීම වැළැක්වීමට වග බලා ගැනීමය.

ශිල්පීය විශ්ලේෂණය

සෙරපිස් ගොවිපල සඳහා යෝජිත සැළැස්මට අනුව සමුපකාර සාමාජිකයින්ගේ අත්දැකීම්ද ඇතුළුව පවතින සියළුම සම්පත් මනාව උපයෝගී කර ගැනීමේ අවස්ථාව සැළසුණි. ශිල්පීය වශයෙන් දුර්වලතාවයන් දෙකක් අවබෝධ විය:

(අ) එතෙක් කොළිවලට හෝ පොල් අතර වගා කරන ලද බෝගවලට හෝ පොහොර යොදා නොතිබීම. පොහොර හිඟකම නිසා පසෙහි පෝෂ්‍යදායී තත්වය උරා ගන්නා මයියොක්කා වැනි බෝග වැවීමට වඩා එම පෝෂ්‍යදායී

තත්වය නැවත ඇති කරන තණ වර්ග හෝ වෙනත් බෝග පොල් අතර වැවීම වැඩදායකය.

(ආ) ගව පට්ටිය සෙරපිස් ගොවිපලට ගෙන ඒමට ප්‍රමාද වීම. මෙය හේතු කොටගෙන රැකියා අවස්ථාවන් සහ ආදායම අඩු වූවා පමණක්නොව වල් පැල වැවීම නිසා තණ වගාවද අයහපත් තත්වයකට පත් විනි. ප්‍රතිෂ්ඨාපිත වතුයායක් අත් පත් කරගත් වහාම එහි සම්පූර්ණ නිෂ්පාදන කාර්යයන් ආරම්භ කිරීමේ වැදගත්කම මෙයින් වැටහේ. එක් එක් දිනයක් බැගින් පමා වීමෙන් සිදු වනුයේ අවසාන වශයෙන් පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය වියදම හා කාලය වැය වීමයි.

ආර්ථික විශ්ලේෂනය

1973/74 සඳහා ඇස්තමේන්තුගත ශුද්ධ ලාභය වූ රු. 72,780/- ක මුදල 1977/78 වන විට රු. 170,380/- තෙක් වැඩි වන බව V-11 සටහනෙන් පෙනී යයි. මනා කළමණාකරන ක්‍රමයක් හා සෑහීමකට පත් ශ්‍රම හවුලක් යටතේ මෙම ඉලක්කයන් ළඟා කර ගැනීමට හෝ ඉක්මවීමට හෝ පිළිවන. කරුණු තුනක් මෙහි ලා වැදගත් වන්නේය:

(අ) අවශ්‍ය මූලධන ආයෝජනය ප්‍රමාද වුවහොත් ඉලක්ක ළඟා කර ගත නොහැකි වනු ඇත. ආදායමක් ලබන සෙරපිස් වැනි වතුයායක පොල් යනාදිය විකිණීමෙන් ලබන මුදල වත්තෙහි වැඩ කටයුතු සඳහා ආයෝජනය කෙරේ නම් ප්‍රාග්ධන ගැටළුවද මග හරවාගෙන බැංකු ණය සඳහා ඇති අවශ්‍යතාවයද අඩු කර ගැනීමට පිළිවන.

(ආ) සමූපකාරයේ සාමාජිකයින් හට ලැබෙන ආදායමෙන් ඔවුන් සෑහීමකට පත් නොවී අනාගතය පිළිබඳව අවිනිශ්චිත තත්වයක් ඔවුන් තුළ ඇති වුවහොත් උසස් ශ්‍රම පලදායීතාවයක් පවත්වාගෙන යාම අසීරු වන්නේය. පැරණි ක්‍රමය යටතේ මෙන් නොව නව ක්‍රමය යටතේ වැඩි වෙහෙසක් නොමැතිව වැඩ කරන බව පැරණි සාමාජිකයින්ගෙන් වැඩි දෙනෙක් පවසා ඇති අතර ඔවුන්ගේ අදහසට අනුව නව සාමාජිකයින් ඉටු කරන වැඩ කොටස් අල්පය. ඊට හේතු ගණනාවක් තිබිය හැකි වුවත් දක්වා ඇති වැදගත්ම හේතුවක් වනුයේ ආදායම ප්‍රමාණවත් නොවීම හා අනාගතය පිළිබඳ අවිනිශ්චිත හැඟීමය.1/

---

1/ නව සාමාජිකයින් 17 දෙනා සහ ස්ත්‍රී කම්කරුවන් 18 දෙනාද ඔවුන් කලින් ලැබූවාට වඩා ඉහළ ආදායමක් මුදලින් ලබති. (දිනකට රු. 3.50)(V-17 සටහන බලන්න) කලින් දෛනික වැටුප් ලැබූ සාමාජිකයින් 9 දෙනාගේ ආදායම අඩුව ඇත්තේ දිනකට රු. 3.66 සිට රු. 3.50 දක්වා පමණකි. ඇතැම් අවස්ථාවල භාර්යාවන්ගේ වැටුප රු. 2.80 සිට රු. 3.50 දක්වා වැඩි වීම නිසා මෙම අඩුවීම හිලවු වී තිබේ. මාසික වැටුප් ලබන සාමාජිකයින් 7 දෙනා පමණක් ආදායම් අතින් බෙහෙවින් පහත් තත්වයකට පත් වුවත් රැකියාව නොමැති නම් සේවා විරහිතව සිටීමට සිදු වන හෙයින් ඔවුන් මෙම තත්වය පිළි ගෙන ඇත. පැරණි කම්කරුවන් සම්බන්ධයෙන් වැදගත් වනුයේ ඔවුන් කලින් හුරු පුරුදුව සිටි ශුභසාධක පහසුකම් නැතිව යාමයි. සමූපකාර සමිතිය ඉදිරියටත් නිවසක් සඳහා බිම් කැබැල්ලක් සහ සහනාධාර ක්‍රමයකට පොල් සැපයීම වෙතෙත් සිදු කර ඇත.

ආරම්භයෙහි පවතින පහත් ආදායම් තත්වය තාවකාලික බවත්, වතුයායෙහි ලාභදායිත්වය පදනම් කරගෙන අවසාන ආදායම් තත්වය, සාමාජික ශ්‍රමයේ ඵලදායිතාවය පදනම් කරගෙන නිගමනය කරනු ලැබෙන බවත් අවධාරණය කිරීම සාමාජික උද්යෝගය පවත්වා ගැනීම සඳහා වැදගත් වන්නේය.

(ඇ) ඉඩමේ වටිනාකම සඳහා වැයක් ඇස්තමේන්තුවෙහි නොමැත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම ඉඩමෙහි වටිනාකම අය කර ගැනීම පිළිබඳ නියමිත ප්‍රතිපත්තිය ගැන දැන් සලකා බලාගෙන යයි. සම්මත පොලී ප්‍රමාණයන්ද සහිතව ඉඩමේ පූර්ණ වටිනාකම (අක්කරයකට රු. 2,000/- පමණ) ගෙවිය යුතු නම් ලාභදායිතාවය වසරකට රු. 30,000/- කින් පමණ අඩු වනු ඇත. වත්ත පවරා ගත් අවස්ථාවෙහි එය මනාව පාලනය කර නොතිබීම සහ එහි තිබූ චංචල දේපල ඉවත් කරගෙන යාම සාමාජිකයින්ගේ වරදක් නොවන නිසා මෙය සමූපකාර සාමාජිකයින්ට ඉසිලීමට සිදු වන ලොකු බරක් විය හැකිය.

පරිපාලනමය විශ්ලේෂණය

ආරම්භක පරිවර්ථන කාලසීමාවෙන් පසුව සමූපකාරය හැකිතාක් දුරට සාමාජිකයින් විසින්ම පාලනය කරනු ලැබීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ බලාපොරොත්තුව වූයේය. ප්‍රගතිය අදියර තුනකින් විශ්ලේෂණය කිරීමට පිළිවන.

I. ව්‍යවස්ථික බදු කාලසීමාව (1972 අගෝස්තු - 1973 ජූලි): මෙම කාලසීමාව තුළදී වතුයාය මැනවින් පාලනය කරනු ලැබේ යයි අපේක්ෂා කලත් සෙරපිස් වතුයාය සම්බන්ධයෙන් එය එසේ සිදු නොවිනි. පොල්වලට පොහොර නොදමන ලද අතර, වත්තෙහි සිටි සතුන් ඉවත් කරගෙන යනු ලැබිණ. ගොඩනැගිලි සමහරක් ජරාවාස විනි. ඒවායේ සවි කර තිබූ ඇතැම් උපකරණ ඉවත් කරගෙන ගොස් තිබුනි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙනුවෙන් වතුයාය පාලනය කිරීමෙන් ලැබෙන වාසියක් නොමැති බව බදුකරුට හඟී යන්නට ඇත.

II. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරූ දින සිට සමූපකාරය පිහිටුවන ලද දින තෙක් කාලසීමාව (1973 ජූලි සිට 1973 ඔක්තෝබර්): වතුයායේ කලින් සිටි කොන්දොස්තරගේ සහාය ඇතිව ව්‍යාපාර සංවිධායක සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නිලධාරීන් විසින් වතුයාය පාලනය කරගෙන යනු ලැබීන. කෙසේ වෙතත් කලින් තිබී දැඩි කළමණාකරන ක්‍රමය ඉවත් කිරීමත් සමඟම පාලනය අකාර්යක්ෂම වූ අතර අසල්වැසි ගම්වැසියන් සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමද අසීරු විනි. මෙම වතුයාය දැන් පොදු දේපලක් බවට පත් වන හෙයින් ගම්වැසියන්ටද කිසියම් අයිතියක් ඇති බව ඔවුන්ගේ අදහස විය. වතුයායෙහි

වැඩ කරන අය සහ ගම්වැසියන් අතර විරෝධතාවයන් උද්ගත වූ බව කලින් සඳහන් කරන ලද පරිදි පෙනී යයි. මෙම ගැටුම් හේතුකොටගෙන පළමු ව්‍යාපාර සංවිධායක මාරු කර ඒ වෙනුවට වෙනත් අයෙක් යෙදැවීමට සිදු විය.

III. සමූපකාර සමිතිය ඇති කිරීමෙන් පසුව කාලසීමාව (සමීක්ෂණය පැවති දින තෙක්–1973 ඔක්තෝබර්): සමූපකාරයේ වැඩ කටයුතු පාලනය කිරීම සඳහා පිහිටුවන ලද විධායක කමිටුවට බාහිර නිලධාරීන් වැඩි හරියක් අයත් විනි. සමූපකාරයේ වැඩි දෙනෙක් විධායක කමිටුවෙහි බලයට පත් වුවහොත් ඔවුන් විසින් ගොවිපල කාර්යක්ෂමව පාලනය කරනු නොලැබේ යයිද නව සාමාජිකයින් පිළිබඳව නොතකා පැරණි කම්කරුවන් විසින් සමූපකාරය පාලනය කරගෙන යනු ලැබේවි යයි අදහස් කරන ලදී.

සාමාජිකයින් වෙත බලතල නොදීම හේතුකොටගෙන ඇති වූ ප්‍රතිඵල තෙ ආකාරය. පළමුව ගොවිපලෙහි වූ කම්කරුවන් සහ පාලකයන් අතර තිබූ සම්ප්‍රදායික සම්බන්ධතාවයෙහි එතරම් වෙනසක් සිදුව නැත. සමූපකාර සාමාජිකයින් ටික දෙනෙක් පමණක් තීරණ ගැනීමේ කාර්යයට සහභාගි වුනේය. ඔවුන් වැඩි දෙනෙක් තමන් පිළිබඳව අදහස් කළේ ඉඩම් හිමියන් මෙන් නොව වතු කම්කරුවන් වශයෙනි. අත්දැකීම් අඩු එසේම ලිහිල් කළමණාකරනය යටතේ මෙම ක්‍රමය උසස් ඵලදායිතාවයකට තුඩු දී නැත.[1] දෙවනුව නොයෙකුත් කරුණු හේතුකොටගෙන ආරම්භක වශයෙන් අවශ්‍ය වුවත් පරිපාලනය හා මුදල් පාලනය කොළඹ මධ්‍යගත කිරීම නිසා තීරණ ගැනීමෙහි ලා ඇතැම් පමාවන් සිදුව ඇත. තෙවනුව කළමණාකරන කාර්යයෙහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, මහජන මන්ත්‍රී, සමූපකාර දෙපාර්තමේන්තුව ආදී වශයෙන් බාහිර ආයතන සහ පුද්ගලයින් හා විධායක නිලධාරීන් අතර මතභේද ඇතැම්විට පැන නැඟුණ අතර ඒවා නිරතුරුවම සමූපකාර සාමාජිකයින්ගේ සුභසිද්ධිය සඳහා නොවීය.

### සමාජයීය විශ්ලේෂණය

හේතු ගණනාවක් නිසා ස්වයං–පාලන ක්‍රමයක් යටතේ සාමූහික ජන සමූහයක් පිහිටුවීමේ වැඩදායක බව අපට ප්‍රත්‍යක්ෂ විනි. අභ්‍යන්තර වශයෙන් මෙන්ම අවට ගම් සමඟද ඒකාබද්ධ කරන ලද පෙරපිස් වතුයාය බලාපොරොත්තු ඇති කර ගත හැකි තත්වයක් නොපෙන්වීය. පැරණි කම්කරුවෝ සමූපකාරය ඇති කරන ලෙස ඉල්ලා නොසිටියහ. වතුයාය පවරා ගැනීම හේතුකොටගෙන ඇතැම් අයගේ ආදායම අඩු වූ අතර තවත් අයෙකුගේ සමාජයීය තත්වය පහත වැටුනි. පිටස්තර ගම් වලින් තරුණයින් වතුයායට පැමිණීම ඔවුන් හෙළා දුටු අතර අසල්වැසි ගම්වල ගොවීයෝද තමන් හට ඉඩම් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සමූපකාරය පිහිටුවීම කෙරෙහි අකමැත්තක් පල කළහ.

---

1/ මේ වගේ දවස්වල බෙල් එක වදින කොට ඉහලට එසවූ උදැල්ල ඇතැම්විට පහල නොදමා යන්නටත් පුළුවන්කම තිබේ යැයි පැරණි කම්කරුවෙක් පැවසීය.

මෙවැනි අඩුපාඩුකම් තිබුනත් සමාජීය වශයෙන් ආරම්භක ප්‍රගතිය දිරි ගන්වන සුළුය. සියළුම සාමාජිකයෝ එක් දිනක වැඩ සඳහා එකම ආදායමක් ලද අතර, කලින් තිබූ සමාජයීය විෂමතාවයන් අඩු වුනේය. ඉඩම් කුඩා කැබලිවලට කඩන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණ අතර පැරණි හා තරුණ සාමාජිකයින් අතරේ දැඩි මතභේද ඇති නොවිනි. එසේම ගම්වැසියන් සහ වතු කම්කරුවන් අතර මුලින් ඇති වූ ගැටුම්ද නැවත නැවතත් ඇති නොවීය.

පැහැදිලිව පෙනෙන මෙම සමතුලයතාවයට දැක්විය හැකි හේතු වනුයේ සුළු දෙනෙක් කලින් ලැබුවාට වැඩි ආදායමක් ලැබීම, ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යය වැඩි වෙහෙසක් ගෙන දෙන කාර්යයක් නොවීම සහ සමාජයීය ගැටළු තිබුනත් ඒවා මතුපිටට ගෙන ඒමට කළමනාකරුවන් විසින් තවම සාමාජිකයින් දිරි ගන්වනු නොලැබීමයි.

කෙසේ වෙතත් දීර්ඝකාලීනව සළකා බලන කල තත්වය බෙහෙවින් සතුටුදායක යැයි සැළකිය නොහැකිය. දැනුදු ගොවිපල පිටස්තර අය විසින් පාලනය කරනු ලබන අතර සාමාජිකයින්ගේ ශ්‍රම පලදායිතාවය පහත් තත්වයක වන්නේය. නව සම්බන්ධතාවයකට අනුරූප වන පරිදි පුහුණුවක් ලබා හැඩ ගැසීම සඳහා සෑහෙන කාලයක් ඉඩ හරින අතරම වගකීම පැවරීමට සහ නිශ්චිත සමාජයීය පරිවර්ථනයක් ලඟා කර ගැනීමට සිදුවන පමාව නිසා ඇතිවනුයේ නව කළමණාකරුවන් ඔවුන්ම එහි මුල්බැස ගැනීම හා සාමාජිකයින් එම කළමනාකරුවන් මතම රැඳා පැවැත්මට ඇති නැඹුරුතාවය වැඩි වීමයි.[1] පත් කරනු ලැබූ කළමනාකරුවන් අදියරගත ක්‍රමයක් යටතේ ඉවත් කිරීම, පැරණි සාමාජිකයින් හා අළුත් සාමාජිකයින් අතර දැඩි සම්බන්ධතාවයක් ඇති කිරීම, මුළු ජන සමාජය ගම් සමඟ ඒකාබද්ධ කිරීම, කාර්යක්ෂම වූත් සූක්ෂම වූත් මාර්ගෝපදේශකත්වයක් හා පුහුණුවක් ලබා දීම අත්‍යවශ්‍ය කාර්යයන් වේ.

## 5.3.2 දම්මුලහේන සාමූහික ගොවිපල

පසුතලය

දම්මුලහේන සාමූහික ගොවිපල කොළඹ දිස්ත්‍රික්කයේ අත්තනගල්ලට නුදුරුව අක්කර 155 ක් පමණ වූ පොල්වතු යායක පිහිටා ඇත. මෙහි බිම මඳක් බෑවුම් සහිත වන අතර සෝදා පාලුව දක්නට ඇත. (සටහන අ.5.1 – අ.5.2) කලින් මුළු වතුයාය පාලනය කරනු ලැබුයේ රබර් වවා තිබූ විශාල වතුයායක කොටසක් වශයෙනි. මෙම වතුයාය තුළ ස්ථිර ගොඩනැගිලි කිසිවක් තිබුනේ නැත. නේවාසික කම්කරුවන් එහි නොසිටි අතර පොල් කැඩීම ආදී වැඩ අනියම් පදනමක් යටතේ කිරීම සඳහා අසල්වැසි ගම් වලින් මිනිස්සු පැමිණියහ. තමන්ගේ ගවයින් හට වත්තෙහි තණ කෑවීමටත් සිය ප්‍රයෝජනය උදෙසා පොල් ගෙඩි කිහිපයක් ලබාගෙන යාමටත් ගම්වැසියන්ට ඉඩ දී තිබුනි. දම්මුලහේන වතුයාය වෙනුවෙන් වෙනමම නිෂ්පාදන වාර්තා නොතිබුනත් එම වතුයායේ අස්වැන්න සහ ලාභදායිතාවය ඉහළ මට්ටමක නොපැවැති බව පැහැදිලිය.

---

[1] තරුණ ජනාවාස සහ සමූපකාර ගොවිපල බොහොමයක මෙම තත්වය ඇති විය.

සාමූහික ගොවිපල ආරම්භ කිරීම

1972 අග භාගයේදී පමණ මෙම ව්‍යාපෘතිය සමූපකාර ජනාවාසය පිහිටුවීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට භාර දෙන ලදී. එහි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අසල්වැසි ගම් වලින් අයදුම් කල 300 ක් පමණ තරුණයින් සම්මුඛ පරීක්ෂණයකට භාජන කර 60 දෙනෙක් තෝරා ගනු ලැබින. (සටහන අ.4.3)

එක් සාමාජිකයෙකුට අක්කර 2 බැගින් පෞද්ගලිකව බිම් කට්ටි වෙන් කර දීමට කලින් අදහස් කරන ලද්දේය. එහෙත් මුළු ව්‍යාපෘතිම එකම ඒකකයක් වශයෙන් සාමූහික පදනමක් මත පාලනය කිරීමට පසුව තීරණය කරන ලදී. 1973 ජනවාරි මාසයේදී වැඩ ආරම්භ කරන ලද අතර තෝරා ගත් සාමාජිකයින් 60 දෙනාගෙන් 35 දෙනෙක් පමණක් වැඩට පැමිණියහ. ඔව්හු තාවකාලික වාඩියක් ඉදි කරගෙන 10 දෙනෙකුගෙන් සමන්විත වැඩ කණ්ඩායම්වලට බෙදී බිම් හෙළි පෙහෙළි කිරීම, පස සෝදා යාම වැළැක්වීම සඳහා කානු කැපීම ආදී කාර්යයන්හි නිරත වූහ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉඩම් උපයෝගිතා අංශයෙහි සහාය ඇතිව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් සංවර්ධන සැලසුමක් සකස් කරන ලදී. මෙම සැලැස්මට අනුව පොල් වගාව ක්‍රම ක්‍රමයෙන් පුනරුත්ථාපනය කිරීම, පොල් වගාව යටතේ ඇතැම් තැන්වල වැලි දොඩම්, ගුරු, මයියොක්කා සහ වෙනත් බෝග වැවීම අපේක්ෂා කරන ලදී. පසුව හැකි වුවහොත් කුකුල් කොටුවක් සහ කිරි පට්ටියක් ආරම්භ කිරීමටද අදහස් කරන ලද්දේය. සටහන V-15 හි විස්තර දැක්වේ.

<u>සටහන V-15</u> <u>යෝජිත නිෂ්පාදන වැඩ සටහන - දම්මුලගේන</u>

| ව්‍යාපාරය | වසර 1 අක්කර | වසර 2 අක්කර | වසර 3 අක්කර | වසර 4 අක්කර | වසර 5 අක්කර |
|---|---|---|---|---|---|
| වැලි දොඩම් | 32# | 32 | 32 | 32 | 25 |
| අන්නාසි | 5 | 5 | 5 | 5 | 5 |
| පොල් (පුනරුත්ථාපනය) | 25 | 25 | 25 | 25 | 25 |
| කෙසෙල් | 5,000¥ | 5,000 | 5,000 | 5,000 | 5,000 |
| මයියොක්කා | 10 | 10 | 10 | 10 | 10 |
| ගුරු | 2 | 2 | 2 | 2 | 2 |

# සැලැස්ම සකස් කිරීමට පෙර 1973 මැයි මාසයේදී අක්කර 7 ක් වගා කරන ලද්දේය. පසුව අවුරුද්දේ සැළැස්මට තවත් අක්කර 25 ක් එක් කරනු ලැබුනි.

¥ මෙය පැල ගණන වේ.

ඉඩම්, යෙදවුම් සහ පොහොර ආදිය සඳහා රු. 85,000/- ක පමණ ආරම්භක ආයෝජනයක් අවශ්‍ය වන්නේ යයි ඇස්තමේන්තු කරන ලද්දේය. මෙයින් රුපියල් 35,000/- ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් අත්තිකාරම් දීමට නියමිතව තිබූ අතර, රු. 50,000/- ක ණය මුදලක් මහජන බැංකුවෙන් ලබා ගැනීමට නියම විනි. යෝජිත වැඩ සටහනෙහි ඇස්තමේන්තුගත වියදම් හා ආදායම් V-16 සටහනෙහි දැක්වේ.

## සටහන V-16 දම්පුලගේන සංවර්ධන සැලැස්මෙහි අය සහ වැය

| කාරණය | වසර 1<br>රු. | වසර 2<br>රු. | වසර 3<br>රු. | වසර 4<br>රු. | වසර 5<br>රු. |
|---|---|---|---|---|---|
| 1. **වියදම** | | | | | |
| වැල් දොඩම්: | | | | | |
| අක්කර 25 ක | | | | | |
| නව වගාව | 43,488 | 12,200 | 13,725 | 14,417 | 12,330 |
| දැනට පවතින | | | | | |
| අක්කර 7 ක | | | | | |
| නඩත්තුව | 3,430 | 3,850 | 4,280 | 3,275 | - |
| අන්නාසි .. | 12,975 | 8,250 | 8,375 | 8,375 | 6,375 |
| පොල් .. | 4,877 | 8,452 | 10,727 | 12,977 | 15,277 |
| කෙසෙල් .. | 9,250 | 2,750 | 2,750 | 2,750 | 2,750 |
| මයියොක්කා | 7,100 | 5,825 | 5,825 | 5,825 | 5,825 |
| ඉඟුරු .. | 1,600 | 1,600 | 1,600 | 1,600 | 1,600 |
| මුළු ප්‍රාග්ධනය | 60,250 | 10,512 | 10,512 | 10,512 | 10,512 |
| මුළු පුනරාවර්තනය | 22,470 | 32,415 | 36,710 | 38,707 | 33,595 |
| මුළු වියදම | 82,720 | 49,922 | 47,222 | 49,219 | 44,107 |
| 2. **ආදායම** | | | | | |
| වැල් දොඩම්: | | | | | |
| පැරණි වගාව | 14,000 | 14,000 | 11,200 | 9,800 | - |
| වැල් දොඩම්: | | | | | |
| නව වගාව | 20,000 | 50,000 | 50,000 | 40,000 | 34,800 |
| අන්නාසි .. | - | 18,750 | 22,500 | 22,500 | 22,500 |
| පොල් .. | 7,500 | 9,000 | 10,500 | 10,500 | 12,000 |
| මයියොක්කා | 16,000 | 16,000 | 16,000 | 16,000 | 16,000 |
| කෙසෙල් .. | 20,000 | 20,000 | 20,000 | 20,000 | 20,000 |
| ඉඟුරු .. | 5,000 | 5,000 | 5,000 | 5,000 | 5,000 |
| මුළු ආදායම | 82,500 | 132,750 | 135,200 | 123,800 | 110,300 |
| 3. **ශුද්ධ ලාභය** | - 200 | 89,803 | 89,978 | 74,581 | 66,193 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

තෝරාගත් සාමාජිකයින් 6 දෙනෙක් සහ පත් කරන ලද සාමාජිකයින් තිදෙනෙක්ද යුතුව විධායක කමිටුවක් පත් කරන ලද්දේය. (ජනපද නිලධාරී, සංවර්ධන සහකාර සහ විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපති) තරුණ සාමාජිකයෙක් සමිතියේ සභාපති ලෙස තෝරා ගනු ලැබීය. ජනපද නිලධාරියා ව්‍යාපාර සංවිධායක ලෙස කටයුතු කළේය.

ගන්නෝරුවේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථානයේදී මෙම සාමාජිකයින් සඳහා කෙදිනක පුහුණුවක් පිළියෙල කරන ලද්දේය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නිලධාරීන් මේ අදියරෙහිදී සතියකට වරක් පමණ ගොවිපල ඔවුන්ගේ නිරීක්ෂණයට ලක් කළේ සාමාජිකයින් පුහුණු කර ඔවුන්ගේ ගැටළු මග හරවා ගැනීමට සාමාජිකයින්ට සහාය දීම සඳහාය.

මෙතෙක් ප්‍රගතිය

සමීක්ෂණය කරගෙන යන ලද අවස්ථාවෙහි සාමාජිකයින් 28 දෙනෙක් දම්බුලගේන ගොවිපලෙහි සිටි අතර ඔවුන්ගේ සාමාන්‍ය වයස් ප්‍රමාණය අවුරුදු 22 ක් විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් 8 වන හෝ 9 වන ශ්‍රේණිය තෙක් අධ්‍යාපනය ලබා තිබුණේය. සාමාජිකයින්ගෙන් වැඩි දෙනෙක් ප්‍රදේශයෙහි ගොවීන්ගේ හෝ වතුයායෙහි කම්කරුවන්ගේ පුතුන් වූහ. ඔවුන්ගෙන් 70% ක් පමණ කණ්ඩායමක් වශයෙන් ගොවිපලෙහි ජීවත් වී සිටි අතර ඔවුන් අතර කුලය පිළිබඳ වෙනස්කම් තිබුණේය. (සටහන් අ.5.4 - අ.5.6) 1974 ජනවාරි මාසයේදී සමාන පසුතලයකින් යුතු තවත් සාමාජිකයින් 11 දෙනෙක් තෝරා ගනු ලැබූ අතර සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 39 ක් විය.

සාමාජිකයෝ 10 දෙනෙකුගෙන් පමණ යුත් වැඩ කණ්ඩායම්වලට බෙදී සිටි අතර, මේ එක් එක් කණ්ඩායමට තෝරා ගත් නායකයෙක් විය. ඔහු විධායක කමිටුවෙහිද සේවය කළේය. සියළුම මාදිලියේ වැඩ ගැන අවබෝධයක් ලබා ගැනීමට හැකි වන පරිදි වරින් වර සාමාජිකයින් විවිධ කාර්යයන් සඳහා නිරත කරවන ලද්දේය. දම්බුලගේන ගොවිපලෙහි අක්කර 30 ක කැලය හෙළි පෙහෙළි කර සෝදා පාළුව ආරක්ෂා කිරීම සඳහා යාර 6,000 ක් පමණ කානු කපා හෙවල් දෙකක් ඉදි කර ළිං තුනක් සහ සැතපුම් බාගයක පමණ පාරක්ද සාදා තිබුණ අතර V-17 සටහනෙහි දක්නට ලැබෙන පරිදි නොයෙකුත් බෝග වැවීමද ආරම්භ කර තිබුණේය.

## සටහන V-17 දම්බුලගේන නිෂ්පාදන වැඩ සටහන 1973 දෙසැම්බර් 29 තෙක් ප්‍රගතිය

| බෝගය | | අක්කර ප්‍රමාණය | සටහන් |
|---|---|---|---|
| පොල් | .. | අක්කර 60* | ගෙඩි කඩාගෙන ඇත. |
| වැලි දොඩම් | .. | අක්කර 10 | පස සෝදායාම වැළැක්වීමට කානු කපා ඇත. 1973 මැයි මස පොල් වගාව යටතේ වවනු ලැබේ. |
| මඤ්ඤොක්කා | .. | අක්කර 8 | පොල් වගාව යටතේ වවා ඇත. |
| කෙසෙල් | .. | පැල 500 | පොල් වගාව යටතේ වවා ඇත. |
| එළවළු | .. | අක්කර 1 | පොල් වගාව යටතේ වවා ඇත. |
| අන්නාසි | .. | අක්කර 6 | තවම වගා කර නැත. |
| වෙනත් බෝග | | අක්කර 1 | ඉඟුරු, කහ ආදිය |

* පොල් වගාවේ හොඳම කොටස වන මෙය පුනරුත්ථාපනය කරගෙන යනු ලැබේ.

මූලාශ්‍රය: දම්බුලගේන සමූපකාර ජනාවාසයේ වාර්තා.

1973 දෙසැම්බර් අවසානය තෙක් වියදම රු. 33,000/- ක් පමණ වුවේය. නිෂ්පාදන විකිණීමෙන් ලද ආදායම රු. 4,000/- ක් පමණ විනි. ප්‍රධාන වශයෙන් මුදල් වැය වූ එක් කාරණයක් වූයේ (මුළු මුදලින් 65% ක් පමණ) සාමාජිකයින්ට දීමනා සහ අත්තිකාරම් ගෙවීමයි. 1973 ජනවාරි සිට ජූලි තෙක් දිනකට රු. 2/- බැගින්ද 1973 අගෝස්තු සිට ඔක්තෝබර් තෙක් දිනකට රු. 3/- බැගින්ද 1973 නොවැම්බර් සිට මෙතෙක් දිනකට රු. 3.50 බැගින්ද මෙම දීමනා ගෙවන ලදී. 1973 ජූනි මස සිට සමීක්ෂණයේ දින තෙක් ලෝක ආහාර වැඩ සටහන යටතේ ආහාර ද්‍රව්‍ය සාමාජිකයින්ට දෙනු ලැබිණි. 1973 අගෝස්තු තෙක් අය සහ වැය විස්තර සටහන V-18 හි දැක්වේ.

## <u>සටහන V-18</u> දම්පුලහේන – අය සහ වැය සටහන – 1973 ජනවාරි සිට අගෝස්තු

| අය | | වැය | |
|---|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අත්තිකාරම් .. | 23,500.00 | සාමාජික ජීවන වියදම් දීමනා .. | 10,154.50 |
| බෝග විකිණීමෙන් .. | 2,130.60 | රසායන ද්‍රව්‍ය සහ පොහොර .. | 1,395.65 |
| සාමාජික ගාස්තු .. | 850.50 | රෝපණ ද්‍රව්‍ය | 395.05 |
| වෙනත් අය .. | 649.06 | වැල් දොඩම් වගාව | 2,266.29 |
| | | කෘෂිකාර්මික උපකරණ | 1,986.85 |
| | | ගොඩනැගිලි සහ ලී බඩු | 1,219.36 |
| | | වෙනත් වියදම් | 876.29 |
| | | විවෘත කිරීමේ උත්සවය | 96.00 |
| | | උත්සව අත්තිකාරම් | 2,900.00 |
| | | වෙනත් අත්තිකාරම් | 1,852.02 |
| | | මුදල් සහ බැංකුවේ ශේෂය .. | 4,007.14 |
| එකතුව | 27,131.16 | එකතුව | 27,131.16 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

විධායක කමිටුව මාසයක් පාසා ගොවිපලෙහිදී රැස් වූ අතර වැඩ කණ්ඩායම් නායකයෝ සතිපතා රැස් වූහ. ආහාර සපයා බෙදාදීම සඳහා ආහාර කමිටුවක්ද පිහිටුවා තිබුණි. ව්‍යාපාර සංවිධායක ගොවිපලෙහි නැවති නොසිටියත් සතියකට දින තුනක් ගොවිපල පරීක්‍ෂා කිරීමට පැමිණියේය. රැස්වීම් පැවැත්වීම සඳහා සහ සාමාජිකයින් සමග පුහුණු සැසිවාර පැවැත්වීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නිලධාරීහු යටත් පිරිසෙයින් මසකට වරක්වත් ගොවිපලට පැමිණියහ.

### ශිල්පීය විශ්ලේෂණය

සෙරපිස් වතුයායෙහි මෙන්ම මෙහිද අත්‍යවශ්‍ය කාර්යය වූයේ පොල් ගස්වලට පොහොර දැමීමයි. සමීක්‍ෂණය පැවති කාලයේදී කොටසකට පමණක් පොහොර යොදා තිබුණි. ඇතැම්විට පොල් ගස් යට ඇති සෙවන නිසා වැල් දොඩම් වගාව මනාව වැඩී තිබුණේ නැත. පැරණි ගස් උගුල්ලා වෙනත් බෝගද තව අළුතින් පොල් පැළ සිටුවීම වෙනුවට පැරණි පොල් වගාව යටම පැළ සිටුවීමද ප්‍රවේශමෙන් අධ්‍යයනය කළයුතු කාරණයකි.

පොදුවේ සළකන කල දම්පුලහේන සංවර්ධන සැළසුම එහි ඉඩමේ හැකියාවන්ට මනාව අනුරූප වන බව පෙනී යයි. මෙම සැළැස්ම වරින්වර සමාලෝචනය කර අවශ්‍ය සැකසුම් කෙරේ නම් අපේක්ෂිත ඉලක්කය සාක්ෂාත් කර නොගැනීමට ඇති ගිල්පිය හේතුවක් නොපෙනේ.

## ආර්ථික විශ්ලේෂණය

සැළැස්මේ 3 – 5 වැනි වර්ෂයන්හි ලාභ අඩුවීම, වැල් දොඩම් වැඩියෙන් වගා කර මග හරවා ගතයුතු වුවත් අය සහ වැය ඉලක්ක සාධාරන බව පෙනී යයි. සැළසුම සමාලෝචනය කරනවිට පොල් වගාවෙහි පැහැදිලිවම දක්නට ලැබෙන පාඩුව පිළිබඳවද සළකා බැලිය යුතු වන්නේය. සමීක්ෂණය කරගෙන යනු ලැබූ අවදියෙහි අරමුදල් සැපයීමෙහි ලා පමාවක් නොතිබුණි. සෑහෙන ආදායමක් තවම ලැබී නැති අතර දෙවන වසරට පෙර එවැන්නක් අපේක්ෂා කලේද නැත.

වෙනස් වූ ඉඩම් ප්‍රතිපත්තිය හේතුකොටගෙන ශ්‍රම පලදායිතාවය ආරම්භක වශයෙන් පහත් තත්වයක පැවතුනද අනාගතය පිළිබඳව අවබෝධයක් ලබා දීමෙන් පසුව හා සාමූහික ප්‍රතිපත්තිය පිළි නොගන්නා වැඩි දෙනෙක් ගොවිපල අත හැර ගියායින් පසුව සාමාජිකයින් ඉටු කළ වැඩ කොටසෙහි සෑහෙන දියුණුවක් ඇති විය.

## පරිපාලනමය විශ්ලේෂණය

අපගේ නියැදියෙහි අනෙකුත් ගොවිපලවල් හා සසඳන කල පරිපාලනමය අංශය අතින් දම්පුලහේන උසස් තත්වයක පවතී. ආරම්භයෙහි සිටම කළමනාකරණයෙහි ලා සාමාජික සහභාගීත්වය වැඩි දියුණු කිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම අවධානයක් දැක්වූ හෙයින් එම ප්‍රයත්නයෙන් පැහැදිලිවම මහඟු ප්‍රතිඵල ලැබුණි:

I. විධායක කමිටුවෙහි වැඩි දෙනෙක් සමූපකාරයේ සාමාජිකයින් වීම නිසා සිය ආත්ම විශ්වාසය, ගොවිපල කෙරෙහි ඇති ඔවුන්ගේ බැඳියාව, මහන්සි වී වැඩ කිරීමට ඇති ඔවුන්ගේ උනන්දුව වැඩි වී ඇත. එසේම මෙම ක්‍රියාවලිය මුදල් භාවිතයෙහිදී හෝ වෙනත් කාර්යයකදී වගකීමෙන් තොරව කටයුතු කිරීමේ සම්භාවයකට තුඩු දුන් බවට සාධක නොමැත.

II. ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කර වැඩ කොටස් සහ ඉලක්ක නියම කිරීමේ කාර්යය අරභයා සිරිත් පරිදි රැස්වන නායකයින්ගෙන් යුත් වැඩ කණ්ඩායම්

ඇති කර ගැනීම සාමාජික බැඳියාව හා පලදායිතාවය වැඩි වීමට හේතු වී ඇත.1/

III. එසේම සාමාජිකයින් සමග එක්ව වැඩ කර ඔවුන් සමග එකට ආහාර ගනිමින්, සාමාන්‍ය ජීවිතයේදී සාමාජික ගැටළු පිළිබඳව සුහදව සාකච්ඡා කිරීමට ඉඩදී ප්‍රතිසංස්කරණ කොමිෂමේ නිලධාරීන් ගත් ක්‍රියා මාර්ගයද සාමාජිකයින්ගේ ආත්ම විශ්වාසය ප්‍රගුණ කිරීමට තුඩු දුන් අතර එනයින් ස්වයං-පාලන ක්‍රමයක අවශ්‍යතාවය සඳහා සාමාජිකයින්ගේ ලැදියාව වැඩි වී ඇත.

## සමාජයීය විශ්ලේෂණය

සෙරපිස් ගොවිපල පිළිබඳව වූ විස්තරයෙහි දැක්වෙන සමාජයීය සාර්ථකත්වය, රැකියා අවස්ථා ඇති කිරීම, සාමූහික ගොවිතැන, සමාජයීය සහ ආර්ථික සමානාත්මතාවය දම්පුලහේනෙහිදීද දක්නට ලැබිණ. විශේෂයෙන් සඳහන් කළයුතු කරුණු කිහිපයක්ද ඇත.

I. එක් සාමාජිකයෙක් හට අක්කර දෙක බැගින් වෙන් කර දීමට මුලින් දෙන ලද පොරොන්දුව පසුව වෙනස් කිරීම නිසා සාමාජිකයින්ගේ බලාපොරොත්තු කඩ වී මුල් අවදියෙහි ප්‍රගතියට බාධාවක් වූ බව පෙනී යයි. මෙම තත්වයෙන් බිඳක් දැනුදු පවතී. එහෙත් පෞද්ගලික බිම් කට්ටි ලබා ගැනීම සඳහා බලවත් ප්‍රයත්නයක් දැරූ සාමාජිකයින් ගොවිපල හැර යාම නිසා ඉතිරි සාමාජිකයෝ කලින් මෙන් නොව වඩාත් ඒකාබද්ධ ජනසමූහයක් බවට පත්ව තිබේ.

II. සමූපකාර ජනාවාසය පිහිටුවීම නිසා දම්පුලහේන වත්තෙහි තම ගවයින්ට තණ කැවීම, පොල් ගෙඩි කිහිපයක් රැගෙන යාම, වරින්වර සුළු රැකියාවන් ලබා ගැනීම ආදී වරප්‍රසාද අහිමි වන හෙයින් ජනාවාසය පිහිටුවීම සම්බන්ධයෙන් අසල ගම්වැසියෝ බොහෝ දෙනෙක් විරුද්ධත්වය දැක්වූහ. තරුණයින් ඉදි කළ නිවසට ගම්වැසියන් කිහිප දෙනෙක් විසින් 1973 මාර්තු මාසයේදී ගිනි තබනු ලැබිණි. නිවස නැවතත් වහාම ඉදි කරන ලද අතර ගම්වැසියන්ගේ විරෝධතාවය සමූපකාර ජනාවාසයේ යහපතට හේතු වූයේ සාමාජිකයින් අතර

---

1/ සෑම කෙනෙක්ම වෙහෙස මහන්සියෙන් වැඩ කළයුතු යැයිද, ඒ බවට වග බලා ගැනීම සියළු දෙනාගේම වගකීම වන්නේ යැයිද සාමාන්‍ය හැඟීමක් පවතී. කිසිවෙක් මහන්සි වී වැඩ නොකරන්නේ නම් කුමක් වන්නේදැයි අප ඇසූ පැනයට ඔවුන්ගේ පිළිතුර වූයේ "කම්මැලි අයට බැන වැදී මහන්සි වී වැඩ කිරීමට අපි ඔවුනට බල කරන්නෙමු" යන්නයි.

ඒකාබද්ධතාවය ඇති කිරීමටත්, ගොවිපල සාර්ථක කිරීමට දැඩි අධිෂ්ඨානයක් ඇති කර ගැනීමටත් එම විරෝධතාවය තුඩු දුන් නිසාය.[1/]

III. ගොවිපල සැළසුම් කිරීමට සහ සාමාජිකයින්ට උපදෙස් දීමට ප්‍රාදේශීය ග්‍රාමීය ආයතන සම්බන්ධ කරවා ගැනීමත්, සමූපකාරයේ සාමාජිකයින්, ශ්‍රමදාන, අවමඟුල්, ක්‍රීඩා උත්සව ආදී ගමේහි කොයෙකුත් කාර්යයනට සහභාගී වීමත් නිසා ගොවිපල හා අසල්වැසි ගම් අතර ඒකාබද්ධතාවය දැන් දියුණු වී ඇත.

### 5.3.3 කෝමැක්ඩ් සාමූහික ගොවිපල

පසුතලය

කෝමැක්ඩ් වතුයාය කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි අක්කර 375 ක් පමණ වන වතුයායක් වන අතර V-19 සටහනෙහි දක්වා ඇති පරිදි කොහොඹා, කරුඳුපොතු, කෝපි ආදී බෝග මිශ්‍ර වශයෙන් එහි වවා ඇත. මෙහි ඇති ගස් බොහොමයක් අවුරුදු 60 ක් පමණ පැරණි වන්නේය. මේවා දිගු කාලයක් තිස්සේ නොසලකා හැර තිබීහි. භූමියෙහි පස සෑහෙන්න සරු වුවත් තැනින් තැන සෝදාපාළුව ගොස් තිබේ. වත්තට ඇතුළුවීමේ මාර්ගය බෙහෙවින් අසතුටුදායකය. කොහොඹා සහ කරුඳුපොතු වියළීම සඳහා මනා සැකසුම් පහසුකම් වතුයායෙහි නොමැත.

කලින් මෙම වතුයාය පාලනය කරන ලද්දේ අසල්වැසි ගම් වලින් පැමිණ සේවය කල අනියම් කම්කරුවන් 30 ක් පමණ යොදවමිනි. මුරකරු සහ ඔහුගේ පවුල පමණක් වත්තෙහි පදිංචිව සිටියහ. කායයාමේ බිය නිසාත්, ගොඩනැගිලි ඉදි කිරීමට හැකි තැන්වල වතුර නොමැති නිසාත් පදිංචි වී සිටීමට මෙම වතුයාය සුදුසු නොවන්නේය යන පොදු හැඟීමක් පවතී. බංගලාවක්, කම්හලක් (පිළිවෙලින් රු. 23,000/- ක් සහ රු. 30,000/- ක් වටින්නේ යයි කලින් අයිතිකරු විසින් අගය කර ඇත.) හා කම්කරු ලැයිම් කාමර තුනක් තිබුනත් ඒවා බොහෝ කලකින් අළුත්වැඩියා කර නැත.

---

1/ තවත් කිසිවෙක් ගොවිපල අත්හැර යාවිදැයි සාමාජිකයින්ගෙන් ඇසූ විට ඔවුන් පැවසුවේ "අපි මෙතනින් ගියහොත් ගමේ මිනිස්සු අපිට හිනාවෙන නිසා තවත් කවුරුවත් ගොවිපල අත්හැර යන්නේ නැහැ" යනුවෙනි.

## සටහන V-19 නෝමැන්ඩි වතුයාය - කලින් ඉඩම් භාවිතය

| බෝගය | ප්‍රමාණය | සාමාන්‍ය නිෂ්පාදනය 1/ | නිරීක්ෂණ |
|---|---|---|---|
| කොකෝවා | අක්කර 168 | අක්කරයකට රු. 108 යි | බෙහෙවින් නොසලකා හැර ඇත. |
| කරදමුංගු | අක්කර 130 | අක්කරයකට රු. 18 යි | බෙහෙවින් නොසලකා හැර ඇත. |
| කෝපි | අක්කර 10 | ලැ.නැ. | ගම්මිරිස්ද අතරින් පතර වවා ඇත. |
| පොල් (කොකෝවා සමඟ) | අක්කර 10 | අක්කරයකට පොල් ගෙඩි 3,037 | සෑහෙන තත්වයක පවතී. |
| රබර් (කොකෝවා සමඟ) | අක්කර 10 | - | අත්හැර දමා ඇත. |
| කිතුල් | ගස් 100 | - | ගම්වැසියන් විසින් මදිනු ලැබේ. |
| කැලෑ | අක්කර 50 | - | - |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සහ පෞද්ගලික නිරීක්ෂණ

---

1/ නිෂ්පාදන සංඛ්‍යාලේඛන ලබා ගන්නා ලද්දේ අවුරුදු පහක් සඳහා(1967 - 1971) හිමිකරු විසින් ප්‍රකාශයට පත් කර තිබුණ වාර්තා අනුසාරයෙනි.

නෝමැන්ඩි වත්ත අනෙකුත් වතුයාය වලින් වට වී තිබේ. මෙය පිහිටා ඇත්තේද උග්‍ර ඉඩම් හිඟයක් පවතින පෙදෙසක නොවේ. කෙසේ වෙතත් මෙහි ඇති බෝග පුනරුත්ථාපනය කර ඇතැම් තැන්වල වැඩි ආදායමක් ලබාගත හැකි බෝග වගා කළහොත් අනාගතයේදී මෙම වතුයායේ සේවය කළ පිරිසට වැඩි පිරිසකට අඛණ්ඩ රැකියා අවස්ථාවන් හා වැඩි ආදායම් මාර්ග සැපයීමේ හැකියාවක් වත්තෙහි තිබේ.

### සාමූහික ගොවිපල ආරම්භ කිරීම

1973 අගෝස්තු සිට 1973 ජූලි මස තෙක් නෝමැන්ඩි වතුයාය කලින් හිමිකරුට ආපසු බදු දෙන ලද අතර 1973 ජූලි මාසයේදී එය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරා ගනු ලැබ සාමූහික ගොවිපලක් පිහිටුවීම සඳහා භාර දෙන ලදී. මෙම ගොවිපලෙහි සාමාජිකත්වය සඳහා පුද්ගලයින් සොයා ගැනීම මදක් දුෂ්කර විය. 1971 අප්‍රියෙල් කැරැල්ලෙන් පසුව නෝමැන්ඩි වතුයායේ සිටි පැරණි කම්කරුවන් එය "වේගුවේරා ව්‍යාපාරය" හා සම්බන්ධ කළ හෙයින් නව සමූපකාරයට බැඳීමට ඔව්හු උනන්දුවක් නොදැක්වූහ. නෝමැන්ඩි වතුයායෙහි කලින් පුහුණුව ලබමින් සිටි එක් තරුණයෙක් ගොවිපල පිහිටුවීමෙහි ලා මහත් උද්යෝගයෙන් කටයුතු

කළ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙනුවෙන් ගම් පුරා ඇවිද මෙම ව්‍යාපාරයට තරුණයින් බඳවා ගැනීමට උත්සුක වූයේය. මෙම තරුණයා පසුව සමූපකාර සමිතියේ සභාපති බවට පත් විනි.

1973 ජූනි මාසයේදී සාමාජිකයින් 13 දෙනෙක් සමිතියට බැඳුන අතර ජූලි මාසයේදී තවත් 22 දෙනෙක්ද සැප්තැම්බර් මාසයේදී තවදුරටත් 15 දෙනෙක්ද ව්‍යාපාරයට ඇතුළත් වූහ. ආරම්භයේදී අයදුම් කළ සියළුදෙනාම පිළිගනු ලැබිනි. පසුව තේරීම් කමිටුවක් පත් කර සිරිත් පරිදි (සටහන අ.5.3) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය කරනු ලැබුවද වතුයායෙහි කලින් වැඩ කළ අය නිරායාසයෙන්ම භාර ගන්නා ලදී. පළමුව පැමිනි සාමාජිකයෝ ප්‍රධාන වශයෙන් වයස අවුරුදු 18 – 30 ප්‍රමාණයේ වූහ. පසුව වඩාත් වයස්ගත පැරණි වතු කම්කරුවෝ සමිතියට බැඳුනහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් විවාහකයින් වන අතර කාන්තාවෝ නව දෙනෙක්ද වෙත්. සාමාජිකයින්ගේ පසුතලය පිළිබඳ සවිස්තර තොරතුරු සටහන අ.5.4 – අ.5.6 හි දැක්වේ.

සටහන V–20 හි දැක්වෙන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් සංවර්ධන සැළසුමක් සකස් කරන ලදී.

<u>සටහන V–20</u> <u>නේවැන්ඩ් – යෝජිත නිෂ්පාදන සැළැස්ම</u>

| බෝගය | ප්‍රමාණය | යෝජනාව |
|---|---|---|
| කරදමුංගු | අක්කර 130 | වල්පැල මර්දනය, පොහොර දැමීම සහ දියුණු සැකසුම් ක්‍රම ආදිය මගින් පුනරුත්ථාපනය කිරීම. |
| කෝපි | අක්කර 10 | පුනරුත්ථාපනය කර අතරින් පතර වවන <u>ගම්මිරිස්</u> ප්‍රමාණය වැඩි කිරීම. |
| පොල් | අක්කර 10 | වල්පැල මර්දනය, පොහොර යෙදීම හා අතරින් පතර වවා ඇති කොකෝවා ඉවත් කර <u>තණ</u> වැවීම. |
| රබර් | අක්කර 10 | උදුරා දමා <u>වැලි දොඩම්</u> වැවීම. |
| කොකෝවා | අක්කර 168 | ඇතැම් තැන් දියුණු කර, අනෙක්වා උදුරා <u>වැලි දොඩම්</u> ආදිය වැවීම. |
| කිතුල් | ගස් 100 | පැණි සඳහා ගස් මැදීම. |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

ඇස්තමේන්තුගත වියදම් සහ ආදායම් සටහන් V–21 දැක්වේ. සංවර්ධනය සඳහා වන වියදමින් වැඩි හරියක් සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවෙන් සහ රබර් පාලන දෙපාර්තමේන්තුවෙන් සහනාධාර වශයෙන් ලබා ගන්නේ යැයි අපේක්ෂා කරන ලදී. අවුරුදු හතරකින් ආපසු ගෙවීම සඳහා රු. 25,000/– ක ආරම්භක ණය මුදලක් ලබා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත අයැදුමක් ඉදිරිපත් කෙරිනි.

තෝරා ගනු ලැබූ සාමාජිකයින් හය දෙනෙකුගෙන් සහ පත් කරනු ලැබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුතුව විධායක කමිටුවක් පත් කරන ලදී. කුරුණෑගල සමූපකාර පරීක්ෂකවරයෙක් ආරම්භයේදී සමිතියේ සභාපති ලෙස පත් කරනු ලැබුවද පසුව ඔහු වෙනුවට තෝරා ගත් සාමාජිකයෙක් යොදවන ලදී. දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ ක්ෂේත්‍ර නිලධාරියෙක් (මෑතදී උපාධිය ලැබූවෙක්) ව්‍යාපාර සංවිධායක ලෙස පත් කරනු ලැබීය; ඔහු ගොවිපලේ පදිංචි වූවේය. දෛනික කළමනාකරන වැඩ වලින් බොහොමයක් සභාපති විසින් තෝරා ගත් ලේකම්ගේ සහාය ඇතිව ඉටු කරන ලදී. කෙසේ වෙතත් මූලදී පැමිණීම සහ ඵලදායීතාවය පහත් තත්වයක විය.

<u>සටහන V-21</u> <u>කෝමැන්ඩි – අය සහ වැය ඇස්තමේන්තු</u>

| කාරණය | වසර 1 | වසර 2 | වසර 3 | මියර 4 | වසර 5 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 1. <u>වැය</u> | | | | | |
| කරදමුංගු | 37,000 | 37,000 | 40,600 | 40,600 | 41,800 |
| පොල් | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 |
| කෝපි | 3,640 | 4,000 | 4,100 | 4,400 | 4,400 |
| කොකෝවා | 42,700 | 51,700 | 51,700 | 60,700 | 60,700 |
| වැල් දොඩම් | 37,515 | 9,600 | 11,350 | 11,940 | 9,940 |
| සාමාන්‍ය වියදම් | 6,000 | – | – | – | – |
| එකතුව | 129,055 | 104,500 | 109,950 | 119,840 | 119,040 |
| 2. <u>ආදායම</u> | | | | | |
| කරදමුංගු | 43,485 | 43,485 | 69,576 | 69,576 | 78,273 |
| පොල් | 5,000 | 5,000 | 6,000 | 7,000 | 8,000 |
| කෝපි | 3,360 | 5,040 | 6,720 | 10,080 | 10,080 |
| කොකෝවා | 53,400 | 80,100 | 106,200 | 160,200 | 160,200 |
| වැල් දොඩම් | 12,000 | 36,000 | 36,000 | 30,000 | 24,000 |
| එකතුව | 107,545 | 169,625 | 225,096 | 276,856 | 280,553 |
| 3. ශුද්ධ ලාභය | – 21,410 | +65,125 | +115,146 | +157,016 | +161,513 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

වෙනත් ප්‍රගතිය

1973 අග භාගයේදී මෙම පරීක්ෂණය කරගෙන යනවිට ගොවිපලෙහි සාමාජිකයින් 50 දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙක් අසල්වැසි ගම් වලින් පැමිණ වතුයායෙහි වැඩ කළ පැරණි කම්කරුවෝ වූහ. එක් පවුලක් පමණක් ස්ථිරවම වතුයායෙහි පදිංචිව සිටි අතර මුර වැඩ සඳහා අනෙක් සාමාජිකයෝ වරින් වර එහි නැවතුනහ. වැඩට පැමිණීම ක්‍රමයෙන්

දියුණු විනි. උදෑසන පෙරේට්ටුවකදී සභාපති සහ ලේකම් විසින් වැඩ බෙදා දෙන ලදී. වැඩ කළ එක් දිනකට රු. 3.50 බැගින් සියළුම සාමාජිකයින්ට සමාන මුදලක් ලැබුන අතර ගෙඩියක් ශත -/20 බැගින් අවු මුදලකට සතියකට පොල් ගෙඩි 10 ක් රැගෙන යාමට ඔවුනට දෙන ලදී.

කරන ලද වැඩ පිළිබඳ විස්තරයක් V-22 සටහනෙහි දැක්වේ. හැකි සෑම තැනකදීම ප්‍රමාණාත්මක අගයන් දක්වා ඇතත් බොහෝදුරට මෙම වැඩ කටයුතු මැනවින් අධීක්ෂණය කර හෝ වාර්තා කර හෝ නොමැත. කාර්ය සංවිධානය පිළිබඳ ස්ථිර ක්‍රමයක් නොමැතිකම හේතුකොටගෙන සාමාජිකයින්ගේ ශ්‍රම ඵලදායීතාවය හීන විනි.1/

**සටහන V-22 කෝමැන්ඩි - 1973 දෙසැම්බර් 31 තෙක් ප්‍රගතිය**

| කාර්යය | ප්‍රමාණය | සටහන් |
|---|---|---|
| කොකෝවා කජුපැදුරු හිරීම, වල් පැල මර්ධනය, ගෙඩි නෙලීම හා වියලීම | අක්කර 100 ක වල් පැල නෙලා ඇත. රාත්තල් 428 ක් කඩා වියලා ඇත. | තවම විකුණා නොමැත. |
| පොල් කැඩීම | රු. 981/- ක් ආදායම | ගෙඩිය ශත -/20 බැගින් සාමාජිකයින්ට විකුණන ලදී. |
| කරුඳුපොතු කැඩීම | රාත්තල් 1,986 ක් කඩා ඇත. | මෙතාට සකසා නැත. වෙළඳ පොලක් සොයනු ලැබේ. |
| කෝපි කැඩීම | අමු කෝපි රු. 4,908 ක් | තවම විකුණා නැත. |
| කිතුල් මැද පැණි සෑදීම | පැණි විකුණා රුපියල් 2,095/- උපයන ලදී. | කොන්ත්‍රාත් ගෙන වතුයාය සඳහා කලින් මෙම කාර්යය කළ සාමාජිකයෙකුගේ පරීක්ෂාව යටතේ කම්කරුවන් 6-12 ක් පමණ වැඩ කළහ. |
| ආහාර බෝග වගාව | අල සහ කෙසෙල් මැද වශයෙන් වගා කර ඇත. | දැනට ඇති ප්‍රධාන ආහාර බෝගය කෙසෙල් වේ. |
| පස සංරක්ෂණය හා මාර්ග | මඳකි. | සැළැස්මකට අනුව ඉටු කර නැත. |
| මුර වැඩ | දිනකට සාමාජිකයින් දෙදෙනෙකි. | මාරුවෙන් මාරුවට. |
| වෙනත් වැඩ | පූර්ණකාලීනව සාමාජිකයින් දෙදෙනෙකි. | සභාපති සහ ලේකම්. ඔවුන් වැඩ බෙදා දී ඇතැම්විට ක්ෂේත්‍ර වැඩ පරීක්ෂණය කරති. |

මූලාශ්‍රය: කෝමැන්ඩි සමූපකාරයේ සභාපති හා ව්‍යාපාර සංවිධායක.

---

1/ වැඩ කණ්ඩායම් සහ වැඩ සටහන් පසුව අනුගමනය කරන ලද බවත් ඉන් අනතුරුව ඵලදායීතාවය වැඩි වී ඇති බවත් වාර්තාගතය.

දෙසැම්බර් අවසානය වන තෙක් වියදම රු. 7,565/- ක් වූ අතර මෙම මුදල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් අත්තිකාරම් දෙන ලදී. නොවැම්බර් මස අවසානය වනවිට බෝග විකිණීමෙන් රු. 16,425/- ක ආදායමක් ලබා ඇතැයි සඳහන් වුවද එය V-22 සටහනෙහි දක්වා ඇති අස්වැන්න පිළිබඳ සංඛ්‍යා ලේඛන සමග නොසැඳේ. කෝමැන්ඩි කොවිපල සම්බන්ධයෙන් ලබා ගත හැකි ලියකියවිලි අප්‍රමාණවත් බව පෙනී යයි.

1973 ජූලි මස සිට දෙසැම්බර් මස තෙක් කාලය අතරතුර විධායක කමිටුව 11 වරක් රැස් වූවාය. සාමාජිකයින්ගේ සාමාන්‍ය රැස්වීම් හතක් පවත්වන ලද අතර මේවායින් ඇතැම් රැස්වීම්වලට සහභාගී වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නියෝජිතයෝ ව්‍යාපාරයේ පරමාර්ථයන් සාමාජිකයිනට පැහැදිලි කර දී ඔවුනට සාමාන්‍ය පුහුණුවක් ලබා දුන්හ.

## ශිල්පීය විශ්ලේෂනය

දිගු කලක් කෝමැන්ඩි වතුයාය නොසලකා හැර තිබූ හෙයින් බෝග වලින් වැඩි හරියක් පලදායී තත්වයක නොපැවතුනි. මේවා පුනරුත්ථාපනය කිරීම සඳහා පොහොර, වල්පැල මර්දනය, පස සංරක්ෂණය, මංමාවත් දියුණු කිරීම සහ ඇතැම් තැන්වල නැවත බෝග වැවීම ආදී කරුණු සම්බන්ධයෙන් විශාල ආයෝජනයක් අවශ්‍ය වනු ඇත. බෝග බොහොමයක් පල දැරීම සඳහා දිගු කාලයක් ගත වීම හා ඒවායේ අවිනිශ්චිත ලාභතාවය සහ දැනටමත් සමූපකාරය ණය බරින් පීඩිත සිටීම යන කරුණු හේතුකොටගෙන, ඉක්මනින් ආදායමක් ලබා ධන සම්පත් රැස් කිරීමේ පරමාර්ථය සඳහා කොකෝවා, කරදමුංගු, පොල්, කෝපි සහ කිතුල් ආදියෙන් ලබාගත හැකි උපරිම පල ලබා ගැනීමටත්, ආහාර බෝග සහ කෙටිකාලීනව ආදායම් ලැබිය හැකි වැල් දොඩම් වැනි වෙළඳ බෝග වැවීමටත් දැනී අනුගමනය කර ඇති ක්‍රියා මාර්ගය ඥානාන්විතය.

ප්‍රවර්තන මුදල් සම්පත් සහ වෙළඳපොල අපේක්ෂාවන් අනුසාරයෙන් ශිල්පීය සැළැස්ම වසරකින් හෝ දෙකකින් සමාලෝචනය කළ හැක.

## ආර්ථික විශ්ලේෂනය

කොකෝවා සහ කරදමුංගු වගාවන් නොසලකා හැර තිබී නිසා ඒවායින් ලබා ගත හැකි යයි V-18 සටහනෙහි දක්වා ඇති ඇස්තමේන්තුගත ආදායම් එතරම් යථාර්ථ නොවන්නා සේ පෙනේ. සමූපකාරයේ මුදල් තත්වය වැඩි දියුණු වී බෝගවල ආදායම් ලබා ගත හැකි තත්වය නිශ්චිත බවට පත්වන තෙක් යෝජිත ඇතැම් ආයෝජන පමා කිරීම වැඩදායක විය හැක.

තවත් වැදගත් හේතුවක් වනුයේ, සම්මුඛ පරීක්ෂණයට යොමු කළ සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ මතයට අනුව ශ්‍රම පලදායිතාවය පහත් මට්ටමක තිබීමයි. ආර්ථිකමය

වශයෙන් ගත යුතු පියවර දැනටමත් ගෙන ඇති හෙයින්[1] මෙම ප්‍රශ්නය විසඳීමෙහි ලා සමාජයීය හා පරිපාලනමය වශයෙන් කටයුතු කළ යුතුව ඇත.

### පරිපාලනමය විශ්ලේෂණය

දම්මුලගේන ගොවිපල මෙන් නෝමැන්ඩි ගොවිපලද ස්වයං-පාලනය කරා සැලකිය යුතු පියවරක් පෙරට තබා ඇත. නව දෙනෙකුගෙන් යුත් විධායක කමිටුවට සමුපකාරයේ සාමාජිකයින් වැඩි දෙනෙක් අයත් වූ අතර බැහැරින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනා නොමැතිවත් එය නිතර රැස් වූවාය. සම්මුඛ පරීක්ෂණයට යොමු කළ ගොවීන්ගෙන් කිහිප දෙනෙක්ම කමිටුවෙහි බැහැර අය සිටින බව නොදත් අතර ඔවුන් කමිටුවට අයත්ව සිටීමද අනවශ්‍ය බව අදහස් කළහ.

සෑම අතින්ම මෙම තත්වය අතිශයින් සතුටුදායක වුවත් නෝමැන්ඩි වතුයාය සම්බන්ධයෙන් ඇතැම් අන්තරායකාරී තත්වයන් පවතින බව පෙනී යයි.

I. සමුපකාර නායකයින් ඔවුන්ගේ කාර්යයන් සඳහා මැනවින් පුහුණුකම් ලැබුවද[2] බැහැරින් ලැබෙන සහාය නොමැතිව ඔවුනට කළ නොහැකි ඇතැම් දේවල්ද ඇත. නිපැයුම් සඳහා වෙළඳ පොළවල් සොයා ගැනීම, ශිල්පීය සේවාවන් ලබා ගැනීම ආදිය ඒවායින් සමහරකි. ස්වයං-පාලනය සම්බන්ධයෙන් පුහුණුවක්ද අවශ්‍ය වන්නේය. මෙම පුහුණුව ලැබුනත්, සමුපකාර සාමාජිකයින් ස්වාධීනව කටයුතු කිරීමට උත්සාහ කරන බව අවබෝධ කර ගත් රජයේ නිලධාරීනු ප්‍රමාණවත් සහායක් හෝ මාර්ගෝපදේශකත්වයක් සමුපකාර සාමාජිකයින් හට නොදීමට නැඹුරුතාවයක් දක්වන බව පෙනී යයි.

II. කළමණාකරන කාර්යයට සම්බන්ධ වී ඇති සාමාජිකයින්ගේ සංඛ්‍යාව අල්ප බව පෙනී යයි. සභාපති විසින් වැදගත් වැඩ කොටසක් ඉටු කළ විධායක කමිටුව හැරුණු විට ස්ථිර වැඩ කණ්ඩායම් හෝ වැඩ කණ්ඩායම් නායකයින් නොවීය. පැරණි සාමාජිකයින් වැඩි දෙනෙක් පැවසුවේ කළමණාකරනය පිළිබඳව

---

1/ රු. 3.50 ක දෛනික යැපීම් දීමනාව, සාමාජිකයෝ සමුපකාරයට බැඳීමට පෙර උපයා ගත් සාමාන්‍ය මාසික ආදායම මෙන් දෙගුණයකට ආසන්නය. තවදුරටත් මෙය වැඩි කිරීම තවම සාධාරණ නොවේ.

2/ සභාපති සහ ලේකම් යන දෙදෙනාම ජ්‍යෙෂ්ඨ සමතුන් වෙති. සභාපති, කලින් සඳහන් කළ පරිදි වතුයායේ පුහුණුව ලැබූ කොන්දොස්තර කෙනෙක් වන අතර ලේකම් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද ස්වයං-පාලන යෝජනා ක්‍රමයකදී පුහුණුව ලබා ටික කලක් ග්‍රාම සංවර්ධන සමිතියක සභාපති ලෙස කටයුතු කර ඇත.

ඔවුන් සැළකිල්ලක් නොදක්වන බවය. ඔවුහු එම කාර්‍ය්‍ය සහාපති සහ ලේකම්ට පවරත්. ප්‍රවීනත්වයෙහි උසස්භාවයක් හෝ බලතල අනිසි ලෙස භාවිතා කිරීමක් පිළිබඳ සාක්ෂි නැතත් පරිපාලනමය කාර්‍ය්‍යයෙහි ලා සාමාජිකයින් වැඩි දෙනෙක් සහභාගි වන්නේ නම් ඔවුන්ගේ බැඳියාව පිළිබඳ හැඟීම සහ පලදායීතාවය වැඩි වන බව පැහැදිලිය. තේරූ ගත් නායකයින්ගෙන් යුත් සජීර වැඩ කණ්ඩායම් නිර්මානය කිරීමෙන් හා මුදල් කටයුතු සහ සැපයුම් සඳහාද සුභ සාධන කටයුතු සඳහාද වෙනත් කමිටු තේරූ පත් කර ගැනීමෙන් මෙම කාර්‍ය්‍ය සපුරා ගත හැක.

## සමාජයීය විශ්ලේෂණය

සේවා නියුක්ති අවශ්‍යතාවයන් සැපයීම, සහයෝගීතාවය සහ සමානත්මතාවය ආදී කරුණු වලින් සමාජයීය වශයෙන් ලබා ඇති දියුණුව සෙරපිස් ගොවිපලෙහි සහ දම්මුලගේන ගොවිපලෙහි ලබා ඇති දියුණුවට සමාන කළ හැක. කෙසේ වෙතත් ආර්ථික සහ පරිපාලනමය විශ්ලේෂකවලදී මතු වූ කරුණු සසාට කරමින් ඇතැම් සමාජයීය ගැටළු උද්ගතව ඇත.

I. ජනාවාස සමාජය තුළ ඇතැම් බෙදීම් දක්නට ඇත. ඇතැම්විට විවිධ කණ්ඩායම් මෙම ගොවිපල සඳහා තෝරා ගනු ලැබූ ආකාරය අනුව මෙම බෙදීම් උද්ගත වූ බවක් පෙනී යයි. පළමුවෙන්ම ජනාවාසයට බඳවා ගනු ලැබූ තරුණයෝ වතුයායෙහි හිමිකරුවන්ය යන හැඟීම ඇති කර ගත් අතර පසුව පැමිණි වැඩිහිටි සාමාජිකයෝ කලින් මෙන්ම කම්කරුවන් ලෙස වැඩ කළහ. ඔවුන්ගෙන් ඇතමෙක් විශේෂයෙන් වැඩිහිටි කාන්තා පක්ෂය කියා සිටියේ තරුණයින් වැඩ කිරීමට කම්මැලිකමක් දක්වන බවය. තරුණයින් මෙවිට පැවසුවේ "කාන්තාවන් ෆැක්ටරියෙහි වැඩ කිරීමට විශාල කැමැත්ත දක්වන්නේ එහි වැඩ කිරීම ලෙහෙසි නිසාය," යනුවෙනි. පැරණි සාමාජිකයින් බොහෝ දෙනෙක් නව ජනාවාසය පිළිබඳ වැරදි අවබෝධයක් ලබා ඇතැයි ඇතැම් තරුණයෝ පැවසුවෝය. "ඔවුන් අප පහත් කොට සලකන අතර නොයෙක්වා සකස් කිරීම ආදිය ගැන අපට කියා දීමට උනන්දු වෙන්නෙ නෑ". විවිධ සාමාජික කණ්ඩායමක් තුළින් සමූපකාර ජනාවාසයක් ආරම්භ කිරීමේදී ඇති වන ගැටළු මෙම කරුණු වලින් පැහැදිලි වේ.

II. සමූපකාරයේ සාමාජිකයින් වැඩි දෙනෙක් අසල්වැසි ගම්වල වාසය කරනත් ජනාවාසයේ ජන සමූහය සහ අසල්වැසි ගම් අතර ඇතැම් විරෝධතා ඇති බව පෙනී යයි. මෙම විරෝධතාවය උද්ගතව ඇත්තේ ජාතික විමුක්ති පෙරමුණේ ඇතැම් අය විසින් එවකට වතුයාය අත් පත් කර ගැනීම නිසාය. ගම්වැසියෝ පැවසුවේ එම සමූපකාරය විසින් අළුත් කිසිම වැඩක් නොකරන බවත් එහෙයින් එය සාර්ථක නොවන බවත්ය. (සාමාජිකයින් ඇතමෙක්ද මෙසේම ප්‍රකාශ කළහ) ඔවුහු තවදුරටත් පැවසුවේ සමූපකාරය සතු පැණි

ආදිය සාමාජිකයින් විසින් සොරකම් කරනු ලැබෙන බවයි. සාමාජිකයෝ අනෙක් අතට පැවසුවේ ගම්වැසියන් විසින් සමූපකාරයේ පොල් සොරකම් කරනු ලැබෙන බවය. මෙම ජන සමූහ දෙක ඒකාබද්ධ කිරීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් දැරිය යුතු බව පෙනී යයි.

III. සාරික වූ කරුණු පිළිබඳව සළකා බලන කල සමූපකාරයේ සාමාජිකයින්ගේ විශේෂයෙන් තරුණ සාමාජිකයින්ගේ නිවැරදි දෘෂ්ටිය පිළිබඳ හැඟීම උසස් තත්වයක පැවතුනි. සමූපකාරයට බැඳීමට ඕනෑ කළේ මන්දැයි එක් අයෙකුගෙන් ඇසූ විට ඔහුගේ පිළිතුර වූයේ "මම ගොවිතැන් කටයුතු ගැන සැලකිල්ලක් දක්වනවා. ඒ වගේම මෙහිදී මාව කම්කරුවෙක් හැටියට සළකනු ලබන්නේ නැහැ." කවර හෝ හේතුවක් නිසා ගොවිපල අත්හැර යන්නේදැයි ඇසූ විට බොහෝ දෙනෙක් කියා සිටියේ "මෙය අපේ බිමයි. ඒ නිසා කවදාවත් එය අත්හැර යන්නේ නැහැ" යනුවෙනි.

ඇතැම් බාධක සහ අඩුපාඩුකම් මධ්‍යයේ වුවද, ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය සම්පාදනය කළ අවස්ථාවේදී අපේක්ෂා කළ යථාර්ථ වූ සමාජයීය පරිවර්තනය සඳහා හැකියාවන් නෝමැන්ඩි සාමූහික ජන සමූහය තුළ ඇති බව ඉහත සඳහන් කරුණු වලින් ඔප්පු වේ. එහෙත් පරිවර්තනයක් සහ සංවර්ධනයක් සඳහා මෙම හැකියාවන් සක්‍රීය කර ගැනීමට නම් ඉතාමත් ප්‍රවේසමෙන් මෙන්ම අඛණ්ඩ ස්වරූපයකින් මාර්ගෝපදේශකත්වය හා පුහුණුව ලබා දිය යුතුය.

## 5.3.4 යැරෝ සාමූහික ගොවිපල

පසුතලය

යැරෝ වතුයාය මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල කොට්ඨාශයේ අක්කර 414 කින් යුත් තේ වත්තකි. වතු යායෙන් අක්කර 53 ක් කලින් අයිතිකරු විසින් තබා ගන්නා ලද අතර අක්කර 361 ක් සාමූහික ගොවිපල සඳහා ඉතුරු වුනි. මෙහි බිම බෑවුම් සහිත සහ ගල් වලින් යුක්ත වන අතර පස සංරක්ෂණය සඳහා කලින් ප්‍රමාණවත් පරිදි කානු කපා තිබුනි. තේ පඳුරු අවුරුදු 50 සිට 100 දක්වා වයස වන අතර වතුයාය අත් පත් කර ගත් අවස්ථාවේදී අවුරුදු 6 – 15 දක්වා පමණ කාලයක් තුළ ඒවා කප්පාදු කර හෝ වල් පැල මර්ධනය කර හෝ පොහොර යොදා හෝ නොතිබුණේය. අක්කර 10 ක් පමණ වන ප්‍රමාණයක වී වපුරා ඇති අතර අක්කර 62 ක් පමණ පතන ඉඩම් වේ.

මෙම වතුයායෙහි විශාල තේ කම්හලක්, කාර්යාලයක්, නිලධාරින් සඳහා නිවාස සහ කම්කරු ලැයිම්කිද ඇත. එහි ඇති බංගලාව කලින් අයිතිකරු ලබා ගත්තේය. කලින් මෙම වතුයාය 130 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සහ දිනකට 150 – 250 ක් පමණ වූ ශ්‍රම හමුදාවක් මගින් පාලනය කරනු ලැබීන. කම්කරුවන් 200 ක් පමණ වතුයායෙහි පදිංචිව සිටි පුරවැසි නොවන්නන් වූහ. පුරවැසියන් 50 – 75 ක් පමණ, වතුයාය අසල වූ ගමක් වන මල්ගම සිට දිනපතා වැඩට පැමිණියහ.

වතුයාය අත් කර ගනු ලැබූ අවස්ථාවෙහි තේ ගස් වලින් තේ දළු නෙළීම පුළුල් ලෙස කරගෙන යනු ලැබුවත් වතුයායේ දියුණුව සඳහා ප්‍රති ආයෝජනයන් කිසිවක් නොකරනු ලැබිණ. ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව සාමාන්‍ය වාර්ෂික ආදායම අක්කරයකට සකස් කළ තේ රාත්තල් 400 ක් පමණ වූ අතර මෙය, මුළු වතුයාය පිළිබඳව සලකන කළ මසකට සාමාන්‍යයෙන් අමු තේ රාත්තල් 10,000 කි. දිනකට අමු තේ රාත්තල් 6,000 ක් නිෂ්පාදනය කිරීමට (සකස් කළ තේ රාත්තල් 1,500 යි) කම්හලට හැකියාව ඇත. මෙම කම්හලෙහිදී නිෂ්පාදනය කිරීම සඳහා අසල්වැසි සුළු වැවිලි කරුවන්ගේ වතු වලින් සහ අනිකුත් වතුයාය වලින් තේ කොළ ගෙන එනු ලැබීය. කලින් අයිතිකරු කියා සිටි අන්දමට වතුයායෙහි සාමාන්‍ය ආදායම පසුගිය පස් අවුරුදු කාලය තුළ අවුරුද්දකට රු. 2,50,000/- ක් පමණ විය.

යැරෝ වතුයාය අවට පෙදෙසෙහි උග්‍ර ඉඩම් හිඟයක් හා තියුණු රැකියා හිඟයක් දක්නට ලැබේ. මෑත කාලයේදී වතුයාය පිරිහීම හේතුකොටගෙන රැකියා හිඟය උග්‍ර තත්වයකට පත්ව ඇත. යැරෝ වතුයාය රජයට පවරාගෙන අසල්වැසි ජනතාවගේ සුභසිද්ධියට හේතු වන පරිදි වඩාත් ඵලදායී අයුරු පාලනය කළයුතු යයි, ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය සම්මත වීමට පෙර පවා එම ප්‍රදේශයේ ගම්වැසියන් හා ප්‍රාදේශීය නායකයින් අතර තදබල හැඟීමක් පැවතුනි.

සාමූහික ගොවිපල ආරම්භ කිරීම

1973 ඔක්තෝබර් මාසයේදී මෙම වතුයාය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට පැවරුණි. ඊට මාස අටකට පමණ කලින් මෙම වතුයායෙහි ආරම්භ කිරීමට අදහස් කෙරුණු සාමූහික ගොවිපලේ සාමාජිකත්වය සඳහා ගම්පොල ඡන්ද කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් අයදුම් පත් කැඳවන ලදී. 1973 ඔක්තෝබර් මස 06 වන දින වන තෙක් කාර්යය ආරම්භ නොකෙරුණද, සමූපකාර සමිතිය 1973 පෙබරවාරි මස 02 වන දින ලේඛන ගත කරන ලදී.

මෙම සමූපකාර සමිතියේ සාමාජිකයින් වශයෙන් මල්ගමින් 85 දෙනෙක් පමණ තෝරා ගන්නා ලදින් මොවුන් අතුරින් ඇතැම් අය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් පත් කරන ලද තරුණයින් වූහ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් කලින් අනියම් කම්කරුවන් වශයෙන් යැරෝ වතුයායෙහි සේවය කළ සුළු ගොවියන් හා ඉඩම් නොමැති කම්කරුවන් වූහ. සමූපකාරයේ සාමාජික ගාස්තුව වන රු. 13.50 ඔවුන් විසින් ගෙවනු ලැබිය යුතු බවත් අනතුරුව එම වතුයාය ඔවුන් සතු භූමියක් ලෙස ඔවුන් විසින් සංවර්ධනය කරනු ලැබිය යුතු බවත් ඔවුනට අවබෝධ කර දෙන ලදී. සිය නිවාස ඉදි කර ගැනීම සඳහා අක්කර 1/4 ක් ඔවුනට ලැබෙන අතර කලින් මෙන් ඉදිරියටත් එහි කම්කරුවන් වශයෙන් සේවය කරන පුරවැසි නොවන අය සමඟ ඔවුනට වැඩ කිරීමට සිදු වනු ඇත. කලින් සිටි කළමනාකරුවන් තවදුරටත් එහි නොසිටින බවත් සාමාජිකයින් විසින්ම වතුයාය පාලනය කිරීමට හැකියාවක් ලබන තෙක්, රජය විසින් අළුතින් පරිපාලකවරුන් සපයනු ලැබෙන බවත් ඔවුනට පවසන ලදී. (සටහන අ.5.3 බලන්න)

V–23 සටහනෙන් දක්වන පරිදි තේ වගාව දියුණු කිරීම සඳහා සහ බෝග විවිධාංගකරණය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් සංවර්ධන සැළැස්මක් සකස් කරන ලදී.

**සටහන V–23 සැරෙයි ගොවිපල – යෝජිත සංවර්ධන සැළැස්ම**

| ව්‍යාපාරය | අක්කර ප්‍රමාණය | යෝජිත සැළැස්ම |
|---|---|---|
| තේ පැල .. .. | 250 | අවුරුදු 5 ක කාලසීමාවක් තුළ පුනරුත්ථාපනය |
| වී.පී. තේ .. .. | 50 | අවුරුද්දකට අක්කර 10 බැගින් නැවත සිටුවීම |
| ගම්මිරිස් – තනිකර වැවීම .. | 1 | ආර්ථිකමය ලාභයක් නැති තේ ඇති පෙදෙස්වල වැවීම |
| ගම්මිරිස් – වෙනත් බෝග අතර වැවීම | 250 | තේ අක්කරයක් ඇතුළත සෙවන ඇති ගස් යට වැල් 15 බැගින් වැවීම |
| කරාබු .. .. | 8 | ආර්ථිකමය ලාභයක් නැති තේ ඇති පෙදෙස්වල වැවීම |
| වී .. .. | 15 | දැනට ඇති අක්කර 10 දියුණු කර තවත් අක්කර 5 ක් අස්වැද්දීම |
| තණ .. .. | 25 | පතන බිම් තණ භූමියක් කිරීම |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

මෙම සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම සාමාන්‍යයෙන් වර්ෂයකට රු. 2,20,000/– ක් පමණ විය. මෙම මුදල තේ විකිණීමෙන් සහ බෝග විවිධාංගකරණ සඳහා ලබා ගත හැකි සහන ආධාර වලින් පියැවේ. අවුරුදු පහක කාලයක් තුළදී ගෙවීම සඳහා රු. 50,000/– ක ණය මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් අයැදුම් කෙරිණි. විස්තර V–24 සටහනෙහි දැක්වේ.

## සටහන V-24 ඇරෝ ගොවිපල – ඇස්තමේන්තුගත වැය සහ අය

| කාරණය | වසර 1 රු. | වසර 2 රු. | වසර 3 රු. | වසර 4 රු. | වසර 5 රු. |
|---|---|---|---|---|---|
| 1. වැය | | | | | |
| තේ පැළ | 175,250 | 175,150 | 177,900 | 165,150 | 162,050 |
| වී.පී. තේ | 17,500 | 17,500 | 27,500 | 30,000 | 32,500 |
| කරාබු | 4,000 | 1,200 | 2,800 | 1,200 | 1,200 |
| ගම්මිරිස්-වෙනත් බෝග අතර වැවීම | 7,500 | 9,000 | 3,000 | 3,000 | 3,000 |
| ගම්මිරිස්-තනිකර වැවීම | 1,789 | 272 | 445 | 751 | 1,123 |
| වී | 17,500 | 15,000 | 15,000 | 15,000 | 15,000 |
| එකතුව | 223,539 | 219,122 | 221,645 | 215,101 | 214,873 |
| 2. අය | | | | | |
| තේ | 224,640 | 257,600 | 264,000 | 252,000 | 256,000 |
| ගම්මිරිස් | - | - | - | 16,710 | 44,370 |
| වී | 21,600 | 21,600 | 21,600 | 21,600 | 21,600 |
| එකතුව | 246,240 | 279,200 | 285,600 | 290,310 | 321,970 |
| 3. ශුද්ධ ලාභය | 22,701 | 60,078 | 63,955 | 75,209 | 107,597 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

සමීක්ෂණය කළ අවස්ථාවෙහි (1974 ජනවාරි 2, 3) සමූපකාරයෙහි සාමාජිකයෝ 73 දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් 20 ක් කාන්තාවෝ වූහ. පුරුෂයින් 20 දෙනෙක් සහ කාන්තාවන් 10 දෙනෙක් කලින් ඇරෝ වතුයායෙහි කම්කරුවන් ලෙස සේවය කර තිබුණි. සාමාජිකයින්ගෙන් 62% දෙනෙක් පමණ විවාහක අය වූහ. ඔවුන්ගේ සාමාන්‍ය වයස් ප්‍රමාණය අවුරුදු 34 ක් වුණි. එක් අයෙක් හැර සියළු දෙනාම වතුයායෙහි සිට සැ. 1/2 ක් පමණ දුරින් පිහිටි මල්ගම පදිංචිව සිටියහ. සාමාජිකයින්ගේ අධ්‍යාපනය, කලින් ලද අත්දැකීම් ආදිය පිළිබඳ විස්තර අ.5.4 සහ අ.5.6 සටහන්හි දැක්වේ.

ඊට අමතරව පුරවැසියන් නොවන්නන් 100 – 120 දෙනෙක් වතුයායෙහි කම්කරුවන් ලෙස ඉදිරියටත් සේවය කළහ. සාමාජිකයින් මෙන්ම කම්කරුවන්ටද එකම දෛනික වැටුපක් ගෙවන ලදී. (පිරිමි – රු. 4.14 යි. ගැහැණු – රු. 3.14 යි) පරිපාලකවරුන් 30

දෙනෙක් සහ කංකානම්වරුන් 4 දෙනෙක් යටතේ 40 දෙනෙක් පමණ වන කණ්ඩායම් වලින් යුතුව සමිතිය එකට වැඩ කළහ. කංකානම් වරුන්ගෙන් පස් දෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් කලින් තෝරා ගනු ලැබූ කරුණයින් වූහ. උපවසම වකුගයක කලින් සේවය කළ අධිකාරී වරයෙක් සහ ක්ෂේත්‍ර නිලධාරියෙක් මෙම වකුගයෙහි වැඩ බෙදා දී ක්ෂේත්‍ර වැඩ කටයුතු පාලනය කළහ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් පත් කරන ලද ව්‍යාපාර කළමනාකරු එහි කටයුතු කලේය.

වතුයාය අත් කර ගැනීමෙන් පසුව වැඩි කරන ලද ශ්‍රම යෙදවුම් නිසා සැලෙන දියුණුවක් ඇති වී තිබේ. පළමු මාස තුන තුළ කරන ලද වැඩ V-25 සටහනෙහි දැක්වේ. කායික තත්වය සහ ශ්‍රම නිපැයුම උසස් මට්ටමක පවතින සේ පෙනී යයි.

සටහන V-25 ගැරෝ හෙවිපල - කරන ලද වැඩ - 1973 ඔක්තෝබර්-දෙසැම්බර්

| කාර්යය | ප්‍රමාණය | මිනිස් දින ගණන | මසකට සාමාන්‍ය මිනිස් දින ගණන |
|---|---|---|---|
| වල් නෙලීම | අක්කර 199 | 5,049 | 1,683 |
| කප්පාදු කිරීම | අක්කර 99 | 936 | 312 |
| තේ දළු නෙලීම | අක්කර 10-15/දිනකට 1/ | 2,109 | 703 |
| දර කැපීම | අක්කර 278 | 500 | 167 |
| වල් මර්ධනය | අක්කර 149 | ලැ.නැ. | ලැ.නැ. |
| කානු සහ පාර | අඩි 300 | ලැ.නැ. | ලැ.නැ. |

මූලාශ්‍රය: ගැරෝ සමූපකාර සමිතියේ වාර්තා

පළමුවෙනි තෙමස තුළ වියදම රු. 61,000/- ක් විය. මෙයින් වැඩි හරියක් වැය වූයේ කම්කරුවන්ට වැටුප් ගෙවීමට සහ වතුයයට පිටතින් තේ කොළ මිලදී ගැනීමටය.2/ ආරම්භක ප්‍රාග්ධනය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් ලැබූ රු. 43,332/- කින් සහ 1973 නොවැම්බර් මාසයේදී ලැබුණු රු. 25,000/- ක බැංකු ණය මුදලකින්ද සමන්විත වූහ.

---

1/ මාස තුනක කාලයක් තුළ නෙලූ තේ දළුවල සම්පූර්ණ බර ප්‍රමාණය රාත්තල් 43,353 කි. නැතහොත් මසකට සාමාන්‍යයෙන් රාත්තල් 14,431 කි. මෙයින් පෙනී යන්නේ සාමාන්‍යයෙන් තේ දළු නෙලූ ප්‍රමාණය මිනිස් දින ගණනකට රාත්තල් 20 කට මඳක් වැඩි වූ බවය. වතුයාය අත් කර ගත් අවස්ථාවේදී පැවති අයහපත් තත්වය හේතුකොටගෙන මෙය සිදු වූ බව පැහැදිලිය.

2/ සාමාන්‍යයෙන් මසකට රාත්තල් 32,777 ක් රාත්තල ශත -/20 ගණනේ මිලට ගන්නා ලදී.

ඔක්තෝබර් සහ දෙසැම්බර් කාලය අතරතුර තේ රාත්තල් 32,665 ක් සකස් කරන ලද අතර මේ සඳහා රාත්තලකට රු. 2.03 බැගින් ලැබුණි. 1974 ජනවාරි මාසයෙන් අවසාන වූනු කාලසීමාව සඳහා අය සහ වැය විස්තර V-26 සටහනෙහි දක්වා ඇති පරිදි වේ.

<u>සටහන V-26</u> සැරෝ ගොවිපල - අය වැය සටහන - 1973 ඔක්තෝබර් සිට 1974 ජූලි තෙක්

| අය | රු. | වැය | රු. |
|---|---|---|---|
| තේ අපනයනය (රාත්තල් 16,420) | 33,154.85 | වෙක්රෝල් ගෙවීම | 60,926.76 |
| දේශීය වශයෙන් විකිණීමෙන් (රාත්තල් 1,132) | 2,237.00 | සේවක මණ්ඩල වැටුප් | 4,560.00 |
| සේවකයින්ට සහනාධාර (රාත්තල් 680) | 397.80 | මිලයට ගත් කොළවල වටිනාකම | 35,115.13 |
| තොග (රු. 25,061) | 50,122.00 | තේ පෙට්ටි සඳහා වියදම | 4,183.00 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අත්තිකාරම (ඉතිරි) | 25,108.46 | කම්හල අළුත්වැඩියා කිරීම | 2,108.55 |
| | | ඉන්දන | 488.98 |
| | | ලියකියවිලි | 209.35 |
| | | පොහොර | 85.00 |
| | | බැංකු ගාස්තු | 57.83 |
| | | ප්‍රවාහනය | 333.31 |
| | | විවිධ | 2,948.40 |
| එකතුව | 111,019.31 | එකතුව | 111,019.31 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

පරිපාලක කාර්ය මණ්ඩලය තැරෙන්නට, මුදල් කටයුතු පාලනය කිරීම සඳහා සහ සැලසුම් හා ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සමූපකාර සමිතියේ විධායක කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටුව සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් යුක්ත වූවාය. එක් සාමාජිකයෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම නියෝජනය කළ අතර අනෙක් අය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් නම් කරන ලද ගම්පොල ප්‍රදේශයේ පුද්ගලයින් වූහ. මෙම කමිටුව මසකට දෙවරක් හෝ තෙවරක් වතුයායෙහි රැස් වුණි. සමූපකාරයේ සාමාජිකයින් හට කළමනාකරණ කාර්ය භාරයෙහි ලා සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කිරීමට හැකි බව අවබෝධ වන තෙක් ගනු ලැබූ තාවකාලික ක්‍රියාමාර්ගයකි, මෙම කමිටුව ඇති කිරීම.

අනතුරුව, සාමාජිකයින්ගේ සුභසාධනය ආදී කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මාසිකව රැස් වූ සාමාජිකයින් සය දෙනෙකුගෙන් සමන්විත කාරක මණ්ඩලයක්ද විය. ප්‍රමුඛතා

කටයුතු, ක්‍රීඩා කටයුතු සහ ප්‍රසාධන කටයුතු උදෙසා කමිටු පත් කර තිබුනද මෙම කමිටු තිබූ බවක් සාමාජිකයින් බොහෝ දෙනෙක් දැන සිටියේ නැත. ගොවිපල කළමනාකරණ කටයුතුවල ඔවුහු උනන්දුවෙන් සහභාගී නොවූ බවක් මෙයින් හැඟේ.[1]

සමූපකාරයේ පරමාර්ථ, කළමනාකරණ ක්‍රමය, ගණන් තැබීම සහ තේ වගාව ආදී කටයුතු පිළිබඳව සාමාජිකයින්ට අවබෝධයක් ලබාදීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම නොවැම්බර් මාසයේදී දෙදිනක පුහුණුවීමේ පාඨමාලාවක් ආරම්භ කළාය. මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වූ බව පැහැදිලි වුවත් තවදුරටත් පුහුණුව ලබා දීම සඳහා කටයුතු කර නොමැත.

## ශිල්පීය විශ්ලේෂණය

ගැරෝ වතුයාය පුනරුත්ථාපනය කිරීම සඳහා සැළකිය යුතු ප්‍රමාණයක ශ්‍රමය සහ ප්‍රාග්ධනය ආයෝජනය කළයුතු වන්නේය. වල් පැල මර්දනය සහ තේ පඳුරු කප්පාදු කිරීම ආදී වැඩ කටයුතුවලදී දක්වා ඇති ප්‍රගතිය සතුටුදායක සේ පෙනී යයි. පෝර ඇනවුම් කර ඇතත් තවම ඒවා යොදා නොමැත. තේ කම්හල එහි ඇති පැරණි උපකරණ අනුව හැකිතාක් දුරට සාර්ථක අයුරින් ක්‍රියාත්මක වන බව දක්නට ඇතත් සැකසූ තේ නිෂ්පාදනයෙහි ප්‍රතිශතය බෙහෙවින් වෙනස් වූ අතර ප්‍රතික්ෂේප කරනු ලැබෙන තේ පිළිබඳ ප්‍රතිශතය අසමාන පරිදි ඉහළ මට්ටමක පැවතුනි. (සටහන V–27 බලන්න)

නිෂ්පාදන සැළැස්මෙහි දක්නට ලැබෙන බරපතල අඩුපාඩුවක් නම් ආහාර අතින් හිඟ මෙම ප්‍රදේශයට අත්‍යවශ්‍ය අතිරේක ආහාර බෝග වගාව සඳහා විධිවිධාන සලසා නොතිබීමයි. ආර්ථිකමය වශයෙන් ලාභයක් ගෙන නොදෙන තේ වෙනුවට තණ භූමි ඇති කර සත්ව සම්පත දියුණු කිරීමේ යෝග්‍යතාවය පරීක්ෂා කළයුතු වන්නේය.

---

[1] සාකච්ඡාවේදී සාමාජිකයින් විසින් මතු කරනු ලැබූ ගැටළු පිළිබඳ නිදර්ශන පහත දැක්වේ:

(අ) කලින් සලාක බඩුබාහිරාදිය වතුයායේදීම බෙදා දෙනු ලැබීය. එහෙත් දැන් නොයෙකුත් අපහසුතා මධ්‍යයේ පුපුරැස්ස විවිධ සේවා සමූපකාර සමිතියට යාමට කම්කරුවන්ට සිදු වී ඇත.

(ආ) කලින් සතියකට දෙවරක් වෛද්‍ය වරයෙක් ගැරෝ වතුයායට පැමිණියේය. දැන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඔවුනට සැතපුම් තුනක් පමණ ඈතින් පිහිටි බෙහෙත් ශාලාවට යා යුතුව ඇත.

(ඇ) කලින් කම්හලට තේ ගෙන යාම සඳහා වතුයායෙහි ලොරියක් තිබුනි. මෙය දැන් කැඩී ඇති අතර කම්කරුවන් විසින්ම තේ ප්‍රවාහනය කළයුතුව ඇත.

(ඈ) පඩි නඩි හෝ දීමනා යනාදිය ප්‍රමාණවත් නොවේ.

(ඉ) වතුයාය පාලනය කිරීමේ කාර්යයට ප්‍රමාණවත් අයුරු සාමාජිකයින් යොදාගෙන නැත.

## සටහන V-27 ඇරෝ බෝග සටහන - 1973 ඔක්තෝබර් - 1974 ජනවාරි

| මාසය | නෙලූ තේ කොළ රා. | මිලට ගත් රා. | මුළු ප්‍රමාණය රා. | සැකසූ තේ රා. | නිපැයුම % | ප්‍රතික්ෂේප කළ තේ රා. | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | 17,094 | | 17,094 | 4,011 | 23.5 | 122 | 3.0 |
| නොවැම්බර් | 14,837 | 9,616 | 24,453 | 5,611 | 22.9 | 435 | 7.7 |
| දෙසැම්බර් | 12,422 | 88,714 | 101,196 | 21,043 | 20.8 | 2,202 | 10.4 |
| ජනවාරි | 10,594 | 41,830 | 52,424 | 12,483 | 23.7 | 381 | 3.1 |
| එකතුව | 54,947 | 140,160 | 195,167 | 43,148 | 22.8 | 3,140 | 6.0 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම

### ආර්ථික විශ්ලේෂණය

1974 පෙබරවාරි මාසයේදී ඇරෝ ගොවිපලේ ගිණුම් වලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සකස් කළ ගණන් හිලව්වලට අනුව, සැකසූ තේ රාත්තලක නිෂ්පාදන වියදම සාමාන්‍යයෙන් රු. 2.57 ක් වූ අතර පොදුවේ විකුණු මුදල රු. 2.03 ක් විය. තේ සැකසීමෙහිදී සිදු වූ වියදමෙන් විශාල කොටසක් සංවර්ධන කටයුතු සඳහා වූ හෙයින් මෙම පාඩුව අපේක්ෂා කිරීමට සිදු විනි. කප්පාදු කළ තේ වලින් අස්වැන්න ලැබෙන තෙක් මෙම තත්වය මේ ආකාරයෙන්ම පවතිනු ඇත.

සාමාජිකයින්ගේ බැඳීයාව සහ ශ්‍රම පලදායීතාවය උසස් මට්ටමක පවත්වා ගන්නා තාක් කල්, V-24 සටහනෙහි දක්වා ඇති ඉලක්කයන් ළඟා නොකර ගැනීමට හෝ එම ඉලක්කවලට වැඩි දියුණුවක් ඇති කර නොගැනීමට හේතු නොපෙනේ. ශ්‍රම පලදායීතාවය බොහෝදුරට පරිපාලනමය හා සමාජයීය සාධක මත රඳා පවතින්නේය. එම සාධක පහත සාකච්ඡා කෙරේ.

### පරිපාලනමය විශ්ලේෂණය

ඇරෝ සමූපකාර ගොවිපල කිසියම් විශේෂ හේතු රාශියක් යටතේ ආරම්භ වූ බව, එහි වර්තමාන පරිපාලනමය සංවිධානය අවබෝධ කර ගැනීමෙහි ලා සැලකිල්ලට ගත යුතු වන්නේය. මෙම වතුයායෙහි පැරණි කාර්ය මණ්ඩලය කලින් හිමිකරුවන්ගේ සහචරයන් ලෙස සලකනු ලැබීය. එම අයිතිකරු යටතේ ඉඩමෙහි මෙන්ම කම්කරුවන්ගේ තත්වයද පරිහානියට පත් විනි. පැරණි කාර්ය මණ්ඩලය නව කළමනාකරණ ක්‍රමයට සරිලන පරිදි සිය ආකල්ප ප්‍රමාණවත් අයුරින් වෙනස් කර ගනිවී යයි අදහස් නොකරන ලදී. කලින් සිටි කම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් පුරවැසියන්

නොවූ අතර සමූපකාර සමිතියේ සාමාජිකත්වය ඔවුනට හිමි නොවීය. එහෙත් ඉදිරියටත් ඔවුහු සේවකයින් වශයෙන් වතුයායෙහි වැඩ කළහ. පුරවැසි කම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් පවා, කම්කරුවන් වශයෙන් හීන මානයක් ඇතිව සිටින්නවුන් වශයෙන් සලකනු ලැබූ අතර ස්වයං-පාලනය පිළිබඳ සම්පූර්ණ වගකීම ඔවුන් වෙත පැවරීමට පළමු ඔවුන්ගේ එම ආකල්පයද වෙනස් කළයුතු වන්නේය.

මෙම හේතු නිසා පැරණි පරිපාලක කාරිය මණ්ඩලය වෙනුවට අලුතින් අය පත් කරන ලද අතර දේශපාලන වශයෙන් කිසියම් බැඳියාවක් ලත් තරුණ සාමාජිකයින් පැරණි කංකානම්වරුන් වෙනුවට යොදන ලදී. සම්පූර්ණයෙන්ම පිටස්තර අයගෙන් සමන්විත විධායක කමිටුවක්ද පත් කරනු ලැබීය.

පරිපාලනමය තත්වය විග්‍රහ කිරීමෙහි ලා පහත සඳහන් කරුණු අප සලකා බලනු වටනේය:

I. අලුතින් පත් කරන ලද පරිපාලක කාරිය මණ්ඩලය ශිල්පීය වශයෙන් සහ සමාජයීය වශයෙන් කාර්යක්ෂම වන්නේද? ශිල්පීය වශයෙන් සලකන කල උසවසම වතුයායකින් මෙම වතුයායට පත් කරනු ලැබූ අධිකාරී, ක්ෂේත්‍ර නිලධාරීන්, ටී මේකර් සහ ලිපිකරු ආදී සියල්ලෝම ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව මනා අවබෝධයක් ඇත්තවුන් සේ පෙනිණි. සමාජයීය වශයෙන් සලකන කල සාමාජිකයින් හට අන කරනු වෙනුවට ඔවුන් හට පුහුණුවක් ලබා දීම මෙකී පුද්ගලයින්ගෙන් අපේක්ෂා කරන ලදී. එහෙත් සාමාජිකයින්ගෙන් ඇසමෙක් කියා සිටියේ නව කළමනාකරුවන්ද පැරණි කළමනාකරුවන් මෙන්ම ඔවුන් කරන දෙය සාමාජිකයින්ට පැහැදිලි කර නොදෙන බවයි. සාමාජිකයින් සමඟ අප විසින් කරන ලද සාකච්ඡා වලින් පැහැදිලි වන්නේ තමන් කම්කරුවන්ය යන හීන මානය ඇතැම් සාමාජිකයින් තුළ පැවතුනත් එය කවර ආකාරයකින්වත් පුංචි සාමාජිකයින් තුළම නොපවතින බවයි. නව අදහස් ඔවුන් තුළ ජනිත කරවීමට ගන්නා ප්‍රයත්න වැඩදායක වනු ඇත.

II. ගොවිපල පිළිබඳ සම්පූර්ණ සැලසුම් සැකසීමෙහිදී සාමාජිකයෝ ප්‍රමාණවත් අයුරින් එයට සම්බන්ධ වන්නේද? විධායක කමිටුවට සමූපකාරයේ සාමාජිකයින් එක් අයෙක්වත් අයත් නොවන බව අපට පෙනී ගියේය. එම කමිටුවට සාමාජිකයින් කිසිවෙක් ඇතුළත් කර නොගැනීමට සාධාරණ හේතුවක් නොපෙනේ. සාමාජික යින්ගෙන් වැඩි දෙනෙක් පැවසුවේ පිටතින් පැමිණි අය හොඳ වුවත් ඔවුන් කරන දේවල් පිළිබඳව අවබෝධයක් සාමාජිකයින්ට නොලැබෙන බවය. සාමාජිකයෝ එම මණ්ඩලයෙහි කටයුතු කළයුතු හොඳම අය යයි ඔව්හු පැවසූහ. සමූපකාර සමිතියේ සාමාජිකයින් කිහිප දෙනෙක් විධායක කමිටුවට පත් කිරීමෙන් අනිකුත් සථානයන්හි සිදු වූ පරිදි සාමාජිකයින්ගේ ආත්ම විශ්වාසය සහ මෙම වැඩ

පිළිවෙල කෙරෙහි ඇති ඔවුන්ගේ බැඳියාව වැඩි කිරීමට තුඩු දෙන බව අපට පෙනී යයි.

III. දෛනික ක්ෂේත්‍ර වැඩ සංවිධානය කාර්යක්ෂමද? සාමාජිකයින්ගේ නිපැයුම් තත්වය පිහිටීමට පත් නොවන්නට නම් වැඩ කණ්ඩායම්වලට බෙදීම, එක් එක් වැඩ කටයුතු පැවරීම සහ කංකානම්වරුන් පත් කිරීම අවශ්‍ය බව අපට හමු වූ සියළු සාමාජිකයින්ගේ මතය විය. කංකානම්වරුන් වශයෙන් පත් කරන ලද තරුණ සාමාජිකයින් හට එවැනි කටයුත්තක් පිළිබඳ පූර්ව අත්දැකීම් නොතිබුනත් ඔවුන් කාර්යක්ෂම අයුරින් වැඩ කර වැඩ කටයුතු පිළිබඳ උසස් තත්වයක් පවත්වාගෙන යන බවත් පෙනෙන්නට තිබුනි. මෙම ක්‍රමය නිසා වැදගත් සමාජයීය ප්‍රතිපල ඇති වන්නේය.

සමාජයීය විශ්ලේෂනය

මෙහි ලා වැදගත් කරුණු තුනක් ඉදිරිපත් කළයුතුව ඇත.

I. නව කළමනාකාරීත්වය යටතේ වුවද සම්ප්‍රදායික කළමනාකරු/කම්කරු සම්බන්ධතාවය තවම වෙනස් වී නැත. මෙම ක්‍රමය දිගු කලක් පවත්වාගෙන යාම එකී සම්බන්ධතාවයද අඛණ්ඩව පැවතීමට හේතු වනු ඇත.

II. සමූපකාර සාමාජිකයින් කංකානම්වරුන් වශයෙන් පත් කිරීම නිසා ජන සමාජය තුළ පංති බේදයක් ඇති විය. කංකානම්වරුන්ගේ පැවැත්ම පිළිබඳ පළ කර ඇත්තේ මඳ විරෝධතාවයක් වුවද තාවකාලික පියවරක් වශයෙන් පවා මෙවැනි පංතියක් ඇති කිරීම පසුව අපේක්ෂා කරන සමාජයීය සමානාත්මතාවය උදෙසා යහපත් ආරම්භයක් නොවන්නේය.[1] නම කංකානම්වරුන් පත් කර ගැනීමට සාමාජිකයින් හට ඡන්දය දීම වඩාත් යෝග්‍ය බව පෙනී යයි. එසේම කම්කරු නොවන පංතියක් ස්ථිරවම ඇති කිරීම වැළැක්වීම සඳහා මාරුවෙන් මාරුවට කාරිය භාරයන් පැවරීම සමහරවිට වැඩදායක විය හැකිය.

III. සමූපකාරයේ සාමාජිකයින් වන පුරවැසියන් හා කම්කරුවන් වන පුරවැසි නොවන්නන් වශයෙන් ජන සමාජය කණ්ඩායම් දෙකකට බෙදීමෙන් ඇතැම් අන්තරායකාරී තත්වයන් ඇති වේ. මෙම කණ්ඩායම් දෙක අතර ගැටුමක් හෝ අසහනකාරී තත්වයක් පිළිබඳ අවස්ථා සඳහන් නොවුවද වතුයායෙහි දීර්ඝකාලීන දියුණුව සඳහා වැඩ කිරීමට කම්කරුවන් හට කිසියම් අනුබලයක් නොමැති නිසාත් සමූපකාර සමිතියේ සේවකයින් වශයෙන් ඔවුන්ගේ තත්වය ආරක්ෂිත නොවන්නේ යයි ඔවුන් තුළ පවතින හැඟීම නිසාත් අසහනකාරී තත්වයක් පහසුවෙන් ඇති වීමට පුළුවන.

---

1/ අළුතින් පත් කරන ලද කංකානම්වරුන් පළපුරුද්දක් නොමැති එහෙත් උගත් තරුණයින් වීම නිසා අසමානාත්මතාවයට තිබුණු බවක් එක් වේ. ඔවුන් සම්මුඛ සාකච්ඡාවට යොමු කළ විට පැවසුවේ කම්කරු වැඩ කිරීමට ඔවුනට නියම වුවහොත් ඔවුන් ගොවිපලෙහි සේවයේ යෙදීමට නොසිටින බවය.

## 5.3.5 පාන්හැම් සාමූහික ගොවිපල

පසුතලය

පාන්හැම් වතුයාය කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල කොට්ඨාශයේ පිහිටි අක්කර 409 කින් යුත් මැනවින් සංවර්ධිත රබර් වත්තකි. (සටහන අ.5.1 – අ.5.2) මෙම ඉඩම සෑහෙන තත්වයේ සශ්‍රීක බවකින් යුක්ත අතර රජයට අත් කර ගැනීමට මද කලකට පූර්වයෙන් එය පාලනය කරන ලද්දේ නියෝජ්‍යත්ව ආයතනයක් මගිනි. කලින් ඉඩම් භාවිතය සහ නිෂ්පාදනය පිළිබඳ විස්තර V–28 සටහනෙහි දැක්වේ.

**සටහන V–28 පාන්හැම් වතුයායේ කලින් ඉඩම් භාවිතය**

| බෝගය | ප්‍රමාණය | වගා කළ දිනය | සාමාන්‍ය නිෂ්පාදනය | තත්වය |
|---|---|---|---|---|
| පැරණි බද්ධ රබර් | 234 | 1943–1967 | රාත්. 1,317 | 1971 අප්‍රියෙල් සිට පොහොර යොදා ඇත. අක්කර 15 ක් උදුරා ඇත. |
| බද්ධ රබර් පැළ | 139 | 1968–1973 | – | 1973 සිට පොහොර දමා ඇත. |
| පොල් | 11 | 1955 | ගෙඩි 1,963 | 1973 සිට පොහොර දමා ඇත. |
| පලතුරු | 8 | – | – | දොඩම්, අඹ ආදිය. |
| වැලි දොඩම් | 1 | 1972 | – | රබර් පැළ අතර වවා තිබේ. |
| කෙසෙල් | 2 | 1972 | – | වෙනත් බෝග අතර වවා තිබේ. |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම හා පාන්හැම් ගොවිපලේ ව්‍යාපාර සංවිධායක

රබර් කම්හලක්, කාර්යාලයක්, බංගලා පහක්, නිවාස තුනක්, පැල්පත් හයක් සහ ලැයිම් කාමර හයක්ද වෙනත් ගබඩා යනාදියද මෙම වතුයායෙහි ඇති ගොඩනැගිලිලට අයත් වේ. රබර් කම්හලෙහි රෝලර් සහ යන්ත්‍ර ආදිය සවි කර ඇති අතර ඒවා හොඳ තත්වයක පවතී. කම්හලට, කාර්යාලයට සහ ප්‍රධාන බංගලාවට නල මගින් ජලය සැපයේ. අනිකුත් ගොඩනැගිලි සඳහා තනන ලද ලිං ඇත. වත්කම් පිළිබඳ තක්සේරුවක් කර නැතත් ඒවා යහපත් තත්වයක පවතී.

දහසය දෙනෙකුගෙන් සමන්විත පරිපාලන කාර්ය මණ්ඩලයක් සහ පුරවැසි කම්කරුවන් පනස් දෙනෙකුගෙන්ද (ඔවුන්ගෙන් 37 දෙනෙක් වතුයායෙහි නේවාසිකව පදිංචිව සිටියහ) පුරවැසි නොවන කම්කරුවන් 70 - 80 කින්ද (තුන් දෙනෙක් හැර අනිත් සියල්ලෝම නේවාසිකව පදිංචි වී සිටියහ) සමන්විත ශ්‍රම හමුදාවක් මගින් මෙම වතුයාය පාලනය කරගෙන යනු ලැබීය. පුරවැසි නොවන වැඩිහිටි අය බොහෝ දෙනෙක් කිසිදු සේවයක් නොකර එම වතුයායෙහි පදිංචිව සිටියහ. මෙය සිදුව ඇත්තේ රබර් අක්කර 139 ක් පමණ නැවත පැල සිටුවා ඇති හෙයින් ඒවායේ කිරි කැපීම එතෙක් ආරම්භ කර නොතිබුණ නිසාය. (සටහන V-28) මෙසේ වුවත් එක් අක්කරයකට 0.36 ක් පමණ වූ ශ්‍රම ශක්තිය වතුයායේ නඩත්තුව සඳහා යම්තම් ප්‍රමාණවත් බව 1972 අගෝස්තු මාසයේදී සංචාරක නියෝජිතයා විසින් සළකන ලදී. වතුයායෙහි ජනගහණය සහ සේවා අවස්ථා පිළිබඳ විස්තර V-29 සටහනෙහි දැක්වේ.

<u>සටහන V-29</u> /පාන්හැලි වතුයාය අත් කර ගැනීමට පෙර ජනගහණය හා ශ්‍රම හමුදාව

| වර්ගය | පුරවැසි | පුරවැසි නොවන | එකතුව |
|---|---|---|---|
| නේවාසික කම්කරු - පුරුෂ | 17 | 35 | 52 |
| නේවාසික කම්කරු - ස්ත්‍රී | 15 | 29 | 44 |
| එකතුව | 32 | 64 | 96 |
| නේවාසික පදිංචි වැඩ නොකරන - වැඩිහිටි | 8 | 63 | 71 |
| - ළමා | 31 | 45 | 76 |
| සම්පූර්ණ නේවාසික ජනගහණය | 71 | 172 | 243 |
| නේවාසික නොවන කම්කරුවන් | 19 | - | 19 |
| අනියම් කම්කරුවෝ | 9 | 3 | 12 |
| මුළු ශ්‍රම හමුදාව | 60 | 67 | 127 |

මූලාශ්‍රය: /පාන්හැලි වතුයායේ වාර්තා.

කලින් මෙම වතුයාය බෙහෙවින් ලාභ උපයාගෙන ඇත. එහෙත් නියෝජිත ආයතනයේ ගිණුම්වලට අනුව සහ සංචාරක නියෝජිතයාගේ නවතම වාර්තාවලට අනුව දැනට ලැබෙන ආදායම 1972 පුනරාවර්තන වියදම් ආවරණය කිරීම සඳහා යම්තම් ප්‍රමාණවත් වුනි. එසේම ප්‍රාග්ධන වියදම්ද සළකා බලා කල වතුයායෙහි දැක්වෙනුයේ පාඩුවකි. (සටහන V-30) මෙයට ප්‍රධානතම හේතු වී ඇත්තේ:

(අ) විශාල කොටසක රබර් දැනටමත් කිරි කපන තත්වයකට පත්ව නොමැත;

(ආ) 1960 පසු භාගයේදී සහ 1970 මුල් භාගයේදී රබර් සඳහා ලැබුණ පහත මිළ ගණන්;

(ඇ) 1972 මුල් භාගයේදී පැවති උග්‍ර නියඟයේ ප්‍රතිපල;

(ඈ) අනාගතය පිළිබඳ අවිනිශ්චිත තත්වය නිසා පොහොර භාවිතයෙහි ලා උනන්දුවක් නොදැක්වීම.

## සටහන V-30 ✓පාත්හැම් වතුයාය - අය වැය සටහන 1972

| ආදායම | රු. | වියදම | රු. |
|---|---|---|---|
| රබර් විකිණීමෙන් | 223,779.76 | වැටුප් ගෙවීම | 42,884.60 |
| පොල් විකිණීමෙන් (දළ වශයෙන්) | 7,000.00 | පඩි කඩි ගෙවීම | 161,607.96 |
| | | ගොඩනැගිලි නඩත්තුව | 20,000.00 |
| | | යන්ත්‍රෝපකරණ නඩත්තුව | 16,000.00 |
| | | රසායන මිළදී ගැනීම | 11,000.00 |
| | | පොහොර හා කෘෂි-රසායන මිළදී ගැනීම | 6,000.00 |
| | | රබර් ප්‍රවාහනය | 3,000.00 |
| | | සේවක අර්ථ සාධක අරමුදල | 17,000.00 |
| | | වෛද්‍ය ගාස්තු හා විශ්‍රාම වැටුප් | 8,000.00 |
| | | නිවාඩු පඩි | 7,500.00 |
| | | රක්ෂණ | 3,000.00 |
| | | විවිධ | 4,759.97 |
| එකතුව | 230,779.76 | එකතුව | 300,752.53 |

මූලාශ්‍රය: ✓පාත්හැම් වතුයායේ වාර්තා.

සටහන:

රබර් පැල විකිණීමෙන් ආදිය ලැබූ වෙනත් ආදායම් සටහන් කර නොමැත.

අළුත් රබර් වගාවේ කිරි කැපීම සමග නිෂ්පාදනය සඳහා වැඩි මිළක්ද ලැබෙනැයි බලාපොරොත්තු වූ හෙයින් 1973 සිට ලාභ බෙහෙවින් වැඩි වෙතැයි අපේක්ෂා කරන ලදී. නව හිමිකාරත්වය සහ කළමනාකරණ ක්‍රමය යටතේ අවිනිශ්චිතතාවය පිළිබඳ ගැටළු මග හරවා ගැනේ නම් වතුයාය අත් කර ගැනීම, පලදායීතාවය සහ රැකියා අවස්ථාවල වැඩි වීමකට තුඩු දෙන්නේ යයි අදහස් කෙරිණි.

සාමූහික ගොවිපල ආරම්භ කිරීම

1973 මැයි මස 21 වන දින ✓පාත්හැම් ගොවිපල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පවරන ලදී. සමූපකාර සමිතිය පිහිටුවීමෙහි ලා ඇතැම් දුෂ්කරතාවයනට මුහුණ දීමට සිදු වුනි. පළමුවෙනුව සාමූහික ගොවිපලක් පිළිබඳව අවබෝධයක් වතු කම්කරුවන්ට නොතිබුන අතර ඔව්හු එවැන්නක් ආරම්භ කරන ලෙසද ඉල්ලා නොසිටියහ. දෙවැනිව මෙවැනි ව්‍යාපාරයක් සඳහා අසල්වැසි ගම්වල පවා එතරම් සැළකිල්ලක් නොතිබුනි.1/

1/ වතුයාය අනෙක් වතු වලින් වට වී ඇත. එහෙයින් ඉඩම් ඉල්ලා සිටින ඉඩම් නොමැති ජනතාව ඒ අවට නොමැත.

මුලින් අදහස් කරන ලද සැලැස්ම වූයේ පුරවැසි කම්කරුවන් පනස් දෙනාට සමුපකාරයේ සාමාජිකත්වය පිරිනමා එම ප්‍රදේශයෙන් රැකියා නොමැති තරුණයින් තවත් පනස් දෙනෙක් සමුපකාර සමිතියට බඳවා ගැනීමය. පුරවැසි නොවන කම්කරුවෝ සමුපකාරයේ සාමාජිකයින් සමග ඉදිරියටත් වතුයායෙහි සේවය කරනිසි අපේක්ෂා කරන ලදී. 1973 ජූනි මාසයේදී තරුණයින් තිහප දෙනෙක් බඳවා ගනු ලැබුවත් වතුයායෙහි වැඩ කිරීමට ඔවුන් සැලකිල්ලක් නොදැක්වූ අතර ඉක්මනින් වතුයාය හැර ගියහ.

අනතුරුව පුරවැසි කම්කරුවන් පනස් දෙනාගෙන් පමණක් සමන්විත සමුපකාරයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. මෙම පරමාර්ථ අරබයා රැස්වීමක් කැඳවන ලදින්, යැරෝ ගොවිපලේ සිදු වූවාක් මෙන්, සාමාජික ගාස්තුව ගෙවා ඔවුනට සාමාජිකත්වය ලබා ගතහැකි බවත් නිවාස ඉදි කිරීම සඳහා ඔවුනට බිම් කැබලි ලැබෙන බවත් මාස හයකට පසුව ලාභය බෙදා දෙනු ලැබෙන බවත් මෙම තරුණයින් හට පැහැදිලි කර දෙන ලදී. මෙවැනි තත්වයක් යටතේ පවා සමුපකාර සමිතියට බැඳීමට ඔව්හු මදක් පැකිලුණහ. සමුපකාරයක් පිහිටුවීම සඳහා ඔක්තෝබර් මාසයේදී කැඳවන ලද සමිතියට සහභාගී වූයේ තරුණයින් පනස් දෙනාගෙන් 16 දෙනෙක් පමණි. පුරවැසි නොවන්නන් හට මෙහි සාමාජිකත්වය ලැබිය නොහැකි නිසා, එනයින් බෙදී යන ලාභ සහ ගෙවතුබිල්ලක් සඳහා වූ බිම් කැබලි 1/ ආදිය සඳහා ඔවුන් හිමිකම් නොලබන හෙයින් එවැනි කම්කරුවන්ගෙන් ප්‍රධාන වශයෙන් සමන්විත වෘත්තීය සංගමයේ ප්‍රාදේශීය සංඛ්‍යාව සමුපකාරයක් ඇති කිරීමේ කාරියයට විරුද්ධ වන බවට රාවයක් පැතිරින. එම වෘත්තීය සංගමයට අවශ්‍ය වූයේ ⁄පාන්හැම් වතුයාය රාජ්‍ය වැවිලි සංස්ථාවට භාර දීමය.

වෘත්තීය සංගමයේ සාමාජිකයින් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම මතභේද තරමක් දුරට සමනය වූයෙන් පුරවැසි කම්කරුවෝ 48 දෙනෙක් සමුපකාර සමිතියට බැඳුනෝය. 1973 නොවැම්බර් මස 2 වන දින එය ලේඛනගත කරන ලදී.

රබර් වගාව දියුණු කිරීම, වැලි දොඩම්, අන්නාසි සහ කෝපි ආදී වශයෙන් තවදුරටත් බෝග විවිධාංගකරණය කිරීම, වී අක්කර පහක් අස්වැද්දීම සහ කිරි පට්ටියක් ඇති කිරීම සඳහා පොල් වගාව යට තණකොල වැවීම ආදියද ඇතුළත්ව සංවර්ධන සැලැස්මක් සකස් කරන ලදී. විස්තර V-31 සටහනෙහි දැක්වේ.

---

1/ වෘත්තීය සංගම් ශාඛාවේ සභාපති සහ ලේකම් යන දෙදෙනාම පුරවැසි නොවූ අය වුවත් එහි කමිටුවේ සාමාජිකයින් 12 දෙනාගෙන් පුරවැසි සාමාජිකයින් තිදෙනෙක් සමුපකාරයේ සාමාජිකත්වය පිළි ගත්හ.

සටහන V–31 ප්‍රාන්තැම් නිෂ්පාදන සැළැස්ම

| ව්‍යවසාය | ප්‍රමාණය | සැළැස්ම |
|---|---|---|
| පැරණි බඩි රබර් | 234 | පොහොර දමා වල් පැල මර්ධනය කර දියුණු කිරීම. අක්කර 20 ක් රතාවාසයක් සඳහාද (උපරිම ලෙස රබර් කිරි ගැනීමෙන්) අක්කර 15 ක් වැලි දොඩම් සඳහාද (රබර් උදුරා දැමීමෙන්) වෙන් කිරීම. |
| කිරි කොතපන බඩි රබර් | 139 | පොහොර දමා වල් මර්ධනය කිරීම, 1974 සිට කිරි කැපීම. |
| පොල් | 11 | පොහොර දමා වල් මර්දනය කිරීම, රබර් අතර තණ වැවීම. |
| පළතුරු | 8 | ඒ වෙනුවට තැසිලි හිටුවීම. |
| වැල් දොඩම් | 15 | රබර් උදුරා දැමූ පෙදෙස්වල තනිකර වැවීම. |
| අන්නාසි | 5 | රබර් උදුරා දැමූ පෙදෙස්වල තනිකර වැවීම. |
| කෝපි | 6 | රබර් උදුරා දැමූ පෙදෙස්වල තනිකර වැවීම. |
| වී | 5 | නිරතුරුව ජලය ඇති පෙදෙස් අස්වැද්දීම. |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

මෙම වැඩ සටහන සඳහා පළමුවන වසරේදී රු. 266,615/– ක් අවශ්‍ය වෙතැයි ඇස්තමේන්තු කරන ලද අතර ඉන් අනතුරුව එක් අවුරුද්දක් සඳහා සාමාන්‍ය වශයෙන් රුපියල් 227,115/– ක් වැය වන්නේ යැයි අපේක්ෂා කරන ලදී. මෙම මුදල් ප්‍රමාණය බෝග විකිණීමෙන් පියවා ගත හැකි වුවත් වහාම කළයුතුව තිබූ වැටුප් හා පඩි නඩි ගෙවීම සඳහා සහ උපකරණ සහ රසායනික ද්‍රව්‍ය ආදිය මිළදී ගැනීම සඳහා රු. 20,000/– ක ආරම්භක ණය මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමින් ඉල්ලා සිටින ලදී. විස්තර V–32 සටහනින් දැක්වේ.

## සටහන V-32 ⁄පාන්කැට නිෂ්පාදන සැලැස්ම - ඇස්තමේන්තුගත වියදම් සහ ආදායම්

| කාරණය | වසර 1 රු. | වසර 2 රු. | වසර 3 රු. | වසර 4 රු. | වසර 5 රු. |
|---|---|---|---|---|---|
| **1. වියදම්** | | | | | |
| කිරි කපන රබර් | 158,000 | 158,000 | 158,000 | 158,000 | 158,000 |
| රබර් පැළ | 41,500 | 41,500 | 41,500 | 41,500 | 41,500 |
| පොල් | 2,200 | 2,200 | 2,200 | 2,200 | 2,200 |
| වැලි දොඩම් | 55,885 | 14,400 | 17,025 | 17,910 | 14,910 |
| සාමාන්‍ය නඩත්තුව | 9,030 | 11,515 | 8,890 | 9,005 | 8,005 |
| මුළු වියදම් | 266,615 | 227,615 | 227,615 | 228,615 | 224,615 |
| **2. ආදායම්** | | | | | |
| රබර් | 349,375 | 349,375 | 349,375 | 349,375 | 349,375 |
| පොල් | 9,240 | 9,240 | 9,240 | 9,240 | 9,240 |
| වැලි දොඩම් | 18,000 | 54,000 | 54,000 | 45,000 | 36,000 |
| මුළු ආදායම් | 376,615 | 412,615 | 412,615 | 403,615 | 394,615 |
| **3. ශුද්ධ ලාභය** | 110,000 | 185,000 | 185,000 | 175,000 | 170,000 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම.

සටහන: නිෂ්පාදන වැඩ සටහනට පසුව එකතු කළ පලතුරු, අන්නාසි, කෝපි සහ වී පිළිබඳ විස්තර මෙම ඇස්තමේන්තුවට ඇතුළත් නොවේ.

වතුයාය රජයට පවරා ගැනීමෙන් පසුව එහි සේවය කළ පැරණි කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකුගේ සේවය නතර කරන ලදී. කොන්දොස්තර, ප්‍රධාන ලිපිකරු, කම්හල්ශාලා නිලධාරී, එන්ජින් රියැදුරු සහ කංකානම්වරුන් තිදෙනෙක් පමණක් රඳවා ගනු ලැබීය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ව්‍යාපාර සංවිධායකයෙක් අනුයුක්ත කරන ලද අතර පත් කරන ලද සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සහ (ව්‍යාපාර සංවිධායක, සමුපකාර පරීක්ෂක, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ සහ රබර් පර්යේෂණ ආයතනයේ නියෝජිතයෙක්) සමුපකාරයේ සාමාජිකයින් විසින් තෝරා පත් කරනු ලැබෙන තුන් දෙනෙකුගෙන්ද සමන්විත විධායක කමිටුවක් පිහිටුවන ලදී.

### වර්තමාන තත්වය

සමීක්ෂණය පැවති අවස්ථාවෙහි (1974 ජනවාරි 10, 11) සමූපකාරයේ සාමාජිකයෝ 48 දෙනෙක් වූහ. ඔවුන් කලින් මෙම වතුයායෙහි පහත සඳහන් තනතුරු දැරූහ. රබර් කිරි කපන්නන් (32 යි), කර්මාන්තශාලා කම්කරුවන් (4 යි), කංකානම්වරුන් (3 යි), සහ අනියම් කම්කරුවන් (9 යි) ඔවුන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 35 ක් විය. 40 දෙනෙක් විවාහකයින් වූ අතර 10 දෙනෙක් ගෙවිපලෙන් බැහැරව පදිංචිව සිටියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පස්වෙනි හෝ සහවෙනි ප්‍රමාණය තෙක් අධ්‍යාපනය ලබා සිටියත් එක් අයෙක්වත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික තත්වයට එළඹ නොසිටියේය. (සටහන අ.5.4 – අ.5.8 බලන්න)

මෙම සාමාජිකයින්ට අමතරව ඔවුන් ලබන පඩියම ලබමින් (දිනකට රු. 4.22 යි) ඔවුන් සමග එකට වැඩ කළ පුරවැසි නොවන කම්කරුවෝ 80 දෙනෙක්ද එහි සේවය කළහ. උදෑසන පෙරේට්ටුවෙහිදී, වල් මර්ධනය, වැට කඩොලු බැඳීම, දර එක් රැස් කිරීම ආදී කාර්යයන්හි නියැලීම සඳහා සාමාජිකයින් මෙන්ම සාමාජිකයින් නොවන කම්කරුවන්ද 3 – 10 දෙනෙකුගෙන් සමන්විත වන පරිදි කණ්ඩායම්වලට බෙදන ලදී. කංකානම්වරු දෙදෙනා හැරුණු විට ස්ථිර කණ්ඩායම් නායකයෝ එහි නොසිටියහ. රබර් කිරි කපන්නෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කළ කංකානම්වරු යටතේ තනි තනිව සේවය කළහ. කාර්ය භාරයන් බෙදා දෙන ලද්දේ ක්ෂේත්‍ර නිලධාරියා විසිනි.

1973 මැයි මස සිට නොවැම්බර් මාසය තෙක් කාලය තුළ රබර් රාත්තල් 123,341 ක් නිෂ්පාදනය කරන ලදී. කෙසේ වෙතත් එක් රබර් කිරි කපන්නෙක් සාමාන්‍යයෙන් දිනකට රැස් කළ රබර් කිරි ප්‍රමාණය 1972 පැවති රාත්තල් 11.8 සිට 1973 වන විට (මැයි, නොවැම්බර්) රාත්තල් 9.4 තෙක් පහත වැටුණි. අතිරේක කඩත්තු වැඩ කිහිපයක් ඉටු කර ඇති අතර මයියොක්කා අක්කර දෙකක් වගා කර ඇත. කර්මාන්තශාලාව කලින් මෙන් ක්‍රියාත්මකව පැවතුනි.

V–32 සටහනින් විස්තර කෙරෙන පරිදි 1973 මැයි සිට නොවැම්බර් දක්වා කාලය අතරතුර වියදම ලැබූ ආදායමට වඩා වැඩි විය. රු. 106,074.30 ක විශාල ලාභයක් ලබා ඇත්තේ අධික ලෙස වැඩි වූ රබර් මිළ ගණන් නිසා සහ (1972 රබර් මිළ ශත 87 ක් වුවද මෙම වකවානුවේදී එය රාත්තල රු. 2.41 ක් විනි) ප්‍රාග්ධන ආයෝජනය අඩු වූ හෙයිනි. විශේෂයෙන් 1973 සම්පූර්ණ කාලය සඳහා ප්‍රක්ෂේපනය කර ඇති ප්‍රාග්ධන වියදම 1972 සඳහා වූ වියදමෙන් අඩකටත් අඩු වන්නේය. සටහන V–34 බලන්න.

සටහන V–33 පාත්හැම් – අය වැය සටහන – 1973 මැයි සිට නොවැම්බර්

| ආදායම | රු. | වියදම | රු. |
|---|---|---|---|
| රබර් විකිණීමෙන් | 216,463.13 | වැටුප් ගෙවීම | 11,244.78 |
| පොල් විකිණීමෙන් | 3,148.83 | පඩි නඩි ගෙවීම | 73,497.80 |
| පළතුරු විකිණීමෙන් | 2,951.70 | රසායන ද්‍රව්‍ය මිළදී ගැනීම | 5,000.00 |
| රබර් පැළ විකිණීමෙන් | 400.00 | අර්ථ සාධක අරමුදල | 7,300.00 |
| | | පොල් සහ පළතුරු | 6,000.00 |
| | | යන්ත්‍රෝපකරණ නඩත්තුව | 2,000.00 |
| | | වෙනත් | 11,846.78 |
| එකතුව | 222,963.66 | එකතුව | 116,889.36 |

මූලාශ්‍රය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම හා පාත්හැම් සාමූහික ගොවිපල.

සමූපකාරයේ සාමාජිකයින්ගේ නියෝජිතයින් තෝරා ගැනීමට පෙර විධායක කමිටුව රැස්වීම් දෙකක් පැවැත්වූවාය. මෙම නියෝජිතයින් තෝරා ගැනීමෙන් අනතුරුව පළමුවන සම්පූර්ණ කමිටු රැස්වීම ජනවාරි මස 11 වන දින පවත්වන ලදී.

විශ්ලේෂණය

අපගේ සමීක්ෂණය ආරම්භ කළ අවධියේදී සමූපකාරය කාර්ය ආරම්භ කළා පමණක් වුවද පළමු සති කිහිපය තුළ මෙම වැඩ පිළිවෙල තුළින් ලද අත්දැකීම් හා ගැටළු අනුසාරයෙන් සැළකිය යුතු කරුණු සමහරක් ඉදිරිපත් කිරීමට පිළිවන.

ශිල්පීය විශ්ලේෂණය

වතුයාය රජයට අත් කර ගැනීමෙන් අනතුරුව කරන ලද වැඩ ප්‍රමාණය සාමාන්‍යයෙන් සතුටුදායක ලෙස පෙනී ගියත් ක්ෂේත්‍ර වැඩ කටයුතු, විශේෂයෙන් රබර් කිරි කැපීමේ කාර්යය පිරිහෙමින් පවතින බව පරිපාලන කාර්ය මණ්ඩලයේ මෙන්ම සාමාජිකයින් බොහෝ දෙනෙකුගේද මතය විය. මෙම තත්වය සම්බන්ධයෙන් ඊට්ටු පහත සඳහන් හේතු දැක්වූහ.

1. වතු අධිකාරි හා ඇතැම් කංකානම්වරුන් ඉවත් කිරීම හේතුකොටගෙන පරිපාලන කාර්ය භාරය පහත වැටීම. මෙම තත්වය හේතුකොටගෙන ඇති වූ පාඩුව පිරිමැසීමට සාමාජික සහභාගිත්වය තවම ප්‍රමාණවත් වී නොමැත.

II. පුරවැසි නොවන කම්කරුවන් වෛයසීමන් තිරීමට සිසිදු ත්‍රම උපත්‍රම නොමැති වීම. ඔවුන් හට කොතෙක් අවවාද කළත් උපරිම ආදායමක් ගැනීමේ පරමාර්ථ සහිතව ඔව්හු රබර් ගසෙහි දෙපැත්තම කපන බව පොදුවේ පැවසුනි.1/ මේ හේතුකොටගෙන රබර් ගස් තුවාල වන අතර අවසානයේ ලැබෙන නිෂ්පාදනයද පහත මට්ටමකද පවතිනු ඇත.

ආර්ථික විශ්ලේෂණය

වතුයාය අත් කර ගැනීමෙන් පසුව ‑පාන්හැම් ශොවීපලෙහි වියදම කලින් අවුරුද්දේ වියදමට වඩා බෙහෙවින් අඩු වුණි. (සටහන V-34) අනෙක් අතට අප වෙත සපයා ඇති සංඛ්‍යාලේඛන නිවැරදි නම් රබර් නිෂ්පාදනයද වැඩි වී ඇත. මේ හේතුකොටගෙන රාත්තලක නිෂ්පාදන වැය පහත වැටුන අතර වැඩි වූ මිළ ගණන් හේතුකොටගෙන විශාල ලාභයක්ද අත් කර ගනු ලැබිනි.

සටහන V-34 ‑පාන්හැම්-රබර් නිෂ්පාදනයේ ලාභදායිතාවය-1972/73

| | 1972# | මැයි-නොවැම්බර් 1973 ¥ | (ප්‍රක්ෂේපිත) 1973 |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම | රු. 74,194.89 | රු. 22,586.51 | රු. 38,719.73 |
| පුනරාවර්තන වියදම් | රු. 221,557.64 | රු. 94,302.85 | රු. 161,662.03 |
| පූර්ණ වියදම | රු. 300,752.53 | රු. 116,889.36 | රු. 200,381.76 |
| රබර් නිෂ්පාදනය | රා. 256,480 | රා. 123,341 | රා. 211,441 |
| රාත්තලක නිෂ්පාදන පිරිවැය | 87.19 | 76.45 | 76.45 |
| රාත්තලක සාමාන්‍ය මිළ | රු. 87.00 | රු. 2.41 | රු. 2.41 |
| මුළු ආදායම | රු. 223,137.60 | රු. 297,251.81 | රු. 509,574.52 |
| මුළු ලාභය | රු. -77,614.93 | රු.+180,362.45 | රු.+309,192.76 |

මූලාශ්‍රය: # 1972 සඳහා වූ සංඛ්‍යාලේඛන කළමනාකරණ ඒජන්තවරුන්ගේ විගණන ගිණුම් වලිනි. 1973 ජනවාරි - මැයි ගිණුම් ලබාගත නොහැකි විය.
¥ 1973 මැයි - නොවැම්බර් සඳහා සංඛ්‍යාලේඛන සමූපකාර සමිතියේ ගිණුම් වලිනි. (මේවා 3 වෙනි තීරුවෙහි මුළු අවුරුද්ද පුරා විසුරුවා ඇත.)

පහත සඳහන් කරුණු සපුරාලන්නේ නම් මෙම සමූපකාරයේ ආර්ථිකමය අපේක්ෂාවන් දීප්තිමත් බව පෙනී යයි.

I. කලට වේලාවට පොහොර දැමීම අත්‍යවශ්‍යය. සමීක්ෂණය කරගෙන යන අවස්ථාවෙහි පොහොර ඇනවුම් කර තිබුනත් එහෙත් ලැබී තිබුණේ නැත.

---

1/ සමූපකාරයේ සාමාජිකයින් සමහරෙක් පවා මෙය කරනවා විය හැකිය.

II. අළුතින් සිටවා ඇති රබර් ගස් වලින් කිරි කැපීම පටන් ගත් පසු ශ්‍රම සැපයුම් වැඩි කළ යුතුය. (දැනුද පවා ශ්‍රම ඌනතාවයක් පවතින අතර කිරි කැපිය හැකි ඇතැම් අංශ අත් හැර දමා ඇත.)

III. ශ්‍රම පලදායිතාවය පවත්වාගෙන යාමේ ගැටළුව විසඳිය යුතුය. පරිපාලනමය හා සමාජයීය ගැටළුවක් වන මේ පිළිබඳව පහත සාකච්ඡා කෙරේ.

## පරිපාලනමය විශ්ලේෂණය

යැරෝ ගොවිපලෙහි සිදු වූවාක් පරිදි ⁄පාන්හැම් වතුයාය රජයට අත් කර ගැනීමෙන් පසුව කලින් සිටි පරිපාලන කාර්ය මණ්ඩලයේ වැඩි දෙනාගේ සේවය නතර කරන ලද අතර පැරණි කංකානම්වරුන් තුන් දෙනෙක් සමුපකාරයේ සාමාජිකත්වය ලබා කංකානම්වරුන් වශයෙන් ඉදිරියටත් කටයුතු කරගෙන ගියහ. එහෙත් යැරෝ ගොවිපලෙහි මෙන් නොව මෙම ගොවිපල සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ව්‍යාපාර සංවිධායක හැරෙන්නට අතිරේක කාර්ය මණ්ඩලය යොදවනු නොලැබුනි. සමුපකාර සාමාජිකයින්ට මාර්ගෝපදේශකත්වය ලබා දී ස්වයං කළමනාකරණයෙහි ලා සහභාගී වී පරිපාලනමය පරතරය පියවීම සඳහා විශ්වාසය තබන ලද්දේ අවු කරන ලද පරිපාලන කාර්ය මණ්ඩලය වෙත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය හා විධායක කමිටුව වෙතය.

ආරම්භක වශයෙන් සංගමය විසින් ගනු ලැබූ මෙම ආකල්පය නිර්භීත පියවරක් ලෙස සැලකිය හැකිය. එහෙත් තත්වයට සරිලන පරිදි නිර්භීත පියවරක් ගැනීම අවශ්‍ය බව තර්ක කිරීමට පිළිවන. එසේම බැහැරින් බඳවා ගනු ලැබූ පරිපාලකයින් යෙදවීමෙන් ගැටළු විසඳීමක් සිදු නොවන්නාක් මෙන්ම පැරණි ක්‍රමයම ඉදිරියටත් ක්‍රියාත්මක වී සමාජයීය හා පරිපාලන පරිවර්තනයක් ළඟා කර ගැනීම පමා වන්නට ඉඩ තිබුණි.

දැනට යොදා ඇති පරිපාලන වැඩ පිළිවෙලෙහි ප්‍රතිඵල තීගමනය කිරීමට තවම කල් මදිය. එහෙත් මෙම ව්‍යාපාරයට සම්බන්ධ වී ඇති ඇතැම් සාමාජිකයින්ගේ අදහස් පරීක්ෂා කිරීම උපදේශාත්මක වශයෙන් වටනේය.

(අ) සම්මුඛ පරීක්ෂණයට යොමු කළ සියළුම සමුපකාර සාමාජිකයින්, පරිපාලක වරුන් සහ පුරවැසි නොවන කම්කරුවන් තියා සිටියේ වැඩ කටයුතු ඉටු කර ගැනීමට නම් කංකානම් ක්‍රමය ඉදිරියටත් පැවතීම අවශ්‍ය බවය.

(ආ) ඇතැම් සාමාජිකයින් කියා සිටියේ නව පාලන ක්‍රමය දර අඩු වැඩි බවයි. නිලධාරීන් අපට පොරොන්දු වූ ක්‍රමය මෙය නොවේ යයි එක් අයෙක් පැවසීය. වත්තෙහි සේවය කළ අයෙක් කිසියම් දුෂ්කරතාවයකට පත් වූ විට වතු අධිකාරි වරයාගෙන් ණයක් ලබා ගැනීමට පුළුවන්කම තිබූ පැරණි ක්‍රමය දෙස ඇතැම්හු කල්පනා කළහ. එවැනි හදිසි අවස්ථාවකදී කවර ආකාරයකින්වත් සහනයක් දැන් නොමැති යයි ඔව්හු පවසත්.

(ඇ) විධායක කමිටුව ඉටු කරන වැඩ කටයුතු පිළිබඳව දැන සිටියේ සමුපකාර සාමාජිකයින්ගෙන් ටික දෙනෙකි. ඔවුන් හා කළමනාකාරිත්වය අතර වඩාත් හොඳ අදහස් හුවමාරුවක් තිබිය යුතු බව ඔව්හු පැවසූහ.

(ඈ) කළමනාකාරිත්වය සමඟ සාකච්ඡාවලට සහභාගිවීමෙහි ලා අවස්ථාවක් නොතිබීම ගැන සංගමයේ නියෝජිතයෝ විරුද්ධත්වය පළ කළහ.

(ඉ) වෙනත් වැඩ කරනවා විනා පුහුණුවක් ලැබීම සඳහා කාලයක් නැතැයි ඇතැම් අය පැවසුවත් සමුපකාර සාමාජිකයින් හට එනා පුහුණුවක් ලැබී නැති බවට සාමාන්‍ය අදහසක් පැවතුණි.

මෙම කරුණු වලින් ප්‍රත්‍යක්ෂ වනුයේ සියුම් මාර්ගෝපදේශකත්වයක් ඉක්මනින් ලබා දීමේ සහ කළමනාකරණ කාර්යයෙහිදී සාමාජිකයින් තවදුරටත් සහභාගී වීමේ ඇති අවශ්‍යතාවයයි. එසේම සමුපකාර සමිතියේ හා වෘත්තීය සංගමයේ සම්බන්ධතාවයන්ද වැඩි දියුණු කළයුතු බවද ප්‍රත්‍යක්ෂ වේ.

## සමාජයීය විශ්ලේෂනය

සමාජයීය තත්වයෙන් බලන කල ගැටළු සහිත පෙදෙස වනුයේ කළමනාකාරිත්වය හා කම්කරුවන් අතර ඇති සම්බන්ධතාවයන් සහ පුරවැසි සාමාජිකයින් හා පුරවැසි නොවන කම්කරුවන් අතර ඇති සම්බන්ධතාවයයි.

I. කළමනාකරණ/කම්කරු සම්බන්ධතාවයන් පාන්සැම් ගොවිපලෙහි සීඝ්‍රාකාරයෙන් වෙනස් වී නැතත් පරිපාලන කාර්ය මණ්ඩලය අඩු කිරීම හේතුකොටගෙන කළමනාකාරිත්වයේ ප්‍රබල බව අඩු වී ඇත. එසේම සමුපකාරය ඇතුළත නව උසස් පංතියක් ඇති වී ද නොමැත. කංකානම්වරුන් තුන්දෙනා හටද ලැබෙනුයේ අනිකුත් සාමාජිකයින්ට ලැබෙන ආදායමම හෙයින් ඔවුන් අතර බරපතල වෙනසක් දක්නට නැත.

II. පුරවැසි නොවන්නන් හට සමුපකාරයේ සාමාජිකත්වය අහිමි කිරීම හේතුකොට ගෙන ඔවුන් හට හැඟී ගොස් ඇත්තේ ඉඩම සම්බන්ධයෙන් දීර්ඝකාලීන සංවර්ධනයකට වඩා තමන් කෙටිකාලීන ලාභයක් ලබා ගැනීම වැදගත් වන බවය. (කලින් සඳහන් කල රබර් ගස් දෙපැත්තම කැපීම සිදුව ඇත්තේ මේ නිසාය.) දෙවනුව මේ හේතුකොටගෙන සමුපකාරයේ සාමාජිකයින් ලබන ආදායමට අඩු ආදායමක් ලබන සමුපකාර සේවක ශ්‍රේණියක් ඇති කර තිබේ. මෙම ශ්‍රේණියට ලාභාංශ හා අනිකුත් වරප්‍රසාද හිමි නොවන්නේය. මේ තත්වය හේතුකොටගෙන මෙම කණ්ඩායම් දෙක අතර ඇති වෙනස වඩාත් පුළුල් වූ අතර කලින් වෘත්තීය සංගමයේ පුරවැසි නොවන්නන් මෙන්ම

පුරවැසියන්ද සිටියත් දැන් වෘත්තීය සංගමය සමන්විතව ඇත්තේ පුරවැසි නොවන කම්කරුවන්ගෙන් පමණකි.

මේ අනුව අප නිගමනය කරනුයේ පුරවැසි නොවන කම්කරුවන් ඉදිරියටත් ගොවිපලෙහි සිටිය යුතු නම් සමුපකාරයේ සාමාජිකයින් සමග සහභාගිත්වයෙන් වැඩ කිරීමට ඔවුන් උනන්දු කරවන සුළු කිසියම් උපක්‍රමයක් යෙදිය යුතු බවයි. මෙහි ලා ගත හැකි එක් ක්‍රියා මාර්ගයක් නම් සමුපකාර සාමාජිකයින්ට මෙන්ම ලාභාංශ සහ අනිකුත් වරප්‍රසාද ඇතුළුව එකම සේවා කොන්දේසි පුරවැසි නොවන කම්කරුවන්ටත් ලබා දීමයි; එසේම ප්‍රතිපත්ති සහ කළමනාකරණ තීරණවලට එළඹීමේදී පුරවැසි නොවන කම්කරුවන්ගේද සුභ සාධනය නියෝජනය වන පරිදි, ඔවුන්ගේ වෘත්තීය සංගමය මගින්, සමුපකාර සමිතියේත් විධායක කමිටුවේත් නියෝජනත්වය ඔවුන් හටත් ලබා දීමයි.

## 5.4 ඉඩම් ප්‍රතිසංස්කරණ සමුපකාර ජනාවාස පිළිබඳ අගැයීම

ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස පිළිබඳ සම්පූර්ණ අගැයීමක් ඉදිරිපත් කිරීමට තවම කල් මදි වුනත් පළමු මාස කිහිපය තුළ ලද අත්දැකීම් තුළින් උගෙන ගත හැකි පාඩම් පිළිබඳව අවබෝධයක් ඇති කරගෙන අනිකුත් සමුපකාර ගොවිපලවල අත්දැකීම් අනුසාරයෙන් ඒවා සමාලෝචනය කර අනාගතයේදී ඇති විය හැකි එවැනි ගැටළු මග හරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රයෝජනවත් වන්නේය.

කලින් පරිච්ඡේදවල අප අනුගමනය කළ මාතෘකා යටතේ සමුපකාර ජනාවාස පිළිබඳ අත්දැකීම් අප විසින් විග්‍රහ කරනු ලැබේ.

### 5.4.1 යෝජනා ක්‍රම සැළසුම් කිරීම

කලින් ජනාවාස තුළින්, විශේෂයෙන් සමුපකාර ගොවිපලවල් තුළින් ලද සැළසුම් පිළිබඳ අත්දැකීම් වලින් ඉඩම් ප්‍රතිසංස්කරණ සාමූහික ගොවිපලවල් අභ්‍යාසයක් ලබා ඇත. මෙම වාර්තාවේ කලින් පරිච්ඡේදවලදී අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා වලින් බොහොමයක් දැනටමත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ක්‍රියාත්මක කර තිබේ. මේ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමුපකාර ජනාවාස අංශයේ පළපුරුදු නිලධාරීන් විසින් මූලික සැළසුම් පිළියෙල කර ඇති අතර අය සහ වැය අවුරුදු පහක කාලසීමාවකට විසිර යන පරිදි එක් එක් ව්‍යාපාර වෙනුවෙන් වෙන් වෙන්ව වියදම් දක්වමින් ඒකීය සැළසුම් ක්‍රමයක් අනුගමනය කර තිබේ. මෙම සැළසුම් පොදුවේ ක්‍රියාත්මක කළහැකිවාක් මෙන්ම යථාර්ථවාදී බව පෙනී යයි.

වල් බිහි වූ බිම් කට්ටියක් මුල සිට සංවර්ධනය කිරීම සඳහා සැළැස්මක් ඉදිරිපත් කරනවාට වඩා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ සංවර්ධිත ගොවිපලක් සඳහා සැළැස්ම ඉදිරිපත් කිරීම ඇත්ත වශයෙන්ම පහසු කාර්යයකි. එමෙන්ම ලිඛිත සවභාවයේදී යහපත් සේ පෙනෙන සැළැස්මක් ඇතැම්විට ක්‍රියාත්මක කිරීමේදී එතරම් මනා තත්වයක නොතිබෙන්නට පුළුවන.

සැළසුම් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනු ලැබේද යන කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් විමසිය යුතු වේ.

1. සැළසුම්වල ඇතුළත් කර ඇති ව්‍යාපාර සංඛ්‍යාව සහ ඒවායේ ප්‍රමාණය වඩාත් අභියෝගශීලී වන්නේද?

ශ්‍රම ඌනතාවය, රෝපන ද්‍රව්‍ය හිඟකම සහ කළමනාකරණ හැකියාවන්හි ඌනතාවය ආදී කරුණු හේතුකොටගෙන ක්‍රියාවට පරිවර්තනය කළ නොහැකි නොයෙකුත් බෝග වගාවන් සංවර්ධන වැඩ සටහනට ඇතුළත් කිරීමට ඇතැම් අවස්ථාවන්හි නැඹුරුතාවය දක්වා ඇති බව සමුපකාර ගොවිපලවල් පිළිබඳව වූ පරිච්ඡේදයෙහි අපි සඳහන් කළෙමු. (115 වෙනි පිටුව) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජනාවාසයන්හි නිෂ්පාදනය හා රැකියා අවස්ථාවන් ප්‍රධාන වශයෙන් වැඩිවීම අපේක්ෂා කරනුයේ ශ්‍රම යෙදවුම, පොහොර භාවිතය සහ දැනටමත් තිබෙන වැවිලි කර්මාන්ත බෝග අතර වවනු ලබන අළුත් බෝග වර්ග ආදිය අනුසාරයෙනි. මෙසේ වෙනත් අධ්‍යයනයට යොමු වූ ඇතැම් වතුයායවල නව ව්‍යාපාර සෑහෙන ගණනාවක් සැළසුම් කර ඇත – පොල් සහ කෝපි අතර වෙනත් බෝග වර්ග වැවීම (සෙරපිස්, දම්මුලහේන, නෝමැන්ඩි) අත්හැර දමා ඇති තේ සහ රබර් ඉඩම්වල බෝග විවිධාංගකරණය (යැරෝ, ෆාන්හැම්) සත්ව පාලනය සහ කෘෂි–කර්මාන්ත ව්‍යාපාර (සෙරපිස්, නෝමැන්ඩි)

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාමූහික ජනාවාසයන්හි සැළසුම් කිරීමට අදහස් කරන ව්‍යාපාර, මෙම ගොවිපලවල් කලින් වතුයායවල් හැටියට පාලනය කරද්දී ඒවායේ තිබුණු ව්‍යාපාර සමඟ සසඳා V–35 සටහනෙහි දක්වා ඇත. එසේම එක් සාමාජිකයෙකු වෙනුවෙන් සැළසුම් කර තිබෙන සාමාන්‍ය බෝග අක්කර ප්‍රමාණයත් රජයට අත් කර ගැනීමට පෙර එම අක්කර ප්‍රමාණයත් මෙම සටහනෙහි සසඳා දක්වා තිබේ.

**සටහන V–35** ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාස – ඉඩම් භාවිතය පිළිබඳ තීව්‍රතාවයේ සහ රැකියා අවස්ථාවන්හි අපේක්ෂිත වැඩි වීම

| | සෙරපිස් | දම්මුලහේන | නෝමැන්ඩි | යැරෝ | ෆාන්හැම් | සාමාන්‍ය |
|---|---|---|---|---|---|---|
| 1. රජයට අත් කර ගැනීමට පෙර තිබූ මුළු ව්‍යාපාර සංඛ්‍යාව .. | 5 | 2 | 5 | 2 | 5 | 3.8 |
| 2. යෝජිත මුළු ව්‍යාපාර සංඛ්‍යාව .. | 11 | 7 | 8 | 5 | 7 | 7.6 |
| 3. වැඩිවීමේ ප්‍රතිශතය | 120% | 250% | 60% | 150% | 40% | 100% |

| | සෙරපිස් | දම්බුලගේන | කෝමැන්ඩ් | සැරෝ | ≠පාන්හැම් | සාමාන්‍ය |
|---|---|---|---|---|---|---|
| 4. අත් කර ගැනීමට පෙර සියළුම බෝග වර්ග වවා තිබූ අක්කර ප්‍රමාණය #, ¥ | 207 | 60 | 318 | 279 | 379 | 253 |
| 5. සියළුම බෝග වැවීමට යෝජිත මුළු අක්කර ප්‍රමාණය ¥ | 255 | 120 | 348 | 350 | 428 | 300 |
| 6. වැඩිවීමේ ප්‍රතිශතය | 23% | 100% | 9% | 17% | 13% | 19% |
| 7. අත් කර ගැනීමට පෙර මුළු කම්කරු සංඛ්‍යාව # | 39 | 20 | 30 | 213 | 145 | 89 |
| 8. යෝජිත සාමාජික/ කම්කරු මුළු සංඛ්‍යාව | 60 | 40 | 50 | 180 | 122 | 103 |
| 9. වැඩිවීමේ ප්‍රතිශතය | 54% | 100% | 67% | -15% | -16% | 16% |
| 10. අත් කර ගැනීමට පෙර එක් කම්කරුවෙක් හට සාමාන්‍ය බෝග අක්කර ප්‍රමාණය | 5.3 | 3.0 | 10.6 | 1.4 | 2.6 | 2.8 |
| 11. සාමාජිකයෙක්/ කම්කරුවෙක් හට යෝජිත සාමාන්‍ය අක්කර ප්‍රමාණය | 4.3 | 3.0 | 7.0 | 1.9 | 3.5 | 2.9 |
| 12. වැඩිවීමේ ප්‍රතිශතය | -19% | 0% | -34% | 36% | 35% | 3.6% |

---

සටහන: # රජයට අත් කර ගැනීමට පෙර කාලය සඳහා දක්වා ඇති ඇතැම් සංඛ්‍යාලේඛන දළ වශයෙන් සඳහන් කර ඇතත් අර්ථාන්විත සැසඳුමක් සඳහා ඒවායේ නිරවද්‍යතාවය ප්‍රමාණවත්ය.

¥ බෝග අතර වෙනත් බෝග වැවීම යෝජනා කරනු ලැබෙන අවස්ථාවන්හිදී වැවිලි කර්මාන්ත බෝග අක්කර ප්‍රමාණයෙන් 50% ක් ලෙස එවැනි බෝග වවන අක්කර ප්‍රමාණය සඳහන් කර ඇත. බෝග අතර තෘණ වැවීම සඳහා වූ අක්කර ප්‍රමාණය හැරුණ විට සත්ව පාලන ව්‍යාපාර ඇතුළත් කර නැත. පස්වෙනි අංකය යටතේ දක්වා ඇත්තේ, සැලැස්මේ තෙවැනි වසරේ අපේක්ෂිත ප්‍රමාණයයි.

සැළසුම්වල යෝජිත ව්‍යාපාර සංඛ්‍යාව අදාළ වතු රජයට ගැනීමට පෙර ඒවායේ තිබූ ව්‍යාපාර සංඛ්‍යාවට වඩා සාමාන්‍යයෙන් දෙගුණයක් වන බවත් මුළු බෝග අක්කර ප්‍රමාණය අවුරුදු දෙකක් පමණ කාලයක් ඇතුළත 19% කින් පමණ වැඩි වෙතැයි අපේක්ෂා කරන බවත් මෙම සටහනින් පෙනී යයි. සේවක සංඛ්‍යාව වැඩි වී ඇති අතිකුත් නව ව්‍යාපාර බොහොමයක් සඳහා අවශ්‍ය වන නිපුනතාවයන් ගොවිපලවල දැනටමත් පවතින නිසාත් එම ඉලක්ක යථාර්ථවාදී වන්නේය. මෙහි ලා ඇසිය යුතු එකම ප්‍රශ්නය නම් පොල් සහ වෙනත් බෝග වගාවන් යට විවිධ බෝග වගා කිරීම හේතුකොටගෙන වැවිලි කර්මාන්ත බෝග කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොකර අපේක්ෂිත ආදායම් ප්‍රමාණයන් ලැබේවිද යන්නයි.1/ අනාගතයේ පොහොර ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පවතිනුයේ අවිනිශ්චිත තත්වයකි. ඒනිසා පසෙහි පොහොර රසය සඳහා වැවිලි කර්මාන්ත බෝග සමඟ තරඟ කරන (මයියොක්කා සහ ධාන්‍ය වැනි බෝග) බෝගවලට වඩා පසෙහි සරු බව නැවත ඇති කරන වෙනත් බෝග වැවීම වඩාත් හොඳ බව පෙනී යයි (තණ වැනි). වැවිලි කර්මාන්ත බෝග සඳහා මෙන්ම ඒවා අතර වවා ඇති අතිකුත් බෝග සඳහාද ජලය ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමද වැදගත් වන්නේය. එක් වසරකට හෝ දෙකකට පසුව මෙම කරුණු සිහියේ තබාගෙන සැළසුම් සමාලෝචනය කිරීමද වැඩදායක වේ.

II. රජයට අත් කරගෙන ඇති වතු යායවල රැකියා අවස්ථාවන් ලබා ගත හැකි උපරිම ප්‍රමාණය ඇති කර තිබේද?

රජයට අත් කර ගැනීමෙන් පසුව ඉහත සඳහන් කළ වතු යායවල රැකියා අවස්ථා 16% කින් වැඩි වී ඇති බව V-35 සටහනින් පෙනී යයි. මෙයින් දැක්වෙනුයේ එක් වතුයායක 100% ක වැඩි වීමක් සහ තවත් වතුයායක 16% ක අඩු වීමක් පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචල්‍යයකි. කෙසේ වෙතත් යැරෝ සහ ✓පාන්හැම් ගොවිපල දෙකේ සේවයෙහි යොදවනු ලැබ ඇති සේවක සංඛ්‍යාවේ අඩුවීම නොමග යවන සුළුය; මෙකී තත්වය අනුව හැඟී යනුයේ කලින් සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවෝ වත්ත රජයට අත් කර ගත් දිනය තෙක් සෑම දිනකම සේවය කළ බවකි. ඇත්ත වශයෙන්ම තත්වය එසේ නොවීය. මුල් හිමිකරුවන් දක්වා ඇති සේවා මිනිස් දින ගණන පිළිබඳ සංඛ්‍යාව දැන ගත හැකි නම් රජයට අත් කර ගැනීමෙන් පසුව එම සංඛ්‍යාව සාමාන්‍යයෙන් වැඩි වූ බව දකින්නට තිබුනි.

ශ්‍රම ඌනතාවය හේතුකොටගෙන සංවර්ධන වැඩ සටහන ප්‍රමාද වී ඇතැයි අප සඳහන් කළ යැරෝ සහ ✓පාන්හැම් ගොවිපලවල්වලට, තව තවත් පුද්ගලයින් බඳවා ගත හැකි බවට තර්ක කිරීමට පුළුවන. කෙසේ වුවද සමූපකාර ගොවිපලවල් පිළිබඳව වූ පරිච්ඡේදයෙහි

---

1/ පොල් වගාවන් යට පොහොර රසය තදින් උරා ගන්නා මයියොක්කා වැනි බෝග වවා ඇති අවස්ථාවලදී සහ පොල් වගාවට හෝ මයියොක්කා වගාවට හෝ යන දෙකටම පොහොර ලබා ගැනීමට නොහැකි අවස්ථාවලදී මෙය විශේෂයෙන් වැදගත් වන්නේය. කෙසේ වෙතත් මයියොක්කා වවා ඇති අක්කර ප්‍රමාණය බොහෝසෙයින් විශාල නොවේ. ආහාර නිෂ්පාදන ව්‍යාපාරය නිසා දියත් කළ හදිසි පියවරක් වශයෙන් මෙය සැළකිය හැකිය.

(131 පිටුව) පෙන්වා දී ඇති පරිදි ආරම්භක වශයෙන් ශ්‍රම අවශ්‍යතාවයන් පිළිබඳව වැඩියෙන් සලකනවාට වඩා ඒ ගැන පුළු කොට තැකීම අගනේය. අවශ්‍යතාවයන් උද්ගත වනවිට නව සාමාජිකයින් පහසුවෙන් බඳවා ගැනීමට පිළිවන් වුවත් රැකියා අවශ්‍යතාවන් සහ ආදායම් තත්වය ප්‍රමාණවත් නොවන අවස්ථාවක සේවයේ නිරත සේවක සංඛ්‍යාව අඩු කිරීම අතිශයින් දුෂ්කර කාර්යයකි. එසේම ඉඩම් භුක්තිය සහ කළමනාකරණය පිළිබඳ නව සංකල්ප කුඩා ජන සමූහයකට හඳුන්වා දීම ඒවා විශාල ජන සමූහයකට අවබෝධ කර දීමට වඩා පහසු වන්නේය. අවසාන වශයෙන් කිව යුත්තේ ඇතැම් ගොවිපලවල්වල දැනට සිටින ශ්‍රම හමුදාව පිළිබඳව පවා ඇතැම් ගැටළු උද්ගතව ඇති බවයි. (නිදසුන් වශයෙන් සෙරපිස් වතුයාය 212 පිටුව, /පාන්හැම් වතුයාය 248 පිටුව) මේ හේතුකොටගෙන බැහැරින් විශාල සාමාජිකයින් සංඛ්‍යාවක් සේවයෙහි නිරත කරවීම පිළිබඳව සළකා බැලිය නොහැක.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාසවල රැකියා අවශ්‍යතාවයන් සැපයීම පිළිබඳ තත්වය මෙතෙක් සතුටුදායක බව පොදුවේ අපි අදහස් කරමු. එක් අවුරුද්දකින් හෝ දෙකකින් පමණ ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව රැකියා අවස්ථාවන් පිළිබඳ මට්ටම තවදුරටත් වැඩි කිරීමට හැකි වන බවට සැකයක් නොමැත.

III. යෝජිත ආයෝජන හා ප්‍රතිලාභ සාධාරණ සේ පෙනී යන්නේද?

මෙම ප්‍රශ්නය අංශ තුනකින් සළකා බැලිය යුතුය. පළමුව යෝජිත ආයෝජනය වතුයාය පුනරුත්ථාපනය කිරීමට තරම් ප්‍රමාණද යන බව, දෙවනුව යෝජිත ආයෝජනය ලබා ගැනීමට හැකියාවක් තිබේද යන බව සහ තෙවනුව ඇස්තමේන්තු කර ඇති ප්‍රතිලාභ යථාර්ථවාදී යන්නේද යන බවයි. දැනට ලබා ගත හැකි පරිදි මෙම අදාල තොරතුරු V-36 සටහනෙහි දැක්වේ.

<u>සටහන V-36</u> ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාස, ආයෝජන සහ ප්‍රතිලාභ

| | සෙරපිස් | දම්මුලහේන | කෝවැන්ඩි | යැරෝ | /පාන්හැම් |
|---|---|---|---|---|---|
| 1. 1972/73 සංඛ්‍යා ලේඛන: | | | | | |
| (අ) ආයෝජනය | ලැ.නැ. | ලැ.නැ. | ලැ.නැ. | ලැ.නැ. | 300,751 |
| (ආ) ප්‍රතිලාභ | ලැ.නැ. | ලැ.නැ. | ලැ.නැ. | ලැ.නැ. | 223,137 |
| 2. 1973/74 යෝජනා | | | | | |
| (අ) ආයෝජන | 148,800 | 82,720 | 129,055 | 223,539 | 266,615 |
| (ආ) ප්‍රතිලාභ | 221,580 | 82,500 | 107,545 | 246,240 | 376,615 |

| | සෙරපිස් රු. | දම්බුලගේන රු. | නෝමැන්ඩි රු. | ඩැරෝ රු. | ≠පාන්හැලී රු. |
|---|---|---|---|---|---|
| 3. 1973 අත්දැකීම් | | | | | |
| (අ) පළමු මාස 4–8 තුළ ආයෝජනය (දළ වශයෙන්) | 43,510 | 23,124 | 7,565 | 111,019 | 116,889 |
| (ආ) පළමු මාස 4–8 තුළ ආදායම (දළ වශයෙන්) | 46,609 | 3,630 | 16,425 | 85,911 | 222,964 |
| (ඇ) ඇස්තමේන්තුගත වැයෙහි අඩු ප්‍රතිශත ප්‍රමාණය# | – 30% | – 60% | – 85% | + 100% | – 10% |
| (ඈ) ඇස්තමේන්තුගත අයෙහි අඩු ප්‍රතිශත ප්‍රමාණය | – 50% | – 90% | – 75% | + 50% | + 20% |

---

සටහන:

\# මෙම නිගමනයට එළඹ ඇත්තේ පළමු මාස කිහිපය තුළ ආදායම සහ වියදම පිළිබඳ තත්වය අවුරුද්දේ ඉතිරි කොටසෙහිද්ද අඛණ්ඩව පවතිය යන උපකල්පනය මතය. විශේෂයෙන් දම්බුලගේන සහ නෝමැන්ඩි ගොවිපලවල් පිළිබඳව සළකන කල්හි මෙම උපකල්පනය ඇත්ත වශයෙන්ම වැරදි සහිතය. එහෙත් සිදු විය හැකි අඩුපාඩු පිළිබඳව එය දළ වශයෙන් පෙන්නුම් කරයි.

මූල්‍ය සැළසුම් පිළිබඳව විධිමත් විග්‍රහයක් කිරීමට තරම් කවම කල් මදි බව අවධාරනයෙන් සඳහන් කළයුතුව තිබේ. එහෙත් වැදගත් කරුණු කිහිපයක් පමණක් උපුටා දැක්විය හැක.

(අ) දැනට පවතින තත්වය සාමාන්‍යයෙන් සතුටුදායක සේ දක්නට ලැබෙන ≠පාන්හැලී ගොවිපල සම්බන්ධයෙන් හැර (V–36 සටහනේ 1 වෙනි අංකය) අනෙක් අවස්ථාවලදී ගොවිපලවල් පිළිබඳව යෝජිත ආයෝජන කලින් අවුරුදුවල කළ වියදම සමග සංසදනය කළ නොහැක. සැළසුම්වල (V–36 සටහනේ 2 වෙනි අංකය) ආයෝජන සංඛ්‍යාලේඛන ගණන් බලා ඇත්තේ එක් එක් බෝගයක් පිළිබඳව නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හා ආහාර හා

කෘෂිකර්ම සංවිධානයේ මූලාශ්‍ර මගින් ලබා ගත් තොරතුරු අනුවය. මෙම තොරතුරු යථාර්ථවාදී සේ පෙනේ. ඉඩමෙහි වටිනාකම මේවාහි ඇතුළත් කර නොමැත. ( 274 පිටුව බලන්න)

(ආ) යෝජිත සියළුම ආයෝජන සඳහා මුදල් ලබා ගත හැකි වේද යන්න වෙනත් ප්‍රශ්නයකි. පළමු මාස කිහිපය තුළ 10% සිට 85% තෙක් වෙනස් වන සැළසුම් වැය පිළිබඳ අඩුපාඩුකම් V-36 සටහනේ 3 (ඇ) අංකයෙන් පෙන්නුම් කෙරේ. කලින් ඉල්ලා සිටි බැංකු ණය මුදල් අවුරුද්දේ දෙවන භාගයේදී ලැබීමට ඉඩ ඇති හෙයින් මෙම අඩුපාඩුකම් බොහෝදුරට මග හැරී යනු ඇත. (සමීක්ෂණය කළ අවස්ථාවෙහි බැංකු වලින් ඉල්ලා සිටි සම්පූර්ණ ණය මුදල වන රු. 145,000/- කින් ලැබී තිබුනේ රුපියල් 25,000/- ක ණය මුදලක් පමණි) ආයෝජන අඩුපාඩුකම්, ප්‍රාග්ධන සූක්ෂම නිෂ්පාදන ක්‍රමයන්ට වඩා ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ක්‍රමයන් උපයෝගී කර ගැනීම හේතුකොටගෙන මග හැරී ගොස් ඇත. කෙසේ වෙතත් ප්‍රාග්ධන හිඟය නිසා ගොවිපලවල්වල සංවර්ධන වේගය පහත බැස යාමේ අන්තරාය පවතින සේ පෙනෙන හෙයින් හැකිතාක් දුරට එම තත්වය නැති කර ගැනීමට ආධාර විය යුතුය.[1] බහුල වශයෙන් ආයෝජනයන් කිරීමේදී ඇති වන අවදානම වැඩියෙන් දක්නට ලැබෙන අඩු සංවර්ධිත තත්වයක් පවතින වතුයායවල් සම්බන්ධයෙන් (දම්මුලගේන, යැරෝ ආදිය සම්බන්ධයෙන්) මෙම තත්වය විශේෂයෙන් වැදගත් වේ. එවැනි අවස්ථාවන්හිදී අවශ්‍ය අරමුදල් අත්තිකාරම් දීමට බැංකු ආයතනද අකමැත්තක් දැක්වීමට ඉඩ තිබේ.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ පිළිබඳ විස්තර ලබාගෙන ඇත්තේද ඇස්තමේන්තුගත වියදම් පිළිබඳ විස්තර ලබා ගත් මූලාශ්‍රයෙනි. මේවා සාධාරණ සේ පෙනී යයි. ඇත්තවශයෙන්ම යැරෝ සහ පාන්හැඩි ගොවිපල පිළිබඳව සළකන කල දැනටමත් අපේක්ෂිත ප්‍රතිලාභ පිළිවෙලින් 50% කින් සහ 20% කින් ඉක්මවා ඇත. ආදායම් පිළිබඳ අනිකුත් ගොවිපලවල්වල ඇති ඌනතාවයන් එතරම් වැදගත් නොවනුයේ වැල් දොඩම්, කෙසෙල් ආදී බෝග වලින් ලැබෙන ආදායම අවුරුද්දේ දෙවන භාගය වන තෙක් අපේක්ෂා නොකරන හෙයිනි. එමෙන්ම අනිකුත් ආයෝජන වලින් ලැබෙන ප්‍රතිලාභද දීර්ඝකාලීන වන්නේය.

සාමාන්‍යයෙන් සළකන කල මෙම ගොවිපලවල් පහ සඳහා සකස් කර ඇති මූල්‍ය සැළසුම් ශක්තිමත්ව පදනම් කර ඇති සේ පෙනේ. පහත් පිරිවැය හා ශ්‍රම සූක්ෂම ක්‍රම හොඳින් උපයෝගී කරගෙන ඇති අතර බොහෝ අවස්ථාවලදී ප්‍රාග්ධන ඉල්ලුම් පවතිනුයේ ඉක්මනින් සැපයිය

---

1/ මෙහිලා ප්‍රධාන වනුයේ ප්‍රාග්ධන හිඟකම නිසාම පමණක් උද්ගතව නොමැති පොහොර හිඟකමයි.

සුළු අත්‍යවශ්‍ය යෙදවුම් සඳහා පමණකි. රජයට අත් කර ගැනීමට පෙර, ණය මුදල් ලබා ගැනීම සඳහා තිබුණු පහසුකම් අඩු වීමට හේතු වූ අවිනිශ්චිතභාවය රජයට අත් කර ගැනීමෙන් පසුවද එපරිද්දෙන්ම තිබීමට ඉඩ නොහැරිය යුතුය. එවැනි තත්වයක් වුවහොත් ගොවිපලේ සංවර්ධනය ප්‍රමාද වී සාර්ථකත්වය ළඟා කර ගැනීමට ඇති අවස්ථාවන් අඩු වනු ඇත.

IV. පසු අවස්ථාවන්හිදී තරුණ සමූපකාර සමිතිවලට සේවාවන් සපයන ප්‍රාදේශීය දෙපාර්තමේන්තු නිලධාරීන් (කෘෂිකර්ම උපදේශකවරු, සමූපකාර පරීක්ෂක නිලධාරී යනාදීහු) සංවර්ධන සැළැස්ම සකස් කිරීමෙහි ලා සහභාගී වූයේද?

සාමූහික ජනාවාස යන අදහස නව සංකල්පයක් හෙයින් ප්‍රාදේශීය නිලධාරීන් හට එවැන්නක් පිළිබඳව අත්දැකීම් නොමැතිය යන තර්කය මත ප්‍රාදේශීය රජයේ නිලධාරීන්ගෙන් වෙන්ව තනිව කටයුතු කිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සැලසුම්කරුවන් නැඹුරුතාවයක් දක්වන බව පෙනී ගියේය. මෙම තර්කයෙහි කිසියම් සත්‍යතාවයක් ඇතත් එකී නිලධාරීන් නොසලකා හැරීමෙන් අවසානයේදී නිෂ්පාදකත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති වන්නට පිළිවන. (සමූපකාර ගොවිපලවල් පිළිබඳව විස්තර කෙරුණු පරිච්ඡේදයෙහි දක්වා ඇති පරිදි සාමූහික ගොවිපල පිළිබඳ සංකල්පයේ ආර්ථිකමය වැඩදායක බව කෙරෙහි තදින් සැක පහල කරන නිලධාරීන්ද සිටීමට පිළිවන) ආරම්භයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම ක්‍රියාත්මක කරන නව ජනාවාස යෝජනා ක්‍රම 30 කට වැඩි ගණනක් තිබෙන හෙයින් මේ එක් එකී ජනාවාසයක් කෙරෙහි පෞද්ගලිකව සැළකිලිමත් වීම අපහසු වන නිසා විශේෂයෙන් එවැනි අවස්ථාවලදී ඉහතකී රජයේ නිලධාරීන්ගේ සේවය සමූපකාරවලට අවශ්‍ය වනු ඇත.[1/] දෙවනුව සලකා බැලිය යුත්තේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙහි පුහුණුවක් ලත් ජනාවාස සැළසුම්කරුවන් සිටින හෙයින් ඔවුන්ගේ අත්දැකීම් ප්‍රාදේශීය රජයේ නිලධාරීන්ට සහ සමූපකාර සාමාජිකයින්ටත් ලබා දීම වැදගත් වන බවය.

V. සමූපකාර සාමාජිකයින් ප්‍රමාණවත් අයුරින් සැළසුම් කාර්යයට සහභාගී වී ඇත්ද?

මේ සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ප්‍රතිපත්තිය පැහැදිලිය. ( 202 පිටුව) ඇතැම් අවස්ථාවලදී මූලික සැළැස්ම පිළිබඳ අවබෝධයක් සාමාජිකයින්ට ලබා දීමට ප්‍රයත්න දරා ඇත. කෙසේ වෙතත් සම්මුඛ පරීක්ෂණයට යොමු කළ සාමාජිකයින්ගේ සාමාන්‍ය අදහස වූයේ එම සැළසුම් ඔවුන් විසින්ම සකස් කරන ලද සැළසුම් යයි හැඟීමක් ඔවුන් තුළ නොමැති බවයි. මෙම ඌනතාවය මග හරවා ගත යුත්තේ තවදුරටත් කරුණු පැහැදිලි කිරීම් හා සාකච්ඡා අනුසාරයෙනි. එවැනි සාකච්ඡාවලට ප්‍රාදේශීය නිලධාරීන්ද සහභාගී විය යුතුය.

---

1/ සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ කාර්ය භාරය පැවරෙන විධායක කමිටුවට බොහෝ අවස්ථාවලදී අදාළ රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් පත් කර ඇති බව සැළකිල්ලට ගත යුතුය. ඔවුන්ගේ සහභාගීත්වය අඩු වූයේ යෝජනා ක්‍රම පිළිබඳ සැළසුම් සකස් කිරීමෙහිදීය. කෙසේ වෙතත් පසුව ඔවුන්ගේ සහභාගීත්වය මේවාට ලැබුණි.

## 5.4.2 සමූපකාර සාමාජිකයින් තෝරා ගැනීම, තෝරා ගැනීමේ මාර්ග සහ ජනාවාසයෙහි පදිංචි කරවීම

ඉඩම් ප්‍රතිසංස්කරණ සාමූහිකයන්හි පදිංචි වී සිටින සාමාජිකයෝ කරුණු තුනකින් අනිකුත් ජනාවාසයන්හි පදිංචි කරුවන්ගෙන් වෙනස් වෙති. පළමුව, වතුයායක දැනට සිටින ශ්‍රම හමුදාවෙන් පුරවැසි සේවකයෝ නිරායාසයෙන්ම සාමාජිකත්වය ලබති. දෙවනුව, වතුයායෙන් පරිබාහිරව අතිරේක සාමාජිකයින් තෝරා ගැනීමේ කාර්යය අනිකුත් ජනාවාස වර්ගවලට වඩා මෙහිදී පැවරෙනුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වෙතය. තෙවනුව, කලින් වතුයායෙහි සේවය කල පුරවැසි නොවන කම්කරුවෝ ඉඩම් ලැබීමට හිමිකම් නොලබන හෙයින් (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 23 (අ) වගන්තිය) ඔව්හු සමූපකාරයේ සාමාජිකත්වයද නොලබන අතර ඉදිරියටත් සමූපකාර සමිතියට සේවය කිරීමේ අවස්ථාව ඔවුන් හට සළසා දී ඇත. මේ අනුව පුරවැසි නොවන කම්කරුවෝ සමූපකාරයේ සාමාජිකයින් සමඟ එක්ව වැඩ කරන සමූපකාරයේ සේවකයින් ගෙන් කොටසක් බවට පත් වෙති. අපගේ නියැදියෙහි දක්වා ඇති ගොවිපලවල් පහේ සාමාජිකයින් තෝරා ගැනීම පිළිබඳ තත්වය V-37 සටහනින් දැක්වේ.

සටහන V-37 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාස - සහභාගි වන්නන්ගේ ප්‍රභවය

| ජනාවාසය | නිරායාසයෙන්ම තෝරා ගනු ලැබූ පැරණි වතු කම්කරුවෝ (පුරවැසි) | බැහැරින් තෝරා ගත් නව සාමාජිකයෝ | සමූපකාර විසින් සේවයෙහි යොදවනු ලබන පුරවැසි නොවන වතු කම්කරුවෝ | එකතුව |
|---|---|---|---|---|
| සෙරපිප් | 34 | 17 | 5 | 56 |
| දම්බුලහේන | - | 40 | - | 40 |
| කෝමැන්ඩි | 35 | 15 | - | 50 |
| යැරෝ | 30 | 47 | 120 | 197 |
| පාන්හැම් | 48 | - | 80 | 128 |
| එකතුව | 147 | 119 | 205 | 471 |

මෙම තත්වය අනුව උද්ගත වන ප්‍රතිඵල තෙ ආකාරය.

(I) තෝරා ගැනීම් පිළිබඳ ස්ථිර නිශ්චය පිළිම

අනිකුත් ජනාවාස වර්ග තුළෙහි ලද අත්දැකීම් අනුසාරයෙන් සාමාජිකයින් තෝරා ගැනීම පිළිබඳව දැනට පවතින නිශ්චය පිළිම වෙනස් කිරීම වැඩදායක යයි සළකනු ලැබුවත් තෝරා ගැනීමේ ක්‍රමය වෙනස් කිරීම සඳහා සාපේක්ෂ වශයෙන් අවශ්‍යතාවයක් නොපෙනේ. කෙසේ වෙතත් සමූපකාර සඳහා නව සාමාජිකයින් තෝරා ගැනීමේදී වයස, අධ්‍යාපනය,

ගොවිතැන් කටයුතු පිළිබඳ පළපුරුද්ද ආදී සාමාන්‍ය අවශ්‍ය කරුණු හැරෙන්නට සාමූහික වශයෙන් ගොවිතැ න් කිරීමේ ක්‍රමයට ඔවුන් දක්වන ලැදියාව පිළිබඳවද සැලකිලිමත් වී ඇත. තරුණ සාමාජිකයින් එකාවන්ව බැඳීමේ ලා මෙම තත්වය තෝමැන්ඩි හා දම්මුලහේන ගොවිපලවල්වලට ආධාරකාරී වී ඇති බව පෙනී යයි. කෙසේ වෙතත් සෙරපිස් ගොවිපලෙහි මෙම තත්වය බැඳියාවක් ඇති කර ගැනීමට හෝ උසස් ශ්‍රම ඵලදායිතාවයකට හෝ තවම තුඩු දී නොමැත.

සාමාන්‍යයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාසවලදී මෙන්ම අනිකුත් ජනාවාස සම්බන්ධයෙන්ද අපට නිගමනය කළහැකි වන්නේ සමූපකාරයකට බැඳී සාමාජිකයින් මුල් කාලය තුළදී ලබන අත්දැකීම් සහ ඔවුන් ලබන පුහුණුව හා මාර්ගෝපදේශකත්වය ඔවුන්ගේ මුල් පසුතලයට වඩා වැදගත් බවය.

(II) පැරණි වතු කම්කරුවන් සහ තරුණ සාමාජිකයින් අතර පවතින බෙදීම

දම්මුලහේන හැරෙන්නට අනිකුත් සමූපකාරවල සාමාජිකයින් අතර ඔවුන් තුළින්ම පැන නැගුණු විවිධතාවයන් දක්නට ඇත. පැරණි වතු කම්කරුවෝ වැඩි දෙනෙක් විවාහකයින් වන අතර ඔව්හු උසස් අධ්‍යාපනයක් ලබා නැත. එසේම ඔවුන්ගේ ක්‍රියාරම්භක ශක්තිය හීන බවත් යටහත් පහත් බවක් ඔවුන් තුළ ඇති බවත් සැළකේ. අනෙක් අතට තරුණ සාමාජිකයෝ අවිවාහක සැහෙන අධ්‍යාපනයක් ලත් අය වන අතර දේශපාලනමය අවබෝධයක්ද ඔවුන් හට ඇත. මෙම සම්බන්ධීකරණය ඉකුත් පරිච්ඡේදයෙන් යෝජනා කරන ලද පරිදි (136 පිටුව) බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නට පිළිවන. එසේ වනුයේ පැරණි සාමාජිකයින්ගේ පරිනතබව සහ පළපුරුද්ද තරුණ සාමාජිකයින්ගේ උද්යෝගය හා දෘෂ්ටිය සමඟ සමතුලනය වන බැවිනි. එසේම අසල්වැසි ගම් වලින් පැමිණෙන තරුණයින් හට ජනාවාසයත් අසල්වැසි පෙදෙසත් අතර පවතින පරතරය පියවීමෙහි ලා කටයුතු කිරීමට පිළිවන.

කෙසේ වුවද සමීක්ෂණය කරනු ලැබූ දින වන විට පවා මෙම කණ්ඩායම් දෙක එක් කර එනයින් ලබා ගතහැකි ප්‍රබල හැකියාවන් සාක්ෂාත් කර ගැනීම පහසු කාර්යයක් නොවන බව වැටහී තිබුණි. සෙරපිස් වතුයායෙහි පැරණි කම්කරුවෝ මුල සිටම තරුණයින්ගේ සහභාගිත්වය කෙරෙහි අකමැත්තක් පළ කළ අතර පසුව තරුණයින් සිය නිවෙස්වල සිට පැමිණෙද්දී පැරණි කම්කරුවෝ වතුයායෙහි වැඩ කළත්, ඒකාබද්ධතාවයකට එය තුඩු නුදුන්නේය. තෝමැන්ඩි වතුයායෙහිද තරුණ සහ වැඩිමහල් සාමාජිකයින් අතර විෂමතාවයන් උද්ගත වීනි (235 පිටුව බලන්න). ජාන්හැම් වතු යායෙහි සිදු වූයේ බැහැරින් තෝරා ගනු ලැබූ තරුණයින් පැරණි කම්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පුළුවන්දැයි දැන ගැනීමටවත් මද කලක් හෝ නොසිට ගොවිපලෙහි ටික දිනක් වැඩ කර එය අත්හැර යාමයි. (245 පිටුව බලන්න) යැයේ ගොවිපලෙහි තත්වය ඊටත් වඩා උග්‍ර විය. පැරණි කම්කරුවන් තුළ තිබූ තමන් කම්කරුවන් යයි සැමවිටම සළකන මානසික තත්වය

ඉවත දැමීමට නොහැකි වන්නේ යයි ප්‍රාදේශීය දේශපාලකයින් විශ්වාස කළ හෙයින් ඔවුහු පැරණි කම්කරුවන් අභිබවා තරුණ සාමාජිකයින් කාරකසභිකයින් වශයෙන් පත් කළහ. (256 පිටුව බලන්න) කම්කරුවන්ගේ මෙවැනි මානසික තත්වයක් පිළිබඳව ඇති විශ්වාසය අතිශයෝක්තියෙන් යුතුව දැක්වීමට පිළිවන් බව අපට පෙනෙන අතර මෙම තරුණ හේතුකොටගෙන ජන සමාජයේ කොටස් දෙක අතර පවතින පරතරය තව තවත් පුළුල් වීමට ඉඩ ඇත.

මේ ආකාරයෙන් මුල් අවස්ථාවේදී බෙදී ගිය සාමූහික ජනාවාසයක් පිළිබඳව සළකා බැලුවද අවසාන වශයෙන් ඒකාබද්ධතාවයක් ඇති කිරීම අපහසු කාර්යයක් යයි අපි නිගමනය නොකරමු. ඇතැම් අවස්ථාවල මෙම ඒකාබද්ධතාවය ළඟා කරගෙන ඇත.1/ කෙසේ වෙතත් මෙම කණ්ඩායම් දෙකම සිය අන්‍යොන්‍ය සුභ සාධනය කෙරෙහි සැලකිල්ලක් දක්වා එක් කණ්ඩායමක් වශයෙන් එකාවන්ව වැඩ කිරීමේ කාර්යයට එළඹීමට පෙර තවදුරටත් පුහුණු කිරීම් සහ සාමූහික සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ඔවුනට ලබා දීම අවශ්‍ය වන්නේය.

(III) පුරවැසි සමූපකාර සාමාජිකයින් හා පුරවැසි නොවන වතු කම්කරුවන් අතර පවතින භේදය

පුරවැසි නොවන සංඛ්‍යාව බෙහෙවින් අඩු ප්‍රමාණයක් සිටින පොල් වතුවල සහ මිශ්‍ර වැවිලි බෝග වලින් යුත් වතු යායවල මෙම ගැටළුව දක්නට නොලැබුණි. පුරවැසි සාමාජිකයින් හෝ වේවා පුරවැසි නොවන සේවකයින් හෝ වේවා සියළුම කම්කරුවන් සමානාත්මකව සළකනු ලැබෙන යැරෝ ගොවිපලෙහි මෙම ප්‍රශ්නය තවමත් එතරම් උග්‍ර නැත. පුරවැසි නොවන කම්කරුවන් හට සමූපකාර සමිතියේ සාමාජිකත්වය ලැබීමට අවකාශ දී නැති හෙයින් එනයින් අසහනයකට පත්ව සිටින එවැනි කම්කරුවන් ඇති /පාන්හැම් වතුයායෙහි මෙම ගැටළුව උග්‍ර තත්වයකට පත්ව ඇත. ගොවිපලේ වැඩ කටයුතු දියුණු කිරීම සඳහා ඔවුන් ධෛර්යමත් කිරීමට මේ අයුරින් අනුබල නොලැබෙන හෙයින් එම ගොවිපලේ අනාගත ස්ථිරත්වය උදෙසා මෙම සාධකය බලවත් තර්ජනයක්ව පවතී. (256 වෙනි පිටුව) පුරවැසි නොවන කම්කරුවන් වැඩි වශයෙන් සිටින රජයට අත් කර ගත් අනිකුත් වතු ගණනාවකද මෙම ප්‍රශ්නය දක්නට ලැබුණි.2/

---

1/ නිදර්ශනයක් වශයෙන් බැද්දේගම සමූපකාර ගොවිපල (3 වන පරිච්ඡේදය බලන්න)

2/ අවිත්ව ජන සමූහයක් තිබීම හේතුකොටගෙන ආර්ථිකමය වශයෙන් පමණක්නොව සමාජයීය වශයෙන්ද අවදානම් තත්වයන් ඇති වේ. ඊශ්‍රායලයෙහි කිබුට්ස් නමින් දක්නට ලැබෙන සාමූහික ගොවිපලවල් වලින් ලද අත්දැකීම් තුළින් මේ සඳහා උපදෙස් ලබා ගැනීමට පිළිවන. පුරවැසි නොවන අරාබි කම්කරු ශ්‍රමය මත හදිසි රැඳා පැවැත්මක් පැවති අවස්ථාවලදී එම සාමූහිකයන්හි සාමාජිකයින් බොහෝ දෙනෙක් වැඩ කටයුතු නොකර නිකරුණේ කාලය ගත කිරීමේ නැඹුරුතාවයට යොමු විය. මේ හේතුකොටගෙන සේව්‍ය සේවක සමානාත්මතාවය හැරෙන්නට, සාමූහික ජන සමූහයද ශ්‍රමය කුලියට ගැනීමට කැමැත්තක් දැක්වූවෝ සහ අකමැත්තක් දැක්වූවෝ වශයෙන් බෙදී ගියේය.

මෙකී ගැටළුව සඳහා ප්‍රාථමිකව පවතින දේශපාලනික විසඳුම ගැන අදහස් දැක්වීමට බලාපොරොත්තු නොවන අතර මෙම ප්‍රශ්නය ප්‍රායෝගික විසඳුමක් සොයා ගත යුතු ප්‍රායෝගික ප්‍රශ්නයක්ද වන්නේය. සමූපකාර සමිතිය විසින් සේවයෙහි නිරත කරනු ලැබ සමූපකාර සාමාජිකයින් සමඟ එක්ව වැඩ කරන පුරවැසි නොවන කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම, ඉදිරියටත් ක්‍රියාත්මක කළ නොහැකි බව පෙනී යයි. මෙහි ලා කරුණු දෙකක් සඳහන් කිරීමට පිළිවන. පළමුව පුරවැසි නොවන්නන් සාමූහික ගොවිපලෙහි රැඳී සිටින්නේ නම් එකම වැටුප් සහ අනිකුත් වරප්‍රසාද වැනි එකම සේවා කොන්දේසි සමූපකාර සාමාජිකයින්ට මෙන්ම ඔවුන්ට ලබා දීමත් කළමනාකරණ කමිටුවෙහි ඔවුන්ද යම්කිසි ආකාරයකින් නියෝජනය වන අයුරින් විධි විධාන යෙදීමත් වැඩදායක බව පෙනී යයි. මෙය ක්‍රියාත්මක වුවහොත් පුරවැසි නොවන්නන්ගේ සුභසිද්ධියද පුරවැසියන්ගේ සුභසිද්ධිය මෙන්ම සම තත්වයකට පත් වන අතර කඩාකප්පල්කාරී ක්‍රියාවන් හා අනිකුත් අන්තවාදී ගැටීම් පිළිබඳ අවදානම අඩු වනු ඇත. දෙවනුව අනාගතයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරෙන වතුයායවල පුරවැසි නොවන කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින්නේ නම් අනුගමනය කළයුතු සරල විසඳීම සේ පෙනෙනුයේ මෙම වතුයායවල් රාජ්‍ය වැවිලි සංස්ථාව, උඩරට සමූපකාර වතු සංවර්ධන මණ්ඩලය ආදියට ලබා දීමයි. පුරවැසි නොවන කම්කරුවන් සුළුවෙන් සිටින අනිකුත් වතු සාමූහික ගොවිපලවල් පිහිටුවීම සඳහා වෙන් කිරීමට පිළිවන. එසේම එක් වතුයායක සිට තවත් වතුයායකට කම්කරුවන් මාරු කිරීමද අවශ්‍ය වන්නේය.

### 5.4.3 ඉඩම් භුක්ති ක්‍රමය

මූලික වශයෙන් දම්බුලහේනේදී හැරෙන්නට සාමූහික ජනාවාස පහේ ඉඩම් බෙදා දීම පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත නොවූ අතර ආරම්භයේ සිටම මෙම තත්වය සහභාගී වන්නන් හට පැහැදිලි කර දෙන ලදී. තරුණ යෝජනා ක්‍රම පිළිබඳව වූ පරිච්ඡේදයෙහි යෝජනා කර ඇති පරිදි (2.4.4 ඡේදය) අනාගත ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ අවිනිශ්චිතතාවය ඉවත් කිරීම වාසි සහගත තත්වයකට තුඩු දුන්නේය. පෞද්ගලික බිම් කට්ටි ලබා ගැනීමට, නව සාමාජිකයෝ ඉන්පසුව අයදුම් නොකළහ. පැරණි කම්කරුවෝ ටික දෙනෙක් ඉඩම් කැබලිවලට කැඩීම කෙරෙහි රුචියක් දක්වන්නට ඉඩ තිබුනද සාමූහික ක්‍රමය ඔවුන් කලින් වැඩ කළ ක්‍රමයට සමාන හෙයින් ඔව්හු එම තත්වය පිළි ගත්හ. එසේම රැකියාවක් නැතිව සිටිනවාට වඩා සාමූහික ගොවිපලකවත් රැකියාවක් කිරීම වඩාත් නුවණට හුරු බව ඔවුනට අවබෝධ වන්නට ඇත. සාමාජිකයින් අතර විවිධතාවයක් පැවතුනත් අනිකුත් සාමාන්‍ය දුෂ්කරතාවයන් තිබුනත් සාමූහික ඉඩම් භුක්ති ක්‍රමය සම්පූර්ණයෙන් නොවූවද සාමාන්‍ය වශයෙන් පිළි ගැනීමක් ඇති බව පෙනී යයි.

තනි ඒකක වශයෙන් ගොවිපලවල් පාලනය කිරීම හේතුකොටගෙන පරිපාලනය හා පුහුණුව ලබා දීම වඩාත් පහසු වී ඇත. සාමාජිකයින් අතර අසමානාත්මතාවයක් ඇති වීමද මෙනයින් වැළකිනි. ඉඩම් කට්ටිවලට කැඩීමෙන් අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබූ යැරෝ, පාන්හැම් සහ සෙරපිස් යන ගොවිපලවල්වල ශිල්පීය කාර්යක්ෂමතාවයේ බරපතල අඩුවීමක්ද මෙම ක්‍රියාමාර්ගය හේතුකොටගෙන වැළකුනේය. කෙසේ වෙතත් සාමාජිකයින්ගේ ශ්‍රම උපයෝගිතාවය

ඇතැම් ගොවිපලවල්වල බෙහෙවින් උසස් තත්වයක නොපැවතුනි. (නිදර්ශනයක් වශයෙන් සෙරපිස් 218 වෙනි පිටුව, තෝමැන්ඩි 232 වෙනි පිටුව) මෙය සිදුව ඇත්තේ කාර්යක්ෂම වැඩ සංවිධාන ක්‍රමයක් නොමැතිකම හේතුකොටගෙනය. මෙයින් පැහැදිලි වනුයේ සමූපකාර සාමාජිකයින් සැළසුම් හා කළමනාකරණ කාර්යයෙහි ලා සම්පූර්ණයෙන් සම්බන්ධ කරවා ගැනීමේ ඇති අවශ්‍යතාවයයි.

පරීක්ෂණය කරගෙන යන ලද අවස්ථාවෙහි සාමූහික වශයෙන් අයිතියක් තිබූ ඉඩම් අවසාන වශයෙන් සමූපකාර සමිතිවලට පවරා දීමේ අපේක්ෂාවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරී තිබුනි. සමූපකාර සමිතියට ඉඩම් භාර දීම කෙසේ කවරදාක සිදුවේද යන්න රඳා පවතිනුයේ ඉඩමට නියම කරනු ලබන මිළ සහ එම වටිනාකම ගෙවීමට අනුගමනය කරන ප්‍රතිපත්තිය මතය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ඉඩ දී ඇති ඉඩම් බෙදා දීමේ ක්‍රම හතරෙන් (විකිණීම, මාරු කිරීම, කුලී ගෙවා මිළයට ගැනීම හෝ බදු දීම) මෙම ගොවිපලවල් පහ සඳහා අනුගමනය කළහැකි යයි සැළකිය හැක්කේ කුලිය ගෙවා පසුව මිළදී ගැනීමේ ක්‍රමය සහ බදු ක්‍රමයයි. දීර්ඝකාලීන බදු ක්‍රමයක් අනුව ඉඩම බදු ගැනීමෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී තත්වය දියුණු කිරීමට කාලයක් ලැබෙන හෙයින් එම ක්‍රමය වඩාත් හොඳ බව අපගේ අදහසයි. එමෙන්ම මෙම වැඩ පිළිවෙල මගින් ඉඩම භාවිතය සහ ඉඩම පැවරීම පිළිබඳ වැඩ කටයුතු ආරක්ෂා වනු ඇත.1/ කෙසේ වෙතත් තම අනාගත සුරක්ෂිත භාවය රඳා පවතිනුයේ අවසාන වශයෙන් ඉඩමෙහි හිමිකාරත්වය සමූපකාරයට හිමිව තිබීමෙන් යැයි ප්‍රචලිත හැඟීම නිසා සාමාජිකයින් විසින් ඇතැම්විට කුලී ගෙවා මිළයට ගැනීමේ ක්‍රමය ඉල්ලා සිටීමට පිළිවන.

නිවසක් ඉදි කිරීම සඳහා සහ ගෙවත්තක් පවත්වාගෙන යාම සඳහා බිම් කැබලි වෙන් කර දීමෙන් හිමිකාරත්වය පිළිබඳ අයිතිවාසිකම් සඳහා වූ මෙම ඉල්ලීම තරමක්දුරට තෘප්තිමත් කිරීමට පිළිවන. සෙරපිස් ගොවිපලෙහි නේවාසික සාමාජිකයෝ ඔවුන්ගේ පැරණි බිම් කැබලි ඉදිරියටත් වගා කරගෙන ගියද කවර වූ හෝ ගොවිපලකවත් බිම් කැබලි සාමාජිකයින් වෙත තවම වෙන් කර දී නොමැත. ඔවුනට දීමට යෝජිත අක්කරයකින් 1/8 සිට 1/4 තෙක් වූ ප්‍රමාණය සාධාරණ සේ පෙනී යයි. මීට වැඩි බිම් ප්‍රමාණයක් ලබා දුනහොත් සාමූහික වශයෙන් හිමි කරගෙන තිබෙන ඉඩමේ ඇති වගාවන් සමඟ තරඟකාරිව වගාවන් ඇති කිරීමට ඔවුන් පැළකිල්ලක් දක්වනු ඇත.

---

1/ වැඩි වටිනාකමක් ඇති ඉඩම් (සෙරපිස්, ~~ෆා~~පාන්හැම්) සම්බන්ධයෙන් දීර්ඝකාලීන බදු ක්‍රමය අනුගමනය කළහැකි එකම ක්‍රමය බව පෙනී යයි. කුලිය ගෙවා මිළදී ගැනීමේ ක්‍රමය අනුගමනය කළහොත් වාර්ෂිකව ගෙවිය යුතු කුලිය සමූපකාරයට ගෙවීමට නොහැකි වන තරම් ඉහල යනු ඇත. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 27 (ආ) ඡේදය බලන්න.)

### 5.4.4 නිෂ්පාදන ක්‍රම

මෙම ප්‍රශ්නය පැති දෙකකින් සළකා බැලිය යුතුය. පළමුව ශිල්පීය හා ඉංජිනේරු අංශය හා දෙවනුව සංවිධායක අංශයයි.

I. ශිල්පීය හා ඉංජිනේරු: ගොවිපල සැකසීම පිළිබඳ සාකච්ඡාවේදී (5.4.1 ඡේදය) ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමවලට වඩා ශ්‍රම සූක්ෂම ක්‍රම කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වා ඇති බව අපි සඳහන් කළෙමු. මෙනයින් එකද ගොවිපලකවත් ට්‍රැක්ටර් යන්ත්‍ර හෝ රථ වාහන නොතිබුණි. සී සෑම සඳහා මී හරක් කුලියට ගෙන පොල් ප්‍රවාහනය සඳහා කරත්ත භාවිතා කළේ සෙරපිස් ගොවිපල පමණකි. මේ හැරෙන්නට ගොවිපල ඇතුළත සියළුම වැඩ කටයුතු සහ ප්‍රවාහන කටයුතු කරන ලද්දේත් කායික ශ්‍රමය මගිනි.

ඇත්ත වශයෙන්ම ගොවිපලෙහි තිබූ නොයෙකුත් යන්ත්‍ර කලින් හිමි කරුවන් විසින් ඉවත් කරගෙන යාම නිසා සහ ඒවා මිළයට ගැනීමට අවශ්‍ය මිළ මුදල් හිඟකම නිසා මෙම තත්වය සමූපකාර ගොවිපලවල් මත පැටවුනු තත්වයකි. අනෙක් අතට මෙය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ වැදගත් ප්‍රතිපත්තියකින් එක් කොටසකි. ප්‍රාග්ධන හිඟකම හේතුකොටගෙන ශිල්පීය කාර්යක්ෂමතාවයෙහි ඌනතාවයක් ඇති වී තිබෙන හෙයින් මෙම තත්වය ඉක්මනින් සමනය කළයුතු අවස්ථා කල්පයක් ඇතත් අනුගමනය කරන මෙම ප්‍රතිපත්තිය සාමාන්‍යයෙන් නිවැරදි බව අපට පෙනී යයි.1/

II. නිෂ්පාදනයේ සංවිධානය: සමූපකාර ගොවිපලවල්හි අනුගමනය කරනු ලැබෙන වැඩ සංවිධාන පිළිබඳ විවිධ ක්‍රම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාමූහික ගොවිපලවල් තවමත් පොදුවේ අත්හදා බලා නොමැත.2/ තෝරා ගත් නායකයින්ගෙන් යුත් ස්ථිර වැඩ කණ්ඩායම් නිර්මානය කර තිබුනේ දම්මුල්ලහේන ගොවිපලෙහි පමණකි. එක් එක් උද්‍යානක විශේෂ කණ්ඩායම් ඇති කර සමූපකාරයේ සභාපති විසින් එම කණ්ඩායම්වලට වැඩ බෙදා දෙනු ලබන නෙස්මැන්ඩි වතුයායෙහි නිෂ්පාදකත්වයට වඩා වැඩි නිෂ්පාදකත්වයක් මෙය හේතුකොටගෙන දම්මුල්ලහේනෙහි පවතින බව පෙනී යයි. අනිකුත් වතුයායවල සිරිත් පරිදි කෙරෙන උද්‍යාන පෙරෙට්ටුව ගැනීම, වැඩ බෙදා දීම සහ කංකානම්වරුන් විසින් ක්ෂේත්‍ර පරිපාලනය කිරීම (ඔවුන්ගෙන් ඇතැමෙක් සමූපකාරයේ සාමාජිකයෝ වෙති) අනුගමනය කරනු ලැබීන. මෙය V-38 සටහනෙහි දක්වා ඇත.

---

1/ නිදසුනක් වශයෙන් සියළුම ගොවිපලවල දක්නට ලැබෙන පොහොර හිඟකම; තේ කොළ තේ කම්හලට ගෙන ඒම සඳහා යැරෝ ගොවිපලෙහි ලොරියක් නොමැතිකම; එසේම යැරෝහි ඇති ඉතාමත් පැරණි කම්හල් යන්ත්‍රෝපකරණ හේතුකොටගෙන තේ සකස් කිරීම අපහසු කළයුතුව ඇත. මේ නිසා නිෂ්පාදනයේ තත්වය පහත බැසීම.

2/ 3 වන පරිච්ඡේදයේ 3.4.6 ඡේදය බලන්න.

**සටහන V–38** ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සාමූහික ගොවිපලවල අනුගමනය කෙරෙන වැඩ සංවිධාන ක්‍රම

| ගොවිපල | වැඩ කණ්ඩායම් නිර්මානය | ක්ෂේත්‍ර වැඩ පැවරීම හා පරිපාලනය | වැඩ බෙදා දෙනු ලැබේද? | ශ්‍රම නිෂ්පාදක භාවය | විස්තර |
|---|---|---|---|---|---|
| සෙරපිස් | එක් එක් දිනක උදෑසන පෙරේට්ටුවේදී විශේෂ කණ්ඩායම්වලට බෙදේ. | කොන්දොස්තරගේ සහාය ඇතිව ව්‍යාපාර සංවිධායක විසින් වැඩ බෙදා දී පරිපාලනය කෙරේ. | සාමාන්‍යයෙන් නැත (පොල් ලෙලි ගැසීම හැර) | පහත් | ක්‍රමවත් සංවිධාන යක් හෝ ඉලක්ක නොමැත. පරිපාලනය ප්‍රමාණවත් නොවේ. |
| දම්මුල හේන | 10 දෙනෙකු ගෙන් යුත් ස්ථිර වැඩ කණ්ඩායම් | තෝරා ගත් නායකයෝ වැඩ බෙදා දී තම කණ්ඩායම්වල වැඩ පරිපාලනය කරත්. | ඔව්, සාමාන්‍ය යෙන් සම්පූර්ණ කණ්ඩායම් සඳහා | ඉහළ මට්ටමක | සාමාජිකයින්ගේ බැඳීයාවක් ඇති අතර ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යය ගැන අවබෝධයක් ඔවුනට ඇත. |
| තෝමැන්ඩ් | එක් එක් දිනක උදෑසන පෙරේට්ටුවේදී විශේෂ කණ්ඩායම්වලට බෙදේ. | සභාපති හා ලේකම් විසින් වැඩ බෙදා දෙනු ලැබේ. ඇත්තේ මඳ පරිපාලනයකි. | පොදුවේ නොමැත | සාමාන්‍ය යෙන් පහත් | සැලසුමක් නැත. පරිපාලනය ප්‍රමාණවත් නොවේ. |
| යැරෝ | තෝමැන්ඩ් මෙනි. | පත් කරනු ලැබෙන නිලධාරීහු වැඩ බෙදා දෙති. පත් කරනු ලබූ කංකානම් වරු පරිපාලනය කරති. | ඔව් | ඉහළ මට්ටමක | පරිපාලකයින් හා කංකානම්වරුන් කෙරෙහි ඇති බිය. |
| ✓පාන්හැම් | තෝමැන්ඩ් මෙනි. | යැරෝ මෙනි | ඔව් | ඉහළ මට්ටමක | යැරෝ මෙනි. |

වැඩ සංවිධානය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ඉතාමත් වැඩදායක ක්‍රමය පිළිබඳ ස්ථිර නිගමනයකට එළඹීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාමූහිකයන්ගින් ලත් අත්දැකීම් කෙටි වුවත්, අවසාන පරිච්ඡේදයේ විස්තර කර විග්‍රහ කර ඇති පරිදි සමූපකාර ගොවිපලවල්වල අත්දැකීම් ගැන සලකා පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට පිළිවන.

(අ) කලින් වතුයායවල පැවති වැඩ සංවිධාන ක්‍රමය (කොන්දොස්තර, කංකානම්වරුන් වැඩ බෙදා දීම ආදිය) අහෝසි කරනු ලැබේ නම් ඉලක්ක හා වගකීම් පිළිබඳ පැහැදිලි බෙදීමක් ඇතිව ප්‍රයත්නය හා ප්‍රතිලාභය අතර පැහැදිලි සම්බන්ධතාවයක් ඇති ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් ඉතාමත් ඉක්මනින් ආදේශ කළ යුතුය. එසේ නැතහොත් නිෂ්පාදනත්වය පිරිහීමට පත්වනු ඇත.

(ආ) දිනපතා විශේෂ වැඩ කණ්ඩායම්වලට බෙදෙනු වෙනුවට ස්ථිර වැඩ කණ්ඩායම් නිර්මාණය කිරීම වඩාත් හොඳ බව පෙනී යයි. මේ හේතුකොටගෙන තම නායකයින් තෝරාගෙන තමන්ට හොඳින් කළහැකි කාර්යයෙහි නියැලීමට සාමාජිකයින්ට හැකි වනු ඇත. කෙසේ වෙතත් වැඩ කණ්ඩායම්වල සාමාජිකයි-න්ගේ ප්‍රමාණය පිළිබඳව කිසියම් නම්‍යතාවයක් තිබිය යුතු අතර වරින් වර සාමාජිකයින් වෙනත් වැඩවලට මාරු කිරීම වැඩදායක වනු ඇත.

(ඇ) වැඩ වර්ග තීරණය කර කළයුතු වැඩ බෙදා දී එක් එක් කණ්ඩායමක ක්‍රියාකාරිත්වය පරිපාලනය කරන වැඩ කණ්ඩායම් නායකයින් තෝරා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

(ඈ) වෙන් වෙන් වශයෙන් වැඩ බෙදා දීම කෙරෙහි වැඩි කැමැත්තක් සාමාජිකයින් දක්වන බව පෙනී ගියත් හැකි සෑම අවස්ථාවකදීම වැඩ බෙදා දිය යුත්තේ පුද්ගලයින් වශයෙන් සලකා නොව කණ්ඩායම් වශයෙන් සලකමිනි. මේ අනුව වැඩි නිෂ්පාදනත්වයක් ලබා ගැනීම සඳහා එක් එක් කණ්ඩායම් අතර තරඟකාරී තත්වයක් ඇති කිරීමට පිළිවන.

(ඉ) නිෂ්පාදනත්වය වැඩි කිරීම සඳහා අනිකුත් සමූපකාර ගොවිපලවල් අත්හදා බලා ඇති වෙනත් ක්‍රම (පීපිලිමාන ගොවිපලෙහි අනුගමනය කරන කණ්ඩායම් කොන්ත්‍රාත් ක්‍රමය, ලස්සනගම සමූපකාර ගොවිපලෙහි අනුගමනය කරන එක් කණ්ඩායමක් එක් විශේෂ බිම් කට්ටියක් අනුව වැඩ කිරීමේ ක්‍රමය ආදිය) සමූපකාර කමිටුව මනාප නම් අත්හදා බැලීමට පිළිවන.

(ඊ) සමූපකාරයේ සාමාජිකයින් නොවන අය (කුලියට ගත් කම්කරුවන්) සාමාජිකයින් සමඟම ඉදිරියටත් වැඩ කරද්දී ස්වයං-පාලනය පිළිබඳ ක්‍රමය අනුගමනය කිරීම අසීරු වනු ඇත. ජන සමූහයේ මේ කණ්ඩායම් දෙකටම අදාළ වන පරිදි එකම වැඩ සංවිධාන ක්‍රමයක් අදාළ කරවීම සඳහා එම කණ්ඩායම් දෙක වඩාත් සම්පූර්ණ වශයෙන් ඒකාබද්ධ කිරීම හෝ කණ්ඩායම් දෙකටම වෙන වෙනම වැඩ සංවිධාන ක්‍රම අනුගමනය කළහැකි පරිදි ඒවා වඩාත් වෙන් කිරීම, අන් තැනක යෝජනා කර ඇත. ( 268 වෙනි පිටුව)

### 5.4.5 මූල්‍ය ප්‍රතිපත්ති

ජනාවාස පහ සඳහා සකස් කරන ලද සැළසුම් කරමින් විස්තරාත්මකව විග්‍රහ කරන ලද අතර යෝජිත මූල්‍ය ප්‍රතිපත්තිය ( 202 වෙනි පිටුව) අනුගමනය කර ඇති බවත් කරුණු දෙකකදී හැරෙන්නට එම මූල්‍ය ප්‍රතිපත්තිය සතුටුදායක බවත් ඔප්පු වී ඇත.

I. ක්ෂණික මුදල් අවශ්‍යතාවයන් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් ලබා ගත් අත්තිකාරම් අවස්ථා පහකින් තුන් අවස්ථාවකදී ගොවිපලේ නිෂ්පාදන වලින් ලද ආදායමින් පියවා ඇතත් (V-31 සටහන) අත්තිකාරම් සහ ආදායම සමුපකාර සාමාජිකයින්ට අවබෝධ වන පරිදි පොදුවේ අදාළ කර නැත. ඔවුන් බොහෝ දෙනෙක් ගොවිපලෙන් ලද ආදායම කවර කාර්යයක් සඳහා වැය වූයේදැයි නොදත් අතර මේ හේතුකොටගෙන ඔවුන් තුළ හැඟී ගියේ දැන් ඔවුහු කලින් වතු හිමිකරුගේ සේවකයින් වෙනුවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සේවකයින් බවට පත් වී ඇති බවයි.1/

එක් එක් ගොවිපලකින් ලැබෙන ආදායම එම ගොවිපලේ ගිණුමට බැර කර එම ගිණුම් දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරයේ අධ්‍යක්ෂ විසින් පවත්වා ගෙන යනු ලැබේ නම් සහ ගොවිපල් සඳහා අදාළ වන ගෙවීම් එම ගිණුමෙන්ම පියවනු ලැබේ නම් මෙම වැරදි හැඟීම පහසුවෙන් ඉවත් කළහැක.

II. යැරෝ (1973 නොවැම්බර් මාසයේදී ලද රු. 25,000/- යි) සහ දම්මුලහේන (1974 මාර්තු මාසයේදී ලද රු. 50,000/- යි) හැරෙන්නට මධ්‍යකාලීන හා දීර්ඝකාලීන අවශ්‍යතාවයන් සඳහා වූ බැංකු ණය තවම ලබාගෙන නැත. අභිනව ණය මුදල් ඉක්මනින් අනුමත කරනු ලැබේ යයි අපේක්ෂා කැරෙන අතර ඉහත සඳහන් කළ ක්‍රියාපටිපාටිය අනුසාරයෙන් ණය සඳහා වූ ඇතැම් අවශ්‍යතා අඩු කිරීමට හෝ මුළුමනින්ම ඉවත් කිරීමට පිළිවන. නිදසුනක් වශයෙන් අවුරුද්ද තුළ ඇති ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පියවීමට පාන්හැම් ගොවිපලේ රබර් විකිණීමෙන් ලැබෙන ආදායම ඊනැවටත් වඩා ප්‍රමාණවත් වන්නේය.2/

---

1/ ජන සමූහයෙන් වැඩි හරියක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ හෝ සමුපකාර සමිතියේ සේවකයින් වූ පාන්හැම් සහ යැරෝ ගොවිපලවල්වල මෙම අදහස ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි.

2/ කලින් මාසය සඳහා වූ වැටුප් ඒ වන විටත් ගෙවා ඊළඟ මාසයේ වැටුප් ගෙවීම සඳහා නිෂ්පාදන වලින් ලැ බෙන ආදායම කල් වේලා ඇතිව ලැබෙන මාසයේ මැද භාගයේදී වතුයාය පවරා ගැනීමෙන් පුනරාවර්ථන වියදම් සඳහා ණය මුදලක අවශ්‍යතාවය, සංවර්ධිත වතුයායන්හි අඩු කර ගැනීමට පිළිවන. ඇතැම් අවස්ථාවල මෙය කරගෙන යනු ලැබේ.

මුල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වෙනත් කරුණුදෙකක්ද සලකා බැලිය යුතුව ඇත.

(අ) ඉඩම සඳහා ගෙවීම: නියැදියෙහි සඳහන් වතුයායවල් පන සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල තවම තීරණය කර නැති නිසාත් මෙම වතු ලබා ගත් අයගෙන් මුදල් අය කිරීමේ ප්‍රතිපත්තිය තවම පැහැදිලිව විස්තර කර නැති නිසාත් සාමූහික ගොවිපලවල් පිළිබඳව වූ ඇස්තමේන්තුවට ඉඩම පිළිබඳ වටිනාකම් ඇතුළත් නොවුනි. කෙසේ වෙතත් V-39 සටහනෙහි දක්වා ඇති පරිදි දළ වශයෙන් නිගමනයක් කිරීමට පිළිවන.

<u>සටහන V-39</u> ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ජනාවාස – ඉඩම්වලට ගෙවීම ලාභදායිත්වය කෙරෙහි ඇති කරන බලපෑම

| | සෙරපිස් රු. | දම්බුලහේන රු. | නෝමැන්ඩි රු. | ගැරෝ රු. | ✓පාත්හැවි රු. |
|---|---|---|---|---|---|
| 1. ඉඩම් වටිනාකම සහ ණයවල පොලිය හැර පළමු අවුරුද්දේ අය වැය සටහන | | | | | |
| (අ) ඇස්තමේන්තුගත වැය | 148,800 | 82,720 | 129,055 | 223,539 | 266,615 |
| (ආ) ඇස්තමේන්තුගත අය | 221,580 | 82,500 | 107,545 | 246,240 | 376,615 |
| (ඇ) ඇස්තමේන්තුගත ලාභය | 72,780 | - 220 | -21,410 | 27,701 | 110,000 |
| 2. ඉඩම් වටිනාකම හා පොලී ගෙවීම් හැර පස්වෙනි අවුරුද්දේ අය වැය සටහන | | | | | |
| (අ) ඇස්තමේන්තුගත වැය | 106,520 | 44,107 | 119,040 | 214,873 | 224,615 |
| (ආ) ඇස්තමේන්තුගත අය | 276,900 | 110,300 | 280,553 | 321,970 | 394,615 |
| (ඇ) ඇස්තමේන්තුගත ලාභය | 170,380 | 66,193 | 161,513 | 107,597 | 170,000 |
| 3. උපකල්පනය කෙරෙන ඉඩම් වටිනාකම් හා වත්කම්✓ | 400,000 ( 2,000/- අක්කරයකට) | 155,000 (1,000/- අක්කරයකට) | 375,000 (1,000/- අක්කරයකට) | 722,000 (2,000/- අක්කරයකට) | 1,227,000 (3,000/- අක්කරයකට) |

| | සෙරපිස් | දම්බුලගේන | කෝමැන්ඩි | ගැරෝ | ෆාන්හැම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 4. වාර්ෂික පියවීම් ගෙවීම් (මුළු වටිනාකමින් 1/15 ක් සේ සලකා)# | 26,666 | 15,000 | 25,000 | 48,000 | 82,000 |

සටහන්:

¥ ඉහත දක්වා ඇති වටිනාකම් මිල වශයෙන් ලබා ගත් තොරතුරු නොවේ. මේවා පදනම් කර ඇත්තේ 1971 ඉඩම් වටිනාකම් අනුව දළ වශයෙනි. වන්දි ගෙවීම නිගමනය කෙරෙතැයි අපේක්ෂා කෙරෙනුයේ ආදායම හෝ ධන බදු තක්සේරුව පදනම් කරගෙන හෙයින් මෙම වතුවලට ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් ඉහත සඳහන් ඇස්තමේන්තු කෙසේවත් සම්බන්ධ කර ගතහැකි නොවන්නේය. (196 වෙනි පිටුවේ පාද සටහන බලන්න)

# මෙහිදී උපකල්පනය කර ඇත්තේ කුලී ගෙවා මිළදී ගැනීමේ ක්‍රමය යටතේ ඉඩම සමූපකාරයට පවරා දී ඇතැයි යන්නය. එවිට වාර්ෂික කුලිය හැකිනාක් දුරට ගෙවිය යුතු වන්දි මුදලෙන් 1/15 කට අඩු නොවිය යුතුය. (ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය 27 වන ඡේදය (ආ) (i) ).

මෙම ඇස්තමේන්තු පදනම් කරගෙන පළමු අවුරුද්දේ කවර හෝ අයුරකින් බීම් කුලියක් ගෙවිය හැකි වන්නේ සෙරපිස් හා ෆාන්හැම් ගොවිපලට පමණක් බව පෙනී යයි. පස්වන වර්ෂය අවසාන වනවිට මෙම සමූපකාර ජනාවාස සියල්ලම අවශ්‍ය කුලිය ගෙවීමට හැකි වන පරිදි ප්‍රමාණවත් අතිරික්තයක් නිෂ්පාදනය කළ යුතුය (උපකල්පනය කර ඇති අය සහ වැය දළ වශයෙන්වත් නිරවද්‍ය වන්නේ නම්). එහෙත් ගොවිපලවල් දෙකක් සම්බන්ධයෙන් කිව යුත්තේ මෙම කුලිය සඳහා ඒවායේ අතිරික්තයෙන් 50% ක් පමණ වැය වන බවය. එවිට පොලී ගෙවීම, ප්‍රති ආයෝජනය, බදු හෝ ලාභාංශ සඳහා ප්‍රමාණවත් මුදලක් ඉතිරි නොවනු ඇත.

වන්දි ගෙවීම තවම ආරම්භ කර නැති නිසාත්, මුල් අවුරුදුවලදී සමූපකාර ණය බරින් මිරිකීම නොවැළැක්විය හැකි නිසාත්, එක් එක් සමූපකාරයක ක්‍රියාකාරිත්වය අනුව ඉඩමට මුදල් ගෙවීම සම්බන්ධයෙන් අවුරුදු 3 – 5 ක සහන කාලයක් ලබා දීමත්, ඉඩමේ වටිනාකම ගෙවීම ආරම්භ කරන අවස්ථාවෙහිදී එක් එක් සමූපකාරයක මුදල් තත්වය සමාලෝචනය කිරීමත් වැඩදායක වන්නේය.

(ආ) ලාභ බෙදා දීම: මෙම ගොවිපලවල් පහෙන් මෙතෙක් ලාභ බෙදා දී නැතත් ෆාන්හැම් ගොවිපලෙහි ( 249 වෙනි පිටුව) මාස හයකින් පසුව ලාභ බෙදා දෙන බවට පොරොන්දු වී ඇති අතර අනිකුත් ගොවිපලවල්වලද මෙම බලාපොරොත්තුව වැඩි වෙමින් පවතී.

මේ සම්බන්ධයෙන් ඉවම් ප්‍රතිසංස්කරණ කොමිෂම යෝජනා කර ඇති ප්‍රතිපත්තිය වනුයේ වැඩ කළ එක් දිනක් සඳහා සාමාජිකයින්ට අවම දෛනික දීමනාවක්ද ඇතුළුව සියළුම පුනරාවර්ථන ගෙවීම් සිදු කිරීමෙන් පසුව පහත සඳහන් ප්‍රමුඛත්ව පදනම මත ඉතිරි ලාභ බෙදා දීමය.

I. ණය පියවීම
II. සමූපකාර ඉතිරි කිරීමේ අරමුදල
III. නිවාස හා ප්‍රසාධන අරමුදල්
IV. සාමාජිකයින්ට ලාභාංශ

මෙම ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වෙනත් අදහසක් දැක්වීම අසීරුය. පළමුවැනි පරමාර්ථයන් තුන සඳහා මුදල් අඩු කර ගැනීමෙන් පසුව සිවුවන කාර්යය සඳහා යම්කිසි මුදලක් ඉතිරි වෙතැයි බලාපොරොත්තු වීම පමණකි කළ හැක්කේ.

5.4.6 කළමනාකරණ ප්‍රතිපත්ති

දෛනික කළමනාකරණ වැඩ කටයුතු සඳහා තෝරා ගත් නායකයින්ගෙන් යුතු වැඩ කණ්ඩායම් නිර්මාණය කිරීම 5.4.4 ඡේදයෙහි සළකා බැලුවෙමු. මෙහි ලා අපගේ නිරීක්ෂණයට හසු වන්නේ පුළුල් වූ කළමනාකරණ ගැටළුව වන සාමූහික ගොවිපලක සම්පූර්ණ ප්‍රතිපත්ති සැකසුම සහ මූල්‍ය පාලනය පිළිබඳ ප්‍රශ්නයි.

එක් එක් ගොවිපලක වගකිව යුතු කළමනාකරණ බලධාරීන් V-40 සටහනෙහි දැක්වේ. සෙරපිස්, ⁄පාන්ගම් සහ යැරෝ ගොවිපලවල්වල විධායක කමිටුවෙහි පත් කරන ලද නිලධාරීහු වැඩි හරියක් වූහ. ගොවිපලෙහි පවතින දුෂ්කර වූ සමාජ තත්වය නිසාත් ස්වයං-පාලනය පිළිබඳව සාමාජිකයින් තුළ පවතින අල්ප වූ අත්දැකීම් නිසාත් මෙම තත්වය සාධාරණ වුවත් පත් කරන ලද නිලධාරීන් විසින් තෝරා ගත් සාමාජිකයින් අභිබවා කටයුතු කිරීම හේතුකොටගෙන එය පහත සඳහන් කරුණුවලට තුඩු දී ඇති බව අපි සැළකිල්ලට ගතිමු.

(අ) කම්කරුවෝ සම්ප්‍රදායික අයුරින් කළමනාකාරිත්වය මත රඳා පැවැත්මේ සම්බන්ධතාවය ඉදිරියටත් පැවැත්ම;
(ආ) සාමාජිකයින් තුළ ඇති උද්යෝගය හීන වීම;
(ඇ) බලය බෙහෙවින් මධ්‍යගත වීම හේතුකොටගෙන තීරණයන් ගැනීමෙහි ලා වරින් වර පවතින ප්‍රමාද;
(ඈ) මෙයට සම්බන්ධ වී ඇති විවිධ බාහිර ආයතන අතර පවතින මතභේද සහ ඒ හේතුකොටගෙන සමූපකාරයේ සාමාජිකයින්ට ගැහැට විඳීමට සිදුවීම.

අනෙක් අතට දම්මුලහේන සහ තෝමැන්ඩි යන ගොවිපලවල්හි විධායක කමිටුව තෝරා ගත් නියෝජිතයින් වැඩි දෙනෙකුගෙන් සමන්විත වූ අතර නිලධාරීන් ඉටු කළේ සාපේක්ෂ වශයෙන් සුළු වැඩ කොටසකි. මෙම තත්වය හේතුකොටගෙන සාමාජිකයින් තුළ ආත්ම විශ්වාසය හා උද්යෝගය වැඩි වූ බවට සැකයක් නොමැත. මෙම ක්‍රියා පරිපාටිය වගකීමෙන් තොර බවකට හෝ බලතල හෝ අරමුදල් අනිසි අයුරින් භාවිතයට ගැනීමකට හෝ තුඩු දී ඇති සාධක අපි නුදුටුවෙමු.

<u>සටහන V–40</u> ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සාමූහික ජනාවාස – විධායක කමිටුවේ නිර්මාණය

| ගොවිපල | විධායක කමිටුවේ සාමාජික සංඛ්‍යාව | පත් කරනු ලැබූ සාමාජික සංඛ්‍යාව සහ තනතුර | තෝරා ගනු ලැබූ සමූපකාර සාමාජිකයෝ |
|---|---|---|---|
| සෙරපිස් | 7 | 4<br>පාර්ලිමේන්තු මන්ත්‍රී (සභාපති)<br>ව්‍යාපාර සංවිධායක<br>ග්‍රාම සංවර්ධන නිලධාරී<br>කෘෂිකර්ම උපදේශක | 3 |
| දම්මුලහේන | 9 | 3<br>ව්‍යාපාර සංවිධායක<br>සංවර්ධන සහකාර<br>වි.සේ.ස. සමිතියේ නියෝජිත | 6<br>සභාපතිද ඇතුළුව |
| තෝමැන්ඩි | 9 | 3<br>ව්‍යාපාර සංවිධායක<br>කෘෂිකර්ම උපදේශක<br>පලදාව වර්ධන කමිටු<br>නියෝජිත | 6<br>සභාපති සහ ලේකම්<br>ඇතුළුව |
| යැරෝ | 7 | 7<br>ව්‍යාපාර සංවිධායක<br>පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ<br>නියෝජිතයින් 6 දෙනෙක් | 0 |
| ⁄පාත්හැම් | 7 | 4<br>ව්‍යාපාර සංවිධායක, දිස්ත්‍රික් ඉඩම්<br>ප්‍රතිසංස්කරණ අධිකාරයේ අධ්‍යක්ෂ,<br>රබර් පර්යේෂණ ආයතනයේ<br>නියෝජිත, සමූපකාර සමිති පරීක්ෂක | 3 |

බැහැරින් යොදනු ලබන කළමනාකරණ ක්‍රමය උද්යෝගය අඩු කිරීමට තුඩු දෙන අතර ස්වයං කළමනාකරණ ක්‍රමයක් මගින් එයට විරුද්ධ ප්‍රතිඵල ලැබෙන බව පැහැදිලි නිසා නිලධාරීන් විසින් සාමූහික ජනාවාස පාලනය කළයුතු යයි පැතිර පවතින මතය පිළිබඳව සලකා බැලීම වැදගත්ය. (සමූපකාර ගොවිපලවල් 3 වන පරිච්ඡේදය බලන්න). මෙම නිලධාරීන් හට අවස්ථාවක් ලබා දුනහොත් ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යය ගොවිපලක තෝරා ගත් සාමාජිකයින්ට වඩා හොඳට ඔවුන් විසින් ඉටු කරනු ලැබේදැයි සලකා බැලීමද මෙහි ලා අදාළ වන්නේය.

I. ශිල්පීය පාලනය

කාර්යක්ෂම කළමනාකාරිත්වයක් සඳහා ප්‍රථම කොටම අවශ්‍ය වනුයේ ගොවිපලෙහි වවනු ලබන ප්‍රධාන බෝගය හෝ බෝග පිළිබඳව ඇති දැනීමයි. සමූපකාර සාමාජිකයින් බොහෝ දෙනෙක් ඔවුන් විසින් වවනු ලබන බෝග පිළිබඳව වැඩි දැනීමක් නොලද අය නිසා බැහැරින් ලබා ගත් ශිල්පීය මාර්ගෝපදේශකත්වය සහ පාලනය මුලදී සැපයිය යුතු බව පිළි ගත යුතු වෙමු. යැරෝ ගොවිපලෙහි මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා උඩරට සමූපකාර වතු සංවර්ධන මණ්ඩලයේ කළමනාකරුවන්ගේ සේවය ලද අතර ශිල්පීය වශයෙන් සුදුසුකම් ලත් අය විධායක කමිටුවට පත් කරනු නොලැබුණි. /පාන්ගැමි, සෙරපිස් සහ නෝමැන්ඩි ගොවි පලවල්වල විධායක කමිටුවට, පත් කරනු ලැබූ කෘෂිකාර්මිකඥයින් අයත් වූහ. දඹුලහේනෙහි ශිල්පීය උපදෙස් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් දෙන ලද අතර එම උපදෙස් සාමාජිකයින් විසින් සාමාන්‍යයෙන් පිළි ගන්නා ලදී. ශිල්පීය පාලනය පිළිබඳ අංශයෙන් සලකා බලන කල අවශ්‍ය විශේෂඥ ඥානය විධායක කමිටුවට තිබුණත්, රජයේ දෙපාර්තමේන්තුවක් සතු වුවත් විධායක කමිටුව වැඩි ගණනක් නිලධාරීන්ගෙන් සමන්විත වුවත් එසේ නොවුවත් එය එතරම් සැළකිය යුතු නොවේ.

II. සමාජයීය පාලනය

ගොවීන් කණ්ඩායමක් වශයෙන් කුලය, වයස, පසුබිම ආදී කරුණු අනුව බෙදී සිටින අවස්ථාවක ඔවුන්ගේ අභිමතය පරිදි වැඩ කිරීමට ඉඩ හැරියහොත් ඔවු නොවුන් ඇන කොටා ගැනීමේ තත්වයක් ඇති වන බව නිතරම පිළි ගනු ලැබෙන අතර මේ නිසා සාමය පවත්වා ගැනීම සඳහා බැහැරින් ලබා ගත් අපක්ෂපාතී බලධාරියෙක් සිටිය යුතුය යන මතයක් පවතී. කෙසේ වෙතත් මෙම කරුණ තහවුරු කිරීම සඳහා ස්වයං-පාලනය පිළිබඳ අත්දැකීම් සංක්ෂිප්ත වුවත් නෝමැන්ඩි හා දඹුලහේන සාමූහික ගොවිපලවල්වල ඉහත කී මතය සනාථ වීමට කරුණු සිදු වී නැත. කෙසේ වෙතත් බැහැරින් යොදවනු ලබන කළමනාකාරී බලධාරීන් හේතුකොටගෙන නොයෙකුත් ගැටීම් ඇති වන්නේය යන මතයත් එවැනි බලධරයෙක් පත් කරනු ලැබූ විට ස්වේච්ඡාවෙන් ඔහු දරණ බලතල වලින් ඉවත් වීම සිදු නොවන නිසාත් (තරුණ ජනාවාස යෝජනා ක්‍රම සහ සමූපකාර ගොවිපල වලින්

ලද අත්දැකීම් වලින් නිගමනය කළහැකි පරිදි) අවශ්‍ය අවස්ථාවන්හිදී මාර්ගෝපදේශකත්වය හා සේවාවන් ලබා දී තම කටයුතු පාලනය කිරීමේ කාර්ය භාරය සමූපකාර සාමාජිකයින්ටම පැවරීම වඩාත් වටිනා බව පෙනී යයි.

III. මූල්‍ය පාලනය

මූල්‍ය පාලනය පිළිබඳ වගකීම සමූපකාර සාමාජිකයින්ගෙන් පරිබාහිරව තැබීමට ඉදිරිපත් කර ඇති ප්‍රධානතම හේතුව වනුයේ සාමාජිකයින් විසින් එම මුදල් අනිසි ලෙස යෙදවීමට කටයුතු කරන්නේ යයි යන බියයි. පත් කරනු ලබූ සාමාජිකයින් වඩාත් විශ්වාසදායී යයි හැඟීමක් පවතී. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් දෙපැත්තකින් කල්පනා කර බැලිය යුතුව ඇත. එනම් වෘත්තීය ප්‍රවීනත්වය සහ වගකීමයි. විශාල වශයෙන් මුදල් මෙන්ම තවත් නොයෙකුත් වටිනා දේ පරිහරනය කරන අවස්ථාවක මෙම කරුණු දෙකම අවශ්‍ය වන්නේය.

වෘත්තීය හැකියාව පිළිබඳව සළකා බලන කල මෙම ගොවිපලවල් පහ සඳහා සැළසුම් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් සකස් කරන ලද අතර ඒවා විධායක කමිටුවේද සහාය ඇතිව කොමිෂමේ නිලධාරීන් විසින් සමාලෝචනයට භාජනය කරනු ඇත. මෙම සමීක්ෂණය කරගෙන යන අවධියේදීත් මූල්‍ය පාලනය පිළිබඳ කාර්ය භාරය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙතම පැවරී තිබුණි. මූලික වශයෙන් දම්මුලහේන ගොවිපලේ ගිණුම් කටයුතු සාමාජිකයින් විසින් කරගෙන යනු ලැබූ අතර සෙරපිස් හා නෝමැන්ඩි යන ගොවිපලවල්වල එය ඉටු කරන ලද්දේ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය විසිනි. යැරෝ හා ⁄පාන්හැම් ගොවිපලවල්වල මෙම කාර්යය වැටුප් ලබන ලිපිකරුවන් විසින් ඉටු කරන ලදී. කිසිදු අවස්ථාවක අරමුදල් අනිසි අයුරින් භාවිතා කිරීම පිළිබඳ සාක්ෂි නොමැත. සියළුම ගිණුම් සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගොවිපලවල් වලින් ලද අත්දැකීම් තවම දුතාමත් සීමිත වුවද ශිල්පීය පාලනය සම්බන්ධයෙන් මෙන්ම මුදල් පාලනය සම්බන්ධයෙන්ද පෙනී යනුයේ මූල්‍ය පාලනය පිළිබඳ හැකියාවන් රජයේ නිලධාරීන් වෙත තිබුණද, සමූපකාර සාමාජිකයින් වෙත හෝ එසේ නැතහොත් සමූපකාර සේවක යින් වෙත තිබුණත් එය පමණක් තීරණාත්මක සාධකය නොවන බවයි.

අවසාන වශයෙන් වැදගත් වනුයේ වගකීම පිළිබඳ ප්‍රශ්නයයි. එනම් වැය පිළිබඳව තීරණය කර චෙක්පත් අත්සන් කර ගිණුම් තබන අය අවසාන වශයෙන් වග කිවයුත්තේ කවුරුන් හටද යන බවයි.

තෝරා ගත් සමූපකාර සාමාජිකයින්ගෙන් යුත් කමිටුවක් විසින් අරමුදල් පාලනය කෙරේ නම් එම කමිටුව වග කිව යුතු වන්නේ ඔවුන් තෝරා ගනු ලැබූ අය වෙතය. පත් කරනු ලැබූ නිලධාරීන් විසින් පාලනය කරනු ලැබේ නම් ඔවුහු තමන් පත් කරනු ලැබූවන් වෙත වගකිව යුතු වෙත්. කෙසේ වෙතත් V–39 සටහනෙහි දැක්වෙන පරිදි විධායක කමිටුවේ ව්‍යුහය පිළිබඳව සළකන කල්හි පත් කරනු ලැබූ සාමාජිකයින් වැඩි දෙනෙකුගෙන් යුත් කමිටුවක් වගකිව යුතු වන්නේ කවුරුන් හටද යන බව නිගමනය කිරීම අසීරුය. ඇත්ත වශයෙන්ම ඔවුහු සාමාජිකයින් වෙත

එග නොකිය යුතු අතර ඇතැම් විට එග කිවයුතු වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා හටය. (යැරෝහි) එසේ නැතහොත් ස්වාධීන සමූහයකටය (ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, විවිධ සේවා සමූපකාර සමිතිය, කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ආදී වශයෙනි). මෙකයින් ඇති වන ප්‍රතිඵලය ලෙස දැක්විය හැක්කේ තමන් අනුමත කරන ආයෝජන පිළිබඳව ඇති අවදානම කමිටුව විසින් සළකා නොබලන බවයි. එහෙත් මෙම වගකීම ඔවුන් වෙත පැවරේ නම් ඔව්හු ඒ පිළිබඳව ගැඹුරින් සළකනු ඇත.[1] මේ අනුව පත් කරනු ලැබූ සාමාජිකයින් කමිටුවෙහි සිටීමෙන් ලැබිය හැකි නොයෙකුත් වාසි අහිමිව යන්නේය.

බැහැර අධිකාරයක් වෙත සාමාජිකයින් විසින් වග කියනු ලැබීම අවශ්‍ය නම්, සැළසුම් සකස් කර බොහෝ අවස්ථාවල මූලික අරමුදල් සපයන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත ඔවුන් විසින් වග කියනු ලැබිය යුතු සේ පෙනී යයි. මෙයින් අදහස් කෙරෙනුයේ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ අධිකාරය විසින් ව්‍යාපෘර සංවිධායකගෙන් හා විධායක කමිටුවෙන් උපදෙස් ලබා මූලික වශයෙන් මුදල් පාලනය කිරීමයි. මෙම තත්වය නොයෙක් අවස්ථාවල සිදුව ඇත. මේ අනුව පත් කරනු ලැබූ නිලධාරීන් බොහෝ ගණනක් විධායක කමිටුවෙහි සිටීම සඳහා ඇති අවශ්‍යතාවයද අඩු වන්නේය.

කෙසේ වෙතත් ස්වයං-පාලනය පිළිබඳ හැඟීම තුළින් උද්ගත වන සමාජයීය හා අනිකුත් වැඩදායක කරුණු නිසා හැකිතාක් ඉක්මනින් මුදල් පාලනය හා එය කැටුව යන වගකීම පිළිබඳ කාර්ය භාරයද සාමාජිකයින් වැඩි සංඛ්‍යාවක් සිටින විධායක කමිටුවට මාරු කිරීම වැදගත් බව පෙනී යයි. මෙම කාර්ය පරිපාටිය තුළින් මතු වන අවදානම පිළිබඳ තත්වය විධායක කමිටුවට වැඩි හරියක් පත් කරනු ලැබූ නිලධාරීන් තෝරා ගැනීමෙන් නොව පහත සඳහන් ආරක්‍ෂක පියවර ගැනීමෙන් වඩාත් ප්‍රවීන අයුරින් පාලනය කළහැකි බව හැඟී යයි.

I. ඉඩම් භාවිතය පිළිබඳව බදුකරු වෙත කොන්දේසි නියම කිරීම හෝ ඉඩමේ අයිතිය පිළිබඳව වෙනත් ගිවිසුමක් ඇති කර ගැනීම;[2]

II. ණයට ගන්නා අරමුදල් භාවිතා කිරීම පිළිබඳව, බැංකුව සමඟ හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම සමඟ ඇති කර ගන්නා ණය ගිවිසුම්වලට කොන්දේසි නියම කිරීම;

---

1/ නිදසුනක් වශයෙන් සෙරපිස්හි යෝජනා කර ඇති ගව පට්ටි ව්‍යාපාරය අසාර්ථක වුවහොත් යෝජිත ආයෝජනය වූ රු. 77,500/- ක මුදල අපතේ යයි. එහෙත් එවැනි අවස්ථාවක මෙම මුදල විධායක කමිටුවේ සාමාජිකයින්ගෙන් ආපසු අය කර ගැනීමක් අපේක්‍ෂා නොකෙරේ. එසේම එවැන්නක් ඔවුන් වෙතින් අපේක්‍ෂා කිරීමද සාධාරණ නොවේ. එසේ වනුයේ ඔවුන් විසින් සැළසුම සකස් කරනු නොලැබූ නිසාත් ඔවුන්ගේ බලතල පිළිබඳ සීමාවන් අවිනිශ්චිත නිසාත්ය.

2/ කෘෂිකර්ම පලදා වර්ධන පනත යටතේද නීති රීති ක්‍රියාත්මක කිරීමට පිළිවන.

III. සමූපකාර අතුරු ව්‍යවස්ථාවල සාමාජිකයින්ගේ හිමිකම් හා රාජකාරී විශේෂයෙන් දැක්වීම;

IV. මූල්‍ය, ශිල්පීය සහ සමාජයීය පාලනය සම්බන්ධයෙන් අවශ්‍ය සේවා හා පුහුණුව ලබා දීම අදාළ රජයේ දෙපාර්තමේන්තුවලට අනිවාර්ය කරවීම.

### 5.4.7 පුහුණුව හා සේවා

විශේෂයෙන් දම්මුලහේන හා සෙරපිස් ගොවිපලවල්වල සාමාජිකයින් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් නව මාදිලියේ පුහුණුවක් දී ඇත. මේ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ නිලධාරීන් සාමාජිකයින් සමඟ එක්ව වැඩ කර නිලධාරීන් මෙන්ම සාමාජිකයින්ද සහභාගී කරවාගෙන ගොවිපලෙහි ගැටළු පිළිබඳව පුහදව සාකච්ඡා කරන ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් මෙතෙක් මෙවැනි සාකච්ඡා පවත්වා ඇත්තේ අල්ප වශයෙනි. එහෙත් එය ප්‍රතිපල ගෙන දෙන අභ්‍යාස ක්‍රමයක් බව පෙනී යයි. මෙම ගැටළුව මග හරවා ගත හැක්කේ ප්‍රාදේශීය නිලධාරීන් වඩාත් සම්පූර්ණ අයුරින් සම්බන්ධ කරවා ගැනීමෙනි. එසේම ගණන් තැබීම, විශේෂත්ව කෘෂිකර්ම ක්‍රම ආදිය පිළිබඳව සමූපකාරයේ සාමාජිකයින් වෙත වඩාත් විධිමත් පුහුණුවක් ලබා දීමද අවශ්‍යය. මෙම අවශ්‍යතාවයන් හයවන සූචියෙහි දක්වා ඇති ආදර්ශ අභ්‍යාස මාර්ගෝපදේශකත්වයෙහි අඩංගු කර ඇත.

සාමූහික ගොවිපලවල්වලට සේවාවන් සපයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සමූපකාර දෙපාර්තමේන්තුව වැනි ආයතනයන්හි ප්‍රාදේශීය නිලධාරීන් හටද පුහුණුවක් ලබා දීම අවශ්‍යය. නිලධාරීන්ගේ දායකත්වය වඩාත් ප්‍රයෝජනවත් වන අයුරින් ලබා ගනිමින්ම ඔවුන්ගේ සහයෝගයද ලබා ගැනීමේ එක් ක්‍රමයක් නම් නිලධාරීන් හා සාමාජිකයින් යන සෑම දෙනාටම එක්ව අභ්‍යාස පාඨමාලා පැවැත්වීමයි.

### 5.4.8 ප්‍රමාණය හා සැළැස්ම

සාමූහික ජනාවාස පහේ සාමාජික සංඛ්‍යාව පාලනය කර ගත හැකි ප්‍රමාණයක වන බව පෙනී යයි. එකද ගොවිපලකවත් සාමාජික සංඛ්‍යාව 75 නොඉක්මවීය. යැරෝ හා පාන්හැම්හි කම්කරුවන් පසුව සාමාජිකයින් වුවහොත් හෝ ඔවුන් වෙනුවට සාමාජිකයින් යොදවනු ලැබුවහොත් මෙම ජනසමූහ නිෂ්පාදන ඒකක දෙකකට බෙදීම වැඩදායක වනු ඇත.

ඉඩමෙහි සැළැස්ම වතුයායෙහි සැළැස්ම අනුව සකස් වී තිබේ. නිවාස ආදිය ඇති අවස්ථාවන්හිදී (සෙරපිස් හා පාන්හැම්) ඒවා පිහිටුවා ඇත්තේ ගොවිපලෙහි ශ්‍රම අවශ්‍යතාවයන් බෙදී යන ආකාරයටය. අනෙක් අවස්ථාවල ජන සමූහ ඒකාබද්ධතාවය ඇති වන අයුරින් සාමාජිකයින්ගේ නිවාස පොකුරු ක්‍රමයක් අනුව පිහිටුවීමට සැළසුම් සකස් කර ඇත.

### 5.4.9 ගම් හා සම්බන්ධතාවය

සාමූහික ජනාවාසයක් පිහිටුවනු ලැබූ විට ඒ අවට ඇති ප්‍රදේශ පුළුල් අයුරින් සංවර්ධනය වීම පිළිබඳ අදහස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ සැළසුම් කරුවන්ගේ සිත් තුළ තදින් දක්නට ලැබුණි. ආරම්භයේදී ඇතැම් අවස්ථාවල මෙම ගොවිපලවල් පිහිටුවීම සම්බන්ධයෙන් විරෝධතා පැන නැගුනේය. කලින් ගම්වැසියන් දම්මුලහේන වතුයායෙන් ලබා ගැනීමට පුරුදුව සිටි නොයෙකුත් වරප්‍රසාද ඉවත් කිරීම ගැන අප්‍රසාදයට පත් වූ අතර සෙරපිස් ගොවිපල අවට සිටින ගොවි ජනතාව අපේක්ෂා කළේ එම ඉඩම කට්ටිවලට කඩා ඉඩම් ලබා ගැනීමය. සෑම අවස්ථාවකදීම සාමූහික ගොවිපලවල්වල කෙරීගෙන යන නව ක්‍රමය පිළිබඳ ගම්වැසියන් තුළ සැක ඉපදිනි.

අසල්වැසි ගම් වලින් පුද්ගලයින් කිහිප දෙනෙක් සාමාජිකයින් වශයෙන් තෝරා ගැනීම, ගොවිපල සැළසුම හා පාලනය පිළිබඳ කාර්යයෙහිදී ප්‍රාදේශීය ගම් නායකයින් සම්බන්ධ කරවා ගැනීම, ගම හා ගොවිපල යන දෙකම සම්බන්ධ කර ගනිමින් ශ්‍රමදාන හා සංස්කෘතික කටයුතු පිළියෙල කිරීම ආදී කාර්යයන් මගින් ඒකාබද්ධතාවයකට එරෙහිව පැන නැගුණු බාධක තරමක් දුරට මග හරවාගෙන ඇත. එහෙත් අසල්වැසි ගම් වලින් තෝරා ගනු ලැබූ සාමාජිකයින් ස්ථිරවම ගොවිපලෙහි සිටීම හෝ දිනපතා ගමෙහි සිට වැඩට පැමිණීම හෝ වඩාත් හොඳද යන බව තවම නිගමනය කළයුතුව ඇත. ඔව්හු ස්ථිරව ගොවිපලෙහි සිටීම සාමූහික ජනාවාසයේ ඒකාබද්ධතාවයකට තුඩු දෙන අතර ගමෙහි සිට වැඩට පැමිණීමෙන් ගම හා ගොවිපල අතර ඒකාබද්ධතාවය පවත්වා ගැනීමට පිළිවන. වඩාත් අගනා ක්‍රමයක් වනුයේ මෙම දෙයාකාරයම ක්‍රියාත්මක වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමයි.

## 5.5 සාරාංශය හා නිගමනය

ඉඩම් ප්‍රතිසංස්කරණ සාමූහික ජනාවාස පහ පිළිබඳව කරන ලද අධ්‍යයනයේදී මතු වූ කරුණුද අප විසින් නිර්දේශ කරනු ලැබෙන කරුණුද ප්‍රධාන වශයෙන් ඒවා ලබා ඇති සාර්ථකත්වයද ඒවායේ ඇති අඩුපාඩුද පහත සඳහන් කරන පරිදි වේ.

1. ජනාවාස සැළසුම

(අ) මෙම ජනාවාස පොදුවේ සළකන කල ශිල්පීය වශයෙන්ද ආර්ථික වශයෙන්ද මනාව සකස් කර ඇත. අඩු වියදමක් ඇති ශ්‍රම සූක්ෂම ක්‍රම මැනවින් භාවිතයට ගෙන තිබේ. ප්‍රාග්ධන අවශ්‍යතාවයන් හා ඇස්තමේන්තුගත ප්‍රතිලාභ සාමාන්‍යයෙන් සාධාරණය. තරමක් දුරට අතිරේක රැකියා අවස්ථා නිර්මාණය කර තිබේ. ඇතැම් ගොවිපලවල්වල අනාගතයේදී සේවා නියුක්ති අවස්ථාවන් තවදුරටත් වැඩි කිරීමට හැකියාවක් ඇත.

(ආ) අනාගත බලාපොරොත්තු පිළිබඳව ඇතැම් අවස්ථාවල දක්නට ලැබෙන විශ්වාසයක් නොමැතිකම හේතුකොටගෙන ගොවිපලවල් සඳහා ඇස්තමේන්තු කර ඇති සම්පූර්ණ මූල්‍ය අවශ්‍යතාවයන් සපයනු ලැබේද යන බවට තරමක සැකයක් ඇත. දැනටමත් සංවර්ධිත

තත්වයක පවතින පලදායිතත්වයක් ඇති ගොවිපලවල්වල බෝග විකිණීමෙන් ලැබෙන ආදායම නැවත ආයෝජනය කිරීමෙන් සහ අනිකුත් අවස්ථාවලදී ඉතාඑත් ඉක්මනින් බැංකු හෝ වෙනත් ණය මුදල් ලබා ගැනීමෙන් මෙම අඩුපාඩුකම් මග හරවා ගැනීම අවශ්‍ය වන්නේය.

(ඈ) ඇතැම් ගොවිපලවල් සකස් කර ආරම්භ කිරීමෙහි ලා ප්‍රාදේශීය රජයේ නිලධාරීන්ගේ සහභාගිත්වය ලබා නොගැනීමේ නැඹුරුතාවයක් දක්නට ලැබේ. එහෙත් පසුව මෙම නිලධාරීන්ගේ සේවාවන් තරුණ සමූපකාරවලට මාර්ගෝපදේශකත්වය දීමෙහි ලා අවශ්‍ය වන නිසා මෙම පියවර නුවණට හුරු නොවන බව පෙනී යයි.

2. සහභාගී වන්නෝ

(අ) එක් සාමූහික ගොවිපලක හැරෙන්නට අනෙක් පියල්ලෙහි සහභාගී වන්නන් දෙකොටසකට බෙදී තිබේ; අසල්වැසි ගම් වලින් තෝරා ගනු ලැබූ තරුණයින් සහ සමූපකාරයේ සාමාජිකයින් ලෙස ඉදිරියටත් වැඩ කරන පැරණි වතු කම්කරුවන් වශයෙනි. මෙම කණ්ඩායම් දෙක ඒකාබද්ධ කිරීමෙන් අතිශයින් ප්‍රබල වාසි ලබා ගත හැකි වුවත් බැහැරින් යොදා ඇති කළමනාකාරීත්වයක් විසින් කණ්ඩායම් දෙකම කම්කරුවන් වශයෙන් සමාන සේ සලකනු ලැබෙන අවස්ථාවලදී හැර අනෙක් අවස්ථාවලදී මෙම කණ්ඩායම් දෙක ඒකාබද්ධ කිරීමෙහි ලා දුෂ්කරතාවයන් පවතී. මෙම ඒකාබද්ධතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් පුහුණුව අවශ්‍ය වන්නේය.

(ආ) ගොවිපලවල් දෙකක අතිරේක කණ්ඩායමක්ද දක්නට ලැබේ. ඒ සමූපකාරය විසින් සේවයෙහි යොදවනු ලැබ ඇති පුරවැසි නොවන කම්කරුවෝය. දීර්ඝ කාලීන විසඳුමක් වශයෙන් සලකන කල මෙම තත්වය ක්‍රියාත්මක කළ නොහැකි බව පෙනී යයි. පුරවැසි සාමාජිකයින් මෙන් ඔවුන් හටද එකම සේවා කොන්දේසි හා නියෝජනත්වයක් ලබා දෙන ලෙස යෝජනා කරනු ලැබේ. අනාගතයෙහිදී පුරවැසි නොවන කම්කරු සංඛ්‍යාව ස්වල්ප දෙනෙක් සිටින ස්ථානවල සාමූහික ජනාවාස ඇති කිරීම වැඩදායක වීමට පිළිවන.

3. ඉඩම් භුක්තිය

සාමූහික භුක්ති ක්‍රමය හැරෙන්නට වෙනත් ක්‍රමයක් නොමැති බව සාමාජිකයින් හට පැහැදිලි හෙයින් එම ක්‍රමය සාමාන්‍යයෙන් ඔවුන් විසින් පිළිගනු ලැබ ඇත. ඉඩම එක් ඒකකයක් වශයෙන් ඉදිරියටත් පවත්වාගෙන යාමෙන් ලබා ගත හැකි ආර්ථික හා සංවිධානාත්මක වාසි බොහෝ සාමාජිකයින් විසින් වටහා ගනු ලැබ ඇත.

සාමූහික වශයෙන් අයිතිය තිබෙන ඉඩම හැරෙන්නට එක් එක් සාමාජිකයෙක් හට අක්කර 1/4 කට වැඩි නොවන බිම් කැබැල්ලක් පෞද්ගලික බිම් කැබැල්ලක් වශයෙන් දී දීර්ඝ කාලීන බදු ක්‍රමයක් යටතේ හෝ කුලී ගෙවා පිළියට ගැනීමේ ක්‍රමය යටතේ ඉඩම්වල අයිතිය සමූපකාර සමිති වෙත පවරන ලෙස යෝජනා කෙරේ.

4. වැඩ සංවිධානය

ක්‍රමවත් වැඩ සංවිධානයක් නොමැතිකම හේතුකොටගෙන ඇතැම් අවස්ථාවල ශ්‍රම ඵලදායිතාවය පහත් තත්වයක පවතී. පැරණි කළමනාකාරීත්වය ක්‍රමය දුවත් කළ සැනින්, තෝරා ගත් නායකයින්ගෙන් යුතු ස්ථිර වැඩ කණ්ඩායම් සහිතව වැඩ බෙදා දීමේ ක්‍රම ඇති වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයක් ඒ වෙනුවට යෙදිය යුතුය.

5. ඉඩමට මුදල් ගෙවීම

සමූපකාර එකක්වත් තවම ඉඩමේ වටිනාකම ගෙවීම ආරම්භ කර නැත. බැංකු ණය මුදල් ආපසු ගෙවීම, පොලී ගෙවීම, ඉතිරි කිරීම්, සුභ සාධක අරමුදල් සහ සාමාජිකයින්ට ලාභාංශ ගෙවීම ආදිය සඳහා අරමුදල් වෙන් කිරීමට සිදු වීම නිසා ආරම්භයේ සිටම ඉඩම සඳහා මුදල් ගෙවීමට දුෂ්කරතාවයන් ඇති වන්නේය. එහෙයින් ඉඩමේ වටිනාකම ගෙවීමේදී අවුරුදු 3 – 5 දක්වා වූ සහන කාලසීමාවක් දෙන ලෙසත් මුදල් ගෙවීම ආරම්භ කරන අවස්ථාවේ සිට එක් එක් ගොවිපලක් එය ලබා ඇති සාර්ථකත්වය අනුව සමාලෝචනයට භාජනය කරන ලෙසත් යෝජනා කරනු ලැබේ.

6. කළමනාකරණ ප්‍රතිපත්තිය

අධ්‍යයනයට යොමු කළ ගොවිපලවල් පහෙන් දෙකක් ස්වයං–පාලනය පිළිබඳ උසස් මට්ටමකට ළඟා වී ඇති අතර සාමාජිකයින් තුළ දක්නට ලැබෙන විශ්වාසය හා උද්යෝගය ඒ අනුව වැඩි වී ඇත. අනෙක් ගොවිපලවල් තුනේ කළමනාකාරීත්වය බැහැරින් යොදවනු ලැබ ඇති අතර සාමාජිකයෝ ඉදිරියටත් තමන් වතු කම්කරුවන් ලෙසම සිතීමේ නැඹුරුතාවයට පත්ව සිටී. නිෂ්පාදකත්වය පවත්වාගෙන යාම හා අවසානයේදී ස්වයං–පාලනය සාක්ෂාත් කර ගැනීමේ කාර්යයෙහි ලා මෙම තත්වය බරපතල ගැටළු උද්ගත කරවනු ඇත.

උග්‍ර සමාජයීය ගැටළු පවතින අවස්ථාවලදී හැරෙන්නට අන් අවස්ථාවල සාමාජිකයින් වෙත සම්පූර්ණ වගකීම පැවරීමට දක්වන බිය හේතු රහිතය. ශිල්පීය, සමාජයීය හා මූල්‍ය පාලනය යනුවෙන් කාර්යක්ෂම කළමනාකරණ ක්‍රමයක දක්නට ලැබෙන අවශ්‍යතා නිලධාරීන් විසින් සපයනු ලැබෙන ආකාරයෙන්ම, සාමාජිකයින් වැඩි දෙනෙකුගෙන් යුත් විධායක කමිටු වලින්ද බාහිර නිලධාරී සහාය ඇතිව ප්‍රවීණ අයුරින් සැපයේ. සාමාජිකයින් වැඩි දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුවක් සම්බන්ධයෙන් වුවද, අවශ්‍ය සේවා සහ පුහුණුව සැපයීම, සියළුම සාමාජිකයින්ගේ අයිතිවාසිකම් හා යුතුකම් සමූපකාර ව්‍යවස්ථාවන්ට ඇතුළත් කිරීම, ඉඩම භාවිතා කිරීම සහ බැංකු ණය ගිවිසුම් හෝ බදු ගිවිසුම් මගින් ලබා ගන්නා ණය මුදල් සම්බන්ධයෙන් දැඩි කොන්දේසි පැනවීම ආදිය අවශ්‍ය වන්නේය.

## 7. පුහුණුව හා සේවා

නව මාදිලියේ පුහුද පුහුණුවක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් සමූපකාර සාමාජිකයින්ට දී ඇත. එධාත් ක්‍රමවත් පරිදි පුහුණුවක් ලබා දීම හා නව ප්‍රවේශ පිළිබඳව ප්‍රාදේශීය නිලධාරීන් හටද අවබෝධයක් ලබා දීම අරබයා ප්‍රාදේශීය නිලධාරීන්ද සහභාගී කරවා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ.

## 8. අසල්වැසි ගම් සමඟ එකාබද්ධතාවය

රජයට අත් කරගත් ඉඩම් තමන්ට ලැබිය යුතුය යන හැඟීමෙන් සිටි ඇතැම් ගම් වැසියන් හා සාමූහික ගොවිපලවල් අතර මුලදී සමහර අවස්ථාවන්හී දුෂ්කරතාවයන් මතු වුණේය. අසල්වැසි ගම් වලින් සාමාජිකයින් තෝරා ගැනීම, ගොවිපල සැළසුම හා පාලනය පිළිබඳ කාර්යයෙහිදී ප්‍රාදේශීය නායකයින් (සහභාගී කරවා ගැනීම ඒකාබද්ධ ශ්‍රමදාන හා සංස්කෘතික කටයුතු පිළියෙල කිරීම ආදිය මගින් මෙම ගැටළුව තරමක් දුරට මග හරවා ගෙන ඇත.

# 6 වන පරිච්ඡේදය

## ජනාවාස වර්ග සතර පිළිබඳව තුලනාත්මක අගැයීමක්

මෙම අධ්‍යයනයට පාත්‍ර වූ ජනාවාස වර්ග සතරෙහි කාර්ය සංසිද්ධීන් සසඳා බැලීමේදී අප විසින් මතක තබා ගත යුතු වැදගත් කරුණක් නම් එම ජනාවාස විවිධ වූ පරමාර්ථ සපුරා ගැනීම සඳහා විවිධ තත්වයන් යටතේ පිහිටුවා ඇති බවය . එමනිසා අපගේ පරමාර්ථය වන්නේ එක් ජනාවාසයක් තවත් ජනාවාසයකට වඩා සාර්ථක යයි යෝජනා කිරීමට වඩා අනාගතයේදී සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍ය ජනාවාස ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම අරභයා එම එක් එක් ජනාවාස වර්ගයෙහි ඇති ප්‍රයෝජනවත් ලක්ෂණයන් හඳුනා ගැනීමයි.

ප්‍රයෝජනවත් සැසඳුමක් කළ හැකි ප්‍රතිපත්තිමය ක්ෂේත්‍ර මෙහිදී විමර්ශනය කෙරේ.1/

### 6.1 ව්‍යාපාර සැළසුම් කිරීම

ජනාවාස වර්ග සතරෙහිම භෞතික සැළසුම් සෑහෙන පමණ ක්‍රමවත්ව සංවිධානය කොට ඇති වුවද ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර , සමූපකාර ගම්මාන සහ තරුණ යෝජනා ක්‍රම කිහිපයකම ආර්ථික සහ මූල්‍ය සැළසුම්වල බරපතල් අඩු පාඩුකම් දක්නට ලැබිණ. තරුණ යෝජනා ක්‍රමයන්හි වගා කර ඇති ප්‍රධාන බෝග අනුව සහනාධාර මට්ටමක් නියම කර තිබුණු අතර (සටහන 11-2) මුදල් ආපසු අය කර ගැනීම හෝ මුදල් සියල්ලම අත්‍යවශ්‍ය වන්නේද යන බව නොසළකා එම මුදල් ලබා දී ඇත. සමූපකාර ගම්මාන සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල ප්‍රාග්ධන ආයෝජනය පිළිබඳව සීමාවක් පනවා තිබූ නමුත් එම සීමාව එක් එක් ගොවිපලේ සුවිශේෂ තත්වයන්ට සම්බන්ධ කොට තිබුණේ නැත. (ඇතැම් අවස්ථාවල ඉතිරි කිරීම් දක්නට ලැබිණි) මෙම ගොවිපලවල් රාශියක පිළියෙල කර තිබූ සැළසුම්වල ආයෝජන තක්සේරු කොට ඇතත් අපේක්ෂිත ප්‍රතිලාභ දක්වා තිබුණේ නැත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ජනාවාසවල ආර්ථික සැළසුම් ක්‍රමවත්ව සකස් කිරීමට මහත් උත්සාහයක් ගෙන ඇත. (5.4.1 ඡේදය) එනම් සවිස්තරව ස්ථානීය සමීක්ෂණයක් කිරීමෙන් පසුව සෑම ව්‍යවසායක් සම්බන්ධයෙන් අවුරුදු පහකට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා පිරිවැය සහ ප්‍රතිලාභ ඇතුළුව අය වැය විස්තර සපයා ඇත. නමුත් මෙම සැළසුම් යථාර්ථවත්ද නැද්ද යන්න අවබෝධ කර ගැනීමට තව කල් ගත වූවා මදිය.

---

1/ සෑම ජනාවාසයක්ම සමාග්‍රතාවයකින් යුත් ඒකකයක් වෙයි. එමනිසා ජනාවාසයක එක් අංගයක් අනික් අංග වලින් වෙන්කොට ගෙන පරීක්ෂා කිරීම අනතුරුදායකයක. මෙම අදහස අපගේ වාර්තාව පුරාම අවධාරණය කරන බව මෙහිදී සිහි තබා ගත යුත්තකි. 2, 3, 4, 5 යන පරිච්ඡේදවල සාකච්ඡා කරන ජනාවාසයන් ප්‍රයෝජනවත් ලෙස ඒවාහී විවිධ සංරචකයන්ට බෙදා ගැනීමට හැකි වෙයි. කෙසේ වෙතත් ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල සාර්ථක ලෙස ක්‍රියාත්මක වන කළමනාකරණ ප්‍රතිපත්තියක් වෙනත් තත්වයන් යටතේ පවතින සමූපකාර ගොවිපලකට අනිවාර්යයෙන්ම ගැළපෙතිහි අපට කිව නොහැකිය. තුලනාත්මක විශ්ලේෂනයේදී මෙම කරුණ සිහි තබා ගැනීම ඉතා වැදගති.

## 6.2 සාමාජිකයින් තෝරා ගැනීම

ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසවල පදිංචි වැඩි මහළු වතු කම්කරුවන් පිළිබඳව වූ අවස්ථාවෙහි හැර ජනාවාස වර්ග සතරෙහි සාමාජිකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් සමාන නිශ්චය ක්‍රමයක් උපයෝගී කොට ඇත. මෙම ක්‍රම වලින් එකක් හෝ සම්පූර්ණයෙන්ම සතුටුදායක නොවන අතර, සෑම ව්‍යාපාරයකම පාහේ ව්‍යාපාරය හැර යන්නවුන්ගේ සංඛ්‍යාව ඉතා අධික විනි. ජනාවාස කිහිපයක් පමණක් ඒකාබද්ධ ප්‍රජාවක් පිහිටුවා ගැනීමට සමත් වී ඇත.

පළපුරුද්ද, අධ්‍යාපන මට්ටම් සහ වයස යන ඒනුම් අනුව සමතාවයක් ඇති කණ්ඩායම් තෝරාගෙන ජනාවාස ඇරඹීම සුදුසුද යන ප්‍රශ්නය ගැන එකිනෙක හා ගැටෙන විවිධ සාක්ෂි ඉදිරිපත් වී ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ ජනාවාසවල වෙනස් වූ වයස් කණ්ඩායම් සහ සමාජ පසුබිම්වලට අයත් වන කණ්ඩායම් සිටීම විවිධ ගැටළු ඇති කිරීමට තුඩු දී ඇත. සමහර සමූපකාර ගම්මානවල සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල විවිධ වයස් කණ්ඩායම් මනාව සමූහයක් වශයෙන් වැඩ කර ඇති බව පෙනේ.

යෝජනා ක්‍රමවල සාමාජිකයින්, එම ව්‍යාපාර අසල ගම් වලින් හෝ ඈත පළාත් වලින් හෝ තෝරා ගැනීම සුදුසුද නැද්ද යන්න පිළිබඳවද විවිධ සාක්ෂි ඇත. සමහර තරුණ ව්‍යාපාරවල, ඈත පළාත් වලින් තෝරාගෙන ඇති සාමාජිකයින් උද්යෝගිමත් සාමාජිකයින් වූ අතර ඔවුන් අසළ ගම් වලින් තෝරා ගත් අයට වඩා පුරෝගාමීව කටයුතු කරන බවද පෙනෙන්නට ඇත. එහෙත් ගම් වැසියන් විසින් ඔවුන් තවමත් සම්පූර්ණයෙන්ම පිළිගෙන නොමැත. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර සහ සමූපකාර ගම්මානවල සාමාජිකයින් වැඩි ප්‍රමාණයක් එම ව්‍යාපාර අසළ ගම් වලින් තෝරාගෙන ඇත. ඔව්හු දිනපතා තමන්ගේ නිවෙස්වල සිට ගම්මානවලට පැමිණෙති. මේ නිසා ව්‍යාපාර සහ ඒ අවට ඇති ගම් අතර සමාජ ඒකාග්‍රතාවයක් ඇති වීම පහසු වී ඇත.

ජනාවාසයක අනාගත සැළසුම් පිළිබඳව (නිදර්ශනයක් වශයෙන් එම තරුණ යෝජනා ක්‍රමයෙහි ඉඩම් භුක්ති ප්‍රතිපත්තිය ගැන) එම ජනාවාසයෙහි සාමාජිකයින්ට පැහැදිලි අවබෝධයක් ලබා දී නොමැති විට එම ව්‍යාපාර කෙරෙහි ඔවුන්ගේ බැඳීයාව හීන වන අතර, ව්‍යාපාර හැර යන අයගේ සංඛ්‍යාව නිතරම ඉහළ මට්ටමක පවතී. එම ප්‍රතිපත්තීන් මුලදීම පැහැදිලි කර දුන් විට; එනම් සාමාජිකයින් ව්‍යාපාරයෙන් බලාපොරොත්තු විය යුතු දේ සහ ව්‍යාපාරය එහි සාමාජිකයින්ගෙන් බලාපොරොත්තු වන දේ පිළිබඳව අවබෝධයක් ලබා දුන් විට ඔවුන්ගේ උනන්දුව සාමාන්‍යයෙන් වැඩි වේ. ඊට උදාහරණයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස නම් කළ හැක.

## 6.3 ඉඩම් භුක්ති ක්‍රමය

(අ) සමූපකාර ගම්මානවල ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳව ලබා ඇති අත්දැකීම් සාමාන්‍යයෙන් අධෛර්යයට පත් කරවන සුළුය. රජයේ සෘජු පරිපාලනය ඇති ගම්මාන සහ පොදුවේ වතු ලෙස පවත්වාගෙන යන ලද ගොවිපලවල්

හැර අන්‍ය ව්‍යාපාරවල පලදායීතාවය අඩු වී ඇත. මෙම ව්‍යාපාරවල කටයුතු කරන රජයේ නිලධාරීන්ට සමූපකාර ගම්මාන පිළිබඳ සංකල්පය ගැන එතරම් පැහැදිලි අවබෝධයක් නොමැති බව බොහෝවිට දක්නට ලැබේ. බොහෝ අවස්ථාවල්වලදී සමූපකාර ගම්මානවලට ඔවුන්ගේ සම්පූර්ණ සහයෝගය ලැබී නොමැත. අසල පිහිටා ඇති ගම් ජනාවාසයක් කෙරේ කරන බලපෑම නිතරම හිතකර නොවේ. ඇතැම් ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසවල සමූහ භුක්තිය පිළිබඳ අත්දැකීම් බලාපොරොත්තු ඇති කරවන සුළුය. සාමාජිකයින් සෑහෙන පමණ සමූහ ජීවිතයකට පුහුණු වී සිටීම සහ ඉඩම් කැබලි කිරීමට විරුද්ධව දක්වා ඇති ආර්ථික සාධක අගය කිරීම මීට ප්‍රධාන හේතුන් සේ පෙනේ.

(ආ) පුද්ගලික ඉඩම් අයිතිය ඇති සමහර ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල සහ තරුණ යෝජනා ක්‍රමවල පලදායීතාව සෑහෙන පමණ ඉහළ මට්ටමක පැවති නමුත් ඒවායේ ඇතැම් පුද්ගලයින් තමන්ගේ ඉඩම් කැබලි වලින් ලබා ගත් පලදායීතාව නිතරම පහළ මට්ටමක විය. අසමානත්වය තවම උග්‍ර තත්වයකට පත් වී නැත්තේ සෑම ජනාවාසයකම ඉඩම් කැබලිවල විශාලත්වය සාමාන්‍යයෙන් එකම ප්‍රමාණයක පැවතීම සහ අතිරික්තයන් සාමාන්‍යයෙන් වෙනත් ස්ථානයන්හි ආයෝජනය කිරීම නිසාය. කෙසේ වෙතත් සාමාජිකයින්ගේ ආකල්ප බොහෝ සෙයින් පෞද්ගලිකත්වයට නැඹුරු වී ඇත. සේවා සමූපකාර සමිති කාර්යක්ෂම වූ බවක් බොහෝ අවස්ථාවල නොපෙනෙන අතර බලාපොරොත්තු වූ තරම් මට්ටමකට, ජනතාව පොදු හැඟීම් වලින් යුත් ජනසමූහ බවට හැඩ ගැස්වීමට ඒවා අපොහොසත්ව ඇත. මීට එක් හේතුවක් නම් සාමාජිකයින්ගේ පුද්ගලික ආකල්ප වේ. අනෙක් කරුණ නම් රජයේ නිලධාරීන් විසින් දෙන ලද සහයෝගය සහ මග පෙන්වීම අකාර්යක්ෂම වීමය.

## 6.4 මූල්‍ය ප්‍රතිපත්ති

තරුණ යෝජනා ක්‍රමවල මූල්‍ය සහ පුනරාවර්තන වියදම් ඇතුළුව මූලික ආයෝජන දීමනාවක් වශයෙන් ලබා දී ඇති අතර සමහර ගොවි ව්‍යාපාරවල එම දීමනාව අවුරුදු පහකට අධික කාලයක් තිස්සේ දී ඇත. ලෝක ආහාර ආධාර ද මෙම ව්‍යාපාරවලට ලබා දී තිබුණි. මෙවැනි දිගුකාලීන සහනාධාර දීම නිසා ජනාවාස අඩු පිරිවැය සහ ව්‍යාපාර වන්නේය යන ආකල්පය උද්ගතව තිබෙන අතර තවදුරටත් රජයේ ආධාර මත යැපීමේ හැඟීම ඇති කර තිබේ. මූලික සංවර්ධන අදියර අවසානයේදී සහ සමූපකාර සමිති වලින් තරුණයින් ණය ලබා ගනිතියි අපේක්ෂා කළ පසුවද ඔවුන් මෙම ණය මුදල් ආපසු ගෙවා නැත. සමූපකාර ක්‍රමය කෙරෙහි ඔවුන්ගේ ඇති නොසැළකිල්ලත්, අවශ්‍ය විටකදී රජය තමන්ට උදව් කරන්නේය යන අඛණ්ඩ අපේක්ෂාවත් මෙයින් පැහැදිලි වෙයි.

සමූපකාර ගම්මාන සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවලට දෙන ලද ආධාර වඩා අඩු මට්ටමක විය. තවද තරුණ ව්‍යාපාර මෙන් නොව මේවාට දෙන ලද සහනාධාර, අසීමිත ස්වභාවයක නුවූ හෙයින් එම ව්‍යාපාර රජය මත යැපීමේ ස්වභාවය අඩු විය. ඉඩම් සහ ඒවායේ ඇති වටිනාකම් ඇතුළු සියළුම ආයෝජන ආපසු ගෙවිය යුතු බව ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසවල තරුණයින්ට පුලදීම පැහැදිලි කර දී ඇත. කෙසේ වෙතත් එම සියළුම ආයෝජන ආපසු ලබා ගැනීමට හැකි වේද යන ප්‍රශ්නයට පිළිතුරු දීමට තව තල් තිබේ. එහෙත් අනෙක් ව්‍යාපාරවල මෙන් නොව මේ ව්‍යාපාරවල ආයෝජන වියදම් ආපසු ගෙවිය යුතුය යන අපේක්ෂාව සාමාජිකයින් තුළ පැවතීම මෙහි ලා වැදගත් වන්නේය.

## 6.5 ජනාවාස කළමනාකරණය

අධ්‍යයනය කරන ලද සමූපකාර ගම්මාන, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාර සහ සියළුම තරුණ යෝජනා ක්‍රමවල ස්වයං-පාලනය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දක්වා ඇති ප්‍රගතිය කවරෙකු වුවද උදාසීන කරවන සුළු වේ. ඊට හේතු වශයෙන් කරුණු කිහිපයක් දැක්විය හැක:

(අ) මධ්‍යම සහ දිස්ත්‍රික්ක මට්ටම්වලදී ජනාවාස සාමාජිකයින්ට විශාල මුදල් ප්‍රමාණයක වගකීම භාර දීම පිළිබඳ අවදානමට මුහුණ දීමට නිලධාරීන් දක්වන අකමැත්ත,

(ආ) ජනාවාස මට්ටමේදී නිලධාරීහු එම ජනාවාස සාමාජිකයින් සමඟ තමන්ගේ බලතල බෙදා ගැනීමට අකමැත්තක් දක්වති. ගුරුවරුන් හා මාර්ගෝපදේශකයන් වශයෙන් කටයුතු කිරීමට වඩා ස්වාමීන් ලෙස කටයුතු කිරීම වඩා පහසු බව ඔවුන් සාමාන්‍යයෙන් වටහාගෙන ඇත.

තරුණ යෝජනා ක්‍රමවල සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල සාමාජිකයෝ තම තමන්ගේ පාලනය යටතේ ඇති පුද්ගලික ඉඩම් කැබලිවල ස්වාමීන් බවට පත්ව ඇති හෙයින් එම ව්‍යාපාරවල සමූපකාර කටයුතු පිළිබඳ වගකීම නිලධාරීන්ට භාර දීමට සාමාන්‍යයෙන් කැමති වෙති. බොහෝ අවස්ථාවලදී සමූපකාර ගම්මානවල බලය අයුතු ලෙස භාවිතා කිරීමට සහ ව්‍යාපාර සාමාජිකයින්ට අකටයුතු ලෙස සැලකීමට රජයේ නිලධාරීන්ගේ බලතල හේතු වී ඇත. නමුත් අවස්ථා ස්වල්පයකදී තෘප්තිය ලාභදායී ලෙස වගා කිරීමට එම බලතල දායක වී ඇත. සාමාන්‍යයෙන් ගොවිපලකට පිටස්තර පුද්ගලයින් කළමනාකරුවන් ලෙස පත් කිරීම ව්‍යාපාර සාමාජිකයින්ගේ උනන්දුව අඩු කරවීමට හේතු වන අතර, ස්වයං-පාලනයක් ඇති කර ගැනීමට තිබෙන අපේක්ෂාවන් මේ නිසා සපුරා ගැනීමට නොහැකි වෙයි.

ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාස සම්බන්ධව, එම සාමාජිකයින් හට ස්වයං-පාලනය පිළිබඳ මාර්ගෝපදේශකත්වයක් ලබා දීමට මහත් උනන්දුවක් ගෙන ඇති අතර කෙටි කාලයක් තුළ, දිරි ගන්වන සුළු ප්‍රගතියක් දක්නට ලැබිණ.

## 6.6 ශ්‍රම භාවිතය

තරුණ ව්‍යාපාරවල සමුපකාරීව වැඩ කෙරී ඇත්තේ සවල්ප වශයෙනි. තවද ඒවාහි විවිධ කටයුතු සඳහා කුලී කම්කරු ශ්‍රමය මත මහත්සේ යැපීමක් දක්නට ඇත. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල සාමාජිකයින් තම තමන්ගේ නිවෙස්වල පදිංචි වී සිටින නිසා වැඩිපුර පවුල් ශ්‍රමය උපයෝගී කරගෙන තිබේ. සමුපකාර ගොවිපලවල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසවල (ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් වූ වතුවල විජාතික කුලී කරුවන් ඇති අවස්ථා හැර) සාමාජිකයෝ කුලී ශ්‍රමය මත පමණක් නොයැපී සාමූහිකව කටයුතු කරති. ඇතැම් අවස්ථා වලදී සමුපකාර ගම්මානවල සාමාජිකයින් තමන් විසින් තෝරා ගත් නායකයින් යටතේ වැඩ කණ්ඩායම්වලට බෙදී ඇති අතර කාර්ය ප්‍රතිමාන උපයෝගී කරගෙන ඉහළ පලදායීතාවක් පවත්වාගෙන යන බව පෙනේ. එහෙත් බොහෝ අවස්ථාවලදී මෙම ජනාවාසවල පලදායීතා මට්ටම සෑහෙන පමණ අඩු විනි.

## 6.7 ආර්ථික සපලතා

සෑම වර්ගයකටම අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන ආයෝජන පුනරාවර්තන පිරිවැය හා ආපසු ගෙවීම්, අක්කරයක බෝග අස්වැන්න සහ සාමාජිකයින්ට ලැබෙන ආදායම සමඟ රජයට ලැබෙන ප්‍රතිලාභ සසඳා බැලීමට මෙහිදී අපි උත්සාහ ගනිමු. මෙවැනි සැසඳීමකින් අවම පිරිවැය ප්‍රමාණයක් උපයෝගී කරගෙන ඉහළම සංවර්ධන මට්ටමකට ලඟා වූ ජනාවාස වර්ගය පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වෙයි.

අවාසනාවකට මෙන් කරුණු කිහිපයක් නිසා මෙම සැසඳීම කිරීමට අපට නොහැකි වෙයි. ප්‍රථමයෙන්ම, මෙම යෝජනා ක්‍රමයන් පිහිටුවන ලද්දේ විවිධ කාල පරිච්ඡේදවලය. තරුණ යෝජනා ක්‍රමවල ප්‍රාග්ධන ආයෝජන කරන ලද්දේ අවුරුදු 6 – 7 දක්වා කාලයකට පැතිර පවතින ලෙසිනි; එහෙත් අනෙක් ජනාවාස වර්ගවල ආයෝජන තවත් සිදු කළ යුතුව ඇත. මෙම ව්‍යාපාරයන් විවිධ තත්වයන් යටතේ ආරම්භ කිරීම දෙවෙනි කරුණ වේ. වියලි කලාපයේ ජනාවාස ඇති කිරීම සඳහා සමහරවිට වාරිමාර්ග ක්‍රම ඇති කිරීම සිදු වෙයි. මෙවැනි මූලික කටයුතු සඳහා මූල්‍ය අවශ්‍යතාවන් ඇතැම්විට තෙත් කලාපයේ දක්නට නැත. නිදසුනක් ලෙස තෙත් කලාපයේ රබර් වත්තක් පුනරුත්ථාපනය කිරීම සඳහන් කළ හැක. විවිධ තත්වයන් යටතේ පිහිටුවන ජනාවාසවල වීය හියදම් සැසඳීම අසීරු වෙයි. තුන්වෙනි කරුණ නම් විවිධ වර්ගවල ව්‍යාපාරයන්හි එකම බෝගය වගා කර ඇති අවස්ථාවලදී ප්‍රාදේශීය විචල්‍යයන් නිසා සංසන්දනය කිරීම දුෂ්කර වේ. (නිදර්ශනයක් වශයෙන් විස්වමඩුකුලම් තරුණ ව්‍යාපාරයෙහි වාරිමාර්ග තත්වයන් යටතේ ලබා ගන්නා ලද පිරිස් අස්වැන්න පිද්දෙනිය ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරයේ අහස් වැසි තත්වයන් යටතේ පිරිස් අස්වැන්න සමඟ සසඳා බැලීම දුෂ්කර වෙයි.). මීට අමතරව අපට ලැබුණු අදාළ ප්‍රමාණාත්මක විස්තර එතරම් විශ්වසනීය නොවන අතර, ඒවා ලබා ගැනීමද බොහෝවිට අසීරු විය. කෙසේ වෙතත්, මෙම සියළුම සීමාවන් සිත්හි තබාගෙන තරුණ ව්‍යාපාර සමුපකාර ගම්මාන සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල ආර්ථික කාර්ය සිද්ධීන් පිළිබඳව යම් යම් කරුණු කිහිපයක් දැක්වීමට උත්සාහ ගනිමු. මෙම ප්‍රයත්නයේදී ඉතා මෑත අතීතයේදී

පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ ජනාවාසයන් අත් හැර ඇත.

(අ) උසස් ආර්ථිකමය හැකියාවක් ඇති ඉඩම් ඇතිවිට සහ ඉහළ වටිනාකම් ඇති බෝග වගා කරන අවස්ථාවල තරුණ ව්‍යාපාරවල සාමාජිකයින්ගෙන් වැඩි කොටසක් සතුටුදායක අස්වැන්නක් සහ ලාභ ලබන නිෂ්පාදකයන් බවට පත් වේ. යෝජනා ක්‍රමයන්හි සාමාන්‍ය පලදායීතාවය අධික මූලික ආයෝජන නිසා අඩු වී ඇති අතර, එම ආයෝජන වලින් වැඩි හරියක් අනිවාර්ය ආයෝජන වන බව නොපෙනේ. තවද මෙම ආයෝජන සමහර කාර්යයන්ගේ ආර්ථික ප්‍රසත්ථාව පහළ මට්ටමකට හෙළා ඇති බවද පෙන්නුම් කෙරේ. සංවර්ධන කාල පරිච්ඡේදයෙන් පසුව පුනරාවර්තන වියදම් සාමාන්‍යයෙන් අඩු වී ඇත. මෙයට හේතුව නම් තමන්ට ලැබුණු සහනාධාරයන් නැවතුනු පසු ගොවීන් තමන්ගේම සම්පත් මේ සඳහා උපයෝගී කර ගැනීමට සිදු වීමයි. සමූපකාර සමිතිවල දුර්වලතා ණය ලබා ගැනීමට තිබූ ඉඩ කඩ අඩු කළ නමුත් එම තත්වය පලදායීතාවය කෙරෙහි මහත් සේ බලපාන බවක් නොපෙනේ.

(ආ) රජයට පවරා ගත් වතුවල පිහිටුවා ඇති සමූපකාර ගම්මානවල සවිමත් මධ්‍යගත කළමනාකරණ ක්‍රමයක් ඇති අවස්ථාවල නිමැයුම් මට්ටම් ඉහළ තත්වයක පවතින නමුත් එසේ නොවූ අවස්ථාවල නිමැසුම් මට්ටම සෑහෙන පමණ අඩු වන බව පෙනේ. කෙසේ වෙතත්, අන්තරයකට යෙදවිය හැකි ආයෝජනය රුපියල් 1,600/- කට සීමා කර ඇති නිසා ප්‍රාග්ධන ආයෝජන සහ නඩත්තු පිරිවැය අඩු මට්ටම්වල පවතී. මෙසේ මෙම ව්‍යාපාරවල ප්‍රතිලාභ බලාපොරොත්තු කඩ කරවන සුළු වුවද එම ව්‍යාපාර වලින් රජයට එතරම් බරපතල මූල්‍යමය අලාභයක් සිදු වෙතියි සිතිය නොහැක.

(ඇ) ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල ආර්ථික සපලතාවය ගොවිපලෙන් ගොවිපලට මෙන්ම සෑම ව්‍යාපාරයකම සාමාජිකයින් අතරද සෑහෙන තරම් දුරට විචලනය වේ. කෙසේ වෙතත් අපගේ නියැදියේ අඩංගු වූ ව්‍යාපාරවල ආයෝජනවලට ලැබුණු ප්‍රතිලාභ සෑහෙන පමණ සතුටුදායක වන්නේ මෙම ව්‍යාපාර සඳහා යොදවන ලද සුළු මූලධන ප්‍රමාණය නිසාය.

(ඈ) එක් ජනාවාස වර්ගයක ආර්ථික සපලතාවය අනෙක් ජනාවාස වර්ගවල සපලතාවයට වඩා සෑම අතින්ම උසස් මට්ටමක තිබෙන්නේ යයි ස්ථිර වශයෙන්ම කිව නොහැක; සෑම වර්ගයකම ජනාවාසයක සතුටුදායක සහ අසතුටුදායක ලක්ෂණයන් ඇති හෙයිනි. ජනාවාසයක සාර්ථක හෝ අසාර්ථක බව කරුණු රාශියක් මගින් තීරණය වන අතර එම කරුණු සියල්ලම ආර්ථික කරුණු නොවන බව සටහන් කිරීම මෙහිදී වැදගත්ය.

## 6.8 සමාජයීය සඵලතා

විවිධ ජනාවාස වර්ගයන්හි ආර්ථික සඵලතා සැසඳීම අපිරු වන අතර ඒවායේ සමාජයීය සඵලතා සැසඳීම ඊටත් වඩා අපිරු වෙයි. කෙසේ වෙතත් සටහන 1–2 හි දක්වා ඇති සමාජයීය පරමාර්යන් ඉතා වැදගත් වන අතර අපගේ විශ්ලේෂනයේදී ඒවා ප්‍රමුඛ ස්ථානයක් ලබයි. එමනිසා පූර්වයෙන් ඉදිරිපත් කරන ලද තර්ක එකට ගොනු කර දැක්වීමට මෙහිදී දෙහස් කෙරේ.

(අ) සමූපකාර ආකල්ප: තරුණ ව්‍යාපාරවල සාමාජිකයින් අධික ලෙස පෞද්ගලිත්වය තැඹුරු වන බව දක්නට ලැබිණ. එම ව්‍යාපාරවල ශ්‍රම හුවමාරුව ඉතා සුළු වූයෙන් සමූපකාර සමිති කෙරෙහි දක්වන ලද්දේ අල්ප සැළකිල්ලකි (ලබා ගත් ණය ආපසු නොගෙවූ අතර නිෂ්පාදනය කරන ලද බෝග පුද්ගලිකව අලෙවි කරන ලදී.). සෑම තරුණ ව්‍යාපාරයකම සාමාජිකයෝ තමන්ගේ බෝග ආරක්‍ෂා කර ගැනීම සඳහා ගම්ගොඩෙහි ජීවත් වීමට වඩා තම තමන්ගේ ඉඩම් කැබලිවල වාසය කිරීම අවශ්‍ය බව අවධාරනයෙන් සඳහන් කළහ. ඔව්හු අවස්ථා කිහිපයකදීම තමන්ගේ ඉඩම් කැබලිවල බෝග ආරක්‍ෂා කර ගත යුත්තේ තමන්ගේම සහෝදර සාමාජිකයින්ගෙන් බව කියා සිටිති.

සමූපකාර ගම්මානවල සමූහයක් සේ විසීම සහ කාර්යයෙහි යෙදීම එහි සාමාජිකයින් අතර යම් ප්‍රමාණයක සමූපකාර හැඟීමක් අනිවාර්යයෙන් බිහි කර ඇති නමුත් එමගින් සාමාජිකයින්ගේ ආකල්ප වෙනස් වූවාදැයි ස්ථිර වශයෙන් ප්‍රකාශ කළ නොහැක. ගොවිපලවල්වල කට්ටි බෙදීම සහ ඊර්ෂ්‍යාවෙන් කටයුතු කිරීම වැනි සිද්ධීන් කිහිපයක් පිළිබඳව වාර්තා ලැබී ඇත. තවත් සමහර අවස්ථාවලදී සමූපකාර ගම්මානවල සාමාජිකයින් විසින් සමූපකාර දේපොල සොරකම් කරන ලදැයි සැක කරන ලද අවස්ථාද දක්නට ලැබිණ. මෙවැනි තත්වයන් තවර නමුත් ප්‍රජාවක වුවද අපේක්‍ෂා කළ යුත්තකි. මෙහිදී දැක්විය හැකි එක කරුණක් නම් මෙවැනි සිද්ධීන් සමූපකාර ගම්මානයකදී බරපතල ප්‍රතිඵලයන් ඇති කරන බවය. තරුණ යෝජනා ක්‍රම සහ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ගොවිපලවල සාමාන්‍යයෙන් මෙවැනි ගැටුම්වලදී පුද්ගලයින් කිහිප දෙනෙක් පමණක් සහභාගී වුවද සමූපකාර ගම්මානවලදී කිහිප දෙනෙකුගේ පෞද්ගලිකත්වය පිළිබඳ ආකල්ප මුළු ප්‍රජාව කෙරෙහිම බරපතල ප්‍රතිවිපාක ගෙන දේ.

ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරවල සාමාජිකයින් තමන්ගේ උපන් ගම්වලම ජීවත් වන නිසා ඔවුන්ගේ ආකල්ප වෙනස් වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. සාමූහික පදනම මත කුකුලන් ඇති කිරීමේ ව්‍යාපාරයෙහි සාමාජිකයින් අතර ඉහල මට්ටමක සමූපකාර හැඟීමක් සහ විශ්වාසයක් වර්ධනය වී ඇත. මෙම සාමූහික ආකල්ප බොහෝදුරට පාඨශාලාවක හෝ කර්මාන්ත ශාලාවක වැඩ කරන සමූහයක දක්නට ලැබෙන ආකල්පයනට සමාන වන අතර සිය නිවාසවලදී ඔවුන් දරන ආකල්ප කෙරෙහි මේවා අනිවාර්යයෙන්ම බල නොපානු ඇත.

(ආ) සමානත්මතාවය: තරුණ යෝජනා ක්‍රමවල සහ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපාර ගොවිපලවල්වල සාමාජිකයින් අතර ආර්ථික අසමානතාවයන් උද්ගත වීමට පටන් ගෙන ඇති බව